ඒ. ටී. ආරියරත්න

භව තණ්හා

ස්ව චරිතාපදානය

තෙවන
වෙළුම

සර්වෝදය පොත් එකතුව/විශ්ව ලේඛා ප්‍රකාශන

දෙල්ගහ යට ගෙදර විප්ලවය	(පළමු මුද්‍රණය)	- 1978
	(දෙවන මුද්‍රණය)	- 1987
දේශන සංහිතා		-
උගුල - ජේම්ස්ගෝල්ඩ්ස්මිත්		-
(සංස්: වෛද්‍ය වින්‍යා ආරියරත්න)		- 1996
ලේඛන සංහිතා		- 1997
යුග පුරුෂයෙකුගේ කථාව (ළමයින්ට)		- 1997
ජනාධිපති ප්‍රේමදාසයි පුරවැසි මමයි		- 1999
සර්වෝදය මාර්ගෝපදේශකයා		- 1999
සර්වෝදය-මහත්මා ගාන්ධි		- 1999
භව තණ්හා වෙළුම 1		- 2001
භව තණ්හා වෙළුම 2		- 2003

The Sarvodaya Book Collection /VISHVA LEKHA PUBLICATIONS

COLLECTED WORKS	Vol I	-	1978
by Dr. A.T. Ariyaratne	Vol II	-	1980
	Vol III	-	1985
	Vol IV	-	1989
Edited by Prof. Nandasena Ratnapala	Vol V	-	1991
in an exclusive gift pack	Vol VI	-	1996
Reprinted in 1999	Vol VII	-	1999
Bhava Thanha	Vol I	-	2001

Voices from the Heart	-	1999
With Gandhiji in Ceylon	-	1998
Revolution under the Breadfruit Tree	-	1988
People's Movement Under Siege	-	1993
Schumaker Lectures on Buddhist Economics	-	1999
Apostle of Peace (S. Godage Books)	-	1997
Sarvodaya and Buddhism	-	1997

භව තණ්හා

ස්ව චරිතාපදානය

තෙවන වෙළුම

ඒ. ටී. ආරියරත්න

ඒ. ටී. ආරියරත්න
පළමුවන මුද්‍රණය : 2014 අගෝස්තු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ආරියරත්න ඒ. ටී.
භව තණ්හා/තෙවන වෙලුම/ඒ. ටී. ආරියරත්න
98, රාවතාවත්ත පාර, මොරටුව. 2014
පි 450. සෙ.මී. 14 x 22 : ආචාර්ය ඒ. ටී. ආරියරත්න
මහතාගේ ජීව චරිතාපදානය
ISBN 978-955- 599-515-3 මිල : රු. 600/=

i. 920 විවි 21 ii. ග්‍රන්ථ නාමය
1. චරිතාපදාන 2. ස්වචරිතාපදාන

ISBN 978-955- 599-515-3

මේ තෙවන වෙළුමෙහි පිටු අංකනය කර ඇත්තේ දෙවන වෙළුමෙහි
අවසාන පිටු අංකය තවදුරටත් ඉදිරියට ගෙන යාමෙන් බව කරුණාවෙන් සලකන්න.
ඒ අනුව තෙවන වෙළුමෙහි ආරම්භක පිටු අංකය 1216 ලෙස දක්වා ඇත.

මුද්‍රණය:-
සර්වෝදය විශ්ව ලේඛා
'මෙත් මැඳුර'
අංක: 77, ද සොයිසා පාර,
මොරටුව.
0776000600



අහිංසාවාදී සමාජ විප්ලවයකට

ක්‍රියාමාර්ග සකසමින් සිටි මගේ සිත

ශාස්ත්‍රීය ක්ෂේත්‍රයටද යොමු කිරීමට

මා පෙළඹවූ මගේ කල්‍යාණ මිත්‍ර

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ

මහාචාර්ය නන්දසේන රත්නපාල ශූරීන්ගේ

ශ්‍රී නාමයට

භවතණ්හා තෙවන වෙළුම

භක්ති ප්‍රණාමයෙන් පුද කරමි.

ඒ. ටී. ආරියරත්න

පෙරවදන

මේ භවතණ්හා ස්ව-චරිතාපදානයේ තෙවැනි වෙළුමයි. සැබැවින්ම මෙය එළිදැක්වීමට දැනට වසර දෙකහමාරකට පෙර හැකියාව තිබුණි. ඒ වන විට මෙම තුන්වැනි වෙළුම මා සම්පූර්ණයෙන් වාගේ ලියා නිම කොට තිබුණි. එහෙත් බාධක රැසක් නිසා එය ඉටු කර ගැනීමට නොහැකි විය.

මෙම තුන්වැනි වෙළුමට හැඳින්වීම ලියා දුන් මහාචාර්ය ටෙනිසන් පෙරේරා සහ පසුවදන ලියා දුන් මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර ශූරීන්ට මගේ විශේෂ කෘතඥතාවය හිමිවේ.

මෙම ග්‍රන්ථය ද මුල් වෙළුම් දෙක තරම් පරිච්ඡේද පනහකට කිට්ටු ප්‍රමාණයකින් යුක්තය. මගේ දින පොත්වලින් සහ ලිපි ලේඛනවලින් කරුණු උපයා ගෙන පිළිවෙලකට සකස් කර දුන් අසෝකා දැදිගමුව මෙනවියට මගේ ආදර ගෞරව ස්තුතිය පිරිනමමි. අවශ්‍ය ජායාරූප සොයා සකස් කර දුන් අනුර පීරිස් මහතාට සහ එරන්ද නිශාන් සුභසිංහ මහතාට ස්තුතිවන්ත වෙමි. සෝදුපත් කියවා කටයුතු කළ කේ. එල්. ගුණවර්ධන මහතාට මගේ ස්තුතිය පිරිනමමි. මේ පොත ඉංග්‍රිරිසියට පරිවර්තනය කළ රෝස් පෙරේරා මහත්මියට සහ ඩී. ඒ. පෙරේරා මහතාට ද මගේ ආදර ගෞරව ස්තුතිය පිරිනමමි.

මේ හැරුණු විට ආගන්තුක පරිච්ඡේද කිහිපයකටම අවශ්‍ය කරුණු සපයා මට ලියා දුන් හිතවතුන් කිහිප දෙනෙකුට ද මගේ ස්තුතිය පිරිනමමි.

මෙම වෙළුම පරිගණක ගත කොට කිහිප වතාවක්ම සංශෝධන කිරීමට කාලය, ශ්‍රමය හා බුද්ධිය පරිත්‍යාග කළ පුෂ්පා රංජනී මහත්මියට මම විශේෂයෙන් කෘතඥ වෙමි.

අවසාන වශයෙන් මුද්‍රණයට බාරදීම සඳහා මෙම ප්‍රකාශනය සකස් කළ මාධ්‍යවේදී තිස්ස ජයවර්ධන මහතාට ද මුද්‍රණ කටයුතු භාරගත් සර්වෝදය විශ්ව ලේඛාහි හේමන්ත ගමගේ මහතාට ද ස්තුති කරමි.

භවතණ්හා නමින් මගේ ස්ව-චරිතාපදානය ලිවීමේ පරමාර්ථය මුල් වෙළුම් දෙකේ හැඳින්වීමෙන් සහ පෙරවදනින් ප්‍රකාශ කර ඇති නිසා නැවතත් එය ලිවීමට නොවෙහෙසෙන්නෙමි. මේ පොත ද මතු පරපුරට ආදර්ශයක් වේවා.

ආචාර්ය ඒ. ටී. ආරියරත්න.

නො. 114, 'සමුදන',
රාවතාවත්ත පාර,
මොරටුව.
2014 අගෝස්තු

හැඳින්වීම

තම නිජ බිමට අනූපමේය වූ සේවයක් කරන හා සේවයක් කළ, මනා අත්දැකීම් සම්භාරයක් සතු, ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත කතා කියවීම තුළින් ලැබෙන දැනුම කෙනෙකුගේ චිත්ත ධෛර්යය හා පෞරුෂ වර්ධනයට හේතු වන බව අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි. එවන් චරිතාපදාන සංයමව කියවීම මගින් ලබා ගත හැකි ආදර්ශ අපමණ වේ. තම රට වෙනුවෙන්, විශේෂයෙන් පොදු ජනතාව උදෙසා ඇප කැප වී සේවය කරන, ආත්ම ලාභයෙන් තොරව පරාර්ථකාමිත්වය මුල් කර ගෙන කටයුතු කරන කාගේත් හිතාදරයට පත් වී සිටින ප්‍රජා නායකයකුගේ ස්ව චරිත කතාවක් කියවීම සත්‍ය වශයෙන්ම අපූර්ව ආශ්වාදයක් වන්නේය.

1950 දශකයේ අග භාගයේ ආර්ථික දරිද්‍රතාවයෙන් හා සමාජ පීඩනයෙන් හෙම්බත් වූ එසේම හුදකලා වූ ජන කොටසකගේ සුබ සාධනය වෙනුවෙන් කුඩා ශ්‍රමදාන කඳවුරක් ඇරඹූ නාලන්දා විදුහලේ තරුණ ගුරුවරයෙකු වූ ඒ.ටී. ආරියරත්න මහතාගේ එම කර්තව්‍යය මේ සා විශාල ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයක් බවට පත් වේ යැයි ඒ මහතා මොහොතකටවත් නොසිතන්නට ඇත. එහෙත් එය නිකම්ම සිහිනයක් නොවීය. ජාතික මට්ටමේ පමණක් නොව, ජාත්‍යන්තර මට්ටමේ ස්වේච්ඡා සංවිධානයක් ලෙස කීර්තියට පත් වී ඇති ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන (සංස්ථාපිත) සංගමය එම තත්ත්වයට ගෙන ආ ආචාර්ය ඒ.ටී.ආරියරත්න මහතාගේ ස්ව චරිතාපදානය වූ ''භවතණ්හා'' තුන්වැනි වෙළුමට හැඳින්වීමක් සැපයීම මා ලත් භාග්‍යයක් කොට සලකමි.

''භවතණ්හා'' පළමුවැනි හා දෙවැනි කාණ්ඩ කියැවූ කවර කෙනෙකුට වුවද වැටහෙන මූලික දෙය නම් එතුමා සතුව ඇති නිහතමානී ගුණාංගයයි. තම අදහස් ඉදිරිපත් කර තිබෙන සරල ශෛලිය නිසාම නවතාවෙන් කියවා ගෙන ගිය හැකි ඇති ආකාරය ''භවතණ්හා'' තුන්වැනි සහ හතරවැනි වෙළුමෙන් ද මොනවට පැහැදිලි වනු නොඅනුමානය. චරිත කතාවකින් එය කියවන

පාඨකයාට ලබා ගත හැකි පාඩම් එමටය. ආචාර්ය ආරියරත්න මහතාගේ මෙම ස්ව චරිතාපදානය එවන් පදනමකින් යුත් බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ.

භාරතයේ අවිහිංසාවාදයේ පියා ලෙස විරුදාවලිය ලත් මහත්මා ගාන්ධිතුමාගේ ''සර්වෝදය'' සංකල්පයට දේශීය මුහුණුවරක් ලබා දෙමින් බෞද්ධ දර්ශනය හා එහි පිළිවෙත් අනුව සර්වෝදය ව්‍යාපාරය මේ රට තුළ දියත් කරන්නට ආචාර්ය ආරියරත්න මහතා ගත් උත්සාහය සුළුපටු නොවේ. කුඩා ශ්‍රමදාන කඳවුරකින් ආරම්භ කොට මහ වෘක්ෂයක් සේ මේ වන විට ව්‍යාප්තව තිබෙන සර්වෝදය ව්‍යාපාරය ඒ තත්ත්වයට නඟා සිටුවන්නට එතුමා ගත් අප්‍රතිහත ධෛර්යය පැසසුම් කට යුතුය. සමාජය තුළ පවතින අසමතාවය හා අසාධාරණ තත්ත්වයන් නැති කිරීමට ගොඩනැගුණු සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් ලෙස ද හැඳින්විය හැකි සර්වෝදය ව්‍යාපාරය මේ රටේ අහිංසක සමාජ විප්ලවයක් කළ සංවිධානයක් වශයෙන්ද ප්‍රකට වී ඇත.

මේ තත්ත්වයට සර්වෝදය ගෙන ඒමේ දී ආරියරත්න මහතාට අත්විඳින්නට සිදු වූ විවිධ ගැටළු, අභියෝග හා මදි පුංචිකම් ගැන එතුමාගේම වචනයෙන් දැන ගැනීමට සලස්වා ඇති භවතණ්හා ස්ව චරිතාපදානය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වටිනා දැනුම් සම්භාරයක්ද ලබා දෙන සංග්‍රහයක් ලෙස සැලකිය හැකිය. සර්වෝදය ව්‍යාපාරය ගැන නොදන්නා කෙනෙක් අද නැත. ඒ තත්ත්වයට ගෙන ඒමට එතුමාට හැකි වී තිබෙන්නේ තමන් සතු අනුහසාත්මක නායකත්වය නිසායි.

කෙනෙකුගේ කාලය, සිතිවිලි හා ශක්තිය සියල්ලන්ගේම උදාව උදෙසා බෙදා හදා ගැනීම ''සර්වෝදය'' ලෙස අර්ථ දැක්විය හැකිය. පුද්ගලයාගේ උදාව එනම් පෞරුෂෝදය මධ්‍යගත කර ගෙන ගම තුළ ඇති වන උදාව ග්‍රාමෝදය වන අතර, එම උදාවෙන් පසුව සමස්ත රට තුළ ගොඩ නැගෙන උදාව දේශෝදය වේ. ඒ සඳහා රටේ

සියලු දෙනාම එකතුව සහෝදරත්වයෙන් තම තමන්ට අදාල වැඩ කටයුතු බෙදා හදා ගෙන සේවය කිරීම අවශ්‍ය වේ. ග්‍රාමීය සංවර්ධනය හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ එතෙක් පැවැති සාම්ප්‍රදායික චින්තනයට හා ක්‍රියාවලියට වඩා වෙනස් සර්වෝදය ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙල ගොඩනගා ඇත්තේ ගමේ සම්පත් උපරිම ලෙස උපයෝගී කර ගෙන ගම තුළින්මය. තීරණ ගනු ලබන්නේ ගමේ ජනතාවයි. ගැමි ජනතාවගේ භෞතික සුබ සාධනය හා සාමකාමී සහජීවනය ඇති කරලීම උදෙසා සර්වෝදය ව්‍යාපාරය අනුගමනය කරන ප්‍රතිපත්ති හා දර්ශනය ගැන මනා වැටහීමක් ලබා ගත හැකි අන්දමේ තොරතුරු අනාවරණයක් ''භවතණ්හා'' තුන්වැනි වෙළුමටද ඇතුලත් වී තිබෙන බව කිව යුතුය.

ලොව විවිධ රටවල්වලට ගොස් තමා විසින් කරන ලද දේශන ගණනාවක් මේ කෘතියට ඇතුලත්වේ. ආචාර්ය ආරියරත්න මහතාට පෙර'පර දෙදිග රටවල්වලින්ම ලැබුණු සම්මාන හා ඒ සම්මානවලට එතුමා සුදුසු වූ ආකාරය ගැන ද තොරතුරු අපට මෙම කෘතිය තුළින් දැන ගත හැකිය. එපමණක් නොව සර්වෝදය මෙතෙක් පැවැති ගමන් මග ගැනත්, එමගින් ඉටු වූ සේවාවන්වලට පදනම් වූ දර්ශනය ගැනත් මාහැඟි අවබෝධයක් එම දේශන කියැවීම තුළින් කෙනෙකුට ලබා ගත හැකිය. තමන්ට ජාත්‍යන්තර වශයෙන් සම්මාන ලබා දීමට පුරෝගාමී වූ නොයෙකුත් ආයතනවල ප්‍රජා නායකයින්ගේ වතගොත ගැනත්, ඔවුන්ගේ සුබ සාධන වැඩ පිළිවෙලවල් පිළිබඳවත් ප්‍රයෝජනවත් තොරතුරු මෙම කෘතිය තුළ අන්තර්ගත කර තිබීම වැදගත්ය යනු මගේ හැඟීමයි.

ලොව විවිධ නායකයින් හා වෙනත් ලේඛකයින් විසින් ලියන ලද චරිතාපදානයන්ට වඩා ආකෘතිය, ව්‍යුහය හා ඉදිරිපත් කිරීම අතින් නව ආරක් දක්නට තිබීම ''භවතණ්හා'' වේ විශේෂ ලක්ෂණයකි. තමන්ගේ විදේශීය ගමන්වලදී හමු වූ නොයෙකුත් හිතවතුන් ගැන හා ඔවුන් කරන ලද කාරුණික අනුග්‍රහයන් පිළිබඳ නිහතමානීව තම අදහස් ඉදිරිපත් කිරීමට ආචාර්ය ආරියරත්න මහතා සමත් වී ඇත. මෙම සද් ව්‍යාපාරයේ දර්ශනය, ප්‍රතිපත්ති හා

වැඩ කටයුතු ගැන අබමල් රේණුවක හෝ හැඟීමක් දැනීමක් නැති අය විසින් කරන ලද අකටයුතුකම්, කෙනහිලි හා හානිකර තත්ත්වයන් ගැන උපේක්ෂා සහගතව කරුණු දැක්වීමක්ද මෙහි දැකිය හැකිය.

සත්‍ය වශයෙන්ම ආචාර්ය ආරියරත්න මහතාගේ ජීවිතය රෝස මල් යහනාවක් නොවේ. ''හවතණ්හා'' පළමුවැනි හා දෙවැනි වෙළුම් කියවන විට ද වැටහෙන්නේ එතුමා මේ ව්‍යාපාරය ආරම්භ කළ දා සිටම කටුක අත්දැකීම්වලට මුහුණ පා ඇති ආකාරයයි. ඒවාට මේ ප්‍රජා නායකයා මුහුණ දී ඇත්තේ දැඩි චිත්ත ශක්තියකින් යුතුව බව නොකිවමනාය. ප්‍රජා සේවයේ යෙදෙන තරුණ නායක නායිකාවන්ට ආරියරත්න චරිතාපදානයෙන් ලබා ගත හැකි පාඩම් අපමණය. අර්බුද අවස්ථාවන්වලදී කලබල නොවීම, සංයමයෙන් ප්‍රශ්නවලට මුහුණදීම ආරියරත්න මහතාගේ චරිත ලක්ෂණයක් ලෙස හැඳින්වීම යුක්ති යුක්තය. නහී වේරේනි වේරානි ... යන බුද්ධ වචනයට අනුකූලව තමන්ට මුහුණපාන්නට සිදු වූ බාධක හා එදිරිවාදිකම්වලට ද්වේෂ සහගත සිතින් නොව සම සිතින් නොබියව මුහුණ දුන් චරිතයක ලක්ෂණ ''හවතණ්හා'' තුළින් පිළිබිඹු වේ.

තමන් ළඟ සේවය කළ, එසේම තමන් විසින් අත හිත දුන් ඇතැම් අය පසුව තමාට කරන ලද විවිධ අකටයුතුකම් සැලකිල්ලට නොගෙන පොදුවේ කාගේත් හිත සුව පිණිස කටයුතු කරන ප්‍රජා නායකයෙකුගේ දර්ශනය කෙබඳුද යන්න වැටහෙන්නේ මේ චරිතාපදානය කියවන විටය. යුග පුරුෂයෙකු වශයෙන් සැලකිය හැකි, සාමය වෙනුවෙන්, දුප්පතුන් වෙනුවෙන් ඇප කැප වී ක්‍රියා කරන මේ ප්‍රජා නායකයාගේ ස්ව චරිතාපදානය වූ ''හවතණ්හා'' පිළිබඳ මේ සටහන එතුමාගේම වැකි කිහිපයකින් අවසන් කරමි.

''මගේ විශ්වාසය අනුව ප්‍රථමයෙන්ම අවබෝධ කර ගත යුතු කරුණ නම්, මිනිසාගේ සමාජීය දේශපාලනික හා ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මකව සැලකිල්ලට ගෙන වැඩ කටයුතු කිරීම පමණක් අර්ථයක් නැති බවය. එමෙන්ම වැදගත් වන්නේ මිනිසාගේ ආධ්‍යාත්මික විෂයෙහි ඇති විය යුතු ප්‍රගතියයි. එවැනි දියුණුවක්

අත්පත් කර ගැනීම උදෙසා යොදනු ලබන ප්‍රයත්නයන්, එම ජනතාවගේ අධ්‍යාත්මික සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකම් සහිත ජීවන රටාවන් හා කිට්ටුවෙන් බැඳී පවතින්නේ නම් පමණකි ඉන් ජයග්‍රහණය ලබා ගත හැකි වන්නේ.''

මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා,
සමාජ විද්‍යා හා මානව විද්‍යාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
නුගේගොඩ.

පටුන

පිටුව

200.	සදාකාලික වියෝවක් නොවේ කිසිදින මා සිතේ	1216
201.	මගේ මවගේ වියෝව	1223
202.	ශ්‍රී ලංකාවේ පුංචි ගාන්ධි	1232
203.	කලණ මිතුරු - එම්.ඒ. තිලකරත්න	1242
204.	සුමිතුරු මතක - මා හිත මිතුරු ස්ටැන්ලි ප්‍රනාන්දු	1246
205.	සොබා දහම ඔහුගේ සරසවියයි මහාචාර්ය එල්.ජී.හේවගේ	1248
206.	ගරුතර හිමිවරුනි අංජලිකරණීය තුන්නානේ සුමනතිස්ස හාමුදුරුවෝ	1256
207.	වැරදි දෙය පිටුදක සත්‍ය ක්‍රියා කළ යතිවරයාණෝ ගණේගම සරණංකර හාමුදුරුවෝ	1264
208.	ප්‍රබල සර්වෝදය නියමුවෙක් වූ - කිරිමැටියාවේ පඤ්ඤාසාගර හාමුදුරුවෝ	1273
209.	අපේ පණ්ඩිත නාහිමිපාණෝ - නැදලගමුවේ ජිනානන්ද හාමුදුරුවෝ	1278
210.	ලෝක ශාසන සේවයට කැප වූ - යටිපව්වේ රතනසාර ලොකු හාමුදුරුවෝ	1282
211.	සමාවෙන්න සර් අදුනන්න බැරිවයි නතර කළේ	1284
212.	කන්න දුන් අත සපා කන මිනිස්සු	1295
213.	මේ මගේ ''ක්ලයන්ට්'' කෙනෙක්	1300
214.	භවාන්ධකාරයෙන් මා ගොඩ ගත්තේ සර්වෝදයයි - ඒ.ගුණපාල උග්ගල්ල	1305

215. දිය නොසැලෙන පිරුණු කළය 1310
මහාචාර්ය නන්දසේන රත්නපාල

216. අහසින් බහින කුමාරයෝ 1318

217. කුමාරයා අමාත්‍ය ප්‍රොන්ක් බාර ගැනීම 1325

218. නියෝජ්‍ය විනිමය පාලකගේ හුළං බැස්ස හැටි 1330

219. බොදු කිතු හදවත් එක් කළ 1333
මර්සලීන් ජයකොඩි පියතුමා

220. සම්‍යක් ප්‍රයෝග නැති බැරි කමට නේ 1337

221. අජාන් සුලාක් සිවරාක්ෂ 1339

222. ඇමෙරිකාවේ මර්ට් මේසන් පවුල 1343

223. අර්කැන්සාස් ප්‍රජා නායකත්ව සමුළුව 1358

224. ආපදා පැමිණියවුන්ට පංච විධ සංවර්ධන ක්‍රමයක් 1364

225. යුද ආපදාව සැනසුමක් නොවේ උතුරේ ජනතා මෙහෙවර 1372

226. සර්වෝදය භාර අරමුදල 1395

227. ලූ මාකර් අනුස්මරණ දේශනයට ගොස් 1406

228. දිළිඳු කමින් තොර සමාජයක් - 1414
ලූ මාකර් අනුස්මරණ දේශනය

229. හෙලන් කෙලර් ජාත්‍යන්තරය 1430

230. ඇමෙරිකානු ජාතික සූසන් ඊස්ට්මන් මෙනවිය 1440

231. සෙනේගේ සෙනෙහස - රෝම සංචාරය 1445

232. සෑම මිනිසෙකුටම වැටහෙන හොඳම භාෂාව 1448

233. ලෝක සම්පත් ආයතනය 1457

234. මා පෙන්වා දීමට මහන්සි ගන්නා පැත්ත ඔච්චු දුටහ 1464

235.	සර්වෝදය කාර්ය භාරයෙහි කොටස්කාරයෝ	1488
236.	ආවරණය - ධෛර්යය සහ කීර්තිය එය ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍යය	1496
237.	කලෙකින් හමු වූ මිතුරු කැල	1509
238.	ජපන් සමාජයේ මානසික විවේකය දෙන තැනක්	1522
239.	රටට අහිමි කළ මානව හිතවාදියා	1525
240.	දේශනයේදී සමාව ගත් සුරේෂ් කුමාර්	1534
241.	මා හමුවීම 1 - වික්ටර් අයිවන් - පොඩි අතුල	1542
242.	රාවයේ අත්තිවාරම 11 - ලේඛකයා, පාඨකයා හා ප්‍රකාශකයා	1547
243.	රාවයේ අරමුණ 111 - අවදානමෙන් තොර ප්‍රගතියක් නැත	1556
244.	රාවය එළිදකී 1v - වැරැද්දට විරුද්ධව සටන් කිරීම:	1560
245.	හදවතයි - දක්ෂකමයි	1569
246.	කඳුරට සාම පා ගමන	1577
247.	සාගිනි නිවීමේ දායකත්වයට ජාත්‍යන්තර සම්මානයක්	1589
248.	සිංගප්පූරුවේදී මුණගැසුනු හිතවතුන්	1596
249.	විශ්ව ධර්ම ශක්තී	1604
250.	දිවෙහි නොවේ හදවතෙහි ඇති දහම - බුරුම වන්දනාව	1630

200

සදාකාලික වියෝවක් නොවේ කිසිදින මා සිතේ.

මගේ ආදරය දිනා ගත් මා ළඟින්ම ඇසුරු කළ මගේ වැඩිහිටි ඥාතීන්ගෙන් වැඩි පිරිසක් දැනට ජීවතුන් අතර නැත. ඒ අය අද අප අතර නැතත් ඔවුන්ගේ ගුණ රුව තවමත් මගේ මනසේ රැඳී තිබේ. එමෙන්ම ඒ අය ජීවතුන් අතර සිටියදී කළ, කී දෑ වරින් වර මට සිහිපත් වේ. එවිට මට හැඟෙන්නේ ඔවුන් සදහටම මගෙන් ඈත් වී නොමැති බවය. තාවකාලිකව දුර බැහැර ගමනක් ගොස් තව නොබෝ දිනකින් ඔවුන් අප වෙත එනු ඇතැයි මට වරින් වර සිතේ.

මගේ ඥාතීන්ගේ අභාවයන් ගැන කතා කරන විට මා අත්දුටු ප්‍රථම මරණ මංචකය ලෙස මගේ සිතේ සතිටුහන්ව ඇත්තේ මගේ අත්තම්මාගේ මරණයයි. එය සිදුවූයේ 1940 වර්ෂයේය. එයට පෙරාතුව 1937 දී අපේ ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ගේ අපවත් වීම යන්තම් ඡායා මාත්‍රයක් ලෙස මගේ සිතේ රැඳී පැවැතියත් මරණය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මගේ සිත තුළට ප්‍රවිෂ්ට වූයේ මගේ අත්තම්මාගේ මරණය නිසාවෙන් බව සඳහන් කළ යුතුය. ඉන් පසු අපේ පවුලේ මා දුටු ඊලඟ මරණය නම් 1970 අප්‍රේල් 29 දා සිදු වූ මගේ ආදරණීය පියාණන්ගේ අභාවයයි. එය මගේ සිත තුළ දැඩි ශෝකයක් ඇති කළ බව සඳහන් කළ යුතුය. පියාණන්ගේ අභාවයෙන් මාස කිහිපයකට පසුව එනම් 1970 දෙසැම්බර් 09 වැනිදා සිරි අයියා අභාවප්‍රාප්ත විය. 1973 ජූනි 7 වැනිදා පුංචි නැන්දා ද 1976 සැප්තැම්බර් 21 වැනිදා අපේ බාප්පොච්චී ද අභාවප්‍රාප්ත වූහ. මේ හැමදෙනා පිළිබඳ විස්තර. භව තණ්හා. පළමු වෙළුමේ සඳහන් කර තිබේ. ඒ නිසා නැවත මෙහි ඇතුලත් නොකළෙමි.

ඉහත සඳහන් කළ හැම දෙනාගේ ම පොදු ලක්ෂණයක් වූයේ කල්තියා මිය යන දිනය ප්‍රකාශ කොට නිර්භීතව මරණයට මුහුණ දීමය. සිරි අයියා සිය වතුපිටි විකුණා දමා අනුරාධපුරයේ කුට්ටම් පොකුණට නුදුරු තැනක ගෙයක් කුලියට ගෙන ජීවිතයේ

අවසාන කාලය එම පූජනීය භූමියෙහි විවිධ සිද්ධස්ථානවල සිට භාවනානුයෝගීව ගත කළේය. ඔහුගේ පපුවේ හතිය වැඩි වී අපේ මරදානේ ගෙදරට වුත් මා සමඟ ගොස් මහ රෝහලට ඇතුළු විය. හැමදාම දවල් සහ සවස අයියා බැලීමට මම ගියෙමි. එක් සැන්දෑවක ඔහු බැලීමට ගිය අවස්ථාවේ ඔහු මට මෙසේ පැවැසීය.

''මල්ලී මම අද රෑට යනවා. හෙටම නිට්ටඹුවේ සෙනෙවිරත්න මහත්මයා සහ ඩැනී අයියාට පමණක් දන්වා මල්ලීගේ ගෙදර අය සමඟ මගේ අවසාන කටයුතු කනත්තේ දී ඉටු කරන්න. ඊට පසුව නෑදෑයින්ට ඒ බව දන්වන්න'' යනුවෙනි.

වමේ සිට දකුණට
සිරි අයියා, ඩැනි අයියා සහ ඇල්. ඒ. මුදලාලි

අයියා නිතර විහිළු කරන කෙනෙක් නිසා එම කතාව මම එතරම් ගණන් නොගත්තෙමි. ''හොඳයි, හොඳයි ඔය විදියට කරන්නම්කෝ'' කියා මමත් සිනාසෙමින් ගෙදර ගියේ එදා සවස තැප්‍රොබේන් හෝටලයේ මෛත්‍රීපාල සේනානායක මහතාට නාලන්දාවෙන් දුන් රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගිවීම සඳහාය. භෝජන සංග්‍රහය අතරේදී අපේ රියැදුරු පියදාස අයියා ශාලාවේ දොරෙන් ඔලුව දමනවා දැක වහාම එතැනට ගිය මට දැන ගන්නට ලැබුණේ අයියා පැය බාගයකට පමණ පෙර මිය ගිය බවය.

පසු දා පස්වරුවේ අයියා කියූ අන්දමට නීතාත් මමත් මරදානේ පවුලේ සිටි අයවලුනුත් නිට්ටඹුවෙන් පැමිණි දෙතුන් දෙනාත් එකතුවී අවසන් කටයුතු සිදු කළෙමු. නාලන්දාරාමාධිපති පූජ්‍ය පණ්ඩිත හිස්සැල්ලේ ඥාණවිමල හිමියන් ප්‍රධාන මහා සංඝයා වහන්සේ විසින් ආගමික කටයුතු සිදු කරන ලදී. අයියා වෙනුවෙන් දුන් දානයට නෑදෑ හිතවතුන් සියලු දෙනාට ආරාධනා කළ අතර ඇතැමුන් මරණය දැනුම් නොදීම පිළිබඳව මට තදින් දොස් පැවරූහ. මා එයට පිළිතුරු වශයෙන් කීවේ අයියා මැරෙන්නට පෙර ඔහු රෝහලේ සිටි බව මා ඔවුන්ට දැනුම් දී ඇති බව ය.

මා හදා වඩාගත් අම්මාත් බුදු නැන්දාත් පුංචි නැන්දාත් යන තිදෙනාට ම මම එක සේ ගරු කළෙමි. ආදරය කළෙමි. එහෙත් මගේ ආදරය වැඩියෙන්ම හිමි කර ගත්තේ පුංචි නැන්දා යැයි කීම වරදක් නොවේ. මා කුඩා දරුවෙක් ලෙස සිටියදී පුංචි නැන්දා පැය ගණන් මා වඩා ගෙන සිටියාය. නැතහොත් මා ඇයගේ උකුලේ නිදා ගෙන හෝ වාඩිවී සිටියෙමි. බොහෝ විට මා පාසල් ඇරී එන තුරු ඇය ආහාර නොගෙන සිටියාය. මා උණවටුනේ ගෙදරට දන්වා තිබුණේ පුංචි නැන්දාට හිසේරදයක් හෝ හැදුණොත් මට දන්වන ලෙසය. 1973 ජූනි මස 07 වැනිදා උදේ පුංචි නැන්දාගේ පපුවේ අමාරුවකට සෙනෙවිරත්න දොස්තර මහතා කැඳවා ප්‍රතිකාර ගත් බව පුංචි අක්කා මට දුරකතනයෙන් පැවැසීය. එවේලේම මම ජීප් රථයෙන් සවස 5.00 වන විට උණවටුනේ මහ ගෙදරට ගියෙමි. පුංචි නැන්දා බොහෝ වේලාවක් මා සමඟ කතා කරමින් සිටියාය. ඇඳේ

හාන්සි වී සිටියදී ඇය කී එකම දෙය වූයේ ''පුතාට වැඩ තියෙනවා මට දැන් සනීපයි. පුතා යන්න මට අමාරු වුනොත් අක්කා දන්වාවි පුතා යන්න යනුවෙනි. '' මම ආපසු මොරටුවට ආවෙමි. එදා රාත්‍රී පුංචි නැන්දා සදහට ම නෙත් පියා ගෙන තිබිණි.

බුදු නැන්දා අවසාන කාලයේ සිටියේ මොරටුවේ අපේ නිවසේ ය. ඇයට අවශ්‍ය සියලු සත්කාර නීතා හා දරුවන් විසින් ඉටු කරන ලදී. අවුරුදු 100 සම්පූර්ණ වූ බුදු නැන්දා හිටි හැටියේ අසනීප වීම නිසා අපි ඇය ආසිරි රෝහලට ගෙන ගියෙමු. ඒ වන විට කළ හැකි කිසිවක් නොවූයෙන් ආපසු ගෙදර ගෙනවුත් අවශ්‍ය සියලු සත්කාර ඇයට ඉටු කළෙමු. ඇය ද හොඳ සිහියෙන් යුතුව සිට පරලෝ සැපත් වූවාය.

අප පවුලේ සහෝදර සහෝදරියෝ හය දෙනෙක් වූහ. එනම්, ලොකු අක්කා සහ පුංචි අක්කාත් මා සහ මල්ලීත් බාල නංගිලා දෙදෙනාත්ය. අප හය දෙනාගෙන් මට වැඩිමල් පුංචි අක්කා හිටි හැටියේම අසනීප වී ගාල්ල මහ රෝහලේදී ශල්‍යකර්මයකට භාජනය වූවාය. එය සනීප වී විවේක ගැනීමට මොරටුවේ අපේ නිවසට අක්කා පැමිණියාය. ඇය හොඳ සුවයෙන් සිටිත්දී නීතාත් මමත් ඉන්දියාවේ ගාන්ධිග්‍රාම් හා මධුරායිවල බාර ගත් උත්සවයක් සඳහා ගියෙමු.

ලලනා වූලලතා (බේබි අක්කා)

1994 දෙසැම්බර් 2 දා එම උත්සවය නිම කොට රාත්‍රී මධුරායිවල හෝටලයක අපි ලැගුම් ගතිමු. අපි නිදා ගන්නා විට රාත්‍රී 11.00 ට පමණ ඇත. හදිසියේම රාත්‍රී 1.00 ට පමණ සීනුව නාද වූයෙන් අපි දොර ඇර බැලූ විට මාරියප්පන් මහතා හා පුතා පැමිණ, මගේ කණිටු සොයුරිය (බේබි අක්කා) ඊට පැයකට පමණ පෙර රාත්‍රී 11.55 ට පමණ අවසන් හුස්ම හෙළූ ශෝකීය පුවත ගෙන ආවෝය. මේ අප පවුලේ හය දෙනාගෙන් පළමුවරට කෙනෙකු මිය ගිය අවස්ථාව විය. මටත් අප පවුලටත් ඉමහත් වස්තුවක්ව සිටි ඇය මා ළඟට වැඩිමල් සොයුරිය වූ ලලනා චූලලතා අක්කාය.

සසර දුක් සිහි කෙරෙන අනිත්‍යය මෙනෙහි කරන තවත් අවස්ථාවක් මෙතරම් ඉක්මනින් ඇය තුළින් පැමිණේ යැයි මා සිතුවේ නැත. වේදනාව ඉවසා ගෙන මාරියප්පන් මහත්මයලා සමඟ නිවසට ගොස් දුරකතනයෙන් සියලු විස්තර අසා දැන ගතිමු. අපට 4 වැනිදා ත්‍රිච්චිවලින් තිබෙන ගුවන් යානයෙන් යනු හැර, වෙනත් විකල්පයක් නැති නිසා අවසන් කටයුතු සූදානම් කරන ලෙස මල්ලීට පැවරුවෙමු. චාරිකාත් අනිත් දරුවනුත් වඩාම කිට්ටුව සිටියේ මෙම නැන්දාටය. මගේ දුක-සැප බෙදා ගත් කිට්ටුම සොයුරිය වූයේ ද ඇයයි. කුමක් කරන්න ද?

අපි මාරියප්පන් මහතාගේ පුතා සමඟ මධුරායිවලින් පිටත් වී ත්‍රිච්චිවලට ආවෙමු. කල්වේලා ඇතිව ගුවන් තොටුපොළට ගියෙමු. ස්වාමි ප්‍රේමානන්ද ආශ්‍රමයේ සිට පැමිණි දිසා විනිසුරු විග්නේශ්වරන් මහතා ඇතුළු පිරිස ද ගුවන් තොටුපොළේදී හමු විය.

නියමිත වේලාවටත් කලින් යානය කොළඹට ළඟා වූ අතර අපි ඉක්මනින් ගෙදර බලා ආවෙමු. අක්කාගේ දේහය දකින විට, මට ඇති වූ සිත් තැවුල වචනයෙන් කියා නිම කළ නොහැකිය.

රාත්‍රී අටට පමණ මොරටුව මගේ නිවසේදී පාංශු කූලය පවත්වා එදිනම නවයට පමණ දේහය රැගෙන අපි උණවටුන බලා පිටත් වීමු. මල්ලී, වීරේ ඇතුළු පිරිස ගෙදර සියලු කටයුතු සූදානම් කර තිබුණි.

අක්කාගේ අභිමතය පරිදි ඉතා චාම්ව අවමඟුල් උත්සවයේ කටයුතු සිදු කළෙමු. පුවක් කොට හතරක් වටේ සුදු රෙදි දවටා ඇයගේ දේහය මිහිදන් කළෙමු. පින් පොල් ගසක් ඒ මත සිටවන ලදී. අක්කා ජීවත් වූ සරල අන්දමටම ඇයගේ දහම අනුව අවසන් කටයුතු සිදු විය.

මල්ලීගේ අසනීපය නිසා ඉතාම සංවේගයකින් සිටි මට අක්කාගේ ඉක්මන් අභාවය වඩාත් ආධ්‍යාත්මික කටයුතුවලට මගේ සිත යොමු කිරීමට තුඩු දුන්නේය. අප ව්‍යාපාරයේ ද ගුණමකු වගකීමකින් තොර පුද්ගලයන් කිහිප දෙනෙකු බිහි වී ඇති නිසා මගේ කලකිරීම තවත් වැඩි විණි. එහෙත් මා පෙන්වා දෙන මග යන අය රැසක් සිටින නිසා එකවරම මා ගතයුතු පියවර ගැනීම නුසුදුසුය.

නිවානෝ සාම ත්‍යාගයෙන් ලත් යෙන් මිලියන විස්ස මූලික අරමුදල හැටියට ගෙන ඒ.ටී. ආරියරත්න පුණ්‍ය භාරය පිහිටුවීමි. එහි භාරකරුවන් හැටියට නීතා, චාරිකා, උපාලි, වින්යා, ජීවන්, හසන්ති, සදීවා, දියත්, නිම්නා, වෝල්ටර් සහ දයා මුතුකුමාරණ මහතා පත් කිරීමට හා භාර ඔප්පුව අත්සන් කිරීම 1994 දෙසැම්බර් 24 වැනි දින පෙරවරු 10.53 ට යෙදී තිබුණු නැතකට සිදු කෙළෙමි. ප්‍රීති ධර්මසිරි මහත්මිය නීතිඥවරිය වශයෙන් අත්සන් කළාය. එය ඉතා සතුටුදායක අවස්ථාවක් විය. අපරිග්‍රහය පුරුදු කිරීමට තවත් අවස්ථාවක් ලැබුණේය. නීතා හා දරුවන් ද මේ පුණ්‍ය කර්මය සඳහා හදවතින්ම සහභාගිවීම සතුට වැඩිවීමට හේතුවකි.

මේ අන්දමට මා ඇති දැඩි කළ මට ආදරය කළ ඒ කිසිවෙක් අද මා ළඟ නැත. එහෙත් දිනපතාම මම ඔවුන් හා ජීවත් වෙමි. මා කරන සෑම කුසලයක් ම ඔවුන්ට අනුමෝදන් කිරීමට කිසි විටෙක මම අමතක නොකරමි. එය අන් අයගේ සිත් දහමට යොමු කරන යහපත් පුරුද්දක් විය හැකිය. දිළිඳු බවෙන් පෙළෙන අසරණයිනට හව්හරණක් ලබා දීමක් විය හැකිය. බීමට ජලය නොමැති අහිංසක මිනිසුනට සකස් කර දෙන පානීය ජල යෝජනා ක්‍රමයක් විය හැකිය.

ඒ සියල්ල පින් සිදුවන දේවල් ය. අප ජීවත්ව සිටින විට අපේ නෑදෑ හිතවතුන්ට කතා කිරීමට අපි දුරකතන යොදා ගන්නේ යම් සේද එසේම මළවුන් සමඟ අප සම්බන්ධකම් පවත්වන්නේ පින් අනුමෝදන් කිරීමෙන් යැයි මම සිතමි. සමහර විට මේ අය අපට සිහිනෙන් පෙනේ. එවැනි අවස්ථාවලදී විශේෂ දානමාන පවත්වා ආගමික වශයෙන් ඔවුන්ට පින් අනුමෝදන් කිරීම අපේ චාරිත්‍රයයි.

201
මගේ මවගේ වියෝව

මගේ අම්මාගේ වියෝවීම පිළිබඳව පරිච්ඡේදයක් ලිවිය යුතු යැයි මම අදහස් කළෙමි. අම්මා මිය ගියේ 1991 මැයි මස 16 වැනිදා උදේ 4.00 ට පමණය. ඊට සති දෙකකට පමණ පෙර අම්මා හොඳ සුවයෙන් තමන්ගේ වැඩ තමන්ම කර ගනිමින් සතුටින් ජීවත් වූවාය.

එහෙත් බලාපොරොත්තු නොවූ සිද්ධියක් ආරංචිවීම නිසා ඇයට ජීවත්වීමේ ආශාව නැති වී ගියා යැයි මට හැඟේ.

අවුරුදු කෑම මේසයේ ඥාති දියනියක, අම්මා සහ මම

මේ යුගය ශ්‍රී ලංකාවට මෙන්ම අපටද ඉතාමත්ම අවාසනාවන්ත යුගයක් විය. මානව නිදහස පතුලටම කිඳා බැස තිබුණේය. මේ හේතුව නිසා එතෙක් අගමැති වරයා වශයෙන් සිටි ආර්. ප්‍රේමදාස මහතා සමඟ මගේ තිබුණු සම්බන්ධය 1989 වන විට පළුදු විය සෑම ගම්උදා සාංවත්සරික උත්සවයකදීම ප්‍රධාන දේශනයක් පැවැත්වූ මම 1988 වර්ෂයේ ගම්උදා සංවත්සරයට

සහභාගිවීම ප්‍රතික්ෂේප කළෙමි. මේ නිසා අගමැතිතුමා මා සමඟ හොඳටම අමනාප වී සිටි බව මම දැන සිටියෙමි. එතුමා ජනාධිපති වූ පසු එතුමා සමඟ මගේ කිසිම සම්බන්ධයක් නොතිබුණු අතර එතුමා එම පදවියට පත් වී සතියකින් පමණ මටත්, සර්වෝදයටත් හිරිහැර කිරීමට පටන් ගත්තේය. එතුමා මියයන තෙක්ම මටත් සර්වෝදයටත් අප්‍රමාණ කරදර හිරිහැර කළේය. මේ පිළිබඳව වෙනත් තැන්වල වාර්තා ගත වී ඇති නිසා මෙහි විස්තර සඳහන් නොකරමි.

ප්‍රේමදාස මහතා මා සමඟ උරණ වී සිටි බව දැනගත් මටත් සර්වෝදයටත් ඊර්ෂ්‍යා කළ සමහරු අපට පහර ගැසීමට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත්තේය. රාජා වනසුන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ කොමිසම මටත් සර්වෝදයටත් අපහාස කිරීමට වේදිකාවක් කර ගත්තේය. එහි සාමාජිකයෙක් වූ විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අභියාචනාධිකරණයේ සභාපති සහ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති ජේ.එෆ්.ඒ. සෝසා මහතා පමණක් එම කොමිසමේ ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කොට වනසුන්දර වාර්තාවට විරුද්ධව අතුරු වාර්තාවක් ඉදිරිපත් කරමින් ඔවුන් ගොතා තිබූ අසත්‍ය චෝදනා සියල්ලෙන්ම මාත් සර්වෝදයත් නිදහස් කළේය.

සැබෑ තත්ත්වය මෙය වූවත් සමහර පහත් ලේඛකයෝ දිගින් දිගටම මට අපහාස කරමින් ලේක්හවුස් පත්‍රවල අසත්‍ය වාර්තා පළ කළහ. ඒ ජනාධිපතිවරයා සතුටු කිරීමට බව කවුරුත් දැන සිටියහ. සිළුමිණ පත්‍රයේ පළ වූ වාර්තාවක් අම්මා සමඟ සිල් ගන්නා එක්තරා කාන්තාවක් අම්මාට පෙන්වා තිබේ. අවුරුදු 91 ක් වූවත් මෙය කියවූ අම්මා සම්පූර්ණයෙන් කම්පනයට පත් වූවාය. මෙතෙක් අප විසින් ජනාධිපතිතුමා අපට පහර ගසන බව අම්මාගෙන් සඟවා ගෙන සිටියේ අම්මා කුඩා කළ සිටම ප්‍රේමදාස මහතාට ලොකු ආදරයක් තිබූ බැවිනි. වරක් එතුමා අම්මා අරලියගහ මන්දිරයට කැඳවා ප්‍රේමදාස මැතිනිය සමඟ අපට සංග්‍රහ කරමින් පැය කිහිපයක්ම ගත කළේය.

අරලියගහ මන්දිරයේදී අගමැති ආර්. ප්‍රේමදාස මැතිතුමා, අම්මා, නීතා සහ මම

ප්‍රේමදාස මහතා මගේ පුතාට අපහාස කරනවා මේවාට ඉඩ දෙන්නේ ඇයි දැයි කිහිප විටක්ම මගෙන් විමසූ අම්මා එදා සිට ඔත්පල වී ඇඳට වැටුණාය. එම ප්‍රවෘත්තිය සැලවූ පසු ඇය නැවතත් ඇඳෙන් නැගිට්ටේ නැත. ඉතා අමාරුවෙන් ඩබ්ලිව්.ඒ.එස්. සිල්වා වෛද්‍යාචාර්ය තුමාගේ උපදෙස් පරිදි ඇයව අපි සති දෙකක් පමණ ජීවත් කරවූයෙමු. ''ජීවත් වෙමින් මගේ පුතා ආරක්ෂා කර ගන්න මට බැරි නම් මේ ජීවිතය අත හැර ගොස් ඊළඟ ජීවිතයේ සිට හෝ මගේ පුතා බලා ගන්නම්'' කියා අම්මා පැවැසූ බව මට මතකය. ජීවත්වීමට ආශාවක් නැති වූ විට කෙනෙකුට ඕනෑම සුළු අසනීපයකින් වුවත් ජීවිතය අත හැර යන්න පුළුවන්. අදත් අම්මා මට ආරක්ෂාව සලසන බව මට විශ්වාසය.

මවගේ මරණය සැලවීමෙන් පසු පෞද්ගලික නැදෑ හිතවතුන් මෙන්ම සර්වෝදය නැදෑ හිතවතුන් ඇතුළු දහස් ගණනක් පිරිස අප නිවසට පැමිණියහ. රටේ ඉහළ අය විශේෂයෙන් රජයේ

මැති ඇමතිවරුන් බොහෝ දෙනෙකුට ඒමට උවමනා වුවත් ඒ හැමදෙනාම වාගේ දුරකතනයෙන් මා අමතා කියා සිටියේ ඇතැමුන්ට පැමිණිය නොහැකි බවය. සමහරු දුරකතනයෙන් ද ඇමතීමට බිය වූහ. විස්සකට අධික රහස් පොලිස් කණ්ඩායමක් අප නිවස අසල සැරිසරමින් අවමංගල්‍ය උත්සවයට පැමිණෙන රජයේ උසස් නිලධාරීන්ගේ වාහනවල තහඩු අංක පවා ලියා ගන්නා බව එම කණ්ඩායමේ ම රහස් පොලීසියේ නිලධාරියෙක් ඇවිත් මට රහසේම ප්‍රකාශ කළේය. අසනීප වී තද උණකින් පෙළෙමින් සිටි මට මෙය අදහා ගත නොහැකි විය. කෙසේ නමුත් රටේ මැති ඇමතිවරුන් අතරින් ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමා, රූපා කරුණාතිලක ඇමතිතුමා, ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා, ජෙනරාල් සිරිල් රණතුංග, බ්‍රිගේඩියර් ඩෙන්සිල් කොබ්බෑකඩුව ආදී වූ ටික දෙනෙක් පමණක් පැමිණියහ. බ්‍රැඩ්මන් වීරකෝන් මහතා ද මගේ කාමරයට පැමිණ මා හා කතා කර යන්නට ගියේය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පැමිණ පැය හතරකට වැඩි කාලයක් අප සනසමින් කතා කරමින් සිටියාය. භික්ෂූන් වහන්සේලා සියයකට වැඩි පිරිසක් ආරාධනයෙන් මෙන්ම අනාරාධිතව පැමිණ පාංශුකූල කටයුතුවලට සහභාගි වූ අතර ස්තුති කතාව කිරීමේදී මේ වැරදි හැසිරීම පිළිබඳව මට කතා නොකරම බැරි විය. අංශක 104 ට පමණ උණ තිබුණත්

බ්‍රිගේඩියර් ඩෙන්සිල් කොබ්බෑකඩුව මැතිතුමා, නීතා හා ජීවන් සමඟ

ඉතා හිත් වේදනා-වෙන් මේ අවස්ථාවේදී මම කතා කළෙමි. පීඩනයට පත්ව මා සිටි මේ යුගයේ අතිශයින්ම ශෝකජනක දිනය වූයේ මෙයයි. ප්‍රේමදාස ජනාධිපතිතුමාටත් එතුමාගේ අසාධාරණ රජයෙන් මිය ගිය මගේ මෑණියන්ගේ අවසන් කටයුතු කර ගැනීමට පවා අවහිර කිරීමත් ගැන මම තදින් දොස් කීවෙමි. ප්‍රසිද්ධියේම මේ අසාධාරණකම්වලට විරුද්ධව දිවි පරදුවට තබා සටන් කරන බවට ප්‍රතිඥා දුනිමි.



බ්‍රැඩ්මන් වීරකෝන් මැතිතුමා

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශෝක පොත අත්සන් කිරීම

එදිනෙදා වන සිදුවීම් දින සහිතව සටහන් කිරීම මගේ සාමාන්‍ය සිරිතය. ඒ අනුව අම්මා මිය යෑමට දින තුනකට කලින් මවිසින් මගේ දින පොතේ ලියා තිබුණු සටහනකින් මේ පරිච්ඡේදය නිම කරමි. 1991.05.13 දින සහිත ඇති සටහන මෙසේය. ''සෙවනැලි සමඟ සටන් කිරීම දිගටම සිදු වෙමින් පවතී. කා සමඟ සටන් කරන්නේ දැයි නොදනිමි. ඊයේ සවසත් 6.20 ට මරණීය තර්ජනයක් ලැබිණි. ටෙලිෆෝන් කරන පුද්ගලයා ඉතා හෙමින් කතා කොට කැත වචනයෙන්ම තර්ජනය කොට මිනිත්තු බාගයක් යෑමටත් පෙර

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟ

නීතා ඇතුළු දූ දරුවන් දේහයට අවසන් ගෞරව දක්වති.

අවමඟුල් පෙරහැර

රිසිවරය තැබුවේය.'' මේ සර්වෝදය ඉතිහාසයේත් මගේ ජීවිතයේත් මුහුණ දෙන භයානකම අභියෝගය යි. මේ සියල්ල ජනාධිපති වරයාට නැවැත් විය හැකිය. ඔහු එසේ නො කරන්නේ මා හා අමනාපයක් තිබෙන නිසාය. ඒ අමනාපයට හේතු කුමක් දැයි මම නොදනිමි. සෑම රජයකටම සර්වෝදය අරමුණු අනුව කෙරෙන සෑම වැඩ පිළිවෙලකටම අප සහයෝගය දුන් අතර ජනතාවට හෝ රටට

අවමඟුල් පෙරහැර

අහිතකර යැයි අප හිතන කිසිම දේකට සර්වෝදය සහාය නොදීම සර්වෝදය ප්‍රතිපත්තියයි. මේ නිසා ඒකාධිපති පාලනයක් දෙසට රජය හැරෙන විට සර්වෝදය ඊට විරුද්ධව කටයුතු කිරීම පිළිබඳව එතුමා අමනාප වන්නට ඇත. සිළුමිණ, දිනමිණ, ඔබ්සර්වර්, ටයිම්ස් පත්‍ර මෙන්ම ඊයේ ලංකාදීප පත්‍රය ද අපට අවමන් කිරීමට එකතු විය. අධර්මය හිස ඔසවන විට සියළු අධාර්මික බලවේගයන් එක්තැන් වේ. ධර්මය ක්‍රියාත්මක වන විට මොවුන් පසු බසිනු ඇත. ධර්මය අවසානයේදී ජය ගැනීම සිකුරුය.

මෙවැනි අවස්ථාවකදී මා පිට බැරෑරුම් වගකීම් හතරක් පැවරී තිබෙන බව මම දනිමි.

(1) මාගේ පෞරුෂය කෙරෙහි බලපෑම් ඇති නොවන අන්දමට මගේ ශාරීරික මානසික ආධ්‍යාත්මික සහ සාමාජික සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීම,

(2) මාගේ පවුලේ අයවලුන්ගේ සේවක සේවිකාවන්ගේ ගම් නියම්ගම් සර්වෝදය සේවක සේවිකාවන්ගේ ද ඒ අන්දමටම ආරක්ෂාව ඇති කර ගැනීම,

(3) අවස්ථාවාදීව රජය පැත්ත ගෙන ක්‍රියා කරන මගෙන්ම හැදුනු පිරිසගෙන් ව්‍යාපාරය අවුල් නොවීමට ඉඩ නොතැබීම සහ

(4) මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන සර්වෝදය දුර්වල කිරීමට කටයුතු කරන විවිධ ව්‍යාපාරික, රාජ්‍ය නොවන සංවිධානවලින් ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීම.

මගේ මෑණියන්ගේ මරණයෙන් පසු 1991.06.07 වන දින මා විසින් තබන ලද තවත් සටහනක් මෙසේය:

''මගේ මැණියන්ගේ අවසරය හා ආශීර්වාදය නොලබා මා පිටරට යන පළමු වතාව මෙයයි. වෙනදා මා පිට වන විටත් නැවත ගෙදර එන තුරුත් මා ලොවැ කොතැනක සිටියත් ඕ මට දන් සිල් භාවනාවෙන් රැස් කර ගත් පින් දෙවියන්ට අනුමෝදන් කොට මගේ ආරක්ෂාව පැතුවාය. මම ද දිනපතා කිහිපවරක් ඇයට ඒ අන්දමින්ම ආශිර්වාදය පැතුවෙමි. අද මට පින් දීමට සිදුව තිබෙන්නේ වෙනත් දේව ආත්මයක සිටින මගේ මවටය. ඇය ද ඒ තත්ත්වයේ සිට මා වෙනදාටත් වඩා හොඳින් රකින බවට සැකයෙක් නැත''

අද උදේ 1.30 ට එයාර් ලංකා යානයෙන් ඇම්ස්ටර්ඩෑම් බලා පිටත් වීමි. එතැන සිට ස්වීඩනයේ ස්ටොක්හෝම්වලට සහ සන්ඩ්වාල්වලට 09 වනදා යමි. එහි පැවැත්වෙන ලෝක සෞඛ්‍යය සමුළුවේ රැස්වීමක් ඇමතීමට මට තිබේ. චාරිකා වින්යා හා ජීවන් මා හැරලීමට ගුවන් තොටුපලට පැමිණියහ. වෙනදා එන්නේ බන්දුල පමණකි. මෙසේ ඔවුන් ආවේ මට අතරමගදී හෝ ගුවන් තොටුපලේදී කරදරයක් වේ යැයි යන චකිතය නිසා බව මම දනිමි.

ශ්‍රී ලංකාවේ පුංචි ගාන්ධි
SRI LANKA'S LITTLE GANDHI
ද ක්‍රිස්තියන් සයන්ස් මොනිටර් පත්‍රයේ ලේඛක රිචඩ් හාර්ලි විසිනි කේම්බ්‍රිජ් මැසචුසෙට්ස්

ඇමරිකානු ප්‍රභූවරුන් කණ්ඩායමක් ඉදිරියේ සුදු කමිසයකින් සරමකින් සහ ලංකාවේම සාදන ලද සෙරෙප්පු යුවලකින් සැරසී සිටි ශ්‍රී ලාංකිකයෙකි. ඔහු අහංගමගේ ටියුඩර් ආරියරත්නය. ශ්‍රී ලංකාවේ මහා සමාජ පෙරළියක් ඇති කරන අසමාන ජන නායකයෙක් යැයි ඔහුගේ බාහිර පෙනුමෙන් සිතා ගැනීමටවත් නොහැකි තරමට හෙතෙම චාම් හා සරලය. නිහතතමානීය. ඇමරිකාවේ බොස්ටන්හි බ්‍රැන්ඩයිස් (Brandeis) විශ්ව විද්‍යාලයේ පැවැති රැස්වීමකදී මා විසින් ඔහු දුටුහැටියි ඒ,


Sri Lanka's 'little Gandhi'
'ARI-ONOMICS' STANDS ACCEPTED WISDOM ON ITS HEAD

ආරියරත්න කතා කරන්නට පටන් ගත්විට ශාලාවෙන් හමා ආවේ මහත්මා ගාන්ධිතුමා පිළිබඳ අතීත මතකයන් රැගත් සුසුම්ය ''මා දන්නා එක් බුද්ධිමත් ඉන්දියානුවෙක් ධනවතෙක් දෙසට හැරී ඔබ පිරිහී ඇතැයි කීවේය. දුප්පත් මනුෂ්‍යයෙකුට ඔහු

කීවේ ඔබ තවමත් දියුණු වී නැත යන්නය. දුප්පත්කම දෙස තවදුරටත් ආර්ථික අංශයෙන් බැලිය යුතු නැත. එය මිනිස් සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නයකි. සැබෑ වෙනස රඳා පවත්නේ මිනිසාගේ සිතීම තුළ යයි ඔහු පවසයි''.

සංවර්ධනය යන්න ගොඩනගා ගත යුත්තේ පහළ මට්ටමේ සිට ඉහළට බව අලුතින් කිවයුත්තක් නොවේ. නමුත් එය එසේ තිබියදී ශ්‍රී ලංකාවේ ගම්මාන දහස් ගණනක් තුළින් තම සංවර්ධන කර්තව්‍යයන් දියත් කළ මේ ධෛර්යවත් පුරුෂයා සාර්ථක ප්‍රතිඵල ලබමින් විශ්මය ජනක ජයක් අත්පත් කර ගත්තේය. දරිද්‍රතාවයෙන් තවමත් පීඩිතව ඇති ශ්‍රී ලංකාවේ තාක්ෂණික පහසුකම් ඉතාම අඩු අවදියක එවැනි උත්කෘෂ්ඨ සමාජ මෙහෙවරක යෙදුනු ආරියරත්න තම දේශයෙහි ජීවය හා සැලැස්මෙහි වැඩි පංගුවකට හිමිකම් කියන්නේ ඒ නිසාය. සංවර්ධනය වන අනෙකුත් රටවලට ඊර්ෂ්‍යා ඉපදවීමට තරම් හේතුවන්නා වූ ජීවිතයේ ගුණාත්මකභාවය ඔහු ස්ව උත්සාහයෙන්ම අත්පත් කර ගෙන සිටී. ලංකාවේ උතුරු නැගෙනහිර හැරුණු විට ඉතිරි ප්‍රදේශ දියුණු තත්ත්වයක පවතී. එහි පුද්ගලයෙකුගේ ආයු ප්‍රමාණය අවුරුදු 68 කි. කියවීමට ලිවීමට හැකි ප්‍රතිශතය සියයට 90 ක්ද අඩු ළදරු මරණ සංඛ්‍යාවන් ද වාර්තා වී ඇත. අනෙක් කාර්මික රටවල් සමග සසඳන විට සැලකිය යුතු සතුටුදායක තත්ත්වයකි.

ආරියරත්න මහතා ගැන 'Small is Beautiful' හි කර්තෘ වන E. F. Schumacher මහතාගේ ප්‍රකාශය මේ අයුරිනි: 'Fame couldn't have been more delighted by the phenomenon.' අවිහිංසා හා සත්‍යවාදී සාමකාමී ජන සමාජයක් ගොඩනැංවීම සම්බන්ධයෙන් එතුමාගේ මෙම සමාජ විප්ලවය කදිම නිදර්ශනයකි. මෙම ධර්ම තාවයන් සෑම මනුෂ්‍යයෙකුටම, ගමට, රටට, දෑයට පොදු වන්නකි.

ශ්‍රී ලංකාවේ පුංචි ගාන්ධිගේ සංවර්ධනයේ රහස කුමක්ද? කුසගිනි යුද්ධය දිනා ගන්නට නම් දුප්පතා විසින්ම ඔවුනොවුන්ට උදව් කර ගැනීමට අවංකවම උනන්දු විය යුතුය. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ ආරියරත්න මහතාගේ සංවර්ධන ක්‍රමය ගත් විට මන්දපෝෂණය හා දුබලතාවයෙන් පෙළෙන ලෝකය පුරා විසිරී ජීවත් වන කෝටි සංඛ්‍යාත ජනතාවකගේ දුක් පීඩාවන්ට ද එය සුදුසුම විසඳුම වනවාට සැකයක් නැත. තවද ඔවුන්ගේ අධික ජන සංඛ්‍යාවන්ට ලබා ගන්නා වූ විදේශාධාර කොහෙත්ම ප්‍රමාණවත් නැත. දැනටමත් ධනවත් රටවල් විසින් ඒවා කපා දමමින් සිටිති.

සාමාන්‍ය භාවිතයේදී කවුරුත් ඔහු ඇමතුවේ 'ආරි'යනුවෙනි බටහිර අප්‍රිකාවේ මැක්සිකෝවේ සංවර්ධන නායකයින් හමුවීමෙන් පසු OXFAM AMERICA නියෝජිතයින් හමුවීමට ආරි නව එංගලන්තයට පැමිණ සිටියේය. වසන්ත ඍතුවේ එක් සැන්දෑවක ඔහුව පිළිගැනීමට සංවිධානය කරන ලද උත්සවයක් අවසානයේදී මට ඔහු මුණ ගැසුනි. තම අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනීම සඳහා කරන ලද සැළසුම් හා ක්‍රියාත්මක කිරීම්, ඒ අයුරින්ම සාර්ථක කර ගැන්මට හැකිවීමේ රහස කුමක් දැයි දැන ගැනීමට මට ඕනෑ විය. ඒ සඳහා මඳක් නැවතී මා සමඟ කතා කිරීමට ආරි එකඟ විය.

ඔහු අතට අත දී මා සමඟ කතා කරන විට නිහතමානී වූත්, විනෝදකාමී හා සැහැල්ලු මනසින් යුත් ඔහුගේ මහත්මා ගතිය මා අවබෝධ කර ගත්තේ චාලි චැප්ලින් හා ෂරීප් ඕමාර් (SHARIF OMAR) ගේ සම්මිශ්‍ර සේයාවන් සිහිපත් කරවමිනි. ආරියරත්න මහතා ක්‍රියාත්මක වූයේ මහත්මා ගාන්ධි සහ ඔහුගේ අනුගාමික ගම් සංවර්ධන නිලධාරීන්ගේ අඩිපාරේ යමිනි. එනම්, භෞතික හෙවත් ද්‍රව්‍යමය ප්‍රගතියට වඩා මිනිස් වර්ගයාගේ ආධ්‍යාත්මික හා සංස්කෘතික සංවර්ධනය ගැන වඩාත් උනන්දුවීමෙනි. නවීකරණය පසුපස යාම නිසා අපේ මිනිස් සංහතිය විනාශයට පා තබා ඇත. තම ආවේනික වාග් විලාශය මනා ලෙස හසුරුවමින් උස් හඬකින් ආරි දිගටම කතා කළේය.

ඉතාමත් වැදගත් වන්නේ තම ආධ්‍යාත්මික සංවර්ධනය හා බාහිර ක්‍රියාකාරකම් අතර තිබිය යුතු ශක්තිමත් සබඳතාවයයි. අතීත මානවයා එය අත්පත් කර ගෙන සිටියද අද අපට එය අහිමි වී තිබේ. උදාහරණයක් ලෙස ගතහොත් මගේ රට ශතවර්ෂ ගණනාවකට පෙර ආහාර ද්‍රව්‍ය අපනයනය කරනු ලැබූ සෞභාග්‍යවත් දේශයකි. ඒ කාලයේ මිනිසුන් ධාන්‍ය වගා කළේ වැඩි වැඩියෙන් අස්වැන්න උපදවා මුදල් හම්බ කිරීමට නොවේ. ඔවුන් මහන්සි වී ගොවිතැන් කළේ මනුෂ්‍යයින් මෙන්ම සත්වයින්ද පෝෂණය කිරීමේ අවංක පරමාර්ථයෙනි. ඔවුන්ගේ බාහිර ක්‍රියාකාරිත්වය නිරන්තරයෙන් සමාජීය හා ආධ්‍යාත්මික අවශ්‍යතාවයන්ගෙන් පෝෂණය වී තිබුණි. සිටුවන්නා වූ බෝගයන් සරුවට වැඩෙනවා පමණක් නොව, මිනිසාගේ ජීවිතයද සංවර්ධනය වන්නේ එවිටය. අප විසින් ජනතාවට අවබෝධ කරවීමට ප්‍රයත්න දරන්නේ මෙම සත්‍යතාවයයි.

මූලික වශයෙන් ආත්මාර්ථකාමි මිනිසා විසින් ඔහුගේ එම සිතිවිලි නිසාම ගනු ලබන වැරදි උපකල්පන හේතු කොට ගෙන ලෝක ආර්ථිකය අවුල් සහගත තත්ත්වයකට පත්ව ඇත. මහපොළව ශ්‍රමය හා ප්‍රාග්ධනය ආදී දේ අපට ස්වල්ප ලෙස ඉතිරිව තිබෙන වටිනා සම්පත්ය. නමුත් ඉතා අරපරිස්සමින් භාවිත කළයුතු මෙම විරල ශක්තීන් වෙළඳපොලේ සමස්ත අවශ්‍යතාවයන් පිරිමැසීමට ඒකාබද්ධ ලෙස යොදවා ගත යුතුය'යන අදහස කෙතරම් සාවද්‍යද? එසේ වුවහොත් මහපොළව සොබාදහමින්ද ප්‍රාග්ධනය සමාජීය වත්කමින්ද ඈත් වී ශ්‍රමය මිනිස් පෞරුෂයෙන් බැහැරව යනු ඇත. මේ අයුරින් විද්‍යාවෙන් ඵල ප්‍රයෝජනයක් ගැනීමද ලෙහෙසි වන්නේ නැත.

එසේ වුවද ගැටළුව තිබෙන්නේ මෙතැනය. මේ භූමිතලය උදාහරණයක් ලෙස ගත් විට එය වනාහි ආහාර නිෂ්පාදනය සඳහා

අවශ්‍ය වන එක් සාධකයක් පමණි. එම ක්‍රියාවලිය සඳහා පූර්ණ දායකත්වය ලැබෙන්නේ අනෙක් සංරචකයන් මගිනි. පොළොව සොබාදහමින් වෙන් වූ විට ස්වභාවික පරිසරයට විෂ මුසු කරන බව අප විසින් දන දනත් අපට සිදුවන්නේ වැඩි වැඩියෙන් කෘතිම පොහොර එක් කරමින් නිෂ්පාදිත ආහාර ද්‍රව්‍යවල මිල ගණන් තවත් වැඩි කරමින් වැඩි වැඩියෙන් ඉන් ආදායම් ලබන්නටය. නමුත් එසේ තමනට ඕනෑ හැටියට සොබාදහම පාලනය කිරීමට ඔබට බැරිය. මිනිසා සම්බන්ධයෙන්ද ඒ ටිකමය. අප ඔවුන්ගේ ශ්‍රමය මෙන්ම බුද්ධියද තක්සේරු කිරීමට පුරුදුව සිටින්නේ වෙළඳපොලේ මිල ගණන්වලට අදාලව මිස පුද්ගලයාගේ හෝ සමස්ත සමාජයේ සංවර්ධනය පිළිබඳ කිසිම තැකීමක් නොමැතිවය.

'Ari Economics' ලෙස මුලින්ම හඳුන්වා දී ඇත්තේ ආරි විසින් තමන්ගේ පරිචය ඥානයෙන් මානව සංවර්ධනය සඳහා සැළසුම් කරන ලද ආර්ථික ක්‍රමයයි. Ari Economic --- Ari Economics (Conventional Economic Wisdom) එහි ක්‍රියාකාරී සාර්ථක ප්‍රතිඵල පසුගිය දශක දෙක තුළ ඉතා හොඳින් නිදර්ශනය වී ඇත.

ආරිගේ දර්ශනයේ මූලික සිද්ධාන්තයන් ලෙස නම් කළ හැක්කේ පරිසරයත් එහි සුන්දරත්වයත් ආරක්ෂා කිරීම සඳහා මිනිසාගේ තිබිය යුතු ගෞරවාන්විත හැඟීමත් පළමුව මානව සංවර්ධනයත් දෙවනුව ආර්ථිකයත් නංවාලීම පිණිස සමාජ ශුභසාධනයේ යෙදීමත්ය. මෙහිදී සාමූහිකව එක්සත් වී සියළු දෙනාගේම දනුම භාවිතයේ යොදවා ගනිමින් ක්‍රියාත්මක විය යුතුය. විශ්ව විද්‍යාල සහ රාජ්‍ය දෙපාර්තමේන්තු ආයතනවල සිරගත වී තිබෙන විද්‍යාවන් තාක්ෂණයන් ඉන් බැහැරට ගෙන ප්‍රයෝජනයට ගත හැකි අන්දමට පරිවර්තනය කර ගත යුතුය. එම තාක්ෂණයන් ගේ ප්‍රායෝගික භාවිතයන් ජනතාවට හුරුකරවීමෙන් නව සම්පත් ඔවුන් වෙත උත්පාදනය කරදිය හැක. මෙවැනි සාරවත් හා බුද්ධිමත් පරිකල්පනාවෙන් පෝෂණය වූ මෙම සැළසුම් ලංකාවේ ගැමි පරිසරයට ඉතා හොඳින් ගැලපෙන බව මෙම දේශනය මැද හරියේදීම අපට ඒත්තු ගත හැකි විය. ශ්‍රී ලංකාවේ ගැමි නගරබද

දහස් ගණන් ජන කොටස් මෙම ගම් සංවර්ධන ව්‍යාපෘතීන්ට ශ්‍රම හා සම්පත් දායකත්වය ලබාදෙමින් බොහෝ කැපවෙති. රටේ මුළු ජනගහනයෙන් සියයට 80ක් පමණ වන්නා වූ මෙම අසරණ ජනතාවට ජලය, සෞඛ්‍ය, අධ්‍යාපන ආදී පහසුකම් නොමැත. හැත්තෑවේ අගභාගය වන විටත් දරුවන්ගෙන් සියයට 40ක් පමණ වන ප්‍රතිශතයක් මන්දපෝෂණයෙන් පෙලුණහ.

ගාන්ධිතුමාගේ ''සර්වෝදය'' සියල්ලන්ගේම යහපතය. ලංකාවට ගැලපෙන පරිදි එය සියලු දෙනාගේම පිබිදීමය. තමන්ගේ සිතිවිලිත් ශ්‍රමය හා කාලයත් අන්‍යයන්ගේ ශුභසාධනය උදෙසා බෙදා ගැනීම හෙවත් කැප කිරීම ශ්‍රමදානයයි. ලංකාවේ සර්වෝදය ගම් 3000 ක සිටින ස්වේච්ඡා සේවකයින් හැර අප ව්‍යාපාරයේ පූර්ණකාලීන සේවකයින් 7500 ක් පමණ තාක්ෂණික හුරුව ලබා ඇත. රටපුරා සිටින හැම දෙනාගෙන්ම ලැබී ඇත්තේ ශ්‍රේෂ්ඨ කැපවීමකි. ආරි විසින් සර්වෝදය සංකල්පය ග්‍රහණය කර ගත්තේ 1957 දීය. පාසල් ගුරුවරුන් ශිෂ්‍යයින් සමඟ ඈත පිටිසර ගම්මානවලට ගිය ආරි, ගම්මුන් සමඟ ජීවත් වී එහි දුක අවබෝධ කර ගත්තේය. ජීප් රථය නවත්වා අපි කැලය මැදින් සැතපුම් 18 ක් පයින් ගමන් කළෙමු. රාත්‍රී අන්ධකාරයේ පැලකට වී නිදා ගත්තෙමු. ආහාර අතිශයින් හිඟය. මිනිසුන් සුළු දෙයකින් යැපී දිවි ගැට ගසා ගනිති. එක් උදෑසනක කාන්තාවක් දරුවෙකු ප්‍රසූත කිරීමට වේදනාවෙන් කෑගසනු අපට ඇසුනි. එක් මිනිසෙක් ඇයට පිළිසරණවීමට දිව ගියේ, පෙකණිවැල කැපීම සඳහා මළ කෑ අත්පොරව ද රැගෙනය. වෛද්‍ය පහසුකම් ඇති මෙවන් කාලයක එම සිද්ධීන් බොහෝ කනගාටුදායක නොවේද?

අධ්‍යාපනය ගැන ද ආරි කතා කළේ කළකිරීමෙන් යුතුවය. ''මිනිසා ද්‍රව්‍යමය නිෂ්පාදනයක් බවට පත් කරන මෙම අධ්‍යාපන ක්‍රමය නතර කළ යුතුය. අවශ්‍ය වන්නේ මිනිසාගේ අවශ්‍යතා

මොනවා දැයි අවබෝධ කර ගැන්මට උනන්දු කරවන විදියේ අධ්‍යාපන ක්‍රමයකි. අසරණයින්ට උදව් උපකාර කිරීමේ අගය හෙතෙම ශිෂ්‍යයින්ට කියා දුන්නේය. ඉන් අවදි වූ පාසල් ශිෂ්‍යයෝ සති අන්තයේ හා නිවාඩු කාලයන්හි කාණ්ඩ වශයෙන් ගම්වලට ගොස් එහි ළමුන්ට යමක් උගන්වා අත්දැකීම් මෙන්ම දැනුවත් බව දිනා ගත්හ. බෞද්ධයෙක් වුවද ආරියරත්න මහතා ජේසුස් වහන්සේගේ දේව වචනය අවධාරණය කළේය. බයිබලයේ තිබෙන පරිදි 'ඔබ යන සංකල්පය ඔබේ සිතින් බැහැර කළහොත් එවිටයි ඔබට ඔබව සොයා ගැනීමට හැකි වන්නේ'.

මහත්මා ගාන්ධිතුමා අවිහිංසා ධර්මය තුළින් ගම් දියුණු කිරීමේ සංකල්පය ක්‍රියාත්මක කළාට පසු තමාත් එය ආදර්ශයට ගෙන මෙවැනි කර්තව්‍යයක් දියත් කළ බව ප්‍රකාශ කළේය. ගාන්ධිතුමාව ඒ කාලයේ හඳුනා ගෙන නොසිටියද එතුමාගේ ප්‍රධාන අනුගාමිකයන්ද, 1950 අග හරියේදී හැඳින ගත් විනෝබා භාවේතුමා ද ආදර්ශයට ගත් බව කීවේය. ආරි විසින් ඇති කළා වූ සැළසුම් හා සමාජ පරිවර්තනයන්ගෙන් පැහැදිලිවම දැක ගත හැකි වූයේ ගාන්ධි දෘෂ්ටීන්ගේ අනුනාදනීය දර්ශන රටාවය. බෞද්ධ සම්ප්‍රදායික ධර්මතාවයන් සර්වෝදය දර්ශනයට කාවැදී තිබීමත් කරුණාව, දයාව, සමානාත්මතාවය තුළින් ශ්‍රමදානය සාර්ථක කර ගැනීමත් කැපී පෙනෙන්නෙකි. ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික රටාවට හොඳින් ගැලපෙන්නෙකි. යටගියාවේ බලපැවැත්වූ සමහර අසාධාරණ සිරිත් විරිත් සර්වෝදය දර්ශනයෙන් වෙනස් කිරීමට හැකි විය. ඒ කාලයේ උසස් කුලවන්තයෝ පහත් කුලවල අයට උඩුකය වැසෙන්නට ඇඳුම් ඇඳීමට ඉඩ නොදුන්හ. පාසල්වල ඔවුන්ගේ දරුවන් අකුරු උගත්තේ බිම ඉඳගෙනය. එය එසේ වී නමුත් සර්වෝදයේ පාරවල් කැපීම වැනි ශ්‍රමදාන ව්‍යාපෘතිවලදී උස් පහත් සියල්ලෝම උරෙන් උර ගැටී එක සේ මහන්සිවී වැඩ කළහ. ඉන්දීය ගම් සංවර්ධකයෝ ස්වේච්ඡාවෙන් ඉඩම් බෙදා දීම දිගටම

කළහ. ආරි විසින් මෙය පරිවර්තනය කළේ තමන්ගේ ශ්‍රම ශක්තිය, කාලය අන්‍යයන්ගේ යහපතට යෙදවීමේ ශ්‍රමදාන මුහුණුවරකටය. ශ්‍රමදානය කළ අයට ගෞරව දැක්වීම සඳහා ආරි දානවල් දුන්නේය. එය හුදෙක්ම මිනිසාට ගෞරව දැක්වීමය. එය නිදර්ශනය කිරීමට ඔහු උපමා කතාවක් ගෙන හැර දැක්වීය.

එක්තරා කවියෙකුට උපහාර දැක්වීමට සිතූ ඉන්දියානු රජ කෙනෙක් ඒ සඳහාම ප්‍රිය සම්භාෂනයක් සංවිධානය කර කවියාට ආරාධනා කළේය. සාමාන්‍ය ඇඳුමින් සැරසී උත්සවයට පැමිණි කවියාට රජ ඇඳුමක් නොමැති නිසා ආපසු හරවා යවන ලදී. ඉන්පසු ඔහු රජ ඇඳුම් කට්ටලයක් සොයා ඇඳ භෝජන සංග්‍රහය පටන් ගන්නා වේලාවටම එහි ගියේය. තමා වෙත ප්‍රදානය කරනු ලැබූ කෑම වර්ග එකෙණෙහිම ඔහු තම සාක්කුවලට ඔබා ගත්තේය. රජතුමා විසින් එය දක්නා ලදුව 'ඔබට පිස්සු දැයි' කවියාගෙන් ඇසීය. උතුමාණෙනි, මෙම උත්සවය මට ප්‍රණාමය දැක්වීමක් නොව මගේ ඇඳුම් කට්ටලයට ගරුසරු දැක්වීමකි. කවියා පිළිතුරු දුන්නේය.

සර්වෝදය සේවකයින් විසින් අප ව්‍යාපාරය සමාන කළේ වැඩි වැඩියෙන් බුරන පුංචි බල්ලෙකුටය. ඒ හැම විටම දේශපාලනය නැමති ලොකු බල්ලා එළවා දැමීමටය. ආරිගේ සමාජ පෙරළිය හැම විටම රටේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිරීතිවලට අනුකූලව පැවතීමද එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට රුකුල් ලැබීමක් විය. නමුත් සමහර දේශපාලඥයින්ගේ සැකයටත් එදිරිවාදිකම්වලටත් ලක් වූ අවස්ථා තිබුණි. එක්දහස් නවසිය හැට ගණන්වලදී සමහර දේශපාලඥයෝ ආරිව ඝාතනය කිරීමට මැරවරයින් කුලියට ගත්හ. ආයුධ සන්නද්ධ මැරවරයා හමුවීමට කෙළින්ම ගිය ආරි ඔහු සමඟ කරුණු කාරණා කතා කිරීමෙන් පසු ආරිගේ වචනවලට ගෞරව කළ හෙතෙම තම කුමන්ත්‍රණය එතැනින්ම නිශ්ප්‍රභා කර ගත්තේය.

1974 දී පීලික්ස් ඩයස් බණ්ඩාරනායක අධිකරණ ඇමතිවරයා සර්වෝදයට විරුද්ධව බොරු චෝදනා ගොනු කළ ද අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ පුද්ගලික විශ්වාසය ගෞරවය ආරිට ලැබීමෙන් ගැටළු සමතයට පත් විය.

දේශපාලන කරදර කාලවලදී ආරි කීවේ කුමක්ද? ''අපි අපේ අනුකම්පාව විරුද්ධවාදීන් වෙත පතුරුවා හැරිය යුතුය. අපි ඔබලාට වෛර නොකරන්නෙමු. ඔබ විසින් විශාල වරදක් කර ගන්නේ ඔබටමය'' යන්න ය.

දේශපාලන පළිගැනීම්වලට හසු නොවී බලකාමී දේශපාලනයෙන් ඈත් වී අපේ ප්‍රතිපත්ති තුළ පමණක් සිටීමට අපට හැකි නමුත් අපි ඒ ආකාරයෙන්ම ක්‍රියා නොකළෙමු. ජේ. ආර්. ජයවර්ධන නව රජය පැමිණි විට එතුමා මෙහි පැමිණ අප ව්‍යාපාරය බොහෝ වටිනා එකක් යැයි තක්සේරු කළේය. එතැන් පටන් අපට රජයේ සහයෝගය ලැබිණි. සිවිල් නීති කඩ කිරීම සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද? අධිකරණ ඇමතිට අනෙක් ඇමතිවරුන්ද ඔබට විරුද්ධව සහයෝගය දුන්නේ නම් ඔබ ඊට දක්වන ප්‍රතිචාරය කුමන ආකාරයේ එකක්ද? යි මම ඇසීමි.

එසේ වී නම් මා ක්‍රියා කරන්නේ බලකාමී දේශපාලන ක්‍රමයට නොවේ. අවිහිංසා සටන මගේ ප්‍රතිපත්තියයි. ඔවුන්ගේ පාපතර දේශපාලන ක්‍රියා මට ඔප්පු කරන්නට හැකිව තිබුණා. නමුත් ඒ සඳහා වැය වන කාලය ශ්‍රමය අසරණ ජනතාව වෙනුවෙන් යමක් කිරීමට වැය කළ යුත්තක් මෙවැනි දේශපාලන සටන් වෙනුවට අප සේවකයන් රජය සමඟ සාර්ථක සුහද සබඳතාවයක් ගොඩනඟා ගෙන තියෙනවා. සර්වෝදය සාම කමිටු මගින් දැනට රටේ පවතින ප්‍රචණ්ඩ අර්බුදකාරී තත්ත්වයන් අඩු කරලීමට ක්‍රියා කරන අතර, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සංවර්ධනය සඳහා ද පොලිස් නිලධාරීන්ට මානව දයාව හුරුකරවීම උදෙසා ද සර්වෝදය පාඨමාලා ලබා දෙන ලෙස රජය අපෙන් ඉල්ලීමක් කර ඇත. මම ආරිගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවෙමි.

1) සර්වෝදය ශ්‍රමදානය වැනි ප්‍රතිසංස්කරණ සංකල්පයක් මේ විදියට දිගටම ගෙන ගිය හැකිද?

2) සර්වෝදය විසින් අපේක්ෂා කරනු ලබන සෞභාග්‍යවත් රන්මය ගැමි ලෝකයට නවීන අභියෝගයන්ට මුහුණදීමට නොහැකි බැව් බටහිර ආර්ථික විශේෂඥයින් තර්ක කරති. මේ ගැන ඔබේ අදහස් කවරේදැයි මම විමසීමි. ඉතා දක්ෂ ලෙස ආරි පිළිතුරු දුන්නේය

තමන්ගේ දර්ශනය හරියටම නිවැරදි බව ප්‍රථමයෙන් ඔවුන් විසින් මට පෙන්වා දිය යුතුය. අද මිනිසාගේ හිත රෝගී වී ඇත. භෞතික ලෝකය ද ක්‍රමයෙන් දූෂණයට ලක්වෙමින් පවතී. ජනාධිපතිවරයෙකුට තම රහස් ආරක්ෂක බලඇණිය නැතිව අද නිරුපද්‍රිතව පාරේ ගමන් කළ හැකිද? ආහාර ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍යවලින් විනාශ වී ඇත. විකිණෙන්නේ ද වැඩි මිල ගණන්වලටමය. අධික ලෙස තෙල් වර්ග භාවිතය නිසා වැඩිකල් නොගොස්ම මිනිස් වර්ගයා විශාල අර්බුදයකට මුහුණපානු ඇත. ලක්ෂ ගණන් අසරණ මිනිසුන් හාමතේ සිටියදී අනවශ්‍ය සුඛෝපභෝගී භාණ්ඩ පිටරටින් ගෙන්වීමට ඩොලර් කෝටි ගණන් වැය කරති. සෞභාග්‍යවත් රන්මය යුගයක් අප බලාපොරොත්තු වන්නේ කෙසේද? මට හිතෙන්නේ මුළු ලෝකයම මුලාවේ වැටී ඇති බවක්ය. ආරිගේ මතය අනුව නවීකරණය වනාහි කාලයේ ප්‍රශ්නයක් නොව එය මිනිසාගේම මති මතාන්තර හෙවත් දර්ශනය සමඟ සම්බන්ධ වූවකි.

අප සතුවන්නා වූ බලශක්තියත් ද්‍රව්‍යමය භාණ්ඩ ප්‍රමාණයත් අනුව බලන විට එයට සරිලන පරිදි අපට ලැබිය යුතු ප්‍රබෝධය හෙවත් සතුට සත්‍ය ලෙසම අප විසින් අත්පත් කර ගෙන ඇත්ද යන්න තීරණය කිරීමට සුදුසු කාලය පැමිණ ඇත. නියම තෘප්තිය රඳා පවතින්නේ අන්‍යයන් සමඟ සතුටින් සිටීමට අපට ඇති හැකියාව මතය. ප්‍රමාද නොවී මදක් නැවතී අවංකව මේ ගැන සිතිය යුතුය. අපේ සංකල්පයට අනුව ක්‍රියාත්මක වෙමින් එය සිතමින් අන්‍යයන්ගේ යහපත සඳහා එය උච්චාරණය කරමින් අප සතු යමක් වෙත් ද අනුන්ගේ යහපත උදෙසා උපරිමයෙන් එය ප්‍රදානය කරමින් අපි සේවයේ අපරිමිත සතුට භුක්ති විඳින්නෙමු.

ආරි කතාව අවසන් කළේය. තවත් ඩොලර් මිලියනයක් අවශ්‍ය යයි ඔබට සිතුනොත් එය සිතමින් උච්චාරණය කරන්න. මම දැනට මා සතු මිලියනය ප්‍රවේශමෙන් භාවිතයට ගන්නෙමි.

කලණ මිතුරු
එම්.ඒ. තිලකරත්න මහතා

සාමාන්‍යයෙන් විදේශ සංචාරවලදී ගුවන් යානයේදී හෝ හෝටල තුළ දී හෝ ගත කරන කාලය ප්‍රයෝජනයට ගනිමින් මම දින්පත්‍රම වාගේ වැදගත් සිදුවීම්වල මතක සටහන් ලීවෙමි. අද 1986 සැප්තැම්බර් 02 දා, මම පෑන අතට ගත්තේ වාර්තා කළ යුතු වැදගත් සංවේගදායී සිද්ධියක් ලියා තැබීමටය.

එම්. ඒ. තිලකරත්න මහතා

අපේ , සර්වෝදය ව්‍යාපාරයේ ආරම්භක සාමාජික යෙක් ලෙස ක්‍රියා කළ මගේ කල්‍යාණ මිත්‍රයෙක් වූ එම්. ඒ. තිලකරත්න මහතා ටික කලක් අසනීපව සිට, පසුගිය 28 වෙනිදා රාත්‍රී සඳහටම අපෙන් සමුගෙන තිබුණි. අගෝස්තු 31 වන ඉරිදා ඔහුගේ අවසන් කටයුතු කනත්තේ ආදාහනාගාරයේදී සිදු කරන ලදී. අවසාන වරට මා ඔහු සමඟ කතා කළේ, සති තුනකට පමණ පෙර ඔහුගේ නිවසේදීය. එදා සවස මහරෝගශාලාවට ඔහු බැලීමට මා ගිය නමුත්, හෘද යන්ත්‍රය සවි කර ඔක්සිජන්ද දෙමින් සිටි ඔහුට, සිහිය තිබුණේ නැත. තිලක් මිය යන විට ඔහුගේ වයස 57 කි. තම ආදරණීය බිරියත්, දස වසරක් පමණ වයසැති පුතාත් මෙලොව තනිකර දමා ඔහු සසර ගමනේ ඉතිරිය ආරම්භ කර ඇත.

ඒ කාලයේ ඉතාලියේ ලංකා තානාපති අප මිත්‍ර එම්. ඒ. පියසේකර මහතා තිලක්ගේ වැඩිමල් සොහොයුරාය. ඒ කාලයේ

කොළඹ නාලන්දා විද්‍යාලයේ සමාජ සේවා සංගමයෙන් ඇරඹූ කනතොළුව සංවර්ධන ව්‍යාපෘතියේ පුරෝගාමීන් හැටියට කටයුතු කළ කිහිපදෙනා අතරින් තිලක් ද කෙනෙකි. ඔහු අප සංගමයේ උප සභාපතිවරයෙක් ද විය. ධර්මසේන සේනානායක, කමල් දිසානායක, ධර්මා ගුණසිංහ, තිලක් සහ මා එදා සිට අද වනතුරු නොවෙනස්ව සර්වෝදය ව්‍යාපාරයේ සිටි අයවලුන්ය. මේ නිසා තිලක්ගේ අසනීපය ගැනත්, අභාවය ගැනත් අප හැම දෙනාටම ඇති වූයේ බලවත් සංවේගයකි.

කලා උපාධිධාරියෙකු වූ තිලක්, ඔහුගේ එම්. ඒ. (ශාස්ත්‍රපති) උපාධිය සඳහා රචනා කළ නිබන්ධය ''ආචාර්ය විනෝබා බාවේතුමාගේ අධ්‍යාපනික දර්ශනය'' නම් විය. ඒ කාලයේ සෑම සන්ධ්‍යාවකම අප නිවසට පැමිණි ඔහු, අපේ රටේ පවතින අධ්‍යාපන ක්‍රමයත් එය වෙනස් කළයුතු ආකාරය ගැනත් පැය ගණන් අප හා සාකච්ඡා කළේය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අධ්‍යාපන අධ්‍යක්ෂක ලෙස සේවය කළ තිලක්ට, මේ රටේ අධ්‍යාපනය හරි මගකට ගෙන ඒමට තදබල අවශ්‍යතාවක් තිබුණි. ඒ කාලයේ මරදානේ දෙල්ගහයටගෙදර අපේ නිවසේ උඩුමහලේ පැවැත්වූ මෙම සාකච්ඡාවන්ට සහභාගි වූ තවත් අය සිටියහ. එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා, එවකට කුමාර විදුහලේ විදුහල්පතිව සිට පසුව විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් වූ ධර්මසේන අරම්පත්ත මහතාත් මහාචාර්ය එල්. ජී. හේවගේ මහතාත් ඒ අතර වූහ.

මුලින්ම පවත්වන ලද කනතොළුව කඳවුරේදී තිලක් කෙත - රම් මහන්සි වී සිත කය වෙහෙසවා වැඩ කළේ ද කියතොත්, කඳවුර අවසාන වීමට පෙර ඔහු ලෙඩ වීමෙන් මට කොළඹ රැගෙන ඒමට සිදු විය. ඉන් පසුවද අප විසින් ඈත ගම්මානවල පැවැත්වූ කඳවුරු සියල්ලටම වාගේ තිලක්ගේ සහභාගිත්වය නොඅඩුවම ලැබුණි. ඔහු නිතරම සර්වෝදයේ දාර්ශනික පැත්ත අළලා කතා කළේය.

අකටයුතුකම් කළ තරුණයින් කිහිප දෙනෙකු වරක් සංගමයෙන් නෙරපා දැමීමට සිදුවිය. අප හා අමනාප වූ ඔව්හු, ඊට විරුද්ධව උසාවි ගියහ. ඒ අවස්ථාවේදී ඔවුන් විසින් මට පෞද්ගලික අපහාස කරනු ඇතැයි සැක කළ තිලක්, සංගමයේ ප්‍රධාන ලේකම් හැටියට එවකට සභාපතිව සිටි එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතාද සමඟ මා වෙනුවෙන් උසාවි යෑමට ඉදිරිපත් විය. එම ක්‍රියාවෙන් ඔහුගේ කල්‍යාණ මිත්‍රත්වය මම තේරුම් ගතිමි.

1967 දී මහත්මා ගාන්ධි ශත සංවත්සර උළෙල එවකට සෙනෙට් සභාපතිව සිටි ඒ. රත්නායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ විට එහි සම ලේකම්වරයෙක් වශයෙන් සියලු බර කරට ගෙන මා සමඟ වැඩ කළේ තිලකරත්න මහතාය.

තිලක් සැහැල්ලුවෙන් ජීවිතය ගත කළ කෙනෙකි. ඔහුගේ දිවියේ එම පාර්ශවය ගැන දැන සිටියේ කුළුපග මිත්‍රයන් වූ අප කිහිප දෙනෙක් පමණි. මුහුණේ සිනහවක්වත්, නොපෙන්වා හාස්‍ය ජනක කතා කියමින් ගමන් යන විට ඔහු අප හොඳට හිනැස්සුවේය. එයින් එක කතාවක් මට මතක් වේ.

එය ඇමරිකාවේ ජනාධිපතිව සිටි ඒබ්‍රහම් ලින්කන් ගැනය. ජනාධිපති ලින්කන් හමුවීමට බොහෝ දෙනා එති. ඔවුහු විවිධ වූ විෂයයන් ගැන ජනාධිපතිට තම අදහස් පළ කරති. කෙනෙක් කාමරයට පැමිණ පිටව ගියාට පසු, ලින්කන් හමුවට එන ඊළඟ තැනැත්තා කතා කරන්නේ එම විෂයට ඉඳුරාම වෙනස් වන තවත් දෙයක් ගැනය. මේ සියලු දෙනාටම කන් දී සිටින ජනාධිපති ලින්කන් අවසානයේදී කියන්නේ 'ඔබ කියන දේ තුළ යමක් තිබෙනවා' යන්නය. ලින්කන් ආර්යාවට ජනාධිපතිගේ මෙම ප්‍රතිචාරය රිස්සුවේ නැත. ඕ දවසක් ලින්කන්ට මෙසේ කීවාය.

''ඒබ්‍රහම් ඔබ අමෙරිකාවේ ජනාධිපති. ලෝකයේ මහා බලවතෙක්. ඔබ ඉදිරියට එන හැමෝටම ඔබ කියන්නේ ඔබ කියන දේ තුළ යමක් තිබෙනවා'' යන්නයි.

''ඇයි ඔබට ධෛර්යය නැත්තේ, ඔබ කියන දේ තුළ කිසිවක් නැතැයි'' කියන්න?.

ලින්කන් ආර්යාවගේ මේ කතාව ඉවසිල්ලෙන් අසා සිටි ජනාධිපති ලින්කන් පැවැසුවේ මෙසේයි:

''ඒක ඇත්ත ඔබ කියන දේ තුළත් යමක් තිබෙනවා''

මෙවැනි හාස්‍යජනක කතාන්තර රැසක්ම තිලක් අප සිනහ ගන්වමින් පැවැසූ හැටි මට තවමත් මතකය.

විවාහ වීමෙන් පසුත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ධූරය බාර ගැනීමෙන් පසුත්, තිලක්ට එතරම් කාලයක් සර්වෝදය වෙනුවෙන් කැප කිරීමට නොහැකි විය. එහෙත් සර්වෝදය විධායක සභාවේ සහ වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයෙක්ව සිටිමින්, අවසන් ගමන් යන තෙක්ම ඔහු සර්වෝදය වෙනුවෙන් වැඩ කළේය.

අපේ ආදරණීය තිලකරත්න සොහොයුරාට නිවන් සුව පතමු!

සුමිතුරු මතක
මා හිත මිතුරු ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා

ලියුකේමියා රෝගය නිසා අඩු වයසෙන් ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා අභාවයට පත්වූයේ මා දිවයිනෙන් බැහැරව ගොස් සිටි කාලයේය. මිය යෑමට ප්‍රථම දින ඔහුගේ අවමගුල් උත්සවයේ 'පෝල් බෙයරර්' කෙනෙක් හැටියට පැමිණෙන ලෙස මට ද දන්වන ලෙස තම බිරිඳට පවසා ඇත. නීතා විසින් දන්වන තුරු මා පිටරට ගොස් සිටින බව ඔවුන් දැන සිටියේ නැත.

ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා දකුණු පස

මට මුලින්ම ස්ටැන්ලි මුණගැසුණේ 1959 හෝ 1960 දී පමණය. අප සෞඛ්‍යදාන ව්‍යාපාරය අරඹන විට ඔහු ලැජ්ජාශීලී ගතියෙන් යුත් නමුත්, ශක්තිමත් ක්‍රියාකාරී තරුණයෙකි. රතු පාට ස්කෝඩා වර්ගයේ වාහනයක් ඔහුට තිබුණේය. මොරටුව ලුනාව උයන පාරේ 'මිථිලා' නම් වූ ලස්සන අලුත් නිවසක ඔහු පදිංචිව සිටියේය. විශාල වත්තක් හා පිහිනුම් තටාකයක් එහි තිබුණි.

බොහෝ අවස්ථාවලදී මා මරදානේ සිට සති අන්තය ගත කිරීමට මිරීලාවට පැමිණියෙමි. ඒ කාලයේ කිහිප වරක්ම ඔහු මා සමඟ නුවරඑළියට රිය පදවා ගෙන ගියේය. ඉතා වේගයෙන් රිය පැදවූ නමුත්, ස්ටැන්ලි ආරක්ෂාකාරී රියැදුරෙක් විය. අප දෙදෙනාගේ හිතවත් කුළුපග මිත්‍රත්වය නිසාම, අපේ විවාහයේ සාක්ෂිකරුවෙකු හැටියට කරුණානන්ද මහතා සමඟ අත්සන් තැබීමට මම ඔහුට ඇරයුම් කළෙමි.

විවාහ වීමට ආසාවක් නොතිබුණු ඔහු බොහෝ විට මගෙන් ඉල්ලා සිටියේ 'මිරීලා' නිවාසය භාවනා මධ්‍යස්ථානයක් හැටියට ගොඩනැංවීමට සැලසුමක් සාදා දෙන ලෙසය. ස්ටැන්ලි වෛද්‍ය ලක්ෂ්මන් සිල්වා මහතාගේ ඥාතිවරයෙකු නිසාත්, ඔහු සෞඛ්‍යදාන ව්‍යාපාරයේ භාණ්ඩාගාරික වශයෙන් ඒ කාලයේ සේවය කළ නිසාත්, මා සෞඛ්‍යදානයෙන් ඈත් වන විට ස්ටැන්ලිගෙන් ද නොදැනුවත්වම ඈත් විය. ඔහුගේ මංගල උත්සවයට සහභාගි වූවා හැර, ඔහුගේ විවාහයෙන් පසු ළඟ ආශ්‍රයක් නොතිබුණි. එහෙත් මිරීලා නිවස වරක් ටොන්ට ජීවත්වීමට දෙන ලෙස මා කළ ඉල්ලීමට එකඟ වූ ඔව්හු, එම නිවස කලක් අපට බදු දී තිබුණි. ඉන් පසු ද අප නැවත හමුවූයේ ඉඳහිටය.

ස්ටැන්ලිගේ අභාවය ගැන ඇසූ මට අතීත සිදුවීම් සිහිපත් වේ. සීතලේ වෙව්ලමින් ශ්‍රීපාදය නගිමින්, සෞඛ්‍යදාන කඳවුරුවලට අපි වෙහෙස වූ හැටි වෛද්‍ය එච්.සී.එච්. සොයිසා මහතාගේ (ඔහුගේ මස්සිනාගේ) 'ශාට්මෝර්' වත්තේ අප කාලය ගත කළ හැටි හා බෞද්ධ පුනර්ජීවයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීමට සැලසුම් පිළියෙල කළ හැටි මට තවමත් මතකය. අවංක ඍජු හා ජාති හිතෛෂී ඔහු කාර්ය ශූරයෙක් විය. සෞඛ්‍යදාන ව්‍යාපාරය සර්වෝදයෙන් වෙනත් මගකට යොමු වීම නිසා, ස්ටැන්ලිගෙන් රටටත්, ඔහුටත් ලබාදීමට තිබූ සේවය ඉෂ්ට කිරීමට මට නොහැකි වීම ගැන මම කනගාටුවෙමි.

ඔහුට නිවන් සැප ලැබේවා'යි මම පතමි !

සොබා දහම ඔහුගේ සරසවියයි.
මහාචාර්ය එල්. ජී. හේවගේ මහතා


මහාචාර්ය එල්. ජී. හේවගේ මහතා

පරාධීන හා ස්වාධීන යන යුග දෙකෙහිම ජීවත් වෙමින් රට දැය මෙන්ම, සමස්ත ප්‍රජාව සම්බන්ධයෙන්ම අත්දැකීම් සම්භාරයක් අත්පත් කර ගත් මහාචාර්ය හේවගේ මහතා මිනිසුන් අතරේ මිනිසාට ඉමහත් ශක්තියක් වූ ශ්‍රේෂ්ඨවන්තයෙකි. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ක්‍රම ක්‍රමයෙන් අධෛර්ය සම්පන්න වූ ලක්වැසි ජනතාව එම තත්ත්වයෙන් මුදවා, ඔවුනට පුනර්ජීවයක් ලබා දීමේ අසහාය කටයුත්ත සඳහා තම දිවි කැප කළ මහාචාර්ය හේවගේ මැතිතුමා, තම ජීවිතය පරමාදර්ශීය අන්දමින් ගත කරමින් එම ගුණධර්ම ඔපවත් කළේය. එතුමා අධ්‍යාපන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි. ජාත්‍යාලය, දේශානුරාගය පිළිබඳ උණුසුම් හැඟීම් තරුණ පරපුරට කාවැද්දවීමට අධික වෙහෙසක් ගත්තේය, ඒ සඳහා පොත් ලිවීමෙන් විශාල දැනුමක් ශක්තියක් සමාජයට ප්‍රදානය කළේය.

බෞද්ධ ජීවන රටාව ප්‍රචලිත කිරීමට ජාත්‍යන්තර ලෙස වටිනා කාර්ය භාරයක් ඉෂ්ට කළ එතුමා, ලෝක සාමය ඇති කිරීමට නව ප්‍රවේශයක් සොයමින් 'ආගම හා සාමය පිළිබඳ ලෝක මණ්ඩලය' පිහිටුවීමට කටයුතු කළේය. බෞද්ධ ප්‍රතිපත්ති නිවැරදිව අනුගමනය කරමින්, එතුමාගේ දිවියෙන් රටට ලෝකයට ලබා

දුන්නේ උතුම් ආදර්ශයකි. හේවගේ මහතා උපත ලැබුවේ ගාල්ලේ දොඩන්දූවේදී 1913 අප්‍රේල් 29 වැනිදාය. ගාල්ලේ හැගොඩ මහා විද්‍යාලයේදි මූලික අධ්‍යාපනය ලබා, එම පාසලේම උප ගුරුවරයෙකු ලෙස සේවය ආරම්භ කර, ඉන්පසු දිවයිනේ පාසල් රැසකම උප ගුරු මුල් ගුරු තනතුරු හෙබවීය. ගුරු සේවය අවසන් වූයේ 1965 දී ගංගොඩවිල විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය වරයෙකු ලෙස පත් වීමක් ලැබීමෙනි. විශ්ව විද්‍යාල සේවයට එක්වූ පසු, බෞද්ධ ජීවන දර්ශනය පිළිබඳ ස්වතන්ත්‍ර පර්යේෂණයන්හි යෙදුන එතුමා, ඒවා ප්‍රචලිත කිරීම සඳහා වෙහෙස දැරීය. බෞද්ධ දර්ශනයට අනුකූල වූ අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමට සිහින මවමින් කටයුතු කළේය. බෞද්ධ මහා සම්මේලනයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් වී, විවිධ නිලතල හොබවමින් අපරිමිත සේවයක් කළ එතුමා, න්‍යායිකව තමන් විශ්වාස කළ ධර්මතාවයන් හා වටිනා සිද්ධාන්ත, ප්‍රායෝගිකව ඒ අයුරුම ක්‍රියාත්මක කරන්නට දැඩි උනන්දුවක් ආශාවක් දැක්වූ නිසාම තම සේවා ක්ෂේත්‍රයේ පුළුල් බව දකින්නට සර්වෝදය ව්‍යාපාරයට එක් විය.

අප ව්‍යාපාරයේ අතීත කතාන්තරය සිහිපත් වන විට මහාචාර්ය හේවගේ මහතා කිසි විටෙක අමතක නොවන පරාර්ථකාමී හිතෛෂී මිත්‍රයෙකි. වටිනා සම්පත් දායකයෙකි. සර්වෝදයේ ප්‍රජා සංවර්ධන සේවාවන් සඳහා දායක වූ හේවගේ මහතා කෙතරම් දුෂ්කර වුවද, අප සමඟ ගම් නියම්වලට ගියේය. ස්වභාව ධර්මයේ ඕනෑම තැනක් ඔහුට අධ්‍යාපන පීඨයක් විය. පන්සල බණමඩුව ශ්‍රමදාන කඳවුර තුරු සෙවණ, සෑම තැනක්ම සරසවි දේශනාගාරයක් බවට පත් කර ගත්තේය. ඔහුගේ අධ්‍යාපන රටාවෙහි දැනුම බෙදා දීම පමණක් නොව ඊටත් එහා ගැඹුරු අර්ථයක් තිබිණි. එනම් සරල බෞද්ධ ජීවන ක්‍රමය සම්බන්ධයෙන් අවබෝධ කරවීම හා විශ්වාසය පෙළඹවීම ඇති කිරීමය. නිරහංකාර, සරල හා චාම් ජීවිතය තම දේශනයේ අඩංගු ධර්මතාවයන් හරියටම පිළිපදින්නක් වීමෙන් හා සත්‍යය සනාථ වීමෙන් එතුමාගේ එවැනි අධ්‍යාපන ක්‍රම අතිශයින්ම සාර්ථක බව ඉසිලීය.

සර්වෝදයේ සංකල්පය අනුව ග්‍රාමීය ප්‍රජාවගේ ස්ව ශක්තිය අවදි කිරීම සඳහා එතුමා අතිශයින් ක්‍රියාකාරී විය. ඒ පිළිබඳව භික්ෂූන් වහන්සේලා විසින් ඉටු කරන ලද මෙහෙය පිළිබඳවත් අවබෝධවත් කළේය. රටට, සමාජයට ආදරය කළ බැවින්, හිතවත් වූ බැවින්, සර්වෝදයටද ආදරය කළේය. හිතවත් වූයේය. ගැමි ජනතාවගේ යහපත අපේක්ෂා කළ සර්වෝදයේ ප්‍රතිපත්ති කෙරෙහි එල්බ ගෙන, එහි ක්‍රියාකාරිත්වයන් පණ ගැන්වීමට නිර්ලෝභී අන්දමින් අත හිත දුන්, වෙහෙස වී වැඩ කළ සමාජ සේවකයෙකි.

මහාචාර්ය හේවගේ මැතිතුමා මව්බස, දේශීයත්වය, ආගමික පසුබිම යන කරුණු ජාතික අධ්‍යාපනයේ හරය විය යුතු බව තදින් විශ්වාස කළේය. එවැනි පදනමකින් තොරව සැලසුම් කරනු ලබන අධ්‍යාපනයකින් නිශ්චල හා කෘතිම සංකල්පනාවන් සහිත පුද්ගලයින් රටට බිහි වීම වැළැක්විය නොහැකි බවත්, නිතර ප්‍රකාශ කළේය. මෙවැනි සිතුවිලි ඔස්සේ ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් පෙරළියක් ඇති කිරීමට ද එතුමාට හැකි විය. පියවර පාඩම් ක්‍රමය. හා අධ්‍යාපන මනෝවිද්‍යාත්මක පොත් රැසක් රචනා කරමින්, රටට දායාද කළ හේවගේ මැතිතුමා දෙස් විදෙස් සඟරාවලට, සමුළුවලට ඉදිරිපත් කරන ලද සාරවත් ලිපි සංඛ්‍යාව දහස් ගණනකි. බාල පරපුර යහමග යැවීමට ශක්තිමත් මෙහෙයුමක් උදෙසා එතුමාගේ ලේඛන දායකත්වයට .රුහුණේ වීරයා. යන්න එක් උදාහරණයක් පමණි.

සර්වෝදය ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයෙක් ලෙස ක්‍රියාකාරී වූ එතුමා, අප ව්‍යාපාරයට පමණක් නොව, මුළු බෞද්ධ ලෝකයාටම පන්නරයක් සැපයූවෙක් විය. මිය යන තෙක්ම සර්වෝදයේ උප සභාපතිවරයෙකු හා යාවජීව සාමාජිකයෙකු ලෙස කටයුතු කළ එතුමා බෞද්ධ දර්ශනය මත පදනම් වූ අධ්‍යාපන විෂයය පමණක් නොව, ශාස්ත්‍රීය සාමාජික හා සංස්කෘතික කරුණුවලදී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේය. විද්‍යෝදය සරසවියේ අධ්‍යාපන අංශයේ ප්‍රධානියා ද විය. විශ්ව විද්‍යාලවල අධ්‍යාපන විද්‍යාව ඉගැන්වීම පිළිබඳ පුරෝගාමියෙක් ලෙස ප්‍රසිද්ධියක් ඉසිලූ හේවගේ මහතාගේ මාර්ගෝපදේශකත්වයෙන් ලංකාව තුළ ඉතා දක්ෂ අධ්‍යාපනඥයින් රැසක් බිහි වී ඇති බව කිව යුතුය.

එතුමා ගුරුවරයෙකු වූයේ ගුරුවරුන්ටත් ගුරුවරයෙකු වෙමිනි. බෞද්ධ දර්ශනයේත්, අධ්‍යාපනයේත්, විශිෂ්ට ගුරුවරයෙක් වූ හේවගේ මහතාගේ ප්‍රථම ග්‍රන්ථය වූයේ, 'ගුරුකම' නැමැති සඟරාවය. එය 1954 දී අධ්‍යාපනය සඳහාම ප්‍රකාශයට පත් කරන ලද ත්‍රෛමාසිකයකි. එතුමා මිය යාමට පෙර තායිලන්තයේ පැවැත්වීමට කටයුතු යොදා තිබූ 'ලෝක අධ්‍යාපන සමුළුව' වෙනුවෙන් ඉතා වෙහෙස වී සංවිධාන කටයුතු මෙහෙයවීය. නමුත් එය නියෝජනය කිරීමට ඔහුට නොහැකි විය. එය රටටම සිදු වූ පාඩුවක් ලෙස අපට දැනුණි.

මහාචාර්ය හේවගේ මහතා 1941 වර්ෂයේ විවාහ වූ අතර, පුතුන් තිදෙනෙක් වූහ. වැඩිමහල් පුතා ඒ දිනවල තානාපති කාර්යාලයේ උපදේශකවරයෙක්ව සිටි මහින්ද හේවගේය. කැනඩාවේ ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කළ සරත්චන්ද්‍ර හේවගේ හා හෝමාගම ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරයෙකු වූ ගාමිණී හේවගේ යන පුතුන් තිදෙනා පියාගේ අඩි පාරේ යමින් වටිනා සේවයක් ඉටු කළහ.

1990 වර්ෂයේදී එතුමා මිය ගියේ අවුරුදු 76 ක් ජීවත්වීමෙන් පසුය. එතුමාගේ වියෝවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාරදයෙකුද, උගතුන්ට නිවහල් චින්තකයෙකුද, තරුණ පරපුරට මාර්ගෝපදේශකයෙකුද, පාඨකයන්ට ලේඛකයෙකුද අහිමි විය. මේ ලියන විට එතුමා දැයෙන් සමුගෙන අවුරුදු 17 ක් ගත වී අවසානය. විදේශයන්හි ගොස් තම දැනුම බෙදා දී ආසියානු රටවල අධ්‍යාපන

මහාචාර්ය එල්. ජී. හේවගේ මහතා සමඟ විදේශීය සමුළුවකදී

ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ රැසක් සිදු කළේය. එතුමා සමස්ත ලංකා බෞද්ධ සංගමයේ නායකත්වයද යුනෙස්කෝ ආයතනයේ විධායක කොමිටියේ සාමාජිකත්වයද ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන කමිටුව ශ්‍රී ලංකා බෞද්ධ කොන්ග්‍රසය ආසියානු සංස්කෘතක සංවර්ධන සංසදය සාමය හා ආගම් සම්බන්ධයෙන් ආසියානු සමූළුව ලෝක ආගම් සමුළුව සහ තවත් ජාතික හා අන්තර්ජාතික සංවිධාන ආයතනයන්හි උසස් වගකීම් සහිත තනතුරු රැසක් හෙබ වූ මහාචාර්ය හේවගේ සර්වෝදයට පමණක් නොව, රට ජාතිය වෙනුවෙන් මිනිස් සංහතිය වෙනුවෙන්, විපුල මෙහෙයක් ඉටු කිරීමට පෙර මගට පැමිණි ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙකි. එතුමාගේ වියෝව අප කාටත් මහත් පාඩුවකි.

එල්. ජී. හේවගේ මහතා සර්වෝදය පත්‍රයට
''සර්වෝදය දර්ශනය'' පිළිබඳ ඉතා සාරවත්
විග්‍රහයක් කර තිබුණි. එහි දාර්ශනික පදනම පිළිබඳව
එතුමා විග්‍රහ කළේ මෙසේය.

ඇවිත් - බලන්න

එහි ඇත්තේ අපට ප්‍රයෝජනවත් අධ්‍යාපන දර්ශනයකි. අප රටට පමණක් නොව, සාමකාමීත්වය හා සහජීවනයෙන් යුත් සමෘද්ධිමත් විශ්ව සමාජයක් ගොඩනගා ගැනීමට වුවද අවශ්‍ය වන සමාජ ආර්ථික හා අධ්‍යාපන දර්ශනයක් සර්වෝදයට මූලික වී ඇති බවක් අපක්ෂපාතී සිහි නුවණින් ඒ පිළිබඳව විමසන කා හටත් පෙනී යනවා ඇත. සර්වෝදයේ කෙටි කාලීන හා දීර්ඝ කාලීන ක්‍රියා මාර්ගයන් මේ රටේ ඕනෑම තැනක ප්‍රකාශ කරන්නට පුළුවන්කම ඇත්තේ සර්වෝදය හැම දෙනාගේම හිතසුව පිණිස සකස් වූවක් නිසාය. සර්වෝදයේ රහස්‍ය සාකච්ඡා නැත. එහි සාකච්ඡා කරන්නේ ලොකු- කුඩා-බාල-මහළු-උගත්-නූගත්-දුප්පත්-පොහොසත්-සතුරු-මිතුරු කාගේත් සැඟවී ඇති හොඳ ටික මතු කරවා එමගින් කාටත් සෙතක් කිරීමේ ක්‍රම සෙවීමටය. නැතහොත් එකකු පරදවා තව කෙනෙකුට ජය ලබා දීමටවත් නොවේ. සැම දෙනාටම සෙත්පතා කරුණාව පතුරවන පිළියම් දෙසට එහි සාකච්ඡා යොමු වී ඇති බව තතු දන්නෝ දනිති. සර්වෝදය මුල සිට අගටත්, අග සිට මුලටත් පින්කමකි. සමාජයටත් මොලොව පරලොව දෙකටමත් ශාන්තියකි.

ලෝකයේ පවතින ඇතැම් වෙනත් දර්ශන අනුව සමාජ ප්‍රශ්න ආර්ථික ප්‍රශ්න අධ්‍යාපන ප්‍රශ්න දෙස බලා ලේ හැලෙන විප්ලව මගින් රට ඉක්මනින් සුබිත මුදිත කරන්නට සමහරු වියදම් කරති. සර්වෝදයේ ගමන් වේගය අපහාසයට-උපහාසයට ලක් කරමින් ඉක්මන් ගමන් යාමට මඟ පෙන්වන්නන් පසුපස ගිය බොහෝ දෙනාට, දැන් අපේ පැරැන්නන්ගේ කියමනක් වන ''ඉක්මන් කොටයි'' යන්න මතක් වී ඇත. ඉක්මන් ගමනින් ජාතිය ඉදිරියට ගෙන යෑම සඳහා ඇතැමුන් විසින් අවුරුදු 25 ක් 30 ක් තිස්සේ කරන ලද විජාතික, බෞද්ධ විරෝධී වැයම් නිසා අද ඉක්මන් කොට වී දේශීය ජන සමාජය අවුරුදු සියයකින් පමණ ආපස්සට ගොස් ඇත. එහි ආර්ථික හා සාමාජීය සංස්කෘතික ව්‍යුහයන් සමඟ අපි පරිහානි ප්‍රපාතයකට ඇද වැටී සිටිමු. ආපසු අපට සංවර්ධනය විය හැක්කේ සර්වෝදය දර්ශනයෙන්ම බැව් කාටත් පැහැදිලි වන දෙයකි.

සර්වෝදය දර්ශනය බෙහෙවින්ම ශ්‍රී ලංකාවේ ඉපැරණි ජාතික උරුමය සේ සැලකෙන මධ්‍යම ප්‍රතිපදාවත් සතර බ්‍රහ්ම විහරණ සතර සංග්‍රහ වස්තු වැනි බෞද්ධ ඉගැන්වීම් ආදියේ වටිනා මූලධර්මයන් මත සකස් වී තිබෙන්නෙකි. ඒ නිසා ඕනෑම කෙනෙකුට ''ඇවිත් බලන්න'' යැයි නිර්භයව කීමට හැකි සමාජ දර්ශනයක් ලෙස හඳුන්වා දිය හැක. අශෝක අධිරාජ්‍යයාගේ සමකාලීන මිනිසුන්ට තම අභිමතය පරිදි නිවීහැනහිල්ලේ තමන්ගේ ආගම් අදහන්නට ඉඩ ලැබුණේ මෙම මධ්‍යම ප්‍රතිපදාව මත සකස් වූ බොදු දහමට එතුමා විසින් මුල් තැන ලබා දුන් බැවිනි.

මහත්මා ගාන්ධි හා විනෝබා භාවේ කාලයේදීත් එසේ මය. එය හැම දෙනාගේම උදාව වූයේ ඒ නිසාය. සර්වෝදය පිළිගත් යම් මිනිස් කාණ්ඩයකට, ජාතියකට, මින් ඉදිරියට නොගියත් අතරමගදී නැවතුණත් ගමන කෙළවර කළත් හැම දෙනාට හැම තැනදීම සැපතක් මිස, විපතක් නොවේ යැයි කියනු ලබන්නේ එබැවිනි. සර්වෝදය ගම්වල කෙරෙන වැඩ කටයුතු කාටත් පැමිණ බලා ගන්නට කියන්නේ එහි දර්ශනය විවෘත නිසාමය.

මහාචාර්ය හේවගේ මහත්මා සර්වෝදය දුටු හැටි ඔහු විසින් රචනා කළ පහත සඳහන් ගීයෙන් මොනවට පැහැදිලි වේ.

සර්වෝදය දිනේවා

සර්වෝදය දිනෙවා ජාතිය නගලා -
නැති බැරිකම් හැම නැති කරලා //
මෙත් සිලිලේ නා කරුණා පතුරා //
සැප ඇති තැන දැක සතුටු වෙලා
දුක ඇති තැන දැක සිය සැප හැරදා -
පරහට වැඩ වන වැඩ කරමු
සර්වෝදය දිනෙවා සාමය පතුරා -
පොදු ජන සේවේ මගිනි ලොවේ //
අවිහිංසාවේ පෙරමුණ ගනිමූ //
මර සෙනඟට අපි එරෙහි වෙමු
අසරණ සත හට සරණ ලබා දෙන -
ගම් වැඩුමට අත හිතද දෙමු
සර්වෝදය දිනෙවා ජාතිය නගලා -
නැති බැරිකම් හැම නැති කරලා //
හැම දෙන තුළ වූ යහගුණ වඩවා //
බේද හැරදා සමගි වෙමූ
ශ්‍රමදානයෙනී ජාතිය නගමූ -
ජනතා සවියේ බලපාමූ
සර්වෝදය දිනෙවා සාමය පතුරා -
පොදු ජන සේවේ මගිනි ලොවේ //
පැති ගැන්මෙන් තොර මැද පිළිවෙත යමු //
වරදට දුටු තැන පහර දිදී
මෙත්තා කරුණා මුදිතොපෙක්ඛා
බඹ විහරණ අපි නිති වඩමු
සර්වෝදය දිනෙවා සාමය පතුරා -
පොදු ජන සේවේ මගිනි ලොවේ //
ගම පොදු වැඩ අපි සැවොම කරන්නේ //
හොඳ පවුලේ පැවතුමට යොදා

මුල මැද අග මග අරමුණ එකසේ -
හැම දෙනටම හිත සුවය බෙදා
සර්වෝදය දිනෙවා සව්ලෝ සාමය -
සමගිය සහ ජීවනේ සදා //
ජාතියේ පැරණී පොදු ජන ගුණ දම් //
සර්වෝදෙන් යළි මතුවේවා
ප්‍රීතී සොම්නස් අප තුළ වැඩි වී -
ඇති දෙය ඇති සැටියෙන් පෙනේවා
සර්වෝදය දිනෙවා ජාතිය නගලා -
සර්වෝදය දිනෙවා .... ආ ... //

පද මාලාව
මහාචාර්ය එල්.ජී. හේවගේ

ගරුතර හිමිවරුනි, අංජලිකරණීය තුන්නානේ සුමනතිස්ස හාමුදුරුවෝ

අප ව්‍යාපාරය ආරම්භ කළ කාලයේදී නාලන්දා විද්‍යාලයීය සමාජ සේවා සංගමය විසින් පටන් ගන්නා ලද ලංකාවේ දිළිඳු ගම්මාන නංවා ලීමේ සමාජ සේවාවන් මුල් අවධියේ සිටම සාර්ථක ප්‍රතිඵල පෙන්වීය. එහිදී පවත්වන ලද ශ්‍රමදාන කඳවුරු සඳහා සහභාගි වන සංඛ්‍යාවද ක්‍රම ක්‍රමයෙන් වැඩි වූ අතර ශ්‍රමදාන කඳවුරු පිළිබඳ ආරංචිය ජනමාධ්‍යවලින් රටපුරා පැතිර ගියේය. ඒ පිළිබඳව කනවැකුණු බොහෝ දෙනා මෙම ව්‍යාපාරයට බැඳීමට කැමැත්ත පළ කරමින් ලිපි එවූහ. ඉන් පළමු ලිපිය එවා තිබුණේ තුන්නානේ සුමන තිස්ස නාහිමියෝය.

උන්වහන්සේගේ විහාරය වුයේ තුන්නානේ ජයසුමනාරාමය. පිහිටියේ කොළඹ අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ 24 වන සැතපුම් කණුව අසලය. යාමට හැකි නුදුරු තැනක් නිසා ලිපිය ලැබුණු වහාම අපි එහි ගියෙමු. ප්‍රථමයෙන්ම මට දක්නට ලැබුණේ ආහාර ද්‍රව්‍ය, ඇඳුම්-පැළඳුම්, මුළුතැන් ගෙවල්වලට අවශ්‍ය උපකරණ ආදී බඩු රාශයකි. ඒවා ජයසුමනා රාමධිපති ගරු කහටානේ සුමනජෝති නායක හිමිපාණන්



වත්මන් විහාරාධිපති පූජ්‍ය තුන්නානේ සුමනශාන්ත හිමිපාණෝ

පූජ්‍ය තුන්නානේ සුමනතිස්ස නාහිමිපාණන් වහන්සේ

හා උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය අපේ පූජ්‍ය පණ්ඩිත තුන්නානේ සුමනතිස්ස හිමිපාණන් ප්‍රධාන සෙසු ස්වාමීන් වහන්සේලා හා දායක දායිකාවන්, බැතිමතුන් විසින් දුගී ජනතාව වෙත බෙදා දීමට එකතු කරන ලද භාණ්ඩය. නායක හාමුදුරුවන් අපට කීවේ, එම ද්‍රව්‍ය රැගෙන ගොස් අපට අවශ්‍ය ප්‍රදේශවල ජනතාවට බෙදා දෙන ලෙසය. නමුත් අප අතින් එය සිදු කරනවා වෙනුවට අප සමඟ පැමිණ, තමන්ම එම ශ්‍රමදාන කඳවුරුවලට සහභාගි වී, ඒ ගම්වල ජනතාවට ඒවා ලබා දෙන මෙන් මම ඉල්ලීමක් කළෙමි. එහි ප්‍රතිඵලය වූයේ තුන්නාන ගමෙන් ස්වාමීන් වහන්සේලා ප්‍රධාන නියෝජිත පිරිසක් ප්‍රථම වශයෙන් අප සමඟ ගොස් ශ්‍රමදාන කඳවුරකට සහභාගි වීමය.

ස්වාමීන් වහන්සේලා නොසිටි ගම්වලින් තරුණ ළමයින් සොයා පැවිදි කර, සර්වෝදයේ ආධාරද ලබා ගෙන නව භික්ෂූන් වහන්සේලාට අධ්‍යාපනය ලබාදීමට සුමනතිස්ස හාමුදුරුවෝ කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1974 වන විට තුන්නාන ජයසුමනාරාමයේ සර්වෝදය සාමණේර භික්ෂු ආයතනයක්ද, 1982 දී හේන්පිටගෙදර ඥාණසීහ හිමිපාණන් සිහිවීමට අවිස්සාවේල්ලේ තවත් සර්වෝදය සාමණේර ආයතනයක්ද උන්වහන්සේ විසින්

පිහිටුවනු ලැබීය. අවුරුදු 30 කට ආසන්න කාලයක් තිස්සේ අප උන්වහන්සේ ළඟින් ඇසුරු කළෙමු. අපි උන්වහන්සේ දෙස බැලුවේ කිසිම අකුසලයකට යොමු නොවන පින් කෙතක් ලෙසටය. පූර්ව කර්ම වේගයක් හේතු කොට ගෙන උන්වහන්සේ 64 විය ඉක්මවීමටත් පෙර අසාධ්‍ය රෝගයකට ගොදුරු විය. උන්වහන්සේ එම රෝගයෙන් අපවත් වූවත්, අවුරුදු 42 ක් පමණ වූ වටිනා පුණ්‍යවත් පැවිදි ජීවිතයක් උන්වහන්සේ පිටුපසින් ඇත.

ශ්‍රී දේහය තැන්පත් කර තිබූ අයුරු

1985 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මුල හරියේ මම ලංකාවෙන් පිට වූයේ රටවල් කිහිපයකටම යාමට දිගු කාලයක් වැය කරන්නටය. මෙවර රටින් පිට වූ පසු දුක්මුසු පුවත් දෙකක් මට අසන්නට ලැබුණේය. එකක් අපේ ගරු තුන්නානේ සුමනතිස්ස හාමුදුරුවන්ගේ අපවත් වීමය. අනෙක මගේ විවාහයට අත්සන් තැබූ ස්ටැන්ලි ප්‍රනාන්දු මහතාගේ අභාවය පිළිබඳවයි.



මහා සංඝයා වහන්සේලා ප්‍රධාන කොට නීතා, එම්.ඩබ්.කරුණානන්ද මහතා, විලියම් කන්දගේ මහතා ඇතුළු පිරිස ආගමික වතාවත්හි යෙදී සිටි අයුරු

ආදාහනෝත්සවයට සහභාගී වූ ගම්වාසීන්ගෙන් කොටසක්

ආදාහනෝත්සවයට සහභාගී වූ මහා සංඝරත්නය

ආදාහනෝත්සවයට සහභාගී වූ සංඝයාවහන්සේලා ඇතුළු පිරිස

සර්වෝදය වෙනුවෙන්ම ජීවිත කාලයක් කැප කළ භික්ෂූන් වහන්සේලා අතර තුන්නානේ හාමුදුරුවන්ට ලැබෙන්නේ අද්විතීය ස්ථානයකි. උන්වහන්සේගේ නම සර්වෝදය ඉතිහාසයේ රන් අකුරින් ලියා තැබිය යුතුය.

මම රටින් පිටවීමට දින තුනකට පමණ පෙර තුන්නානේ හාමුදුරුවන් බැලීමට ගියෙමි. නීතා, ජීවන්, රාජසූරිය මැතිනිය හා කොණ්ඩඤ්ඤ හාමුදුරුවන් ද මා සමඟ ගියහ. කියන දේ තේරුම් ගැනීමට අපහසු වූ නමුත් උන්වහන්සේ අප සමඟ කතා කළේ හොඳ සිහියෙනි. හාමුදුරුවන්ගෙන් සමු ගන්නා අවස්ථාවේදී, නැවතත් උන්වහන්සේව පණ පිටින් දැක ගන්නට අවස්ථාවක් නොලැබෙන බව මට කල්පනා විය. අවුරුදු තුන හතරක් තිස්සේ ක්‍රමයෙන් අසාධ්‍ය තත්ත්වයට හැරී තිබුණු උන්වහන්සේගේ පිළිකා රෝගය ඒ වන විට ආහාරයක්වත් ගැනීමට නොහැකි තත්ත්වයක් දක්වා අසාධ්‍ය වී තිබුණි.

තුන්නානේ සුමනතිස්ස හාමුදුරුවන් බණ දේශනා කරන විට, අපට එය රිදී සීනු හඬක් තරමට මිහිරිය. ප්‍රසන්නය. පැහැදිලිය. විනීතය. ජාතික ආගමික සමාජසේවා කටයුතුවල ප්‍රමුඛස්ථානය ගෙන නිර්ලෝභීව තම දැනුම ශ්‍රමය අන්‍යයන් උදෙසා වැය කළ තුන්නානේ හාමුදුරුවන්ගේ අපවත් වීමෙන් අප හැම දෙනාටම, සර්වෝදය ව්‍යාපාරයටම මහත් පාඩුවක් දැනුණි. අප ශ්‍රමදාන සංගමයේ දුරස්ථ ප්‍රදේශවල ශ්‍රමදාන කඳවුරුවලට ගොස් සහභාගි වීම නිතර පුරුද්දක් කර ගෙන සිටි උන්වහන්සේ සැම දෙනාටම ශක්තියක් ධෛර්යයක් විය. සර්වෝදය ශ්‍රමදාන කඳවුරු දෙකකදී අවසානයේ පැවැති පවුල් හමුවේදී තුන්නානේ හාමුදුරුවෝ ස්තුති කතාව පැවැත්වූයේ හිටිවන කවි පෙළකිනි. හිටිවන කවි තැනීමෙහි අති දක්ෂයෙක් වූ අපේ සුමනතිස්ස ස්වාමීන් වහන්සේගේ කවි පන්තිය ඇසූ සර්වෝදය සේවකයින් ඇතුළු ගම්වාසී සියලු දෙනා ශ්‍රමදානයේ විඩාව නිවාගත්හ. සතුටු ප්‍රමෝදයේ මිහිර වින්දාහ. ඉන් කවි කිහිපයක් පහත සඳහන් කරමි.

මින් පෙර අඩිය නොතැබූ මේ ගමෙහි කුඩා
මුල් කඳවුරේ විසුවෙමි පිය තෙපල දොඩා
කරුණක් කියමි අද කාටත් සෙනෙහෙ වඩා
යා යුතු මගක් නැහැ සර්වෝදයට වඩා

එඩිතර කම් ප පා එකමුතු ගුණය උඩ
දෙදිනක් හෙලුව මුත් දහඩිය මුගුරු ගොඩ
නොපෙනෙයි වැඩ ඉවර වූ මාවතක හැඩ
සෙල්ලම් නොවෙයි මේවා බරපතල වැඩ

සෙනෙහස හදවතේ පුරවා උදය හවා
රසවත් අහර සපයා සා පහස නිවා
සැලකූ සියල්ලන් වෙත මෙත් ගුණය මවා
පතනෙමු ඔබ සැමට තෙරුවන් සරණ වෙවා

(සර්වෝදය පුවත්පත 1968
පැලැල්ලේගම ශ්‍රමදාන කඳවුර)

1968 අප්‍රේල් 21 - 25 දිනවලදී බදුල්ල දික්යාය ගමේ පැවැති සර්වෝදය ශ්‍රමදාන කඳවුරේ පැවැත්වූ පවුල් හමුවක් අමතා අපේ තුන්නානේ සුමනතිස්ස ස්වාමීන් වහන්සේ විසින් කරන ලද කවි කතාවකින් කොටසක් මෙසේය.

ගරුතර හිමිවරුනි අංජලි කරණීය
නෝනාවරුනි මහතුනි ආදරණීය
අද වැනි පවුල් හමුවක අති රමණීය
හැමටම බෙදන මේ රස කවි පැණි වීය

මේ කඳවුරට පැමිණෙන හැම මිනිසෙක්ම
ගත කොට තිබේ ගම වෙනුවෙන් සතියක්ම
සර්වෝදය මගින් ලැබ ගත් හරි දක්ම
සතුටකි මේ තරම් දුර පැතිරෙනු දක්ම

නෙත් දෙක වැනිව පවතින දික්යාය ගමේ
ආරාමෙනුත් පන්සලෙනුත් සුවඳ හැමේ
හිමිවරු මහත්වරු දක්වූ සුවඳ පෙමේ
අගයයි අපේ සිත් ඒ දෙපළට ම නැමේ

සර්වෝදයෙන් සරු අදහස් පැතිරේවා
හැම මුවතින්ම පිය බස් රස වැගිරේවා
වෛරයෙ වාද බේදයෙ මුල් ඉදිරේවා
දරුවෙනි ඔබ හැමෝටම කිරි ඉතිරේවා

වැරදි දෙය පිටුදැක සත්‍ය ක්‍රියා කළ යතිවරයාණෝ ගණේගම සරණංකර හාමුදුරුවෝ

ගාල්ල ප්‍රදේශයේ රැස්වීමක කතා කරමින් සිටි ගණේගම හාමුදුරුවෝ අපගේ රටත් ජාතියත් පත්ව තිබෙන ශෝකජනක තත්ත්වය ගැන සඳහන් කරමින් වේදනාව උසුලා ගැනීමට නොහැකිව කඳුළු වැගිර වූ හැටි දහස් ගණන් ජනතාව බලා සිටියහ.

පූජ්‍ය ගනේගම සරණංකර නායක හාමුදුරුවෝ

සම්බුද්ධ ශාසනය ලොව රඳා පවතින්නේ උගත් විනය ධර මහා සංඝරත්නය වැඩවාසය කරන තෙක්ය. ඒ නයින් බලන විට බද්දේගම හැඩිදෙමළ කන්දේ පුරාණ රජමහා විහාරාධිපති ගාලු කෝරලයේ ප්‍රධාන සංඝ නායක රාජකීය පණ්ඩිත ගණේගම සරණංකර නාහිමි-යෝ තපෝවෘද්ධ ගුණෝවෘද්ධ සීලවෘද්ධ මහා තෙර නමකි. ආගමික ශාසනික හා භාෂාමය වශයෙන් වටිනා ශාස්ත්‍රීය මෙහෙයක් ඉටු කළ බුදු පුත් රුවනකි. දක්ෂ ලේඛන කලාවෙන් තම රටට දැයට කතා කළ උන්වහන්සේ විසින් රචනා කරන ලද දහම් පොතපත ඉතා වටිනා දායාදයකි. අයුක්තිය, අසාධාරණය නොඉවසූ උන්වහන්සේ සාධාරණය දිනා ගැන්මට අභීතව පෙරටම ගමන් කළ සේක. තම උපන් ගම් ප්‍රදේශයේ ජනතාවගේ දුක සැප බලා කියා ගනිමින්, හැම විටම තම දායකයින් අතර පියෙක් බඳු විය.

උන්වහන්සේගේ උපන් ගම බද්දේගමය. 1908 දී උපත ලද සරණංකර හාමුදුරුවෝ පැවිදි ජීවිතය ආරම්භ කළේ 1924 දීය. ගාල්ලේ කිතුලම්පිටිය ආනන්ද පිරිවෙනෙහි මූලික අධ්‍යාපනය ලැබූ හාමුදුරුවෝ, පසුව මාලිගාකන්ද විද්‍යොදය පිරිවෙනෙහි ඉගෙනුම ලබා, ප්‍රාචීන පණ්ඩිත උපාධිය සමත් වූහ. 1932 ජූනි 11 දින මහනුවර මල්වතු විහාර සීමා මාලකයේදී උපසම්පදාව ලැබූ උන්වහන්සේ තරුණ කාලයේදීම විද්‍යොදය පිරිවෙණෙන් අධ්‍යාපනය අවසන් කර, කොළඹ පෙම්රොක් විද්‍යාලයෙන් ඉංග්‍රීසි භාෂාව හදාරා, ඉන්දියාවට ගොස් කල්කටා විශ්ව විද්‍යාලයට ඇතුළත් වූහ. එහි අධ්‍යාපනයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා, රවීන්ද්‍රනාත් තාගෝර් විශ්ව විද්‍යාලයට ඇතුළත්ව අවුරුදු පහක් ඉගෙනුම ලබා විශ්ව භාෂාන්තර දැනුම එක් රැස් කර ගත්හ. ශ්‍රී ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකුව සිටි කාලයේදී, සරණංකර හාමුදුරුවන් වෙතින් උගත් ගිහි පැවිදි බොහෝ දෙනා අදත් උන්වහන්සේගේ නිහතමානීකම අගය කරති.

1963 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ ප්‍රථම අධ්‍යයන වාරය ආරම්භක දිනයේදී බෞද්ධ සංස්කෘතිය දේශනය සඳහා ගණේගම හිමියෝ විශ්ව විද්‍යාල භූමියේ බණ්ඩාරනායක ශාලාව වෙත වැඩම කළහ. ඕනෑම වෙලාවක 'හූ' කීමට. පුරුදුව සිටි ශිෂ්‍යයෝ හාමුදුරුවන් වේදිකාවේ මයික්‍රෆෝනය වෙත යද්දී 'හූ'ව පටන් ගත්හ. විනාඩි දෙකක් තිස්සේ 'හූ' ව ගෙන ගියද, හාමුදුරුවන් නොවේ, වචනයක්වත් කතා කළේ හෝ කේන්ති ගත්තේ. උපැස් යුවල මුහුණින් ඉවතට ගත් උන්වහන්සේ ''දැන් 'හූ' කියලා ඉවරද?''. හයියෙන් ප්‍රශ්න කළහ. ශාලාව පුරාම පැතිර ගියේ දැඩි නිහඬතාවයකි.

''මට හූ කියන මේ අය සිංහල ළමයි, හොඳ අම්මලා තාත්තලාගේ දූ පුත්තු මට 'හූ' කියන මේ මහත්වරු මෙහාට ආවේ ගේට්ටුව ළඟ ඉඳන් බඩ ගාගෙන. සමහරු සපත්තු කරේ දමාගෙන. ඉතිං ඔය එකක්වත් මට වුණේ නැහැණේ....'' එසේ කියමින් සරණංකර හාමුදුරුවෝ දේශනය පටන් ගත්තා. මෙසේ කියද්දී බොහෝ සිසුන්ගේ දෙනෙත් කඳුලින් තෙත් වුණා. ශිෂ්‍යයින්ගේ හිතුවක්කාර චංචල සිත් උන්වහන්සේ ඥානාන්විත ක්‍රියාවෙන්

මෙල්ල කිරීමට සමත් වුණේ ඒ විධියටයි. ගණේගම හාමුදුරුවෝ සර්වෝදය ව්‍යාපාරයට වටිනා සේවයක් ඉටු කළහ. උන්වහන්සේ අපේ සමාජ මෙහෙවරට අනුශාසකවරයෙක් ලෙස ක්‍රියා කරමින්, ගම්බිම් නඟා සිටුවීමේ උදාර මෙහෙවරට දායකත්වය ලබා දුන්හ. කෙතරම් දුර වුවද අප සමඟ දුරස්ථ ගැමි ප්‍රදේශ කරා වැඩම කරවීය. දහවල් දානය පන්සල තුළම ගැනීමට උවමනා වූයේ නැත. ගසක් යට වාඩි වී දානය වැළඳීමට තරම් උන්වහන්සේ නිහතමානී වූයේ, ආහාරයට වඩා සේවයේ පාරිශුද්ධ චින්තනය බලවත් වූ නිසා නොවේද?

විහාර භූමියේ දී ගනේගම නාහිමි සමඟ

ගාන්ධි චින්තනය අනුගමනය කළ සරණංකර හාමුදුරුවෝ සර්වෝදය ගම්මානවලට ගොස් ගැමියන් සමඟ කතාබස් කර, ඔවුන්ගේ සිතුම් පැතුම් හඳුනා ගත්තේය. සමාජ සාධාරණත්වය යන්නෙන් සමාජ සංවර්ධනය පිළිබිඹු වන බැව් උන්වහන්සේ තරයේ විශ්වාස කළහ. එම උත්කෘෂ්ට වූ සංකල්පයට ගෞරව ප්‍රශංසා කළහ. අප ව්‍යාපාරයේ ගැමි සංවර්ධන හා සමාජ සේවා ක්ෂේත්‍රයන්හි සේවාවන්ට හාමුදුරුවන්ගේ උපකාර ලබා ගත්හ. මා හා අත් වැල් බැඳ ගනිමින්, සමාජ සේවයට ප්‍රවේශ වූ උන්වහන්සේ, ගැමි ප්‍රජාව සඳහා අප විසින් දියත් කළ ජනතා ප්‍රමුඛ සංවර්ධනය වෙනුවෙන් තම උපරිම සහයෝගය ලබා දුන්හ. උන්වහන්සේ අපවත්වීම දක්වාම අපගේ ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයන්ට උපදේශකත්වයක්, මාර්ගෝපදේශකත්වයක්

මෙන්ම ශක්ති ප්‍රභවයක් වූහ. සරණංකර හාමුදුරුවන් හමු වූ මුල්ම දිනය මට අද වගේ මතකයි. ගිනිමැල්ලගහ ගනේගම අතර පාර කැපූ දිනයයි. ඇල්බට් එදිරිසිංහ මහත්මයාත්, මා සමඟ එම ශ්‍රමදානයට සහභාගි විය. මා උන්වහන්සේ හඳුනා ගත්තේත් හාමුදුරුවෝ සර්වෝදය ව්‍යාපාරයට බැඳුනේත් එදාමයි. එදා මුලින්ම ඇති කර ගත් අධිෂ්ඨානය අනුව සරණංකර හාමුදුරුවෝ තම මුළු දිවියම සර්වෝදය සේවාවන් වෙනුවෙන් කැප කළහ. සැම විටම අපට නියම මග පෙන්වූ උන්වහන්සේ, අපගේ ක්‍රියාකාරිත්වයන්ට ශක්තියේ මහා ටැඹක් විය. උන්වහන්සේ කොමියුනිස්ට්වාදියෙක්වත් කොමියුනිස්ට් ප්‍රතිපත්ති ගැති කෙනෙකුත් නොවේ.

ගිනිමැල්ලගහ පැවැති ශ්‍රමදාන කඳවුරක පවුල්හමුව අමතා දේශනයක් කරමින්

බද්දේගම තම ගමෙහි, හැඩිදෙමළකන්දේ පුරාණ රජමහා විහාරය සකලාංගයන්ගෙන් පරිපූර්ණ කළ උන්වහන්සේ, අනාගත පරපුරට ආදර්ශයක් වන පරිද්දෙන් ජාතියේ අනභිභවනීය වීරයාණන් වූ දුටුගැමුණු රජතුමාගේ චරිතාපදානයෙන් එය මූර්තිමත් කළහ. දුටුගැමුණු රජුගේ චිත්‍ර කර වූහ. විහාරමහා දේවියගේ ද දුටුගැමුණු රජුගේ ද පිළිරූ සහිතව එහි තනා ඇති දසමහා යෝධයන් දුටු විට අපේ ජාතික ප්‍රෞඪත්වය විශිෂ්ට ලෙස සිතට කාවදියි.

අනුරාධපුර යුගයේ අපේ ශ්‍රී විභූතිය ගැන මහත් ආඩම්බරයකින් කතා කළ සරණංකර හාමුදුරුවෝ, නිතරම ප්‍රකාශ කළේ බුදුහාමුදුරුවන් හැරුණු විට මේ රටේ මිනිසුන් වන්දනා මාන කළ යුත්තේ දුටුගැමුණු රජ්ජුරුවන්ට බවය. සෑම සිංහලයෙකු තුළම දුටුගැමුණු කෙනෙකු සිටිය යුතු යැයි උන්වහන්සේගේ අධිෂ්ඨානය විය. ඒ සටන් කිරීමට නොව, ජාත්‍යානුරාගයෙන් පිරි සිංහලයින් අතුරුදන් වී යන බැවිනි. දේශප්‍රේමී, නිර්භීත, ජාත්‍යාලයෙන් සිංහලකම රැක ගැනීමට ඒ මහා සිංහල වීරයාණන් හැම විටම වීරත්වයෙන් ක්‍රියා කළහ.

රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ විශ්ව භාරතී විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමෙන් අනතුරුව සරණංකර හාමුදුරුවෝ, රත්මලානේ පරමධම්ම චේතිය පරිවෙනාචාර්ය අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්ය පදවියක් දරමින් තරුණ උගත් භික්ෂූන් වහන්සේලාට අතිමහත් කරුණාවෙන් අර්ථයෙන් ධර්මයෙන් ජාත්‍යානුරාගය ඉස්මතු වන අයුරින් මහජනතාවට සේවය කරන හැටි ඉගැන්වූහ. මෙම ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයාණන් වහන්සේ කිසි විටෙක ලාභ සත්කාර, කීර්ති, ප්‍රශංසා පසුපස හඹා ගිය කෙනෙක් නොවූහ.

ප්‍රචණ්ඩත්වයේ ආරංචි මාර්ග වෙනුවෙන් හද පිරි ශෝකයෙන් කඳුළු සැලූ අපේ ගණේගම හාමුදුරුවෝ, ජාතික සමගිය හා එකමුතුකම ඇති කරලීමේ සහ පෝෂණය කිරීමේ වටිනා කර්තව්‍යයක නියැලුණහ. උතුරේ දෙමළ තරුණ කණ්ඩායම් සාමය සඳහා පෙළ ගැස්වීමට උත්සාහයක් ගන්නා ලදී. දෙමළ ජාතීන් කෙරෙහි වෛරයෙන් යුතුව කතා කිරීම සිතීම උන්වහන්සේ සම්පූර්ණයෙන්ම පිටු දැක්කේය. අවිහිංසාව අවංකකම අගය කළ ජාතික සංස්කෘතියේ අනු නාදය වූ සර්වෝදයේ සරල දිවි පෙවෙත උන්වහන්සේගේ චරිතය තුළින් පැහැදිලිව විද්‍යාමාන වුයේය.

උන්වහන්සේගේ ලේඛන කලාවෙන් රටට දැයට සිදු වු සේවය ද මෙහිදී සඳහන් කළ යුතුය. භාරතයට ගොස් ඉගෙන

ගන්නා කාලයේදී ලංකාවේ පුවත්පත් සඟරාවලට ලිපි ලියූ උන්වහන්සේ දිනමිණට ලියන ලද .ජනරංජන. ලිපි පෙළ ඉමහත් වැදගත් බවක් ඉසිලීය. එහි ඉගෙනුම අවසන් කර තම රටට පැමිණ, උගත් දෙයින් රටට සේවය කිරීම ආරම්භ කළහ. ඉන් පසු ලියූ පොත්පත් බෞද්ධ ජනතාවගේ අතිශය ගෞරවාදරයට පත් වීය. ආනන්ද හාමුදුරුවෝ, දුටුගැමුණු රජ්ජුරුවෝ, යශෝදරාව, ජාතියේ පියා, අනගාරික ධර්මපාලතුමා ආදී පොත් ජනතාව අතර ජනප්‍රිය බවට පත් වූ පොත්ය. දුටුගැමුණු රජ්ජුරුවෝ පොතෙහි උන්වහන්සේ සඳහන් කර තිබූ විශේෂ කියමනකි,

''දෙමළ ජාතිකයිනට කිසි විටෙකත් වෛර නොකරන ලෙස''ය. මන්ද යත් එසේ වුවහොත් ඉන් කතුවරයාට යම් අවමානයක් සිදුවන හෙයිනි.

දකුණු පළාතේ ගම්බද දරු දැරියනට පොත්පත් ලබාදී අධ්‍යාපනය නංවා ලීමට කටයුතු කළ උන්වහන්සේ, කරත්තයක පොත් පටවා ගෙන තැන් තැන්වලට යමින් ජංගම පුස්තකාල ක්‍රමය මෙරටට හඳුන්වා දුණි.

මේ අයුරින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ජංගම පුස්තකාලය බිහි කළ ගණේගම සරණංකර හාමුදුරුවන්ට එම අගනා සේවයට ගරු කිරීමක් වශයෙන් මල්වතු මහා නිකාය විසින් ගාලු කෝරළයේ මහා සංඝනායක පදවිය පිරිනමමින් ගෞරව දැක්වූහ.

බද්දේගම රතනසාර පිරිවෙන ආරම්භ කළේ ද ගණේගම සරණංකර හාමුදුරුවෝය. එය සිදු වූයේ තම ආචාර්යවරයාණන් වහන්සේට පුදන ලද ගෞරවයක් ලෙසටය. උන්වහන්සේ එහි ගුරුවරයෙක් ලෙස ද සේවය කළහ.

මෙසේ රටට හා ශාසනයට සේවාවන් රැසක් සිදු කළ ගණේගම හාමුදුරුවෝ 1989 දෙසැම්බර් 29 වැනි දින අපවත් වී වදාළහ. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සර්වෝදයට මාර්ගෝපදේශකයෙක්, ශක්තිමත් නායකයෙක් වූ උන්වහන්සේගේ වියෝ වීම අපට පිරවිය නොහැකි පාඩුවකි. ශෝකයට කරුණකි. මුළු ප්‍රදේශයටම බලපාන්නකි. තම දායකයින්ගේ බෞද්ධ බැතිමතුන්ගේ ගැටළුවලට විසඳුම් සෙවීමට බොහෝ වෙහෙස වූ

ගණේගම හාමුදුරුවෝ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඔවුන් සමඟ එක්ව හරි හරියට සටන් වැදුණි. වරක් බද්දේගම රටබීම හලක් නැවැත්වීම සඳහා උන්වහන්සේ මහා සංඝයා වහන්සේ සමඟ කරණීයමෙත්ත සූත්‍රය කියමින් බද්දේගම වීදි දිගේ පා ගමනින් වැඩියහ. යුධ හමුදා නිලධාරීන්ද එම ක්‍රියාවට ගෞරවයෙන් හිස නැමීය. වැරදි දෙය පිටුදක සත්‍යක්‍රියා කළ හෙයින්, සදාචාරාත්මක පිරිසිදු බවට සැමදා ගරු කළ ගණේගම හාමුදුරුවන්ගේ මැදිහත්වීම නිසා රට බීමහල වැසී ගියේය.

අපේ ගණේගම ශ්‍රී සරණංකර නාහිමියන්ගේ අපවත්වීම පිළිබඳ පුවත ජනක පුතා මට පැවැසුවේ වැලිඔය දීය. එවේලේම රැස්වීමේ කටයුතු නිම කොට, අනුරාධපුරය බලා පිටත්වීමි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟ භාවනා කිරීමට පැමිණි අමිතගවේෂී හිමියන්ද හමුවී, රාත්‍රී අනුරාධපුර මධ්‍යස්ථානයෙන් ආහාර ගෙන පැය දෙකක් පමණ නිදා සිට පාන්දර 2.00 ට පමණ කොළඹ බලා පිටත්වීමු.

අනුරාධපුර-කුරුණෑගල හන්දියේදී කොළ පාට ජීප් රියක සතුන් දෙදෙනෙකු මෙන් මිනිසුන් දෙදෙනෙකු පටවා ගෙන යනු ද දුටිමි.

උදේ 5.20 ට මාලිගාකන්ද පිරිවෙන් පන්සලට පැමිණියෙමු. නීතා ඇතුළු අපේ අයත්, සංස්කෘතික ඇමති ඒ.ජේ. රණසිංහ මහතාත්, බුද්ධ ශාසන ඇමති ලාල් ගමගේ මහතාත්, ඇල්බට් එදිරිසිංහ මහතා ඇතුළු දායක පිරිසක් හාමුදුරුවන්ගේ ගෝලයන් වන සුමන හා සමිත හිමිවරුත් එහි වූහ. එදා රාත්‍රියම දේහය බාරව සිට ඇත්තේ අපේ ශාන්තිසේනා මල්ලිලාය.

දේහයට ගෞරව දක්වා ගෙදර පැමිණියෙමි. ශ්‍රී දේහය දම්සක් මන්දිරයට වඩමවා ගෞරව දැක්වීමට අපේ නංගිලා මල්ලිලා පැමිණ සිටියහ.

උදේ හයහමාරට පමණ රිය පෙරහැර ඉතා අලංකාරව සරසා තිබුණු රාවතාවත්ත පාර දිගේ පැමිණියේය. එහෙත් බද්දේගම සමිත හිමියෝ දේහය ඇතුලට ගැනීමට ඉඩ නොදුන්හ. එම ක්‍රියාව ගැන අනුකම්පා කළ මම, අපේ අයට රිය තුළදීම හිමියන්ට ගෞරව දැක්වීමට ඉඩ සලසා රිය පෙළහර පිටත් කර හැරියෙමි.

දවල් දෙකට පැවැත්වුනු ආදාහන කමිටු රැස්වීම සඳහා මම බද්දේගමට ගියෙමි. මග දෙපසත් බද්දේගමත් සරසා තිබුණේ සර්වෝදය ස්ථානවල පමණි.

අතුරලියේ ඉන්දරතන හිමියන් හා හේමසිරි හිමියන් ඉතා දක්ෂව ආදාහන කමිටුවේ කටයුතු මෙහෙය වූහ. රුපියල් ලක්ෂයක් දක්වා වියදම් කිරීමට හර්ෂට අවසර දුනිමි. සර්වෝදය ද සහභාගිත්වයෙන් තුන්වැනිදා බද්දේගම මහා විද්‍යාලයීය ක්‍රීඩා භූමියේදී ඉතා අලංකාරව ආදාහන උළෙල දහ දාහක් පමණ පිරිසකගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

ආදාහනෝත්සව පෙරහර



ආදාහනෝත්සවයට සහභාගි වූ පිරිස

හාමුදුරුවන්ගේ අපවත්වීම සිදු වූ හැටියේ මා සිතට ආ කවි පද හතරක් සහිතව විශ්වලේඛා ආයතනයෙන් මුද්‍රණය කර දුන් ලස්සන පින්තූරයක් ද බෙදා දුනිමු.

පින්බර මුහුණ සිල් ගුණයෙහි කැඩපතය
පැණසර සිරස තුන් හෙළයෙහි හදවතය
කඩිසර සුරත දම් උතුරන උල්පතය
සුරපුර වැඩි සමිඳු සිහියත් සම්පතය

ජීවත්ව සිටියදී පමණක් නොව, මරණින් පසු ද හිමියෝ සර්වෝදයට සේවාවක්ම වූහ.

ප්‍රබල සර්වෝදය නියමුවෙක් වූ
කිරිමැටියාවේ පඤ්ඤාසාගර හාමුදුරුවෝ

1986 නොවැම්බර් මාසයේ මම ජපානයේ සර්වෝදය රැස්වීම් කිහිපයකට යෑමට සූදානම් වී සිටියෙමි. අපේ පූජ්‍ය පණ්ඩිත කිරිමැටියාවේ පඤ්ඤාසාගර හිමියෝ මා හමුවීමට වැඩම කළහ. මුහුණ පුරා සිනාසෙමින් උන් වහන්සේ මෙසේ පැවැසූහ:

''මහත්තයෝ මම සංඝ සම්මේලනයකට ඉන්දුනීසියාවට යනවා. මා සමඟ තවත් භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ද වැඩම කරනවා. ඒ සමුළුව අවසන් වූවාට පසු, තවත් ටික දිනක් ඉන්දුනීසියාවේ ගත කර බෝරෝ බුදුර් විහාරය ඇතුළු සිද්ධස්ථාන වැඳපුදා ගැනීමට මම බලාපොරොත්තු වෙනවා. ඒ අතරේ ලංකාවටත් වඩා බෞද්ධයෝ සිටින ඉන්දුනීසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා කුමක් හෝ සේවයක් කිරීමට ද මම බලාපොරොත්තු වෙනවා''

මා එක් වරම පිළිතුරු දුන්නේ, 'දැන් ඔය ගමන් නවත්වන්න ළඟදී නේද යුරෝපය ඇමරිකාව ආදී රටවල සංචාරයකට ගොස් පැමිණියේ දැන් මේ වෙලාවෙ අපි සියලු දෙනාම රටේ සිටිය යුතු අවස්ථාවක් හැම පැත්තෙන් ම හිංසාවාදය හිස ඔසවනවා මාත් ජපානයට ගොස් ඒ සමුළුව හමාර කොට කල් නොයවාම පැමිණෙනවා.

මා එසේ පැවසුවත්, වෙන කවරදාටවත් වඩා මේ ගමන යෑමට කිරිමැටියාවේ හිමියන් දැඩි උනන්දුවක් දක්වන බව මට පෙනිණි. ඊළඟට උන්වහන්සේ පැවසුවේ මෙසේ ය:

"බන්දුල මල්ලීට කියල මම වර්ණ පින්තූරයක් ගත්ත. එකක් පන්සලට යවන්න කීව අනිත් එක මෙහේ තියෙන්න ඕනෙ කවුද දන්නෙ ජීවිතයෙ හැටි. සර්වෝදයට නැවත ඒමට මට නුපුළුවන් වෙන්නත් පුළුවන් නෙ'' කියමින් සිනාසී උන්වහන්සේ පිට විය.

මම ජපානයේ සිට දිනක් ගෙදරට දුරකථනයෙන් කතා කළෙමි. ඔවුන් පැවසුවේ ඉන්දුනීසියාවට වැඩම කළ ස්වාමීන් වහන්සේ නමක් රිය අනතුරකට භාජනය වී, අපවත් වූ බව ගුවන් විදුලියෙන් දැනගත් බවයි. ඉන් එහාට විස්තරයක් එනතුරු ඔවුන් බලා සිටින බවය.



පූජ්‍ය කිරිමැටියාවේ පඤ්ඤාසාගර නාහිමි

යුනිසෙෆ් ආයතනයේ ජිම් ග්‍රාන්ට් මහතාගේ ඉල්ලීමක් අනුව මම ඉන්දුනීසියාවේ ජාත්‍යන්තර රැස්වීමක් ඇමතීමට යම් දෝ නොයම් දෝ කියා සිතමින් සිටින අවස්ථාවකි මේ. මම වහාම ඉන්දුනීසියාවට යෑමට තීරණය කළෙමි. එහි වැඩ බලන තානාපති වශයෙන් සේවය කළ මගේ මිත්‍ර ඩබ්ලිව්. පී. ආර්. බී. වික්‍රමසිංහ මහතාට ද දන්වා මම වහාම ඉන්දුනීසියාවට ගියෙමි. ගුවන් තොටුපළේදීම මුණගැසුණු වික්‍රමසිංහ මහතා, සම්පූර්ණ ඛේදවාචකයම මට විස්තර කළේය. විදේශ අමාත්‍යාංශයේ සම්පූර්ණ සහාය ඇතිව එතුමා සියලුම ඉන්දුනීසියාවේ බලධාරීන්ගේ ද උදව් ඇතිව උන්වහන්සේගේ දේහය කල් නොයවාම ලංකාවට පිටත් කර හැරිය බවත් සර්වෝදයේ සහ රජයේ මෙන්ම, උන්වහන්සේගේ දයාබර ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය පූජ්‍ය එගොඩමුල්ලේ අමරමෝලි හිමියන්ගේ ද දැඩි උත්සාහයෙන් ලංකාවේදී සිදු විය යුතු සියලු කටයුතු ගෞරවාන්විතව සිදු වූ බවත් ආදාහන උත්සවය ඉතා ඉහළින් පැවැත්වූ බවත් එතුමා මට විස්තර කළේය.

මේ සියල්ල සිදු වන විට සතියක් ගත වී තිබිණි. කිරිමැටියාවේ පඤ්ඤාසාගර ස්වාමීන් වහන්සේත් මාත් හඳුනා ගත්තේ 1960 දශකයේ දීය. මෙය හදිසියේ සිදුවූවකි. ඒ කාලයේ 5 ශ්‍රී

1106 ජීප්රථය මවිසින්ම පදවාගෙන නීතා සහ දියණිය ද, තවත් සර්වෝදය ළමයින් කිහිප දෙනෙක් ද සමඟ අතරමඟදී නිදා ගැනීමට පැදුරු කොට්ට ආදිය ද ආහාර මුල් ද ගෙන ගමන් යෑම සිරිතක් විය.

දිනක් කුරුණෑගල කැප්පෙටිපොළ පාරේ ගමන් කරන අතර, දිවා ආහාරය ගැනීමට කුඩා ආවාස ගෙයක් ඉදිරියේ තිබූ රම්බඩගල්ලේ මහා පර්වතයක පා මුලට අපි ගියෙමු. එම ගල්තලාවේ වාඩි වී ආහාර ගන්නා විට පඤ්ඤාසාගර හිමියන් එතැනට වැඩියහ. උන්වහන්සේ සර්වෝදය ගැන අසා තිබුණේය. එම නිසා අප දෙදෙනාට ඉතා කිට්ටු කුළුපග බවක් ඇති කර ගැනීමට වැඩි වේලාවක් ගත වූයේ නැත.

5 ශ්‍රී 1106 මා පාවිච්චි කළ ජීප්රථය

වැඩි දවස් නොගොස්, උන් වහන්සේ මරදානේ අපේ නිවසට වැඩම කළ අතර, එතැන් සිට සර්වෝදය සංවිධානය කළ

සෑම ශ්‍රමදාන කඳවුරකට ම වාගේ සහභාගි වූහ. සර්වෝදය සම්මේලනවලට සහභාගි වී අනිවාර්යයෙන් ම ජනතාව උනන්දු කරමින්, වටිනා දේශන පැවැත්වීය. එවකට සර්වෝදය කටයුතුවලට මුල් පෙළේ සංඝ නායකත්වය දුන් ගරු හේන්පිටගෙදර ඥාණසීහ, තුන්නානේ සුමනතිස්ස, ගනේගම සරණංකර, නැදලගමුවේ ජිනානන්ද ආදී වූ සංඝ පීතෘවරයන් වහන්සේලා සමඟ දිවයිනේ සෑම ප්‍රදේශයකම සර්වෝදය පණිවුඩය ගෙන ගියහ. මේ සංඝ පීතෘවරයන් වහන්සේලා අතරට කිරිමැටියාවේ පඤ්ඤාසාගර ස්වාමීන් වහන්සේ ද ප්‍රබල සර්වෝදය නියමුවෙක් ලෙස එකතු වූහ.

කිරිමැටියාවේ හිමියන්ගේ ජන්ම ලාභය සිදු වී තිබෙන්නේ මාතලේ කිරිමැටියාව ගමේ 1929 අප්‍රේල් මස 16 වැනිදාය. උන්වහන්සේ පැවිදි බිමට පත්ව ඇත්තේ 1948 පෙබරවාරි 12 වෙනිදාය. උපසම්පදා වී තිබෙන්නේ 1953 ජූලි මස 14 වැනිදාය. 1953 වර්ෂයෙන් ආරම්භ වූ උන් වහන්සේගේ ලෝක ශාසනික සේවය 1986 නොවැම්බර් මස 26 වැනි දින ඉන්දුනීසියාවේ ජකර්තා නුවර අන්චෝල් ප්‍රදේශයේ මර්තා දිනාතා වීදියේ සිදු වූ මිනි බස්රිය ගැටුමෙන් මෙසේ අවසන් වෙතැයි කිසිවෙක් සිතුවේ නැත.


පූජ්‍ය එගොඩමුල්ලේ අමරමෝලි නාහිමි

1953 දීම මයුර සුමිත්‍ර ධර්ම විද්‍යාලය නමින් මොනරාගල විහාරයේ ආරම්භ කළ, වරෙක ලක්දිව හොඳම දහම් පාසල වශයෙන් නම් කරනු ලැබූ දහම් පාසල උන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ශාසනික සේවයක් විය. 1966 වසරේදී උන්වහන්සේ විසින් විද්‍යාසාගර පිරිවෙන ආරම්භ කළහ. කලක සිට උන්වහන්සේ ක්‍රියාත්මක කළ සර්වෝදය දර්ශනය තම පළාතේ වඩාත් ප්‍රචලිත කරනු වස්, තම ආරාමයේ ම සර්වෝදය ප්‍රාදේශීය

මධ්‍යස්ථානය ආරම්භ කොට යාපහුව මාවතගම හිරියාල කුරුණෑගල සහ දොඩම්ගස්ලන්ද යන ආසනවල ගම් සිය ගණනක පාරවල් ඇලවේලි නිවාස පෙර පාසල් ආදිය පිහිටුවා කටයුතු කළ අතර, සර්වෝදය විධායක සභාවේ ද ක්‍රියාකාරී සාමාජිකයෙක් විය. සර්වෝදය හැරුණු විට බෞද්ධ සම්මේලනය, මහාබෝධි සමාගම ආදී වූ විවිධ ජාතික සහ ජාත්‍යන්තර සංවිධානවල සේවය කළ පඤ්ඤාසාගර හිමියන්ගේ හදිසි අපවත් වීම සර්වෝදයට මෙන්ම පෞද්ගලිකව මට ද බලවත් පාඩුවක් විය.

මාතලේ ශ්‍රී ස්වාමි ප්‍රේමානන්ද සමඟ කිට්ටුවෙන් ආශ්‍රය කළ කිරිමැටියාවේ හාමුදුරුවෝ 1983 දෙසැම්බර් මුල් සතියේ කතරගමින් ආරම්භ කළ සාම පා ගමනේ එතුමා සමඟ ම වැඩම කළහ.

කිරිමැටියාවේ පඤ්ඤාසාගර නාහිමියන්ගෙන් වූ අඩුව හැකි තරම් දුරට පිරිමැසීමට අද අප හා එක්ව සර්වෝදය විධායක සභිකයෙකු හැටියට ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ ශ්‍රී සද්ධර්ම යුක්තික නිකායේ මහා නායක පූජ්‍ය එගොඩමුල්ලේ අමරමෝලි

රාජකීය පණ්ඩිත පූජ්‍ය නැදලගමුවේ ජිනානන්ද අපේ පණ්ඩිත නාහිමිපාණෝ

සත් කෝරළය ඈත අතීතයේ සිටම රට-දැය-සමය ඒකාලෝක කළ මහ තෙරුන් වහන්සේලාට නිජබිමක් විය. සත් කෝරළයේ, කටුගම්පොල හත්පත්තුවේ, නැදලගමුව නම් ග්‍රාමයෙහි ජන්මලාභය ලැබ එම ගම කේන්ද්‍ර කොට ගෙන ගමත් සත් කෝරළයත් රටත් අධ්‍යාපනයෙන් හා ප්‍රජා සේවයෙන් ආලෝකවත් කළ මහ පඬි රුවනකගේ ඇසුර නිශ්‍රය ලැබීමට තරම් මම ද භාග්‍යවන්තයෙක් වීමි. එම බුද්ධ පුත්‍රයාණන් වහන්සේ අන් කවරෙකුවත් නොව රාජකීය පණ්ඩිත පූජ්‍ය නැදලගමුවේ ජිනානන්ද හිමිපාණෝය. මා මෙන්ම අන් බොහෝ දෙනෙකු උන්වහන්සේ ඇමතුවේ පණ්ඩිත හාමුදුරුවෝ යන ගෞරව නාමයෙනි.


පූජ්‍ය නැදලගමුවේ ජිනානන්ද නාහිමි

උන්වහන්සේ ජන්ම ලාභය ලැබුවේ 1919 වෙසක් මස හතර වැනිදා ය. නැදලගමුවේ ප්‍රභූ පවුලක් වූ දනියෙල් අප්පුහාමි මහතා සහ හපුආරච්චිගේ ලැයිසො හාමි මාතාව අප හාමුදුරුවන් ගේ දෙමව්පියෝ වූහ. ගිහි කල නැදලගමුව රජයේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ නැදලගමුවේ ජිනානන්ද ස්වාමීන් වහන්සේ ජ්‍යෙෂ්ඨ විහාගයෙන්ද සමත් වූහ. නැදලගමුව ධර්මරාජ පිරිවෙන් විද්‍යායතනයෙහි ආදි කර්තෘ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායෙහි වයඹ පළාතේ දිසාපාලක ධූරන්ධර

අතිපූජ්‍ය යටගම ශ්‍රී ඤාණුක්කංස මහ තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙකු වශයෙන් 1934 නොවැම්බර් මස 04 වැනිදා උතුම් වූ පැවිදි බිමට පිවිසුණාහ. නැදලගමුවේ පණ්ඩිත හාමුදුරුවෝ 1940 මැයි මස 05 දා උතුම් උපසම්පදාව ලබා සසුනට මුල් බැස ගත් සේක. ඉගෙනීමෙහි අතිදක්ෂයෙක් වූ උන්වහන්සේ 1944 දී ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වූයේ භාෂාත්‍රයෙන්ම ප්‍රමුඛයා ලෙස ත්‍යාග රැසක් ද ලබා ගනිමිනි. 1954 වර්ෂයේදී ප්‍රාචීන භාෂා අවසන් විභාගය උසස් ලෙස සමත් වෙමින් රාජකීය පණ්ඩිත උපාධි නාම භාවිතයට අතිශයින්ම සුදුස්සෙකු වූ අපේ හාමුදුරුවෝ නැදලගමුව ධර්මරාජ පිරිවෙනෙහි ආචාර්යවරයෙකු ලෙස පත්වී වසර 30 ක්ම එහි පරිවේණාධිපති ධූරය හොබවන ලදහ. වයඹ පළාතෙහි පමණක් නොව මුළු මහත් දිවයිනෙහිම කීර්තිමත් විද්‍යාස්ථානයක් ලෙස නැදලගමුව ධර්මරාජ පිරිවෙන ගොඩනැඟීමට නායකත්වය ලබා දුන් පූජ්‍ය පණ්ඩිත නැදලගමුවේ ජිනානන්ද හිමිපාණෝ එම විද්‍යායතනය තුළින් විද්වතුන් රාශියක්ම සමාජයට බිහි කිරීමටද සමත් වූහ.

සර්වෝදය ඉතිහාසයේ රන් අකුරෙන් නම සඳහන් වන අපේ පණ්ඩිත ස්වාමීන් වහන්සේ මට මුලින්ම හඳුනා ගැනීමට ලැබුණේ 1965 වර්ෂයේදීය. නාලන්දා විද්‍යාලයෙහි සිප්සතර හැදෑරූ ශිෂ්‍යයෙකු වන ජයවික්‍රම පෙරේරා මහතා ශිෂ්‍ය නායකයෙකු වශයෙන් 1958 වර්ෂයේදී කුරුණෑගල හෙට්ටිපොල කනතොළුව ගමෙහි පැවැත්වූ ප්‍රථම ශ්‍රමදාන කඳවුරට සහභාගි වීය. සිය ගම් පළාත වූ ගිරිඋල්ල, කටුගම්පල, පන්නල ප්‍රදේශයන්හි නොදියුණු ගම්මාන සර්වෝදය ශ්‍රමදාන සේවාව තුළින් දියුණු කිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ප්‍රභූවරයෙකි. පසුව ඔහු දේශපාලන ක්ෂෙත්‍රයට අවතීර්ණ වී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, ඇමතිවරයෙකු, මහ ඇමතිවරයෙකු වශයෙන් දේශපාලන කරලියේ ඉහළටම නැග රටට විශාල සේවාවක් ඉටු කළේය. අදත් දේශපාලඥයෙකු වශයෙන් එතුමා කටයුතු කරයි. ඔහු විසින් නැදලගමුව ප්‍රදේශයේ සත් පුරුෂයෙකු වූ සිංහ පෙරේරා මහතා සමඟ නැදලගමුව කේන්ද්‍ර කොට ගෙන අවට ගම් දියුණු කිරීමේ ශ්‍රමදාන කඳවුරු ආරම්භ කර එම වැඩ පිළිවෙලට අවවාද

අනුශාසනා කළ පූජ්‍ය පණ්ඩිත නැදලගමුවේ ජිනානන්ද ස්වාමීන් වහන්සේ ඇසුරු කිරීමට මට ද භාග්‍යය ලැබුණි. උන්වහන්සේ එදා සිට අපවත් වන තුරුම අපගේ කල්‍යාණ මිත්‍රයෙකු වූවා පමණක් නොව සර්වෝදය සංසදයෙහි සියලු කටයුතුවලටම ක්‍රියාකාරීව සහභාගී වී උපදේශකත්වය සපයමින් පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ සේක. තරුණ වියේදීම සිංහ පෙරේරා මහතා අප අතරින් සදහටම වෙන් වුවත් එතුමාගේ බිරිඳ ලක්ෂ්මී පෙරේරා මැතිනිය අදත් සර්වෝදය ව්‍යාපාරයට ඇප-කැප වී නැදලගමුව ගම්මානයේ සේවාවන් කරන්නීය.

නැදලගමුවේ පණ්ඩිත හාමුදුරුවෝ මුවඟ නිතරම සිනහ රැල්ලක් ශෝභමානවේ. ඉතාමත්ම තැන්පත් සියුම් කටහඬකින් කතා කරන උන්වහන්සේගේ වචන ඕනෑම කෙනෙකුගේ හදවතට කිඳාබසින සුළුය. වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම සරලය. චාම්ය. නිරහංකාරය. සංඝශෝභන ගුනයෙන් අනූනය. ධර්මධරයත විනයධරය. උන්වහන්සේගේ දේශනා ශෛලිය ඉතා මනහරය. උපමා උපමේය භාවිතය අපට සිහි ගන්වනු ලබන්නේ දඹදෙණිය යුගයේ වැඩ සිටි සද්ධර්මරත්නාවලී කර්තෘ ධර්මසේන මහතෙරුන් වහන්සේය. පරිත්‍යාගශීලී බව උන්වහන්සේ සසර පුරා පුරුදු කළ පාරමිතාවක්මය.

අපේ පණ්ඩිත හාමුදුරුවෝ සර්වෝදය සංගමයේ විධායක සභාවේ වැඩිහිටි මණ්ඩලයේ සභිකයෙකු ලෙස ඉටු කළ මෙහෙය කියා නිම කළ නොහැක. උන්වහන්සේ සෑම මාසයකට වරක් පැවැත්වූ විධායක මණ්ඩල රැස්වීමට නොකඩවාම සහභාගි වූහ. 1977 වර්ෂයේදී අපේ පණ්ඩිත හාමුදුරුවෝ සර්වෝදය නියෝජනය කරමින් බටහිර ජර්මනියෙහි දූත මෙහෙවරෙහි ද නිරත වූහ. එම ගමනේදී ලැබූ අත්දැකීම් නැදලගමුව හා අවට ගම්වල සර්වෝදය ශ්‍රමදාන සමිති, ග්‍රාම සංවර්ධන සමිති, අවමංගල්‍යාධාර සමිති හා දහම් පාසල්වල කාර්යයන්හිදී ප්‍රායෝගිකවම භාවිතා කළහ. නැදලගමුව ධර්මරාජ පිරිවෙන මූලික කොට ගෙන, ජයප්‍රකාශ් නාරායන් මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් 1969 දී එවකට ඉන්දීය මහකොමසාරිස්ව සිටි ආචාර්ය බිම්සෙන් සචාර් මැතිතුමා, සුප්‍රසිද්ධ

ඉන්දීය සර්වෝදය නායකවරුන් වන ශ්‍රී දේවේන්ද්‍ර කුමාර් ගුප්තා මහතා, රාමචන්ද්‍ර මහතා ආදීහු ද යාපනයේ මුදලිය කේ. සින්නතම්බි මහතා ඇතුළු යාපනයෙන් විශාල පිරිසක් මෙම ජාත්‍යන්තර සමුළුවට සහභාගි වූහ.

දායකකාරකාදීන්ගේ ආගමික කටයුතු නොපිරිහෙළා ඉටු කළ පණ්ඩිත හාමුදුරුවෝ ප්‍රජා සංවර්ධන කාර්යයන් හිදී ලබා දෙන ලද බුද්ධිමය දායකත්වය අපගේ මෙන්ම ජනතාවගේ මතකයෙන් ද කිසිදා ඈත් නොවනු ඇත. රාජකීය පණ්ඩිත පූජ්‍ය නැදලගමුවේ ජිනානන්ද හිමිපාණෝ සියලු සංස්කාර ධර්මයන්ගේ අනියත බව පසක් කරමින් උන්වහන්සේගේ කෘතහස්ත සේවය සමාජයට අතිශයින්ම අවශ්‍යව තිබුණු අවස්ථාවක 1988 ජූලි මස 16 වැනි දින පෙ.ව.6.10 ට සිහි නුවණින් යුතුව අපවත්වී වදාළ සේක. එහෙත් උන්වහන්සේගේ කීර්තිකදම්භය කිසිදාක අපවත් නොවනු ඇත.

210

ලෝක ශාසන සේවයට කැප වූ
පූජ්‍ය යටිපව්වේ රතනසාර ලොකු හාමුදුරුවෝ

අපවත් වී වදාළ ගරු යටිපව්වේ රතනසාර ලොකු හාමුදුරුවන් මා පළමුවෙන්ම දුටුවේ 1970 වසරේදීය. සර්වෝදය මූලස්ථානය මොරටුව, රාවතාවත්තේ, පල්ලියගොඩැල්ල පුරාණ විහාරස්ථානයට යාබද තැනකට ගෙන ඒමත් සමඟම රතනසාර ලොකු හාමුදුරුවෝ මගේ ගෞරවය දිනාගත් සංඝපීතෘන් වහන්සේ නමක් වූහ. අවසන් වරට උන් වහන්සේ මා සමඟ කතා කළේ අපවත් වීමට විසි හතර පැයකට ප්‍රථම කොළඹ මහ රෝහලේදීය. උන්වහන්සේ මගෙන් කළ ඉල්ලීම වැඩ කටයුතු ඉදිරියට ගෙන යන්නට ඕනේ යන්නයි.


පූජ්‍ය යටිපව්වේ රතනසාර නාහිමි

උන් වහන්සේ ජීවත් වූයේ ලෝක ශාසන සේවය සඳහාය. ඒ නිසා ම තමන්ගේ ශරීර සෞඛ්‍යය ගැන නොතකා දිවා රෑ පල්ලිය ගොඩැල්ල විහාරය පැරණි සම්ප්‍රදායානුකූලව ලෝක ශාසන සේවය සිදු කරන නියම බෞද්ධ ආරාමයක් වශයෙන් පවත්වාගෙන යාමට වෙහෙසුණහ.

මොරටු ප්‍රදේශය ජනාකීර්ණ වූ නාගරික බලවේගවලට පහසුවෙන් ගොදුරු විය හැකි පරිසරයකි. මෙම පරිසරයේ ජීවත් වන දරුවන් හා තරුණ තරුණියන් බෞද්ධ සංස්කෘතියට නැඹුරු කොට, යහපත් මඟකට උන් වහන්සේ විසින් යොමු කළ අන්දම දීර්ඝ කාලයක් තිස්සේ මම දුටුවෙමි. අපේ පන්සලක ලොකු හාමුදුරුවන් වහන්සේ නමකගෙන් යම් පරිපූර්ණත්වයක්

මාර්ගෝපදේශකත්වයක් අපි බලාපොරොත්තු වෙමු ද, එය යටිපව්වේ ලොකු හාමුදුරුවන් වහන්සේගෙන් අවට දායක පවුල්වලට නොඅඩුව ලැබුණේය.

විවිධ දේශපාලන ගැටුම්වලට ගිහි පැවිදි බොහෝ දෙනා ඉබේම පටලැවෙන යුගයක අපේ ලොකු හාමුදුරුවන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ පෞරුෂය නිසා පල්ලියගොඩැල්ල ආරාමය නියම බෞද්ධ සිද්ධස්ථානයක් වශයෙන් සමගි සම්පන්නව ජනතාව එක් තැන් වන තැනක් විය.

සර්වෝදයට සම්බන්ධ භික්ෂූන් වහන්සේලා දහස් ගණන් දම්සක් මන්දිර සර්වෝදය මූලස්ථානයට වැඩම කළ විට, උන් වහන්සේලාගේ සියලුම සිව්පසය සැලසුණේත්, අඩුවක් නැතුව ආගන්තුක සත්කාර ඉටු වුණේත්, උන්වහන්සේගෙ නායකත්වය යටතේ නිසා පල්ලියගොඩැල්ල විහාරය සර්වෝදය ව්‍යාපාරයට ඉමහත් ශක්තියක් දුන් ශාසන සේවා ස්ථානයක් බවට පත් විය.

තැනට සුදුසු පරිදි ධර්ම අවවාද දීමත්, සියලුම පුණ්‍යකර්මවලට සම්ප්‍රදායානුකූල බව ඇති කිරීමත්, ළාබාල භික්ෂූන් වහන්සේලාට ආදර්ශවත් නායකත්වයක් දීමත්, පන්සලක ලොකු හාමුදුරුවන් වහන්සේ නමක් මේ අන්දමින් පරිපූර්ණ විය යුතු යැයි පෙන්වන්නාක් මෙන් සියලුම ඇවතුම්-පැවතුම් සකස් කර ගැනීමත් නිසා, උන් වහන්සේ අපේ වත්මන් සංඝ පරපුරේ කීර්තිමත් සංඝපීතෘන් වහන්සේ නමක් වූහ.

පුරා 51 වසරකටත් අධික කාලයක් මහණ දම් පිරූ ගරු යටිපව්වේ රතනසාර මාහිමිපාණන් වහන්සේ 1983 ජූනි මස 02 දා ලෝ දහම අනුව සදහටම අප අතරින් වෙන් වූ සේක. කළ ගුණ දත් දායකකාරකාදීන් ඉමහත් හරසරින් උන් වහන්සේගේ ආදාහන කටයුතු මොරටුව ප්‍රසිද්ධ සුසාන භූමියේදී සිදු කළහ. ආදාහන කමිටුවේ සභාපති වශයෙන් මම කටයුතු කළෙමි.

සමාවෙන්න සර් අඳුනන්න බැරිවයි නතර කළේ

පෙම්සිරි ද සිල්වා මල්ලී සර්වෝදය සේවයට එකතු වූයේ 1978 දී පමණය. එවකට අපේ ක්‍රියාකාරී විධායක සභිකයකුව සිටි ඩී.එස්. ලියනගේ මහතා විසින් ඔහුව බාර ගෙන, ජායාරූප අංශයේ වින්සන්ට් සිරිසේන මල්ලීට බාර දෙන ලදී. ඔහු ජායාරූප ශිල්පියෙක් හැටියට පුහුණු වන අතර, වරින් වර මම ඔහුව ඈත එපිට ගම්වලට යන චාරිකාවලටද එකතු කර ගත්තෙමි. මගේ භව තණ්හා පළමු වෙළුම කියවීමෙන් පසු ඔහුගේ දින සටහන් පොතෙන් උපුටා ගත් පහත සඳහන් කොටස මට ලියා එව්වේය.



පෙම්සිරි ද සිල්වා මහතා

ඩී.එස්. ලියනගේ මහතා අද මා සර්වෝදයට එක් කර ගෙන ගියේය. ලියනගේ මහතා එහි ලේකම් විය. වැඩි කතාබහකින් තොර වුවත්, ලියනගේ මහතා ප්‍රසන්න පුද්ගලයෙකි. නිතර සිනහමුසු මුහුණින් පසුවන ඒ මහතා මිනිසුන්ට උදව් කිරීමට කැමති කෙනෙකි. පෞද්ගලිකව මට බෙහෙවින් කාරුණිකව උදව් කළ කෙනෙකි.

දින වකවානු හරිහැටි මතකයේ නැතත්, මා සර්වෝදය වෙත යන විට ඔබතුමා සිටියේ රටින් බැහැරවය. එකල කරුණානන්ද මහතා සභාපති විය.

වින්සන්ට් සිරිසේන අයියාට මා හඳුන්වා දීමෙන් අනතුරුව ලොකු බාලසූරිය අයියා ළඟට මා කැඳවා ගෙන ගියා. ඉතාම කාරුණිකව ප්‍රශ්න කිහිපයක් ඇසූ ඔහු 'සර් එනකං මල්ලී වැඩ කරන්න. යැයි' පැවසීය. එකල සර්වෝදයේ බොහෝ කටයුතුවල මූලිකත්වය ගෙන කටයුතු කළේ ලොකු බාලසූරිය අයියා සහ කිරිවන්දෙනිය අයියායි. ෂෙල්ටන් සහ හර්ෂ අයියා තරුණයින් අතර කැපී පෙනුණ අය වූහ.

මට මුල් වරටම ඡායාරූප පිටපත් තුනක් මුද්‍රණය කරන ලෙස දන්වූ වින්සන්ට් අයියා 'ඩාර්ක් රූම් එක' (Dark Room) සහ එහි උපකරණ පෙන්වීය. එය ඉතා කුඩා කාමරයක් විය. ඔහු දුන් .නෙගටිව්. (Negative) එකෙන් එකම ප්‍රමාණයට මා පිටපත් තුනක් මුද්‍රණය කළෙමි. ඒවා බැලූ වින්සන්ට් අයියා, හොඳයි හෙට ඉඳලා එන්න කීවද...? ඔව්.

'එහෙනම් උදේම එන්න වැඩ තියෙනවා' යි පැවැසීය.

වින්සන්ට් අයියා වැඩි කතාබහට කැමති කෙනෙකු නොවීය. ඔහුගේ හොඳම හිතවතා වූයේ සාලිය සමරවික්‍රමය. පසු කාලයක මා දැනගත් පරිදි වින්සන්ට් සර්වෝදයට කැඳවා ගෙන ඇවිත් ඇත්තේ සාලිය විසින් ය. පළමු වරට මා මුද්‍රණය කළ පින්තූර තුන කරුණානන්ද මහතාගේ මැණියන්ගේ පින්තූරයි.

පළමු මාසය ගෙවී ගියද මා වෙත කිසිදු දීමනාවක් නොලැබුණි. දිවා ආහාරය නොමිලේ ලැබුණි. පාන්දරම වැඩට පැමිණෙන මම බොහෝ විට උදේ ආහාරය ද එහිදී ගැනීමට පුරුදු වීමි. මෙත්මැඳුරේ මැද සාදා තිබූ පවුල්හමු ශාලාවේ බිම වාඩි වී සියල්ලන් සමඟ ආහාර ගැනීම නුහුරු පුරුද්දක් වුවත්, මම එයට ආසා කළෙමි. ආහාර අංශය සහ අමුත්තන්ට සංග්‍රහ කිරීම බාරව සිටියේ විජේසේකර මහතාය. ආහාර පිසීමේ කටයුතුවල මූලිකත්වය දැරුවේ සුමනක්කාත්, උක්කුබණ්ඩා අයියා සහ ඇල්බට් අයියාත්ය. ඇල්බට් අයියාගේ ගම බුන්දලය. උක්කුබණ්ඩා අයියා රඹුක්කන ප්‍රදේශයේ කෙනෙකි. සුමනක්කාගේ ගම මැල්සිරිපුරය. ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණි අය, එකම පවුලක් ලෙස ජීවත් වීම දැකීම, මට සතුටක් මෙන්ම පුදුමයක් සේ දැනිණි. දිවා ආහාර

ගත් පසු එතැන පිරිසිදු කිරීමෙන් අනතුරුව දිවා පවුල්හමුව පැවැත්වේ. මුල්ම දිනවල මා එයට සහභාගි වූයේ නැත. මුලු මෙත්මැඳුරේ සෑම තැනකම සොයා බලමින්, පවුල් හමුවට සහභාගි නොවන අය එයට සහභාගි කරවීමට ෂෙල්ටන් අයියා උත්සාහ ගනී.



විජේසේකර මහතා

අපගේ ආහාර ගැන සොයා බැලූ විජේසේකර මහතා, සිංහල මුල් ගුරුවරයෙකි. අවිවාහක මහතෙකකු වූ හෙතෙම ඉතාමත් කරුණාවන්තය.

මගේ මතක සටහන් අනුව එදා 1978 ඔක්තෝම්බර් 5 වැනිදා මං පාන්දරම වැඩට ගියා. විජේසේකර මහතා හදිසියේම රෝගාතුර වෙලා. රෝහලට ඇතුළත් කරලා. මට ඒ විස්තරය කීවේ, එඩ්ගාර් ප්‍රනාන්දු මහතාය. එඩ්ගාර් ප්‍රනාන්දු මහතා කියූ හැටියට විජේසේකර මහතාට තරමක් අමාරුයි වගේ. එඩ්ගාර් ප්‍රනාන්දු මහතාත් බොහොම සංවේදී හැඟීම් ඇති කෙනෙකි. කවදාවත් ඒ මහතාට තරහ ගිය වෙලාවක් මට මතක නැහැ. වැනිලා සුරුට්ටුවක් බීමට පුරුදුව සිටි ඒ මහතා, පදිංචිව සිටියේ මෙත්මැඳුරට අල්ලපු ගෙදරයි. එඩ්ගාර් ප්‍රනාන්දු මහතා විශ්‍රාම ගොස්, සර්වෝදයේ ලිපිකරු වශයෙන් එකල සේවය කළ කෙනෙකි. (ලිපිකරු කීවාට එතුමා මුළු ආයතනයේ බොහෝ සේවාවන්ට අනුබද්ධිත යම් යම් රාජකාරී කටයුතුවල නිරත වී සිටි කෙනෙකි.) එදා මෙත්මැඳුරේ තිබුණේ තරමක පාලු හැඟීම් ඇති කරවන පරිසරයක්. මං හවස ගෙදර ආවා.

රාත්‍රී 10.30 ට විතර අපේ ගෙදර දොරට තට්ටු කරන ශබ්දයට දොර ඇරියා. කරු අයියාත්, නිමල් සහ කුලසිරි මල්ලීත් අපේ ගෙදර ඇවිත් ගෙට ගොඩවුනු ගමන් මං ඇහුවේ, විජේසේකර මහත්තයට කොහොමද? කියලයි. ඒත් කවුරුවත් එක වර කතා කළේ නැහැ. ඉන්ද්‍රානිත් නැගිටලා ආවා. කරු අයියලාට වාඩි වෙන්න කීවා.'නැහැ නංගී අපි විජේසේකර මහත්තයට බෝධි පූජාවක් පවත්වන්න ආවා. ඒත් රාත්‍රී 8.45 ට විජේසේකර මහත්තයා නැතිවෙලා'.

අපට අදහා ගන්නත් බැහැ. මං බොහොම අමාරුවෙන් හිත් වේදනාව මැඩ පවත්වා ගත්තා. ඒත් ඉන්ද්‍රානි ඇඬුවා. නංගී, 'පෙම්සිරි මල්ලීට සර් එන්න කීවා' අපි ආවෙ මල්ලිව එක්කර ගෙන යන්න කියලා කරු අයියා කීවා.

මම කරු අයියලා සමඟ සර්වෝදයට ගියා. සර් හිටියේ බොහොම දුක්බර මුහුණකින්. හිත් වේදනාවකින්. මං කවදාවත් දැකලා නැහැ සර්ගේ ඇස්වල කඳුළු. ඒත් ඒ වෙලාවේ සර්ගේ ඇස් රතුවෙලා කඳුළු පිරිලා 'සර්ට කතා කර ගන්නත් බැහැ' ඉතාම දුක්මුසු ස්වරයෙන් පෙම්සිරි, විජේසේකර මහත්තයාගේ පින්තූරයක් හදලා දෙන්න පුළුවන්ද? සර්ගේ ඒ ප්‍රශ්නයට මට ඇති වූ හැඟීම් විස්තර කරන්න අමාරුයි. මේ වගේ අත්‍යවශ්‍ය අවස්ථාවකදීත් අපට සර් කියා දුන්නේ පාඩමක්. පින්තූරය හදන එක අවශ්‍යම කාර්යයක් වුවත්, එය කර දෙන ලෙස අපගෙන් ඉල්ලා සිටි කාරුණිකත්වය වෙනත් කිසිවෙකුගෙන් බලාපොරොත්තු විය හැකි කතාවක් නොවේ.

ඒ වෙලාවේම මම විජේසේකර මහතාගේ පින්තූර කිහිපයක් හදලා දුන්නා. ඒ වෙනකොට වෙලාව රාත්‍රී 12.00 පහුවෙලා.

වෙන දවසක නම් මේ වෙලාව වෙනකම් ඇහැරලා හිටියොත්, 'මලේ තේ ටිකක් බොමුද?' කියලා අහන විජේසේකර මහතා අද නිහඬයි. ජීවිතය මේකද? මුළු මෙත්මැඳුරම පාලුයි. ජීවිතය මේකද? මැරෙන්න ඕන මිනිස්සු ද මැරෙන්නේ.?

* * *

මෙත්මැඳුරට රෑ කීයට ගියත් විජේසේකර මහත්තයා ඇහැරලා. ඒ මහතා නිදා ගත් වේලාවක් නැහැ. බඩු ගේන්න වාහනයට නැග්ග වෙලාවට විතරයි එතුමා නිදා ගත්තේ. ඒ තරම් කැපවීමක් එතුමාට තිබුණා. බොහොම කාරුණික මහතෙකුගේ අවසානය අපගේ ද අවාසනාවකි.

එකම එක පුද්ගලයෙක් වුවත්, එතුමාගේ අඩුව හිස් තැනක් සේ අප හිතට තදින් දැනෙනවා.

පාන්දරම මෙත්මැඳුරේ පවුල් හමුව. සර් කතා කළා. මගේ පියා නැතිවුනු මොහොතේදීවත් මට ඇඬුනේ නැහැ. ඒත් විජේසේකර මහතා නැතිවුණු මොහොතේ මං හුඟක් ඇඬුවා. එතුමා නැතිවීම අපට බලවත් පාඩුවක්. ව්‍යාපාරයට බලවත් පාඩුවක්. එතුමා තරම් මිනිසුන්ට කන්න දුන් වෙන කෙනෙක් අප ව්‍යාපාරයේ නෑ. එතුමා වෙනුවෙන් දිය යුතු ඉහළම ගෞරවය අපි දෙන්න ඕනේ. එතුමාට අපගේ පින් අවශ්‍ය නෑ. එතුමා ඒ තරමට පින් කළ කෙනෙක්.

සර් කතා කළ වචන මයි මං ලියා ගත්තේ. ඒ තරම් දුක්බර ස්වරයකින් සර් කතා කළේ.

සර්ගේ දරාගත නොහැකි වේදනාව ගැන නීතක්කාත් බය වෙලා. ඒ නිසා මේ පරිසරයෙන් ටිකකට හෝ පිටට යන්න තීරණය කරලා. අම්පාරේ යන්න සූදානම් වෙලා. වින්යා මල්ලීත්, මමත්, කරු අයියාත් සර් සමඟ පිටත් වුණා. කිසිම කතාවක් නැහැ. වාහනය තුළ බොහොම තද නිශ්ශබ්දතාවයක්.



සිසිර නවරත්න මහතා

හර්ෂ කුමාර නවරත්න මහතා

මහනුවරදී සිසිර මල්ලී හමු වුණා. සිසිර නවරත්න. මහනුවර පන්විල මධ්‍යස්ථානය බාරව කටයුතු කළේ සිසිර. එයත් අප සමඟ එකතු වුණා.

සර්, සිසිරගෙන් ඇහුවා. ඇයි ඔයා මහා සම්මේලනයට නාවේ කියලා 'සිසිර මොකුත් කීවේ නැහැ' ඊළඟට ආයෙත් සර් කතා කළා.

මට හරි ප්‍රශ්නයක්. මහා සම්මේලනයේදී හර්ෂ කතා කරපු හැටි. මොනවද එයා කීවේ...? එයාට මං මොනවද කතා කරන්න කීවේ. ඒත් එයා කතා කළේ මොනව හරි දෙයක් හිතේ තියාගෙන. තමන් ගැන විතරයි හිතන්නේ. මට හරි කලකිරීමක් ඇති වුණා. සර් ටිකක් නිශ්ශබ්දව ඉඳලා නැවතත් කතා කළා.

පී. හේවාවිතාරණ මහතා

මම ප්‍රාදේශීය නායකයින් වශයෙන් සලකන තුන් දෙනෙක් ඉන්නවා. එක සිසිර. දෙක හර්ෂ. තුන හේවා-විතාරණ. හර්ෂට අවශ්‍ය හැම නිදහසක්ම පහසුකමක්ම මා දීලා තියෙනවා. ඇයි එයාට වැඩ කරන්න බැරි? හේවා

නිතරම කියන්නේ මං එන්නේ නැතිලු. මම 3 වැනිදා පිටවෙලා 4 වැනිදා මුළු දවසම ගත කළේ මාතර දෙනියාය කොටසේ. ඉස්සෙල්ලාම අඟුනකොලපැලැස්සට ගියා. (මේ සර් වාහනේ ඇතුළේ සිට සිසිරට කියූ හැටි) එතන ගෑණු ලමයෙක් හිටියා. කොහේද යන්නේ කියලා ඇහුවා. කිරි-පිටි ගෙනියන්න ආවා. කොච්චර දුර යන්න තියෙනවද? කියලා මං ඇහුවා. ශත 40 ක දුර යන්න තියෙන බව කීවා. පස්සෙ මං අපි ගිය වාහනේම නංවා ගත්තා. යන ගමන් සර් පෙර පාසල ගැන ඇහුවා. ඒ නංගීම කැලේට ගිහින් ලී කපාගෙන ඇවිත් පෙර පාසල හැදුවා කීවා. කොච්චර වියදම් වුනාද කියා සර් ඇහුවා. හුඟක් වියදම් වුනා කීවා. එතකොට සර් ඇහුවා රුපියල් සීයක් විතර? නෑ එච්චර වියදම් වුනේ නැහැ කීවා. එහෙනම් රුපියල් පනහක් විතර. ඔව් එච්චර විතර වියදම් වුනා කීවා.

සර් මට කීවා, සර්ගේ බෑග් එකේ අයිනේ සාක්කුවේ තියෙන ලියුම් කවරයෙන් රුපියල් පනහක් අරගෙන දෙන්න කියලා. රුපියල් පනහේ කොළයක් තිබුණේ නැහැ. සියයේ කොළයක් තිබුණේ. ඒක ඒ නංගිට දුන්නා. ඒ ළමයා ගන්නම බැහැ කීවා. සර් බලෙන් වාගේ ඒ රුපියල් සියය දීලා ආවා.

මම ඒ නංගිට රුපියල් සියයක් දුන්නා කියලා හේවා මට දොස් කියලා ලියුමක් එවලා තියෙනවා. මම හිතාගෙන ඉන්නෙ ඔය ගොල්ලෝ හුඟක් ඉදිරියෙන් ඉන්නවා කියලයි. ඒත් ඔයගොල්ලෝ තාමත් පටන් ගත්ත තැනමයි. එතකොට සිසිර කතා කළා.

සර්, මම ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව පටන් ගත්තා. ඇයි ඒ ගැන සැක කරන්නෙ? ඇයි සර්, අපේ වැඩ ගැන ඔතරම් විමසිලි වන්නේ?

සිසිර, මං ඔයගොල්ලන්ගේ පාඨමාලාවල වැරදි හොයනවා නෙවෙයි. අඩුපාඩුයි බැලුවේ. ඔයගොල්ලෝ හැම වෙලාවෙම හිතාගෙන ඉන්නේ තමුන් හරි කියලයි. ඒත් ඒක වැරදියි. ව්‍යාපාරයේ සමහර දේ කොටස් වශයෙන් මං අගයනවා. සමස්තයක් වශයෙන් අගයන්නේ නැහැ කියලා සිසිර කීවා.

සමස්තයක් වශයෙන් අගයන්නේ නැත්තේ ඔයගොල්ලන්මයි. මම හැම විටම සමස්තයක් වශයෙන් ව්‍යාපාරය ගොඩ නගන්නයි උත්සාහ ගන්නේ. ඒත් මට සමස්තයක් වශයෙන් ගොඩ නගාගන්න අත දෙන්න අය නැහැ. මම විශ්වාස කර ගෙන ඉන්න මිනිස්සු ප්‍රාදේශීය විරයෝ වෙන්න හදන අය සර් එහෙම කීවා.

බතික් අංශයේ සේවය කළ ඉන්ද්‍රානි නංගිත් සමඟ විවාහ වී, පෙම්සිරි මල්ලී පසු කලෙක කොළඹින් බැහැර පදිංචියට ගියේය. සර්වෝදය ව්‍යාපාරයට මෙන්ම මටද එදත් අදත් ලැදි මොහු දැන් වැඩ කරන්නේ පොල් පර්යේෂණායතනයේය.

* **

(අතීතය සිහිපත් කර විටින් විට මා වෙත එවන ලද ලියුම් වලින් උපුටා ගත් කොටස් කිහිපයකි.)

මා ප්‍රථමයෙන්ම සර් සමඟ ගමනක් ගියේ හදිසියේ වින්සන්ට් අයියා අසනීප වූ නිසා. ඒ වව්නියාවේ මලයාපරන්තිකුලම් කියන ගමට. ඒ ගමනට පූජ්‍ය තුන්නානේ සුමනතිස්ස හිමිපාණෝ, කරුණානන්ද මහතා, කිරිවන්දෙනිය අයියාත් සහභාගි වුනා. අපි ගියේ 1785 දරණ ලෑන්ඩ්රෝවර් (Land Rower) වාහනයෙන්. වාහනයේ රියැදුරු සිරිපාල අයියා. අපි දඹුල්ලට යන විට දවල් වුනා. දිවා ආහාරය සඳහා දඹුල්ල තානායමට ගියේ. මම කෑවේ බොහොම ටිකයි.

'තරුණයා, ඔහොම කාලා බැහැ. හොඳට කන්න ඕනෙ'. කියලා කරුණානන්ද සර් කීවා. කරුණානන්ද සර්ට තිබුණේ බොහොම ගාම්භීර පෙනුමක්. ඒත් එතුමාගේ මුහුණ දිහා බොහෝ වේලාවක් බලා සිටීමට හැකි සුන්දර පෙනුමක් තිබුණා. ආහාරයෙන් පස්සේ වාහනය පදවා ගෙන ගියේ ඔබතුමා. බොහොම වේගයෙන් වාහනය පදවා ගෙන ගියා. මට නුහුරු නිසා බයකුත් දැනුණා. ඔබතුමාගේ වේගවත් රිය පැදවීම ගැන ඊට පස්සේ වූ සිදුවීමක් මට අද වගේ මතකයි. එක දවසක් උදේ 8.00 වන විට මහනුවර ඉන්න තිබුණේ. ඒත් මෙත්මැඳුරින් පිටත් වන විට 5.30 පහුවෙලා.

වාහනේ පදවා ගෙන ගියේ සර්. ඒ වාහනේ කොළපාට මිට්සුබිෂි ජීප් (Mitsubishi Jeep) එක. (පසුව එය නන්දසේන රත්නපාල මහතාගේ ගමන් සඳහා පෙරේරා අයියා සමඟ වෙන් කර තිබුණා. අද මහාචාර්ය රත්නපාල මහතාත්, රියැදුරු පෙරේරා අයියාත් ජීවතුන් අතර නැහැ.) ඔබතුමා ඉතා වේගයෙන් කඩවත නගරය පසු කරනවාත් සමඟ පොලිස් කොස්තාපල්වරු දෙදෙනෙක් වාහනය නතර කරන්න අණ කළා. මා සිටි පැත්තෙන් ආ කොස්තාපල්වරයා

'ගන්නවා ලයිසන් එක' ඔහොමද වාහන එළවන්නෙ? කියා ප්‍රශ්න කළා.

'රාලහාමි, හදිසියේ නුවර ඉන්න ඕනෙ නිසයි. ටිකක් වේගයෙන් ආවෙ.

'ටිකක් වේගයෙන්' හොඳ ටික. ඔහොම ගියොත් නුවර නෙවෙයි යන්න වෙන්නේ කනත්තට.... ගන්නවා ලයිසන් එක.... සර් ලයිසන්එක කොස්තාපල්වරයාට දුන්නා.

එය බැලූ ඔහු 'සමාවෙන්න සර්, හඳුනා ගන්න බැරිවයි නතර කළේ. යන්න සර් යන්න යයි. පැවසූ ඔහු හිස නමා ආචාර කළා.

'නෑ ඔබගේ රාජකාරිය නේ. රාජකාරිය ඉටු කරන්න'.

'අපොයි, සර් රටට කරන සේවය දිහා බලන කොට අපි කොහොමද සර්ට විරුද්ධ වෙන්නේ' අපට සමාවෙලා සර් යන ගමන යන්න'.

'සර් හිනහ වෙලා අපි එහෙනම් යන්නම්.....බොහොම ස්තුතියි! බුදු සරණයි!. කියා නැවතත් ගමන පටන් ගත්තා.

'පෙම්සිරි දන්නවද පොලීසියේ අය මොනවද හිතුවේ කියලා'. සර් මගෙන් විමසුවා. 'මං දන් නෑ සර්'. 'ඒ අය හිතන්න ඇති ඔයා මහත්තයා. මම ඩ්‍රයිවර් කියලා. ඇයි මම සරමයි බැනියමයි නේ ඇඳලා ඉන්නේ'. ඒ වගේ මුළු රටම හඳුනන, රටම පිළිගත් ඔබතුමා සමඟ ළංව සිටීම මගේ භාග්‍යයක් සේ මට හිතුණා.

මලයාපරන්තිකුලම ගමේ එදින සවස පොඩි පවුල් හමුවක් තිබුණා. ඒ පවුල් හමුවේ තුන්නානේ හාමුදුරුවෝ දේශනයක් පැවැත්වූවා. හාමුදුරුවන්ට තිබුණේ පුදුම දක්ෂ කමක්. උපහැරණ බොහොම සරලයි. ගැමි උපහැරණ. හරියට සද්ධර්මරත්නාවලියේ වගේ.

'මං මේ ගමට මුලින්ම ඇවිත් පන්සිල් දෙන කොට මේ දූරියන් වැඳගෙන හිටියේ හරියට ලී මඩුවක පොල් පරාල තියලා තියෙනවා වගේ.' ඒ වගේ උදාහරණ බොහොමයක් හාමුදුරුවන්ට තිබුණා. වරෙක තෘෂ්ණාව ගැන උන්වහන්සේ බණකට කීවේ මෙන්න මේ විදියට. 'මං එතකොට පැවිදි වෙලා නැහැ' පොඩි කොලුවා. ගමේ තිබුණ මඟුල් ගෙදරකට මාවත් එක්කර ගෙන ගියා. අද වගේ නොවෙයි. මගුල් ගෙවල්වල හොරෙන් සමහර වැඩිහිටි අය මදුවිත ගන්නවා. ඒක අර ගෙන පරණ කෝන්තර මතු කර ගෙන පොඩි රණ්ඩුවකුත් වෙනවා. මෙය සාමාන්‍යයෙන් මගුල් ගෙවල්වල සිදුවන දෙයක්. ඒ මඟුල් ගෙදරත් මහා ශබ්දයක් ඇහෙනවා. මිනිස්සු වට වෙලා. පිටකරට ගහපන්... පිටකරට ගහපන්.... මාත් මිනිස්සු අස්සෙන් රිංගලා බැලුවා. වයසක අත්තම්මා කෙනෙක්. කටේ එක දතක්වත් නැහැ. පැදුරක වාඩිවෙලා... පිරිමියෙක් හයියෙන් බෙල්ලේ පිටුපසට පාරක් ගැහුවා. එතකොට කටින් විසිවුණා ගුලියක්... මොකක්ද? මඟුල් ගෙදර සූකර මස් තිබුණා. දත් නැති වුනත් ඌරු මස් කන්න තෘෂ්ණාව ඇති වුණා. මස් කෑල්ල හපන්න බැරි නිසා උගුරේ හිර වුණා. ඔන්න පින්වතුනි, කටේ එක දතක්වත් නැති වුනත් සූකර මාංශ කන්න ඇති වූ තෘෂ්ණාව නිසා තව ටිකෙන් ජීවිතයත් අහිමි වෙනවා.

වරක් කැකිරාවේ පිරිවෙනක සංඝ සම්මේලනයක් තිබුණා. ඒ සඳහා පූජ්‍ය පණ්ඩිත හේන්පිටගෙදර ඤාණසීහ හිමි, පූජ්‍ය හැවන්පොල රතනසාර හිමි, මහාචාර්ය එල්. ජී. හේවගේ මහතා, එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා, පී.ඒ. කිරිවන්දෙනිය මහතා, ඇතුළු කිහිප දෙනෙක් ගියා. එම පිරිවෙනේ හිටියේ තරමක් තරුණ භික්ෂූන් වහන්සේලා. ඉතින් ප්‍රථම දේශන කිහිපය පැවැත්වූවා. සර්ගෙ කතාවට මුල් වුණේ අවිහිංසාව. සර් ඒ ගැන ටිකක් වැඩියෙන්

කතා කළා. කතා අවසානයේ එක් තරුණ භික්ෂූන් වහන්සේ නමක් නැගී සිට සර්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා.

'ආරියරත්න මහත්මයාණනි, අවිහිංසාව ප්‍රමුඛ ව්‍යාපාරයක් වූ ඔබ ව්‍යාපාරය දුප්පත් ධීවර ගම්මානවල ක්‍රියාත්මක කරන්නේ කෙලෙසද?'

ඔබතුමා නැගිටින්න ඉස්සර වෙලා ඥාණසීහ හාමුදුරුවෝ නැගිට්ටා.

'ආරියරත්න උන්නැහේ වාඩි වෙන්න. පොඩි උන්නාන්සේට මං උත්තර දෙන්නම්'. කියලා මහ හඬින් පැවසුවා.

'උන්නාන්සේ ඔය විදියට හිතන්න ගියොත් දානෙ වේලකට අපට හාල්මැස්සෙක්වත් වළඳන්න බැරිව යනවා. ඊටත් වඩා බත් කන්නත් බැරි වෙනවා. කුඹුරු කොටන්න බැහැ නේ පනුවෝ කැපෙනවා නේ'.

පොඩි හාමුදුරුවෝ නිශ්ශබ්දව වාඩි වුණා.

සම්මන්ත්‍රණය අවසන් වෙලා වාහනේ එන විට ඥාණසීහ හාමුදුරුවෝ කියනවා 'ආරියරත්න මහත්තය සමහර ප්‍රශ්නවලට උත්තර දෙන්න එක්තරා විදිහක වාචාලකමකුත් ඕනේ'.

කන්න දුන් අත සපා කන මිනිස්සු

ඒ දිනවල අපි හබරාදූව ගම්මානයේ පාරක් කැපීමේ ශ්‍රමදාන කඳවුරකට සහභාගිවෙමින් සිටියෙමු. එම පාර පිහිටා තිබුණේ පාඨශාලා පරීක්ෂකයකු වූ හබරාදූවේ තල්පේ පදිංචි ජී.කේ.එෆ්. වික්‍රමසේකර මහතාගේ නිවස ආසන්නයේය. කුඩා ඇල කණ්ඩියක් ඔස්සේ විහිදී පැවැති මෙම පාර ප්‍රධාන තාර පාරේ සිට දුම්රිය මාර්ගය දක්වා වැටී තිබුණු බව මට මතකය. මෙම කඳවුර පැවැත්වූ දිනවල අප රාත්‍රිය ගත කළේ ගම ඇතුළත පිහිටි ආවාසයක ය. එහිදී අප සිරිත් පරිදි සෑම රාත්‍රියකම, පවුල් හමු රැස්වීම් පැවැත්වීමු. ඒ රැස්වීම්වලදී එක් තරුණයෙකු ඉතාම චතුර ලෙසත්, විෂය බද්ධවත්, අපූරු ආකාරයට කතා පවත්වනු දුටු මම, ඔහු සමග කතා බස් කොට දැන හඳුනා ගතිමි. ඒ වන විට ඔහු සිටියේ අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාගය සමත් වී, පාසල් අධ්‍යාපනය අවසන් කොට ගෙදරට වී ඊළඟට කුමක් කරම්දෝ යන අවිනිශ්චිත හැඟීමෙන් යුතුවය. ඒ බව දැන ගත් මම, ඔහු අමතා කැමති නම් මොරටුව මෙත්මැදුරට පැමිණ එහි පවත්නා තරුණ නායකත්ව පාඨමාලාවකට සහභාගි වී සිය කුසලතා ඔප්නංවා ගන්නා ලෙස දන්වා සිටියෙමි.

ඔහු මගේ යෝජනාව පිළිගත්තේ උතුරා යන සතුටින් යුතුව ය.

ඒ 1971 වර්ෂයේ අග භාගය බව මගේ හැඟීමයි. ඔහු විමලසේන යන නමින් අපි හඳුන්වමු. දැන් විමලසේන සිටින්නේ අපේ මෙත්මැදුරේය. ඔහු අපේ අලුත්ම සාමාජිකයාය. හතළිහක් පමණ වූ සෙසු නේවාසික පිරිස සමග ඔහු ද උදේ පහේ සිට රාත්‍රී දහය දක්වා වූ කාල සටහනට අනුව විවිධ විෂයයන් පුහුණු වෙමින්, විවිධ ක්‍රියාකාරකම්හි යෙදෙමින් අධ්‍යාපන කටයුතුවල නිරත වී සිටී. ඔහු වඩාත් ප්‍රිය කළේ අපේ ආධ්‍යාත්මික පාර්ශවයේ විෂයයනට වඩා, අත්කම් සහ යාන්ත්‍රික ශිල්පීය අංශයේ සේවාවනට බැවින්, ඒ අංශයෙන් උපරිම ඵල නෙලා ගන්නට අපි ඔහුට ඉඩ ප්‍රස්ථා සලසා දුනිමු.

මේ අතර දිනක් මේ තරුණයා වෙනදා මෙන් කෙළිදෙලෙන් පසු නොවී, දුක්මුසු මුහුණින් යුතුව කල්පනා හරිතව කාලය ගත කරනු දුටු මම, ඔහු මගේ කාර්යාලයට කැඳවා මෙසේ විචාළෙමි.

'විමලසේන, මම කියලා තියෙනවා නේද මේ මෙත්මැදුර වහල යට ඉන්න හැම දෙනාම නිතරම සතුටින් සිනහවෙන් ඉන්න ඕනෑ කියලා? නමුත් අද මොකද ඔබ ඒක අමතක කරලා මේ විදියට මුහුණ අඳුරු කරගෙන දුක්මුසු විදිහට ඉන්නෙ? මොකක්ද හේතුව'.?.

ඔහුගේ මුහුණ තවත් අඳුරු වූවා සේ පෙනිණි.

'සර්... ඔහු කතා කළේ හැඬීමට ආසන්න කෙනෙකුගේ ස්වභාවයෙනි. සර් දන්නවනෙ, අපි හුඟක්ම දුප්පත්. මගේ අම්මා රුපියල් තුන්සීයකට අපි ඉන්න ගේ උගස් තියලා. දැන් පොලියත් එකතුවෙලා. ඒක සින්න වෙන්නයි යන්නේ. අම්මා අද මට ඒ බව දන්වලා ලියුමක් එවලා තියෙනවා. ඒ ගේ තමයි අපිට තිබෙන එකම සම්පත. මේක දැන ගත්තු වෙලේ ඉඳලා මගේ හිතට හරි වේදනාවයි. ඒකයි සර් මම මේ කණගාටුවෙන් ඉන්නෙ'.

මම මඳක් කල්පනා කළෙමි.

ඔහුගේ දුකට පිහිට විය යුතු යැයි මට සිතුණි. ඉන්පසු මම ඔහු අමතා මෙසේ කීවෙමි.

''හොඳයි, මම විමලසේනට උදව්වක් කරන්නම්. තව දවස් දෙක තුනකින් අපේ පාසලේ වැටුප් දෙනවා. ඒ වැටුප ලැබුණාම මම ඔබට රුපියල් තුන්සීයක් දෙන්නම්. ඒක අම්මාට ගිහින් දීලා, ප්‍රශ්නෙ නිරවුල් කර ගන්න. හරිනෙ? දැන් ඉතින් කනගාටු වෙන්නෙ නැතුව ගිහින් ඉගෙනීමේ වැඩ කටයුතු කරන්න.''

දින කිහිපයකට පසු මට මගේ වැටුප ලැබිණ. මම වහාම එවකට අපේ රියැදුරු ලෙස කටයුතු කළ උණවටුනේ පියදාස අයියා කැඳවා ඔහු හමුවේම රුපියල් තුන්සීයක් විමලසේන අතට දී මෙසේ කීවෙමි:

''මෙන්න ඔබට අවශ්‍ය රුපියල් තුන්සීය. මේකත් අරන් පියදාස අයියාත් එක්ක ගෙදර ගිහින් මේක අම්මාට දීල අම්මාට වැඳලා ආපහු එන්න.''

මා කී ආකාරයට දෙදෙනාම එදින සවස් භාගයේ මෙත්මැදුරට පැමිණ සිටියහ. ගිය ගමන ගැන මා විචාල විට පියදාස අයියා කීවේ, විමලසේනගේ නිවස ලොකු කඳු ගැටයක් මත පිහිටි නිසා තමා ඒ ගෙදරට නොගොස් මෝටර් රථයට වී සිටි අතර, විමලසේන තනිවම ගෙදරට ගොස් ආපසු පැමිණි බවය. එහෙත් මා කළ ඒ සත් ක්‍රියාව පිළිබඳව ඒ තරම් පැහැදීමක් හෝ කැමැත්තක් පියදාස අයියා තුළ නොවූවා සේ මට හැඟිණි.

මේ දේ සිදු වී දින දෙක තුනක් පමණ ගත විය.

ඒ දිනවල රාත්‍රී නින්දට පෙර, මෙත්මැදුර වටේ රවුමක් ඇවිද ගෙන යාම මගේ පුරුද්දක් කොට ගෙන සිටියෙමි. එදිනත් මම එසේ ඒ ගමන යමින් සිටියෙමි. එවිට රාත්‍රී එකොළහමාරට පමණ ඇති. එදා හොඳට හඳපාන ඇති දවසක් විය. මා එසේ ඇවිදින අතර කිසිවෙකුගේ කටහඬක් මට ඇසිණි. ඒ කටහඬ ආවේ ඉස්තෝප්පුව දෙසිනි. මම හඬ නොනැගෙන ලෙස පිළිකන්න ඔස්සේ ගමන් කොට, ඒ පැත්තට කන් යොමු කළෙමි. ඒ කට හඬ විමලසේනගේය. විමලසේන ඉස්තෝප්පුවේ සිට තවත් තරුණයකු සමඟ කතා බහ කරමින් සිටී.

'අපේ සර් නම් බෝධිසත්වයෙක් ම තමයි. ඒ වුණත් සර් මගේ ගැටේට අහුවුණා. මම දවසක් කනගාටුවෙන් ඉන්න බවක් පෙන්නුවාම සර් ඒක දැකලා මොකද කියලා අහපුවාම මම කිව්වා අපේ ගේ උගස් කරලා ඒක සින්න වෙන්න යනවා කියලා. ඒක අහපු සර් ටික දවසකට පස්සෙ මට රුපියල් තුන්සීයක් දීල පියදාස අයියා එක්ක ගෙදර ගිහින් ප්‍රශ්නෙ විසඳා ගෙන එන්න කීවා. ඉතින් මම අම්මාට ඒකෙන් රුපියල් සීයක් දීල ඉතිරි ඒවායින් මේ කමිසෙ ගත්තා. මේකට රුපියල් අසූපහක් ගියා. ඊළඟට සුගතමුණි ඥානසිරි මහත්තයාගේ මනෝ විකාර කියන පොත ගත්තා. තවත් සල්ලි ටිකක් ඉතුරුයි. ඒකෙනුත් මොන මොනවා හරි ගන්න ඕනෙ'.

මට ඔහුගේ කට හඬ පැහැදිලිවම ඇසිණි.

මොහොතකට මම තුෂ්ණිම්භූත වීමි. මිනිස් හදවතක් ඇත්තෙකුට කළ හැකි දෙයක් ද මේ? කිව හැකි දෙයක් ද මේ? මම මගෙන් ම අසා ගත්තෙමි.

මට මේ මනුෂ්‍යයා පිළිබඳ විශාල කලකිරීමක් ඇති විය.

එකල ගුරුවරයකු වශයෙන් මට ලැබුණේ රුපියල් එක්දහස් පන්සීයකටත් අඩු වැටුපකි. එම මුදලත්, නොයෙක් විදියේ අමතර වැඩ කොට උපයා ගත් මුදල් සහ කරුණානන්ද, උපාලි සේනානායක, හේවගේ යන මහත්වරුන්ගෙන් ලැබුණු පරිත්‍යාග ආදියත් සියල්ලම මා වැය කළේ මෙත්මැදුරේ සිටි හතළිහක් පනහක් පමණ වූ මේ දුප්පත් තරුණ පිරිසේත්, මගේ බිරිඳ සහ දරුවන්ගේත් පැවැත්ම උදෙසාය. එසේ විශාල කැපවීමකින් කටයුතු කළ මට, මේ තක්කඩියා කළ රැවටීම මගේ පිළිකුළට හා අප්‍රසාදයට හේතු විය.

පසුදා උදෑසන සිරිත් පරිදි අප පවත්වන පවුල් හමු රැස්වීමේ අවසානයට පවත්වන දවසේ කතාව මම ම පවත්වන්නට තීරණය කර ගතිමි.

සෑම දිනකම උදේ පහට අවදි වන අපි, පහයි තිහට පවුල් හමු රැස්වීම පවත්වන්නෙමු. පුබුදු ගීය, භාවනාව, වැඩ බෙදා ගැනීම ආදී අංග අවසන ශ්‍රමදානයට යන්නට ප්‍රථම දවසේ කතාව පැවැත්වීම අපේ පවුල් හමු රැස්වීමේ සම්ප්‍රදාය වීය. එම පවුල් හමු රැස්වීමේදී මම උද්වේග කර හැඟීමෙන් යුතුව විමලසේනගේ සිද්ධිය සම්පූර්ණයෙන්ම විස්තර කොට කීවෙමි. හැමෝම එවිට මගේ කතාව අසා සිටියේ විමතියට පත් ස්වරූපයෙනි. කතාව අසා උන් විමලසේනගේ තොල කට වියළී යන සැටිත්, ඔහු බය වී බිම බලාගත් වනම ඉන්නා හැටිත් මට දැක ගන්නට ලැබිණි.

කතාව අවසානයේ මොහුට දඬුවමක් දිය යුතුද? දඬුවමක් දිය යුතු නම් ඒ කුමක්ද? යන්න පවුල් හමුවෙන් මම ප්‍රශ්න කළෙමි.

එවිට රැස්ව සිටි සියලුදෙනාම එකවර කියා සිටියේ, ඔහු සිදු කොට ඇත්තේ විශාල ද්‍රෝහීකමක් බවත්, ඒ නිසා ඔහු අපේ සාමූහික පවුලෙන් වහාම පිටමං කළයුතු බවත් ය.

එය ඒකමතික තීරණය විය.

එවිට බයභීතව බිම බලා ගත් වනම ඉන්නා විමලසේන ඇමතූ මම, උදේ ආහාරය අනුභව කිරීමෙන් පසු තමා සතු බඩුමුට්ටු සියල්ල රැගෙන අප ආයතනයෙන් බැහැර වන ලෙසත්, එදා මා දුන් රුපියල් තුන්සීයෙන් ඉතිරි මුදල ගමන් ගාස්තු ලෙස යොදා ගන්නා ලෙසත් ඉල්ලා සිටියෙමි.

ඊට ස්වල්ප වේලාවකට පසු තම ගමන්මල්ල ද රැගෙන විමලසේන අප ආයතනයෙන් පිටමන් වී පාර දිහාට ගමන් ගන්නා අයුරු මගේ කාමරයේ ජනේලය අතරින් මම බලා සිටියෙමි.

එවිට ගුවන් විදුලියෙන් භික්ෂූන් වහන්සේ නමකගේ ධර්ම දේශනයක් ප්‍රචාරය වෙමින් තිබිණ. ඒ වෙලාවේ උන්වහන්සේ කියමින් සිටියේ මේ ධර්ම කොටසයි.

''පින්වතුනි, ඔබ හැම විටම අනුන්ට යහපතම සලස්වන්න. එවිට ඔබටත් යහපතම සැලසෙනවා ඇත. යම්කිසි විදියකින් ඔබ ඊට විරුද්ධ මගක් ගතහොත්, එහි ප්‍රතිඵලයද ඒ ආකාරයෙන් ම ඔබ කරා එන්නට බැරිකමක් නැත.''

මට පිටුපා පාර දිහාට ගමන් කරන විමලසේනට ද ඒ භික්ෂූන් වහන්සේ පැවැසූ ධර්ම පාඨය ඇසෙන්නට ඇතිවාට සැක නැත.

මේ මගේ 'ක්ලයන්ට්' කෙනෙක්

අප මරදාන දෙල්ගහයට ගෙදර පදිංචිව සිටි කාලයේ අපේ පවුලේ වෛද්‍යවරයා වශයෙන් කටයුතු කළේ වෛද්‍ය විජයරත්න මහතාය. එතුමා ඉතා නිහතමානීය. කරුණාවන්තය. එමෙන්ම අපට ඉතාම හිතවත් වෛද්‍යවරයකු විය. පසු කාලීනව අප මරදාන හැර 'පියා මොරටුවේ මෙත්මැදුරට පැමිණි කල්හිත්, අපි බොහෝ කලක් යන තුරුම අවශ්‍ය වෙද හෙදකම් සඳහා එතුමා වෙතටම යන්නට පුරුදු වී සිටියෙමු.

වරක් මට වැළඳුණු උදරාබාධයකට ප්‍රතිකාර ගැනීම සඳහා එතුමා හමුවීමට ගියෙමි. ඒ 1971 වර්ෂයේදී බව මට මතකය. එහෙත් එතුමා දුන් ප්‍රතිකාරවලින් මට සුවයක් නොලැබිණි. අවසානයේ එතුමා මෙය 'ඇපැන්ඩිසයිටිස්' විය හැකි යැයි අනුමාන කොට, එයට ප්‍රතිකාර ගැනීම සඳහා එවකට ප්‍රසිද්ධ එක්තරා ශල්‍ය වෛද්‍යවරයෙක් වෙතට මා යොමු කළේය. ඒ වෛද්‍යවරයා මගේ උදරය පිරික්සා බලා, එය 'ඇපෙන්ඩිසයිටිස්' රෝගයම බව තීරණය කොට, වහාම එතුමාගේ වාට්ටුවට ඇතුළත් වන ලෙස දැනුම් දී ඒ සඳහා මට ලිපියක් ද දුන්නේය.

ශල්‍ය කර්මය සඳහා රුපියල් තුන්සිය පනහක් ගෙවිය යුතු විය. එම මුදල ඒ අවස්ථාවේ මා ළඟ තිබුණෙන් එවේලේම මම එය ගෙවූයෙමි.

''ඔබම ද මේ ශල්‍ය කර්මය කරන්නේ...?'' මුදල් ගෙවා හමාර වූ පසු මම ඒ දොස්තර මහතාගෙන් ඇසුවෙමි.

'ඔව්... ඔව්.... ඔහු වහා පිළිතුරු දුනි. 'ඔබ වැනි කෙනෙකුට ප්‍රතිකාර කිරීම මට ලොකු ගෞරවයක්. ඒ ඇරත් අපි එකම ගම් පළාතක උදවියනෙ? බාග විට අප අතර ඥාති සම්බන්ධ කමක් තිබෙන්නටත් පුළුවන්. මගේ නැන්දම්මාත් ඔබේ සමාජ සේවා කටයුතුවලට හුඟක් උදව්-පදව් කරනවා. මම ම තමයි ඔබේ ශල්‍ය කර්මය කරන්නෙ'. මෙසේ කියා ඔහු තම දිනපොත පෙරළා බලා

ස්ථිර වශයෙන්ම අනිද්දා මට පුළුවන් ඔබේ ඔපරේෂන් එක කරන්න, යැයි ද කීවේය.

මට තව සති තුනකින් එක්සත් ජාතීන්ගේ සංගමයේ සංවිධායකත්වයෙන් ස්විට්සර්ලන්තයේ පවත්වන රැස්වීමකට සහභාගි වන්නට යාමට නියමිතව තිබිණ. ඒ ගැන සඳහන් කළ මම, මෙම ශල්‍ය කර්මයෙන් පසු මට ඒ දිනවල ඊට සහභාගි වීමට හැකි වේ දැයි විචාළෙමි. එවිට ඔහු කීවේ සතියකින් පසු ඕනෑම ගමනක් යාමට තරම් මා සුවපත් වන බවය.

ඊට පසුදාම මම ඔහු දුන් ලිපිය ඉදිරිපත් කොට, කොළඹ මහ රෝහලේ ඔහුගේ වාට්ටුවට ඇතුළත් වීමි. මට ඇඳක් ද ලැබිණ. මෙම ශල්‍ය වෛද්‍යවරයාත්, වාට්ටුව බාර ඔහුගේ සහාය වෛද්‍යවරයාත් ඊට ස්වල්ප වේලාවකට පසු මා පරීක්ෂා කොට පසු දා උදේ වරුවේම මගේ ශල්‍ය කර්මය කිරීමට තීරණය කළහ.

පසුදා උදේ රෝද සවි කරන ලද ස්ට්‍රෙචර් එකක මා හාන්සි කර, සියල්ල සූදානම් කොට මා ශල්‍යාගාරය වෙතට ගෙන යනු මට මතකය. එසේ මා ගෙන යන අතර ඒ වන විට වෛද්‍ය ශිෂ්‍යයකු වූ නාලන්දාවේදී මගෙන් සිප් හැදෑරූ තරුණ ශිෂ්‍යයකු මා දැක ඔහු ද ඒ සමඟම ශල්‍යාගාරයට ඇතුළු විය. මම ඔහු හඳුනා ගතිමි. එහෙත් කතා බහ කරන්නට කාලයක් නොවිණි. මගේ නිර්වින්දන වෛද්‍ය ලෙස කටයුතු කළේ කාන්තා වෛද්‍යවරියකි. ඇය මට එන්නතක් දෙනු මම බලා සිටියෙමි. ඊළඟ මොහොතේ කොළ පාට ඇඳුම්වලින් සැරසුණු යන්තම් ඇස් දෙක පමණක් දිස් වුණු වෛද්‍යවරුන් සහ හෙදියන් මා වටා සිටිනවා දැක ගන්නට ලැබිණ. එපමණි' ඒ සමඟම සියල්ලන්ම අඳුරු වී මා නින්දට වැටිණි. නැතහොත් සිහි නැති තත්ත්වයට පත්වීමි.

මට හොඳ සිහිය ලැබුණේ පසු දාය.

එදා මගේ ශල්‍ය වෛද්‍යවරයා පැමිණ මා දෙස බලා, සිනාසී "You are allright" කියා යන්නට ගියේය.තුවාලය සනීප වී තිබුණේ

නැතත්, එදින මම ගෙදර ගියෙමි. ඉන්පසු කිහිප වතාවක් මා හිතවත් ලක්ෂ්මන් සිල්වා දොස්තර මහතා මෙත්මැදුරට පැමිණ මගේ තුවාලය පිරික්සා කොට එයට බෙහෙත් දැම්මේය.

කෙසේ හෝ නියමිත දින මට ස්විට්සර්ලන්ත රැස්වීමට සහභාගි වන්නට ද ඉඩ කඩ ලැබිණ. ඒ රැස්වීමේ කටයුතු අවසන් වූ පසු මම ස්වීඩනයට ගියෙමි. එහිදී මා නතර වූයේ වකුගඩු බද්ධ කිරීම සම්බන්ධයෙන් කීර්තියක් ලබා සිටි යුරෝපීය වෛද්‍ය විශේෂඥයකු වූ ඕර්ලිං මහතාගේ නිවසේය. ඔහුගේ පුතා වූ ආචාර්ය ස්ටෙපාන් ඕර්ලිං ද මගේ හොඳ මිත්‍රයෙක් විය. ඒ වන විටත් මගේ තුවාලය නිසි ලෙස සනීප වී නොතිබිණ. විටින් විට තුවාලය ඇදුම් කන්නටත්, හිරිවැටී තිබෙන්නා සේ දැනෙන්නටත් වී තිබිණ. දිනක් මම නිදහසේ කතා බහ කරමින් සිටින විට, ශල්‍ය කර්මයෙන් ඇති වූ තුවාලය වෛද්‍ය ඕර්ලිං මහතාට පෙන්වීමි. අඟල් පහක් පමණ දිගට විහිදුණු ඒ කැපුම දුටු ඕර්ලිං ගේ දෙනෙත් විමතිය පළ කරන අයුරින් විවර වන අයුරු මට පෙනිණ. මේ කැපුම කළ වෛද්‍යවරයා කවුරුන් දැයි ඊළඟට ඔහු ප්‍රශ්න කළේය. ලංකාවේ හොඳම ශල්‍ය වෛද්‍යවරයකු යැයි මම කීවෙමි.

ඔහු සිනාසිණි.

එදිනම ඔහු තමා සේවය කරන රෝහලට මා කැඳවා ගෙන ගොස් නැවත තුවාලය පවිත්‍ර කොට මැහුම් ගසා තෙදිනක් ප්‍රතිකාර කළ පසු මට පූර්ණ සුවය ලැබිණ.

ඒ සියලු කටයුතු නිම කොට පෙරළා ලංකාවට පැමිණි විගස මා කළේ එදා මා ශල්‍යාගාරය වෙතට ගෙන යන විට හමු වුණු වෛද්‍ය ශිෂ්‍ය අසෝක සොයා ගෙන ගොස් එදා සිදු වූ දේ ගැන තොරතුරු පිළිවිසීමය.

එහිදී ඔහු කීයේ අපූරු කතාවකි.

''සර්, සර් නම් ගිය ආත්මෙ හුඟක් පිං කරලා තියෙනවා. එදා සර්ව ඔපරේෂන් තියටර් එකට අරන් යන අතරෙ මට මුණ

නොගැසෙන්න සර්ට වෙන්නෙත් අර අපේ ආචාර්ය කොටගම වාචිස්සර හාමුදුරුවන්ට වුණු වැඩේ තමයි.''

''ඇයි එහෙම කියන්නෙ. මොකද එදා වුණේ.?''

''සර් හිතන්නෙ සර්ව බාර ගත්තු ඩොක්ටර් ඔබතුමාව ඔපරේෂන් කළා කියලද? නැහැ. එයා නොවෙයි එදා සර්ව ඔපරේෂන් කළේ. වෙනත් කෙනෙක්. ඩොක්ටර් .... කියල අලුත් කෙනෙක්. එයාට සර්ගෙ ඇපෙන්ඩික්ස් එක සොයා ගන්න බැරි වුණා. එයා දාඩිය මුගුරු දාගෙන දිගටම කැපුවා. මට පෙනුණා එයා අප්සට් ගිය විත්තිය. ඒ අතර මා දුටුවා සර්ගෙ ලේවල වෙනසක් වෙන හැටි. ලේ නිල් පාට වේගෙන ආවා. අර ලේඩි ඩොක්ටර් ඇනස්තිටිෂන් එයාත් කලබල වෙච්ච පාර, ඔපරේෂන් එක දිහා බලා හිටියා මිසක්, ඔක්සිජන් සිලින්ඩරය දිහා බැලුවේ නෑ. එතකොට ඔක්සිජන් සිලින්ඩරේ හිස් වෙලා. ඒක දැක්ක හැටියෙ මට ඉබේම කෑගැසුණා. මම ඒක ඒ ගොල්ලන්ට පෙන්වූවාම තමයි ඒ ගොල්ලො විගහට අලුත් සිලින්ඩරයකට ඒ වැල්ව් සෙට් කළේ. එදා සර්ට සිහිය එන්න හුඟාක් වෙලා ගියේ ඒ නිසායි. ඔපරේෂන් එක ඉවර වුණාට පස්සෙ විනාඩි දහයෙන් දහයට මම සර්ව බලන්න ආවා. රෑ සර්ට සිහිය ඇවිත් තියෙනවා දුටුවාම තමයි මගේ ඇඟටත් ලේ ඉනුවේ.''

ඔහු කීවේ ඒ කතාවය.

ඒ අසා උන් මගේ නාසයෙන් දිග සුසුමක් පිටවිණි. කෙසේ වුවත් ටික දිනකට පසු ඒ සිද්ධිය මම සිතින් අමතක කොට දැමුවෙමි.

එහෙත් පුදුමයට කාරණය නම් අර වෛද්‍යවරයා නොයෙක් සාද සහ උත්සව අවස්ථාවන්හිදී මා මුණ ගැසුණු විට ලොකු මිනිසුන් හමුවේ මා පෙන්වා ඒ අයට කීවේ 'හී වොස් මයි ක්ලයන්ට්'... යන කියමනය.

එය මගේ සිත පාරවන්නට සමත් කියමනක් විය. දිනක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති සමුළුවකදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුත්, ඇමෙරිකන් තානාපතිතුමා සහ

තවත් කිහිප දෙනෙකුත් හමුවේදී ඔහු මේ 'ක්ලයන්ට්' කතාව යළිත් කීවේය. මගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගිය බැවින්, මේ 'ක්ලයන්ට්' කතාව මෙතැනින්ම නතර කළ යුතු යැයි සිතා, සෙසු සියලු ප්‍රභූන් හමුවේම මම ඔහුට මෙසේ කීවෙමි.

''ඩොක්ටර්... ඔබ මා දක්වමින් අනුන්ට කරන ඔය ක්ලයන්ට් කතාව මම මීට පෙරත් කිහිප අවස්ථාවක අසා තිබෙනවා. නමුත් ඔය කතාව සම්පූර්ණ සත්‍යයක් නොවෙයි. අසම්පූර්ණ සත්‍යයක්. ඒක මම අද විස්තර කරන්නම්. ශල්‍ය කර්මයක් කරවා ගන්න මම ඔබට දිනක් ඔබේ ගාස්තුව ගෙව්වා. ඒක ඇත්ත. ඒ අනුව මම ඔබේ ක්ලයන්ට්. නමුත් එදා ඔබ ඒ ශල්‍යාගාරය පැත්තටවත් ආවේ නෑ. වෙනත් නුපුහුණු වෛද්‍යවරයෙක් තමයි එදා මගේ ඔපරේෂන් එක කළේ. නමුත් එදා මම ඔබේ ආධුනික වෛද්‍යවරු නිසා එලොව ගොස් පසුව මෙලොව ආවේ එතැන සිටිය මගේ ශිෂ්‍යයෙක් නිසායි.''

මෙසේ කියා අදත් මගේ උදරයේ දකුණු පසට වන්නට පිහිටි අඟල් පහක් පමණ වූ ඒ තුවාල කැළල ඒ මොහොතේම එතැන සිටි සෙසු අයටත් පෙනෙන්නට සලස්වා ආයෙත් එහෙම ඔය ක්ලයන්ට් කතාව මා ඉදිරියේ කියන්න එපා. යි කියමින් මම එතැනින් ඉවත් වී යන්න ගියෙමි.

එවිට එතැන හුන් සෙසු අය ද ඔහු තනි කොට එතැනින් ඉවත්ව යනු මම දුටිමි. මහාචාර්ය සී.සී.ද සිල්වා, මහාචාර්ය කේ. රාජසූරිය, මහාචාර්ය පී. ආර්. අන්තෝනිස් වැනි මා පෞද්ගලිකව දන හැඳින ආශ්‍රය කළ, අපට වඩා වැඩිහිටි පරම්පරාවට අයත් ශ්‍රේෂ්ඨ වෛද්‍යවරුන්ගෙන් අලංකාර වූ, ගෞරවාර්හ වූ අපේ වෛද්‍ය වෘත්තිය මෙවැනි දොස්තර මුදලාලිලා නිසා අශෝභන වීම කණගාටුවට කාරණයක් බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත.

214

භවාන්ධකාරයෙන් මා ගොඩ ගත්තේ සර්වෝදයයි

ඒ.ගුණපාල උග්ගල්ල

මෙම භවතණ්හා පොත් කාණ්ඩ කෙරෙන් හැකි තරම් දුරට මා සමඟ සේවය කරන සහෝදර සේවකයන් පිළිබඳව හඳුන්වා දීමට මා අදහස් කරන නිසා මේ සඳහා කිහිප දෙනෙකුට ඔවුන්ගේ චරිතය සහ අත්දැකීම් පිළිබඳව මට ලියා දෙන මෙන් ඉල්ලා සිටියෙමි.

ගුණපාල උග්ගල්ල මහතා

මෙයින් එක් අයෙකු ගුණපාල උග්ගල්ල මල්ලීය. ඔහු දැනට අපේ විශ්ව නිකේතන ආයතනයේ ප්‍රධාන භාවනා උපදේශක වශයෙන් ක්‍රියා කරයි. මේ ඔහුගේ කතාන්තරයයි.

සොහොයුරියන් සහ සොහොයුරන් නවදෙනෙකු ගෙන් සමන්විත වූ පවුලක බාලම පිරිමි ළමයා වශයෙන්, ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම මම උපත ලදිමි. යන්තම් බහතෝරන කාලය තුළ දී පවා තරු දිදුලන අහස දෙස බලා සිටීමට මම පුරුදුව සිටියෙමි. දිස් වූ අසිරිමත් අහස සහ පොළවෙහි අර්ථය කුමක් දැයි සෙවීමට කුඩා කල සිටම පුරුදුව සිටියෙමි. අනන්ත කාලය, අනන්ත විශ්වය පිළිබඳව පැය ගණන් දින ගණන් කල්පනා කිරීමට පුරුදුව සිටි මම, වයස අවුරුදු 15 - 16 වන විට අභිධර්මය, සාපේක්ෂතාවාදය වැනි ගැඹුරු පොතපත කියවීමට හා ඒ තුළින් ලෝකයේ යථාර්තය සෙවීමට උත්සාහ කළෙමි. මේ අතර වයස

අවුරුදු 10 - 12 වන විට අප නිවසේ මැද පිහිටි කුඩා කාමරයකට වී භාවනාව කුමක් දැයි නොදන සිටියත්, භාවනා කිරීමට පුරුදු වී සිටියෙමි.

ඩී.එස්. සේනානායක විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලත් මම, විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයෙන් උසස් ලෙස සමත් වීමි. එහෙත් එවකට පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ සිදුවූ අමානුෂික නවක වදය හේතුවෙන් විශ්ව විද්‍යාලයට ඇතුලත් නොවී, වනගත වී පැවිදිවීමට තීරණය කළෙමි. 1975 වන විට නොයෙක් විෂයයන් පිළිබඳ ලියැවුනු පොත්පත් දහස් ගණනක් කියවා අවසන් කළ අතර දිවයිනේ එවකට ජීවත් වූ ගිහි-පැවිදි උගතුන් බොහෝ දෙනෙකු හමු වී නොයෙක් ගැඹුරු ධර්ම කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට පුරුදුව සිටියෙමි. මේ අතරම ගමේ තරුණ බෞද්ධ සංගමයක් පිහිටුවා ගෙන එහි සාමාජික තරුණයන් 200-250 ගේ පමණ සහභාගිත්වයෙන් දිවයින පුරා පිහිටි ප්‍රසිද්ධ බෞද්ධ සිද්ධස්ථානවලට ගොස්, සීල භාවනා වැඩ සටහන් රාශියක් සංවිධානය කර පැවැත්වීමි. මේ තුළින් ලත් ධර්ම ඥානය නිසා එවකට දිවයිනේ වැඩ සිටි කීර්තිධර හිමිනමක් වූ පූජ්‍ය පණ්ඩිත හේන්පිටගෙදර ඤාණසීහ හිමියන් හමුවී අප සමිතියේ සාමාජිකයන් කිහිප දෙනෙකු ද සමඟ පැවිදිවීමට තීරණය කළෙමු. මේ අනුව 1977 ජනවාරි මස 11[t] වැනි දින එවකට එම හිමියන් වැඩවාසය කළ පැල්මඩුල්ල නගරයට ආසන්න පාතකඩ ආරණ්‍යයට යාමට පිටත් වීමු. තද වර්ෂාව පැවැති එදින රාත්‍රී 2.00 ට පමණ ඉතා දුෂ්කර ගමනකින් පසු පාතකඩ ආරණ්‍යයට ළඟාවීමු.

පසු දින උදයේ නාහිමියන් හමු වී අපගේ අදහස පැවසීමෙන් පසු උන් වහන්සේ විසින් අපට මෙසේ පවසන ලදී.

'මාත් කාලයක් දේශපාලනය කළා. නමුත් මට දැන් තේරෙනවා මේ දේශපාලනයෙන් අපත් රටත් අගාධයෙන් අගාධයටම යනවා මිසක් රට හදන්න බැරි බව. මේ නිසා මාත් දැන් ඔය සර්වෝදය නායකතුමා සමඟ එකතු වෙලා සමාජ සේවයක යෙදෙනවා. අද ඔය මහත්වරු වැනි අය ලක්ෂ ගණනකින් හොයා ගන්න බැහැ. ඒ නිසා මාත් එක්කලා මොරටුවට ගිහින් ආරියරත්න

මහත්තයව හම්බුවෙමු. මෙසේ පැවැසූ උන්වහන්සේ, පසුවදාම අප සමඟ මොරටුවට ගොස් සර්වෝදය මෙත්මැඳුරේදී අප එතුමන්ට හඳුන්වා දෙන ලදී. අනතුරුව අප සමඟ ඉතා සුහදව දීර්ඝව කතා කළ එතුමා, අපට මෙසේ පැවසුවේය. 'මල්ලිලා අද සමාජය අන්තයටම පිරිහිලා, අධර්මය අද හැම තැනම රජ වෙලා, මේ රට නැවත ධර්මද්වීපයක්, ධාන්‍යාගාරයක් කරන්නයි මා සර්වෝදය ආරම්භ කළේ ඒ නිසා ඔය මල්ලිලාත් මේ සර්වෝදය ව්‍යාපාරයට එකතු වෙන්න'.. යැයි. ඒ අවස්ථාවේදී එතුමා ඉතාමත් කාරුණික ලෙස පැවැසීය. එම වදන්වලින් අප සිත් තුළ පැවැති මානසික කලකිරීම දුරුවී නව ප්‍රබෝධයක් ඇති විය.

මේ අනුව 1978 මාර්තු 2 දින එතුමාගේ මඟපෙන්වීම යටතේ අනුරාධපුරය සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානයේ ප්‍රධාන අධ්‍යාපන නියමු සේවක වශයෙන් සේවයට අනුයුක්ත වීමි. මෙසේ මා අනුරාධපුරය පොළොන්නරුව වව්නියාව පුත්තලම ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක පහේම අධ්‍යාපන නියමු සේවක වශයෙන් 1984 දක්වා සේවය කළෙමි. එතැන් සිට 1984 - 1985 දක්වා ගාල්ල සර්වෝදයේ සහාය දිස්ත්‍රික් නියමු සේවක වශයෙන් ද 1985 - 1990 දක්වා සුවසෙත සේවා ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රථම ප්‍රජාපාදිත ආබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි අධ්‍යක්ෂවරයා වශයෙන් ද කටයුතු කළෙමි.

1990- 1995 දක්වා ගරු සභාපතිතුමාගේ ලේඛනාගාරයේ ද සේවය කළ අතර, අනතුරුව ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි 1995 - 1997 දක්වා සර්වෝදය ව්‍යාපාරය යටතේ ක්‍රියාත්මක කළ ප්‍රථම සර්වෝදය සංවර්ධන සේවාවන්ට පාදක වූ ගම්මාන 140 කට ගොස් එම ගම්මාන පිළිබඳ පිටු 600 කට අධික දීර්ඝ විස්තර වාර්තාවක් සකස් කළෙමි. නැවත 1997 - 2000 දක්වා සර්වෝදය ජෛව විවිධත්ව හා පරිසර සංරක්ෂණ ඒකකය බාරව කටයුතු කළෙමි. 2000 සිට සර්වෝදය ජාත්‍යන්තර අංශයේ සම්බන්ධීකරණ නිලධාරියෙකු වශයෙන් ද ක්‍රියා කළෙමි. මේ අතරම ගරු සභාපතිතුමාගේ මඟපෙන්වීම හා උපදෙස් පරිදි, ''විශ්ව නිකේතන්'' ආයතනයේ ප්‍රධාන භාවනා උපදේශකවරයෙකු වශයෙන් ද මේ

වනතුරුම සේවයේ යෙදී සිටින්නෙමි. ගරු සභාපතිතුමාගේ මඟපෙන්විම යටතේ මේ දක්වා විශ්ව නිකේතන ආයතනය මගින් දෙස් විදෙස් ලක්ෂ සංඛ්‍යාත පිරිසකට භාවනා පුහුණුව සලසාදීමට හැකි වී ඇත.

මගේ විසිපස් වසරකට ආසන්න සර්වෝදය සේවා කාලය තුළ දි මා හට ජාත්‍යන්තර වැඩ සටහන් කිහිපයකට ද සහභාගිවීමට අවස්ථාව ලැබුණි. 1985 වර්ෂයේ දී ඇමරිකාවේ බොස්ටන් නගරයේ සර්වෝදය ඔක්ස්ෆෑම් සංවර්ධන වැඩ කටයුතු ඇගයීමේ වැඩ සටහන සඳහා සහභාගි වීමි. 1986 වර්ෂයේ ඉතාලියේ මිලානෝ නගරයේ පැවැති යුරෝපීය ප්‍රජාව විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සංවර්ධන සම්මේලනයට සහභාගි වීමි. එම සම්මේලනය සඳහා විද්වතුන් 3000 ක් පමණ සහභාගි වූ අතර, සම්මේලනයේ දෙවන දින එහි මුලසුන හා ප්‍රධාන දේශනය පැවැත්වීමට මා හට අවකාශ ලැබිණි. 'ආගම සංස්කෘතිය හා සංවර්ධනය'යන මැයෙන් මා විසින් එහිදී පවත්වන ලද මගේ කතාව භාෂා පහකට පරිවර්තනය කොට සජීවීව විකාශනය කරන ලදී.

2001 වර්ෂයේ අප්‍රේල් මස ඉන්දියාවේ ජයපූර්වල දින 11 ක විපස්සනා භාවනාව පිළිබඳ වැඩිදුර පුහුණුව ලත් මා, දැනට සර්වෝදය නායකතුමාගේ මඟපෙන්වීම හා නායකත්වය යටතේ විශ්ව නිකේතන්හි ප්‍රධාන භාවනා උපදේශක වශයෙන් සේවයේ යෙදී සිටින්නෙමි.

මෙයට වසර 25 කට පෙර භව කතරෙහි භවාන්ධකාරයෙන් හසරක් නොදැක මංමුලා වී පියමන් කළ මා හට ලෝකයෙහි සහ ජීවිතයේ යථා අවබෝධය ලබා ගැනීමේ මාවත ඒකාලෝක කරන මිණිපහන් වැටකි, මගේ ගුරු දෙවි සර්වෝදය නායක ආචාර්ය ඒ.ටී.ආරියරත්න මැතිඳුන්.

සබ්බේ සත්තා සුඛී හොන්තු!

විශ්ව නිකේතනයේත්, උතුරු නැගෙනහිර ඇතුළු සියලුම පළාත්වලත් අඛණ්ඩව භාවනා පුහුණු වැඩ සටහන් ගෙන ගිය උග්ගල්ල මල්ලී වරින් වර පිළිකා රෝගයකින් ද පෙලුණේය. බටහිර වෛද්‍ය ප්‍රතිකාර ගත්තත්, කිහිප වරක්ම එම පිළිකා තත්ත්වය භාවනා ශක්තියෙන්ම යටපත් කර ගැනීමට ඔහු සමත් විය. අන්තිම දිනය දක්වාම හිර ගෙදර භාවනා පන්ති මෙහෙය වූ උග්ගල්ල මල්ලී හිටිහැටියේ නැවත අසනීප වූහ. මම ද විශ්ව නිකේතනයට ගොස් ඔහු රෝහලට පිටත් කිරීමට කටයුතු සැලැස්වූයෙමි. මට වැඳ ආචාර කොට, ඔහු වාහනයට ගොඩ වන විට, මට මොහු නැවත සනීප ලබනු ඇත්දැයි සැකයක් මගේ සිතේ මතු විය. එදා රාත්‍රී එනම්, 2004.10.16 වැනිදා උග්ගල්ල මල්ලී සදහටම අපෙන් සමු ගත්තේය.

සර්වෝදය මූලස්ථානයේ ඔහුගේ දේහය තැන්පත් කොට, ගෞරව දක්වා අවසාන කටයුතු මොරටුව, රාවතාවත්ත සුසාන භූමියේදී සිදු කළෙමු.

ගුණපාල උග්ගල්ල මල්ලීට නිවන් සැප ලැබේවා!

දිය නොසැලෙන පිරුණු කළය
මහාචාර්ය නන්දසේන රත්නපාල

සර්වෝදය සමාරම්භක අවධියේ පටන් අද දක්වාම සර්වෝදයේ සියලු වැඩ කටයුතුවලට සහයෝගය දෙමින්, අඩුපාඩු දුටු විට ඒවා පෙන්වා දී නිවැරදි මඟට ගන්නට උපකාර කරමින්, සර්වෝදයේ දර්ශනය සහ ක්‍රියාකාරකම් හි ශාස්ත්‍රීය අංශය අරබයා විශාල පර්යේෂණයක් කොට, ඒවා ලෝක ජනතාවට හඳුන්වා දීමට පුරෝගාමීව කටයුතු කළ මානව හිතවාදී සහ විශ්වාන්තරවාදී විද්වත් මහාචාර්යවරයකුගේ සේවය අගැයීම සඳහාත්, එතුමන්ට උපහාර දැක්වීම සඳහාත් මෙම පරිච්ඡේදය වෙන් කරනු කැමැත්තෙමි.

මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා

ඒ මහාචාර්යවරයා අන් කවරකුවත් නොව ගත් කතුවරයකු, සාහිත්‍යධරයකු, විචාරකයකු, සමාජ සේවකයකු, සමාජ විද්‍යාඥයකු සහ ප්‍රමුඛ පෙළේ සමාජ විද්‍යා පර්යේෂකවරයකු වන මහාචාර්ය නන්දසේන රත්නපාල සූරීන්ය.

මහාචාර්ය නන්දසේන රත්නපාල සූරීන් මට මුලින්ම මුණගැසුණේ පනහ දශකය අවසානයේ මා දෙල්ගහයට ගෙදර වාසය කරන අවධියේය. ඒ දිනවල සවස් භාගයේ අලුත පිට වූ

පොත්පත් මිලදී ගැනීම සඳහාත්, පත්තර සඟරා පෙරළා බැලීම සඳහාත් මම මරදානේ රත්න පොත් ප්‍රකාශකයෝ වෙතට යන්නට පුරුදු වී සිටියෙමි. මට නන්දසේන රත්නපාල සූරීන් මුණගැසුණේ එහිදීය.

ඒ දිනවල ඒ මහතාගේ සංස්කාරකත්වයෙන් ග්‍රන්ථ විචාර සඟරාවක් එම ප්‍රකාශන ආයතනය මගින් පළ කරමින් තිබුණා මට මතකය. එදා එහිදී ඇති වූ මිත්‍රත්වය අද දවසේත් නොබිඳී, නොනැසී පවතී. එය විශේෂ දෙයක් ලෙස මම සලකමි. 70 දශකය වන විට අපි ඉතාම සමීප මිතුරන් බවට පත් වී සිටියෙමු. ඒ අවධිය එක් අන්දමකින් මට සෙනසුරු දශාව ලැබී තිබූ වකවානුවක් බඳු විය. බොහෝ පැතිවලින් එකල මට පහර පිට පහර එල්ල වෙමින් තිබිණ.

එකල රජයේ ප්‍රධාන පෙළේ අමාත්‍යවරයකු ද මට එළව එළවා පහර දෙන තත්ත්වයක් උද්ගත වී තිබිණ. ඒ සමඟම මා වටා හුන් ඇතැම් හිතවත් කොටස් මා හැර දා යන්නට පටන් ගත්හ. ඒ මගේ වරදක් නිසා නොවේ. රජයේ බලවතෙක් මට ප්‍රහාර එල්ල කරද්දී, ඒ අය තව දුරටත් මා අතරේ සිටියහොත්, තමන්ටත් ඒ රාජ උදහස එල්ල වේය යන සාධාරණ සැකය ඒ අයගේ සිත් තුළ ඇති වී තිබීම නිසාය. එහෙත් මා හිතවත් නන්දසේන රත්නපාල සූරීන් එදා ඒ මඟ ගත්තේ නැත. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කල්‍යාණ මිත්‍රයකු ලෙසින් ඔහු මට අවවාද අනුශාසනා දෙමින්ද, ධර්මයෙන් මෙන්ම, අර්ථයෙන්ද උදව් උපකාර සලසමින්, මා සමඟම සිටින්නට ඔහු අමතක කළේ නැත.

ඔහු මට කතා කළේ ''ආරි'' යන සහෘද නාම පදයෙනි. මා ඔහු ඇමතුයේ ''නන්දේ'' යනුවෙනි. ඒ දිනවල ඔහු නිතරම මා අමතා කී දෙයක් මට තවමත් මතකය. ඔහු කීවේ ආරි, ''ධම්මෝ හවේ රක්ඛති ධම්ම චාරී'' කියාය. ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම ආරක්ෂා කරන්නේය යනු එම කියමනෙහි අර්ථයය. බාග විට එකල මට මුහුණ දෙන්නට සිදු වී තිබූ ප්‍රශ්නවල බැරෑරුම්කම නිසාම, මා ධර්ම මාර්ගය අතහැර අන් මඟකට එළඹේදෝ යන සැකය ඔහු තුළ ඇති වී තිබුණ දැයි මම නොදනිමි. ඇත්ත වශයෙන්ම ඒ අවධියේ

නන්දේ මා ළඟ සිටිමින් මට ලබා දුන් චිත්ත ධෛර්යය එදා මා මුහුණ දුන් ප්‍රශ්නවලට නොබියව මුහුණ දෙන්නට හේතු වූ කාරණා අතරින් ප්‍රධානම කාරණයක් වූ බව මගේ අදහසයි. අවසානයේ ඒ සියලු බාධක, අවහිර සහ දුක් කරදර පරදා මම ජය ගතිමි. මම එයින් වඩ වඩාත් මගේ ඉදිරි ගමනට සහ ජීවිතයට අවශ්‍ය ආත්ම ශක්තිය වර්ධනය කොට ගතිමි. පන්නරය ලබා ගතිමි.

එදා ගම් මට්ටමේ පැවැති සර්වෝදය පසු කාලීනව දේශ දේශාන්තරයන් දක්වා ප්‍රචලිත කිරීමට තරම් හැකියාවක් මා තුළ වර්ධනය වූයේ එදා මා ලැබූ ඒ ආත්ම ශක්තියත්, ධෛර්යය සහ පන්නරයත් නිසා බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

එදා රජයේ ප්‍රධාන අමාත්‍යවරයෙක් මට එල්ල කළ ප්‍රහාරය මට වෙස් වලා ගත් ආශීර්වාදයක් වූ බව මම අද විශ්වාස කරමි.

මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා රැස්වීම අමතයි
දකුණු පස ලීල් ගුණසේකර මහතා, මම සහ මහාචාර්ය ස්වර්ණා ජයවීර මැතිනිය

මා තෝරා ගත් සර්වෝදය දර්ශනයත්, ඊට අනුබද්ධිතව ගමින් ගම රට පුරා ව්‍යාප්ත කළ දහසකුත් එකක් වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් සමුදායත් පිටුපස තිබූ දාර්ශනික සහ ශාස්ත්‍රීය පැත්ත මනාව ග්‍රහණය කොට ගන්නට මහාචාර්ය නන්දසේන රත්නපාල සූරීන්ට හැකි විය. මම දිගින් දිගටම සේවා කටයුතු නිර්මාණය කොට ඒවා ව්‍යාප්ත කළා විනා, ශාස්ත්‍රීය පැති ගැන අධ්‍යයනය කරන්නට උත්සාහයක් නොගතිමි. එහෙත් ඒ කටයුතු දෙස ගැඹුරු නුවණින් බැලූ මහාචාර්ය නන්දසේන රත්නපාල සූරීන්ට මට හසු නොවූ ඒ පාර්ශවය හඳුනා ගන්නට අවස්ථාව සැලැසිණි.

පසුකාලීනව ඔහු ස්වේච්ඡාවෙන්ම සර්වෝදය පර්යේෂණ ආයතනයට අනුයුක්තව එහි අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරමින්, සර්වෝදය සේවාවන්හි ශාස්ත්‍රීය පාර්ශවයන් අළලා ග්‍රන්ථ තිහකට අධික සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කරන්නට සමත් විය. එමෙන්ම මගේ ඉංග්‍රීසි දේශන සහ ලිපි ලේඛන අමාරුවෙන් ඒකරාශී කොට, වෙළුම් අටකින් යුත් ග්‍රන්ථ මාලාවක් සම්පාදනය කරන්නට ද ඔහු සමත් විය.

ඒ සියලුම කෘතීන් විශ්ව සාහිත්‍යයට අන්තර් ග්‍රහණය වූයෙන්, ලෝකයේ බුද්ධිමත් ජනතාවගේ අවධානය ද පෙරට වඩා සර්වෝදය ව්‍යාපාරය දෙසට යොමු වන්නට පටන් ගැනිණ.

මේ නිසාම මා උසස් අධ්‍යාපනය ලත් ගංගොඩවිල විද්‍යෝදය සරසවිය (අද ජයවර්ධනපුර සරසවිය), පිලිපීනයේ අම්ලියෝ අගිනල්ඩෝ විශ්ව විද්‍යාලය, ජපානයේ සෝකා විශ්ව විද්‍යාලය ආදී විද්‍යායතනවලින් මා වෙත උසස් ගෞරව උපාධි පිරිනමන ලදී. එමෙන්ම කලා සහ විද්‍යා පිළිබඳ ලෝක ඇකඩමිය, ක්ලබ් ඔෆ් බුඩාපෙස්ට් ආදී වූ ලෝක විද්වතුන්ගේ ආයතනවල සාමාජිකත්වය ලබා ගැනීමේ භාග්‍යයද මට උදා වූයේ, මේ ශාස්ත්‍රීය ග්‍රන්ථ ප්‍රකාශයට පැමිණ වීමත් සමඟමය.

ඒ සියල්ලකටම දොරටු මට විවර කොට දුන්නේ මේ කල්‍යාණ මිත්‍ර නන්දසේන රත්නපාල සූරීන්ය. මා ජීවිත කාලයක්

ඉටු කළා වූ ජනතා සේවාවේ විද්‍යාත්මක ශාස්ත්‍රීය හරයක් ඇති බව නොබියව ලොවට ප්‍රකාශ කළ ප්‍රථම විද්වතා මහාචාර්ය නන්දසේන රත්නපාල සූරීන්ය. ඒ නිසා මම ඔහුට සදා ණයගැති බව ප්‍රකාශ කරමි.

ඔහු මට එදා පෙනුණේත්, අද පෙනෙන්නේත් ඇවිදින සරසවියක් වාගේය. දශක පහක පමණ කාලයක් ඉතාම සමීපව මෙම සරසවිය ඇසුරු කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙමි. එය භාග්‍යයක් ලෙස ද මම සලකමි.

මට ඔහු සමඟ විවිධ රටවල සංචාරයේ යෙදෙන්නට ද අවස්ථා උදා වී තිබිණ. එංගලන්තය, අමෙරිකාව, ජර්මනිය, නෙදර්ලන්තය, ඉන්දියාව, නේපාලය වැනි රටවල අපි සංචාරය කොට ඇත්තෙමු. ඒ රටවල හෝටල් කාමරවල අප නේවාසිකව සිටියදී සෑම රාත්‍රියකම මම පොත්පත් කියවා ලියන්නට ඇති ලිපි ලේඛන සකස් කොට රෑ වී නින්දට සූදානම් වන විට, නන්දේ තම යහනේ ගොරව ගොරවා නිදිය. එහෙත් උදේ දෙකට පමණ මට ඇහැරී බලන විට නන්දේ නැගිට මොනවා හෝ ලියමින් සිටිනවා අනිවාර්යයෙන්ම දැක ගන්නට ලැබෙයි. ඒ ඔහුගේ ජීවන ශෛලියේ ස්වරූපයයි.

ඕනෑම දවසක ඔහුගේ නිවෙසට ගියහොත්, ඔහු උඩුමහලේ ඉස්තෝප්පුවේ වාඩි වී කිසිවක් ලියමින් සිටිනවා දකින්නට ලැබෙයි. ඔහු බොහෝ විෂයයන් ගැන පොත්පත් ලියා ඇත. විශේෂයෙන් බෞද්ධ සාහිත්‍යයේ හරය ගැබ් කොට ලියන ලද ග්‍රන්ථ සංඛ්‍යාව මේ වන විට සියය ද ඉක්මවා ඇත.

යාචක වෙස් ගෙන, ඔහු කළ යාචක ජීවිත පිළිබඳ පර්යේෂණය මෙරට විශ්ව විද්‍යාල පද්ධතීන්හි වාර්තා ගත සිද්ධියක් ලෙස මම සලකමි. එය කෘත්‍රිම පර්යේෂණයක් නොවේ. සැබෑ යාචකයකු ලෙසින් යාචකයන් අතරට වී මාස ගණන් ඔහු ගත කළ කටුක ජීවිතය නිසා, ඔහු සිය සෞඛ්‍යයට ද හානියක් කර ගත් බව මම දනිමි. ඔහු කළ පර්යේෂණ මා හැඳින්වූයේ Living in Research "ජීවන අත්දැකීම් පර්යේෂණයන්ට උපයෝගී කර ගැනම" යනුවෙනි.

මෙතෙක් බලයට පත් අපේ කිසිම රජයක් මොහුගේ පර්යේෂණ වලින් ප්‍රයෝජනයක් ලබා ගත්තේ ද යන සැකය මා තුළ ඇත. අපරාධ වර්ධනය, සුරාව, මත්ද්‍රව්‍ය, සංචාරක ව්‍යාපාරය, ඒඩ්ස් රෝගය සහ ගණිකා ව්‍යාපාරය පිළිබඳව ඔහු කර ඇති පර්යේෂණ රාජ්‍ය ප්‍රතිපත්ති සැකැසීමේදී රජයකට විශාල මෙහෙවරක් ලබා ගත හැකි බව මගේ විශ්වාසයයි.

විදේශීය සමුළුවකට ගිය අවස්ථාවකදී

රත්නපාල සූරීන්ගේ ජීවිතය රෝස මල් අතුරන ලද මාවතක් ඔස්සේ ගිය ගමනක් නොවේ. වෙන ඕනෑම කෙනෙකුට මුණගැසෙන ජීවන කම්කටොලුවලට ඔහුත් මුහුණ දුන්නේය. ඒ හැම අවස්ථාවක් දෙසම මම ළඟින් සිට බලා සිටියෙමි. නොසැලෙන චිත්ත ධෛර්යය, නිරවුල් ජීවිත දර්ශනය සහ අභියෝග ඉදිරියේ අසීමිත ඉවසීමකින් ක්‍රියා කිරීම මා ඔහු තුළින් දුටු අපූරු මානව ගුණදම් වෙත්. එමෙන්ම ඔහු කිසිදා කිසිවකුට හෝ ගරහා නැත. අතිශය දරුණු ලෙස තමාට දුර්ජනකම් කළ කෙනෙකු ගැන හෝ ඔහු කතා කළේ බොහෝ උපේක්ෂා සහගතවය.

බොහෝ විට යම් පැරණි පොතක එන හාස්‍ය ජනක කතාවක් මතු කොට, තමාට සතුරුකම් කළ තැනැත්තා කළ දේ ඊට සමාන කොට, ඉන් හාස්‍ය රසයක් විඳීමට තරම් ඔහු රසකාමී වූද, ඉවසිලිවන්ත වූද පුද්ගලයකු විය.

මහාචාර්ය රත්නපාල සූරීන් විවිධ අංශ පිළිබඳ ප්‍රවීණයෙකි. සිනමා කෘතියකට අත ගැසුවත් ඔහු එය කලාවෙන්, තාක්ෂණයෙන් පමණක් නොව, මානව දයාවෙන්ද ඔපවත් කළේය. කවියක් ලියුවත් එසේ ම ය. මේ සියලු දස්කම්, හැකියාවන්, දැනීම් සහ ප්‍රඥා වාසනා ගුණ තිබීයේ වී නමුත්, ඔහුගේ නිතහමානීකම ඒ සියල්ල අභිබවා සිටී. ඔහු දකින හැම විටම මට සිහියට නැඟෙන්නේ අප කුඩා කල අපේ වැඩිහිටියන් නිතර සඳහන් කළ ''පිරුණු කළේ දිය නොසැළේ'' යන ආප්තෝපදේශයයි.

මහාචාර්ය රත්නපාල පොල්තෙල් පහණ දල්වයි.

විශ්ව තරංග සඟරාව එළිදුටුදා

කලකට පෙර ලියන ලද ඉහත පරිච්ඡේදයට පසු වදනක් මෙතරම් ඉක්මනට එකතු කිරීමට මට සිදු වේ යැයි මම නොසිතුවෙමි. එහෙත් බුදු වදන අනුව ''සිතන දේ නො සිදුවේ. නො සිතන දේ සිදුවේ'' යන්න මට ප්‍රත්‍යක්ෂ විය. 2007 වසරේ අගෝස්තු 02 දින සති දෙකක ජපන් සංචාරයක් සඳහා පිටත් වීමට පෙර මම නන්දේ හමුවීමට ගියෙමි. ඉතාම උද්‍යෝගයෙන් තමාගේ අලුත්ම පර්යේෂණයක් පිළිබඳ කරුණු ඔහු මට විස්තර කළේය. අපට මරණින් මතු කුමක් වේ ද? ඔහු ළඟදී මිය ගිය ගිහි-පැවිදි කිහිප දෙනෙකු පිළිබඳ විද්‍යානුකූලව සොයා ගත් කරුණු කියන විට මගේ ඇඟ කිලිපොලා ගෙන ගියේය. දිට්ඨ ධම්ම වේදනීය කර්මය විග්‍රහ කරමින් ඔහු බොහෝ අය ගැන මොලොවදීම පළ දෙන කර්ම ගැන පොත් ලියා ඇත. ඊට දෙවැනි නොවන සොයා ගැනීමක් ය. මේ දැන් ඔහු කරගෙන යන්නේ.

''ආරි, ඔය ගමන ගිහින් නිරුපද්‍රිතව එන්න. මේ කරුණු හෙළි කිරීමට ඔබ එනතුරු මා නොඉවසිල්ලෙන් ඉන්නේ'' යනුවෙන් ඔහු මට කීවේය.

මා ජපානයට ගොස් ඔසාකා නගරයේ තිබුණු වැඩ සටහන් නිම කොට ටෝකියෝ යෑමට සූදානම් වන විට හදිසියේම ගෙදරින් දුරකතන පණිවුඩයක් ලැබුණේය. මෙය බලාපොරොත්තු නොවූ කම්පනයකි. මගේ ආදරණීය නන්දේ හදිසියේම මිය ගිය බව දැන ගතිමි. එවේලේම සෙසු වැඩ සටහන් නවතා දමා මාත් ක්‍රිෂ්ණාත් ඔසාකාවලින් කොළඹට ගත හැකි පළමු ගුවන්යානයෙන්ම ආපසු ඒමට පිටත්වීමු.

ගුවන් තොටුපලේ සිට මා කෙලින්ම ගියේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයටයි. ඒ වන විට දේහය එහි ගෙන ගොස් තිබිණි. ගුරු සිසුන් විශාල සංඛ්‍යාවක් ද, ගිහි පැවිදි නෑදෑ හිතවතුන් එහිදී එතුමාට අවසාන ගෞරව දැක්වූහ. සවස දේහය බොරැල්ල සුසාන භූමියට ගෙන ගොස් එහිදී ආදාහන කටයුතු කළෙමු.

මහාචාර්ය නන්දසේන රත්නපාල ශූරීන්ට නිවන්සැප ලැබේවා!

අහසින් බසින කුමාරයෝ

භව තණ්හා ස්ව චරිතාපදානයේ පළමුවන සහ දෙවන වෙළුම් කියවූ ඕනෑම කෙනෙකුට අපේ රට-දැය-සමය සඳහා අඛණ්ඩව මාත් සමඟ කටයුතු කළ දස දහස් ගණන් ඇත්තවුන් කළ පරිත්‍යාගයන් ගැන අවබෝධයක් ලැබෙන්නට ඇත. එහෙත් අප රටේ සමහර නායක හාමුදුරුවරුන්ගේත්, වෙනත් ප්‍රජා නායකයින්ගේත්, පොදු මහජනතාවගේත් ලොකු දුර්වලකමක් තිබේ එනම්: ලොකු පවුල්වලට සහ ඒ පවුල්වලට සම්බන්ධ වන ඕනෑම කෙනෙකුට දක්වන බයාදු කමයි. මේ ගැන මට දිය හැකි හොඳම උදාහරණය මා එකල දත් කුමාර් රූපසිංහ මහතා ය.

ස්වීඩනයේ රැස්වීමකට මා ගිය අවස්ථාවේදී එවකට ස්වීඩනයේ ලංකා තානාපතිව සිටි කුල්මේයර් මහතා මා හමුවී ඉල්ලීමක් කළේය. එනම්, එංගලන්තයේ සිට පැමිණි ආචා ලැනරෝල් නැමැත්තෙකු බණ්ඩාරනායක මැතිනියටත් රජයටත් ශ්‍රී ලංකාවටත් විශාල අවමානයක් ගෙන දෙන ආකාරයට දේශන මාලාවක් පවත්වන බවයි. ඔහු එදා දේශනය පවත්වන සම්මන්ත්‍රණයට මට ද ආරාධනා ලැබී තිබෙන බැවින්, ලංකාවේ ගෞරවය මොහුගෙන් ආරක්ෂා කර දෙන මෙන් තානාපතිවරයා මගෙන් ඉල්ලීය. තානාපතිවරයා වශයෙන් රජයේ නම ආරක්ෂා කර දීම එතුමාගේ වගකීම බව පැවැසූ මම, සත්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා ඕනෑම දෙයක් කිරීමට සූදානම් බවත් ප්‍රකාශ කළෙමි.

මගේ මතකයේ හැටියට මිටි තරබාරු සිරුරකින් යුත් කාල් මාක්ස් සිහි ගන්වන, ඒ විදියේ ම එහෙත්, කළු පාට දිග රැවුලකින් සහ පහතට එල්ලා වැටෙන කළු කොණ්ඩයකින් ද යුත් ආචා ලැනරෝල් නැමති මේ පුද්ගලයා ඔහුගේ යථා තත්ත්වයට වඩා විප්ලවීය. ස්වභාවයක් පෙන්නුම් කළේ, ඔහුගේ දිග රැවුල් කොණ්ඩාවලින් සහ හුඟක් පහළට එල්ලෙන ඇඳුමෙනි. ඔහුගේ කථාවෙන් ඔප්පු කරන්නට හැදුවේ ශ්‍රී ලංකාව බණ්ඩාරනායක මැතිනිය යටතේ පවතින දරුණු ඒකාධිපතිවාදී පොලිස් රාජ්‍යයක් බවයි. ලංකාව වටේ කටුකම්බි ගැසූ පිට කවරයේ ලංකාවේ සිතුවමක් ද 'ශ්‍රී ලංකාව

පොලිස් රාජ්‍යයක්' යන වචන ද යොදා මුද්‍රණය කරන ලද පොතක් ඔහු විසින් බෙදා දෙන ලදී

මගේ කතාව ආරම්භයේදී ම ඔහු අන්තිමට ශ්‍රී ලංකාවට ගියේ කොතරම් කාලයකට පෙරදී දැයි ඇසුවෙමි. ඔහුගේ උත්තරය වූයේ අවුරුදු විස්සකට පෙර බවයි. මම ලංකාවේ සිට පැමිණියේ දවස් දෙකකට පෙර බවත්, ඒ නිසා ලැනරෝල් මහතාට වඩා හොඳින් මා රටේ වත්මන් තත්ත්වය ගැන දන්නා බවත් පවසා, ඔහුගේ කතාවේ සදොස් තැන් නිදොස් කොට රජයට හෝ අන් කිසිවෙකුට පක්ෂපාතී නොවී, මා දත් පමණින් සත්‍ය තත්ත්වය ඔවුනට කියා දුනිමි. මගේ කතාව නිම වෙන්නට පෙර, ඔහුට ආපසු එංගලන්තයට යාමට ගුවන් යානයට ප්‍රමාද වෙන බව කියා ඒ ශාලාවෙන් පිට වීය. ඉන් පසු සර්වෝදය දර්ශන -ය සහ වැඩ සටහන පිළිබඳව එහි සිටි තරුණ තරුණියන්ට මා දීර්ඝ වශයෙන් කියා දුනිමි.



කුමාර් රූපසිංහ මහතා

ස්කැන්ඩිනේවියානු රටවලට, යුරෝපයට සහ උතුරු අමෙරිකාවට ගිය මම, ලංකාවට පැමිණි වහාම බණ්ඩාරනායක මැතිනිය හමුවීමට ගියෙමි. ''ශ්‍රී ලංකාව පොලිස් රාජ්‍යයක්'' යන පොත ද මම ගෙන ගියෙමි. අරලියගහ මන්දිරයට මා ගියේ ඉස්සරහ දොරිනි. එසේ ඇතුළු වන විටම, ඇතුළේ සිට එළියට ආවේ ආචා ලැනරෝල් මහතා සහ ජීවිතයේ පළමුවරට මා දුටු කුමාර් රූපසිංහ මහතාය. සුභ සන්ධ්‍යාවක් වේවා! යි කියා කියනු

හැර, ඔවුන් සමඟ කතා කරන්නට දෙයක් මට තිබුණේ නැත. කුමාර් රූපසිංහ මහතා, බණ්ඩාරනායක මැතිනියගේ වැඩිමහල් දියණිය සුනේත්‍රා හා විවාහ වී සිටින නිසා, එතුමියගේ බෑණා බවත්, තරුණ සේවා සභාවේ සභාපති වශයෙන් ද ඔහුට පත්වීමක් දී ඇති නිසා රටේ බලවත් පුද්ගලයෙකු බවත්, එතැන සිටි මගේ හිතවත් නිලධාරීන් කිහිප දෙනෙක් පැවැසූහ. බණ්ඩාරනායක මැතිනියට ස්වීඩනයේදී වූ සිද්ධිය විස්තර කොට, පොත් පිංච ද අතට දී, දූත් ආචා ලැනරෝල් මහතා බෑණාගේ වසඟයට රැගෙන තිබෙන බැවින් මේ ගැන කිසිවක් මෙතුමියට කීමට නොහැකි බව පවසා මම අරලියගහ මන්දිරයෙන් පිට වීමි.

ඊට ටික දිනකට පසු කුමාර් රූපසිංහ මහතා ටෙලිෆෝනයෙන් මට කතා කළේය. ඔහුගේ කට හඬේ ඉතා ගාම්භීර බවක් මෙන්ම, අණ දෙන විදියේ ස්වරූපයක් ද තිබුණේ ය. සර්වෝදය මූලස්ථානය මෙත්මැදුර බැලීමට වුවමනා බවත්, අහවල් දින අහවල් වේලාවට පැමිණෙන බවත් ඔහු පැවැසීය. දශක දෙකකටත් වැඩි කාලයක් ඔහු කරන්නට හදන තරුණ සේවාවල මා යෙදුණු කෙනෙක් වුවත්, මේ කුමාරයාගේ අණ මම පිළිපැද්දේ සච්චකයාගේ අණ බුදුන් වහන්සේ පිළිපැද්දා සේය.

ජාතික තරුණ සේවා සභාවේ සභාපති කුමාර් රූපසිංහ මහතා මෙත් මැදුරට පැමිණ සියලුම අංශ නරඹා, පවුල් හමුවේ කතාවක් ද කොට, සමරු පොතේ සටහනක් ද තබා ගියේය. ඔහු ගිය විගස අප කතා වූයේ ෆීලික්ස්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා පැමිණ කළ භාරදූර කතාවට පසු ඇසූ භාරදූර කතාව මෙය බවයි. බණ්ඩාරනායක මැතිනියගේ අනිත් බෑණා මෙන්ම, මේ බෑණාගෙන් ද අපට පහර වැදෙයි ද?

එංගලන්තයේ දී 'ගිනිපුපුර' නමින් ආණ්ඩු විරෝධි පුවත්පතක් පළ කළා යැයි කියන කුමාර් රූපසිංහ මහතා, ලංකාවේදී 'ජනවේගය' නමින් පුවත්පතක් ආරම්භ කළේය. සර්වෝදයට පහර දීමට මේ පුවත්පත යොදා ගත් හැටි පහත දැක්වේ. 1976 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා එහි පළ වූ සර්වෝදය මොකක්ද? කොහෙන්ද? යන මැයින් වූ ලිපියේ මෙසේ සඳහන් විය.

''ශ්‍රී ලංකාවේ පොදු ජනතාවගේ ආර්ථික දේශපාලන හා සමාජීය ප්‍රශ්නයන් මේ රටේ පවත්නා ආර්ථික ක්‍රමය හා එක එල්ලේම බැඳී පවතී ඕනෑම සමාජයක ආර්ථික සම්පත්වල අයිතිය හා එම සම්පත් මෙහෙයවීමේ අයිතිය සමාජයේ බහු ජනතාව සතු වීමෙන් තොරව බහු ජනතාවගේ ජීවන ප්‍රශ්නයන්ට විසඳුම් ඉදිරිපත් කිරීමට හැකියාවක් නැත. ජනතාවගේ ආර්ථික හා සමාජීය ප්‍රශ්නත් ඒවා විසඳා ගැනීමට නම් ජනතාවගෙන් උදුරා ගෙන සමාජයේ අතලොස්සක් වෙත හිර කර ගෙන ඇති සමාජයේ ආර්ථික අයිතිය ලබා ගැනීමේ අවශ්‍යතාවක් එකිනෙකට බැඳී සිටී.''

මේ සැබෑ තත්ත්වය කරා ජනතාව ප්‍රවිශ්‍යවීම වැලැක්වීමට තම ප්‍රශ්නයන් විසඳා ගැනීමට ජනතාව ගත යුතු දේශපාලන ක්‍රියා මාර්ගය පිළිබඳ අවබෝධයෙන් හෝ එම ක්‍රියා මාර්ගයන්හි වැදගත් බවෙන් ජනතාව ඈත් කිරීමට හෝ වෙනත් මගක යොමු කිරීමට කිසියම් ව්‍යාපාරයක් ක්‍රියාත්මක වේ නම් එම ව්‍යාපාරය ජනතාවගේ වුවමනා ඉටු කරනවාය යන මතු පිට පැවැත්මට යටින් මූලිකව සේවය සපයන්නේ ප්‍රතිගාමිත්වයට හා වරප්‍රසාද ලාභීන්ට ඒ වරප්‍රසාද රැක ගැනීමටය.

මෙම තත්ත්වය අප පිළිගන්නේ නම් මේ දෘෂ්ටි කෝණයේ සිට බලන්නට අප සූදානම් නම්, අද අපේ අවධානය යොමු විය යුතු, අපේ විමසීම් භාජනය විය යුතු සංවිධාන අතරින් එක් ප්‍රධාන සංවිධානයකි, සර්වෝදය ව්‍යාපාරය.

දේශපාලනයෙන් හුදකලාව පවතී යයි ද, පතල කරුණාවෙන් උදාසීන ජාතියක් නිදිගැට ඇරවීමට සූදානම් යයි ද පැවැසෙන සර්වෝදය ව්‍යාපාරය තුළින් දියත් වන ප්‍රධාන මතය කුමක් ද? යන්න අපේ සැලකිල්ලට භාජනය විය යුතුය. ගම - ගමේ ප්‍රශ්න - සාමූහික වෑයම - ශ්‍රමදානය - මේ ක්‍රියා මාර්ගයන්ට සීමාව ගමක් තුළ සර්වෝදයෙන් කෙරෙන වැඩ කටයුතු ඉටු කරන්නේ කුමක්ද? ගමක දුප්පත්කම ගැමියාගේ ඉඩම් නැතිකම - ගමේ ධනවත් පවුල් කිහිපයක් ඉඩම් අත්පත් කරගෙන සිටින බව පිළිබඳ සැබෑ තත්ත්වයෙන් ඒ තත්ත්වය පිළිබඳ අවබෝධයෙන් ගැමියා ඈත් කිරීමකි. ශ්‍රමදානයෙන් පාරක් කැපිය හැකි වෙනු ඇත. ඒත් ශ්‍රමදානය ආර්ථික විෂමතාවය විසඳන ක්‍රියා මාර්ගයක් නොවේ.

සර්වෝදය මොකක්ද කොහෙන්ද ?

සර්වෝදය පිළිබඳ එලවූ ලිපිය

ප්‍රධාන ප්‍රශ්නය යට ගසමින්, ජනතාව වෙනත් මාවත් කරා යොමු කිරීමට උත්සාහ ගනී නම් එනම්, තමන් යා යුතු මගින් ජනතාව ඈත් කර ජනතාව වල්මත් කරයි නම් ඕනෑම සංවිධානයක් මූලිකව සේවය කරන්නේ ජනතාවට නොව ප්‍රතිගාමිත්වයටය. ජනතාවගේ ප්‍රශ්නවල සැබෑ තත්ත්වයෙන් ඈත්ව මනෝමූල විසඳුම් කරා ජනතාව මෙහෙයවන්නට උත්සාහ දරණ සර්වෝදය ප්‍රතිපත්තිමය වශයෙන් සේවය කරන්නේ ජනතාවට නොව ප්‍රතිගාමිත්වයටය.

සර්වෝදය ව්‍යාප්තිය හා හැඩහුරුව සම්බන්ධව ද කරුණු සැලකීමේදී පෙනී යන කරුණු කිහිපයක් ඇත. ප්‍රධාන වශයෙන් සර්වෝදය ගමේ ගොඩේ ස්වාමීන් වහන්සේලා නොදැනුවත් කමින් ග්‍රහනය කරගෙන පැවතුන ද මෙහි මූලික අනුග්‍රාහක ඇතැම් යතිවරු මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයට මුළුමනින්ම විරුද්ධව එමෙන්ම, සමහර විට ඒකාධිපති වාදයක වැදගත්කම ගැන කතා කළ පිරිස් ද වීමය. මේ කරුණ හැරෙන්නට සර්වෝදයේ මිත්‍යා මතය ව්‍යාප්ත කරන හැඩහුරුව බලතොත් ප්‍රගතිශීලී ජනතාවට ඒ තුළ ද සැක මුසු තැන් මතුවේ.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ආසන අනුව ගතහොත්, ප්‍රගතිශීලී බලවේගවල ප්‍රවනතාවයක් ඇති ප්‍රගතිශීලී මන්ත්‍රීවරු නියෝජනය කරන ආසනවල සර්වෝදය දැඩි ලෙස ක්‍රියාත්මක වනු දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. මෙහිදී එක්තරා රහසක් පැවැතිය යුතුය.

සර්වෝදය හා අන්තර් ජාතික සම්බන්ධතාවය ගතහොත් බටහිර ජර්මනිය හා ඇමෙරිකානු ආධාර හා සර්වෝදය අතර පවත්නා සම්බන්ධතාවය ද, ජනතාවගෙන් වසන් වූ තත්ත්වයකි. ලෝකයේ සමාජවාදයට විරුද්ධ හොඳම ක්‍රියා මාර්ගය ක්‍රියා කරන්නන්ට පිළිගන්වන ත්‍යාග හා ආධාර හිමි කර ගැන්මට තරම් අධිරාජ්‍යවාදීන්ට සර්වෝදය වැදගත් නම් මේ රටේ ජනතාවට සර්වෝදය දෙස සැකයෙන් තොරව බැලීමට හැකියාවක් ඇති විය නොහැක.

රැකියා හිඟය තුළින් ප්‍රයෝජන ගනිමින් ඈත ගම්වල ගැමි තරුණයන් කොළඹට ගෙන්වා අවිහිංසා පැනි තැවැරූ අබිං ගුලිය ඔවුන්ට ගිල්වා කණ්ඩායමක් භාර දී ඔවුන් කරන මෙහෙයට රුපියල් 75/= හැත්තෑ පහේ සිට තුන්සීය දක්වා ගෙවන්නට සමත් සංවිධානයක් ජීප්, වෑන්රථ, ප්‍රකාශන, මාධ්‍ය, ට්‍රේප් රෙකෝඩර්, ලාංඡන, පදක්කම්, කඳවුරුවලට කෑම මේ සියල්ල සඳහා අත දිග හැර වියදම් කළ හැකි සංවිධානයක් ලෙස අප සර්වෝදය දකියි නම් මේවාට සල්ලි කොහෙන්ද යන ප්‍රශ්නය ද අපි ඒ සමඟම නැඟිය යුතුව ඇත. සර්වෝදයට මුදල් ලැබෙන්නේ කොහෙන් ද යන්න පමණක් නොව, පුනරුත්ථාපන කඳවුරුවල සිටින තරුණයන් ද එයින් එළියට එන විට සර්වෝදය කරා ඇඳා ගැනීමේ අභ්‍යන්තර වැඩ පිළිවෙලක් පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව ඔස්සේම එම කඳවුරු තුළම ක්‍රියාත්මක කිරීමට තරම් සර්වෝදයේ මිනිසුන් අද මහ තැන්වල සිටින බව ජනතාවගෙන් වසන් නොකළ යුතුය. සර්වෝදය ප්‍රතිපත්තිමය ලෙස ද ක්‍රියාකාරිත්වයෙන් ද ප්‍රතිගාමිත්වයට වාසි දායක තත්ත්වයක් ඇති කිරීමට උත්සාහ දරන සංවිධානයක් මිස අසරණ සරණ අවිහිංසාවාදී ව්‍යාපාරයක් නොවන බව මෙම කරුණු මගින් පෙන්නුම් කරන්නට අපි උත්සාහ දැරුවෙමු. සර්වෝදය මේ ප්‍රශ්නයට ජනතාවට පිළිතුරු සැපයිය යුතුය.

1. ජනතාව සැබෑ තත්ත්වයෙන් ඉවතට යොමු කිරීමට සර්වෝදය ක්‍රියා නොකරයිද?

2. සර්වෝදයේ ජාත්‍යන්තර සම්බන්ධතා මොනවාද? ඒවා ජනතාවගෙන් සඟවන්නේ ඇයි?

3. රාජ්‍ය තන්ත්‍රයේ මහා පුටු සර්වෝදයේ මිනිසුන් ලෙස හඳුන්වමින් කඳවුරු තුළ, හිරගෙවල් තුළ, දෙපාර්තමේන්තු තුළ ඔවුන් ඔස්සේ ක්‍රියාත්මකවීමේ තේරුම කුමක්ද?

4. දකුණු පළාතේ සර්වෝදය ව්‍යාපාරයට පාවිච්චි වෙන ඇතැම් ජීප් රථවල හිමිකාරයන්ගේ සම්බන්ධය ප්‍රතිගාමීද? නැතිද?

5. සර්වෝදය නායකත්වය භාර ගැනීම මේ රටේ ප්‍රකට පුද්ගලයන් කිහිප දෙනෙකුම අතීතයේ ප්‍රතික්ෂේප කළ බව ජනතාවට සැඟවීමේ රහස කුමක්ද? දේශපාලන වශයෙන් පීඩිත ජනතාව ගෙන යා යුතු සටන වැරදි මඟකට යොමු කර, මින් අධිරාජ්‍යවාදීන්ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා සියුම් ව්‍යාපාර ගෙන යන විවිධ සංවිධාන පිළිබඳ ලියැවෙන ලිපි පෙළේ තවත් ලිපියක් අද පළ කරමු.

කුමාරයා අමාත්‍ය ප්‍රොන්ක් බාර ගැනීම

නෙදර්ලන්තයේ විදේශ සංවර්ධන සහයෝගය බාර අමාත්‍යව සිටි යැංප්‍රොන්ක් මහතා (YanPronk) මා මුලින්ම හඳුනා ගත්තේ ස්ට්‍රාස්බූර්ග්වල පැවැත්වූ යුරෝපා මණ්ඩලයේ රැස්වීමක් අමතන්නට ගිය අවස්ථාවේදී ය. මගේ දේශනයෙන් පසු මා හා කතා කළ යැංප්‍රොන්ක් මහතා, ඒ කාලයේ ලංකාවේ තිබූ ආහාර හිඟයට යම් පිළිසරණක් වශයෙන් 'නොවිබ්' සංවිධානය හරහා කිරිපිටි, බටර්ඔයිල් ආදිය එවීමට පොරොන්දු විය. එතුමා සමඟ ඒ දිනවල මිත්‍රත්වයක් තිබුණු නිසා, පසු වතාවක නෙදර්ලන්තයට ගිය අවස්ථාවකදී ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස මා ඔහුගෙන් ඉල්ලීමක් කළෙමි. ඔහු සර්වෝදය බැලීමට ඒමට එකඟ විය. එය පෞද්ගලික ආරාධනයකින් කෙරෙන පෞද්ගලික ගමනකි.

නෙදර්ලන්තයේ විදේශ සංවර්ධන සහයෝගය බාර අමාත්‍ය
යැංප්‍රොන්ක් මහතා,චාරිකා සහ මම

ඒ යුගයේ ප්‍රොන්ක් මහතාගේ පැමිණීම ලංකාවට නෙදර්ලන්තයෙන් ආධාර ලබා ගැනීමට මාර්ගය විවෘත වූවක් බැවින්, රජයට මේ බව දැනුම් දීම රට වෙනුවෙන් මා විසින් කළයුතු යුතුකමක් බව මම විශ්වාස කළෙමි. මේ නිසා ලංකාවේ යුරෝපීය හවුල නියෝජනය කළ ආචාර්ය ලාල් ජයවර්ධන මහතා මුණගැසී ලංකාවට පැමිණීමට ප්‍රොන්ක් මහතාට මා කළ පෞද්ගලික ආරාධනය ඔහු පිළිගත් බව පැවසීමි. ඔහු පැමිණෙන්නේ සර්වෝදය බැලීමට වුවත් නිල වශයෙන් අගමැතිනිය විසින් ඔහු මුණගැසී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් වන්නේ නම් එය වැදගත් බව කියා සිටියෙමි.

ප්‍රොන්ක් මහතා සර්වෝදය බැලීමට එන බව මා ලංකාවට පැමිණි පසු ලිපියකින් දන්වා තිබුණේ ය. ඊට පෙර දින උදයේ මට ලැබුණු විදුලි පුවතක සඳහන් වූයේ ඔහු රාජ්‍ය අමුත්තෙකු ලෙස පිළිගැනීමට රජය විසින් කටයුතු යොදා ඇති බවත් ඔහු අසවල් දින, අසවල් වේලාවට, අසවල් අංකය දරන යානයෙන් කටුනායකට ගොඩබසින බවත් ය. නියමිත වේලාවට මම ද ගුවන් තොටුපළට ගියෙමි. විශේෂ අමුත්තන්ගේ පර්යන්තය වෙත මම ඇතුළුවීමි. එතැන සිටි නිලධාරීන් කිසිවෙකු මා නැවැත්වූයේ නැති නිසා, මම ද ඇතුළට ගොස් වාඩිවීමි. එවකට ක්‍රම සම්පාදන පිළිබඳ නියෝජ්‍ය ඇමතිව සිටි රත්න දේශප්‍රිය සේනානායක මහතා ද, නිලධාරීන් කිහිපදෙනෙක් ද කුමාර් රූපසිංහ මහතාත් එහි සිටියහ. KLM ගුවන් යානය නියමිත වේලාවට පැමිණියේ ය. ගුවන් යානය වෙතට දේශප්‍රිය මහතා ප්‍රධාන නිලධරයන් යන විට, මම ද ඔවුන්ගේ පස්සෙන් ගියෙමි. යානයෙන් බැස්ස ප්‍රොන්ක් මහතා ඔවුන්ටත්, මටත් අත දුන්නේය. ඇසෙන් මොකක්ද කීවා හැර වචනයක් හෝ ඔහු මා සමඟ කතා කළේ නැත. ඒ සියලුදෙනා නිල රථවල නැග කොළඹට ගිය අතර, ප්‍රොන්ක් කෙරෙහි මහත් කලකිරීමෙන් යුතුව මගේ රිය දෙසට පා නැගුවෙමි.

මා මොරටුවට පැමිණෙන විට රාත්‍රී 11.00 ත් පසුවී තිබිණි. එහෙත් ගෙදරට ගොස් මගේ ඇඳුම් මාරු කර ගැනීමටත් පෙර, මගේ ටෙලිෆෝනය නාද විය. ඒ ප්‍රොන්ක් මහතා ය.

''ආරි මම දැන් හිරකාරයෙක් නොවෙයි. ඒ නිසා කතා කිරීමට දැන් හෝටලයට එන්න'' පැය භාගයක් ඇතුළත හෝටලයට ගිය මා, ප්‍රොන්ක් මහතාට ඇහුම්කන් දුනිමි.

''මට උවමනා කළේ සර්වෝදය බැලීමට, එහෙත් ඔබගේ ආණ්ඩුව සර්වෝදයට යෑමට මට ඉඩ දී තිබෙන්නේ පැයක් පමණයි. තණමල්විල ගොවිපොළට පමණක් ඒ පැය ගත කිරීමට යොදා තිබෙනවා. සර්වෝදය පහත් කොට, අතරමගදීම මේ අය කතා කිරීම නිසා ලංකාවට දෙන්න පොරොන්දු වෙන්න හිතාගෙන ආ මුදල අඩු කිරීමට මා තීරණය කළා''

තණමල්විල සර්වෝදය ගොවිපොළට තරඟයට මෙන්, ඇඹිලිපිටියේ ඊට වඩා විශාල ගොවිපොළක් විශාල වශයෙන් රජයේ මුදල් සහ සම්පත් ආයෝජනය කොට ජාතික තරුණ සේවා සභාව යටතේ කුමාර් රූපසිංහ මහතා විසින් ආරම්භ කර තිබුණේය. කුමාර් රූපසිංහ මහතාගේ හපන්කම් පෙන්වා, ඔවුන් තණමල්විලට ඇතුළු වන විට හරියටම පැය භාගයක් පසු වී තිබුණේ ය. ඇතුළු වූ සැණින් මේ වලාකුළෙන් බට කුමාරයා කීවේ, ඔවුන්ට වැඩි වේලාවක් සිටිය නොහැකි බව යි.

ප්‍රොන්ක්ටත් ඇසෙන්නට මම මෙසේ කීවෙමි:

''මේ ඇමතිතුමාට ආරාධනා කළේ මම. එතුමා ආවේ සර්වෝදය බලන්න. නමුත් අපේ මූලස්ථානයටවත් ඒමට වෙලාවක් නොදී, තණමල්විලට පමණක් පැයක් වෙන් කර ඒකත් ප්‍රමාද වෙලා ඇවිල්ලා, ඉක්මනට යන්න ඕනෙ කියන එක මට පිළිගන්න බැහැ. වැඩ සටහනේ තියෙන පැයට මිනිත්තු 60 ක් තියෙනවා. මේ මිනිත්තු 60 ට මේ අක්කර 500 තුළ අප කර ඇති දේ බලාගෙන පමණයි මෙහෙන් පිටව යන්නේ''

මා හිතන්නේ කුමාර් රූපසිංහ මහතාට දවස් දෙකහමාරක් පෙන්වන්නට බැරි වූ වැඩ කොටසක් තණමල්විලදි පැයක් ඇතුළත ප්‍රොන්ක් මහතාට පෙන්වීමට අප සමත් වූ බවයි. කුමාර් රූපසිංහ

මහතා ප්‍රොන්ක් මහතා සමඟ රට පුරා සංචාරය කරන විට, ඔහුගේ ආරක්ෂකයා හැටියට සිටි පොලිස් පරීක්ෂකවරයා නාලන්දාවේ මගේ ශිෂ්‍යයෙකි. යුනිෆෝම් එක නිසා කොතෙක් රාජකාරියට වහල් වී සිටියත්, එම නිලධරයා සදාචාර විරෝධීව කතා-බහ තෝරා බේරා ගැනීමට හොඳින් දන සිටියේය. ප්‍රොන්ක් මහතා වෙනුවෙන්, ගරු අග්‍රාමාත්‍යතුමිය රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වූවාය. ඒ සඳහා මටත් නීතාටත් ආරාධනා පත්‍රයක් එවා තිබුණාය. මෙම රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා අප කොළඹ යාමට පිටත්වීමට සූදානම් වෙද්දී දුරකතනය නාදවීය. අනිත් පැත්තෙන් කතා කළේ ආචාර්ය දහනායක නැමැති මහත්මයෙකි. ඔහු කීවේ එදා පැවැත්වෙන භෝජන සංග්‍රහයට අප දෙදෙනාට ආරාධනා කර තිබෙන්නේ වැරදීමකින් බවත්, ඒ නිසා අප නොපැමිණිය යුතු බවත් ය.

මා ඔහුට කියා සිටියේ අප හෝටලයට එන බවත් ආවාට පසු අප පිට කිරීම වඩා නම්බුකාර බවත් ය. දහනායක මහතා වික්ෂිප්ත වූවා සේ මට හැඟිණ. ටිකක් වේලා නිශ්ශබ්දව සිටි ඔහු 'අනේ ඒක කළොත් මගේ රස්සාව නැතිවේවි' මේක කාගේ නියෝගයක් දැයි මම ඇසීමි. උප ඇමති රත්න දේශප්‍රිය සේනානායක මහතාගේ නියෝගයක්. නමුත්, මේ ආරාධනය එවා තිබෙන්නේ අගමැතිනියගේ නමින්. ඇයි ඔබ අගමැතිනියගෙන් අහන්නේ නැත්තේ අනේ සර් අපට මැතිනියගේ ළඟට යන්න බැහැ අපේ රස්සාව බේරා දෙන්න. මේ අහිංසක නිලධාරියා ගැන අනුකම්පා කොට අප එම භෝජන සංග්‍රහයට යෑමෙන් වැලකුනෙමු. ඊට පසු දින ප්‍රොන්ක් මහතා විසින් අගමැතිනිය ඇතුළු අන් අයට භෝජන සංග්‍රහයක් සඳහා ආරාධනා කොට තිබුණේ ය. අපි එයට ගියෙමු. එදින අවස්ථාවක් බලා මැතිනිය ළඟට ගොස් කනට කොට මෙසේ පැවැසීමි.

> ''මැතිනිය ඊයේ රෑ අපට භෝජන සංග්‍රහයට ආරාධනා පත්‍ර එවා අන්තිම මොහොතේ ටෙලිෆෝන් කොට ඇයි එන්න එපා කීවේ''

මැතිනිය විමතියෙන් ඇස් උඩු කර ගත්තාය

මැතිනිය කලබල වෙන්න එපා. ඕවා වලාකුළින් ආ ඔබතුමියගේ බෑණා වූ කුමාරයාගේ වැඩ.

(මේ විස්තරය මා ලියා තිබුණේ මීට වඩා ටිකක් සැරටය. එහෙත් එහි සැර බාල කොට පළ කරන්නට මා අදහස් කළේ අද රූපසිංහ මහතා ද සිවිල් සමාජ කටයුතුවල නියැලෙන පුද්ගලයෙකු නිසාය. එතුමාගේ සංවිධාන සමඟ සර්වෝදයේ සම්බන්ධයක් නැත. එහෙත් එතුමාට පහර ගසන අය සර්වෝදය ද ඔහුට සම්බන්ධ කොට පහර දීම පුරුද්දක් කර ගෙන තිබේ. එදා කුමාර් රූපසිංහ මහතා අපට පහර ගැසූ කාරණාම ඉස්මතු කොට, අද එතුමාට එම පහරවල් වැදීම දෛවයේ සරදමක්ද? දිට්ඨ ධම්ම වේදනීය කරුමයක්ද?)

කෙසේ නමුත් (එනම් 2006 දී) එතුමා සිවිල් සමාජයේ නිදහස වෙනුවෙන් කටයුතු කිරීම ගැන අපි සතුටු වෙමු. එහෙත් අපට විරුද්ධව එදා ඔහු නැඟූ ප්‍රශ්න අද ඔහුගේ සංවිධාන පිළිබඳ නඟා ඔහුම පිළිතුරු සපයනවා නම් අගනේය.

218

නියෝජ්‍ය විනිමය පාලකගේ හුළං බැස්ස හැටි

කලකට ඉහතදී අපේ රටේ විදේශ විනිමය තත්ත්වය ඉතාම පහළ මට්ටමකට බැස තිබිණ. ඒ අවදියේ පිටරට යන ඕනෑම කෙනෙකුට විදේශ විනිමය සැපයීම රුපියල් පනහකට නැතහොත් පවුම් තුනහමාරකට සීමා කොට තිබිණ. මේ අවදියේ මට නිතරම පිටරට යාමට සිදු වී තිබිණ. ඒ ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශක රැස්වීම්වලට සහභාගිවීම සඳහා ය. එහෙත් මට ලබාගත හැකි වූ රුපියල් පනහේ විදේශ විනිමය ප්‍රමාණය එම රැස්වීම්වලට යාමේදී අවශ්‍ය වන කුලී රථ ගාස්තු වැනි සුළු සුළු වියදම් සඳහාවත් ප්‍රමාණවත් නොවීය. මේ නිසා මම වරක් ජිනීවා නුවර පිහිටි ලෝක සෞඛ්‍ය සංවිධාන මූලස්ථානයට ලිපියක් යවා මේ කාරණය දැනුම් දී යටත් පිරිසෙයින් පවුම් සියයක මුදලක්වත් අත්තිකාරම් වශයෙන් එවන ලෙස දන්වා සිටියෙමි.

ඒ අනුව ඔවුන් නොපමාව එම මුදල කොළඹ ග්‍රීන්ඩ්ලෙස් බැංකුවට එවා, ඒ බව මට ද දැනුම් දී තිබිණ. මම එය ලබා ගැනීම සඳහා ග්‍රීන්ඩ්ලේස් බැංකුවට ගියෙමි. එහිදී එම කාරිය බාර නිලධාරී මහතා යුහුසුළුව මගේ කාරිය ඉටු කර දීමට ඉදිරිපත් වී, සියලු විස්තර ඇතුළත් පෝරමයක් මට බාර දී එය ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර විනිමය පාලක වෙතට ගෙන ගොස්, මගේ ගුවන් ටිකට්පත් සහ ගමන් හැඳුනුම් බලපත්‍රය ද ඉදිරිපත් කොට, පෝරමය පුරවා ඔහුගේ අනුමැතිය ලබා ගෙන එන ලෙස විනීත ලෙස පැවැසීය. ඒ අනුව මම ඒ වේලාවේම ශ්‍රී ලංකා මහ බැංකුවට ගියෙමි.

ඒ අවදියේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාද සෙසු බොහෝ නිලධාරීන්ද මා පෞද්ගලිකවම දන්නා හඳුනන අය වූහ. එහෙත් මගේ කටයුත්ත ඉටු කර දීමට නියමිත නියෝජ්‍ය විනිමය

පාලක තැන නම් මා හඳුනන කෙනෙකු නොවීය. කෙසේ වුවද මම දන්නා හඳුනන අයට කරදර කිරීමට නොගොස්, අවශ්‍ය සහ නියමිත නිලධාරී මහතා වෙතට ගියෙමි. එවිට ඒ මහතා සිටියේ එදින පුවත්පතක් බලමිනි. මම ඔහු හමුවීමට ගොස් ඉංගිරිසියෙන් ඔහු අමතා 'සමාවෙන්න මහත්මයාණෙනි, කරුණාකර මේ පෝරම කොලය බලා ඔබතුමාගේ අත්සන මෙයට යොදා දෙන්න' යැයි කීවෙමි.

ඔහු මා දෙස බලන්නටවත් උනන්දු ගත්තේ නැත. ඔහු පත්තරය දෙසට යොමු කොට ගත් දෙනෙතින් යුතුවම මෙසේ කීවේය.

'ඕක ඔහොම තියලා ගිහින් හෙට එන්න මට ඕක අධ්‍යයනය කරන්න ඕනෙ' ඔහු එය කීවේද මාව ගණන් ගන්නේවත් නැතිව මහා ගාම්භීර තාලයකට ය. නිලධාරී උෂ්ණයෙන් ඔහු ඉදිමී සිටියා විය යුතුය.

සාමාන්‍යයෙන් මා එතරම් කේන්ති ගන්නා කෙනෙකු නොවූවද, මේ අවස්ථාවේ මට යකා නැග්ගේය. ඊළඟ මොහොතේ මම, ඔහු මට කතා කළ ස්වරූපයටත් වඩා දරදඬු සහ උච්ච ස්වරයෙන් කතා කොට මෙසේ කීවෙමි.

'මෙය අධ්‍යයනය කිරීමේ කාරියට ඔබට මමත් උදව් වෙන්නම්, මම ගුරුවරයෙක්, ඒකට අවශ්‍ය සුදුසුකම් මා ළඟ තිබෙනවා'

මා මෙසේ කියන විට ඒ අවට මේස අසල සිටි සෙසු නිලධාරීන්ද තම රාජකාරී නතර කොට මා දෙස බලනවා මට පෙනිණ. එවිට මා හැසිරුණේ ප්‍රමාණය ඉක්ම වන තරමේ ස්වභාවයකින් බව මට ද වැටහුන නමුත්, මගේ සිත පාලනය කර ගැනීම මටම අපහසු වීය. ඔහු හිස ඔසවා මා දෙස බලනු මට පෙනිණි. මම යළිත් කතා කළෙමි. 'ඔන්න ඔහොම හිස ඔසවා

මගේ දිහා හොඳට බලන්න. ඊළඟට මේ පාස්පෝට් එකේ තියෙන පින්තූරය දිහාත් බලන්න. ගුවන් ටිකට්පතේ තියෙන නම දිහාත් බලන්න. බලලා ඒවා මගේම ඒවා ද නැද්ද කියලා තේරුම් ගන්න උත්සාහ කරන්න. එච්චරයි ඕකට මම තවත් දවසක එන්න ඕනෙ නැනෙ?'

මා එසේ කියනවා සමඟම එවකට මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ආචාර්ය වර්ණසේන රාසපුත්‍රම් මහතා කොහේදෝ සිට මා සිටින ස්ථානයට එනවා මට දැක ගන්නට ලැබිණ.

'ආරි මල්ලී මොකක්ද ප්‍රශ්නෙ? මොකද මේ කලබලේ?' ඔහු මා ළඟට අවුත් මගේ උරහිසට අතක් තබමින් ඇසුවේය.

ඒ වෙලාවේ ආචාරශීලීභාවය මා වෙතින් පලාගොස් තිබිණ.

'නැහැ, ඔබේ මේ සහාය විනිමය පාලකතුමාට මාව අධ්‍යයනය කරන්න පැය විසිහතරක් ඕනැලු. මම ඒක විනාඩි දෙකෙන් කරන හැටි කියා දුන්නා' යි මම කීවෙමි

ඔහු සිනාසුණි.

ඒ අතර අර නිලධාරී තැන මගේ ලියකියවිලිවල තම අත්සන තබා ඒවා සියල්ලම මා අතට පත් කළේ 'දැන් ඔබ අත්සන් කරන්න. ඔක්කොම හරිනෙ?.' යැයි කියමිනි.

මම, ස්තූතියි කියනු හැර වෙන කිසිත් නොකියා ඒවා බාරගෙන, රාසපුත්‍රම් මහතා සමඟ එතැනින් ඈත් වීමි. එවිට වටපිට සිටි සෙසු නිලධාරී මහත්වරුන් තමන්ගේ මුවගට නැග එන සිනා බලහත්කාරයෙන් මැඩගෙන අර නිලධාරී මහතා දිහා අවඥා සහගත ලෙස බලා ඉන්නා හැටි මට දැක ගන්නට ලැබිණ. මෙවැනි නිලධාරීන්ගෙන් මහජනතාවට කවර නම් සෙතක් වේද?

බොදු කිතු හදවත් එක් කළ
මර්සලීන් ජයකොඩි පියතුමා

පිලපිටිය ශාන්ත ආනා පල්ලිය පිහිටියේ, පූජනීය කැලණි නගරයේ සුදෝ සුදු දාගැබ පෙනෙන නොපෙනෙන දුරිනි. වරෙක රටේ සිදු වූ ජාතික විපත්වලින් කනස්සල්ලට පත්ව සිටි මා ශාන්ත ආනා පල්ලියට ඇතුළු වූයේ මද්දහනේය. පල්ලිය ඉදිරිපිට කිසිවෙකු නොසිටියෙන් එහි දකුණු පස පිහිටි ඉස්තෝප්පුව දිගේ ගමන් කළ මම එක් දොර පියනක් විවෘතව තිබුණු කාමරයක් වෙත ගියෙමි.

තකහනියක් මා මේ දෙව්මැදුර වෙත ගියේ ක්‍රිස්තු භක්තිකයන්ගේ පමණක් නොව, බොදු බැතියන්ගේත් සියලුම දේශප්‍රේමීන්ගේත් කලා ලෝලයින්ගේත් ආදරය දිනාගත් ගරු මර්සලීන් ජයකොඩි පියතුමා මුණගැසී මගේ සුභ පැතුම් එතුමාට පුද කරන්නටය. මා එහි යන විට එතුමා සමඟ කතා කරමින් සිටි තරුණ සිසුවියන් දෙදෙනෙකු හැරුණු විට, එතැන කිසිඳු විශේෂ යමක් සිදු වී ඇති බවක් පෙනෙන්නට නොතිබිණි. ඇන්ග්ලෝ ඒෂියන් සමූහ ව්‍යාපාරයේ අධිපති තිස්ස විජේවර්ධන මහතාත්, තවත් මිතුරෙකුත්, මාත් එකවරම පුදුම වූයේ 83 හැවිරිදි මේ ශ්‍රේෂ්ඨ පුරුෂයා අවට තිබූ සරල චාම් පරිසරයයි. ජයකොඩි පියතුමාගේ ගීතයක, කවියක, පදමාලාවක තිබෙන නිර්ව්‍යාජ ශාන්ත බව පිළිබිඹු වන සිනහබර දයාන්විත මුහුණෙන් එතුමා අපව පිළිගත්තේය.



ගරු මර්සලීන් ජයකොඩි පියතුමා

සර්වෝදය මූලස්ථානයේදී

සන්නිවේදන සාහිත්‍යය සහ නිර්මාණාත්මක කලා පිළිබඳව ආසියාවේ පිරිනැමෙන 'රැමොන් මැග්සයිසයි' ත්‍යාගය මෙවර මර්සලීන් ජයකොඩි පියතුමාට හිමි වූ බව නිවේදනය වූයේ පෙර දින සන්ධ්‍යාවේය.

ජයකොඩි පියතුමා තරම්ම වයෝවෘද්ධ බවක් පෙනෙන කුඩා මේස දෙකකි. පුටු හයකි. එහි ම කෙළවර පැරණි කුඩා මෝටර් රියකි. 1981 අගමැතිතුමන් අතින් ලත් සාහිත්‍ය ත්‍යාග සහතිකයත්, 1982 ගීත ප්‍රබන්ධ කලාව සඳහා ටවර් හෝල් රඟහල් පදනමෙන් පිරිනැමුණු කලාශූරී සම්මාන සහතිකයත් හැරුණු විට, දිස් වූයේ තැනින් තැන ගොඩ ගැසී තිබුණු පැරණි පොත් රැසකි.

අපි කතාවට වැටුණෙමු. 1902 ජූනි 03 වැනිදා උපත ලත් මෙතුමා පූජකවරයෙක් හැටියට ගිහි ජීවිතය අත් හලේ 1927 දෙසැම්බර් මාසයේදීය. අවුරුදු 23 ක්ම ශාන්ත ජෝශප්, ශාන්ත පීතර් සහ ශාන්ත පැට්රික් විදුහල්වල ගුරුවරයෙක් වශයෙන් සේවය කළ එතුමා මීසම් රැසකම තම මෙහෙය ඉටු කළේය.

භක්තියෙන් කිතුණුවකු වීම දේශාභිමානය අඩුවීමට හෝ බෞද්ධ ලංකාවේ උරුමයනට අභිමිකම් කීමට හෝ හේතුවක් නොවන බවට මර්සලීන් ජයකොඩි පියතුමා අගනා ආදර්ශයකි.

පන්සලටය පෙර පරපුර අකුරු ගියේ
සිවුරෙන් අපේ රට රැකුණා අඳුරු පැයේ
අප හෙළ ගතිය වැඩුණේ පන්සලෙයි පියේ
අද වන තුරුම සිවුරේ පඬු ගතිය තියේ

1981 වසරේ සාහිත්‍ය ත්‍යාග දිනූ විට භික්ෂූන් වහන්සේලා පැමිණ එතුමා වැළඳ ගෙන, පැසසුම් පුද කළ අන්දම එතුමා සිහි කළේ ජීවිතයේ ලත් ආශිර්වාද අතර ඉහළම ආශිර්වාදය බව පවසමිනි.

ඇස යන යන තැන වෙහෙරක් පෙනීයන්
වෙහෙරක් නැති තැන වෙහෙරක් තැනීයන්
ඉන් එන පණිවුඩය නුවණට දැනීයන්
දුටු දුටු විට සිත් තුළ සිල් ගැනීයන්

මෙහි බුදුන් ගේ පා තබා ඇත වන්දනීයය සිරි පාදය
රැයෙත් උදයෙත් මිහිරියාවයි ඇසේ රැව් දෙන සාදු නාදය
පියේ මේකයි ධම්ම දීපය මුතු බඳින්නේ අපේ මූදය
මෙහෙම ලස්සන වෙන රටක් නැත ඇයට කොයි රට වුව පරාදය

දේශ භක්තියේ ජාත්‍යාලයේ සුමිහිරි ගී කවි පමණක් නොව, මානව දයාවෙන් ද එතුමාගේ හදවත පිබිදී ඇත.

මගෙ නත්තල දුගියා බත් කන දාය
මගෙ නත්තල වැරැහැලි නැති වන දාය
මගෙ නත්තල ඔබේ දුක සැනැසෙන දාය
මගෙ නත්තල පව පල්ලිය යන දාය

කතෝලික පියතුමෙකු හැටියට මර්සලීන් ජයකොඩි පියතුමා තමා උපන් දෙස බස රැසට කළ සේවය, මල් ගොමු අතරින් සිනිඳු

බුමුතුරුනු උඩින් ගමන් කරමින් ගොස් කරන ලද සේවයක් නොවන බව කවි කියැවෙන කියවන කා හට වුවත් තේරුම් යයි. කටු පඳුරු අතරින් වේදනා විඳ දරා ගනිමින් එතුමා අඩ සියවසක් ගමන් කළ මඟ කෙසේ වචනයට නඟා තේරුම් ගනිම් දැයි සිතමින් එතුමාගෙන් සමු ගැනීමට මම නැගිට්ටෙමි. එවිට මා දුටුවේ එතුමාගේ මේසය උඩ තිබූ පැරණි පොතක කවරය උඩ අලවා තිබුණු අගනා ඉංගිරිසි පාඨයකි. එතුමාගේ ජීවන දර්ශනය එයින් හෙළි වේ යැයි මම කල්පනා කරමි. එහි සිංහල අනුවාදය නම්:

''පාර වැටී තිබෙන දිශාව
අනුව නොයන්න
ඒ වෙනුවට
පාරක් නැති තැනකින්
ගමන් කොට නව පාරක්
තබා යන්න.''

ගිහි පැවිදි අප කාටත් නව පාරක අගය පෙන්වමින් ලෝක සම්මානයට පත් ගරු මර්සලීන් ජයකොඩි පියතුමාට තෙරුවන් සරණින් දෙවි පිහිටෙන් බොහෝ කල් අප අතර වැජඹීමට දීර්ඝායු පැතුවෙමි.

220
සම්‍යක් ප්‍රයෝග නැති බැරි කමට නේ

සර්වෝදය ක්ෂෙත්‍රයට අඩංගු නොවන කිසිම ධනාත්මක හෝ ගුණාත්මක විෂයයක් හෝ කාර්යයක් නොමැත. සමාජයේ ප්‍රගතියට ඉවහල් වන ඕනෑම ක්‍රියා මාර්ගයකට පිවිසීමට මා පැකුළුණේ නැත. එහෙත් මගේ සෙසු සර්වෝදය වගකිව යුත්තන් සහභාගි කරවා ගෙන ඔවුන්ගේ සහාය ද ලබා ගෙන අලුත් අලුත් දේට බැසීම මගේ ස්වභාවයයි.

1980 ගණන්වල මැද වන විට සර්වෝදය ප්‍රගතිය දුටු බොහෝ දෙනා ඔවුන්ට පෞද්ගලිකව සහාය විය හැකි සමාජ සංවර්ධනයට ප්‍රයෝජනවත්, විවිධ ක්ෂෙත්‍රයන් සඳහා මගේ සහාය පැතූහ. මේ සෑම දෙයක් සඳහාම මුදල් අවශ්‍ය විය. එහෙත් විවිධ ව්‍යාපෘති සඳහා සංගමයට ලැබෙන මුදල් ඒවාට බාහිරව යෙදීමට අපට නීතියෙන් ඉඩක් නොතිබිණ. මේ නිසා මට දෙයාකාරයකට ඒ සඳහා මුදල් සෙවීමට සිදුවිණ. එක් ආකාරයක් නම් සංගමයේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක වැය ශීර්ෂය යටතේ මේ නව නිර්මාණයන් පර්යේෂණයන් සඳහා මුදල් ලබා ගැනීමය. අනිත් ආකාරය වූයේ මා පෞද්ගලිකව ලිපි ලේඛන ලියාදීමෙන් දේශන පැවැත්වීමෙන් පොත්පත් පළ කිරීමෙන් ලබා ගත් ආදායමෙන් වැඩි කොටස සර්වෝදයේ වෙනම ගිණුමකට බැර කොට, මගේ තනි කැමැත්ත පරිදි ඒ මුදල් නව නිපැයුම් සඳහා යෙදවීමය.

පවුල් බරක් ඇති ගිහි ජීවිතයක් ගත කරන කිසිවෙක් මේ අන්දමට තමන් පෞද්ගලිකව උපයන දේ පොදුවේ සමාජ ප්‍රගතිය සඳහා ආයෝජනය කරන අවස්ථා විරලය. ඒ නිසා මා පෞද්ගලිකව උපයා ගත් දෙයින් බොහෝ දෙනෙකුගේ දුකේදී පිහිටවීමට මට හැකිවීම ගැන මම සතුටු වෙමි. එහෙත් එසේ ප්‍රයෝජනය ගන්නා ඇතැමුන් දුර්ජන වෙති.

'මේ එයාට කවුරුවත් නිකම් දෙන දේවල් නිසා අප ඔහුට කෘතවේදී වියයුතු නැත' යනු ඔවුන්ගේ අදහසයි

මේ අය අතර සමාජයේ සුප්‍රසිද්ධ ගිහි පැවිදි සැහෙන පිරිසක් ද සිටියහ. එහෙත් 'මා මගේය' යන මෝඩ අදහසෙන් මිදෙන්නට තැත් කරන අයෙකු හැටියට, මා එවැන්නන් දෙස බලන්නේ තරහ සිතින් නොව, උපේක්ඛාවෙනි. බොහෝ විට කළගුණ නොදත් අය ගැන සිතන විට, මා මට ම සිනාවී මෙසේ සිතමි' ''මෝඩයෝ ඇයි යමක් කරන්නේ ස්තුතියක්වත් බලා පොරොත්තුව...? ඒක හරියට පොලියට සල්ලි දෙනවා වගේ නේ?''

වරක් රැකියාව අහිමි වී සිටි මහාචාර්යවරයෙකුට, සාහිත්‍ය පර්යේෂණයකට හා ශබ්දකෝෂයක් නිර්මාණය කිරීමට ආධාර කරන්නැයි කරන ලද ඉල්ලීමකට මම මාස ගණනක් උදව් වීමි. එහෙත් මට රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසම (වනසුන්දර කොමිසමෙන්) චෝදනා එල්ල වන විට මගෙන් මේ ආධාරය ලද බව ලිඛිතව දීමටවත්, මේ මහැදුරු කරුණාවන්ත නොවීය. අදත් ඔවුන්ගේ ශාස්ත්‍රීය ලිපි ලේඛන පුවත්පත්වල දකින විට අන් අයට බණ කියනු, දොස් පවරනු දකින විට මම සිත යටින් සිනාසෙමි.

දිනක් මොරටුවැල්ල පැත්තේ වයසක කාන්තාවක් මා හමුවීමට පැමිණියාය. තමන්ගේ ස්වාමි පුරුෂයා මිය ගිය බවත් මිනී පෙට්ටිය ගැනීමට උදව් වන ලෙසත් ඕ අඬමින් කියා සිටියාය. ඒ කාලයේ මිනී පෙට්ටියක් රුපියල් තුන්සීයක් පමණ නිසා, එවේලේම මගේ අතින් එම මුදල දුනිමි. මාස කිහිපයකට පසු නැවතත් ඒ කාන්තාව එම කාරණයම කියා මා හමුවීමට පැමිණ, සැමියාගේ මිනී පෙට්ටියට මුදල් ඉල්ලා ගෙන ගියාය. මට මේ සිද්ධි දෙකම ඒ මොහොතේදීම අමතක විය. එහෙත් තුන්වැනි වරටත් තවත් මාස කිහිපයකට පසු ඒ කාන්තාවම පැමිණ මට කතා කරන විට, මගේ බිරිඳ ද එතැන සිටියාය. ඇය හඳුනා ගත් නීතා ඇගෙන් මෙසේ ඇසීය

''ඇයි ඔය බඳින, බඳින සැමියෝ ඔතරම් ඉක්මනට මැරෙන්නේ?'''

''අනේ නෝනා නැති-බැරි කමට නේ'

ලොකු, ලොකු අයත් මා රවටා තිබෙන බව සිහි කළ මම සිත යටින් නැවත සිනා සී ඇයට රුපියල් සියයක් දී පිටත් කර හැරියෙමි.

අජාන් සුලාක් සිවරාක්ෂ

ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ ආසියානු බෞද්ධ නායකයින් අතර සුලාක් සිවරාක්ෂ මහතා මට නිතර මුණගැසෙන ක්‍රියාකාරී බෞද්ධ නායකයෙකි. යුරෝපය හා ඇමෙරිකාව ඇතුළු රටවල පැවැත්වෙන බෞද්ධ, අන්තර් ආගමික සහ සාම සම්මේලනවලදී එතුමා මට නිතර මුණගැසේ. ඔහු ඉපදුනේ අදත් සියම නමින් හඳුන් වන තායිලන්තයේය. උපන් දිනය 1933 මාර්තු 27 වැනිදාය.

සුලාක් සිවරාක්ෂ මහතා සමඟ

ඔහුගේ මූලික අධ්‍යාපනය පන්සල ආශ්‍රිතව සහ කතෝලික පාසලකදී සිදු විය. 1953 සිට 1961 දක්වා එංගලන්තයේ වේල්ස් ප්‍රාන්තයේ ශාන්ත ඬේවිඩ් විද්‍යාලයේ ඉගෙන ගෙන ඔහු බී.ඒ. උපාධිය සමත් වීය. ඉන්පසු නීතිඥඋපාධිය හදාරා මිඩ්ල් ටෙම්පල්වල නීතිඥයෙක් හැටියට ඔහු සේවය කළේය. චන්ද්‍රා සොයිසා මහතා ද, විනිසුරු පී රාමචන්ද්‍රන් මහතා ද ඔහු සමඟ නීතිඥවෘත්තියට එහිදී එකතු වූ ශ්‍රී ලාංකිකයෝ වූහ. මා මුලින්ම සුලාක් සිවරාක්ෂ මහතා හඳුනා ගත්තේ චන්ද්‍රා ඝොයිසා මහතාගෙනි.

දෙවසරකට පසු තායිලන්තයට පැමිණි සුලාක් සිවරාක්ෂ මහතා විශ්ව විද්‍යාල මුද්‍රණාලය ආරම්භ කළේය. මේ කාලයේ තායිලන්තයේ පැවැතියේ ඒකාධිපති පාලනයකි. ඔහු සමාජ විද්‍යා සඟරාවක් පළ කිරීමට අවසර ලබා ගත්තේය. 1963 වන විට මේ ශාස්ත්‍රීය ප්‍රකාශනය දේශපාලන විග්‍රහයන් ඉදිරිපත් කරන සඟරාවක් බවට පත් විය. සුප්‍රසිද්ධ විශ්ව විද්‍යාල ආචාර්යවරයකු වූත්, තායිලන්ත මහ බැංකුවේ උප සභාපති වූත් ආචාර්ය පූවේ අගකෝයි මහතා සමඟ ඔහු ඉතා කිට්ටුවෙන් සම්බන්ධ විය. ඉතා අවංක පුද්ගලයෙක් වූ ආචාර්ය පූවේ එක් අවස්ථාවකදී රටෙන් පැන ගිය අතර නැවත තායිලන්ත මහ බැංකුවේ අධිපති හැටියට සියරට පැමිණි කෙනෙකි. හතරවැනි රාමා රජුගේ මුණුබුරෙක් වූ අග්‍රාමාත්‍ය සිත්ති සිපෝන් මහතාගේ බලපෑමට මේ කාලයේදී සුලාක් යටත් විය.

සුලාක් සිවරාක්ෂ මහතා සමඟ

සුලාක් එදා ඇන්දේත් අද අදින්නේත් තායිලන්ත ජාතික ඇඳුමයි. බස්තමක්ද කරේ එල්ලා ගෙන මල්ලකින් යුක්ත වූ ඔහුගේ ඇඳුම කොට සරුවාලයක්ද දණහිස දක්වා දික් වූ අත්දිග බැනියමකින් ද යුක්තය.

දිනක් අගමැති සිත්ති සිපෝන් ඔහුගේ කාර්යාලයට ගොඩ වැදුණේය. සුලක්, ''ඔබ සියමේ ගොවීන් ගැන දන්නේ කුමක්ද? ඔවුන් අතරට ගොස් තිබෙනවාද? ඔවුන්ගේ අසරණ තත්ත්වය ගැන ඔබ නොලියන්නේ ඇයි?'' මෙම සාකච්ඡාව සුලාක්ගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් මඟකට යොමු කළේය.

තායිලන්තය බෞද්ධ රටකි. බෞද්ධ දේශනාවේ සඳහන් වන සාධාරණත්වය, සාමය, බෙදාහදා ගැනීම, සාධාරණ නීතිරීති, මානව අයිතිවාසිකම්, දුප්පත්කම නැති කිරීම, සාමය ඇති කිරීම ආදී වූ අංග කෙරෙහිත් ඔහුගේ අවධානය යොමු වන්නට පටන් ගත්තේය. තායිලන්තය සහ වෙනත් දුප්පත් රටවල ආර්ථික දේශපාලනික තත්ත්වය කෙතෙක් දුරට ජාත්‍යන්තර ආර්ථික ව්‍යුහයන් සහ දේශපාලන බලපෑම් කොතෙක් දුරට වගකිව යුතු ද? මේවා වෙනස් කරන්නේ කෙසේ ද? අහිංසාවාදී එහෙත් විප්ලවීය ක්‍රියාකාරී බෞද්ධ මාර්ගයක් මේ සඳහා යොදා ගැනීමට නොහැකි ද? ශ්‍රේෂ්ඨ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් වූ බුද්ධදාස හිමිපාණන් වහන්සේ ද, තරුණ පයුත්තෝ හිමිපාණන් වහන්සේ ද වෙනත් ගිහි පැවිදි තායි නායකයෝ ද සමඟ කිට්ටු සම්බන්ධයක් ඇති කර ගත් සුලාක් බෞද්ධ ශිල්පීය ක්‍රම මාර්ගයෙන් පාලකයින්ටත්, පාලන ක්‍රමවලටත් ජාතික ජාත්‍යන්තර වශයෙන් සුළු පිරිසකට පමණක් වරප්‍රසාද භුක්තිවිඳීමට ඉඩ සැලසී ඇති සියලුම ව්‍යුහයන්ට අභියෝග කරන්නට විය. කෙළවරක් නැති නඩුහබවලට ඔහු පැටළුනු අතර අනේක වාරයක් සිරගෙයි ලගින්නට ද උසාවි යන්නට ද සිදු විය.

ආචාර්ය සුලාක් සිවරාක්ෂ මහතා ජාත්‍යන්තර වශයෙන් බෞද්ධ ධර්මය පදනම් කර ගෙන තමාගේ ජන්ම භූමිය වූ සියම හෙවත් තායිලන්තයේත් සමස්ත ලෝක ප්‍රජාවේත් අහිංසාවාදී මූලික වෙනසක් ඇති කොට වඩා යහපත් සමාජයක් ගොඩනැංවීමට මාර්ගෝපදේශකයෙක් වශයෙන් ක්‍රියා කරයි.

මේ සඳහා දනට 20 වසරකට පෙර ඔහු ආරම්භ කළ International Network of Engaged Buddhists (INEB) ක්‍රියාකාරී බෞද්ධයන්ගේ ජාත්‍යන්තර ජාලය නැමැති සංවිධානය අද විශාල ප්‍රසිද්ධියක් මෙන්ම පිළිගැනීමක් ද ලබා තිබේ. එහි ප්‍රධාන අනුශාසක ගරු දලයි ලාමාතුමාය. සාමාජික වශයෙන් ක්‍රියාකාරී වන බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු, සික් ආදී ආගමිකයන් සමඟ මෙන්ම ආගමක් නොමැති අය සමඟ ද ආධ්‍යාත්මික සහෝදරත්වයක් ඇති කළයුතු බව ඔහු විශ්වාස කරයි. මහත්මා ගාන්ධිතුමා ප්‍රකාශ කළ

පරිදි 'ඔබ කරන දේට විරුද්ධවාදියෙක් මුණගැසුණු විට දයාවෙන් ඔහු දිනා ගැනීමට ඔබ සමත් විය යුතුය' යන අවවාදය ඔහු නිතරම සිහිපත් කරයි.

ඔහු විසින් ආරම්භ කළ තවත් ආයතනයක් නම් අධ්‍යාපනයේ ජීවය Spirit in Education Movement (SEM) නැමැති සංසදයයි. නොබෙල් ත්‍යාගලාභී ඩෝ අවුන්ග් සාන් සූකයි මහත්මිය (Daw Aung San Sukyi) නිවාස අඩස්සියෙන් නිදහස් කර බුරුමයේ හමුදා රජය විසුරුවා හැර බුරුමයේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට ආචාර්ය සුලාක් සිවරාක්ෂ ලොව පුරා විශාල ජනමතයක් ඇති කළේය. එමෙන්ම 50 වසරකට පෙර බලෙන් ටිබෙටයට ඇතුළු වී ටිබෙටය හමුදා බලයෙන් යටත් කර ගෙන සිටින චීනය වහාම නොබෙල් ත්‍යාගලාභී දලයි ලාමා තුමාට නැවත ටිබෙටයට පැමිණීමට නිදහස දී ටිබෙටයේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළයුතුය යන සටන ද ඔහු ජාත්‍යන්තර වශයෙන් මෙහෙයවයි.

මේ කරුණු නිසා සුලාක් සිවරාක්ෂට ලොව පුරා ඔහුගේ ඍජු අදහස් ගරු කරන විශාල ජනතාවක් සිටින අතර ඔහුට විරුද්ධ වන ප්‍රබල රාජ්‍යයන් ද සිටිති.

සුලාක් මගේ ඉතා කුළුපග මිතුරෙකු වන අතර සියමේත් ලංකාවේත් ලෝකයේ වෙනත් රටවලත් අප දෙදෙනා එකතුව අපේ අහිංසාවාදී විප්ලවීය අදහස් ව්‍යාප්ත කිරීමට එකතු වී ඇත්තෙමු.

ළඟකදී සුලාක් කෙරෙහි මගේ තිබූ විශ්වාසය පළුදු වූ බව සඳහන් නොකළහොත් එය මා කරන වරදක් යැයි සිතමි. ඔහුගේ සීඩ්ස් ඔෆ් පීස් නැමැති සඟරාවේ මා කිසිසේත් නොදන සිටි සිද්ධියකට මගේ නම ද ගාවා තිබිණි. ඒ පිළිබඳ විමසා මා යැවූ ලිපියකට ඔහු පිළිතුරු දීමෙන් මඟ හැරියේ මන්දැයි මට සිතා ගත නොහැකිය. එහෙත් ඔහුගේ රටටත් බෞද්ධ සමාජයටත් කරන ලද සේවය මම සදා අගයමි.

222

ඇමෙරිකාවේ මර්ට් මේසන් පවුල

අසූතුන වර්ෂය ආරම්භ වෙත්ම මා සූදානම්ව සිටියේ දිගු ගමනක් යාමටය. 1983 පෙබරවාරි මාසයේ 25 වැනිදා කටුනායක ගුවන් තොටුපළින් පිටත් වී ඇමෙරිකාවේ සති පහකුත් කැනඩාවේ සතියකුත් පිලිපීනයේ තවත් දින හතකුත් වශයෙන් ගත කර හොංකොං හරහා ආපසු ඒමට යෙදුනු එම සංචාරය විවිධාකාර අත්දැකීම් සම්භාරයක් අත්පත් කර දුන් අමතක නොවන සිද්ධීන් රැසකින් යුත් එකකි.

මා ඇමෙරිකාවට ගියේ එහි අර්කැන්සාස් (Arkansas) ප්‍රාන්තයේ පවත්වනු ලැබූ ජාත්‍යන්තර ප්‍රජා නායකත්ව සම්මන්ත්‍රණයට (International Community leadership Project) සහභාගිවීමට නියමිතව තිබූ නිසාය. ටොන් ඩිවයිල්ඩ් ද ඒ දිනවල ඇමෙරිකාවේ ම සිටි නිසා මට අවශ්‍ය විදියට ගුවන් ගමන් සකස් කර ගැනීමට පහසුවක් විය. කොළඹ, වොෂින්ටන්, මොන්ට්‍රියල්, ඔටාවා, ලොස්ඇන්ජලීස්, හවායි, මැනිලා සහ කොළඹ යන අයුරින් මගේ ගමන යොදා ගතිමි.

අර්කන්සාස් සම්මන්ත්‍රණය යනු, ප්‍රජා නායකයින් පුහුණු කිරීමේ ඇමෙරිකාවේ ජාත්‍යන්තර වැඩ සටහනකි. ඇමෙරිකාවේ ජාත්‍යන්තර සංවර්ධන සභාවෙහි ව්‍යාපෘතියක් වන මෙය සංවිධානය කරන ලද්දේ ඇමෙරිකා-කැනඩා විශ්වදාන වැඩ සටහන වෙනුවෙනි. කැනඩාව, කින්යාව, ඉන්දියාව, පේරු, කොලොම්බියාව හා ශ්‍රී ලංකාවෙන් මාද ඇතුළුව රටවල් තිස්පහකින් පැමිණි ප්‍රජානායකයින් එහි පැමිණ සහභාගි වූහ. ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ නේදන් ග්‍රේ (Nathan Gray) මහතාය. ඔක්ස්ෆෑම් ආයතනයේ නිර්මාතෘවරයෙක් වූ ග්‍රේ මහතා බොස්ටන්හි අධ්‍යාපන හා සන්නිවේදන මධ්‍යස්ථානයේද අධ්‍යක්ෂතුමාය.

මම අර්කන්සාස් බලා පිටත් වූයේ ඇන්ඩි මේසන් සමඟය. මගේ සමීප මිත්‍රයින් වූ මර්ට් සහ ඇබී මේසන් යුවල ඔහුගේ දෙමාපියන්ය. මා ඔහුට ආමන්ත්‍රණය කළේ ඇන්ඩි මල්ලී යනුවෙනි. ඇන්ඩි මල්ලී එදා මා සමඟ ඇමෙරිකාවට යාමට එක්වී සිටියේ අපේ රටේ සර්වෝදයේ අවුරුදු එකහමාරක් සේවය කර ආපසු ගම රට බලා යන්නය. සති ගණන් ඇමෙරිකාවේ ගත කළ කාලයේදී මගේ තනි නොතනියට හැම විටම මගේ ළඟින් සිටි ඇන්ඩි මට ඉතා ආදරයෙන් සැලකුවේය.

ඇමෙරිකාවේ මේසන් පවුලේ සාමාජිකයෝ

ස්විට්සර්ලන්තයේ සූරිච් නගරයේ උඩුගුවනේ අඩි 40000 ක් පමණ ඉහළින් එයාර් ලංකා UL 513 ගුවන් යානයේ අපි ගමන් ගතිමු. ඇන්ඩි මල්ලී මට මුලින්ම මුණගැසුණේ ඇමෙරිකාවේ මැසචුසෙට්ස් හි කේම්බ්‍රිජ් නගරයේ පිහිටි මහාචාර්ය රූත් මෝගන්තව් මැතිනියගේ නිවසේදීය. ඔහු ඇයගේ බ්‍රැන්ඩයිස් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙකි. වරක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමට සිදු වූ විට හාවඩ් වෛද්‍ය මධ්‍යස්ථානය වෙත රියෙන් මා කැඳවා ගෙන ගියේ ඇන්ඩිය. ඒ දිනවල යන්තම් අවුරුදු 20 ක් පමණ වී සිටි

ඇන්ඩිට විශ්ව විද්‍යාලයේ පළමුවන උපාධිය නිමවා සර්වෝදය සමඟ සේවය කිරීමට පැමිණෙන ලෙස මම ඇරයුම් කළෙමි. ඔහු ලංකාවට පැමිණියේ ඒ අනුවය.

සර්වෝදයට පැමිණ වැඩ කළ ඔහු ඉතා ටික දිනකින් කාගේත් සිත් දිනා ගත්තේය. සිහින් සිරුරක්, රැලි ගැසුනු හිසකෙස්,

ඈබී සහ මර්ටි මේසන් යුවල සමඟ

දිගටි වූ ලාමක මුහුණක් ඇති ඇන්ඩිගේ සුරතල් සිනහවෙන් ඕනෑම කෙනෙක් වශී වන සුළුය. ටික දිනකින් ඔහු සිංහල ඉගෙන ගත්තා පමණක් නොව පවුල් හමුවලදී ලස්සනට සිංහලෙන් කතා කිරීමට දක්ෂයෙක් විය. ක්ෂේත්‍රයෙහි වැඩිපුර ගැවසුණු ඔහු එහි විවිධ තැන්වල අත්දැකීම් ලබා ගැනීමට සමත් විය. ඇමෙරිකාවේ ශ්‍රී ලංකා විදේශීය පදනම හා සර්වෝදය ඒකාබද්ධව ක්‍රියාත්මක වූ දෙනියායේ ඉදිගහහේන සංවර්ධන යෝජනා ක්‍රමයේ ඔහු වසරක් පමණ සේවය කළේය.

දම්සක් මන්දිර පවුල්හමු ශාලාවේ මගේ දේශනයකට සවන් දෙමින්

1985 දෙසැම්බර් මස මුල හරියේ රාජකාරී කිහිපයක් සඳහා යුරෝපයට ගිය මෙම අවස්ථාවේදී මර්ටි සහ ඇබී මේසන් යුවල හා ඔවුන්ගේ පුත් ඇන්ඩි මේසන් සමඟ ගත කළ කාල පරිච්ඡේදයත් බිල් මැක්ලීන් හා තවත් පැරණි මිතුරන් සමඟ ලැබූ ඇසුර ප්‍රීතියත් සතුටත් දනවන්නකි. මේසන් පවුල හා බිල් මැක්ලන්ලා සැමදා මගේ මතකය තුළ ජීවත් වන හිත මිතුරන්ය.

මා ඇමෙරිකාවට ගිය විට වැඩි කාලයක් නැවතීමට පුරුදුව සිටියේ මේසන් පවුලේ නිවසේය. හැම විටම මම සුපුරුදු විදියට එහි පහත මාලයේ ලැගුම් ගනිමි.

මේසන්ලාගේ නිවස පිහිටියේ නිව්යෝර්ක් නගරයේ සිට මිනිත්තු 45 ක් පමණ දුරින් පිහිටි හෙස්ටින්ග්ස් ඔන් හඩ්සන් (Hastings on Hudson) නගරයේය. මෙවර ඇමෙරිකාවට ගිය විට ද 1985 දෙසැම්බර් 18 දින ඇන්ඩි සමඟ සවස් භාගයේ ඔවුන්ගේ ගෙදරට ගියෙමි. මගේ ගමන් බිමන්වලදී හැම විටම මේසන් පවුලේ අය මට සහාය වූහ. මට තනි නොතනියට කවුරුන් හෝ මා සමඟ ආවේය. අවශ්‍ය තැන්වලට මා ගෙනත් ඇරලීය.

මා එහි නැවතී සිටින විට මට දැනුනේ තමන්ගේම ගෙදරක් හැටියටය. මට හොඳට පුරුදු යට මාලයේ පුංචි කාමරයේ ඉදිරියෙන් ඉඩ පහසුකම් ඇති සාලයක් හා නිදන කාමරයක් සහ වැසිකිළි හා නාන කාමරයද ඇත. අඩි 12 ක් පමණ පළල වීදුරු දොරවල් තුළින් පෙනෙන්නේ යාර 50 ක් පමණ ඈතට විහිදී ඇති ලොකු ගස් පිරිවරා ගත් බෑවුම් සහිත තණබිමකි. නිවස අසලම තිබෙන ගස ඉදිරිපිට ඉස්තෝප්පුවේ ජපන් කලාවට නිර්මාණය කරන ලද බුදු පිළිමයකි.

මෙවර මා රටින් පිටවී සිටින්නේ දිගු කාලයකට නොවේ දැයි මම කල්පනාවට වැටුනේ මේ නිවසේ තනියෙන් සිටින විටකදීය. මෙම ප්‍රශ්නය ඇත්තෙන්ම බොහෝ විට මගෙන්ම අසා ගන්නා එකකි. විශේෂයෙන් ගෙයින් එළියටවත් බසින්නට බැරි, ජලය මිදෙන අධික සීතලක් පවතින හිටි හැටියේ හිම වැස්සෙන් වැසී යන දේශගුණයක් ඇති මෙවැනි කාලයක මා මෙහි පැමිණියේ ඇයි දැයි යන හැඟීම මතුවේ. පාළුව තනිකම නිසා මෙවැනි හැඟීම් ඇති වුවද නිව්යෝර්ක් නගරයේ ශාන්ත ජෝන් කැතීඩ්‍රල් හිද, එංගලන්තයේ ඔක්ස්ෆෑම් හිද, ජනවාරි මැද සීඩා ආයතනයේ ද පැවැත්වීමට යන දේශන සඳහා මා මෙහි පැමිණි බැව් මට සිහිවේ. මගේ සියළු වියහියදම් දරනු ලැබුවේ ද එම ආයතන මගිනි. සති දහයක් පමණ ගෙදරින් පිටව සිටීම ද අපහසු දෙයකි.

දේශන පැවැත්වීමට අමතරව මෙම ගමන් බිමන්වලින් ලබා ගත හැකි වූ වැදගත් ප්‍රයෝජන දෙස බැලූ විට මේවා සිදුවිය යුතුම දේවල්ය. සර්වෝදයට අවශ්‍ය ආධාර උපකාර සෙවීමත්, විවිධ රටවල සර්වෝදය කණ්ඩායම් අලුතින් ඇති කිරීමත් මෙම සංචාරයන්ගෙන් ලැබුණ ප්‍රධාන ඵල ප්‍රයෝජනයන්ය. මේ සියල්ලටම අමතරව ව්‍යාපාරය සම්බන්ධයෙන් යම් යම් වෙනත් හේතු සාදක ද තිබේ. මා නැතිව මේ ව්‍යාපාරය ගෙන යෑමට මෙහි සිටින අයට බාරදීම ද හේතුවකි.

සර්වෝදයට අකමැති අයවළුන් විසින් ප්‍රකාශ කර ඇති දෙයක් නම් සර්වෝදය තනි මිනිසෙක් වටා ගොඩනැඟී තිබෙන

ව්‍යාපාරයක් බවය. මා නොමැතිව ව්‍යාපාරයට පැවැතිය නොහැකි බව ඔව්හු කියා සිටිති. අපේ සමහර වගකිවයුතු සේවක සේවිකාවන් විසින් තම වගකීම් හරිහැටි ඉටු නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙනුයි මෙවැනි වැරදි අදහස් මිනිසුන් තුළ ඇති වී තිබෙන්නේ.

පිටරටවල සංචාරයන්හිදී තනිකම පාළුව මට දැනුනු තවත් අවස්ථා මගේ මතකයේ ඇත. ගිය ඔක්තෝම්බරයේ ජපානයට ගොස් පිලිපීනයට ගිය අවස්ථාවේදී ලොකු පුතා වින්යා මැනිලාවල තනිකර දමා එන විට මට ඇති වූ තනිකම පාළුව වචනයෙන් කිව නොහැකිය. වින්යා සමඟ පිලිපීනයේ ගත කළ එම දින දහය තුළ කෙතරම් නිල කටයුතුවල යෙදුන ද මට ලොකු සැහැල්ලුවක් හා විවේකයක් දැනුනු දින කිහිපයකි. වින්යා ඕනෑම පියෙකුට ආඩම්බර විය හැකි පුතෙකි. ඔහු කීකරුය. බුද්ධිමත්ය. වගකීමෙන් යුතුය. හරි වැරදි තෝරා බේරා ගෙන කාගේත් සිත් දිනා ගෙන කටයුතු කරන්නට දනී. ගෙවී ගිය අවුරුදු තුනහමාර මෙන්ම ඉදිරි අවුරුදු තුනහමාර ද සාර්ථකව ගත කොට වෛද්‍යවරයෙකු ලෙස සමත් වී වින්යා සිය රට පැමිණෙන දිනය තරම් සතුටු විය හැකි වෙනත් දිනයක් ඇත්දැයි එදා මම කල්පනා කළෙමි.

දෙසැම්බර් අග හරියේදී මම බොස්ටන්වල සිට අමරා නංගී බැලීමට ෆ්ලොරිඩාවට ආ සැටිත් අද වගේ මතකය. බොස්ටන්හි ලෝගන් ගුවන් තොටුපළේ සිට ඇට්ලන්ටාවලට පැය දෙකක්ද නැවතත් ගේන්ස්විල්වලට එහි සිට පැයක් ද ගත වූ ගුවන් ගමන් දෙකකින් මම ඇය බැලීමට ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලයට ගියෙමි. මා සමඟ මගේ මිත්‍ර වෛද්‍ය ඩැනියෙල් සුසොට් මහතාද සිටි අතර අමරා නංගී සමඟ එම සතිය ගත කර ආපසු හැරුණේ හිතේ කාන්සියෙනි. පාළුවෙනි. නංගී සමඟ රංජිත් හා ආනන්ද අප ආපසු යන විට ගුවන් තොටුපළට අප හැරලීමට පැමිණියහ. මා ගුවන් යානයට නැඟීමට යන විට අමරා ඇඬුවාය. නැවත වීදුරුවෙන් පිටුපස බැලූ විට අඬමින් මා ගුවන් යානයට නඟින තුරු බලා සිටියාය.

තම මව්බිමින් සැතපුම් 13000 ක් පමණ ඈත සිටින ඇයට මා සමග සතියක් ගත කිරීමට සැලැස්වීම ඇයගේ විශාල පාළුවක් මැකීමට උදව්වීමකි. මා විවිධ තැන්වලට ගෙන යාමට කුලී රියක් ද ගෙන තිබුණු අමරාට ආනන්ද හා



ලොකු පුතා විජ්යා

රංජිත් ඒ සඳහා හොඳ ශක්තියකි. පවුලේ අයගෙන් ඈත්ව වෙසෙන විට තනිකම පාළුව කාටත් දැනෙන්නේ එක විදියටය. අපේ පවුලේ හය දෙනාගෙන් එවැනි විදේශ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනයක් ලැබීමට අවස්ථාව ලැබුණේ අමරාට පමණි. උපාධියක් වෙනුවට ෆුල්බ්‍රයිඩ් ශිෂ්‍යත් - වයක් මගින් ඇය විශේෂ අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම ගැන මම සතුටු වෙමි. මානසික ආබාධ වලින් පෙළෙන ළමයින් ගේ අධ්‍යාපන ක්‍රම ඇය ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලයේ සිට හැදෑරුවාය.



අමරා නංගී සමග

* * *

මර්ට් මේසන්ගේ ඇරයුමෙන් 1988 ජූලි 30 සිට
අගෝස්තු 8 දින දක්වා කළ නිව්යෝර්ක් චාරිකාව

මර්ට් සහ ඇබී මේසන් යුවළගේ ඇරයුම අනුව මම දැන් නිව්යෝර්ක් බලා ගමන් කරමින් සිටිමි. සවස 7.15 ට පමණ ගුවන් ගත වූ KLM ගුවන් යානය දැන් කරච්චිය බලා පියාසර කරයි. මගේ ගමනේ අරමුණ මර්ට්ගේ උපන්දින උළෙලට සහභාගි වී ඒ වෙනුවෙන් සර්වෝදය සඳහා ආධාර සෙවීමේ ප්‍රයත්නයට උදව් වීමයි. මෙය දිග ගමනකි. හෙට උදේ 6.00 ඇම්ස්ටර්ඩෑම්වලට පැමිණ නැවත දවල් එහි සිට නිව්යෝර්ක් බලා යන්නෙමි.

ඇම්ස්ටර්ඩෑම්වලට එනතුරු මා සමඟ නීතිඥ දයා වෙත්තසිංහ මහතා ද ගමන් කළේය. ඔහු ටොරොන්ටෝවලට යයි. පැය හතක් පමණ ඇම්ස්ටර්ඩෑම් ගුවන් තොටුපළේ ගත කොට නිව්යෝර්ක්වලට පැමිණෙන KLM ගුවන් යානයට 12.30 ට පමණ ගොඩවීමි. පැය අටක පමණ ගමනකින් පසු නිව්යෝර්ක් JFK ගුවන් තොටුපළට රාත්‍රී 8.15 ට පමණ ළගා වීමි. විශාල සෙනඟක් සිටි නිසා මර්ට් සහ ඇබී මා ළඟම සිටියත් සොයා ගැනීමට පැය තුනක් පමණ ගත විය. රාත්‍රී හෙස්ටින්ග්ස් ඔන් හඩ්සන් නගරයේ පිහිටි මර්ට්ගේ නිවසට ළඟා වීමි.

අද උදේ වරුව මර්ට් සහ ඇබී සමඟ ගත කළෙමි. නීතාට දුරකතනයෙන් කතා කළෙමි. චාරිකාට කතා කළමුත් කවුරුවත් ගෙදර සිටියේ නැත. නොවීබ්වලට කතා කොට රොබට්ට මා 15 වනදා එන විස්තර දුනිමි. ලූසීටද කතා කළෙමි. අද උදේ වරුවම ගත වූයේ ඉදිරි දින කිහිපයේ වැඩ සටහන සූදානම් කර ගැනීමටය. අද පස්වරුවේ රොකෆෙලර් ආයතනයේ සභාපති පීටර් ගෝල්ඩ්මාක් සහ හෙලන් කෙලර් ආයතනයේ සූසන් ඊස්ට්මන් සහ වෛද්‍ය ලැරී කැම්බල් මුණ ගැසීමට යොදා ගතිමි. ෆ්රෑන්ක් මිල්ස්පව් ද අප මුණගැසෙනු ඇත.

පස්වරු 2.30 ට ඇවනියු ඔෆ් ඇමෙරිකාස්වල පිහිටි රොකෆෙලර් පදනමේ මූලස්ථානයට මර්ට් සහ මම ගියෙමු. ෆ්රෑන්ක්

මිල්ස්පච් ද පැමිණ සිටියේය. රොකෆෙලර් පදනමේ නව සභාපති පීටර් ගෝල්ඩ්මාක් මහතා ම පැමිණ අපව ඔහුගේ කාමරයට කැඳවා ගෙන ගියේය. ඔහු වැඩ බාර ගෙන සති දෙකකට වඩා නැත. මීට කලින් වරක් මට ඔහු මුණගැසී තිබේ. එකල ඔහු නිව්යෝර්ක් වරායේ සභාපති හැටියට වැඩ කළේය. පීටර් හීන්දෑරිය. උසය. වයස 45 ක් පමණ ඇත. මිත්‍රශීලීය. කලින් මට මුණගැසුණු මේ පදනමේ අය මෙන් ආඩම්බර නැත.

පැය එකහමාරක් පමණ ඔහු හා සාකච්ඡා කළෙමි. රොකෆෙලර් පදනම නව මඟක් ගතයුතු බව ප්‍රකාශ කළෙමි. ඔහුගේ අදහස වූයේ ප්‍රජා සංවර්ධන කටයුතු න්‍යෂ්ටික අවිහරණය සමඟ සම්බන්ධ කිරීමට දියුණු රටවල ප්‍රජාවන් සමඟ දුප්පත් රටවල ප්‍රජාවන් එකතු කිරීම ගැනයි. අපේ ණය වැඩ පිළිවෙල, මූලස්ථානය සහ ඉහළ සේවකයන්ගේ නඩත්තුව ගැන මම කතා කළෙමි. මා අත තිබූ පත්‍රිකා හා සාහිත්‍යය ද දුනිමි. එයින් යම් පටන් ගැන්මක් වේ යැයි සිතමි.

හෙලන් කෙලර් ආයතනයට ගොස් සූසන් ඊස්ට්මන්, ලැරී කැම්බල් සහ ජෙෆ් ද මුණගැසීමි.

අමෙරිකා එක්සත් ජනපදයේ ළමාරක්ෂක අරමුදලේ මූලස්ථානයට අද උදේ දහයට මර්ටි සමඟ යමි. එහි ලංකා ශාඛාවේ වැඩබලන අධ්‍යක්ෂවරයා මයිකල් ගිබන්ස් මට ගිය සතියේ මොරටුවේදී හමු විය. ඔහු හා බිරිඳ දවසම අප හා ගත කළේය. අප සමඟ එක්ව වැඩ කිරීමට ඔවුන් කැමැත්ත දක්වන බව පෙනේ. ඩේවිඩ් ක්ලොසිනියස් නැමැති ආසියා වැඩ සටහන් උප අධ්‍යක්ෂවරයා මා හා ටෙලිපෝනයෙන් කතා කොට අද වැඩ සටහන යොදා ගත්තේය.

දවල් 11.05 ට මර්ටි හා මම වෙස්ට්පෝට්වලට ගියෙමු. සභාපති ජිම් බෝෂ්ඩ්, උප සභාපති ෆ්ලිස් ඩොබින්ස්, ස්ටීව් සිමර්මාන් සහ ඩේවිඩ් ක්ලොසිනියස් සමඟ දීර්ඝ වශයෙන් අප ආයතන දෙක එකට එකතු වී වැඩ කරන්නේ කෙසේ දැයි සාකච්ඡා

කළෙමු. ලුසී සහ කුඩා ආරි ද දවල් 1.30 ට අප හා එකතු වූහ. අපි සියළු දෙනාම ළඟ පිහිටි භෝජනාගාරයකට ගොස් ආහාර ගතිමු.

සවස ආපසු පැමිණ මම අලුත් කන්නාඩි කුට්ටමක් ගැනීම සඳහා ඇස් පරීක්ෂා කරවා ගතිමි. ඩොලර් 209 ක් පමණ මෙයට වියදම් විය.

අද දවස ගත වූයේ මේසන් නිවසේ සිට සැතපුම් 90 ක් ඈත පිටිහි ඔවුන්ගේ ගැමි නිවසට ගොස් ලබන සෙනසුරාදා එහි පැවැත්වෙන රැස්වීමට ගෙය හා වත්ත සූදානම් දැයි බැලීමටය.

උදේ 6.00 ට මර්ටි හා මම ලාගුවාඩ්යා ගුවන් තොටුපළට ගියෙමු. ඊස්ටන් ෂටල් එකෙන් බොස්ටන්වලට ගියෙමු. පළමුව ඔක්ස්ෆෑම්වලට ගොස් ජෝල් චානි මුණගැසීමි. සර්වෝදය ඔක්ස්ෆෑම් සහයෝගය ගැන කතා කළෙමු. පසුව Eqnal Exchange ජොනතන් රොසන්හොල්, මයිකල් රොසිකා සහ රින්ක් ස්කින්සන් මුණ ගැසීමි. මේ තරුණයන් දෙදෙනා දුප්පත් රටවල නිෂ්පාදන ඇමෙරිකාවට ගෙන්වා නිෂ්පාදකයන්ට වැඩි ආදායමක් ලබාදීමේ මහඟු සේවයක් අරඹා තිබේ. මුලින්ම සර්වෝදය තේ සහ නිකරාගුවාවේ කෝපි විකිණීම අරඹා තිබේ.

රූත් මෝගන්තව් සේරා රෝඩ් දිවයිනේ සිට මා දැකීමට පැමිණියහ. ඇය කොංග්‍රෙසයට රෝඩ් දිවයිනෙන් තරඟ කරන්නීය. මොවුන් නම් මගේ පෙර ආත්මයේ නෑදෑයන්ය. මට දක්වන ආදරය ගෞරවය නිම් හිම් නැත. මට දිවා ආහාරය ලබාදී නැවත ඔව්හු ආපසු ගියහ.

කලින් ඔක්ස්ෆෑම්වල විධායක අධ්‍යක්ෂව සිටි ජෝ ෂෝට් ඊළඟට හමුවීමි. එරිකා හා පුතා සිටියේ නැත. සවස නැවත මිනිත්තු හතළිස් පහක ගුවන් ගමනකින් පසු නිව්යෝර්ක් ලාගුවාඩ්යා ගුවන් තොටුපළට අපි සවස 4.00 ට පමණ ආපසු ආවෙමු.

රාත්‍රියේ ෆෝරම් නැමැති රැස්වීමකට ගියෙමු.

අද උදේ නීතාට මම ටෙලිපෝනයෙන් කතා කළෙමි. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ට මැග්සයිසයි ත්‍යාගය ලැබීම ගැන අසා අතිශය සන්තෝෂයට පත්වීමි. මෙය මට ලැබුණු පෞද්ගලික ජයග්‍රහණයක් හැටියට සලකමි. සරත්චන්ද්‍රයන්ගේ ජීවිතයේ සැඳෑසමයේ ඔහු මා සමඟ එකතුවීම පෙර පිනකි. ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් ආත්මාර්ථකාමී මිනිසුන්ට මැදි වී සිටීම නිසා ඔහුගේ වටිනාකම සැඟවී තිබිණ. ඔහු ළඟට ගොස් සර්වෝදයට කැඳවා ගැනීමත් මැග්සයිසයි ත්‍යාගය සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමත් මට මහත් සතුටක් ගෙන දෙන්නකි. මේ අවස්ථාවේ හැටියට මෙය ඔහුට ලොකු සහනයකි. අප ව්‍යාපාරයටද ඉමහත් ගෞරවයකි.

සරත්චන්ද්‍රයන් නිහතමානී සාහිත්‍යකරුවෙකි. ස්වශක්තියෙන් නැඟී සිටි සාමාන්‍ය පවුලකින් මතු වුණු කලා කරුවෙකි. ඔහුගේ සාර්ථකත්වය ඔහු දේශීයත්වයෙන් බැහැර කළේ නැත. මනමේ නාට්‍යයෙන් ප්‍රසිද්ධියට පත් ඔහුගේ නාට්‍ය කලාව රට පුරා නාට්‍ය කලා පුනර්ජීවයකට මග පෑදුවේය. ඔහුට ලැබුණු මේ සම්මානය ගැන මුළු රටම ප්‍රීතිවනවාට සැකයෙක් නැත. ඔහුට ටෙලිෆෝන් කළ මුත් ගෙදර සිටින බවක් නොපෙනේ.

එදිරිවීර සරත්චන්ද්‍ර යුවල සමඟ

ඇබී මේසන් සමඟ ගෙමිදුලේ

හෙට පැවැත්වෙන මර්ට්ගේ උපන් දින උළෙල පැවැත්වෙන්නේ ඔහුගේ ගැමි නිවසේය. පැය දෙකහමාරක් පමණ රිය පදවා ගෙන අපි එහි ආමු. ආ විගසම මහාචාර්ය එදිරිවීරයන්ට ටෙලිෆෝන් කළෙමි. ඔහුට සුභ පැතීමි. ඔහු ඉතා සතුටින් සිටින බව පෙනේ. ගමනට අවශ්‍ය උපදෙස් ද දුනිමි.

මේ නිවස තිබෙන්නේ නිව්යෝර්ක් ප්‍රාන්තයේ හද්ද පිටිසර තැනකය. එහෙත් නගරයක තිබෙන විදුලිය, පාරවල්, ජලනල, ටෙලිෆෝන් ආදී සියල්ල තිබෙන නිසා නොදියුණු යැයි කිව නොහැක. ගෙවල් දොරවල් අඩුවීම, කඩ සාප්පු, තට්ටු මන්දිර විශාල වශයෙන් යාන වාහන නැතිවීම පමණකි වෙනස. ඉතා ලස්සන නිශ්චල පෙදෙසකි. සැතැපුම් ගණන් ඈතට හැම පැත්තෙන්ම වනයෙන් පිරුණු කඳු හෙල් දිස්වේ.

මේ නිවස ද පිහිටියේ අක්කර අනූවක පමණ පෙදෙසක් වට වූ භූමියකය. මෙය අවුරුදු දෙසීයකට වඩා පැරැණි නිවසක් බව කියනු ලැබේ. වරින් වර පිළිසකර කර ඇත. දැනුත් කරනු ලබයි. මෙහි ඉහළ මාලයේ ඇන්ඩිගේ කාමරයේ මම නිදා ගතිමි. ඊළඟ කාමර දෙකේ රිබෙකා හා ඇයගේ මිතුරාත්, ඇබී සහ මර්ට් නිදා ගනිති.

මර්ට් ඇබී මේසන් යුවල සමඟ නීතා

අද දවල් දොළහේ සිට ජේම්ස් යෙන් ආචාර්යතුමා ඇතුළු අමුත්තෝ පැමිණෙනු ඇත. මට ද කතා කිරීමට තිබේ. යෙන් සහ මා ප්‍රධාන අමුත්තෝය. මේ මර්ට්ගේ පණස්නව වැනි (59) උපන් දින උළෙලයි. මෙහිදී සර්වෝදයට සහ ජාත්‍යන්තර ග්‍රාම සංවර්ධන ආයතනයට ආධාර එකතු කෙරෙයි. උපන් දින ත්‍යාග වෙනුවට මුදලින් පරිත්‍යාග ලැබේ.

අමුත්තන්ගේ පැමිණීම ඇරඹිණි. ආචාර්ය ජේම්ස් යෙන්, ඔහුගේ දියණිය, මිනිපිරිය ඇතුළු පිරිස ද 12.00 වන විට පැමිණියහ. හැමදෙනාම ඔවුනොවුන්ගේ ආහාර ද වෙනත් අය හා බෙදා ගැනීමට අමතර ආහාර ද රැගෙන ආහ. සුදු සහ කහ වහලෙන් යුත් විශාල කූඩාරම් දෙකක් ඉදි කර තිබේ. එහි පුටු හාරසීයක් පමණ ද මේස ද සූදානම් කර තිබේ. ගේ ඉදිරිපස තිබෙන පොකුණේ බොහෝ දෙනෙක් පිහිනති. විවිධ ක්‍රීඩාවල ද යෙදෙති. මා දන්නා හඳුනන අය බොහෝ දෙනෙක් පැමිණියහ.

ඩග්ලස් ගුණවර්ධන, ඔහුගේ බෑනා ඒකනායක සහ බර්නාඩ් නැමැති මහතෙක් ද පැමිණ සිටියහ. සියල්ලන්ම ආහාර ගත් පසු පස්වරු 1.00 ට පමණ රැස්වීම ඇරඹිණි. මුලින්ම කතා කළේ මර්ට්

මේසන්ය. ඔහු හැම දෙනාම පිළිගනිමින් කතා කළේය. ඇන්ඩි මේසන් හා ඩොරිස් ඉන්දුනීසියාවේ සිට එවූ ලිපියක් ද කියෙව්වේය. ඊළඟට දේශනය මට බාර විය.

ආචාර්ය ජේම්ස් යෙන් ගැනත් මේසන් පවුල ගැනත් කතාව අරඹා සර්වෝදය ව්‍යාපාරය, ලෝක සාමය හා සංවර්ධනය ගැන කතා කළෙමි. මට සුපුරුදු පරිදි කිසිදු සූදානමක් නැතිව කතා කළත් හැමදෙනාම නැගිට නොනවත්වා අත්පොළසන් නාදය දීමෙන් එය සාර්ථක වූ බව මට හැඟිණි.

ජේම්ස් යෙන් කතා කරන විට අවුරුදු 96 ක පුද්ගලයෙකු බව ඔහුට මෙන්ම අසන්නන්ට ද අමතක වේ. පැයක් පමණ ඔහුගේ ජීවිත අත්දැකීම් අළලා කතාවක් කළේය.

ග්ලින්, ජැකලින් සහ මම

රාත්‍රී 9.00 පමණ වන තුරු අමුත්තන් සමඟ කතා කළෙමු. අපි නින්දට යන විට රෑ 11.00 ට පමණ ඇත. හැමෝටම හොඳටම වෙහෙස දැනී හමාරය.

මර්ට්, ඇබී, ලැරී සහ ජේන් පමණක් මා සමඟ මෙහි ඉතිරි විය. උත්සවයට ගෙන ආ සියලු ආම්පන්න ගෙන යන තුරු ද මේ ස්ථානය තිබුණු අන්දමට නැවත පිරිසිදු කිරීම මේ හතරදෙනා විසින් කරන ලදහ. මම ද උදව්වීමි.

පසුදින අප ගෙදර එන විට රාත්‍රී 8.00 ට පමණ ඇත. නීතාට ද ටෙලිෆෝන් කළෙමි. ජැකලින් සහ ග්ලින් ද ටෙලිෆෝන් කළහ. ජනවාරියේ ඔවුන් ලංකාවට පැමිණ රැකියා උපදවන ගෑම් කර්මාන්ත ඇරැඹීමට ඔව්හු පොරොන්දු වූහ. පසුගිය දෙවසර තුළ ඔවුන්ගේ ව්‍යාපාර ඉතා දියුණු වූ බව ග්ලින් පැවසුවාය.

අද උදේ වරුව ගෙදර ගත කොට ආපසු යෑමට සූදානම් විය. ඈබීගෙන් සමුගත් මම මර්ටි සමඟ ගුවන් තොටුපළට ආමි. මේ දෙදෙනා නම් මගේ පෙර ජාතියක සහෝදරයන් වන්නට ඇත. එතරම් දයාවක් ඔව්හු මට දක්වති. සවස 5.45 ට පිටත් වන KLM යානයට නැඟීමට සූදානමින් මම ව්‍යාපාර පන්තියේ නවාතැන් කාමරයේ විවේක ගතිමි. මේ ජේ. ඇෆ්. කෙනඩි ගුවන් තොටුපළයි.

අර්කැන්සාස් ප්‍රජා නායකත්ව සමුළුව

අර්කැන්සාස් සම්මන්ත්‍රණය ප්‍රජා නායකයින් පුහුණු කිරීමේ ජාත්‍යන්තර වැඩ සටහනකි. සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය පිහිටියේ අර්කන්සාස් ප්‍රාන්තයේ ලිට්ල්රොක් නගරයෙන් සැතපුම් හැටක් පමණ ඔබ්බෙහි පිහිටි වින්ට්‍රොෆ් රොකෆෙලර් ආයතනයේය. වොෂින්ටන් ගුවන් තොටුපළින් ගොඩබැස්ස ඇන්ඩි සහ මම මෙම්ප්‍රිස් නැමැති කුඩා නගරයේදී (ජනගහණය 1427) දිවා ආහාරය ගෙන පැය කිහිපයක් එහි ගත කිරීමෙන් පසු සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයට පැමිණියෙමු. මෙම්ප්‍රිස් කළු ජාතිකයින්ගේ නගරයකි. නගරාධිපතිවරයා වයසින් මුහුකුරා ගිය ඉතා ඥානවන්ත කළු ජාතිකයෙකි. මෙම ප්‍රදේශය තුළ දක්නට තිබෙන්නේ ඇමෙරිකාව පිළිබඳ ලෝකයේ ප්‍රසිද්ධ වී ඇති ලෙස සමෘද්ධිමත් බව නොවේ. එහි අනිත් පැත්තය. දිළිඳු බවය. නගරාධිපතිවරයාගේ නායකත්වයෙන් සමාජ සාධාරණත්වය සඳහා ඔවුන් විසින් ගෙන යනු ලබන ජලාපවහන දියුණු කිරීමේ, නිවාස අලුත්වැඩියා කිරීමේ, නව ගොඩනැගිලි ඉදිකිරීමේ හා පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති අපට දැක ගැනීමට ලැබුණි.

ප්‍රජා නායකත්ව සම්මන්ත්‍රණය සඳහා අනුග්‍රහය ලබා දී තිබුණේ අර්කැන්සාස් ප්‍රජා පදනම් ආයතනය, සාගිනි නිවීමේ ව්‍යාපාරය, ඔක්ස්ෆෑම් ඇමෙරිකා සහ සේව් ද චිල්රන්ස් සංවිධානය හා පෞද්ගලික පරිත්‍යාගයන්ය.

මෙම ව්‍යාපෘතිය මුලින්ම සංවිධානය කිරීමට මුල පුරා ඇත්තේ ඇමෙරිකාවේ ඔක්ස්ෆෑම් ආයතනය ආරම්භ කළ නේදන් ග්‍රේ මහතාය. ඔහු තවමත් වයස තිස් ගණන් නොඉක්ම වූ තරුණ විවාහකයෙකි. හීන්දෑරිය. උසය. පැත්තට පීරන ලද කෙස් කළඹක් හා නිතරම සිනහවෙන් පිරි මුහුණක් ඔහු සතු විය. සාධාරණත්වය හා සාමය පිළිබඳව යම් වෙනසක් ඇති කිරීමට නම් ප්‍රජා මට්ටමේ නායකත්වයක් ඇති කිරීමේ වැදගත්කම ඔහු අවබෝධ කර

ගත්තේය. මා ඇතුළු මෙම ව්‍යාපෘතියට පැමිණි තවත් කිහිප දෙනෙකු ගැනම ඔහු මීට කලින් අසා ඇත. එම අදහස ඔහු විසින් මුලින්ම පවසා ඇත්තේ ආර්ථික සංවර්ධනයේ සීමාවන් නැමැති රෝම සමාජයට සුප්‍රසිද්ධ පොතක් ලියූ ඩෙනා මෙඩෝස් සමඟය. මේ දෙපළ විසින් වසරක් පමණ කාලයක් තිස්සේ එය සංවිධානය කර ගෙන යද්දී සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ මුල් තැනක් ගෙන කටයුතු කළ, පසුව සාම හමුදාවේ අධ්‍යක්ෂවරිය හැටියට ක්‍රියා කළ මේරි කිංග් මහත්මිය ද ඒ හා එකතු වූවාය. එම නිසා මෙම ව්‍යාපෘතියේ සංවිධායක මඩුල්ල වූයේ මේ තිදෙනාය. විවිධ ආයතනයන් හා පුද්ගලයින් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ කර ගැනීමට සංවිධායක මඩුල්ල වර්ෂ දෙකහමාරක් පුරා මහන්සි වී ඇත. ඉහත සඳහන් කර ඇති ආයතන සම්බන්ධ කර ගෙන තිබෙන්නේ කැඳවන්නන් හැටියටය. නමුත් ඔක්ස්ෆෑම් ආයතනය පසු බැස තිබුණි. එය කණගාටුදායක සිද්ධියකි. සමුළුවට පැමිණ සිටි නියෝජිතයන්ගෙන් විදේශිකයින් මා ද ඇතුළුව දහහත් දෙනෙකි. ඇමෙරිකාවෙන් ප්‍රජා නායකයින් පහලොස් දෙනෙක් විය. මේ ගමනේදී අද දක්වාම ආශ්‍රය කරන බංගලිදේශ් නායකයින් කිහිප දෙනෙක්ම මුණගැසුනු අතර ෆස්ලේ හසන් අබඩ් ද එක් අයෙක් විය. ෆස්ලේ අබඩ් අවුරුදු 42 ක් පමණ වූ තරුණයෙකි. මිටි වූ කුඩා සිරුරක් ඇති ඔහු වත්මන් බංගලාදේශ් ජනාධිපතිතුමාගේ නෑදෑයෙකි. එහෙත් ඔහු එම බලය පාවිච්චි නොකරන්නෙකි.

එංගලන්තයේ අධ්‍යාපනය ලැබීමට තම දෙමව්පියන්ගෙන් උරුමකම් ලත් අබඩ් 1962 දී බ්‍රිතාන්‍යයේ පුරවැසිභාවය ද ලබා ගත්තේය. ලන්ඩන් ආර්ථික විද්‍යාලයේ ඉගෙන ගත් ඔහු පසුව ගණකාධිකාරීවරයෙක් ලෙස ජිනීවාහි ෂෙල් සමාගමක වැඩ කළේය. ඔහු මරිආටා නම් වූ කාන්තාවක් විවාහ කර ගෙන සිටියේය. කැනඩාවේ මැක්මාස්ටර් විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා උපාධියක් ද ඔහු ලබා ගත්තේය. 1969 දී ෂෙල් තෙල් සමාගමේ උසස් නිලයක් දරූ ඔහු බංගලිදේශයේ චිතගොන් නගරයේ ෂෙල් කාර්යාලයට අනුයුක්ත කොට තිබුණේය. 1970 නොවැම්බර් මාසයේදී ඇති වූ සුළි සුලඟත් සමඟ තුන්ලක්ෂයත් පන්ලක්ෂයත් අතර පිරිසක් ජීවිතක්ෂයට පත්වීම නිසා අබඩ් විශාල

කම්පනයකට පත් වීය. ඊට පසු ඇති වූ විමුක්ති අරගලයෙන් ජනතාවගේ අඛණ්ඩ දුක්ඛිත ජීවිතයත් දුටු අබඩ් ෂෙල් සමාගමින් අස්වී 'බංගලිදේශ ග්‍රාමීය ක්‍රියාකාරී කමිටුව' බ්‍රැක් (BRAC) නැමැති ආයතනය පිහිටුවීය. ආරම්භයේදී ගම් ප්‍රමාණයක සීමිත අංශවල පමණක් සේවයේ යෙදුන ද පසුව ගම් දෙසීයක පමණ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන කටයුතුවල යෙදුණේය. විදේශීය ආයතන රැසකින්ම උදව් ලබා ගත් ඔහු ආර්ථික අංශයට බරව ඉතා දක්ෂ ලෙස මෙම ආයතනය ගොඩනැගුවේය. ආධ්‍යාත්මික අංශයට බර වූ නැතත් ඉඩම් අහිමිව සිටින අය පමණක් තෝරා එම්.ඒ.උපාධිධාරීන් 1500 ක් පමණ යොදවා ඔහු විසින් විශාල ව්‍යාපාරයක් මෙහෙයවනු ලැබේ. අවුරුදු දෙක තුනකට ඉහතදී ඔහු මැග්සයිසයි සම්මානය හිමි කර ගත්තේය.

සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ ලෙස අවධාරණය කර තිබුණේ නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා නායකත්වය තුළින් ළමුන් පිළිබඳ ගැටළු, සෞඛ්‍යය, අධ්‍යාපනය, කෘෂිකර්මය යන සියලුම අංශවලට බලපානු ලබන ප්‍රශ්නවලට විසඳුම් සොයා ප්‍රගතියක් ඇති කිරීමය. එමගින් දිළිඳුකම, කුසගින්න ඉවත් කිරීමය. එබැවින් ලෝකයේ රටවල ප්‍රජා නායකයින් වැඩි කර විශ්ව ජාලයක් නිර්මාණය කර එමගින් අන්‍යොන්‍ය සබඳතා වර්ධනය කිරීමේ අරමුණ මත මෙම සම්මන්ත්‍රණයේ වැඩ සටහන් සම්පාදනය කර තිබුණි.

අර්කන්සාස් යනු ඇමෙරිකාවේ ඉතා දිළිඳු ප්‍රාන්තයකි. එහි වෙසෙන ජනතාවගේ ගැටළු විසඳා ගැනීමට මෙම ව්‍යාපෘතියෙන් ආධාර ලබා ගැනීමට හැකි වේ යයි ද අපේක්ෂා කරනු ලැබීය. එම ප්‍රාන්තයේ ජනතාවගේ නිෂ්පාදනයන් වන කෘෂිකාර්මික භාණ්ඩ සුළු ප්‍රමාණයක් පිටරට යැවීම සිදු වෙතත් ඔවුහු ඉතා අඩු ආදායම් ලබන්නෝය. මෙම ව්‍යාපෘතිය නිසා දිළින්දන්ගේ දුක් සුසුම්වලට අවසානයක් උදා වේය යන්න හැමදෙනා තුළම හොල්මන් කළ

සිතුවිල්ලය. නිව්යෝර්ක්වල ඇම්ස්ටර්ඩෑම් නිවුස්, නිව් අර්කන්සාස් ටයිම්ස් (Amsterdam News, Arakansas Times) ආදී ඇමෙරිකාවේ ප්‍රධාන පුවත්පත්වල ඒ දිනවල මෙම ව්‍යාපෘතියේ විස්තර පළ කර තිබුණි. සමහරු එයට කීවේ 'දිළින්දන්ගේ සමුළුව' කියාය. තවත් සංවිධායකයෙක් මෙම වැඩ සටහන ගැන වාර්තා කර තිබුණේ මට පෙනෙන්නේ මෙහි 'විවිධාකාර ගාන්ධිලා' සිටින බවයි. ඒ කියන්නේ සමහරුන් ගාන්ධි චරිතය ඇති අය වීමයි යනුවෙනි.

සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය මා විසින් පැවැත්විය යුතුව තිබුණෙන් නියමිත වේලාවේදී මම එය සාර්ථකව ඉටු කළෙමි. මාතෘකාව වූයේ 'සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය සහ ගැමි සංවර්ධනය' යන්නය. පසුව ඇමෙරිකානු ජනාධිපති වූ ගවනර් බිල් ක්ලින්ටන් මහතා ද ඇට්ලන්ටාවේ නගරාධිපති ආචාර්ය ඇන්ඩෲ යං මහතා ද සභාව ඇමතුහ. අර්කැන්සාස්වල පැවැත්වූ විවිධ සාකච්ඡාවන්ට ලෝකයේ බොහෝ රටවලින් පැමිණ සිටි නියෝජිතයින් අතර, සර්වෝදය ව්‍යාපාරය, සමාජ සේවාවන්, ප්‍රජානායකත්ව වැඩ සටහන් පිළිබඳව පුළුල් විමර්ශනයක් සිදු කරනු ලැබීය. අපගේ විශිෂ්ඨ සේවාවන්ට ගෞරව කිරීමක් ලෙස අර්කැන්සාස් සංචාරකයා (Arkanas Traveller) යන විශේෂිත නාමය මා වෙත එහිදී ප්‍රදානය කරනු ලැබීය. වැඩ සටහනෙහි පූර්ණ කාලය සති තුනක් විය. අර්කන්සාස්වල පිහිටි වින්රොක් ජාත්‍යන්තර පශු පර්යේෂණ පුහුණු ආයතනය හා තවත් සංවර්ධන ව්‍යාපෘති නැරඹීමට අපට අවස්ථාව ලැබුණ අතර ඉන්පසු නිව්යෝර්ක් නගරයට ගොස් එහි නාගරික සංවර්ධන ආයතනයත් බොස්ටන්, වොෂින්ටන්, ඩලාස් හූස්ටන් යන නගරවල ද සංචාරය කිරීමට සංවිධානය කර තිබුණි. එම ප්‍රදේශවල ප්‍රජා නායකයින් හා නගරවාසීන් හමු වී අදහස් හුවමාරු කර ගැනීමටත් එම පිරිස් සමඟ සාකච්ඡා, වැඩමුළු ආදියට සහභාගිවීමටත් අපට අවස්ථාව උදා විය.

මා බොස්ටන්වල සිටියදී එහි ඔක්ස්ෆෑම් ආයතනයේ අධ්‍යක්ෂ ජෝ ෂෝට්, මයික් ස්කොට් ආදී පිරිස මුණගැසුනහ. සියලු දෙනාම එකට දිවා ආහාරය ගත් අනතුරුව රැත් මෝගන්තව් හා හෙන්රි මෝගන්තව් දෙපළගේ ආරාධනය පරිදි සන්ධ්‍යාවේදී මම ඔවුන්ගේ

නිවසට ගියෙමි. එහිදි රාත්‍රී ආහාරය ගැනීමෙන් පසු නිදා ගතිමි. රූත් මෝගන්තව් මහත්මිය මා ලෝගන් ගුවන් තොටුපළට ඇරලූයේ එහිදී මුණගැසුණු නේදන් ග්‍රේ මහතාට මා බාර දෙමිනි. නේදන් සමඟ පිටත් වූ මම ඩෙල්ටා යානයකින් ඇට්ලන්ටාවලටත් එහි සිට තවත් ගුවන් යානයකින් ලිට්ල්රොක්වලටත් පැය තුනහමාරකින් පමණ පැමිණියෙමි.

ලිට්ල්රොක් නගරයේ මම රාත්‍රී දෙකක් ගත කළෙමි. මා නතර වූයේ ඉතා කරුණාවන්ත යුවළක් වූ ෆ්‍රැන්ක් සහ ජීන් මෝගන් නම් වූ අයගේ ලස්සන නිවසෙහිය. තනිකර ස්වාභාවික කළු ගලින් නිම වූ එම නිවස සොබා දහමත් සමඟ ගැලපෙන විදියට සාදා ඇත. ලිට්ල්රොක්වලදී මා ඇතුළු විවිධ රටවලින් පැමිණි ප්‍රජා නායකයින් 17 දෙනා හා ඇාමරිකාවෙන් පැමිණි 15 දෙනා නැවත එක්වීමු. මෙය ද පුංචි සම්මන්ත්‍රණයකි. එය සංවිධානය කළේ නේදන් ග්‍රේ, ඩේනා මෙඩොස් හා මේරි කිං හා ඊට උදව් වූ වින්ඩොෆ් ආයතනයේ සභාපති ටොම් මැක්රේ ද විසිනි. ඒ හැමදෙනා සමඟ මම ද රූපවාහිනී හා පුවත්පත් සාකච්ඡාවකට සහභාගි වීමි.

උතුරු ඇමෙරිකාවේ මා ගත කළ අන්තිම දින දෙක ද ඉතා වැදගත් සිදුවීම් සහිතය. කලපු ප්‍රදේශයේ බෞද්ධ සාම සහෝදරත්වය සහ කලපු පෙදෙස් දහම් පදනම යන ආයතන දෙක මගින් මගේ දෙදින චාරිකාව සංවිධානය කර තිබුණි. ජැමී සහ ජේන් බරාස් යුවලත් ජොආනා මේසිත් මේ සංවිධානයේ මූලිකත්වය ගෙන කටයුතු කළ අයය.

ජැමී සහ ජේන් අපේ සර්වෝදය මූලස්ථානයට පැමිණි බෞද්ධ යුවලකි. ජොආනා මේසි වසරක් සර්වෝදයේ ගත කොට ධර්මය හා සංවර්ධනය නැමැති අගනා ග්‍රන්ථය ලියූ බෞද්ධ කාන්තාවකි. අපේ ආගමන විගමන නිලධාරීන්ගේ මෝඩ තීරණයක් හේතු කොට ගෙන ඇය ලංකාවේ ගත කළ අවසාන සතිය ලැජ්ජා සහගත එකක් විය. ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් නිසා මේ වරද හරි ගැස්සවිය හැකි විය. මට

සැන්ප්‍රැන්සිස්කෝවලට ඒමට ඇරැයුම් කළේ මෙම දෙපලය. මම ඇමෙරිකාවේ සිටි කාලයේදී ජොආනාගේ පොතට හොඳ අලෙවියක් ලැබී තිබුණි.

මේ දින දෙකහමාර තුළ වැදගත් සේවාවන් රැසක් ඉටු කළෙමි. ඊයේ රාත්‍රියේ මගේ දේශනය පැවැත්වූයේ පළමුවන යුනිටේරියන් පල්ලියේය. තුන්සීයකට අධික පිරිසක් එහි පැමිණ සිටිහය. මගේ පැරැණි මිතුරන් වූ ආසියා පදනමේ සිටි රිචඩ් හෙන්ඩ්‍රික්සන් සහ මැතිනියත් ෂර්ලි මහේර් නංගීත් එහි වූහ. ෂර්ලිගේ මව ඊට පෙර දින පැමිණ මා හමුවී ඩොලර් පන්සීයක පරිත්‍යාගයක් මට දුන්නේය. ඒ මුදල මාතර දිස්ත්‍රික්කයේ ගමක් සෑදීමට යෙදවීමි. මගේ දේශනය අවසානයේදී කලපු ප්‍රදේශයේ සර්වෝදය ශ්‍රමදාන සමිති පිහිටුවීමට හැමදෙනාම කැමැත්ත පළ කළහ.

ආපදා පැමිණියවුන්ට පංචවිධ සංවර්ධන ක්‍රමයක්

1983 කළු ජූලියෙන් පසු සාමාන්‍ය සිවිල් ජනතාව, ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක් වීම දිනපතා වාගේ සිදු විය. එම නිසා මේ තත්ත්වයට මුහුණ දීමට විශේෂ ඒකකයක් නිර්මාණය කිරීමට මම කල්පනා කර, ඒ සඳහා විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගතිමි. මේ ඒකකය අප නම් කළේ '5ආර්' (5R) අංශය යනුවෙනි. මේ 5ආර් (5R) පංචවිධ වැඩ පිළිවෙල නම්;

පීඩාවට පත් ජනතාව උදෙසා වහාම අවශ්‍ය සහන සේවා සැලසීම හෙවත් (Relief) කටයුතු පළමු R වශයෙන් ද

විපතට පත් ජනතාවට ආත්ම ගෞරවයෙන් යුතුව ජීවත් වීම සඳහා ඔවුන්ගේ ජීවිත යළි ගොඩනැඟීමේ මානසික මෙන්ම භෞතික වශයෙන් ද පුනරුත්ථාපන ක්‍රියාදාමයකට ඔවුන් සහභාගි කරවා ගැනීම හෙවත් (Rehabilitation) කටයුතු දෙවන R වශයෙන් ද

මෙසේ සිදු කරන සහනසේවා සහ පුනරුත්ථාපන කටයුතු කිසිදු භේදයකින් තොරව එක සේ සැමදෙනා සඳහාම පොදුවේ ක්‍රියාත්මක කිරීමෙන් ආරම්භ වන ප්‍රතිසන්ධාන වැඩ පිළිවෙල හෙවත් (Reconciliation) තෙවැනි R වශයෙන් ද

විනාශ වූ නිවාස, පාඨශාලා, ප්‍රජා පහසුකම්, වැව්, වාරිමාර්ග, ප්‍රජා ජල යෝජනා ක්‍රම, සෞඛ්‍ය පහසුකම් ආදී වූ සියලු යටිතල පහසුකම් නැවත ඇති කිරීමෙන් රාජ්‍ය සැලසුම් යටතේ ඒවා ප්‍රතිසංස්කරණය කිරීම හෙවත් (Reconstruction) හතරවැනි R වශයෙන් සහ මෙසේ අසරණ වී ඇති මිනිසුන් නැවත ප්‍රජාවක් වශයෙන් එකතු වී

මනෝවිද්‍යාත්මක සහ ආධ්‍යාත්මික වැඩ සටහන් තුළින් සර්වෝදය සාමාන්‍ය ගමක තත්ත්වයට පත් වී විවිධ සංවර්ධන අවස්ථා පසු කර ග්‍රාමස්වරාජ්‍ය ප්‍රජාවක් බවට පත් කිරීම හෙවත් නැවත උදා කිරීම (Reawakening) පස්වැනි R වශයෙන් ද විග්‍රහ කොට අපි මේ වැඩ සටහන් පවත්වා ගෙන ගියෙමු. මෙය අතිශය සාර්ථක ක්‍රමයක් විය.

උතුරු පළාතේ කිලිනොච්චි යාපනය මන්නාරම සහ වව්නියාව දිස්ත්‍රික් මධ්‍යස්ථාන මාර්ගයෙන් ද නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය කන්තලේ මඩකලපුව කල්මුණේ සහ අම්පාර දිස්ත්‍රික් මධ්‍යස්ථාන මාර්ගයෙන් මෙම 5ආර් වැඩ සටහන අපේ උපරිම ශක්තිය යොදා දිගටම ක්‍රියාත්මක කළෙමු. මේ සඳහා අපට අත දුන් ආයතන අතර 'යූ.එන්.එච්.සී.ආර්' (UNHCR) ආයතනය, මහා බ්‍රිතාන්‍යයේ 'ඔක්ස්ෆෑම්' (OXFAM) ආයතනය, 'කෙයාර්' (CARE) ජාත්‍යන්තරය, 'යුනිසෙෆ්' (UNICEF) සංවිධානය, කැනඩාවේ ලෝක විශ්ව විද්‍යාල ආයතනය, (WORLD UNIVERSITY SERVICE OF CANADA) 'නොරාඩ්' (NORAD) ආයතනය, ඩෙන්මාර්කයේ සරණාගත මණ්ඩලය, (REFUGEE COUNCIL OF DENMARK) එක්සත් රාජධානියේ 'සේව් ද චිල්ඩ්‍රන්ඩ්' ආයතනය (SAVE THE CHILDREN), 'සීඩා' (CIDA) ආයතනය, 'යූ.එස්.ඒ.අයි.ඩී. (USAID) ආයතනය, 'හෙල්විටාස්' (HELVITAS) ආයතනය 'අයි.එල්.ඕ. (ILO) සංවිධානය, ජපානයේ 'එකම ලොවයි එකම ජනතාවයි. (OWOP) සංවිධානය, 'නිගාටා අපි නොකයි' ආයතනය 'ඉකෝ' ආයතනය 'රිසෝ-කෝසි-කායි' (RKK) ආයතනය, ලෝක ආහාර සංවිධානය (FAO), (AUSAID) සහ ජපන් රජය ගැන සඳහන් කළ යුතුය.

ක්‍රියාත්මක කළ වැඩ සටහන් අතර පහත සඳහන් වැඩ සටහන් මුල් තැනක් ගත්තේය.

* ආහාර ඇඳුම් නිවාස සහ මුලුතැන්ගේ උපකරණ ආදී අවශ්‍යතා සපුරාලීම
* ප්‍රජාව ශක්තිමත් කිරීම

* ළමයින්ගේ අධ්‍යාපනික කටයුතු
* මානසික ආබාධිත වූවන්ගේ අධ්‍යාපනයට උදව් කිරීම
* වෘත්තීය පුහුණුව
* පාරවල් ළිං වැව් ආදී යටිතල පහසුකම් සැලසීම
* ප්‍රජා සෞඛ්‍යය

* නිවාස, ආහාර පිළිබඳ සුරක්ෂිතතාවය
* ජලය සනීපාරක්ෂණය කෘෂිකර්මය වාරිමාර්ග පාරවල් සහ පාසල් ප්‍රතිසංස්කරණය කිරීම
* ව්‍යවසාය සංවර්ධනය සහ ණය පහසුකම්
* බිම් බෝම්බවලින් ආරක්ෂාවීම පිළිබඳ අධ්‍යාපනය
* වැන්දඹුවනට සහ බිම් බෝම්බවලින් විපතට පත් වූවනට විශේෂ ආධාර
* ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාවන් අතර අවබෝධය ඇති කිරීම

ආහාර පිළිබඳ සුරක්ෂිතභාවය

යටිතල පහසුකම්

ප්‍රජාව ශක්තිමත් කිරීම

අධ්‍යාපනය

පෙර පාසල් දරුවන් විසින් පැල සිටුවීම

මෙම පංචවිධ වැඩ සටහන ඉතාමත්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හොඳම අවස්ථාවක් අපට 2004 වසරේ දෙසැම්බර් මාසයේ සිදු වූ සුනාමි ව්‍යසනය ත් සමඟ උදා විය. සුනාමිය ආරම්භ වී පැය කිහිපයක් ඇතුලත එදා නිවාඩු දිනයක් වුවත් මූලස්ථානයේ කුඩා මෙහෙයුම් ඒකකයක් ආරම්භ කොට මුලින්ම සෑම දිස්ත්‍රික්කයකටම දුරකතනයෙන් කතා කොට සුනාමියෙන් විපතට පත් ප්‍රදේශ පිළිබඳව හැඟීමක් ඇති කර ගත්තෙමු. එමෙන්ම දකුණු පළාත, නැගෙනහිර පළාත සහ උතුරු පළාතේ විපතට පත් ගම්මාන අතර සර්වෝදයට සම්බන්ධව තිබූ ගම්මාන 223 ක් තෝරා ගැනීමට අපට හැකි විය. එම ගම්මාන දිස්ත්‍රික්ක අටක් පුරා විහිදී තිබුණි. පැය කිහිපයක් ඇතුලත සුනාමියට හසු නොවුනු දිස්ත්‍රික්ක ද හඳුනා ගතිමු. එම දිස්ත්‍රික්කවලට අප උපදෙස් දුන්නේ සහන සේවාවනට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය එකතු කර ගෙන ස්වේච්ඡා සේවකයන් 25 දෙනා බැගින් ගොස් සර්වෝදය ගම්මාන 223 කඳවුරු බැඳ ගෙන සේවාවන් ලෙසයි. සුනාමියේ පළමු දින අවසානවීමට පෙර අපේ ස්වේච්ඡා සේවකයින් ඔවුනට එකතු කර ගැනීමට හැකි වූ සියලුම

ජලය

ආහාර ද්‍රව්‍ය, බෙහෙත්, ඇඳුම් ආදී දේ රැගෙන එම ගම්වල කඳවුරු බැඳ ගත්හ. අප සිදු කරන සේවාවන් පිළිබඳව අන්තර් ජාලය මාර්ගයෙන් මහජනතාව දැනුවත් කළෙමු. අපට ඒ මගින් ලැබුණු සුළු සුළු ආධාරවලින් වුවත් විශාල සේවයක් කිරීමට හැකි විය. පෙරපාසල්, පාසල්, ප්‍රජාශාලා, සර්වෝදය මූල්‍ය කේන්ද්‍ර, නිවාස සංකීර්ණ, පැරණි ළිං ප්‍රතිසංස්කරණය කොට පිරිසිදු පානීය ජලය ලබාදීම පමණක් නොව සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළි ආදිය ගොඩ නැංවීම ද අප විසින් සිදු කළෙමු.

ලාගෝස්වත්ත ජනපදය වැනි සුනාමියෙන් අතරමං වූ ජනතාවට ගම්මාන ගොඩනැගුවෙමු. ලාගෝස්වත්තේ ආදර්ශ ගමක් පිහිටුවා ගම්නියම්ගම යන නාමය එයට දුන්නෙමු. ලංකාවේ නොයෙක් ස්ථානවල මේ අංශ පහම ක්‍රියාත්මක වන සේ වසර 4 ක පමණ කාලයක් අපි එම සේවයෙහි යෙදුනෙමු.

සුනාමියටත් වඩා ඛේද සහගත තත්ත්වයක් ඇති වූයේ උතුරු නැගෙනහිර මුදා ගැනීමේ මානුෂීය මෙහෙයුම නිම වී තුන්ලක්ෂයක් පමණ සරණාගතයින් වව්නියා දිස්ත්‍රික්කයේ රැඳවුම් කඳවුරුවලට

පැමිණීමය. රජය විසින් ඔවුන්ගේ සහන සේවා සහ පුනරුත්ථාපනය සඳහා විශාල වශයෙන් පියවර ගත් අතර සර්වෝදයේ ශක්ති ප්‍රමාණයෙන් එම කටයුතුවලට මෙම පංචවිධ වැඩ පිළිවෙල ඔස්සේ අදත් සහයෝගය දෙන්නෙමු.

රජය සහ වෙනත් සංවිධාන සර්වෝදය විසින් ආරම්භ කළ මෙම වැඩ පිළිවෙල ආදර්ශයට ගත් බවට කිසිම සැකයක් නැත. ඒ බව සනාථ වන හොඳම කාර්යය නම් අප විසින් හඳුන්වා දුන් 5 ආර් වදන් මාලාව අද සැමදෙනා භාවිතා කිරීමයි.

225

යුද ආපදාව සැනසුමක් නොවේ
උතුරේ ජනතා මෙහෙවර

අසූව දශකය මැද භාගය වන විට ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි පැන නැගී තිබුණු යුද ගැටීම් නිසා එම ප්‍රදේශවල ජන ජීවිත සම්පූර්ණයෙන්ම පාහේ ආකූල ව්‍යාකූල තත්ත්වයට පත් වී තිබිණ. එකල එම යුද ගැටීම් ජාතිවාදී කෝලාහලයක්, යුද්ධයක් බවට පරිවර්තනය වීමක් ලෙස සමහරු හැඳින් වූ අතර තව පිරිසක් එය විමුක්ති අරගලයක සමාරම්භයක් ලෙස ද තවත් පිරිසක් එය ත්‍රස්ත මර්දන ක්‍රියාවක් ලෙස ද හැඳින්වූහ. මේ අතර තවත් පිරිසක් කියා සිටියේ එය රාජ්‍ය ත්‍රස්තවාදයේ සමාරම්භයක් බවය.

කවර පදනමක් මත ගොඩනැගී තිබුණද, මෙම යුද ආපදාව උතුරු නැගෙනහිර ප්‍රදේශයටත් එහි වැසි ලක්ෂ සංඛ්‍යාත ජනතාවටත් ගෙන ආයේ සැනසුමක් නම් නොවේ. මහා විශාල ආපදාවකි. ඛේදජනක අත්දැකීම් සම්භාරයකි. ඒ තමා යුද්ධයේ සැබෑ ස්වරූපය විශේෂයෙන්ම එම ප්‍රදේශයන්හි ජීවත් වූ සිවිල්

යාපනය සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානය ඉදිරිපිට සේවක සේවිකාවන් සමඟ නීතා සහ මම

පුරවැසියන් ලක්ෂ සංඛ්‍යාත ජනතාවට උන්හිටි තැන් අහිමි වී, අවතැන් වී, ඒ අය සරණාගතයන්ගේ තත්ත්වයට පත්වී තිබීම විශාල ඛේදජනක තත්ත්වයක් ලෙස හඳුන්වා දිය හැකිය.

ඒ වන විට විපතට පත් එම ජනතාවට පිහිටවීමට නැතහොත් පිළිසරණක් වීමට එම ප්‍රදේශයන්හි ක්‍රියාත්මකව පැවැති එකම ස්වේච්ඡා සේවා සංවිධානය වී තිබුණේ සර්වෝදය ව්‍යාපාරයයි. මෙබඳු ජාතික ආපදා පැමිණි විට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව විශේෂ පුහුණුවක් ලබා සිටි උතුරේ සර්වෝදය ස්වේච්ඡා සේවක පිරිස් වහා ක්‍රියාත්මක වී අවතැන් වූ ඒ සහෝදර ජනතාවට අවශ්‍ය ආහාර සහ සෙසු අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සම්පාදනය කොට දෙමින් ද නිවෙස් අහිමි අයට තාවකාලික නවාතැන් පහසුකම් සලසමින් සහ රෝගාබාධයනට ගොදුරු වී සිටි අයට අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙමින් ද වඩාත් අසාධ්‍ය තත්ත්වයේ සිටි අය රෝහල්වලට ගෙන යමින් ද ඒ අය විශාල සේවාවක් සැලසූහ. ඒ අවධියේ රොයිටර් පුවත් සේවය මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන් ඔස්සේ මෙම යුද්ධයේ තොරතුරු ජගත් ප්‍රජාවට ප්‍රචාරය කරන අතරතුර, සර්වෝදය ව්‍යාපාරය මගින් සලසන මෙම සමාජ සුබසාධන කටයුතු පිළිබඳව ද ප්‍රශංසාභිමුඛව පුවත් ප්‍රචාරය කළ අයුරු තවමත් මගේ මතකයේ රැඳී පවතී.



කේ. තිරුණාවුකර්සු මහතා

ඒ අවධිය වන විට යාපනය අර්ධද්වීපය ශ්‍රී ලංකාවේ අධික ජනගහනයෙන් යුත් දිස්ත්‍රික්කවලින් එකක් ලෙස වාර්තා වී තිබිණ. එය ඡන්ද කොට්ඨාශ එකොළහකින් සමන්විතව පැවැති අතර, ජනගහනය 904552 කටත් වඩා අධික බව ද සඳහන් වී තිබිණ. එහි වාසය කළ ජනතාව අතරින් බහුතරය දෙමළ ජනතාව වූහ. සිංහල

සහ මුස්ලිම් ජන කොටස් සුළුතර ලෙස එහි ජීවත් වූහ. කෘෂිකර්මය සහ ධීවර කර්මාන්තය ඒ අයගේ ප්‍රධානතම ජීවනෝපායයන් වී තිබුණු අතර, සුළු පරිමාණයේ ගෘහ කර්මාන්ත වල නියැලි විශාල ජනතාවක් ද එහි වාසය කළහ. (දැනට අප සතුව ඇති එකල යාපනය දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා ලේඛනවලට අනුවල 80 දශකය වන විට එහි ධීවර පවුල් 23000 ක්ද කෘෂි කර්මාන්තයේ නියුක්ත පවුල් 38528 ක්ද බීඩි නිෂ්පාදනයේ නියුක්ත පවුල් 8000 ක්ද වූ බව සඳහන් වේ). එහෙත් 1984 දී රජය විසින් යාපනය දිස්ත්‍රික්කය ආරක්ෂිත කලාපයක් ලෙස නිවේදනය කිරීම හා සමඟම, තම ජීවනෝපායයන් පෙර පරිදි කර ගෙන යා නොහැකි වූයෙන්, එම ජනතාවට විශාල දුක් කම්කටොලු රාශියකට මුහුණ දෙන්නට සිදුවිණි.

තිරු මල්ලී සමඟ

වෛද්‍ය වෙට්ටිවේලි මහතාට අයිති පුංගුඩුතිව් රාසවින්තෝට්ටම් පාරේ අංක 22 දරණ ස්ථානයේ පිහිටි නිවසේ එකල යාපනය සර්වෝදය මධ්‍යස්ථානය පිහිටුවා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ සේවක ලෙස කේතිරුණාවකර්සු මහතා කටයුතු කළේය. භක්තිමත් හින්දු ලබ්ධිකයකු වූ ඔහු, එකල අප ව්‍යාපාරයටත් මටත් විශාල ගෞරවයක් සහ ආදර භක්තියක් දැක්වූ බව මට මතකය.

වරක් තමා අතින් සිදු වූ කිසියම් වරදක් ගැන සඳහන් කරමින් එයට කමාව යැද පාපොච්චාරණයක ස්වරූපයෙන් දීර්ඝ ලිපියක් ඔහු මා වෙත එවා තිබුණු අතර, මම එය කියවා බලා ඔහුගේ සංවේදී සිත නිවා සනසනු වස් වැරදීම මිනිස් ගතියක් බවත් එබඳු අවස්ථා උදා වූ විට එය ජීවිතයට ලැබුණු අලුත් අත්දැකීමක් ලෙස සලකා යළි එබඳු දෑ සිදු නොවීමට පියවර ගන්නා ලෙසත් දිගින් දිගට ඒ ගැන සිතමින් කනස්සලු නොවන ලෙසත් දන්වමින්, ඔහුට ලිපියක් යැවූ බව මට මතකය. ඒ දිනවල ඔහු මගෙන් ලබා ගත් භාවනා ක්‍රම පිළිබඳ පොතපත පරිශීලනය කොට භාවනා කටයුතුවල යෙදුණු බවත් එමෙන්ම හින්දු ආගමානුකූලව දේව ප්‍රසාදය ලබනු පිණිස ඔහු උදේ සවස නොකඩවා සර්වෝදයේ සෙසු පිරිස් ද සහභාගි කොට ගෙන යාපනයේ අප මධ්‍යස්ථානය වටා පාද යාත්‍රාවේ යෙදුණු බවත් මම දැන සිටියෙමි.

ඒ දිනවල උතුරු ප්‍රදේශයන්හි සංවර්ධන වැඩ කටයුතු සඳහා කිසිදු ආධාරක ආයතනයකින් සර්වෝදයට ආධාර මුදලක් ලැබුණේ නැත. උතුරේ අරඹා තිබූ සියලු ප්‍රජා සේවා සහ සේවක දීමනා ආදිය වෙනුවෙන් වැය කළේ පොදුවේ සර්වෝදය සේවා සඳහා යොදවන මුදලින් කොටසක් කළමනාකරණය කොට, සංගමය මගින් උතුරේ සේවක පිරිස් වෙතට ඒ මුදල් ප්‍රදානය කිරීමෙනි. මේ අවධියේදී ස්විට්සර්ලන්තයේ හෙල්විටාස් ආයතනයේ නියෝජිත පිරිසක් පැමිණ සර්වෝදය හා සම්බන්ධවීමේ යෝජනාවක් ඉදිරිපත් කළේය. මේ පිරිස අතර එහි විධායක අධ්‍යක්ෂ වර්නන් කුලින් මහතා ද විය. ඔවුන් සමඟ මම යාපනයේ සංචාරය කළෙමි. ඔවුන්ගේ නිවාස ප්‍රජාශාලා සහ ජලසම්පාදන යෝජනා ක්‍රම සඳහා යාපනයේ පුංගුඩුතිව් කෙරතිව් කිලිනොච්චි ආදී ස්ථාන තෝරා ගතිමු. දැනට එහි තිබෙන ගොඩනැගිලි ගොවිපළවල් ආදී සියල්ලටම උදව් වූයේ හෙල්විටාස් ආයතනයයි. ඒ සියල්ල බාරව කටයුතු කළේ තිරුණාවුකර්සු මල්ලීය.

1983 ජාතිවාදී කෝලාහලයෙන් පසු තිරු මල්ලී මූලස්ථානයට පැමිණීම අත්හිටු වීය. මා යාපනයට ගිය ගමන්වලදී ඔහු හමුවී මේ සිදු වූ විපතට ධනාත්මකව මුහුණ දීමේ අගය තේරුම්

කර දුනිමි. මේ අතර ඔහු වෙනමම සංවිධානයක් වශයෙන් ක්‍රියා කර ගෙන ගිය අතර, හෙල්විටාස් ආයතනය සමඟ කෙලින්ම සම්බන්ධවීමට ද, අප නොසිතූ විරූ ආකාරයේ යෝජනාවක් කර තිබුණි. එහෙත් හෙල්විටාස් ආයතනය ඊට එකඟ වූයේ නැත.

ඔහු යෝජනා කර තිබුණේ කිලිනොච්චියේ ක්‍රියාත්මක කෙරෙන සර්වෝදයේ සියලු වැඩ සටහන් සර්වෝදය පරිපාලනයෙන් මුදවා ඔවුනට බාර දිය යුතු බවය. මෙය අප විමතියට පත් කළ යෝජනාවක් බව සඳහන් කළ යුතු නැත. මෙබඳු අදහසක් තිරු මල්ලී තුළ මීට පෙර ඇති වී තිබුණේ නැත. ඔහු සර්වෝදය දර්ශනයටත්, එහි ප්‍රතිපත්තිවලට සහ සේවා කටයුතුවලටත් ඉතාම ඉහළින් ගෞරව කළ ඊට ඇලුම් කළ අපේ ක්‍රියාකාරිකයකු වීය. ඔහු හිටිවනම මෙබඳු පරිවර්තනයකට භාජනය වි ඇත්තේ කෙසේද? විශේෂයෙන්ම සර්වෝදයේ මූල්‍ය සම්පත් විශාල ලෙස යොදවා උතුරුකරයේ ජනතාවගේ යහපත සඳහාම සංවර්ධනය කළ අක්කර 13 කින් සමන්විත කිලිනොච්චි සර්වෝදය ගොවිපළ පවා ඔහු අතට බාර දිය යුතු යැයි ඔහු යෝජනා කොට තිබීම, අපගේ විමතියට පමණක් නොව කනස්සල්ලටද කාරණයක් වී තිබිණ.

හෙල්විටාස් ආයතනයේ විධායක අධ්‍යක්ෂ වර්නන් කුලින් මහතා ප්‍රධාන එහි නියෝජිත පිරිස, සර්වෝදය නියෝජිතයින් හා මම කිලිනොච්චිය ගොවිපලේ

මේ වන විට සර්වෝදය සංගමය විසින් බොහෝ දුක් විඳ වියදම් දරා ලබා ගත් උතුරේ දේපළ බොහොමයක් සර්වෝදයට විරුද්ධව නැඟී සිටි ඇතැම් කණ්ඩායම් බලහත්කාරයෙන් අත්පත් කොට ගෙන තිබිණ. ඒ කාලයේ යාපනය දිස්ත්‍රික්කය තුළ ප්‍රචණ්ඩ ක්‍රියා බහුලව ක්‍රියාත්මක වෙමින් තිබිණ. මේ නිසා මෙබඳු ආරංචි ලැබුණු විට 'ගිය දේ ගියාවේ' 'මේ කැළඹිලි තත්ත්වයන් පහ වී ගිය පසු අපි යළි ප්‍රදේශවාසීන් සමඟ එකමුතු වී පෙර පරිදිම කටයුතු කරමු' යැයි ඒ අයට උපදෙස් දෙන්නට මම පුරුදු වී සිටියෙමි. එහෙත් තිරු මල්ලී සර්වෝදයේ සියලු පරිපාලන කටයුතු කෙළින්ම හෙල්විටාස් ආයතනය සමඟ කරන බව දැනුම් දීමේ ලිපිය එවූ විට අප තුළ ඇති වූයේ විමතියකි.

තිරු මල්ලී උතුරේ අපට විරුද්ධ කිසියම් බලවේගයකට අවනත වී හෝ ඒ අයගේ තර්ජනයකට ගොදුරු වී මෙබඳු යෝජනාවක් කරනවාද? යන සාධාරණ සැකය ද අප තුළ ඇති වී තිබිණ.

අපි ඔහුට මූලස්ථානයට පැමිණ මේ පිළිබඳ සාකච්ඡාවකට සහභාගි වන්නැයි යෝජනා කළෙමු. එහෙත් ඔහු එයට ඇහුම්කන් දුන්නේ නැත. ඇහුම්කන් නොදුන්නා පමණක් නොව, එක දිගට පුරා වසර තුනක්ම මූලස්ථානයට පැමිණීමෙන් වැළකී සිටියේය.

මේ අතර තිරු මල්ලී පිළිබඳ අසුබ ආරංචි අපට යාපනයේ අපේ අසල්වාසීන් සහ හිතවතුන් මගින් ලැබෙන්නට පටන් ගෙන තිබිණ. සර්වෝදයේ දර්ශනයට සහ ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ සංවිධානයක් ඔහු වෙනම පිහිටුවා, සර්වෝදයට අයත් වැඩ සටහන් ද ඊට අනුගත කොට ඇත යන ආරංචිය ද අපට ලැබී තිබිණ. වරක් ඔහු සර්වෝදයේ සේවා කටයුතු දෝෂ දර්ශනයට ලක් කරමින් රෙඩ්බානා ආයතනයට යවා තිබූ ලිපියක පිටපතක් ද එම ආයතනයේ කිසිවෙකු විසින් අප වෙත එවා තිබිණ.

තත්ත්වය මෙසේ වුවද කරුණු කාරණා සාකච්ඡා කොට ආපසු ඔහු නිසි මඟට ගත හැකිය යන ස්ථාවරයේ සිටි අපි, නිරන්තරවම ඔහුට අප සමඟ මේ ගැටළු පිළිබඳව සාකච්ඡා කරන්නට එන්නැයි දිගින් දිගටම ආරාධනා කර සිටියෙමු. එහෙත් ඔහු ඒ ඉල්ලීම් ගණන් ගත්තේ නැත. ඔහුගේ දරදඬු සහ හිතුවක්කාර ගති අප තුළ ඇති කළේ බලවත් වේදනාවකි කලකිරීමකි. අවසානයේ අපි ඔහු සර්වෝදය සේවයෙන් ඉවත් කරන්නට තීරණය කොට ඔහුට ලිඛිතව ඒ බව දැනුම් දුනිමු. එසේ දැනුම් දී රජයේ ආයතනවලට ද,

කේ. කදිරමලේ මහතා

වෙනත් රාජ්‍ය නොවන සංවිධානවලට සහ අවශ්‍ය පුද්ගලයන්ට ද තිරුණාවුකර්සු මල්ලී තවදුරටත් සර්වෝදය සේවකයකු නොවන බවත්, ඔහුගේ කාර්ය කටයුතු අරබයා මින් ඉදිරියට සර්වෝදය වග නොකියන බවත් දන්වා සිටියෙමු.

මේ අනුව 1985 දෙසැම්බර් 01 වැනි දින සිට යාපනය දිස්ත්‍රික් නියමු සේවක ලෙස කේ. කදිරමලේ මහතා පත් කර ගනු ලැබිණ. එම තනතුරෙහි කාර්ය භාරයන්ට

සිවසුබ්‍රමනියම් මහතා (මනියම්) සමඟ

අමතරව යාපනය මන්නාරම මුලතිව් කිලිනොච්චි සහ වව්නියා යන ප්‍රදේශයන්හි ක්ෂෙත්‍ර අධ්‍යක්ෂ ලෙස ද ඔහුට සේවය කරන ලෙස සංගමය දැනුම් දී තිබිණ.

ඒ අතර කිලිනොච්චි ගොවිපළේ පාලනය එහි සියලු දේපළ සමඟ කිලිනොච්චි සම්බන්ධී කරණ සේවක ක්‍රිෂ්ණසාමි සිවසුබ්‍රමනියම් හෙවත් මනියම් මල්ලීට පැවැරු වෙමු.

ඒ දෙදෙනා උනන්දුවෙනුත්, කාර්යක්ෂම ලෙසත් සිය වගකීම් ඉටු කරන්නට වූහ. එය මගේ සැනසුමට හේතුවක් විය.



එස්.කේ. වේලායුදපිල්ලේ මහතා

උතුර ගැන කතා කරන විට එස්.කේ. වේලායුදපිල්ලේ මහතාට වඩා උසස් සර්වෝදය සේවකයෙක් හෝ ගාන්ධි සේවකයෙක් සිටියේ නැත. අපේ ද උදව් ඇතිව මෙතුමා පවත්වා ගෙන ගිය කිලිනොච්චියේ ළමා නිවාසය එතුමාගේ සේවයට ඉමහත් සංකේතයකි. මා අතින් එහි පැල කරන ලද කර්තකොළම් අඹ ගසේ අඹ මල්ලක් සෑම වසරේම මොරටුව අප නිවසට ගෙනැත් දීම එතුමාගේ චාරිත්‍රයක් විය. එතුමා ඉන්දියාවේ ගාන්ධිතුමාගේ කාලයේ සිටම මිය යන තෙක්ම සියළුම සර්වෝදය සම්මේලනවලට සහභාගි වූ එකම ශ්‍රී ලාංකිකයාය. උඩුකය තුවායකින් පමණක් වසා ගාන්ධි කෙනෙක් මෙන් ශ්‍රී ලංකාවේ ජීවත් වූ එකම පුද්ගලයා ඔහුය. බෝම්බයක් පිපිරීමෙන් පසු වියරු වැටුණු හමුදා සෙබළුන් කිහිප දෙනෙක් පසු කළෙක කදිරමලේ මල්ලීගේ

බිරිඳ සහ ඇයගේ පවුලේ අය සහාසිකව මරා දැමූ අවස්ථාවේ එතැන සිටි අයගෙන් දිවි ගලවා ගත්තේ එස්.කේ. වේලායුදපිල්ලේ මහතා පමණි.

මේ අතරේ වරින් වර මම යාපනයේ සංචාරය කළෙමි. එල්ටීටීඊ පාලනය යටතේ යාපනය පවතිද්දී ද මම එහි ගියෙමි. ඒ හැම අවස්ථාවකදීම තිරු මල්ලි මුණගැසී කතා කළෙමි. සුහද තත්ත්වයක් ඇති කර ගැනීමට මහන්සි ගතිමි.

එහෙත් ඒ වන විට උතුරේ තත්ත්වය නම් පැවැතියේ ඒ තරම් යහපත් ස්වභාවයක නොවේ. යුද උණුසුම වඩ වඩාත් උත්සන්න වෙමින් තිබිණ. මෙයින් වඩාත්ම දුක්බිත තත්ත්වයට පත් වී සිටියේ උතුරේ දුගී දුප්පත් පවුල්වල අයයි. ආබාධිත වූවන්ට පිළිසරණක් නොමැත. සිසු පරපුරට අධ්‍යාපනය ලබන්නට මඟක් නැත. තරුණයිනට කරන්නට රැකියාවන් නැත. ගෙවල් දොරවල් අහිමි සරණාගත තත්ත්වයට පත් පවුල් ලක්ෂ ගණනක් ඉතාම අසරණව තැන තැන ලැග සිටිති. මේ සෑම කෙනෙකුටම මේ වන විට විශාල ශක්තියක් වී තිබුණේ සර්වෝදයෙන් ලැබෙන ආධාර උපකාරයි. ඒ වන විට පුන්ගුඩුතිව් හි සර්වෝදය මධ්‍යස්ථානය සම්පූර්ණයෙන්ම වෙන් වී තිබුණේ පුනරුත්ථාපන කටයුතු සඳහාය. ජෙයපුරම්හි රජයේ ඉඩම්වල කැලය කපා ළිං තනා දී තාවකාලික ගෙවල් හදා දී තිබුණේ සර්වෝදය ස්වේච්ඡා සේවක පිරිස් විසිනි. අනාථ වී සිටි ජනතාව කාරතිව් සිට ජෙයපුරම් දක්වා රැගෙන ආවේ සර්වෝදයේ වියදමින් වාහන ලබා දී ඒ මගිනි.

ආචාර්ය ජෙහාන් පෙරේරා, නීතා ආරියරත්න මැතිනිය, මම, තිරු මල්ලී සහ සේවක පිරිස

යාපනය රෝහලට ගිය අවස්ථාවේ නීතාද මෙහි වෙයි.

යාපනයේ සර්වෝදය සේවකයන් හමුවී

යාපනය රෝහලේ කාර්ය මණ්ඩලය හමුවී

යාපනය අගරදගුරු සවුන්ද්‍රනායගම් පියතුමා හමුවූ අවස්ථාව

යාපනයේ සර්වෝදය මධ්‍යස්ථානයේදී

යාපනයේ මෙතෝදිස්ත පල්ලියේ දී

ඒ දිනවල කිසිදු භේදයක් නොසලකා අපේ කටයුතුවලට ආධාර උපකාර කළ කෙනෙකි, වැල්වැටිතුරේ පුරවැසි කමිටුවේ සභාපති තැන්පත් මහාචාර්ය සින්නතම්බි මහතා ඔහු සර්වෝදය දර්ශනය මනාව තේරුම් ගෙන, කිසිදු බාහිර බලවේගයකට අවනත නොවී බිය නොවී සර්වෝදය සේවාවන්ට විශාල වශයෙන් සහයෝගය දුන් බව මෙහි ලා සඳහන් කළ යුතුය. මේ අතර සර්වෝදය උතුරේ සිදු කරන සේවා කටයුතු ප්‍රසංශාවට භාජනය කරමින් උතුරේ ප්‍රභූන් තිදෙනෙකු අත්සන් කොට මා වෙත විශේෂ ලිපියක් ද එවා තිබිණ.

එහි මෙසේ සඳහන් කොට තිබිණ

''විපතට පත් අසරණ ජනතාවට අවශ්‍ය ආහාරපාන ඇඳුම් පැළඳුම් ආදිය ඔබගේ සේවක පිරිස් බෙදා දෙන අයුරු අපි බලා සිටියෙමු. එය ඉතාම මානුෂික ප්‍රසංසනීය එමෙන්ම විශිෂ්ට ක්‍රියාවකි සේවාවකි. ඔබ නායකත්වය දරන සර්වෝදය ව්‍යාපාරය වැඩි දියුණු වී සර්වප්‍රකාරයෙන්ම ඔබේ ප්‍රාර්ථනා ද ඉෂ්ට වේවායි අපි ප්‍රාර්ථනා කරමු''

එම ලිපිය අත්සන් කොට තිබුණේ යාපනය තෙල්ලිපලේ නඩේස්වර විද්‍යාලයේ විදුහල්පති බැංකු කළමනාකාර ඩී. වෙල්ලයියා සහ ඉංජිනේරුවරයකු වූ ඊ. ඒ. මාරියම්පිල්ලේ යන තිදෙනාය. ඊට අමතරව ප්‍රජා නායකයෝද වූහ.

මෙලෙස අප සේවා කටයුතු සාර්ථක ලෙස යාපනය දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක වෙමින් පැවැතියදී අප සිහිනෙකිනිදු නොසිතූ විරූ ආකාරයේ ඛේදජනක සිද්ධියක් සිදු විය.

ඒ අපේ ක්ෂේත්‍ර අධ්‍යක්ෂ කදිරමලේ මල්ලීගේ ඝාතනයයි. කිසියම් ආයුධ සන්නද්ධ පිරිසක් විසින් වෙඩි තබා ඔහු ඝාතනය කොට තිබිණ. (ඒ පිළිබඳ භවතණ්හා දෙවැනි වෙළුමේ 199 පරිච්ඡේදයෙන් විස්තර කෙරේ).

කදිරමලේ මල්ලීගේ අභාවයෙන් පසු සර්වෝදය මූලස්ථානය සහ යාපනය මධ්‍යස්ථානය අතර පැවැති සම්බන්ධතාවය යම් පමණකට දුරස් වීම කණගාටුවට කාරණයක් වූ

බව නොකිව මනාය. ඒ සමඟම යුදහමුදාවේ ඇතැම් පිරිස් සහ ඊරෝස් සංවිධානයේ පිරිස් යාපනයේ අප මධ්‍යස්ථානයට අවුත් එහි තිබූ අපගේ වටිනා ලියකියවිලි සහ ගිණුම් වාර්තා ආදිය ගෙන ගොස් තිබීම ද අපේ බලවත් කණස්සල්ලට හේතුවක් වීය.

කදිරමලේ මල්ලීගේ අභාවයෙන් පසු යාපනය සර්වෝදය දිස්ත්‍රික් නියමු සේවක පදවියට පත් කරන ලද්දේ සිවසුබ්‍රමනියම් මල්ලීය. ඔහු අවංකව සහ කාර්යක්ෂමව සේවයේ නියැළෙමින් කෙටි කලක් ඇතුළත උතුරේ සර්වෝදය සේවාවන් යළිත් පුනර්ජීවනය කොට පෙර පැවැති තත්ත්වයටම ගෙන ආවා සේ පෙනිණි. ඔහු එඩිතරව ප්‍රදේශවාසී ජනතාව ද සහභාගි කර ගනිමින් පුනරුත්ථාපන සහ අනෙකුත් සේවා අඛණ්ඩවම ඉදිරියට ගෙන යන්නට විය. මේ වන විට යාපනය දිස්ත්‍රික්කයේ ගම්මාන 103 ක් තෝරාගෙන පෝෂණ වැඩ සටහන යටතේ ඒ සෑම ගම්මානයකම ළමුන්ට කිරිපිටි සම්පාදනය කිරීමේ කටයුත්තක් ආරම්භ කර තිබිණ. ඒ කිරිපිටි ලබා දුන්නේ ඒ ගම්මානවල ඉතාම දිළිඳු පවුල්වල ළමයින්ටය. කිසිවක් කර කියාගත නොහැකිව තම දුක් වේදනා දෙවියන්ට කියමින් උන් ඒ දිළිඳු පවුල්වල මාපියන්ට සර්වෝදයේ එම සහන සැලැසීම හරියට දෙවියන්ගේ ආශීර්වාදයෙන් අත් වූ ප්‍රාතිහාර්යයක් සේ වීය. එයින් ධෛර්යයට පත් අපි තවත් එබඳු දුෂ්කර ගම්මාන 200 කට අපට කිරිපිටි බෙදා දිය හැකි බව දන්වා ඊට අදාළ ව්‍යාපෘති යෝජනාවක් ද සකසා එය මම පුනරුත්ථාපන අමාත්‍යාංශයේ ලේකම් තැන්පත් ඔස්ටින් ප්‍රනාන්දු මහතා වෙතට යැවීමි.

මේ කාලය තුළදී කිලිනොච්චි කනකාම්බියහිකුලම් සහ තෙඩුම්කුලම් ගොවිපළ භාරව සිටි සබාපති මල්ලී ද මෝටර් රිය අනතුරකින් මිය ගියේය.

කොතරම් හොඳ වැඩ කළ ද, කරදර එන විට එන්නේ පෙරහැරේය. එය මා ප්‍රත්‍යක්ෂයෙන්ම අත්දැක ඇති සත්‍යයෙකි. මේ දිනවල මම අසනීපව සුළු ශල්‍යකර්මයකට ද භාජනය වී සිටියෙමි.

මේ වන විටත් තිරුණාවුකර්සු මල්ලීගෙන් සිදුවන කරදර නිමාවක් වී නොතිබිණ. ඔහු විවිධ ආයතනවලට සහ විවිධ පුද්ගලයන්ට මා පිළිබඳ අභූත චෝදනා නගමින් ලියුම් යවන්නට පටන් ගෙන තිබිණ. උතුරේ තවත් ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ මුත්තයියා නමැති අය වෙත යවා තිබූ එබඳු ලිපියක් ඒ දිනවල කවුරුන් හෝ මා වෙත එවා තිබිණ. මුත්තයියා දීර්ඝ කාලයක සිට මා දන්නා හඳුනන, මගේ සිතුම් පැතුම් මනාව තේරුම් ගෙන සිටි අයෙකි. ඔහු එම ලිපියේ සඳහන් අසත්‍ය කරුණු නොපිළිගත් බව මම දනිමි.

තවත් අවස්ථාවක තලෙයිමන්නාරම සර්වෝදය මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් ගෙවීමට යාමේදී එහි අයිතිය පිළිබඳ වැරදි සහගත ලිපියක් එහි විදුලි ඉංජිනේරුවරයා වෙතට යවා ඔහු අප කරදරයකට පත් කරන්නට කටයුතු කොට තිබිණ. එතැනදී එම ඉංජිනේරුවරයා තොරතුරු සොයා බලා, අවසන ඔහුට අවවාදාත්මක ලිපියක් යවා සිද්ධිය සමථයකට පත් කළේය. ඊළඟට කදිරමලේ මල්ලීගේ මරණයේ උණුසුම යන්නට පෙර යාපනය මධ්‍යස්ථානයේ සර්වෝදය ක්‍රියාකාරී සේවිකාවක වූ ජයරානි නංගීගේ, මල්ලී කෙනෙක් වූ සීලන් ද මරණයට පත් වි තිබුණෙන්, ඇය සිය දුක්ගැනවිලි කියා මා වෙත දීර්ඝ ලිපියක් එවා තිබිණ.

මොන තරම් කරදර පැමිණියත්, මම උපේක්ෂාවෙන් ඒ සියල්ල ඉවසා ඒ සියලු ප්‍රශ්නවලට මුහුණ දුන්නෙමි. ආධාර උපකාර අවශ්‍ය අයට ඒ ආධාර උපකාරයන්, අවවාද-අනුශාසනා ඇවැසි අයට ඊට සුදුසු ප්‍රතිකර්මත් මම ලබා දුනිමි. එසේ කරමින් උතුරේ ප්‍රජා කටයුතු අඩපණ වී යා නොදී කෙසේ හෝ ඒවා ඉදිරියට ගෙන යන්නට මම කටයුතු සලසා දුනිමි.

කොළඹ මලයාලි කලාලයම් සමිතියට පවරා දෙන ලද අක්කර 100 ක ඉඩමක පදිංචි වී සිටි සරණාගත පවුල් 100 ක නිවාස මේ වන විට දිරාපත් වී ඇති නිසා ඒ අයට අලුතින් නිවාස තනා දෙන්නැයි දන්වමින් කිලිනොච්චි දිසාපතිවරයාගෙන් ලිපියක් මා වෙත ලැබී තිබුණේ ද මේ වකවානුවේය. මම එම ඉල්ලීම ඉටු කරලීමට පෙළඹුණෙමි. එම ඉඩමේ පදිංචි වී සිටියේ 83 ජූලි කෝලාහලයෙන් අනාථ වූ පිරිස්ය. ඒ අයට අලුත් නිවාස 50 ක්

පමණක් නොව, පානීය ජලය ලබා ගැනීමට අලුතින් ළිං 50 ක්ද සකසා දීමට අපට හැකි විණ. ඒ සියල්ලක්ම ඉටු කර දුන්නේ අපේ ස්වේච්ඡා සේවක පිරිස්ය.

මේ කාලයේ උතුරේ අනාථ පිරිස් විශාල වශයෙන් ලංකාව හැර පියා ඉන්දියාවට යන්නට පටන් ගෙන තිබිණ. මෙය කිසිදු ක්‍රමික භාවයකින් සිදු නොවූ නිසා, ලංකාණ්ඩුවේ මෙන්ම, ඉන්දියාවේ ජන ප්‍රධානීන්ද මෙම කටයුත්ත අවුලකින් තොරව ඉටු කොට දීමට සර්වෝදයේ සහාය ලබා දෙන්නැයි ඉල්ලා සිටියහ. ඒ අනුව තලෙයිමන්නාරමේ පිහිටි සර්වෝදය මධ්‍යස්ථානය කේන්ද්‍රීය කොට ඉන්දියාවට යන අයට ඒ කටයුතු විධිමත් ආකාරයට සහ අවහිරයකින් තොරව ඉටු කර ගැනීමට අවස්ථාව සලසා දුනිමි. පසුව මෙම කටයුත්තේ සම්බන්ධීකරණ නිලධාරී ලෙස කටයුතු කළේ තලෙයිමන්නාරම සර්වෝදය සම්බන්ධීකරණ නිලධාරී කේ. තිලකරත්නම් මල්ලීය.

මේ අවධියේ යුද හමුදාවේ ක්‍රියාන්විත නිසා ද යාපනයේ ජනතාවට විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවී තිබිණ. නිබඳව කෙරෙන ඇඳිරි නීතිය පැනවීම් එක විටම කඩා පැන කෙරෙන ගෙවල් සෝදිසි කිරීම් ද තවත් බොහෝ මිලිටරි කටයුතු ද, ඒ ජනතාවට ගෙන ආයේ විශාල පීඩාවකි. ඒ දිනවල සර්වෝදය සමීක්ෂණ කණ්ඩායම් පැවැත්වූ ස්වාධීන සමීක්ෂණ වාර්තාවන්හි ඒ බව සඳහන් කොට තිබිණ. වරක් ඒ අය මා වෙත එවා තිබූ එබඳු වාර්තාවක මෙම යුදමය තත්ත්වයන් නිසා එහි වාසය කළ සිවිල් පුරවැසියන් 1250 ක් මිය ගොස් ඇති බවත් පවුල් 2650 කට උන්හිටිතැන් අහිමි වී දේපළ විනාශ වී ඇති බවත් තවත් පවුල් 3000 කට පමණ උයා-පිහා ගැනීමට අවශ්‍ය මුලුතැන්ගෙයි උපකරණ විනාශ වීම නිසා, අසරණව සිටින බවත් සඳහන් කොට තිබිණ.

මෙම හානි වැඩි වශයෙන් සිදු වී ඇත්තේ ඉන්දියානු සාම හමුදාව (IPKF) ක්‍රියාන්විත නිසා බව ද එහි සඳහන් කොට තිබිණ.

පුදුමයකට මෙන් මේ දිනවල උතුරේ රාජකාරියේ නියුක්තව සිටි උසස් නිලධාරියකුගෙන් විශේෂ ලිපියක් මා වෙත ලැබී තිබිණ. එහි සඳහන්ව තිබුණේ උතුරේ පැන නැගී ඇති තත්ත්වය පිළිබඳ

තොරතුරුය වහාම යාපනයට පැමිණ එහි ආහාර නොමැති කමින් පීඩා විඳින ජනතාවට කෙසේ හෝ ආහාර සම්පාදනය කර දෙන ලෙස ඉන් අවධාරණය කොට තිබිණි. සර්වෝදයේ උදව්යට උතුරේ රජයේ සෝදිසි මධ්‍යස්ථානවලින් ඇතුළුවීමට විශේෂ අවසරයක් ලබා දී ඇති බවත්, අනන්‍යතාවය තහවුරු කොට අත්සන් තබා සර්වෝදය ක්‍රියාකාරීන්ට දවසේ පැය විසිහතර තුළ ඕනෑම වේලාවක පැමිණිය හැකි බව ද එහි සඳහන් කොට තිබිණ.

මේ අතර යාපනය සර්වෝදය මධ්‍යස්ථානය භාරව සිටි සිවසුබ්‍රමනියම් මල්ලීගෙන් ද මා වෙත ලිපියක් ලැබී තිබිණ තමා එහි හුදකලාව ගත කරන දුෂ්කර සහ බිය ජනක තත්ත්වය එහි සඳහන් කොට තිබුණි. නිතරම හතර වටින් බෝම්බ පිරිරෙන සහ වෙඩි ශබ්ද ඇසෙන බවත් අහල පහළ නිවෙස්වල උදව්ය තම නිවෙස් හැර දා ගොස් ඇති බැවින්, තමා මෙහි තනි වී සිටින බවත් එහි සඳහන් කොට තිබිණ. දුරකතන සේවාද අක්‍රිය වී ඇති බැවින් කිසිවෙකුට පණිවුඩයක් දෙන්නට හෝ පිටස්තර තොරතුරක් දැන ගන්නට ක්‍රමයක් නැතැයි ද, මේ නිසා තමා විශාල හුදෙකලා බවෙකින් සිටින්නේ යැයි ද තව දුරටත් එහි සඳහන් කොට තිබිණ.

මට ඒ පණිවුඩවල ඇති බැරෑරුම්කම තේරුම් ගත හැකි විය. උතුරේ සාමාන්‍ය ජනතාවට පමණක් නොව රජයේ නිලධාරීන්ට පවා මුහුණදීමට සිදුවී ඇති තත්ත්වය මට ඒ මගින් තේරුම් කොට ගත හැකි වීය. බල බලා සිටීමට කාලයක් නැත. මම වහාම ඊට අවශ්‍ය ප්‍රතිකර්ම සැලැසීමට කටයුතු සූදානම් කළෙමි මුලින්ම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය උතුරට යැවීමට කටයුතු පිළියෙල කළෙමි. ඒ සඳහා හාල් පිටි පරිප්පු තේකොළ තුනපහ සහ ටින් කෑම ද, වියළි ආහාර පාර්සල් විශාල සංඛ්‍යාවක් ද සකස් කොට ඒවා ලොරි 18 ක් මගින් යාපනයට යැවීමට කටයුතු සැලැසුවෙමි.

ඒ දිනවල සර්වෝදය ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේ තරුණ, හර්ෂ කුමාර නවරත්නය. ඔහු මෙබඳු කටයුතු සංවිධානය කිරීමට දැක්වූයේ ඉමහත් ශූරතාවයෙකි. මේ අවස්ථාවේදී ඔහු කඟවේනෙකුගේ ජවයෙන් යුතුව මා දුන් සැළසුම් සහ උපදෙස් අකුරට පිළිපදිමින්, ඉතාම කඩිනමින් සහ කලට වේලාවට ඒවා සම්පූර්ණ කළ බැවින් ඒ කටයුතු ඉතා සාර්ථක වීය.

මෙම ආහාර ද්‍රව්‍ය රැගත් වාහන උතුරට ගිය විගස, එහිදී ද පුහුණුව ලද අපේ තරුණ ස්වේච්ඡා සේවක පිරිස් උතුරේ අස්සක් මුල්ලක් නෑර පීරා ගොස් අසරණව අනාථව සිටි සියලු ජන කොටස් සොය සොයා ඒ අයට ඒවා බෙදා දීමට කටයුතු කළේ විශාල කැපවීමෙකින් යුතුවය. ඒ දිනවල යාපනය දිස්ත්‍රික්කයේ සරණාගත පිරිස් වෙත ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා තවත් රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක්ම ඉදිරිපත් වී සිටියත්, ඒ සියලු සංවිධාන අභිබවා අපේ සේවක පිරිස් ඒ කර්තව්‍ය කිසිදු අඩුපාඩුවක් සහ ගැටළුවක් ඇති නොවන ආකාරයට ඉටු කළහ.



විනාශවී තිබූ යාපනය පුස්තකාලය

යාපනයේ පදිංචි ද්‍රවිඩ ප්‍රභූ ජන කොටස් වෙතින් මට ස්තුති කරන සහ සුබ පතන ලිපි එන්නට පටන් ගත්තේත් විදෙස් මාධ්‍යය මගින් සර්වෝදය සේවා අගයමින් සහ ඒවා ප්‍රශංසාවට භාජනය කරමින් පුවත් ප්‍රචාරය වෙන්නට පටන් ගත්තේත් මේ අවධියේය.

ඒ දිනවල දිනපතාම පාහේ අපට උතුරේ සරණාගත පිරිස් සඳහා දිනකට යටත් පිරිසෙයින් ආහාර පාර්සල් 1000ක් වත් බෙදා දීමට හැකියාව තිබිණ. ඒ අතර මම ද උතුරට ගොස් එහි වෙසෙන සරණාගත පිරිස් මුණගැසී ඒ අයගේ අවශ්‍යතා ගැන සාකච්ඡා කළෙමි. ඒ වන විට යාපනයේ පමණක් 72000 ක් පමණ අවතැන් වී සිටින බවත්, ඒ අය මධ්‍යස්ථාන 120 ක නවාතැන් ගෙන සිටින බවත් මට දැන ගත හැකි විය. එයින් මධ්‍යස්ථාන නැතහොත් සරණාගත කඳවුරු කිහිපයකට පමණි මට යන්නට හැකි වූයේ.

එසේ ගිය බොහෝ කඳවුරුවල මට පැහැදිලිවම පෙනී ගිය කරුණක් නම් එහි වෙසෙන කුඩා දරුවන් උග්‍ර මන්දපෝෂණයට ගොදුරු වී සිටින බවය. එය මගේ සිත ඉතාමත් වේදනාවට පත් කරන සිද්ධියක් වීය. මම වහාම එම කඳවුරු වෙතට ආහාර ද්‍රව්‍ය යවනවාට අමතරව අර කුඩා දරුවන් සඳහා ප්‍රමාණවත් තරම් කිරිපිටි වර්ග යවන්නට ද කටයුතු සම්පාදනය කළෙමි. එයට අමතරව ඒ දරුවන් සඳහා ඇඳුම් පැළඳුම් සපයා දෙන්නටත් මම කටයුතු සැලසුවෙමි.

යාපනය සංචාරයේ දී

මා එහි යන විට එම ප්‍රදේශවලට ඇඳිරි නීතිය පනවා තිබිණ. එය ද ඒ ජනතාවට විශාල කරදරයක් සහ දුක් වේදනා ගෙන දෙන සිද්ධියක් වී තිබිණ. මුලු යාපන දිස්ත්‍රික්කය පුරාම විදුලි බලය ඇණහිට තිබුණ නිසා, මෙම සරණාගත පිරිස්වලට භූමිතෙල් අත්‍යවශ්‍යව තිබිණ. එහෙත් ආහාරපාන මෙන්ම, භූමිතෙල් ද මේ අයට ලබා ගන්නට මාර්ග සැලසී නොතිබිණ. මේ නිසා මම වහාම අපේ ක්‍රියාකාරීන් මාර්ගයෙන් සලාක ක්‍රමයට සෑම පවුලකටම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙන්ම භූමිතෙල් ද ලබාදීමට වැඩ පිළිවෙලක් සකස් කළෙමි. ඒ සඳහා ඒ පවුල්වලට සර්වෝදයෙන්

සුන්බුන් අතරදී

භූමිතෙල් කාඩ්පත් නිකුත් කරන්නටත්, ඒ මගින් අඛණ්ඩවම ප්‍රමාණවත් තරම් භූමිතෙල් බෙදා හැරීමටත් අපි කටයුතු සැලසුවෙමු .

මේ වන විට උතුරේ සියලු දෙනාගේම පාහේ සහ යෝගය සර්වෝදයට ලැබී තිබිණ. ත්‍රිවිධ හමුදාවේ මෙන්ම ආයුධ සන්නද්ධ තරුණ කැරලිකාර කණ්ඩායම්වල සහාය ද නිරන්තරව ම අපට ලැබී තිබිණ. එය අපට විශාල ශක්තියක් වූ බව සඳහන් කළ යුතුව ඇත. අප එතැනදී ඉටු කළේ සර්වෝදය කවදත් අගයන බුදු දහමේ සඳහන් ''දුක්ඛප්පත්තාච නිද්දුක්ඛා - භයප්පත්තාච නිබ්බයා'' යන සනාතන ධම්මපදයේ අරුතට සමාන ක්‍රියාදාමයකි. අපි එතැනදී ජාති ආගම් කුල-මල භේදයක් නොදක්වා නොසලකා, දුකට-බියට-ශෝකයට පත් වී සිටින ජන කොටස් සොයා ගොස් ඒ අයට පිහිට වීමු. ඒ සියල්ලක් අප ඉෂ්ට සිද්ධ කළේ නිස්සරණාධ්‍යාශී හැඟීමෙනි. අප ඒ විපත් පැමිණි අවස්ථාවේ අපේ සහෝදර ජනතාවගේ කුසට ආහාර පාන සැපයීම පමණක් නොවේ, සිදු කළේ අපි ඔවුනගේ හිසට සෙවන සලසා දුනිමු. ගතට ඇවැසි වස්ත්‍ර පසයා දුනිමු. ලෙඩට බෙහෙත් ලබා දුනිමු. එපමණක් නොවේ, දයාව කරුණාව මෛත්‍රිය යන හැඟීම් තුළින් ඔවුනගේ අධ්‍යාත්මයට ශාන්තියක් සැනසිල්ලක් සමීප කොට දුනිමු.

යාපනයේ විනාශ වී ගිය ගොඩනැගිලි අතර

යාපනය සර්වෝදය මධ්‍යස්ථානය ඉදිරිපිට

ඒ අවධියේ සර්වෝදය උතුරේ ජනතාවගේ යහපත සඳහා වැය කළ මුදල දළ වශයෙන් රුපියල් නමකෝටි අසූලක්ෂයක් ඉක්මවා ගොස් තිබිණ.

අද උතුරේ එදා තිබූ ඛේදජනක තත්ත්වය ඇත්තේ නැත. අපි සතුටු වෙමු. යුද්ධය අපි එදත් පිළිකුල් කළෙමු. අදත් පිළිකුල් කරමු. ජාතීන් අතර සුහදතාවය ගොඩනැගීම අපේ එකම ප්‍රාර්ථනය වීය. අද එය යම් ප්‍රමාණයකට හෝ ගොඩනැගී ඇති සැටියක් දැක ගන්නට ඇත. අපි සතුටු වෙමු. එදා අපි උතුරේ ජනතා මෙහෙවරෙහි යෙදෙමින් ලැබුයේ නිස්සරණ ප්‍රීතියකි. ඒ ප්‍රීතිය අදත් අප තුළ ඇත.

* * *

තිරුගේ අවසාන කාලය ඔහු ගත කළේ ආධ්‍යාත්මික ජීවිතයකි. ඒ සමඟම සමාජ සේවා කටයුතු ද කළේය. වසර ගණනාවකට පසු 2001 ඔක්තෝම්බර් මස මුල් සතියේ තිරු මල්ලී කොළඹ පැමිණ තිබේ. එම ගමනේදි ඔහු සර්වෝදය මූලස්ථානයට ද මා හමුවීමට ද බලාපොරොත්තු වී තිබේ. එහි පරමාර්ථය වූයේ නැවත ඔහු අප හා එක්ව එකට වැඩ කිරීමටය. එහෙත් අවාසනාවකට මෙන් 2001.10.03 වැනි දින වෛද්‍ය ප්‍රතිකාර ගැනීමටත් පෙර ඔහු හදිසියේම කොළඹදී අභාවප්‍රාප්ත වීය.

මෙය සැල වූ වහාම අප ඔහුගේ දේහය තැන්පත් කර තිබූ ජයරත්න මල් ශාලාවට ගොස් ඔහුට අපේ ගෞරවය දැක්වීමු. ඔහුගේ ගුණ ගායනාවක් ද කළෙමු.

ඔහුගේ දේහය යාපනයට ගෙන ගොස් පුංගුඩුතිව්වලදී ආදාහනය කරන ලදී.

ඔහුගේ මැණියන්ට සහ සොහොයුරියට ද අපේ සංවේගය ප්‍රකාශ කර ලිපියක් යැව්වෙමු.

අවමංගල්‍යය දැන්වීම

226

සර්වෝදය භාර අරමුදල

එම ජාත්‍යන්තර සම්මානය හිමි වූයේ 1969 වසරේදීය. (ප්‍රජා නායකත්වය සඳහා රැමන් මැග්සයිසයි ත්‍යාග පදනම විසින් එම වසරේ ත්‍යාගය පිරිනැමීම සඳහා තෝරා ගෙන තිබුණේ මා ය). එම ත්‍යාගය සමඟ තිබුණු සම්පූර්ණ මුදල ඇමරිකානු ඩොලර් දහදාහ අරලියගහ මන්දිරයේදී ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති පිළිගැනීමේ උත්සවයේදී එතුමා මාර්ගයෙන් මම ඒ ත්‍යාග මුදල සර්වෝදය සංගමයට පරිත්‍යාග කළෙමි. එවකට සංගමයේ සභාපතිව සිටි එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා සංගමය වෙනුවෙන් එම මුදල බාර ගත්තේය.

ඒ කාලයේ සංවර්ධන අධ්‍යාපනය යන වචනය එතරම් ප්‍රචලිතව තිබුණු වචනයක් නොවේ. අපේ සර්වෝදය ගම්මානවලින් තෝරා ගත් තරුණ තරුණියන් පුහුණු කිරීම සඳහා එම මුදල ආයෝජනය කරන මෙන් මම අපේ විධායක මණ්ඩලයෙන් ඉල්ලා සිටියෙමි. එදා මෙත්මැඳුර සහ තවත් ස්ථාන කිහිපයකින් ඇරඹුණු සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථාන අද රට පුරාම ව්‍යාප්තව තිබෙන අතර ඒවා උසස් අධ්‍යාපන ආයතන මට්ටම දක්වා උසස් කොට පවත්වා ගෙන යනු ලබයි.

මීළඟට මට ලැබුණු ත්‍යාගය බෙල්ජියමේ රජතුමාගේ රාජ්‍ය කාලයට අවුරුදු 25 ක් පිරීම නිසා ආරම්භ කරන ලද ජාත්‍යන්තර සංවර්ධනය සඳහා පිරිනැමෙන බෝඩුවින් රාජ්‍ය සම්මානයයි. එය 1982 වසරේදීය. මෙම ත්‍යාගයට හිමි මුදල සම්පූර්ණයෙන්ම ආයෝජනය කොට මානව දයාව සංවර්ධනය සහ සාමය ගොඩනැංවීමට සැහෙන දායකත්වයක් දෙන ශ්‍රී ලාංකිකයින් තෝරා ඔවුනට ත්‍යාග පිරිනැමීමට මම අදහස් කළෙමි. ඒ අනුව එවකට සර්වෝදය සමඟ ඉතා කිට්ටුවෙන් සේවය කළ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වන ඩී. පී. ජී. මහදිවුල්වැව මහතා විසින්

ලියා සහතික කරන ලද සර්වෝදය භාර අරමුදල 1983 මාර්තු මස 4 වැනිදා පිහිටු විනි. මේ සඳහා භාරකරුවන් වශයෙන් මා සමඟ එම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතා, බී. ඒ. ඩී. ගුණසිංහ මහතා, සීතා වර්ජිනියා රාජසූරිය මැතිනිය, විලියම් කන්දගේ මහතා, මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා, ආචාර්ය පී.අමරසිංහ මහතා, සතිස් ද මැල් මහතා, අධිනීතිඥ වෝල්ටර් පීරිස් මහතා භාරකාර මණ්ඩලය වශයෙන් පත් කෙරිනි. රුපියල් 67 ලක්ෂයක් පමණ වූ මෙම මුදල ආපසු ගත නොහැකි පරිදි මෙම භාරයට පවරා තිබේ. සම්මාන පිරිනමනු ලබන්නේ මෙම මුදලට ලැබෙන වාර්ෂික පොලියෙනි.

සර්වෝදය භාර අරමුදල පාර්ලිමේන්තුවේ 1984 අංක 31 දරණ පනත යටතේ සම්මත වී 1984 ජූලි 25 වැනි දින සිට නීතිගත සංස්ථාවක් බවට පත් විය.

1993 වර්ෂයේදි පළමුවන ජාතික සම්මාන උත්සවය පැවැත්වූ අතර එදා සිට මේ පොත පළවන අවස්ථාව දක්වා වූ කාල පරිච්ඡේදයේ දී ප්‍රධාන අමුත්තන් විශාල ගණනක් සහභාගි වූ සම්මානලාභීන්ගේ නම් වර්ෂයත් සමඟ පහත සඳහන් වේ. භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් අභාවප්‍රාප්ත වීම නිසා හෝ අස්වීම නිසා හිස් වූ වර්තමාන භාරකාර මණ්ඩලය ආචාර්ය ඒ.ටී. ආරියරත්න, ඩී. ඒ. පෙරේරා මහතා, ධර්මා ගුණසිංහ මහතා, නීතිඥ වෝල්ටර් පීරිස් මහතා, නීතිඥ ෂෙවෝන් ගුණරත්න මහතා, වෛද්‍ය වින්යා ආරියරත්න මහතා, අමරදාස ගුණවර්ධන මහතා, කේ. එල්. ගුණවර්ධන මහතා, සුබසේන ද සිල්වා මහතා යන අයගෙන් සමන්විත වේ. මෙහි විධායක භාරකරු හැටියට කටයුතු කරන්නේ සර්වෝදය ආරම්භයේ සිටම මා සමඟ වැඩ කරන එමෙන්ම පාසල් යන යුගයේ සිටම එකට මා සමඟ ඉගෙන ගත් මාගේ කළ්‍යාණ මිත්‍රයෙක් වූ පසුව නාලන්දා විද්‍යාලයේ විදුහල්පතිව සිට විශ්‍රාම ගිය ධර්මා ගුණසිංහ මහතාය.

මට පෞද්ගලිකව පිරිනැමුණු මෙම ත්‍යාගවලින් අප රටේ පිළිගැනීම් ලැබිය යුතු, රටට දැයට සමයට සේවය කළ කිහිප දෙනෙකුටත්, ආර්ථික අපහසුතාවලින් පෙළෙන දූ දරුවන් කිහිප දෙනෙකුගේ උසස් අධ්‍යාපනයටත්, ඉතා අසීරු ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දුන් කිහිප දෙනෙකුටත් මෙයින් යම් පිළිගැනීමක් දීමට හැකිවීම පිළිබඳව මා ලබන්නේ විශාල සතුටකි.

ජාතික සම්මානලාභීන් :-

1993 මංගල සම්මාන උළෙල සම්මානලාභීන්

1. පූජ්‍යපාද සේරුවිල සරණකිත්ති නාහිමිපාණෝ
2. පූජ්‍යපාද කුප්පියවත්තේ බෝධානන්ද හිමිපානෝ
3. ගරු තිස්ස බාලසූරිය පියතුමා
4. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීන්
5. තංගම්මා අප්පකුට්ටි මහත්මිය
6. ආචාර්ය ඩග්ලස් වලතර මහතා
7. බන්දුල ලියනගේ මහතා
8. සුනේත්‍රා වීරසිංහ මහත්මිය
9. ආචාර්ය එච්. එම්. ඩී. හේරත් මහතා

1994 වර්ෂයේ ජාතික සම්මානලාභීන්

1. එච්.ඩී. සුගතපාල මහතා
2. එඩ්වින් ආරියදාස මහතා
3. මඩවල එස්. රත්නායක මහතා
4. වෛද්‍ය ජේ.සී.ඊ. මූණමලේ මහතා

1995 වර්ෂයේ ජාතික සම්මානලාභීන්

1. පූජ්‍යපාද පන්විල විපස්සී හිමිපාණෝ
2. මහාචාර්ය ඒ.ඩී.වී.ද ඇස්. ඉන්ද්‍රරත්න මහතා
3. ලූෂන් රාජකරුණානායක මහතා
4. සිබිල් වෙත්තසිංහ මැතිනිය
5. ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී.අමරදේව මහතා
6. සිරිසුමන ගොඩගේ මහතා

1996 වර්ෂයේ ජාතික සම්මානලාභීන්:

1. ශාස්ත්‍රවේදී මාදුළුවාවේ සෝභිත හිමිපාණෝ
2. මහාචාර්ය ජේ.බී.දිසානායක මහතා
3. දේශබන්දු ඇල්බට් එදිරිසිංහ මහතා
4. මහාචාර්ය ස්වර්ණා ජයවීර මහත්මිය
5. මාධ්‍ය උපදේශක එච්.එම්. ගුණසේකර මහතා

1997 වර්ෂයේ ජාතික සම්මානලාභීන්:

1. දේශමාන්‍ය මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මහතා (වෙනුවෙන්) මිනිපිරිය
2. කලාශූරී අයිරාංගනී රොක්සානා සේරසිංහ මහත්මිය
3. කලාශූරී ආචාර්ය චිත්‍රාචාරී පණිභාරත මහතා
4. කලාශූරී ගරු මර්සලීන් ජයකොඩි පියතුමා
5. රීනි තිලකාවතී පීරිස් මහත්මිය

1998 වර්ෂයේ ජාතික සම්මානලාභීන්:

1. අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහා නායක ස්වාමීන් වහන්සේ
2. බෝගොඩ ප්‍රේමරත්න මහතා
3. ආචාර්ය ඒ.එන්.එස්. කුලසිංහ මහතා
4. තිස්ස අබේසේකර මහතා
5. ශ්‍රී ලංකා සුමිත්‍රයෝ

1999 වර්ෂයේ ජාතික සම්මානලාභීන්: භාරකාර මණ්ඩලය සමඟ

1. ආචාර්ය විමලා ද සිල්වා මහත්මිය
2. වෛද්‍ය සී.ජී. උඟරගොඩ මහතා
3. ආචාර්ය ශ්‍රීමතී ලෝර්නා දේවරාජා මහත්මිය
4. ආචාර්ය ගොඩ්ෆ්‍රි ගුණතිලක මහතා
5. වෛද්‍ය හඩ්සන් සිල්වා මහතා
6. විශාරද නන්දා මාලනී මහත්මිය

2000 වර්ෂයේ ජාතික සම්මානලාභීන්:

1. පූජ්‍ය ආචාර්ය මාපලගම විපුලසාර නාහිමිපාණන් වහන්සේ
2. හෙන්රි ජයසේන මහතා
3. වෛද්‍යාචාර්ය ජී. ආර්. ඩබ්ලිව්. ගොඩකුඹුර මහතා
4. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා
5. වෛද්‍ය චන්ද්‍රසිරි වැලිවත්ත මහතා

2001 වර්ෂයේ ජාතික සම්මානලාභීන්: භාරකාර මණ්ඩලය සමඟ

1. පූජ්‍ය ආචාර්ය වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම නාහිමිපාණන් වහන්සේ
2. ගරු මර්වින් ප්‍රනාන්දු පියතුමා
3. කලාශූරී ආචාර්ය චිත්‍රසේන මහතා
4. කලාශූරී ටයිටස් තොටවත්ත මහතා
5. දේශබන්දු ආයුර්වේද වෛද්‍ය වික්ටර් හෙට්ටිගොඩ මහතා

2002 වර්ෂයේ ජාතික සම්මානලාභීන්: භාරකාර මණ්ඩලය සමඟ

1. පණ්ඩිත විලියම් අල්විස් මහතා
2. මොනිකා රුවන්පතිරණ මහත්මිය
3. ඩී.එල්.ඕ. මැන්දිස් මහතා
4. සෝමවීර සේනානායක මහතා
5. මහාචාර්ය විනී විතාරණ මහතා

2003 වර්ෂයේ ජාතික සම්මානලාභීන්ː භාරකාර මණ්ඩලය සමඟ

1. පූජ්‍ය මහමාන්කඩවල පියරතන හිමිපාණෝ
2. සංගීතවේදී වික්ටර් රත්නායක මහතා
3. කොනි.වී. වැලිකල මහත්මිය
4. ධර්මසිරි ගමගේ මහතා
5. තම්බියාර් පෙරිම්පනායගම් මහතා

2004 වර්ෂයේ ජාතික සම්මානලාභීන්ː

1. පූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලංකාර හිමිපාණෝ
2. සුනිල් සරත් පෙරේරා මහතා
3. වෙ.වි. අභයගුණවර්ධන මහතා
4. රජිත සෙල්වනායගම් මහත්මිය

(ආරාධිත ප්‍රධාන අමුත්තා සමඟ)

2005 වර්ෂයේ ජාතික සම්මානලාභීන්: ආරාධිත අමුත්තන් සමඟ

1. මහාචාර්ය මොහාන් මුණසිංහ මහතා
2. සෝමලතා සුබසිංහ මහත්මිය
3. වෛද්‍ය ඩී.වී.ජේ. හරිස්චන්ද්‍ර මහතා
4. මහාචාර්ය වී.කේ. සමරනායක මහතා
5. සිරිල් හේවාවසම් මහතා

2006 වර්ෂයේ ජාතික සම්මානලාභීන්:

1. පූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමිපාණෝ
2. ආචාර්ය ලීල් ගුණසේකර මහතා
3. හද්‍රජී මහින්ද ජයතිලක මහතා
4. ගාමිණී ජයසිංහ මහතා
5. නාමෙල්-මාලිනී වීරමුණි යුවළ

2007 වර්ෂයේ ජාතික සම්මානලාභීන්:

1. කලාශූරී ජයසිරි සේමගේ මහතා
2. ජේ.වී. තාම්බර් මහතා
3. එන්. ලංකා ජයවර්ධන මහතා
4. රෝහණ බැද්දගේ මහතා
5. මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා
6. වෛද්‍ය උපාලි පිලපිටිය මහතා

2008 වර්ෂයේ ජාතික සම්මානලාභීන්: ආරාධිත අමුත්තන් සමඟ

2008 වර්ෂයේ ජාතික සම්මානලාභීන්: ආරාධිත අමුත්තන් සමඟ

1. දේශබන්දු ජෙසීමා ස්මයිල් මහත්මිය
2. ආචාර්ය ජයන්ත ධනපාල මහතා
3. මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා
4. සිංහ මහේන්ද්‍ර අමරසූරිය මහතා
5. අශෝක ද්වේන්ද්‍ර මහතා
6. එන්.ඩබ්ලිව්.ඊ. විජේවන්ත මහතා

ෂූමාකර් අනුස්මරණ දේශනය සහභාගීවීම

මෙවර මා එංගලන්තයට පැමිණියේ ආචාර්ය ඊ.එෆ්. ෂූමාකර් අනුස්මරණ දේශනය පැවැත්වීම සඳහාය. (1984.11.12) බ්‍රිස්ටල් විශ්ව විද්‍යාලයේදී විශාල පිරිසක් ඉදිරියේ ඉතා සාර්ථකව එය ඉටු කළෙමි. ෂූමාකර් සංගමයේ ප්‍රධාන ලේකම් සතිෂ් කුමාර් මහතා මුලසුන දැරූ අතර ස්තුති කථාව කළේ ෂූමාකර් මහතාගේ වැඩිමහල් පුතා වන ක්‍රිස්ටියන් ෂූමාකර්ය. වත්මන් ලෝකය යා යුතු මග ප්‍රායෝගිකව පෙන්වන්නා වූ අද ජීවතුන් අතර සිටින අංක එකේ පුද්ගලයෙක් වශයෙන් මා හඳුන්වමින් සභාව ඇමතූ ජෝර්ජ් මැක්රෝබි මහතා ආචාර්ය ෂූමාකර් හා මා අතර තිබූ මිත්‍රත්වය ගැනද කතා කළේය.

ආචාර්ය ඊ.එෆ්. ෂූමාකර් මහතා

දුප්පත්කමින් හා සුඛෝපභෝගිත්වයෙන් තොර මධ්‍යම ප්‍රතිපදාවක් ඔස්සේ අහිංසාවාදීව ගොඩනැඟිය යුතු සමාජයක ලක්ෂණ හඳුන්වා දුන් මම, ඒ සඳහා අප එකිනෙකාට කළ හැකි සේවා කොටස ගැන ද විස්තරයක් කළෙමි.

එංගලන්තයේ ජීවත් වූ ඊ. එෆ්. ෂූමාකර් මහතා, ස්විස්ටර්ලන්තයේදී හදිසියේ අභාවයට පත්විය. ඉන් අනතුරුව

ෂූමාකර් අනුස්මරණ සංගමය ස්ථාපිත කරනු ලැබීය. ඉන් පසු වර්ෂයක් පාසා එතුමාගේ අනුස්මරණ උත්සවය පැවැත්විණ. ෂූමාකර් මහතාගේ පරමාර්ථ හා සංකල්පයන් ද එතුමාගෙන් මිනිස් වර්ගයා වෙත ඉෂ්ඨ වූ වටිනා සේවය ද අගය කරමින් තෝරා ගත් විද්වතුන් විසින් පවත්වනු ලබන දේශන මාලාවක් මෙම උත්සවය වෙනුවෙන් සංවිධානය කරනු ලැබේ. මේ හැම උත්සවයකදීම කැපී පෙනෙන විශේෂත්වයක් දක්නට ලැබුණ අතර, පිරිස ද හත් අටසීයකටත් වඩා සහභාගි වීය.

මගේ විශ්වාසයන් හා පරමාර්ථයන්, ෂූමාකර් මහතාගේ හා බෙහෙවින් සමාන්තර වූවා මෙන්ම, අප දෙදෙනා අතර තිබූ ඥාතිත්ව හැඟීම් නිසාත් ලබන වසරේ ඔහුගේ අනුස්මරණ උත්සවයේදී ඔහු පිළිබඳ මතක සටහන් සමඟ දේශනයක් ඉදිරිපත් කරන ලෙස ෂූමාකර් සංගමයේ සභාපති සතිෂ් කුමාර් මහතා විසින් මට ලිපියක් එවා තිබුණි. එවැනි දේශනයක් මහත් ප්‍රසංශනීය වේය යන්න ඔහුගේ විශ්වාසය විය.

සතිෂ් කුමාර් මහතා සමඟ

ඒ දිනවල සාම පා ගමන් වෙනුවෙන් අපි බොහෝ මහන්සි වෙමින් සිටි නමුත්, මම සතිෂ් කුමාර්ගේ ආරාධනය සතුටින් පිළිගත්තෙමි.

අනුස්මරණ උත්සවය පැවැත්වූයේ 1984 වර්ෂයේ නොවැම්බර් 10 වන සෙනසුරාදා දිනක එංගලන්තයේ බ්‍රිස්ටල් නගරයේයි. ඒ කාලයේ මට විදේශ ගමන් අතින් ද කාර්ය බහුල විය. ටෝකියෝ නුවර රැස්වීමකට සහභාගි වී, ඔක්තෝම්බරයේ මුල හවායි දේශයෙහි ද, ඉන් පසු අමෙරිකාවටත්, කැනඩාවටත් යාමට නියමිතව තිබූ නිසා, මට සිදු වූයේ එකටම ගුවන් බලපත්‍ර සකස් කර ගෙන අන්තිමට ලන්ඩනයට යාමටය. මුදල් පරිහරණය ඉතා ප්‍රවේශමෙන් කර ගෙන ගිය නිසා මට ලන්ඩනයට යාමට ගුවන් ටිකට්පත ලබා දීමට ෂූමාකර් සංගමය අපොහොසත් වී තිබුණි. එස්. ජයසේකර මහතාගේ කාරුණික අනුග්‍රහයෙන් ඔහුගේ මැදිහත්වීම නිසා මගේ ගමනට KLM ගුවන් සමාගම මගින් ටිකට්පතක් ෂූමාකර් සංගමය වෙත ප්‍රදානය කරන්නට යෙදුණ හෙයින් එය සැනසිලිදායක ලෙස ඉෂ්ට විය.

එංගලන්තයේදී අනුස්මරණ දේශනයෙන් පසු මට යුරෝපයට ගොස් අවශ්‍ය නම්, මගේ මිතුරන් මුණගැසීමටත් අවශ්‍ය කටයුතු සැලැස්වීමට සතිෂ් කුමාර් උනන්දු විය. එංගලන්තයේදී ද, මම මගේ මිතුරන් හමුවීමි. අනෙකුත් දේශන ද පැවැත්වීමි. ඔහු විසින් කාර්යක්ෂමව සියල්ල සංවිධානය කර තිබිණ. සෙනසුරාදා නියමිත දේශනයෙන් පසු මට එංගලන්තයේ ගත කළ හැකිව තිබුණේ සතියක කාලයක් පමණි. මගේ පැමිණීම ආරංචි වූ දන්නා කියන හඳුනන බොහෝ දෙනා හමුවීම සඳහා ලිපි එවා තිබුණ ද මට කාලවේලාව නොමැති හෙයින්, හිතවත් මිතුරියක් වූ ජොආනා මේසි මහත්මිය සහ මා කිට්ටුවෙන් ඇසුරු කළ හිතමිත්‍ර බ්‍රැඩ්මන් වීරකෝන් මහතා ඇතුළු කිහිප දෙනෙකු පමණක් හමුවීමට බලාපොරොත්තු වූයෙමි.

''දිළිඳුකමින් තොර සමාජයක් කරා ප්‍රවේශ වීමට ලෝකයේ දුගී හා අසරණ වූ ජනතාවට දීප්තිමත් බැබලෙන්නා වූ මාවතක්''

එඩ්වර්ඩ් ගෝල්ඩ්ස්මිත් විසින් ඒ අයුරු මා සභාවට හඳුන්වා දුන්නේය. මෙම අනුස්මරණ උත්සවයේ තවත් විශේෂ අංගයක් නම්, ඊ.එෆ්. ෂූමාකර් වැනිම තවත් වටිනා ගත් කරුවන්ගේ පොත් ද ෂූමාකර් මහතාගේ පොත් සමඟ එහි ප්‍රදර්ශනය සඳහා තබා තිබීමයි. ''පුංචි නම් ලස්සනයි'' යන පොත ඒ අතර කැපී පෙනුණි. අනුස්මරණ දේශනයන්හි පරමාර්ථයන් ලෙස දක්වා තිබුණේ එතුමාගේ ශ්‍රේෂ්ඨ සිද්ධාන්ත හා ධර්මතාවන් පොදු ජන ශුභසිද්ධිය උදෙසා නැවත නැවත ජනතාවගේ හදවත් තුළ කාවැද්දීමේ ප්‍රයත්නයක් ලෙසටයි. පුද්ගලයාගේ සංවර්ධනය උදෙසා හුදෙක්ම ඔහු ගමන් කළ යුත්තේ, ආධ්‍යාත්මික ගමන් මාර්ගයකය. ඒ නිසා ධනවාදී සිතුවිලි නිරන්තරයෙන් තමා තුළ වර්ධනය කර ගනිමින් සිටින මිනිසා ඉන් මිදී, යම් ශුභවාදී පරිවර්තනයක් කරා යොමු විය යුතු බවත්, එසේ කරන්නේ කුමන ආකාරයකින් ද යන්න සඳහා නිසි විසඳුම් සොයා ගැනීම පිළිබඳව ෂූමාකර් මහතා විසින් බොහෝ පර්යේෂණය පවත්වා ඇත.

ඒ සඳහා වටිනා චින්තනයන් ඉදිරිපත් කළ එතුමා, වඩ වඩාත් ඒ ගැන උනන්දු වෙමින් තම බුද්ධිමත්, ශ්‍රේෂ්ඨ නිර්මාණ චින්තනය තුළින් මහත් ඵලදායී සේවාවක් ලෝකයට ප්‍රදානය කළ පරාර්ථකාමී මානව හිතවාදියෙක් විය.

ආර්ථික විද්‍යාව නැතහොත් ගෘහ නිර්මාණ ශිල්පය හෝ කුමක් හෝ වේවා තුන්වන ලෝකයේ සංවර්ධනය වේවා කාර්මික ලෝකයේ ප්‍රගතිය ද විය හැක. මේ සියලුම ක්ෂේත්‍රයන් පිළිබඳව සමස්තයක් ලෙස ගත් විට, ඒ හා සම්බන්ධව මිනිසා සතුව තිබූ සම්භාවනීය හා පාරිශුද්ධ වූ මූලධර්ම මෙන්ම, නිත්‍යමය ප්‍රඥාව ද අද අපට අහිමි වී ඇත. ශ්‍රේෂ්ඨ හෙවත් පාරිශුද්ධ මූලධර්ම ලෙස හැඳින්වෙන්නේ මනුෂ්‍යයාට යහපත් ජීවිතයක් ගත කිරීමට හා සංවර්ධනය වීමට උපකාරී වන පිරිසිදු වටිනා ධර්මතාවයන්ය. විශ්වමය ප්‍රජාව වෙත මෙම පණිවිඩය සම්ප්‍රේෂණය කිරීමෙන් යුක්තිගරුක සෞභාග්‍යවත් මිනිස් පරපුරක් ගොඩනැංවීමේ අදහසින් ආචාර්ය ෂූමාකර්, ග්‍රන්ථ බොහොමයක් රචනා කර, ප්‍රකාශයට පත් කළේය. බෞද්ධ ආර්ථික විද්‍යාව ගැන හැඳින්වීමක්

කළ ඔහු පුද්ගලයා හා සමාජයක් විසින් ආර්ථිකය හැඩගස්වා ගන්නේ කෙසේද යන්න බෞද්ධ ඉගැන්වීම් තුළින් පැහැදිලි කළේය.

ද්‍රව්‍යමය සැපත සහ ආධ්‍යාත්මික භාවයත් අතර පවතින හිදැස පුරවා ගැනීමට උනන්දුවක් දක්වන අය වෙතොත්, මේ වර්ෂයේ ෂූමාකර් අනුස්මරණ දේශනයන් ඇසීමට අපි ආරාධනය කරමු, යන ආකාරයෙන් මහජනතාවට කර තිබූ විවෘත ආරාධනාවන් සහිත ලොකු පෝස්ටර් පත්‍රිකා බෙදා හැර තිබුණි.

ඉයුස්ටන් පාරේ 'මිතුරන්ගේ නිවස' (Euston Rd, Friends House) නම් ස්ථානයේ තිබූ තවත් රැස්වීමක් ඇමතීම සඳහා එහි වැඩ සටහනක් සූදානම් කර තිබුණි. 12 වෙනිදා උදෑසන 8.00 ට ඒ සඳහා විශාල සංඛ්‍යාවක් එහි රැස්ව සිටියහ.

ෂූමාකර් දේශනයෙන් පසු මම ආපසු ලන්ඩනයට පැමිණ, මිතුරන්ගේ නිවසේදී මෙන් 'හවුස් ඔෆ් ලෝඩ්ස්' (House of Lords) නම් වූ සාමි මණ්ඩලයේ තවත් දේශනයක් පැවැත්වීමි. 13 දින සවස බ්‍රැඩ්මන් වීරකෝන් මහතා ඔහු එවකට වැඩ කළ IPPF සංවිධානයේ නිලධාරීන් සමඟ මා හමුවීමට පැමිණියේය.

මගේ වැඩ සටහන්වලට ලන්ඩනයේදී මට උපකාර කළ තවත් අමතක නොවන මිත්‍රයෙකි, බොබ් කොන්ඩන් මහතා (Mr.Bob Condon) ඔහු හැම මොහොතේම මා ළඟින්ම සිටියේය. මට එහිදී කොන්දේ අමාරුවක් සෑදී ටිකක් අමාරු විය. මගේ කුඩා බෑගයවත් මට ගෙනියන්න නොදී, ඔහු මා හොඳින් රැක බලා ගත්තේය. ජෑන් සහ ඇයගේ සැමියා ස්ටීව් නේෂන් ද එලෙසින්ම මට ගමන සුව පහසු කරන්නට හුඟක් උදව් කළ කෙනෙකි.

හවුස් ඔෆ් ලෝඩ්ස් (සාමි මණ්ඩල) දේශනය සඳහා මා

හඳුන්වා දුන්නේ ජෝර්ජ් මැක්රොබී විසිනි (Mr. George Mc. Robbie) එය අවසන් වී තවත් දේශනයක් සඳහා මා ඉක්මනින් පිටත් වූ නිසා, මට ජෝර්ජ් සමඟ හිතේ හැටියට කතා කරන්නට නොහැකි වීම පිළිබඳව යම් කනගාටුවක් ඇති විය. එනමුත්, ලංකාවට ආපසු පැමිණි පසු ස්තුති කර ලිපියක් ලියා යැව්වෙමි.

''එදා ඔබ විසින් මා වර්ණනා කළා නොවේද? ඔබ ප්‍රකාශ කළ ඒ සුචරිතය මා විසින් පූර්ණ ලෙස වගා කර ගන්නා තුරු ජීවත් වීමට ඔබ විසින් මට උදව් කළ යුතුයි'' මම ලීවෙමි ''ගාන්ධිතුමා තම සටන ආරම්භ කළේ, ජීවිතයේ දෙවන භාගය ආරම්භ වීමෙන් පසුවයි. වයස අවුරුදු 50 පිරුණු පසුවයි. ජීවිතයේ හතරෙන් එකක් ගෙවී යාමේදී මම, මගේ සටන පටන් ගත්තා. .එය ඉදිරියට ගෙන යාම සඳහා තව ශත වර්ෂ භාගයක් ඉතිරිව තියෙනවා. ඒ නිසායි ඔබට කියා සිටින්නේ මට උදව් කරන්නත් මඟ පෙන්වන්නත් කියා''

ෂූමාකර් පදනමෙහිදී එදා සහභාගි වූ එම උත්සවය මට, මගේ ජීවිතයේ අමතක නොවන සිද්ධියක් යැයි කීවාට වරදක් නැත. සංවිධායකයින්ගේ උත්සාහය හා පරමාර්ථ අනුව විශාල සෙනඟක් එහි රැස්ව සිටියා සේම, පදනමෙහි සභාපති සතිෂ් කුමාර් ඇතුළු අනෙක් සියලුම හිත මිතුරන්ගෙන් මට ලැබුණේ අපරිමිත සහයෝගයකි. කරුණාබර හදවත්වලින් සතුට සොම්නස පිටාරය ගැලූ තරම් වචනයෙන් කිව නොහැකි විශාල තෘප්තිමත් බවක් මම ඒ අනුස්මරණ උත්සව සභාවේදී භුක්ති වින්දෙමි. මා විසින් පවත්වන ලද දේශනය කාගේත් සිත් ගත් බව දින කිහිපයකින් සතිෂ් විසින් මට එවා තිබූ ලිපියේ සඳහන්ව තිබුණි. දේශනයේ පිටපත කලින් Resurgence හිද, පසුව ෂූමාකර් දේශන පොතෙහි තෙවන පිටපතෙහි ද ප්‍රසිද්ධ කරනු ලැබ තිබිණි. Resurgence හි ස්තුති පූර්වක ලැයිස්තුවට මගේ නම ද ඇතුළත් කර තිබුණි.

ෂූමාකර් මහතාගේ බිරිඳ ඩයනා ෂූමාකර් මහත්මිය විසින් බොහෝ ස්තුති කොට මට ලිපියක් එවා තිබුණි. කෙතරම් කලබලකාරී දින වැඩ සටහන් තිබුණද, එහි පැමිණි ජන හදවත්

අවදි වන අන්දමින් කළා වූ එම දෙසුම අතිශය ප්‍රශංසනීය බවත්, එහිදී තමන් විශේෂ වරප්‍රසාද ලත් අය වශයෙන් දැනුණ බවත් තවදුරටත් එහි සඳහන් කර තිබුණි.

ඊළඟ එනම් 85 වර්ෂයේදී සංගමයේ සභාපති වූයේ ෂූමාකර්ගේ දියණිය ක්‍රිස්ටිනා ෂූමාකර්ය. ඉන් පසු වසරවල දිගටම පැවැත්වූ ෂූමාකර් සංගමයේ රාත්‍රී භෝජන සංග්‍රහ උත්සවයන්ට මට ආරාධනා ලැබිණ. නැවත එංගලන්තයට පැමිණි විට ඕනෑම වේලාවක විවේක ගැනීමේ ස්ථානයක් ලෙස සලකා, එහි එන ලෙස කියා තිබුණි. ක්‍රිස්ටිනා ද විශේෂයෙන් ස්තුති කර, 1985 වර්ෂයේ ජූනි මාසයේ මට නැවතත් ලියා තිබුණේ පුළුල් සමාජ වාතාවරණයක් තුළ ප්‍රජා කාණ්ඩ තුළ ධෛර්යය හා තෘප්තිමත් බව ඇති කිරීමට මගේ දේශනය ශක්තිමත් හා ප්‍රාණවත් වූ බව තම විශ්වාසය බවයි. ෂූමාකර් සංගමයේ සියලුම සාමාජිකයින්ගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරමින් ඇය දිගු ලිපියක් ලියා තිබුණි.

ෂු මාකර් විද්‍යාලය

ෂූමාකර් මහත්මිය සහ ක්‍රිස්ටිනා දියණිය සමඟ මා ගත කළ ඒ කෙටි කාලය ෂූමාකර් මහතා හා මගේ හිතවත්කම්වලට නව ජීවයක් දුන් බවත්, මා තවත් ඔවුනට ළංවූ බවත් මම කීවෙමි. ඒ සුහද සොම්නස් හැඟීම් මව් බසින් මිස, වෙනත් කිසිම භාෂාවකින් විස්තර කළ නොහැකි බව මම අවසාන වශයෙන් ලිපියේ සඳහන් කළා මට මතකය.

දිළිඳු කමින් තොර සමාජයක්
ෂූමාකර් අනුස්මරණ දේශනය

මේ වර්ෂයේ එනම් 1984 ෂූමාකර් අනුස්මරණ උත්සවය වෙනුවෙන් කෙරෙන දේශනය සඳහා මට අවස්ථාව ලබා දීම පිළිබඳව ෂූමාකර් සංගමය වෙත මගේ කෘතඥතාවය පළ කරමි. මෙම දේශන මාලාවේ මීට කලින් දේශන ඉදිරිපත් කළ විද්වතුන් මට වඩා උසස් අධ්‍යාපනික සුදුසුකම් ලබා සිටින අය පමණක් නොව, අතිශය පුළුල් බුද්ධිමය හා දාර්ශනික විශාරදයින් වෙද්දී, ඒ බව දැන දැනත් මා හට මෙවන් කාර්යයක් සඳහා ආරාධනා කිරීම ගැන මගේ හිතමිත්‍ර ෂූමාකර් සංගමයේ සභාපති සතිෂ් කුමාර් මහතාට මගේ හෘදයාංගම විශේෂ ස්තුතිය පුද කරන්නෙමි.

අතරමැදි තාක්ෂණික න්‍යායයක් ''පුංචි නම් ලස්සනයි'' (Small is Beautiful) යනුවෙන් අලුතින් ලෝකයට හඳුන්වා දීමටත් ''පුංචි දේ කළ හැකිය'' (Small was Possible) ලෝකයට කියා දීමටත් ආචාර්ය ෂූමාකර් මහතාට හැම විටම උදව් දුන් එතුමාගේ ජීවිත කාලයටම මිතුරු සහායකයා වූ ජෝර්ජ් මැක් රොබී (George Mc Robie) මහතාත් අද මෙතැන සිටීම මට ද යම් ගෞරවයක් අත් වූවා මෙන්ම, ධෛර්යයක් ද ලැබූ බව තවදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

සභාවට මා හඳුන්වා දීමේදී ඔහු සඳහන් කළ කරුණාබර විශිෂ්ට වූ ප්‍රකාශයට මා ප්‍රශංසා කරන අතරම, තවත් වැදගත් යමක් ඒ සම්බන්ධව කිව යුතුව ඇත. එනම් ආචාර්ය ෂූමාකර් මහතා මට හදවතින් සමීප වූ මිත්‍රයෙක් පමණක් නොව, පසුව අපි ශ්‍රී ලංකාවේ සර්වෝදය තුළින් පුංචි හා ලස්සන දේවල් කරන්නට ගිය හැම විටම අපට මඟ පෙන්වූ ශ්‍රේෂ්ඨ ගුරුවරයෙක් හැටියටත් ක්‍රියා කර ඇති

බවත්ය. මා ඉපදී හැදී වැඩුනේ ශ්‍රී ලංකාවේ ගම් ප්‍රදේශයකයි. නාගරික ජීවිතය යනු කුමක් දැයි මා විසින් හඳුනා ගත් මුල් කාලයේ සිටම, තරුණයෙක් හැටියට මට එය රිසි වූයේ නැත. ඒ සමඟ ගැටෙන්නට-ගැටෙන්නට මා තව තවත් සමීප වුයේත්, ඇල්මක් දක්වූයේත් අපේ බෞද්ධ සංස්කෘතික වටිනාකම් තවමත් ජීවමානව පැවැතියා වූ ගැමි සමාජය දෙසට ම ය. ජීවිතයේ අර්ථවත් බව අවබෝධ කර ගැනීමත් මානව අවශ්‍යතා සපුරා ගැනීමත් යන්න අත්පත් කර ගත හැක්කේ ජීවිතයට සම්බන්ධ වූ සමාජීය ආධ්‍යාත්මික සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකම් තුළින් මග පෙන්වන ලද මනාව සංවිධානය වූ කුඩා සංඛ්‍යාවන්ගෙන් යුත් ප්‍රජා කාණ්ඩ මගින් පමණක් බව, මම ටිකෙන් ටික අවබෝධ කර ගත්තෙමි. එක්දහස් නවසිය පනස් ගණන්වල අග භාගයේදීත්, හැට ගණන්වල මුල් හරියේදීත්, ඉන්දියාවට යාම සඳහා මා පොළඹවනු ලැබුවේ මෙවැනි විශ්වාසයන්ය. ඒ කාලයේ විනෝබා භාවේතුමා හා ශ්‍රී ජයප්‍රකාශ් නාරායන්තුමා විසින් මහත්මා ගාන්ධිගේ සංකල්පයන් .භූදාන් ව්‍යාපාරය තුළින් ශක්තිමත්ව ක්‍රියාත්මක කරමින් සිටියහ. ඒ දේවල් සිදුවන ආකාරය බලා ගන්නට ඒ වකවානුවේම මා එහි ගියෙමි. ඒ වන විට ෂූමාකර් මහතා මුණගැසීමට මට සුළු සුළු අවස්ථාවලදී ඉඩකඩ ලැබුණි. වාරනාසි නම් ස්ථානයේ පිහිටි ගාන්ධි ආයතනයේදීත්, එතුමා මුණගැසීමේ වාසනාව ලැබුණි. නමුත් අප හොඳ මිතුරන් වූයේ එකදාස්නවසිය හැත්තෑ ගණන්වලදීය. ඒ එතුමා අපේ ව්‍යාපාරයේ වැඩ කටයුතු බලා කියා ගන්නට ලංකාවට පැමිණි විටයි. ඒ දිනවල මගේ මල්ලී ලන්ඩනයේයි ජීවත්ව සිටියේ. මා ඔහු සමඟ එංගලන්තයේ ටොන්බ්‍රිජ් තුමාගේ නිවසේ රැයක් ද ගත කොට තිබේ.

මගේ තවත් මිත්‍රයෙක් වන ටොන් ඩි වයිල්ඩ් මහතා (Ton de Wilde) එක්දාස් නවසිය හැත්තෑහයේදී ටූල් (Tool) නමින් තිබුණ නෙදර්ලන්තයේ යෝග්‍ය තාක්ෂණ සංවිධානයක ප්‍රධානියා වී සිටියේය. ඔහු දැනට අමෙරිකාවේ වොෂින්ටනයේ ජේ.ටී. අන්තර් ජාතික ආයතනයේ විධායක අධ්‍යක්ෂ ලෙස සේවය කරයි. ටොන් විසින් නෙදර්ලන්තයේ 'නියිමේගන්' නම් ස්ථානයේ අන්තර් ජාතික සම්මේලනයක් සංවිධානය කළේය. එහි ප්‍රධාන දේශනය පැවැත්වීම

සඳහා ආරාධනය කරනු ලැබුවේ ආචාර්ය ෂූමාකර් මහතාටයි. එතුමාගේ දේශනයේ ප්‍රථම සමාලෝචන කතාව ඉදිරිපත් කිරීමට බාර වූයේ මටය.

එදා ෂූමාකර් මහතාට කලට වේලාවට දේශනය පැවැත්වීමට පැමිණීමට නොහැකි විය. ලන්ඩනයේ සිට පිටත්වීමට නියමිතව තිබූ ඔහු රැගෙන එන ගුවන් යානය අනපේක්ෂිත ලෙස ප්‍රමාදවීම නිසයි එය සිදුවූයේ. සම්මේලනය ආරම්භ කිරීමට හරියටම මිනිත්තු පහකට කලින් සම්මේලන කොන්ග්‍රසයේ සභාපතිට එතුමා දුරකතනයෙන් කතා කළා. පසුව මා එතැනට කැඳවනු ලැබුවා. ෂූමාකර් මහතාගේ සුවිශේෂ කටහඬින් ඔහු මට කීවේ කුමක්ද?

'අද ප්‍රධාන දේශනය කළයුත්තේ ඔබයි' මා පැමිණි පසු ඔබගේ කතාවේ සමාලෝචනය ඉෂ්ට කරන්නම්'.

මා එය පිළිගැනීමට එක හෙළාම විරුද්ධ වූ නමුත්, ඉන් ඵලක් වූයේ නැත. අවසානයේදී ඉල්ලීම මම පිළිගතිමි. උසස් පෙළේ විද්‍යාඥයින් තාක්ෂණිකයින් රාශියක් අභිමුඛයේ මා යන්තම් දැන ගෙන සිටි විෂයයක් පිළිබඳව දේශනයක් පැවැත්වීමි.

භෞතිකවාදීන් ලෙස තමන්ව හඳුන්වා දෙන අය වුවද, රහසින් හෝ විඥානවාදී මාර්ගයන්ට යොමු විය යුතුව ඇත. එම නිසා කොතරම් බුද්ධිමත් වුවද, මමත්වය කේන්ද්‍ර කොට ගත් ජීවිතය ඇත්තේ අනතුරෙහිය.

ආධ්‍යාත්මික මාර්ගෝපදේශකත්වය විශ්වාස කරන්නෙකු ලෙස මම ආචාර්ය ෂූමාකර් මහතා විසින් මා වෙත එල්ල කරනු ලැබූ අභියෝගයට මුහුණ දීම සඳහා මගේ ගුරුතුමන් වූ බුදුන් වහන්සේගේ ධර්මය දෙසට හැරුණෙමි.

මගේ සිත ක්ෂණයකින් දිව ගියේ මගේ ළමා කාලය දෙසටයි. ගමේ පන්සලේදී මා ඉගෙන ගත් බොදු මාර්ගය මට සිහිපත් විය. මිනිසාගේ ආර්ථික සංවර්ධනයට අදාළ වන්නා වූ දහම් පාඨයන් කිහිපයක් මතක් කර ගත් මම, වර්තමාන ලෝකයට සරිලන පරිදි එම ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගත්තේ කෙසේ ද යන්න කල්පනා

කර අදාළ කරුණු සුදුසු පරිදි සකස් කර ගතිමි. මගේ දේශනය එම කරුණු මත සම්පූර්ණයෙන් පදනම් වී තිබුණි.

එම සිද්ධියට කාලයකට පසුව ෂූමාකර් මහතා විසින් රචනා කරනු ලැබූ බෞද්ධ ආර්ථිකය යන මැයින් පරිච්ඡේදයක් ලියැවුණු 'පුංචි නම් ලස්සනයි' පොත මුළු ලෝකයේම විශේෂ අවධානයට යොමු වුණා. බුදුදහමේ අගය එම සිද්ධිය නිසා මුළු ලෝකයේම ප්‍රශංසාවට ලක්වුණා නොවේද?

එදා පැය දෙකකට පසු ආචාර්ය ෂූමාකර් මහතා එහි පැමිණියේය. මගේ දේශනයේ වීඩියෝ පටය නරඹමින් දේශනය ශ්‍රවණය කළ එතුමා, එහි සමාලෝචන ප්‍රතිචාරය ආරම්භ කළේය. මගේ ප්‍රකාශනයන්ට උත්තර දීමට පටන් ගත්තේය. විශේෂයෙන් ඔහුගේ සමාලෝචනයන්ට ලක් වූයේ මා විසින් කරන ලද බෞද්ධ ආර්ථික විග්‍රහයයි.

'ආර්ථික විද්‍යාව හා තාක්ෂණය' පිළිබඳව ඔහුගේ තිබෙන්නේ සම්‍යක් දෘෂ්ටික අදහස්. ඒවා සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ ප්‍රධාන අංගය බවට පත් වී තිබුණා එපමණක් නොව මගේ සිතිවිලි හැඟීම් ද එදා පටන් ඒ ඔස්සේම ගමන් කළා.

මහා චින්තකයෙක් වූ තරමින් මිනිස් වර්ගයාගේම සේවයට ඇප-කැප වූ අප හැමගේ හදවත් දිනාගත් ෂූමාකර් මහතා මගේ දේශනය සමාලෝචනය කළේ ඒ විදියටයි. එතුමා එතරම් නිහතමානී කෙනෙක් වූ තරම්.

ඔහුගේ හදිසි අභාවයට මාස කිහිපයකට පෙර මට නැවතත් සුළු කාලයකට ඔහු මුණගැසුණා. වියානාවල පැවැති අන්තර් ජාතික ස්වේච්ඡා සේවා සමුළුවේදී තම වැඩ කටයුතුවලින් ඊළඟ වර්ෂය නිවාඩු ගෙන ගත කරන බව එදා මා සමඟ කීවේය. එම පරමාර්ථය ඉෂ්ට කර ගැනීමට එතුමාට නොහැකි වූ බව ඔබත් මාත් හොඳින් දන්නා දෙයකි. තම පණිවුඩය මුළු මිනිස් සංහතිය වෙත ප්‍රදානය කිරීම එතුමාගේ ප්‍රාර්ථනය වී තිබුණි. ලෝකයේ සෑම තැනින්ම ඒ වන විට ඔහුගේ කෘතිය සඳහා විශාල ඉල්ලුමක් තිබුණත්, එම සේවාවේ යෙදී සිටියදී ස්විස්ටර්ලන්තයේදී ඔහු හදිසියේ මිය ගියේය.

දැන් අපට පැවැරී තිබෙන කාර්යය වනුයේ එතුමා ඉතිරි කර ගිය ඒ සත් ක්‍රියාවන් නොකඩවා ගෙන යාමටයි. 'පුංචි නම් ලස්සනයි' සහ ඔහුගේ අනෙක් කෘතීන්ට අදාළව පමණක් නොව, ඔහුගේ නාමයට ගෞරව දැක්විය හැකි තවත් උචිත අවස්ථාවන් තිබේ. එනම් ඔහුත් මාත් අප දෙදෙනා විසින්ම ඔහුගේ යම් සංකල්පයන් ක්‍රියාවට නැංවීමට බොහෝ වෙහෙස මහන්සි ගත්තෙමු. එහිදී අප විසින් දරනු ලැබූ ප්‍රයත්නයන්හි අත්දැකීම් ඔබ සමඟ බෙදා ගැනීම එතුමාට විශේෂ ප්‍රණාමය දැක්වීමක් ලෙස මම සලකමි.

දිළින්දාගේ විශිෂ්ටත්වය

ලින්ඩිස් ෆ්‍රේන් සමුළුවේදී ෂූමාකර් මහතා විසින් ඉදිරිපත් කරන ලද දේශනයේ විමධ්‍යගත කිරීම සඳහා ආධ්‍යාත්මික පසුබිම අන්තර්ගත වූ යම් එක් අදහසක් පිළිබඳව පමණක් සුළු විග්‍රහයක් කරන්නට මා කැමතියි.

කතා කිරීමෙන් නොව, එම සංකල්පයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමෙන් පමණකි, අරමුණු කර ගත් යම් සත්‍යමය වෙනසක් සමාජයක් තුළ ඇති කළ හැක්කේ. එවැනි සාර්ථක අත්දැකීමක් ලබා ගැනීමට සරිලන පරිදි ඉඩ ප්‍රස්ථාවක් උදා කර ගන්නේ කෙසේ දැයි අවබෝධ කර ගැනීමට පහසු වන කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මම අදහස් කරමි. එවැනි යම් වැඩ පිළිවෙලක සාර්ථකත්වයක් දැකිය හැක්කේ පුද්ගලයින් කුඩා සංඛ්‍යාවක් පමණක් සිටින කණ්ඩායම් තුළින් ඒවා ක්‍රියාත්මක කිරීමෙනි. එක අතකින් බලන විට, අපගේ පරමාර්ථයන්ට අනුව විමධ්‍යගත කිරීම සඳහා කිසිම සිද්ධාන්තයක් ඒ සඳහා අවශ්‍ය වන්නේ නැත. අතීතයේ ජීවත් වූ යෝධ ඩයිනෝසිරස් සත්වයින් ලිස්සා වැටෙන්නේ ඔවුන්ගේම බර නිසාය. එමෙන්ම සුළු ජාතීන් නව වෙනස් ක්‍රමවලට හැඩගැස්වීමේ සිද්ධිය ද සිදු කෙරෙන්නේ ඉතාම අඩුවෙන් වන අතර, ඒ නිසාම ඒ කරුණෙන්ම විමධ්‍යගත වීම ඉබේම සිදුවේ.

අපි කවුරුන් හෝ වේවා විශාල බලසම්පන්න සංවිධානවලින් ඇත්තටම ආධාර බලාපොරොත්තු වෙයි නම් මගේ

අදහසේ හැටියට ඔහු කරන්නේ තමන්ගේ වටිනා කාලය නාස්ති කර ගැනීමකි. එවැනි අනාථයන්ට ආධාර නිකුත් කරනු ලබන සංවිධාන හෝ ආයතනයන් සුවිශාල තත්ත්වයෙන් පමණක් නොව බල පුලුවන්කාරකමින් ද අනූනය. මන්ද, ඒවායේ අලුත් ක්‍රම සම්පාදනයන් සිදු නොවන හෙයිනි.

ඒ නිසා කළයුතු හොඳම දෙය නම්, ඔවුන් අමතක කර දැමීමය. තවත් ඕනෑ නම්, ඔබ කාර්ය ශූරයෙක් නම්, ඔවුන්ව කිරි හරක් ලෙස භාවිතා කිරීමෙන් අවස්ථානුකූල ප්‍රයෝජනයන් ලබා ගැනීමයි.

මා ඔබට මේ දේවල් ප්‍රකාශ කරන්නේ සර්වෝදය ව්‍යාපාරය තුළින් ලබාගත් අවුරුදු 26 ක අත්දැකීම් ආශ්‍රයෙනි. එයත් කුඩා ප්‍රජා කණ්ඩායම් වශයෙන් ගෙන දියුණු කිරීමට ගන්නා ලද ප්‍රයත්නයකි. ශ්‍රී ලංකාවේ ජීවත් වන හත්දහකටත් අධික ගැමි ප්‍රජාවන් ද පිට රටවල් ගණනාවක සිටින එවැනි ප්‍රජාවන් සිය ගණන් ද කුඩා කණ්ඩායම්වලට වෙන් කර සංවර්ධන කාර්යයන්හි පොළඹවමින් ක්‍රියාත්මක කරවමින්, සර්වෝදය ව්‍යාපාරය ඉතා සතුටුදායක ප්‍රතිඵල අත්පත් කර ගත්තේය. 'ශ්‍රමදාන' යන්නෙන් අදහස් කරන්නේ, සෑම දෙනාගේම ශුභසිද්ධිය උදෙසා ශ්‍රමශක්තිය සහජීවනයෙන් බෙදා හදා ගැනීමයි. සර්වෝදය ශ්‍රමදානය යනු ඒ තුළින් 'සෑමදෙනාගේ අවදිවීම' හෙවත් උදාවයි.

සංවර්ධන කාර්යයන්හි නියැලී වැඩ කරන විට අපට මුණගැසෙන මිනිසුන් ජීවත් වන රටාව හා සිතුම් පැතුම් අනුව, කාණ්ඩ හතරකට බෙදා වෙන් කළ හැකිය.

ප්‍රථම කාණ්ඩය යමක් කරකියා ගන්නට හැකි බලවත් අයය. ධනය බලය තේජස යන්න ජීවිතයේ සත්‍ය පරමාර්ථය ලෙස ඔව්හු විශ්වාස කරති.

පරිපූර්ණ ජීවිතයක් යනු, ධනයෙන් බලයෙන් සපිරි එකක් යැයි අරමුණු කරගත් දෙවැනි කාණ්ඩයේ ජන කොටස් එම තත්ත්වයන් වෙත ප්‍රවේශ වීමට වීර්ය දරන්නෝය.

ඉහත කී සෑම දෙයක්ම සත්‍ය වශයෙන්ම තමන් සතුව ඇති නමුත්, සරල හා චාම් ජීවිතයක් කරා යාම සඳහා විකල්ප මාර්ග

සොයමින් අතෘප්තිමත් ජීවිත ගත කරන ජන කොට්ඨාශ තුන්වන කාණ්ඩයට අයිති වේ. ඔවුන්ගේ ජීවිත සෞභාග්‍යයෙන් අනූන වුවද ජීවත් වන්නේ අසන්තෝෂයෙන්මය.

අපට මුණගැසෙන හතරවන කාණ්ඩයේ ජනතාව දිළිඳුය. බල රහිත නිසා අසරණය. නමුත් ඔවුන්ගේම සංස්කෘතික වටපිටාවන් තුළ නිදහස් මනුෂ්‍යයින් ලෙස ජීවත් වීමට හැකි වන පරිදි, දිළිඳුකමින් තොර සමාජයක් කරා ප්‍රවේශවීමට හැකියාවක් ඇත්නම්, ඔවුන් ඇත්තෙන්ම තෘප්තිමත් ප්‍රජාවකි.

සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය දුප්පතාගෙන් සංයුක්ත වූ සියලු දෙනාගේම උදාව සඳහා නිර්මාණය වූ දුප්පතාගේ ව්‍යාපාරයකි. එහි පරමාර්ථයන් හුදෙක්ම ඉහත සඳහන් හතරවන කාණ්ඩය සඳහා විශේෂිත වුවද, ඉතිරි මුල් කාණ්ඩ තුනට අයිති ජන කොට්ඨාශයන්හි නවෝදය සඳහා ද සර්වෝදය සේවාවන් ඒ ලෙසම ක්‍රියාත්මක වනු ලැබේ. අපි අපේ ප්‍රජා සංවර්ධන සේවාවන් ආරම්භ කිරීමේදී ඉලක්ක කාණ්ඩ ලෙස සහභාගි කරවා ගනු ලබන්නේ, සමාජයේ සිටින ඉතාමත් පීඩාකාරී අසරණ ජනතාවය. එම වැඩ සටහන් හා ක්‍රියාකාරිත්වයන් සම්පූර්ණයෙන්ම පදනම් වී තිබෙන්නේ පශ්වාත් නවීන සමාජයක් නිර්මාණය කිරීමෙහි ලා මුල පිරීමට යොමු වන ඔවුන්ගේම ප්‍රජා නායකත්වය මතය.

හිටපු ගාන්ධි ශිෂ්‍යයෙක් වූ මහාචාර්ය සුගතදාස් ගුප්ත මහතා විසින් කරන ලද ප්‍රකාශයක් මෙහිදී සිහිපත් කරමි: ''අපගේ වෑයම කිසි සේත් විකල්ප සමාජයක් ගොඩනැංවීම සඳහා නොවේ. අපේ මුතුන්මිත්තන් ජීවත් වූ අපේම පැරණි සමාජයන්හි සිට පශ්වාත් නවීන සමාජයක් කරා අඛණ්ඩව ගමන් කිරීමටය.''

අප විසින් එම නවීන සමාජය හඳුන්වනු ලබන්නේ දිළිඳුකමින් තොර සමාජයක් හැටියටය. තවද අපේ බලා පොරොත්තුව නවීන සමාජය මගහැර යන්නටය. එය වනාහි තිරසාර නොවන්නා වූ එකක් බවයි, අපේ විශ්වාසය. පසුගිය වසර 26 තුළදී සර්වෝදය ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වයන් මෙලෙස කෙටියෙන් විස්තර කළ හැක:

* ප්‍රජාවන්ට තම සම්ප්‍රදායික අගයන් කෙරෙහි විශ්වාසය වර්ධනය කර ගැනීමට ආධාර කිරීම.
* උචිත තාක්ෂණික කුසලතාවයන් සමග ප්‍රජා සහභාගිත්ව පද්ධති ශක්තීකරණය කිරීම මගින් ඔවුනට තමන්ගේ අවශ්‍යතා තෘප්ත කර ගැනීමට අවශ්‍ය සැළසුම් හා ක්‍රියාත්මක හැකියාව ලබා දීම.
* ආර්ථික සමාජීය හා දේශපාලනික ජීවිතයට අදාළ වන්නා වූ තම අයිතිවාසිකම් හඳුනා ගැනීමට හැකි වන පරිදි දැනුවත් වීමට නීති සංවිධාන ආයතනවලට ප්‍රජා සංවිධාන යොමු කිරීම.
* ස්වයං තීරණ ගත හැකි වන පරිදි ශක්තිමත් නිදසුන් සහිතව, විවිධ මට්ටම්වල පරිපාලන පද්ධති මගින් ඔවුන්ගේම ස්වාධීන ඒකකයන්හි පාර්ශවික ජාලයන් සංවිධානය කිරීම.
* සමාන පරමාර්ථ සහිත ප්‍රජා සංවිධාන අතර අන්‍යෝන්‍ය උදව් උපකාර ලබා ගැනීමට හැකි වන පරිදි සහෝදර සබඳතා ඇති කරවීම.

පුද්ගලයාගෙන් ආරම්භ වී, පවුල ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන් ඔස්සේ විශ්වය පුරා ප්‍රචලිත වන පරිදි සැලසුම් හා ක්‍රියාත්මක කරනු ලබන මෙම ස්ව සංවර්ධන, ක්‍රියාකාරිත්වයන් අන්තිමේදී ඔවුනොවුන් විසින්ම සංවිධානය කර ගන්නා ජගත් ව්‍යාපාරයන් බවට පරිණාමය වේ යයි අපි විශ්වාස කරමු. දැනට ලෝකයේ පවතින ඒක සංස්කෘතික වූ තම තමන්ම විනාශය කරා යොමු වන්නා වූ මෙම නැඹුරුවල ඉදිරියේදී කුමන ක්‍රමයකින් හෝ යුක්ති සාධාරණව වෙනස් වේය යන්න ස්ථිරය. විවිධ ජාතීන් තුළින් ක්‍රියාත්මක වන යෝධ සන්නිවේදන සංවිධාන අද ලෝකයේ ඇත. ඒවා දේශපාලනික කාර්මික වාණිජමය මූල්‍යමය තාක්ෂණික හෝ මොන යම් විදියේ හෝ වේවා මිනිස් සංහතියටම ඉන් සිදුවන්නේ විශාල ව්‍යසනයකි. එම ව්‍යුහයන්හි ක්‍රියාකාරිත්වයන් සහ අපේ සමාජයන් තුළ සුලභව දක්නට ඇති දරිද්‍රතාවය වර්ධනය වීම අපරාධ, සන්නද්ධ ගැටුම් යුද්ධ පාරිසරික විනාශය සංස්කෘතික පරිහානිය යන සිද්ධීන් අතර පවතින්නා වූ ඉතා සමීප සබඳතාවය එම සංවිධාන බලධාරීන්ට ඒත්තු ගන්වා ඒ අනුව නිවැරදි ක්‍රියා මාර්ගයන් ගැනීමට පෙළඹවීම කළ හැකි දෙයක් යැයි මා සිතන්නේ

නැත. මුළු ලෝකයටත් මිනිස් සමාජයටත් විනාශයේ හේතු සාධක වන එකී යෝධ සංවිධාන වැඩි හරියක්ම පාලනය වන්නේ මීට කලින් මා විසින් සඳහන් කරනු ලැබූ ප්‍රථම කාණ්ඩයේ අය විසිනි. මේ සම්බන්ධයෙන් ආචාර්ය ෂූමාකර් මහතා නිවැරදිව ප්‍රකාශ කළ පරිදි, සමහර විට අප සිතන්නේ ඔවුන් මේ ගැන දැනුවත් නැත කියාය. මේ සිද්ධීන් හා තත්ත්වයන් පිළිබඳව එම බලධාරීන්ට ආයාචනය හෝ කරුණු පැහැදිළි කිරීම මගින් කිසිම ඵලයක් වන්නේ නැත. මේ මිනිසුන් ඒ හැම දෙයක්ම අපට වඩා හොඳින් දන්නා අයය.

මෙවැනි සමාජ පද්ධතීන් තුළ සිදු කර ගෙන යන ක්‍රියාදාමයන්හි හුදු ප්‍රතිඵලයන් ලෙස එම නිර්මාණකරුවන්ටම විෂම වූ පරස්පර විරෝධී සිද්ධීන්ට මුහුණ පෑමට සිදුවන්නේ නිරායාසයෙනි. එම වාතාවරණයන් නිර්මාණය කළ ඔවුනටම තදබල ලෙස පහර වැදීමට පටන් ගන්නේ මේ අවස්ථාවේදීය. ඒ වගේම, අද දවසේ ලෝකයේ ජීවත් වන ලක්ෂ සංඛ්‍යාත මනුෂ්‍යයන්ගේ ඉමහත් දුක් වේදනාවන් තමන්ට සිහිපත් වන මොහොත මෙයයි. තමාටද රිදුම් දෙන බැවිනි. එවැනි චිත්ත වේදනා ගෙන දෙන අත්දැකීම් ඒ අය වෙත ප්‍රවේශ වන්නට එතරම් ප්‍රමාද වන්නේ නැත. එතෙක් ගත වන කාලාන්තරය අපේ වාරයයි.

සර්වෝදය ව්‍යාපාරය අනුගමනය කරමින් මූලික ලෙස කණ්ඩායම් සෑදී, ඉතිරි මිනිස් වර්ගයාත් සමඟ ඒකරාශී වී අත්වැල් බැඳ ගනිමින්, යුක්ති ගරුක හා සාධාරණ තිරසාර වූ සාමකාමී සමාජයක් ගොඩනැංවීම සඳහා සාමූහිකව කටයුතු කරන්නේ නම්, මානව සංහතිය බේරා ගැනීමට තවමත් ඉඩ ප්‍රස්ථාව ඇත. එවැනි හිතකර වූ වාතාවරණයක් නිර්මාණය කළ විට, ඉහත කී සුපිරි ධනවතුන්ටත් අන් අයට මෙන්ම ජීවිතයේ තෘප්තිමත් හා සුවදායී බව ඉන් භුක්ති විඳිය හැක.

යථාර්ථය කුමක් ද යන්න අවබෝධ කර ගැනීමට එම සුපිරි කොටියාශයන් විසින් තවමත් අසමත් වන්නේ නම්, අප විසින් කළ යුතුව තිබෙන්නේ තමන් විසින් කරනු ලබන කල් ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයන් තමා විසින්ම භුක්ති විඳීමේ විශ්ව නීතියට අනුව ස්වභාවයෙන්ම ලැබෙන ප්‍රතිඵලයන්ට ඔවුනටම මුහුණපෑමට ඉඩ හැරීමය.

දෙවන සහ තුන්වන කණ්ඩායම් වෙනුවෙන් ද යහපතක් සැලසීම සර්වෝදය ව්‍යාපාරයේ. ඔවුන්ගේ කැමැත්ත තිබේ නම්, අප ජීවත් වන ලෝකය පිළිබඳව මෙතෙක් තමන් සතුව පැවැති අදහස් පිළිගැනීම් සහ ජීවන රටාව තම තමන්ට සරිලන පරිදි වෙනස් කර ගැනීමට අපට උදව් කළ හැකිය. ඔවුනොවුන් විසින් යම් කැපවීමකින් ඒ සඳහා ඉදිරිපත් වන්නේ නම්, අවිහිංසාවාදී මෙන්ම යම් නිර්මාණාත්මක ක්‍රියා පටිපාටීන් භාවිතා කිරීමෙන් දිළිඳු කමින් සහ සුපිරි බවින් තොර සමාජයක් (No Poverty No Affluent Society) ගොඩනැංවීම සඳහා අත්වැල් බැඳ ගනිමින් අප සමඟ එක් වන ලෙස අපි ආරාධනය කරමු.

ලෝකය තුළින් තෝරා ගත යුත්තේ කවුරුන් දැයි සැලකීමේදී, දිළිඳු හා අසරණකමින් යුක්ත වුවද, අවබෝධයක් ඇති දුප්පතා ඒ සඳහා විශේෂයෙන් සුදුසු වන බව අතිශයින් පැහැදිලිය. පශ්චාත් නවීන හා පශ්චාත් කාර්මීකරණ නව සමාජයක් ගොඩනැංවීමේ වගකීම බාර වන්නේ අධික පාරිභෝජනයට තුඩු දෙන්නා වූ මහා පරිමාණයේ නිෂ්පාදනයන්ට නැඹුරු වී සිටින ප්‍රචණ්ඩ සමාජයක නිශ්ඵල බව අවබෝධ කර ගැනීමට හැකි, අන්තර් දෘෂ්ටියක් සහ බුද්ධිමය හැකියාවක් තමන් සතු වූ නමුත්, දිළිඳු හා අසරණව සිටින ජනතාවටය. තවද අසරණ වූ දිළිඳු ජනතාව ව්‍යාකූලත්වය, මානසික චංචල බව හා අසහනය වැනි දේට මුහුණ දෙන්නේ අන් හැමටම වඩා අඩුවෙන්ය.

සිද්ධාන්තයට පෙර ක්‍රියාව ඉස්සරවීම (Theory Follows Practice)

ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරයේ මූලික ප්‍රයත්නයන් අපි ආරම්භ කළේ කලින් සොයා ගත් හෝ නිර්මාණය කර ගත් සිද්ධාන්තයන්ට අනුව නොවේ. සිද්ධාන්තය හෙවත් මූලධර්මය හෙළිදරව් වූයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් අවසාන වීමෙන් පසුවය. අප මෙතෙක් පැමිණි දුෂ්කර දිගු ගමනේදීත්, එදා මෙන් අදත් ඉදිරියට එන අභියෝගයන්ට බුද්ධිමත්ව ප්‍රතිචාර දැක්වූයෙමු. සමාජ සේවා ක්ෂේත්‍රය තුළින් අපට ඉගෙන ගැනීමට බොහෝ දේ ඇත. දොම්නස් වී දුක් පීඩා විඳිමින් ආර්ථිකව දුර්වල වෙමින්, දේශපාලනික ලෙස කොන් වී සිටින ඈත ගම්වල ජීවත් වන අපේ අසරණ සහෝදර සහෝදරියන් වෙත අපි ගියෙමු.

අපේ ඉගෙන ගැනීම් පාරාසය පුළුල් කර ගැනීම අපේ අරමුණ විය. මුල් කාලයේදී අපට තරුණ ගුරුවරුන් හා ශිෂ්‍යයන් අවශ්‍ය එම ජනතාවට සේවය කිරීමටයි. අපි, අපට ලබා ගත හැකි වූ සම්පත් යොදා ගනිමින් අපගේ ශ්‍රම ශක්තිය ප්‍රදානය කර ඔවුන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීමට, වැඩ කරන ගමන් අපි අපේ සමාජ සේවා සංරචකය සමඟ ඉගෙන ගැනීමේ අත්දැකීම් ද එකට මුසු කර ගත්තෙමු.

සමාජයේ ඉතා පහළින් සිටින කුල හීනයන් ලෙස සැලකෙන ජන කොටස් දෙසීයකට වඩා එදා එම ගම්මානයන්හි ජීවත් වෙනවා අප නිරීක්ෂණය කළා මට මතකය. එම ප්‍රදේශයන් අපගේ අධ්‍යයන සේවාවේ ප්‍රථම ක්ෂෙත්‍රයයි. එම කුල හීන අසරණ ජනතාව ඒ සමාජවලම වෙසෙන උසස් කුල පැලැන්තිවල උදවියගෙන් නිතර හිරිහැර අවමන්වලට භාජනය වුණ හැටි තමවත් පැහැදිලිව මගේ මතකයේ තිබේ. මෙම බෙලහීන ජනතාවගේ ජීවන රටාවන් විවිධ සමාජයික අන්තර් සබඳතා හා ඔවුන් විඳින්නා වූ අනේක විද දුක් ගැහැටත් සියලු වතගොත පිළිබඳව පර්යේෂණ විමර්ශන කිරීමට හා පොත් ලිවීම සඳහා නම්, දේශීය-විදේශීය උගත් ශ්‍රී ලාංකිකයින් නිතර ඒවායේ ආ ගිය නමුත්, එම අසරණයින්ට කිසිම අතකින් උදව් උපකාර කිරීමට කිසිවෙක් ඉදිරිපත් වූයේ නැත.

ගිය සතියේ මා අමෙරිකාවට ගිය අවස්ථාවේදී මෙම සම්ප්‍රදායන් සම්බන්ධයෙන් විදේශික ශ්‍රී ලාංකික සමාජ විද්‍යාඥයෙක් එහි පුවත්පතක ලිපියක් පළ කර තිබුණි. ඔහු කවදාවත් සර්වෝදයට පැමිණියේවත්, අප සමඟ කතාබස් කර ඇත්තේවත් නැති කෙනෙකි. එකී ලිපියේ ඔහු හුඟක් කනගාටු වී තිබුණේ යම් සිද්ධියක් පිළිබඳවයි. එනම්, එක්තරා ප්‍රසිද්ධ ජර්මන් සමාජ විද්‍යාඥයෙකු විසින් සර්වෝදය ව්‍යාපාරය පිළිබඳව ලියා තිබූ වටිනා පොතක අඩංගු කර තිබූ යම් පාඨයක් පිළිබඳවය.

''තම ව්‍යාපාරයේ ජාති-කුල-භේද සංකලනය සම්බන්ධයෙන් සර්වෝදය විසින් කිසිවක් සඳහන් කර නැත. ඒ කාලයේ ගම් පළාත්වල දක්නට ලැබුණු කුලභේද විෂමතාවයන්හි සත්‍යය දැකීමෙන්, තරුණයින් ලෙස අපි පුදුමයට පත්වීමු.''

ඒ කාලයේදීත් මේ වගේ සමහර බටහිර සමාජ විද්‍යාඥයින් අප ව්‍යාපාරයන් තුළ නොයෙක් සීමාවන් පැනවීමට සූදානම් වූවා පමණක් නොව, මිනිසාට, මිනිසා විසින්ම අඩත්තේට්ටම් කරන කාලයක එවැනි පාපතර ක්‍රියාවන් අප සමාජය තුළ හැමදා පවතින්නට සලස්වන්නත් උත්සාහ කළහ. එපමණක් නොව, ඔවුන්ගේ බටහිර පන්නයේ ක්‍රමයටවත් කිසියම් යුතුකමක් එම ජනතාවට ඉෂ්ට කළේ නැත. එනම්, අපේ සංස්කෘතියේ අතිශය ලෙස රැඳී පවතින්නා වූ සම්ප්‍රදායික වටිනාකම් සම්බන්ධයෙන් බටහිර සමාජය දැනුවත් කිරීමටත්, ඔවුන් අපොහොසත් වූණි. එවැනි දෙයක් කිරීමට වෑයමක් කළා නම්, අප වන් නිහතමානී පුද්ගලයින් පමණි.

ඉහතින් මා දැක්වූ ආකාර සමාජ විද්‍යාඥයින්ට කියන්නේ අධ්‍යයන බ්‍රාහ්මණයින් කියාය. ඔවුන්ගේ දැනුම් සම්භාරයම මිස, මිනිස් ගතිපැවතුම් අල්පය. මෙම බ්‍රාහ්මණයින් අපව හඳුන්වන්නේ අතීත සමෘද්ධිමත් ලෝකයේ තවමත් ජීවත් වීමට වෙර දරන චින්තකයින් යනුවෙනි.

අධ්‍යාපන බලධාරීන්ගේ නොමනා පාලනය මගින් ද ඒ කාලයේ අපට පාර වසා තිබුණි අධ්‍යාපනය යන්න පන්ති කාමරයෙන්, අච්චු පොතින් හා විෂය නිර්දේශ යන සීමාවලින් පිටතට අපි ගත්තෙමු. ඉගෙන ගැනීම අධ්‍යාපනය යන්න මිනිසාගේ ජීවිතයේ යථාර්ථය වෙතට හෙවත්, අපට තහනම් වූ ප්‍රදේශයක් කරා අප විසින් ගෙන යාම එයට හේතුවයි. නොසලකා හැරීම් උපහාසයන් අපයෝජනයන් දඬුවම් පවා අපි වින්දෙමු. නමුත් අපේ අධිෂ්ඨානයන් අසරණ වූ දුප්පතාගෙනුත්, දුප්පතාට සෙත සැලසීමේ ක්‍රියා කලාපයන් කිසි විටෙක අත් හැරියේ නැත. එදා මෙන්ම අදත්, අපගේ වැඩ සටහන්වල අධ්‍යාපන සංරචකය වන්නේ පොත්පත් විභාගවලින් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් නොවේ. ජීවිතයේ ජය ලබා ගැනීම සඳහා උපරිම ධෛර්යය, ශක්තිය ඇති කරවීම සඳහා පුද්ගලයා අවදි කිරීමයි අපේ පරමාර්ථය. එය ඔහුගේත් අපගේත් ආධ්‍යාත්මික සංවර්ධනය හා සබැඳි මානසික ප්‍රබෝධය තුළින් ජනිත වන ජීවනයේ නවෝදයයි. සමගි සමාදානයෙන් එක්ව වැඩ කිරීමෙන් සැම දෙනාගේම යහපත උදාකර ගැනීමේ ක්‍රමයයි.

මෙම සේවාවන්හි යෙදෙන විට ඉන් අප ලබන දැනුම, යම් පුද්ගලයෙකුට විසින් ඉතා විරල ලෙස අත්පත් කර ගත හැකි ඒවාය. එපමණක් නොව, ඥානාන්විතව ක්‍රියා කිරීමට අපට එම අත්දැකීම් ඉතා ප්‍රයෝජනවත්ය. පුද්ගලයාගේ අවදි වීම යන්න ඇති වන්නේ ජීවිතයේ සත්‍ය අත්දැකීම් තුළිනි. අප ව්‍යාපාරය ආරම්භ කළ මුල් කාලයේදී පුද්ගලයාගේ උදාව පිළිබඳ සංකල්පය රට පුරා ව්‍යාප්ත කළෙමු. තුන් ලක්ෂ පනස්දහසක් පමණ ග්‍රාමීය ජනතාව ඒ ගැන උනන්දු කරවා, පොදු සේවා සඳහා ඔවුන්ව ඉදිරිපත් කරවීමට සමත් වීමු. වැඩි දෙනෙක්ම තරුණයින් වූ ඔව්හු, සිය ගණනින් අප හා එක් වී විවිධ ජාති ආගම්වලට අයිති මිනිසුන් වෙසෙන දුරස්ත ප්‍රදේශවලට ගොස් ශ්‍රමදාන කඳවුරු පැවැත්වූහ. සියලු මනුෂ්‍යයාට එක සේ ගෞරව කිරීමටත් දුක් පීඩාවන්ගෙන් මිදීම සඳහා සානුකම්පික ක්‍රියාවන්හි යෙදීමටත්, අන්‍යයන්ගේ යහපත උදෙසා නිහතමානී සේවාවන්හි යෙදීමෙන් ජීවිතයේ සතුට භුක්ති විඳීමට ඉගෙන ගැනීමටත් දුක, සැප, ලාභ, අලාභ හා යස, අයස, උපේක්ෂා සහගතව එක සේ විඳ දරා ගැනීමටත් ඉගෙන ගැනීමට මිනිසුනට ආධාර කිරීමටත් ඉහත කී ශ්‍රමදාන කර්තව්‍යයන් මාහැඟි පිටුහලක් වන බව අපි පසක් කර ගතිමු.

ඇත්තෙන්ම අනෙකුත් වරප්‍රසාදයන් වන නායකත්ව සංවර්ධනය ජනතාව තුළ ඔවුනොවුන් අතර මනෝවිද්‍යාත්මක අන්තර් සබඳතා ගොඩනැංවීම පාරවල් තැනීම වැනි තවත් බොහෝ යටි තල නිර්මාණ ක්‍රීයාකාරිත්වයන් ඉදි කිරීම් ප්‍රජා ශාලා ළිං වැසිකිළි තැනීම ආදී සියලුම දේත් සැලකිය යුතු වැදගත්කමක් ඇති කාර්ය භාරයන් වුයේය.

අප ව්‍යාපාරයට සම්බන්ධ වී සිටි යම් කෙනෙකුගේ අහඹු ආධාර දීමනාවක් හැරෙන්නට, පසුගිය වසර දහය තුළ දි අපට දේශීය හෝ විදේශීය වශයෙන් කිසිම අරමුදලක් ලැබුණේ නැත. ගැමි ප්‍රජාවන් විසින් ඔවුනොවුන්ගේම සම්පත් පොදු යහපත උදෙසා යොදා වැඩ කිරීමෙන් සේවා සඳහා විශාල දායකත්වයක් බැර වී තිබුණි. අද දවසේ වුවද සර්වෝදයේ ප්‍රධාන ආයෝජනය වන්නේ දහස් සංඛ්‍යාත ජනතාව විසින් අපේ වැඩ සටහන් සඳහා ප්‍රදානය කරනු ලබන තම ශ්‍රමය හෙවත් ස්වේච්ඡා සේවාවන්ය.

අප ව්‍යාපාරයේ දෙවන අදියර වූයේ ප්‍රජා සංවර්ධන වැඩ සටහන්ය. තෝරා ගත් ගම් සියයකින් එය ආරම්භ කරන ලදී. ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන වැඩ සටහන්වල සියළුම අංශ ගැමි ප්‍රජාව මගින් ක්‍රියාත්මක කරන ලදී. පිටතින් අවශ්‍ය වූ අමතර ස්වේච්ඡා සේවකයින් පුහුණු සංරචක අවශ්‍ය අනෙකුත් බඩු බාහිරාදිය හා මූල්‍යමය අවශ්‍යතා ද සමගින් සර්වෝදයේ දායකත්වය එතැන නියෝජනය වූයේ ඉන් පසුය. තත්ත්වයන් එසේ තිබියදී අප ව්‍යාපාරය ආරම්භ කර අවුරුදු 14 ක් ගෙවී ගියායින් පසු, බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆෑම් වැනි සංවර්ධන සහයෝගිතා සංවිධාන අපේ ආධාරයට පැමිණිහ.

කෙසේ වෙතත් අප ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජනය තවමත් ප්‍රජාවගේ කැමැත්තෙන්ම සේවා සඳහා ප්‍රදානය කෙරෙන ඔවුන්ගේම සම්පත් සහ ගමට පිටතින් ලැබෙන ගම් දායකත්වයන්ය. 1973 වර්ෂය අග හරියේදී අපි ලංකාවේ ගම් 1000 ක් සඳහා සංවර්ධන කර්තව්‍යයන් පවත්වා ගෙන ගියෙමු.

සර්වෝදයේ තෙවෙනි පියවර අපි ආරම්භ කළේ මේ අවදියේය. සර්වෝදය තුළ පමණක් නොව, රාජ්‍ය අංශය සම්බන්ධයෙන් හා විශ්වමය ලෙසත් සංවර්ධනය සඳහා මෙතෙක් උපයෝගී කර ගත් ක්‍රමෝපායන් හා තාක්ෂණයන් ද සංවර්ධනය යන්න පිළිබඳව අප සතුව තිබූ අවබෝධය ද සම්පූර්ණයෙන් වෙනස් විය යුතු බවක් අප ආ මාවත තුළින්ම ලබා ගත් ප්‍රායෝගික අත්දැකීම් තුළින් අපි අවබෝධ කර ගතිමු. ඒ දිගු කාලාන්තරය තුළදී විවිධ අරගලයන්ට මුහුණ දුන් අපි, බොහෝ දේ ඉන් ඉගෙන ගත්තෙමු. එමෙන්ම අප සමග අන්තර් සබඳතාවයන් පැවැත්වූ දේශීය විදේශීය සංවර්ධන විශේෂඥයින් වෘත්තිකයින් පරිපාලන නිලධාරීන්, අපේ සහෘදයින් ආශ්‍රයෙන් අපි තේරුම් ගෙන සිටියේ අපේ ජනතාවට යුක්ති සාධාරණ සාමකාමී ජීවිතයක් ගත කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබාදීමට නම්, සියලු දෙනාගේම උදාව ඇති කර ගැනීමේ ක්‍රියාවලිය ඔවුන්ට හුරුපුරුදු කළයුතු බවයි. අමෙරිකාව අප්‍රිකාව යුරෝපය ආසියාව ආදී ලෝකයේ කුමන ප්‍රදේශයක රටක සිටිය ද සියළු ජන කොටස් කුඩා කණ්ඩායම් ලෙස එක් වී පුද්ගලයාගේ උදාව සිට විශ්වයේ උදාව දක්වා අවතීර්ණ වීමට ක්‍රියා කළ යුතුය, යන්න අප විසින් අධිෂ්ඨාන කර ගත්තෙමු. මෙම විශ්වමය උදාව මිනිසාගේ ආධ්‍යාත්මික සදාචාරාත්මක සංස්කෘතික සමාජයික ආර්ථික හා

දේශපාලනික වශයෙන් සමස්ත සමාජයටම නවෝදයක් ගෙන දෙන්නා වූ සංසිද්ධියක් වනු ඇතැයි අපි තරයේ විශ්වාස කළෙමු.

මුදා හැරීමේ ක්‍රියාමාර්ග

ලෝකයේ තිබෙන්නා වූ සියළුම වර්ගයේ ප්‍රශ්න අර්බුදවලට විසඳුම් ලබා ගත හැකි කිසිම අන්දමේ සූත්‍රයක් සර්වෝදය විසින් ලබා දෙන්නේ නැත. අනික් අතින් බලන විට එහි සේවකයින් ඉතා වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන්, ශ්‍රී ලංකාවේ සිටින 23000 ක් ගැමි ප්‍රජාවන්ගෙන්, හත්දාහක් පමණ ප්‍රජා කාණ්ඩ සඳහා ඒකාබද්ධ වූ සංවර්ධන ක්‍රියාපටිපාටීන් මුදා හැර ඇත. පුද්ගලයින් ලෙස සැලකූ විට සංඛ්‍යාවෙන් මිලියන දෙකහමාරකි. ස්ව-ශක්ති සංකල්පය මුල් කර ගත් ප්‍රජා සහභාගිත්වය හා ඔවුනොවුන් විසින් සැළසුම් කර ගන්නා වැඩ සටහන් අනුව එම කර්තව්‍යයන් පවත්වා ගෙන යනු ලැබේ. පෙර පාසල් දරුවාගේ සිට තරුණයින් මව්වරුන් ගොවීන් හා අනෙක් වැඩිහිටියන්ගේ ද යුතුකම් නිසි අයුරින් ක්‍රියාත්මක වී තිබේ.

ගම් මට්ටමින් තිබිය යුතු සර්වෝදය ශ්‍රමදාන සමිති ද යථා කාලයේදී සංවිධානය වී, නීතිමය වශයෙන් රජයේ ලියාපදිංචි වනු ඇත. ඉන් පසු ඒවා විශේෂයෙන් ආර්ථික කටයුතුවලදී සැමදෙනාගේම යහපත සඳහා ඒකාබද්ධව සමස්තයක් ලෙස ක්‍රියා කරනු ඇත. ජීවිතයේ ගුණාත්මක බව දියුණු කර ගැනීම සඳහා අවිහිංසාවාදි නව ක්‍රම හා තාක්ෂණ ඔස්සේ සංවර්ධනය කරා පිය නැඟීමේ ශක්තිය ද මේ නිසා තව තවත් වර්ධනය වේ ඔවුනොවුන්ගේ ජීවිතවලට සැලකිය යුතු බලපෑමක් ඇති වන පරිදි විවිධ ක්ෂෙත්‍රයන් තුළ එක්ව වැඩ කිරීම ප්‍රායෝගිකව ඉමහත් ලෙස ඵලදායී වන දෙයකි.

ගමක් සම්බන්ධයෙන් වෙනම සැලකූ විට එහි වෙසෙන්නන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීමේ වැඩ සටහන් සඳහා ඊට අදාළ පුහුණු සේවකයින් අවශ්‍යය. පෙර පාසල්, සෞඛ්‍ය, පෝෂණ හා ප්‍රජා වෙළඳසැල් සේවකයින් ඉතිරි කිරීම් හා ණය ගනුදෙනු සංවිධායකයන් ගැමි තාක්ෂණ සේවකයින් කෘෂිකාර්මික

සංවර්ධකයින් ආදී වශයෙන් ඔව්හු ඒ ඒ ක්ෂෙත්‍රයන් තුළ සේවාවන්හි නියුක්ත වී සිටිති. මෙම සේවකයන් අපේ සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානවලදී කොට්ඨාශ දිස්ත්‍රික්ක හා ජාතික මට්ටම්වලින් පුහුණු කරනු ලැබූ අයයි.

එවැනි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන 160 ක් අප විසින් දීප ව්‍යාප්තව පවත්වා ගෙන යන්නෙමු. තරුණයින් දෙදහස් හාරසීයක් ඒවායේ එක වර පුහුණුව ලබති. ජාතික හා අන්තර් ජාතික වශයෙන් තවත් පුහුණු මධ්‍යස්ථාන මූලස්ථානයේ හා දිස්ත්‍රික් ප්‍රධාන මධ්‍යස්ථානවල ආරම්භ කිරීම අපේ පරමාර්ථයයි.

හෙලන් කෙලර් ජාත්‍යන්තරය

ලෝකයේ සියලු ප්‍රදේශවල ජීවත් වන ළමුන් ද තරුණ, වැඩිහිටි සියලු වයස්වල සිටින මනුෂ්‍යයන් ද ලක්ෂ සංඛ්‍යාතයක් පීඩාවට පත් කරන්නා වූ අක්ෂි රෝග හා අන්ධභාවය සමස්ත විශ්ව ප්‍රජාවටම අභියෝගයක් වූ අවදානම් සෞඛ්‍ය ගැටළුවකි. අන්ධභාවයට පත්වීම වලක්වා ගැනීම හා සුව කළ නොහැකි අන්ධභාවයට පත් වූවන්ට සහනදායී වන පුනරුත්ථාපන හා වෙනත් සේවාවන් හා අක්ෂි වෛද්‍ය සේවාවන් ලබාදීම සඳහා .හෙලන් කෙලර් ජාත්‍යන්තරය (Helen Keller International) යන සුප්‍රකට ඇමෙරිකානු ස්වේච්ඡා සංවිධානය පිහිටු වන ලදී. ලෝකය පුරා සිටින අන්ධභාවයට පත් පුද්ගලයින් සංඛ්‍යාව 21 වන ශත වර්ෂය ආරම්භ වන විට ලෝක සෞඛ්‍ය සංවිධාන ගණනයන්ට අනුව මිලියන 80 ඉක්මවමින් තිබුණි. 1913 වර්ෂයේදී ලෝක යුද්ධ සමයේ ආරම්භ කරනු ලැබූ, 'හෙලන් කෙලර් ජාත්‍යන්තරය' අන්ධ පුද්ගලයින්ට අධ්‍යාපනය ලබාදීමේ බ්‍රේල් ක්‍රමය ඉතා සාර්ථකව ලෝකයට හඳුන්වාදීමේ ගෞරවය හිමි කර ගෙන ඇත. බ්‍රේල් ක්‍රමය භාවිතා කරමින් මුළු ලෝකයේම අන්ධ ජනතාවට ඉතා සාර්ථක අධ්‍යාපනයක් ලබාදීමටත් ළමුන් අන්ධභාවය හා අක්ෂි රෝගවලින් වලක්වා ගැනීමටත්, විටමින් ඒ අවශ්‍යතාවය ලෝකයේ ප්‍රචලිත කිරීමටත්, පුරෝගාමීව ඉතා කාර්යක්ෂම ලෙස ක්‍රියා කළ මෙම ආයතනය විසින් 'විටමින් ඒ දෘෂ්ටිය හා ජීවිතය යන දෙකම ආරක්ෂා කරයි'. යන පාඨය පදනම් කර ගනිමින් ළමුන් සඳහා පෝෂණ ව්‍යාපෘති ආහාර හා අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කළේය.

තුන්වන ලෝකයේ ජීවත් වන අන්ධ ජනතාවගෙන් මෙවැනි සුදුසු සේවාවක් ලබා ගැනීමට සමත් වන්නේ අතළොස්සක් පමණ වන සුළු සංඛ්‍යාවක් පමණි. ඒ ඔවුනට අධ්‍යාපන හා පුනරුත්ථාපන සේවා සැපයීමට තරම් වාසස්ථාන හා නාගරික පහසුකම් නොමැති හෙයිනි. එම බාධක මගහරවා ගැනීමට හෙලන් කෙලර් සංවිධානය මගින් ප්‍රජාමූලික පුනරුත්ථාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

අසීමිත වූ අන්ධ පුද්ගලයින් සංඛ්‍යාවකට තම පෞද්ගලික නිදහස භුක්තිවිඳීමටත්, සමාජීය සහභාගිත්වය සමඟ ආර්ථික ඵලදායීතාවයකින් යුක්තව තම ගම්වලට ජීවත්වීමේ වරප්‍රසාද ලබා ගැනීමටත් අවස්ථාව සලසාදීමට හැකිව තිබේ. 1986 /87 වර්ෂවලදි පැපුවානිව්ගිනියා, පේරි දූපත්, බටහිර සැමොආ හා ශ්‍රී ලංකාව යන රටවල්වල ජාතික මට්ටමින් එම වැඩ සටහන් පවත්වා ඇත. ශ්‍රී ලංකා රජය සමඟ හෙලන් කෙලර් සම්බන්ධ වී තිබෙන්නේ 1983 වර්ෂයේදීය. හෙලන් කෙලර් ආයතනය විසින් තම සේවාවන් යුරෝපයේ සිට දකුණු ආසියාව හා අප්‍රිකාව දක්වා ඉක්මනින් ව්‍යාප්ත කළේය. අක්ෂි රෝගවලින් පෙළෙන දුක්ඛිත ජනතාවක් සිටින තුන්වන ලෝකයේ සංවර්ධනය වන රටවල් සියල්ලටම එම සේවාවන් දැන් සපයනු ලැබේ. එම රටවල රාජ්‍ය අංශ හා සංවිධානයන්ට අක්ෂි වෛද්‍ය සේවා, ජීවනාධාර වැඩ සටහන් ආදියට ආධාර ලබා දේ.

ඒ රටවල අක්ෂි සායන, ප්‍රතිකාර, පුනරුත්ථාපන කාර්යයන් සඳහා ක්ෂේත්‍ර සේවකයින් පුහුණු කරවා තම රටේ ගැටළු තමන්ටම විසඳා ගත හැකි පරිද්දෙන් ශක්තියක් අවබෝධයක් ලබාදීම සංවිධානයේ ප්‍රාථමික අරමුණු විය. මිනිස් සංහතියේ යහපත උදෙසා සුපිරි මානව දයාවෙන් හා සානුකම්පික ලෙස මහත් කැපවීමෙන් සේවය සඳහා ඉදිරිපත් වී සිටින හෙලන් කෙලර් ජාත්‍යන්තරය එහි සියළු සේවා තුළින් ලෝකයට විශිෂ්ඨ සේවයක් ඉෂ්ඨ විය. මූලස්ථානය ඇමෙරිකාවේ නිව්යෝර්ක් නගරයේ පිහිටා ඇත.

අපගේ ව්‍යාපාරය හෙලන් කෙලර් ජාත්‍යන්තරය සමඟ මිත්‍ර වූයේ 1981 දීය. එහි වැඩ සටහන් නිලධාරී ලෝරන්ස් එෆ්ගකැම්බල් මහතා කලින් සර්වෝදයට පැමිණ අපේ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණය කර සර්වෝදය කාර්ය මණ්ඩලය සමඟ කතාබස් කර දැන හඳුනා ගෙන ප්‍රසාදයට පත් වූ කෙනෙකි. ප්‍රජා සංවර්ධනයේ මා හැඟි නිදර්ශනය සර්වෝදය යැයි පැවසූ එතුමා නැවතත් මෙහි පැමිණීමේ බලාපොරොත්තුවක් ඇති කර ගෙන තිබුණි. හෙලන් කෙලර් සංවිධානය සර්වෝදය ගැන පැහැදී සමීප සබඳතාවයක් ඇතිවීමෙන් අප සමඟ ප්‍රජා ව්‍යාපෘති ආරම්භ කර උදව් උපකාර

කිරීමට එම ලෝරන්ස් මහතාගේ විශ්වාසනීයත්වය හේතු වී තිබුණි. සර්වෝදය හා ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පුහුණු පාඨමාලාවක් පැවැත්වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසටය. ප්‍රාථමික අක්ෂි සෞඛ්‍යය හා අන්ධභාවය වැලැක්වීම පිළිබඳව යම් ව්‍යාපෘතියක් ආරම්භ කර අපට ආධාර කිරීම පිණිස කරුණු සොයා බැලීමට හෙලන් කෙලර් හි පුනරුත්ථාපන අධ්‍යක්ෂ රොබට් සී ජැකල් මහතා (Robert C. Jackle) ලංකාවට පැමිණියේ ඉන් පසුවයි. අසූදෙකේ ජනවාරියේදී ඔහු මෙහි පැමිණෙන විට පුහුණු පාඨමාලාව ආරම්භ කර තිබුණෙන් එතුමා ශිෂ්‍යයින්ට දේශනයක් පැවැත්වීය. විලියම් කන්දගේ, සී. අර්ථනායක, සීතා රාජසූරිය යන මහත්ම මහත්මීහු එදින උත්සවයට සහභාගි වූ අයයි.

ප්‍රථම පුහුණු කාලය අවසන් කළ සේවකයින් නවදෙනාගේ සහභාගිත්වයෙන් ප්‍රථමයෙන් හෙලන් කෙලර් හා අප සමඟ ක්‍රියාත්මක වූ ඒකාබද්ධ ව්‍යාපෘතිය කළුතර දකුණ, කොළඹ ප්‍රදේශයන්හි දෘශ්‍යාබාධිත දරුවන් ප්‍රජා මට්ටමින් පුනරුත්ථාපනය කිරීමය.

අපේ එම මුල් වැඩ සටහනේදී එම ප්‍රදේශවල දරුවන් පමණක් නොව අන්ධ භාවයට පත් වැඩිහිටියන් ද පුනරුත්ථාපනය කිරීමට හැකි වීමෙන් එහි කැපී පෙනෙන සංවර්ධනයක් හා සාර්ථක බවක් දක්නට හැකි විය. එම අන්ධ පුද්ගලයින් හැම දෙනාටම පාහේ තම ග්‍රාමීය පරිසරය තුළදීම ඵලදායී සාමාජිකයින් ලෙස ජීවත්වීමේ වරප්‍රසාද ඉන් හිමි වී තිබුණි.

ශ්‍රී ලංකාවේ දේශීය සම්පත්වලට අනුව සර්වෝදයත් ශ්‍රී ලංකා රජයත් සම්බන්ධ කර ගනිමින් හෙලන් කෙලර් ජාත්‍යන්තරය විසින් තාක්ෂණික ආධාර යටතේ ප්‍රජා මූලික ව්‍යාපෘති ආරම්භ කිරීමට යෝජනා කරනු ලැබුවේ ඉන් අනතුරුවය. මෙතෙක් අප විසින් ක්‍රියාත්මක කළ හෙලන් කෙලර් ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීමටත් නව ව්‍යාපෘතියේ ආරම්භය උදෙසා විවිධ කරුණු සොයා බැලීමටත් ලෝරන්ස් මහතා නැවතත් 1983 වර්ෂයේ ශ්‍රී ලංකාවට පැමිණ සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු අදාල රජයේ අනෙකුත් අංශ නිලධාරීන්, මැති ඇමතිවරුන් සමඟ සාකච්ඡා රැස්වීම්

බොහොමයකට සහභාගි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථිර තීරණයකට එළඹීමෙන් අනතුරුව එම ප්‍රජා මූලික පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සැලසුම් සම්පාදනයවීම සිදු විය. ඒවා රජයේ ප්‍රාථමික සෞඛ්‍ය වැඩ සටහන්වලටම අනුයුක්ත වූ ඒවාය.

රජයේ පාර්ශවයත් සමඟ සුහදව එකට වැඩ කිරීමට සර්වෝදයට හැකි වේ යන විශ්වාසය හෙලන් කෙලර් විසින් ගොඩනගා ගෙන තිබීම අපට මහත් ශක්තියක් ධෛර්යයක් වූ බැවින් අපේ රටේ ජනතාව අන්ධභාවයෙන් වලක්වා ගැනීමටත්, අක්ෂි රෝග හා අන්ධභාවයට පත් වී දුක්විඳින ජනතාවට පිහිටවීමටත්, කදිම අවස්ථාවක් වූ හෙලන් කෙලෙර් ජාත්‍යන්තරයේ මෙම නව යෝජනා අපි ඉතා සතුටින් බාර ගතිමු. සර්වෝදය හා හෙලන් කෙලර් ජාත්‍යන්තරයත් ශ්‍රී ලංකාවේ අදාල දෙපාර්තමේන්තුත් එක්ව ක්‍රියාත්මක වීම සඳහා මෙම ව්‍යාපෘතියේ සභාපතිත්වය මට බාර ගන්නා ලෙස පුනරුත්ථාපන අධ්‍යක්ෂ රොබට් ජැකල් මහතා මට ආරාධනය කළේය.

සති තුනක් ලංකාවේ නැවතී සිටි එතුමා තමා ලංකාවෙන් පිට වූයේ මිනිස් වර්ගයා කෙරෙහි නව භක්තියෙක් සහ විපුල සේවයක් සැලසීමේ අධිෂ්ඨානයක් සහිතව යැයි කියා තිබිණි. ඒ සඳහාම හෙලන් කෙලර් සිට මෙහි පැමිණි දොස්තර වෝල්ටර් ග්‍රිග්ස් මහතා (Dr. Walter Griggs) සමඟ මූලික සැලසුම් නිර්මාණය කරනු ලැබිණි. මීට කලින් සර්වෝදයේ ඉදිරිපත් වීමෙන් හෙලන් කෙලර් සමඟ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල සමීක්ෂණ වාර්තා පිටපත් සෞඛ්‍ය ඇමතිතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් නව ව්‍යාපෘතිය සඳහා පූර්ණ අනුමැතිය හා සහයෝගය අපට ලබා ගැනීමට හැකි විය. අලුතින් යෝජනා වූ ප්‍රජා මූලික ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලැබුවේ කුරුණෑගල දිස්ත්‍රික්කයයි. ප්‍රථම සමීක්ෂණය සඳහා කුලියාපිටිය හා පන්නල ප්‍රදේශයන් නිර්දේශ වී තිබුණි. පුහුණු වැඩ සටහන් කුලියාපිටිය දිස්ත්‍රික් මධ්‍යස්ථානයේදී සිදු විය. කුලියාපිටියේ ඒ කාලයේ නියමු සේවකව සිටි කීර්ති නිශ්ශංකමල්ලව මල්ලී සහ කේ. එල්. ගුණවර්ධන මල්ලී සර්වෝදය ප්‍රජා සේවකයින් 14 දෙනෙකුත් ආරම්භයේදී ව්‍යාපෘතිය වෙනුවෙන් ක්ෂේත්‍ර සේවාවන්හි යෙදුනි.

ව්‍යාපෘති කටයුතුවලදී ක්ෂේත්‍රයේ සියලු සම්බන්ධීකරණ වගකීම් සඳහා සූසන් ඊස්ට්මන් මෙනවිය ඇමෙරිකාවේ නිව්යෝර්ක් හි හෙලන් කෙලර් මූලස්ථානයේ සිට මෙහි පැමිණියාය.

සූසන් ඊස්මන් මෙනවිය අතින් සහතික පත්‍ර ලබා ගැනීම

කුලියාපිටිය දිස්ත්‍රික් මධ්‍යස්ථානයේදී ව්‍යාපෘතියේ වැඩ උත්සවාකාරයෙන් ආරම්භ වූ අතර බොබ් ජැකල් මහතා ද එම අවස්ථාවට සහභාගි විය. 1983 පෙබරවාරි මාසයේදී හෙලන් කෙලර් ආයතනයේ ශ්‍රී ලංකා නියෝ - ජිත කාර්යාලය කොළඹ බුලර්ස් පාරේ අංක 410/85 දරණ ස්ථානයේදී පිහිටුවනු ලැබිණ. අන්ධභාවය වැළැක් වීම හා ප්‍රාථමික සෞඛ්‍යය ආරක්ෂා කිරීමත්, ස්ථිර අන්ධභාවයට පත් වූවන්ට පුනරුත්ථාපනය හා ආධාර ලබාදීමත් ව්‍යාපෘතියේ මූලික පරමාර්ථයන් වන අතර, හොඳ ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහා වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලැබුණි. අන්ධභාවය පිළිබඳ විශේෂ අවධානයකුත් එය ඇති වීමට බලපාන හේතු සාධකත්, අක්ෂි රෝග හා අන්ධභාවය පුද්ගලයාගේ සමස්ත සෞඛ්‍ය කෙරේ බලපෑමේ ප්‍රවනතාවයත් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට යෝජනා වීය.

1984 මාර්තු මාසයේදී ව්‍යාපෘතිය ආරම්භ කළ අවස්ථාවේදී පුහුණුව අවසන් වූ ක්ෂේත්‍ර සේවකයින් විසි දෙදෙනෙක් සඳහා බොබ් මහතා දේශනයක් පැවැත්වූ අතර, මා ඔවුනට සහතික පත් බෙදා දී සේවයේ වටිනාකම ඔවුනට කියා දුන්නා. මෙය විශාල සමාජ සේවාවක් බැවින් මුදල් පසුපස නොගොස් මෙම වටිනා සේවයට කැපවන්න. සෑම ශිෂ්ට සමාජයක් විසින්ම ආබාධිත අයට විශේෂ

සූසන් ඊස්මන් මෙනවිය, ගුරුසිංහ මහතා සහ කීර්ති
නිශ්ශංකමල්ල මහතා වැඩ මුළුවකදී

වරප්‍රසාද ලබා දෙන නමුත් මානසික හෝ ශාරීරික ආබාධිත අයව අපේ රටේ කොන් කරනවා. ඒ නිසා අපි ශිෂ්ට ජාතියක් වන්නේ නැහැ. අප බෞද්ධයින් වූවාට ප්‍රායෝගික බුද්ධාගම අපේ රටේ දක්නට නැහැ. අපට මුදල් හම්බ කරන්නත් පුළුවන්. ඒවා වියදම් කරන්නත් හරිම ලේසියි. මෙහි ඇති ඵල ප්‍රයෝජනය කුමක් ද? අපට අවශ්‍ය තෘප්තිමත් බව ලබා දීමට මේ මුදල්වලට පුළුවන්ද? නැත. සල්ලි වියදම් කිරීමෙන් අත්පත් කර ගත නොහැකි කොතෙකුත් දේ ඇත. ඒවා ලබා ගත හැක්කේ සේවයේ යෙදීමෙනි. යමෙක් අවංකව පරාර්ථකාමීව සේවයට කැප වී ඇත්නම් කුඩා ආදායමක් ලැබූව ද ඔහුට අවශ්‍ය දේ පූර්ණ වනු ඇත. මුදලට මුල් තැන දෙන විදියේ සමාජ ව්‍යුහයකි අද අප සතුව තිබෙන්නේ. අපි ඉන් බැහැරව කටයුතු කළයුතු වෙමු.

උත්සවයට පැමිණි ලයනල් ගුණතිලක මහතා කියා සිටියේ ''අන්ධ'' යන වචනය භාවිතා කිරීම වැරදි බවයි. ඒ සඳහා නිවැරදි වචනය වන්නේ ''දෘෂ්‍යාබාධිත'' යන්නයි. මෙම පුනරුත්ථාපන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අන්ධ අයගේ කුසලතාවයන් හඳුනා

ගෙන ඒවා වර්ධනය කර ගැන්මට ඉඩ ප්‍රස්ථාව සලසා දෙමින් ඉන් ආදායම් මාර්ගයන් ඉස්මතු කර දී ධෛර්යවත් කිරීම බව ගුණතිලක මහතා තම කතාවෙන් පැහැදිලි කර දුන්නේය.

ප්‍රජා මූලික සංවර්ධන සංකල්පයක් සර්වෝදයේ ශ්‍රමදාන හා ස්වශක්ති සිතිවිලිවලින් සම්මිශ්‍රණය වීමෙන් අන්ධභාවයට පත් පුද්ගලයාට තම පවුල හා සමාජය සමඟ සාර්ථක අන්තර් සබඳතාවයන් පවත්වා ගැනීමටත්, අන්‍යොන්‍ය ලෙස බෙදා හදා ගන්නා වූ තෘප්තිමත් භාවයෙන් ජීවත් වීමටත් ඉඩ සැලසූ මෙම ව්‍යාපෘතිය සම්මානනීය අයුරින් සාර්ථක ලෙස ක්‍රියාත්මක බව කිව යුතුය. පුනරුත්ථාපන සේවාවන්හි නියැලීමට පුහුණුව ලැබූ සේවකයින් තෝරා ගනු ලැබුවේ ව්‍යාපෘතියේ ඉලක්ක ගම් වන කුරුණෑගල, පන්නල, කුලියාපිටිය යන ප්‍රදේශවලින් නිසා පුහුණුව අවසානයේදී ඔවුන් තම ගම්වලට ගොස් සේවයේ යෙදුනාහ. නැවතත් එතුමා පැමිණ දෙවන කණ්ඩායමකටත් එම පුහුණුව ලබා දීමෙන් කුරුණෑගල ඉතිරි ප්‍රදේශවල ද සේවා ඉෂ්ඨ කිරීමට පසුව හැකි වුණා. ඒ හැමදෙනාම සර්වෝදයේ සේවකයින්. අප ව්‍යාපාරය සතුව පවත්නා මෙවන් දිරියක් මිනිස් ශ්‍රමයක් සේවයක් මිනිසාට අත්පත් කර ගත හැකි උතුම්ම සම්පතකි. මෙවන් පුණ්‍ය ක්ෂෙත්‍රයක් අපට උරුම වීම අපේම මහත් භාග්‍යයක් නොවේ දැයි මම කිහිපවරක් සිතීමි.

ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා හෙලන් කෙලර් ජ්‍යෙෂ්ඨ උපදේශක හා ක්ෂෙත්‍ර නියෝජිතවරුන් වූ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළු සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ නිලධාරීන් හමුවී අවශ්‍ය සාකච්ඡා පැවැත්වූවා. අන්ධභාවය වැළැක්වීමත්, අක්ෂි රෝග සායන පැවැත්වීමත් පිළිබඳව දරන ලද ප්‍රයත්නයේදී මහජන සෞඛ්‍ය නිලධාරීන්, වෛද්‍යවරුන් ශල්‍ය වෛද්‍යවරුන් හෙදියන්, සිංහ සමාජ සාමාජිකයින් ආදි බොහොම - යක් දෙනා නොමසුරුව තමන්ගේ දායකත්වය පිරිනැමීම විශේෂ සතුටට කරුණක්. ක්‍රිස්ටෝපර් බලයින්ඩර් මිෂන් වැනි අපේ හිතවත් අන්තර් ජාතික ආයතනවල සහාය ද අපට ලැබුණා. අවශ්‍ය අරමුදල් ප්‍රධාන වශයෙන්ම 'USAID' වොෂින්ටන් මගින් ලබා දෙන ලදී.

ප්‍රජා මූලික දෙවන ව්‍යාපෘතියේ සෑම අංගයක්ම අපේ ප්‍රථම ව්‍යාපෘතියට වඩා මනාව සංවර්ධනය වී තිබීම එහි සාර්ථකත්වයට සාක්ෂි දරුවා. ක්ෂෙත්‍ර පුහුණුවීම්, හුරුවීම්, ක්‍රියාත්මක භාවය, හස්ත කර්මාන්තය, නිර්මාණශීලිත්වය වර්ධනයවීම හා උපදේශන සේවා රැකියා ආධාර යනාදිය ඇතුළත් විය.

1984 මැද භාගයේදී අන්ධභාවයට පත් 360 දෙනෙක් ද පුනරුත්ථාපනයට සුදුසු ලෙස නිර්දේශ කළ 175 දෙනෙක් ද ශල්‍යකර්මවලට තවත් 75 දෙනෙක් ද සූදානම් වී තිබුණි. අපගේ මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව වැඩ කළ හෙලන් කෙලර් නිලධාරීන් සර්වෝදය මැදිහත්වීම පිළිබඳව අතිශය තෘප්තිමත් වී සිටියහ. සර්වෝදය ව්‍යාපාරයේ ප්‍රජා සංවර්ධන සංකල්පය තුළින් කැපවීමෙන් යුතුව අවංක පරාර්ථකාමී සමාජ සේවයටම හුරුව සිටි අපගේ සේවකයෝ මෙම ප්‍රජාමූලික ව්‍යාපෘතියේදීත් තම තමන්ට පැවරුණ කාර්යභාරය ඒ අයුරින්ම ඉෂ්ට කිරීමට සමත් වූහ. එසේම ඔව්හු අනුන්ගේ වේදනාවෙහිදී සානුකම්පිකව බැලීමටත්, ඒ වෙනුවෙන් යම් ශුභසාධන කටයුත්තක යෙදී ඔවුන්ට සහනයක් වීමටත්, විශේෂයෙන්ම ශ්‍රමදානය වැනි මහන්සි වී වැඩ කිරීමෙන් අනුනට යහපත සලසා තෘප්තිමත්වීමට හොඳින් හුරු පුරුදු වී සිටිති. අපේ සර්වෝදය සේවකයින් හා එහි මූලික ව්‍යුහයන් නිර්මාණය කළ අපේ කළමනාකරණය විසින් ව්‍යාපෘතියේ සහභාගි වූ අන්‍යයන්ට පූර්ණ ක්‍රියාකාරිත්වයන් තුළින් ලබා දුන්නේ ඉතා වටිනා ආදර්ශයකැයි කවුරුත් ඒ ගැන කතාබස් කළහ.

අන්ධභාවයට පත් පුද්ගලයා පුනරුත්ථාපනය වීමෙන් පසු එම පවුල හරහා පාරිසාරික සමස්ත ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය වූ ආධ්‍යාත්මික භෞතික හා සමාජීය සංවර්ධනය කවුරුත් අගය කළ අතර අන්ධ පුද්ගලයින්ව තම පවුල් වාතාවරණය තුළදී ද ඒ හා සමානව පිටතදී ද කරුණා දයාවෙන් සලකනු ලැබීම හැමදෙනාගේ ප්‍රශංසාවට ලක් වූ සිද්ධියකි. 1984 වර්ෂයේ සැප්තැම්බර් අග වන විට ප්‍රජා සංවර්ධන ස්වේච්ඡා සේවකයින් ලෙස 1116 දෙනෙක් එම පුනරුත්ථාපන පුහුණුව ලබා සිටියහ. ව්‍යාපෘති ක්‍රියාකාරිත්වයේ

ගැටළු බාධක විසඳා ගැනීමට සර්වෝදය හා සෞඛ්‍ය අමාත්‍යාංශය හා හෙලන් කෙලර් ජාත්‍යන්තරය නියෝජනය කළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කොළඹ අක්ෂි රෝහලේ රැස්වීමක් ද පවත්වන ලදී. මමත් ගුරුසිංහ මහතාත් සර්වෝදය වෙනුවෙන් සහභාගි වීමු.

අප ව්‍යාපෘතියට ආධාර ලබා දුන් ක්‍රිස්ටෝපර් බෙලන්ඩන් මිෂන් ආයතනයේ දකුණු ආසියානු කලාපීය ප්‍රාදේශීය කාර්යාලය පිහිටා තිබුණේ ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රදේශයේය. එම නියෝජිත ඥානදුරෙයි මහතා සූසාන් මහත්මියගේ නිල නිවසේ පැවැත්වූ උත්සවයකදී නීතාටත් මටත් මුණගැසී ව්‍යාපෘතිය කර ගෙන යාමට අඩු වශයෙන් තව වසරක්වත් ආධාර එවීමට කැමති වුණේය. අපේ එවැනි තවත් පැරණි මිත්‍රයෙකි හෙස්පරියන් ආයතනය හෙලන් කෙලර් ව්‍යාපෘතිය සර්වෝදය තුළින් සාර්ථකව සිදු වන බව හෙස්පරියන් හි ඩේවිඩ් වර්නර් මහතාට ආරංචි වී තිබුණි. අප ටික කාලයක් ආශ්‍රයෙන් ඈත් වී සිටිය ද හෙලන් කෙලර් හි ලෝරන්ස් මහතා අපේ ව්‍යාපෘති ගැන වර්නර් මහතාට ලියමින් අප නැවතත් සමීප කළේය. ඩේවිඩ් මහතා මට හමුවී තිබුණේ කැනඩාවේ හෝ ඇමෙරිකාවේදී බොහෝ කාලයකිනි. ඒ කාලයේත් ඔහු සමාජ සේවයේ යෙදී සිටියේය. .වෛද්‍යවරයෙක් නැති තැන්. යන ආයතනයේ "Where there is no doctor" එක අතකින් බලන විට අපි මේ හැම දෙනාම සමාන සමාජ සේවකයෝ වෙමු. එක විදියටම අසරණ ජනතාව වෙනුවෙන් පොදුවේ වෙහෙසෙන කණ්ඩායමකි. අපි හැමදෙනාම අතර පොදු සමානත්වයන් තිබේ. අප කියන්නේ සිතන්නේ හැම විටම අපට ඔබලාගෙන් ඉගෙනීමට තවත් බොහෝ දේ ඇති බවය. වර්නර් මහතාත් මට එසේ කීවේය. මම කීවා අප අපේ ව්‍යාපාරය මගින් විවිධ පුනරුත්ථාපන සේවාවන් ඉටු කර තිබෙන නමුත් දෘෂ්‍ය ආබාධිත අයට මෙවැනි පුනරුත්ථාපන සේවා පටන් ගත්තේ දැන් බවයි. මෙම ක්ෂේත්‍ර තාක්ෂණයේ අපි තවම සිටින්නේ ළදරු අවදියේයි. නමුත් අනිත් පාර්ශවයෙන් එනම්, ගැමි සංවර්ධන සේවා, පුනරුත්ථාපන ක්‍රියා අතරින් ලෝකයේ එවැනි සමගාමී සංවිධානයන් සමඟ අපි හුගක් ඉහළින් සිටින්නෙමු .

හෙලන් කෙලර් ආයතනයේ උපදේශක කර්ක් හෝර්ටන් මහතා (Kirk Horton) සති තුනක කාර්යභාරයක් සඳහා මෙහි පැමිණ අක්ෂි රෝග හා අන්ධභාවය පිළිබඳව මහජනතාව දැනුවත් කරනු ලැබීය. කාර්ය මණ්ඩලය වෙනුවෙන් අඩු මිලට ඇස් කණ්නාඩි ලබා දීමට සැලැස්වීමේ ණය සහන ක්‍රමයක් ආරම්භ කරනු ලැබිණ.

හෙලන් කෙලර් ආයතනයේ විධායක අධ්‍යක්ෂ ලෙස වැඩ කළ ජෝන් පාමර් මහතා(John Palmer) ලංකාවට පැමිණ සර්වෝදය මූලස්ථානයට ද පැමිණ මා හමු විය. මුල සිටම යම් කැපවීමකින් අපේ ව්‍යාපෘතියට ආධාර කළ එතුමා වෙනුවෙන් අප කොළඹ ඔබරෝයි හෝටලයේදී රාත්‍රි භෝජන සංග්‍රහයක් සංවිධානය කළෙමු. අප ව්‍යාපෘතියේ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ හෙලන් කෙලර් අතර සම්බන්ධීකරණයේ ඉතා යහපත් ප්‍රතිචාරයක් ලබා දුන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය නිලධාරී වෛද්‍ය තිලක් මුණසිංහ මහතා විසින් රාත්‍රී සාදය සංවිධානය කරන ලදී.

1987 මාර්තු මාසයේදි නැවත ව්‍යාපෘතිය බැලීමට මෙහි පැමිණි පාමර් මහතා පුනරුත්ථාපන සේවා නැරඹීමට දිවයිනේ විවිධ ප්‍රදේශවලට ගියේය. එතුමා සතු පරිචය ඥානය මෙන්ම සංවිධාන කළමනාකරණයේ දක්ෂතාවය කැපී පෙනුණි. ගජෝන් පාමර් මහතා ඇමෙරිකාවේ එපිස්කෝපල් (Episcopal Church) පල්ලියට අයත් පූජකවරයෙකි. හෙලන් කෙලර් ආයතනයට සම්බන්ධ වී තිබෙන්නේ තුන්වන ලෝකයේ රටවල ජනතාවට විශේෂයෙන් ලතින් අමෙරිකාවට සේවය කිරීමේ පරමාර්ථයෙනි. ආසියානු අප්‍රිකානු බොහෝ රටවල ඉන් පසු හෙලන් කෙලර් ජාත්‍යන්තර සේවා සාර්ථකව ව්‍යාප්ත වීය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවල ද මෙම සේවා ලබාදීමේ අවශ්‍යතාවය මත ව්‍යාපෘතිය තවත් පුළුල් කිරීමට අවශ්‍ය වූයෙන් මිනිස් බල සම්පත් ලෙස අවශ්‍ය සේවකයින් ද පුහුණු කරනු ලැබුණි. 1987/88 වන විට ශ්‍රී ලංකාවේ තවත් දිස්ත්‍රික්ක හතරකට කළුතර 'කෑගල්ල' රත්නපුරය හා බදුල්ල යන ප්‍රදේශවලට ව්‍යාපෘති සේවා පුළුල් කිරීමට සමත් වූයෙන් දක්ෂ ශල්‍ය වෛද්‍යවරු හතර දෙනෙක් ප්‍රමුඛ කාර්ය මණ්ඩලයක් සහිතව ව්‍යාපෘතිය පුළුල් විය. රටේ ජීවත් වන යම් කොටසකට හෝ සහනයක් ලබා දීමට හෙලන් කෙලර් ව්‍යාපෘතිය සමත් විය.

ඇමෙරිකානු ජාතික සූසන් ඊස්ට්මන්

අප නිවසේ අලුත් අවුරුදු කෑම මේසයේ පොල්තෙල් පහන දල්වයි

සූසන් ඊස්ට්මන් මෙනවිය ඇමෙරිකාවේ නිව්යෝර්ක් හි පිහිටි හෙලන් කෙලර් ජාත්‍යන්තර මූලස්ථානයේ කාර්ය මණ්ඩල නිලධාරිනියකි. අප ව්‍යාපාරයත්, ශ්‍රී ලංකා රජයත් සමඟ එක්වී හෙලන් කෙලර් සංවිධානයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ අන්ධභාවය හා ශ්‍රී ලංකා ජනතාව සම්බන්ධ ප්‍රජා මූලික ව්‍යාපෘතියේ ක්ෂෙත්‍ර සම්බන්ධීකරණ නියෝජිතවරිය ලෙස පත්වීමක් ලැබූ ඇය ශ්‍රී ලංකාවට පැමිණියාය. ඇමෙරිකාවේ හෙලන් කෙලර් ආයතනයත් සර්වෝදයත් අතර ව්‍යාපෘතියේ ක්ෂෙත්‍ර වැඩ කටයුතු සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම ඇයගේ කාර්යභාරය විය. රජයේ පාර්ශවයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයත් හෙලන් කෙලර් ආයතනයත් අතර සම්බන්ධිකරණ වගකීම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය නිලධාරී වෛද්‍ය තිලක් මුණසිංහ මහතා භාරයේ විය.

තමාට අයිති රාජකාරිය හැකි උපරිමයෙන් කැපවීමෙන් ඉෂ්ඨ කිරීමට සමත් වූ සූසන් මෙනවිය සර්වෝදය මෙන්ම අපේ රටේ ජනතාව වෙනුවෙන් ද විශිෂ්ට වූ සේවයක් ප්‍රදානය කිරීමට සමත් වූවාය. පුනරුත්ථාපන හා පුහුණු වැඩ සටහන්, වෛද්‍ය සායන ආදි හැම කටයුත්තකදීම සියලු බර කරට ගත් සූසාන් මෙනවිය ඇය නතර වී සිටි කොළඹ නවාතැනේ සිට සතියකට වරක් දෙකක් කුරුණෑගලට පැමිණියාය. ව්‍යාපෘතිය සඳහා තෝරා ගෙන තිබූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය සර්වෝදය නියමු සේවක කීර්ති නිශ්ශංකමල්ල මල්ලිත්, ගුරුසිංහ මහතාත් අපේ අනෙක් පුහුණු ස්වේච්ඡා සේවකයින් සමඟත් ඉතා සුහද හැඟීමෙන් වැඩ කිරීමට ඇය පෙළඹී සිටීම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට බොහෝ රුකුලක් වී තිබුණි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා කාර්ය මණ්ඩලය සමඟ සුහදශීලීව සාකච්ඡා රැස්වීම් පවත්වා අදාල වැඩ කටයුතු සිදු කළ එතුමිය ව්‍යාපෘතියේ සියලුම අංශවලට අලුත් මුහුණුවරක් ශක්තියක් වෙමින් අපේ සේවකයින් සමඟ ඉදිරියට ගමන් කළාය.

අවශ්‍ය හැම කටයුත්තකදීම ක්ෂේත්‍රයේ සිටි ඇය හැම නව පියවරකම විස්තර මට වාර්තා කළ අතර, ඇමෙරිකානු තානාපති කාර්යාලය හරහා සර්වෝදයත් ව්‍යාපෘති කටයුතුත් සම්බන්ධීකරණය කළේ ඉතා දක්ෂ ලෙසටය. අපට අවශ්‍ය වූ හැම කටයුත්තක්ම තානාපති කාර්යාලය හරහා ලබා දුන්නාය ඇමෙරිකාවේ සිට පැමිණි ලෝරන්ස් රොබට් වැනි අයටත් අවශ්‍ය උදව් දෙමින් වැඩ සටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කළාය. ජනතාවගේ සේවයටම බැඳී සිටි මානව හිතවාදී කාන්තාවක ලෙස අපි සූසන් මෙනවියගේ චරිතය හඳුනා ගතිමු.

ව්‍යාපෘතිය වෙනුවෙන් සර්වෝදයෙන් ද ඇයට පෞද්ගලිකවම මා විසින් ද ලබා දුන් ද්‍රව්‍යමය ආධාර මෙන්ම ආධ්‍යාත්මික උපකාර ඉහළින්ම සැලකුවාය. හැම විටම ඒවාට ස්තුති කරමින් සියලු සත්ත්වයාට සෙත් ප්‍රාර්ථනා කර නිතරම කෙටි ලිපි මට ලීවාය. ව්‍යාපෘති වැඩ සටහන්වලදී සර්වෝදයේ දායකත්වය

මනාව අවබෝධ කර ගෙන සිටි ඇය, ඒ වෙනුවෙන් අපට දුන් සහාය ඉමහත්ය. කොළඹ අක්ෂි රෝහලේ දොස්තර මෙන්දිස් මහතා ගෙන්වා එතුමාගේ ප්‍රධානත්වයෙන් අනිකුත් වෛද්‍යවරුන් සමඟ සායන පැවැත්වූවාය. සූසාන් මෙනවිය ශ්‍රී ලංකාවෙන් පිටස්තර කෙනෙකු වූවාට අපේ රටේ ක්‍රියාකාරී ව්‍යුහයත් ජනතාවගේ හද ගැස්මත් එක සේ හඳුනා ගෙන දේශප්‍රේමී සමාජසේවා නායිකාවක් සේ පෙනී සිටියාය. දුගී ජනතාවට ආදර කරුණාවෙන් සැලකීය. අවශ්‍යතාවන් සඳහා ගෙන් ගෙට ගොස් වාර්තා තොරතුරු රැස් කළාය. සර්වෝදයේ සේවකයින්ට සමීපව ලෙන්ගතු වූ ඇය, සර්වෝදය පවුල සමඟ ජීවත්වීම හා එක්ව වැඩ කිරීම කෙතරම් තෘප්තියක් දැයි කිහිප වාරයක් ප්‍රකාශ කළාය. ඇයගේ මෙහෙයවීම හා නායකත්වය යටතේ ව්‍යාපෘතියේ වැඩ කළ අපේ සේවකයින් භක්තිමත් හා අවංක පිරිසක් හැටියට ඇය විසින් හඳුනා ගෙන තිබුණි.

අන්ධ පුද්ගලයින් සමඟ වැඩ කිරීමට යෙදවූ අපේ ව්‍යාපෘති සේවකයෝ ස්වාධීන ලෙස ක්ෂේත්‍රයේ වැඩ කළ දක්ෂ කොටසකි. සර්වෝදය ව්‍යාපාරය කෙරේ ආදරයක්, බැඳීමක් ඔවුන් තුළ තිබුණ ද, තමන් හෙලන් කෙලර් ආයතනයේ කාර්ය මණ්ඩලයට ද අයිතිය යන හැඟීමක් ද ඒ සමඟම ඇති බව දිනක් සූසන් විසින් එවන ලද ලිපියක සඳහන් විය. ඒ කාලයේදී සර්වෝදය විසින් එම සේවකයින්ට ගෙවීමට නොහැකි වූ යම් ගරු දීමනාවක් හෙලන් කෙලර් මගින් ඔවුනට ලබා දීමට සූසන් කටයුතු කර තිබීම එයට හේතුවය.

1984 දී වරක් හිටිහැටියේම එතුමිය මුදල් පරිත්‍යාගයක් එවා තිබුණාය. ඒ අපේ සමාජ සේවාවන්ටයි. ඇ විසින් නොයෙක් අයුරින් කරන ලද මහඟු සේවාවන්ට අපේ අවංක ආදර ස්තුතිය කෙසේ පිරිනමන්න දැයි මම කිහිප විට කල්පනා කළ දෙයකි.

අප ව්‍යාපෘතියේ වගකිවයුතු වැඩ කොටසක් භාරව සිටි සර්වෝදය සේවකයෙක් වූ ගුරුසිංහ මහතාගේ වැටුප ද එතෙක් අප විසින් ගෙවමින් තිබුණ ද සූසන් මෙනවියගේ ඕනෑකමින්ම එය හෙලන් කෙලර් මගින් ගෙවීමට එහි කළමනාකාරිත්වයෙන්

කැමැත්ත ලබා ගෙන තිබුණි. ඒ සම්බන්ධව මා සමඟ කතා කළ එතුමිය කියා සිටියේ .ඔබ කෙරේ ඇති ගෞරවය නිසාත්, ගුරුසිංහ මහතා විසින් ඉෂ්ට කෙරෙන කාර්යභාරයට ප්‍රසංශා කිරීමක් ලෙසත්. එවැන්නක් සිදු කළ බවය.

වයාපෘතිය අවසන් වූ විට ඇය ආපසු ඇමෙරිකාවට ගිය ද අප සමඟ හිතවත්කම් දිගටම පවත්වා ගෙන යන ලෙස ද සර්වෝදයට පැමිණ අප සමඟ ගත කර යාමට සර්වෝදය නිවස ඔබට හැමදා විවෘත බව ද මම කීවෙමි. 1985 මැයි මාසයේ ඇය වැඩ අවසන් වී ආපසු ඇමෙරිකාවට ගොස් අපේ පවුල වෙත ලිපි ලීවේ ලයාන්විත මිතුරියක් හා සොයුරියක් ලෙසය. ඒ දිනවල ලංකාවේ අනුරාධපුරය ශ්‍රී මහා බෝධිය ඉදිරියේ සිදු වූ මිනිස් ඝාතනය ගැන අසා එතුමිය බොහෝ කනස්සලු වී සිටියාය. ඒ ඇය ශ්‍රී ලංකාවට ඉතා ආදරය කළ හෙයිනි. ඒ වන විට ඇය හෙලන් කෙලර් ජාත්‍යන්තරයෙන් ඉවත් වී නිවාඩු පාඩුවේ ගත කළාය. ඇගේ උපන් නගරය ඇමෙරිකාවේ නිව්යෝර්ක්ය. දෙමාපියන් චිකාගෝහි සිටි බැවින් නිතර එහි යාමට පුරුදුව සිටියාය. මල් වැවීමෙන් විනෝදයක් ලැබූ ඇය තෘප්තිමත්ව ජීවත් වූවාය. මල් ගස්වලට වතුර දැමීමත්, ඒවා සමඟ කතා කිරීමටත් ඉතා ආශා කළ සූසන් ඉන් විශාල සතුටක් ලබන බව කීවාය. චිකාගෝවල සිටින සූසාන්ගේ දෙමාපියන් බැලීමට ගිය විට ඇති තරම් කෑම බීම ලැබෙන බවත්, සතුටු සාමිචියේ යෙදෙමින් පියාගේ පරිගණකය ලඟ බොහෝ වේලා වාඩි වී සිටීමටත් සිදු වන බවත් මට ලියා තිබුණි. ඒ ඔහුගේ උපදෙස් ඇසීමටය. ලංකාවේ සිටියදීත් සති අන්තවලත් ගිණුම් කටයුතුවල ඇලී ගැලී දවස පුරාම ගත කිරීමට පුරුදුව සිටි සූසන්, කම්මැලිකම යන්න කිසිවිටෙක නොදුටු කෙනෙක් ලෙස මගේ මතකයේ සටහන් වී ඇත. අපි ඇයට සුභ ප්‍රාර්ථනා කළෙමු.

හෙලන් කෙලර් වයාපෘතිය බාරව මෙහි සේවය කළ සූසන් ඊස්ට්මන් මෙනෙවිය මගේ හොඳ හිතවතියක් වූවාය. ඇය සිහින් සිරුරක් ඇති දිගැටි මුහුණකින් යුතු අඩි 5 1/2ක් පමණ උස නිතරම

මුවඟ සිනහවක් තිබූ තැනැත්තියකි. ලංකාවේ දෙවසරක සේවා කාලය නිම වී යන දිනයේදී ඇගේ ගෙදර පැවැත්වූ සාදයේදී ඇය මට ඩොලර් 2000 ක චැක්පතක් දුන්නාය. ඒ ඇය ලංකාවේදී ඉපැයූ මුදල්වල ඉතිරිය විය.

231

සෙනේගේ සෙනෙහස
රෝම සංචාරය

දැන් මා සිටින්නේ ඉතාලියේ අගනුවර වන රෝමයේ ෂෙරටන් හෝටලයේ දෙවැනි මාලයේ විසිතුන් වැනි කාමරයේ ය පසුගිය 24 වැනිදා ලංකාවෙන් පිටත් වූ මා රෝමයට ළඟා වූයේ 25 වැනිදා උදේ ය මගේ ඉතා කිට්ටු පැරණි මිතුරකු වූ ඒඑච්සෙනෙවිරත්න මහතා ගුවන් තොටුපළේදී මා මුණගැසී ෂෙරටන් හෝටලයට කැඳවා ගෙන ආවේ ය.

එච්.ඒ. සෙනෙවිරත්න මහතා

සෙනේ මා හඳුනා ගත්තේ 1956 දී පමණ ය. එවකට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කළ ඔහු ඩී.ඒ. අබේසේකර මහතා හා මා සමඟ නොයෙක් විට මුල් කඳවුරුවලට ගොස් තිබේ. සෙනේ තුළ තිබුණු සෙනෙහෙබර සෞම්‍යගතිය නිසා මා ඔහු වෙතට ඇදී ගියේ ය. අපි දෙදෙනා ඒ කාලයේ සිට ම ඉතා කුළුපඟ මිතුරන් වීමු. සෙනේ හීන්දෑරිය උසය. පස්සට පීරන ලද රැළි වැටුණු කෙස් කලඹකින් යුත් ඔහුගේ සිරුර තලෙළු යැයි කීමට වඩා රන් පැහැයට හුරුය කීම වඩා නිවැරදිය. ඔහු විදේශ සේවයට බැඳී අවුරුදු විස්සකටත් වැඩි යයි සිතමි. ඒ කාලය තුළ දී විවිධ තනතුරුවල සේවය කළ ඔහු හුදෙක් අවංකකම හා කාර්යශූරත්වය නිසාම දැන් රෝමයේ පළමුවැනි ලේකම් ය. හෘදය සාක්ෂියට එකඟව සුඛෝපභෝගිත්වයට ගැති නොවී දේශීය සාරධර්ම අමතක නොකොට රාජ්‍ය සේවයට ඔරලෝසුව

නො බලා මේ අන්දමට ඇප-කැප වූ රාජ්‍ය නිලධාරීන් අතිශයින්ම වත්මන් ලංකාවේ විරලය. ලාංකිකයෙක් හැටියට මම සෙනේ ගැන ඉතාම ආඩම්බර වෙමි. අවුරුදු 48 ක් පමණ වන ඔහු තවම තනිකඩයෙකි.

මා රෝමයට පැමිණියේ යුනිසෙෆ් ආයතනයේ විධායක මණ්ඩල රැස්වීමේ අංගයක් වූ රාජ්‍ය නොවන ආයතනවල රැස්වීමට සහභාගි වී ''තිරස් සන්නිවේදනය හා සංවර්ධනය'' ගැන කතාවක් කිරීමට ය. මේ සඳහා මට විශේෂයෙන් ඇරයුම් කර තිබුණේ ටාසි විට්ටච්චි මහතා ය. එතුමා යුනිසෙෆ් ආයතනයේ සහකාර අධ්‍යක්ෂවරයෙකි.

ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා බිරිඳ සුජාතා ගුරුගේ මැතිනිය හා මැණික්දිවෙල මහතාගේ දියණිය මේ දිනවල රෝමයේ සිටියහ. වතිකානුවේදි පාප්තුමා බැහැ දැකීමෙන් පසු ඔවුන් සමඟ කෞතුකාගාර නැරඹීමට ද ගියෙමි.

ටාසි විට්ටච්චි මහතා සමඟ

සෙනෙවිරත්න මහතා මා හොඳින් බලා ගත් අතර ඉඩ ලැබුණු හැම අවස්ථාවකම ආහාර සඳහා වියට්නාම් හෝටලයකට රැගෙන යෑමටත් රෝමයෙන් පැය දෙකක් පමණ ඈත තිවෝලිවල පැරණි නටඹුන් හා උද්‍යාන පෙන්වීමටත් රැගෙන යෑමට අමතක කළේ නැත.

මා 30 වැනිදා රාත්‍රී ගත කළේ තානාපතිතුමාගේ නිවසේ ය. මෙහි තානාපති

අපේ ඇම්.ඒ. තිලකරත්න මහතාගේ අයියා වන ඇම්. ඒ. පියසේකර මහතාය. එතුමා කිසිම අඩුවක් නැතිව මට ආගන්තුක සත්කාර කොට පසුදා සෙනේ එතුමාගේ රියෙන් මා ගුවන් තොටුපළට යැවීම සූදානම් කළහ.

නවදිල්ලියේ එතුමා සේවය කරන යුගයේදී මේ අන්දමින් අපි මුණ ගැසුණෙමු. බුද්ධගයාව ආදී ආගමික මධ්‍යස්ථාන නැරඹීමට අප ගියේ ශ්‍රද්ධාවෙන් මෙන්ම විනෝදයෙනි. සෙනේ මා හැමදාම ආදරය කරන අමතක නොවන ශ්‍රේෂ්ඨ මහත්මා චරිතයකි.

සෑම මිනිසෙකුටම වැටහෙන හොඳම භාෂාව
රිසෝ-කෝසි-කායි

'රිසෝ-කෝසි-කායි' යනු 1938 දි ජපානයේ බිහි වූ ගිහි බෞද්ධ සංවිධානයකි. දැනට දියුණු තත්ත්වයක පවතින මෙම සමාජ සේවා සංවිධානය ලෝකයේ වෙනත් ප්‍රචලිත එවැනි සංවිධානයන්හිද සාමාජිකත්වය ලබා ඇත. එහි වර්තමාන සාමාජික සංඛ්‍යාව මිලියන 6.5 ඉක්මවමින් සිටී. සංවිධානයේ නිර්මාතෘවරයා දැනට අභාවප්‍රාප්තව ඇති ජපන් ජාතික නිකියෝ නිවානෝ තුමාය. රිසෝ-කෝසි කායි හි සමාජ සේවාවන් තවත් පුළුල් කර ගැනීම උදෙසා 'නිවානෝ' සාම පදනම පසුව ආරම්භ කරන ලදී.

නිකියෝ නිවානෝතුමා දේශනයක් කරමින්

මෙම සංවිධානයේ ආධ්‍යාත්මික සංකල්පය හා මාර්ගෝපදේශකත්වය ලෙස භාවිතා කරනු ලැබුවේ බුදුන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ මණිපත්‍ර සූත්‍රයේ අන්තර්ගතයන්ය.

බෞද්ධ පවුලකින් පැවත ආ නිවානෝතුමා එම සූත්‍රය දැනගෙන තිබෙන්නේ වයස 11 දී තම ගුරුතුමා මාර්ගයෙනි. එම ධර්මයට දිවි හිමියෙන් ගරු කළ එතුමා, තම ජීවිතයේ ජය ලබා ගැනීමට එය මහෝපකාරී කර ගත් බව ප්‍රකාශ කළේය. අන්‍යයන් යහ මගට යොමු කිරීමෙන් සැම දෙනාටම එක සේ සතුට ප්‍රීතිය භුක්ති විඳිය හැකි සැබෑ සාමකාමී සමාජයක් බිහි කිරීමටත් මිනිස් ප්‍රජාව තුළ ස්ව-සංවර්ධනය උදා කර ගැනීමටත්, එම ධර්මතාවයන් ඔස්සේ පියමං කිරීමට ගරු නිකියෝ නිවානෝතුමා තමාගේම රිසෝ-කෝසි කායි නම් වූ ගිහි බෞද්ධ සංවිධානය පිහිටුවා ගත්තේය. පරාර්ථකාමිත්වයේ සැබෑ තෘප්තිමත් බව අත්පත් කර ගැනීමටත් අන්තර් ආගමික සහයෝගය තුළින් WCRP, ACRP වැනි ජාත්‍යන්තර සමුළු පිහිටුවමින් අපමණ සේවයක් ලොවට ප්‍රදානය කරමින්, එතුමා ජගත් කීර්තියට පත් වීමටත් හේතු වූයේ මෙම රිසෝ-කෝසි කායි සංවිධානයෙන් ලැබූ මුල් ශක්තිය නිසාය.

රිසෝ-කෝසි කායි සංවිධානයේ යටගියාව පිළිබඳව ආවර්ජනය කළ විට, නොයෙක් බාධක කම්කටොළු මැදින් ගමන් කළා වූ සමාජසේවා ව්‍යාපාරයක් ලෙස දිස්වේ. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු බිහි වී සීඝ්‍රයෙන් පැතිරී ගිය අලුත් ආගමික සංවිධානයන් අතරට එක් වී තිබූ රිසෝ-කෝසි කායි සංවිධානය ද මුහුණ පෑමට සිදු වූ ප්‍රතිවිරුද්ධ බලවේගයන්ගෙන් බේරී සිටීමට අසීරුව සිටියේය. පිටතින් බලා සිටි එදිරිවාදීන් මෙම සංවිධානය යළි හිස ඔසවන බවක් සිතුවේ නැත. දීප්තිමත් ලෝක ප්‍රජාවක් සඳහා ව්‍යාපාරය. යන්න 1969 දී නිවානෝතුමාගේ ම අවශ්‍යතාවය අනුව, රිසෝ-කෝසි කායි ට සමගාමීව ආරම්භ කරන ලද්දකි. අන්‍යෝන්‍ය විශ්වාසය හා ඒකීයභාවය පළුදු වී ගිය එවැනි කාලයක, රිසෝකෝසි කායි විසින් ලේ දන්දීම සමාජ සේවාවන්ට මුදල් රැස් කිරීම හා ආගමික වටිනාකම් ඉස්මතු කරමින් සමාජයට මිනිස්කමෙහි ආදර්ශය ප්‍රදානය කරන්නටත් යොමු වී තිබුණි. ක්‍රමයෙන් සංවිධානය දියුණු වෙත්ම ස්වාධීන නායකත්වයන් යටතේ පාලනය වන ප්‍රාදේශීය සංවිධාන ජපානය තුළ ගොඩනැගීමට හැකි විය. ඉන් අනතුරුව දේශීය වශයෙන් ස්වතන්ත්‍ර පාලන සංවිධානයන් ද විවිධ ආගමික කණ්ඩායම්වල ද සහයෝගය රිසෝ-කෝසි කායි

වෙත නොඅඩුව ලැබෙන්නට වීය. එහි දියුණුව මෙන්ම, දෙස් විදෙස් කීර්තිමත් බව ද අත්පත් කර ගනිමින් එහි සේවය ජාත්‍යන්තර ලෙස ව්‍යාප්ත වී, විදේශීය ආගමික සංවිධාන සමඟ සම්බන්ධ වීමට ඉඩ ප්‍රස්ථාව ලැබුණි.

නිවානෝතුමා ජීවත්ව සිටි කාලයේදී, න්‍යෂ්ටික අවි තහනම් කිරීමට නියෝජිත පිරිසක් සමඟ අමෙරිකාවට ගිය අවස්ථාවේදී යුනිටේරියන්ස් නම් වන ක්‍රිස්තියානි ආගමික සංවිධානය සමඟ රිසෝ-කෝසි කායි සබඳතාවයක් ඇති කර ගන්නා ලදී. අන්තර් විශ්වාසනීය හෙවත් අන්තර් ආගමික සුහදතාවය ඉහළින්ම අගය කළ හා පිළිගත් යුනිටේරියන් කණ්ඩායමෙහි එම සංකල්පය මෙන්ම ඒ මත පදනම් වූ සේවයත් රිසෝ-කෝසි කායි සංවිධානයට සමානකම් පෙන්වූවකි. තම ප්‍රවර්තනය ආරක්ෂා කර ගැනීම පිණිස ඒකාබද්ධව, අනෙක් ආගමික සංවිධාන සමඟ පිහිටුවා ගත් නව සංවිධාන සංගමයේ දියුණුව වෙනුවෙන් රිසෝ-කෝසි කායි හි ප්‍රයත්නයන් වැඩි උනන්දුවකින් යොදනු ලැබීය.

වර්ෂ විස්සක් තිස්සේම නොකඩවා ක්‍රියාත්මකවීම නිසා ජාත්‍යන්තර සුහදතාවය සාර්ථක තත්ත්වයකට ගෙන ඒමට හැකි වීම සංවිධානයේ වටිනා ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකිය. ටෝකියෝ නගරයේ පිහිටුවා ඇති මධ්‍යස්ථානයේ රිසෝ-කෝසි කායි ශාලාව විවිධ ආගමික කටයුතු සංවිධානය කර පැවැත්වූ ස්ථානයකි. ජීවමාන බෞද්ධ දර්ශනය පිළිබඳව පැහැදිලි නිදර්ශන සහිතව එම ආගමික වැඩ සටහන් එහි ක්‍රියාත්මක කරනු ලැබීය. රිසෝ-කෝසි කායි සංවිධානයට සාමූහිකව සේවයේ යෙදීම තුළින් ඒකීයත්වය හා සහෝදරත්වය පිළිබඳ හැඟීම යන්න තදින් ග්‍රහණය කර ගැනීමට හැකි වූ බව නිවානෝතුමා ප්‍රකාශ කර තිබුණි.

එතුමාගේ පරම සිහිනයක්ව තිබූ ආගම හා සාමය පිළිබඳ ලෝක සමුළුව පැවැත්වීම සැබෑ කර ගැන්මට ඉතා වෙහෙස මහන්සි වූයේ රිසෝ-කෝසි කායි කාර්යය මණ්ඩලය ඇතුළු සාමාජිකයන්ය. මෙම සංවිධානය ආරම්භ කළ දින සිටම අන්තර් ආගමික සුහදතාවය යන වටිනා චින්තනය ජනතාවට ප්‍රවේශ කිරීමට මහත් උත්සාහයක් දැරූ නිවානෝතුමා, එහි ප්‍රතිඵලය ලබා ගැනීමට සමත්

ලෝකයේ විවිධ ප්‍රදේශවල විපතට පත් වූවන්ට රිසෝ-කෝසි කායි විසින් ආධාර කරනු ලැබූ බව රහසක් නොවේ. ජාති-භේද නොතකා එඩිතරව ඉදිරියට ගිය සංවිධානයේ විදේශ සේවා අංශය, ඉතා කාර්යක්ෂම වූ බවට හොඳ උදාහරණයක් ලෙස බෝට්ටුවල කොටු වී සිටි ජනතාව බේරා ගැනීම හඳුන් වන්නට පුළුවන. යුද්ධයෙන් අවතැන් වූ වියට්නාම් සරණාගතයින් අධික සංඛ්‍යාවක් චීන මුහුදේ කුඩා බෝට්ටුවල ගසා ගෙන යමින් සිටියහ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉල්ලීම මත WCRP වෙනුවෙන් RKK තරුණ පිරිස් විසින් විශිෂ්ට සේවයක් ඉටු කරමින් එම ජනතාව බේරා ගැනීමට ක්‍රියා කර තිබිණි. එම සරණාගතයින්ගේ භාෂාවන් ජපන් අයට කතා කිරීමට නොහැකි වුවද RKK තරුණයින් කෙසේ හෝ ඔවුන්ව භාර ගෙන අවශ්‍යතා ඉටු කර විශාල මෙහෙයක් ඉටු කළේය. පිහිටට පැමිණි අනෙකුත් රටවල සංවිධානවල අයට ඒ දේ කිරීමට නොහැකි විණ. හදවතේ උණුසුම් හැඟීම්, හැම විටම සෑම මිනිසෙකුටම වැටහෙන හොඳම භාෂාව බව එදා RKK තරුණයින් සනාථ කරන ලදී.

1975 දී ජපානයේ හා පිලිපීනයේ ජනතාව අතර මිත්‍රත්වය ඇති කිරීමේ පරමාර්ථය මත සෘණණ සංවිධානයේ තරුණ පිරිස් මගින් ''මිත්‍රත්වයේ කුලුණඳ'' Tower of friendship නමින් පිලිපීනයේ බටාන් ප්‍රදේශයේ කුලුණක් ගොඩ නගනු ලැබීය. එම දෙපාර්ශවයේ අසමගිතාවයට හේතු වන යම් අතීත සිද්ධීන් නිසයි, එය සිදු කරනු ලැබුවේ. යුද්ධය කාලයේදී ජපන් හමුදා සොල්දාදුවන් විසින් පිලිපීන පුරවැසියන්ට හා යුද හිරකරුවන්ට බොහෝ දුෂ්ටකම් කිරීම එයට හේතුවයි. ඔවුන්ගේ හදවත් තුළ තවමත් පැවති එම ලප කැලැල් මැකී යාවී යයි මෙහිදී බලාපොරොත්තු විය. බටාන් ප්‍රදේශය දෙවන මහා ලෝක යුද්ධය පැවති දරුණුම ස්ථානයක් අසල පිහිටියකි. කුලුණු පිළිබඳව ප්‍රසාදයට පත් බටාන් ප්‍රදේශයේ ආණ්ඩුකාරවරයා විසින් එය විවෘත කිරීමට පැමිණ එය ගොඩනැගූ RKK නායකයාට 'බටාන්හි පුත්‍රයා' (Son of Bataan) යන ගෞරවනීය නාමය ප්‍රදානය කරනු ලැබිණ. 1975 දී වතිකානු මාලිගයේ ඉල්ලීම පරිදි RKK තරුණ සාමාජිකයින් පිරිසක් සාම නියෝජිතයින් ලෙස රෝමයට ගියේය.

රිසෝ-කෝසි කායි මගින්, සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථාන යටතේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර කළේය. වරින් වර එම ව්‍යාපෘති බැලීමට නියෝජිතයෝ ද පැමිණියහ.

මහාචාර්ය මූරෝ මහතා, මම රිසෝ-කෝසි කායි නියෝජිත පිරිස සමඟ

නරීටා ගුවන් තොටුපළ ජපානයේ අලුත්ම ගුවන් තොටුපළයි. ගිය වසරේ අප්‍රේල් මාසයේ එනම් 1984 හි මා ඇමරිකාවේ සිට පිලිපීනයට යන අතරමඟ මෙහි ටික වේලාවක් ගුවන් යානය නතර කර තිබුණේය. ඊට පසු මා ජපානයට ආවේ මෙදාය. පළමුවෙන්ම ආගමන හා රේගු අංශ පසු කොට එළියට ආවේ මාය. මා මුණගැසීමට මහාචාර්ය ඔසාමු මූරෝ හා මා බලා ගැනීමට බාරව සිටින නිවානෝ සාම පදනමේ ජාත්‍යන්තර කටයුතු අංශයේ කෙයිටාරෝ සුසුකි මහතා හා තවත් අයෙක් ගුවන් තොටුපළට පැමිණ සිටියහ. අලුත්ම ටොයෝටා කාරයකින් කි.මී. 90 ක් පමණ පැය එකහමාරක් පමණ ගමන් කොට අපි ෂින්ජුකු නිව් සිටි හෝටලයට පැමිණියෙමු. මා ජපානයේ සිටින කාලය තුළදී නවාතැන් ගත්තේ මෙතැනය.

විසිහත් වැනිදා රිසෝ-කෝසි කායි ආයතනයට අයිති මහා ශාලාවේ පන්දහසක් පමණ සහභාගි වී, ආගමික නිදහස සඳහා වූ ජාත්‍යන්තර සංගමයේ 25 වැනි මහා සමුළුව උත්සවාකාරයෙන් ඇරැඹිණි. ශ්‍රී ලංකා ධජය පෙරටු කොට ගමන් කර, වේදිකාවේ වාඩිවීමට මට ද ඉඩ සලසා තිබුණි. ගරු නිකියෝ නිවානෝ තුමා ඇතුළු සම්භාවනීය ආගමික නායකයෝ වේදිකාවේ සිටියහ. පැය තුනක් පමණ විවෘත කිරීමේ උළෙලට ගත විය.

සමුළුවේ විවිධ රැස්වීම් පැවැත් වුණු අතර මම ද දින දෙකක් ඒවාට සහභාගි වීමි. මගේ පළමුවන දේශනය තිබුණේ පෙර දිනයේය. රිසෝ-කෝසි කායි ව්‍යාපාරයේ තරුණ සමුළුවට ද සහභාගි වී, මම සර්වෝදය ගැන දේශනයක් කළෙමි. එය ඉතා ඉහළින් පිළිගෙන පැසැසුම් ගලා ආවේය. මා මූරෝ මහතාගේ කාරෙකට නැගී නොපෙනී යන තුරුම තරුණයින් විශාල පිරිසක් මට අනේක වාරයක් ඉඟ පහත් කොට, හිස නමමින් ආචාර කළහ. ජපන් ජාතිකයන්ගේ නිහතමානීකම හා ආගන්තුක සත්කාරය ඉතා ඉහළ මට්ටමක පවතී.

සවස මූරෝ මහතාගේ ගෙදරින් රාත්‍රී භෝජනය ගෙන, රැවී හෝටලයට පැමිණියෙමි. රාත්‍රී ලංකාවේ අප හා සිටි ෂිබී හා ඔහුගේ බිරිඳ පැමිණ මා ඔවුන්ගේ ගෙදරට කැඳවා ගෙන ගොස් පසු දා උදේ මෙහි ඇරලුවෝය. නීතාගේ පැනේ මිතුරියක වූ මුත්සුකෝ හිරෝසි හා ඇයගේ සැමියා ද දියණිය ද සොයුරියක් ද පැමිණ මා හා දිවා ආහාරය ගෙන පෙරදා ගොස් තිබිණ. තව ටිකකින් නිවානෝ පදනමේ ආරම්භක ගරු නිකියෝ නිවානෝ තුමා හමුවීමට යාම මගේ අපේක්ෂාව විය.

නිකියෝ නිවානෝතුමාඃ

පෙර දා උදේ ගරු නිකියෝ නිවානෝතුමා හා පැයක් සාකච්ඡා කළෙමි. ශ්‍රී ලංකාවේ වත්මන් බෞද්ධ තත්ත්වය පිළිබඳ කරුණු පැහැදිළි කර දුනිමි. මෙතුමා මට ඇරැයුම් කළ රිසෝ-කෝසි

කායි නැමැති ගිහි බෞද්ධ ආයතනයේ ආරම්භකයාය. දාර්ශනිකයාය. සභාපතිය. ප්‍රධානියාය. නිවානෝ සාම පදනමත් එතුමා ආරම්භ කළ අතර, දැනට ආගමික නිදහස පිළිබඳ ජාත්‍යන්තර සංගමයේ ද සභාපතිය. වටිනා නිකොන් කැමරාවක් හා එතුමාගේ පොත් කීපයක් මට පරිත්‍යාග කළේය. ජපානයේ බෞද්ධ පුනර්ජීවයේ නායකයෙක් වූ මෙතුමා මුණගැසීම ද ඉමහත් වාසනාවකි.



නිකියෝ නිවානෝතුමා

මට නියමිත දේශන දෙකක් පැවැත්වීමි. පෙර දා බෞද්ධ තරුණයන්ට දෙසුමක් කළෙමි. මේ හැම දේශන යකටම විශාල භක්තිමත් පිරිස් පැමිණ සිටි අතර, හැමදෙනා සර්වෝදය සේවය හා එහි ලෝක දර්ශනය අගය කළෝය.

මා පැමිණි සමුළුවේ අවසන් උත්සවය ද පැවැත්විණි. මා සිත් ගත් කරුණු දෙකක් එහිදී මතකයේ තබා ගතිමි. පළමුවැන්න අවුරුදු 104 ක් වයසැති ලෝක ආගම් සමුළුවේ හිටපු සභාපතිවරයෙක් කළ දේශනයයි. දැන් සිටම ඔහු 1993 දී පැවැත්වීමට නියමිත ලෝක ආගම් පාර්ලිමේන්තු ශත සංවත්සරයට තරුණයෙක් මෙන් සූදානම් වෙයි. දෙවැනි කරුණ නම් ශ්‍රී ලංකා ධජය මා ඉදිරියෙන් ගෙන ගිය රිසෝ-කෝසි කායි කාන්තා විදුහලේ ඉගෙන ගන්නා නොරිකෝ සෙකිගුචි නැමැති තරුණිය ඒ සතුට විඳ දරා ගත නොහැකිව මා ඉදිරියට වුත් ස්තුති කොට කඳුළු සැලීමයි. නැවත නැවත ඇගේ සතුට පළ කළ ඕ දෙවැනි වරටත් පැමිණ ඇ ළඟ තිබෙන වටිනාම වස්තුව යැයි කියා යතුරු දාන කුඩා තිළිණයක් මට ප්‍රදානය කළාය. මනුෂ්‍යයා සෙසු මිනිසුන් සමඟ මිත්‍රත්වය හුවමාරු කර ගැනීමට කෙතරම් ආශා කරන්නේ දැයි මේ සිද්ධියෙන් මට තවත් පැහැදිළි විණි.

* * *

1986.01.28 දහවල් 12.00 ට ලොස්ඇන්ජලීස් නුවරින් පිටත් වූ ජපන් ගුවන් යානයෙන් මම ටෝකියෝවට ගියෙමි. එහි රාත්‍රියක් සන්රූට් හෝටලයේ ගත කර, එතැනින් නරීටා ගුවන් තොටුපළ වෙත නැවතත් වෙනත් යානයකින් ගමන් කළෙමි. ඉන් ඉවතට එන විට ඉතා ආදරයෙන් මා පිළිගත්තේ මරුටා සාන් තනේඩා සාන් හා කලින් මට කෝනෙල්වලදී හමු වූ මරදමා සාන් විසිනි. දින රේඛාව පසු කර ගමන් කර තිබූ නිසා දවසක් පසු වී පසුවදා අප හා එක් වූ මහාචාර්ය මූරෝ සාන් සමඟ නවීනතම හෝටලයකට ගියෙමු. එහි 52 තට්ටුවේ බිම වාඩිවී තෙම්පුරා ආහාරය ගතිමු.

මූරෝසාන් පසුගිය දිනවලදී පීකිංවලට ගොස් තිබෙන අතර, එහිදී ජෙෆ් ටියුනිස් හමුවී ඇත. දැන් ඔහු සර්වෝදය ගැන විරෝධයක් නැති අතර ගාන්ධියම් ව්‍යාපාරය ගැන තවම තැවෙන බව දැන ගතිමි.

වරින් වර මිරිගුවක් මෙන් මට සැබෑව පෙනෙයි. එහි නිස්සරණ නිරාමිස රසය විඳින විට එය අවිද්‍යා වළාකුලෙන් වැසී යයි. නැවත එය මතු වෙයි. මෙම චාරිකාවේ අවසානය වන විට ගත-සිත දෙකක් නොව එකකි. නියම සත්‍යය මේ මොහොතේය. අතීතය හා අනාගතය යනු මතක සටහන්, බලාපොරොත්තු පමණය. සත්‍යය යනු මේ මොහොත පමණක් බව වඩ වඩා තීව්‍රව මතු විය. මා හා විශ්වය අතර වෙනසක් නැත. මොහොතකට එය සැබෑ අත්දැකීමක් වී ඊළඟ මොහොතේ සිතිවිල්ලක්, වචන මාත්‍රයක් බවට පත් වෙයි. පැය බාගයක් සිත එකඟ කිරීම නිසා අළුයම තුනහමාරට පමණ අවදි වුවද, මහන්සියක් නොදැනේ.

මෙම ආයතනයේ සාමාජිකයින් බෞද්ධ ධර්මය අනුව ජීවත් වන්නවුන්ය. ඊයේ උදේ මා ෂූමෝන් ශාලාවට ගිය විට උදේ 6.00 - 7.00 දක්වා සූත්‍ර සජ්ඣායනා කර බුදුන් වඳින අය දුටුවෙමි. ඉන් පසු මා ගිය වර එහි පැමිණි විට රූපවාහිනී ගත කර පසුව දෙසැම්බරයේදී ජපානයේ පෙන්වනු ලැබූ චිත්‍රපටිය නැරඹූවෙමි.

රිසෝ-කෝසි කායි ආයතනයේ ප්‍රකාශන අංශය බාර ටකාසි සූඩෝ මහතා පැමිණ මා හමු විය. නිවානෝ මහතාගේ පොත් රාශියක් ඔහු මට තෑගි කළේය. එතුමා ග්‍රාම සංවර්ධනය පිළිබඳ විවිධ ප්‍රශ්න හා අදහස් අඩංගු ලිපි හුවමාරුවක් මා සමඟ අරඹන බවත්

ඒවා ධර්මාලෝකය සඟරාවේ සහ පසුව පොතක් වශයෙන් මුද්‍රණය කරන බවත් පවසා, ඒ සඳහා මගේ කැමැත්ත ඉල්ලීය. මා එම ඉල්ලීමට එකඟ වූයේ ද ඉමහත් සතුටිනි.

යුනෙස්කෝ ෆෙඩරේෂන් ආයතනයේ යමාෂිටා මහතා පැමිණ මා අශෝක හෝටලයට කැඳවාගෙන ගිය අතර, සේයා මහතාගේ ආශ්‍රම් ව්‍යාපාරයේ දොළොස් දෙනෙකු පමණ එක් වී එහිදී මා ආදරයෙන් පිළිගත්හ.

රිසෝ-කෝසි කායි ආයතනයේ විදේශ අංශයේ ප්‍රධාන හිරෝෂි පුෂි මහතා සහ මරුවා සාන්ගේ ප්‍රධානියා වන ගොටෝසාන් සමඟ ඊළඟට අප ආයතන දෙකේ අනාගත සම්බන්ධය ගැන සාකච්ඡා කළෙමු. නව වසරේ ජනවාරි 1 වැනිදා සිට ක්‍රියාත්මක වන ලෙස බදුල්ල දිස්ත්‍රික්කය ඔව්හු බාර ගත්හ.

ඩෑන් ඩැන්ලැප් විසින් හඳුන්වා දුන් ආයතන දෙකකින් රොබට් හොෆ්මෙයර් මහතාගේ ප්‍රධානත්වයෙන් කාන්තාවන් තිදෙනෙක් ඇතුළුව හයදෙනෙක් පැමිණ, ගම් පහක් සඳහා යෙන් 1,293,450.00 ක චෙක්පතක් සහ යෙන් 1,093,798.00 ක මුදලක් පරිත්‍යාග කළහ. කෙලින්ම මුදල් බැංකුවට යවන ලෙස මම ඒවා ආපසු බාර දුනිමි. රොබට් හොෆ්මෙයර් මහතා ඔක්ස්ෆෑම් මගින් ඩොලර් 2000 ක් සර්වෝදයට කෙලින්ම යවා ඇත.

233

ලෝක සම්පත් ආයතනය

ලෝක සම්පත් ආයතනය යනු විවිධ සංවර්ධන ප්‍රතිපත්ති හා නීතිරීති සම්බන්ධයෙන් ඒවායේ අනුකූල බව හා නිවැරදි බව පිළිබඳ පර්යේෂණ පැවැත්වීමේ මූලික පරමාර්ථයෙන් ඇමෙරිකාවේ වොෂින්ටන් නගරයේ පිහිටුවා ඇති ජාත්‍යන්තර ආයතනයකි. ලෝක සම්පත් ආයතනය මගින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සංවිධානය කර පැවැත්වූ අතර, කණ්ඩායම් නායකයෙකු ලෙස මම ද එහි ගොස් සහභාගි වීමි.



ටොන් ඩි වයිල්ඩ් මහතා, පුතු සහ මම

එය පැවැත්වූයේ වොෂින්ටනයට සැතපුම් 60 ක් පමණ දුරින් පිහිටි මේරිලන්ඩ් නම් පෙදෙසේ (Maryland) නැගෙනහිර වෙරළෙහි වයි වුඩ්ස් (Wye Woods) නැමැති ස්ථානයේ පිහිටි ඇස්පෙන් ආයතනයෙහිය. ඇස්පෙන් ආයතනය (Aspen Institute) යනු විවිධ ලෝක විෂයයන් පිළිබඳව වරකට හැත්තෑපස් දෙනෙකුට නොවැඩි පිරිසකට රැස්ව සාකච්ඡා කිරීමට පහසුකම් තිබෙන පුළුල් අධ්‍යාපන ආයතනයකි. සම්මන්ත්‍රණය පැවැත්වූයේ 1984 මැයි 2 සිට 5 දක්වා දින තුනක කාලයක් තුළදීය. එයට සහභාගිවීම සඳහා මා ලංකාවෙන් පිටත් වූයේ ඒ එක්කම තවත් ගමන් කිහිපයක් සූදානම් කර ගෙනය. අප්‍රේල් විසිවැනිදා ලංකාවෙන් පිටත් වූ මම කෙලින්ම සූරිච් නගරය බලා ගොස්, විසිපස්වෙනි දින රෝමයට ගියෙමි.

අප්‍රේල් විසිනව වෙනිදා රෝමයෙන් පිටත් වූ මා, වොෂින්ටනයට පැමිණියේ 1984 මැයි පළමුවැනිදා ය. ටොන් ඩි වයිල්ඩ් සහ සිසිර නවරත්න ගුවන් තොටුපළට පැමිණ මා, ගෙදරට කැඳවා ගෙන ගියහ.

පසුදා උදෑසන 11.00 ට මම ලෝක සම්පත් ආයතනයට (World Resources Institute) ගොඩවැදුනෙමි. එහිදී ගුවන් විදුලි සාකච්ඡා දෙකකට ද සහභාගිවීමෙන් පසු, මාද සෙසු අය සමඟ විශේෂ බසයෙන් පැයක පමණ කාලයක් ගමන් කොට ඇස්පෙන් ආයතනය නමින් හඳින්වෙන මෙම සම්මන්ත්‍රණ භූමියට පැමිණියෙමි. මා වැඩිපුරම කාලය ගත කළේ මේ ස්ථානයේ ය. සාකච්ඡා පැවැත්වූ තැන සිට සැතපුම් හයක් පමණ වනය මැදින් යාමට තිබූ .මැනර් හවුස්. නේවාසිකාගාරය නවාතැන් සඳහා සූදානම් කර තිබුණි. සියලුම සුඛෝපභෝගී පහසුකම් සහිත මෙම ස්ථානය විශාලය. සුන්දරත්වයෙන් හෙබි නිශ්චල වූ කිසිම බාහිර ශබ්දයක් නො ඇසෙන නිස්කලංක තැනකි. පේන තෙක් මානයක වත්තෙහි ලස්සනට මල් ගස් හා වෙනත් වෘක්ෂ වවා තිබේ.

අවට තිබෙන්නේ අක්කර සිය ගණනක් වූ ගොවිපළකි. එය දැන් අයත්ව තිබෙන්නේ මේරිලන්ඩ් විශ්ව විද්‍යාලයටයි. ගොවිපළෙහි කෘෂිකර්ම හා සත්ත්ව පාලන පර්යේෂණ කරනු ලබන්නේ මේ ස්ථානයේය. ගොවිපළත්, ඇස්පන් ආයතනය සතු සියලු ගොඩනැගිලි හා භූමි භාගයත් එක්තරා ධනවතකු විසින් අන්තිම කැමැත්තෙන් කරන ලද පරිත්‍යාගයන් ය.

ඇමරිකාවේ ධනවතුන් එක් අතකින් ධනය හැකි තරම් උපයා, සුඛෝපභෝගී ජීවිත ගත කළත්, අවසානයේදී ඒ සියල්ල වියපැහැදම් කර පුණ්‍ය ආයතන පිහිටුවා සමාජයට පරිත්‍යාග කරති. මෙතරම් පරිත්‍යාගශීලී ජනතාවක් මා කොහේවත් දැක නැත. මා

සහභාගි වූ මෙම සමුළුව සංවිධානය කළ ලෝක සම්පත් ආයතනය ද "World Resources Institue" පිහිටුවා තිබෙන්නේ ඒ අන්දමට ය. මැක් ආතර් පදනම විසින් ඔවුන්ට මේ ආයතනයේ කටයුතු සඳහා පස් වසරකට ඩොලර් දසලක්ෂ පහළොවක් පරිත්‍යාග කර තිබේ.

මෙම සමුළුවට සහභාගි වී සිටින්නෝ විශේෂයෙන් දියුණු රටවලින් පැමිණි විවිධ විෂයයන් ගැන හසල දැනුමක් ඇති මහා විද්‍යාඥයන් ය. බ්‍රිතාන්‍ය රජයට විද්‍යා කටයුතු පිළිබඳ උපදෙස් දෙන මාටින් හෝල්ඩ්ගේට් සමුළුවේ සභාපතිවරයාය. නෝර්වේ රාජ්‍යයේ හිටපු අගමැතිනිය වන ග්‍රෝ හාලෙම් බ්‍රැට්ලන්ඩ් මැතිනිය ද, ඉන්දුනීසියාවේ ඇමතිවරයකු වන එමිල් සලීම් මහතා ද මෙහි වෙති. සාමාන්‍ය පුරවැසියකු හැටියට, ටයි කෝට් නැතිව මෙහි සිටින්නේ මා පමණ ය. 'ග්ලෝබල් පොසිබල්' යනුවෙන් නම් කර තිබූ මෙම සම්මන්ත්‍රණයේ තේමාව වූයේ 'සම්පත් සංවර්ධනය සහ නව ශත වර්ෂය' යනුවෙනි. එහි පරමාර්ථයන් සරලව සඳහන් කරතොත්:

1 ලෝකයේ සෑම ප්‍රදේශයකටම උචිත වන පරිදි මහජන සහ පෞද්ගලික යන අංශ දෙකටම පොදු වන සේ ලෝක සම්පත් සහ පරිසරය නිසි පරිදි කළමනාකරණය කිරීමට ආධාර වන්නා වූ යම් ප්‍රතිපත්ති නීතිරීති මාලාවක් සකස් කිරීම හා ඊට අදාළ අනෙකුත් ක්‍රියාකාරිත්වයන් නිසි අයුරින් වැඩිදියුණු කිරීම.

2 ලෝකයේ පවතින ස්වභාවික සම්පත් හා පාරිසරික ගුණාත්මක භාවය සංරක්ෂණය කර ගැනීමට උපකාරී වන විවිධ මාර්ග සාධක මොනවා දැයි හරියාකාරව හඳුනා ගැනීම හා එම මාර්ග වැඩි දියුණු කිරීම.

3 ඒ සමඟම ලෝකය පුරා පැතිරී ජීවත් වන අසරණ ජනතා කොට්ඨාශයන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවමින්, ඔවුන්ගේ ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමත්ය.

සම්මන්ත්‍රණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ වූ නියාමක කමිටුවක් පත් කර තිබුණි. විවිධ විෂයයන්ට අදාළ වූ වාර්තා පිළියෙල කිරීම සඳහා සංස්කාරකවරු අනුයුක්තව සිටියහ. තවද සමුළු නියෝජිතයින් වශයෙන් අප විසින් සම්බන්ධ වී ඇති අපේ ආයතන සංවිධානයන්ට වඩා මෙහි යම් විශේෂත්වයක් දක්නට තිබුණි. එනම් විශ්වමය සම්පත් සහ පාරිසාරික සුරක්ෂිත භාවය තහවුරු කර ගැනීමෙහි ලා පෞද්ගලිකව තම තමන්ගේ පාර්ශවයන්ගෙන් ලබා දෙන්නා වූ දායකත්වය සඳහා උසස් පිළිගැනීමක් කෙරෙන බවට කල් තියාම දන්වා සිටීමය. ඒ අතරම ශක්තිමත් වූ හා විශ්වාසනීය ජාත්‍යන්තර සුහදතාවයකින් මෙය පවත්වා ගෙන යාමට උපකාරී වේ යැයි හැඟෙන ක්‍රියාමාර්ගයන් සොයා හඳුනා ගැනීමට උපකාරී වන අප නියෝජිතයින්ගේ අත්දැකීම් හා අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ද සකස් වී තිබුණි. ඉදිරි වර්ෂ දහයක් පහළොවක් සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සම්පාදනයවීම සිදු විය.

නවතම ලෙස පිහිටුවා ඇති සංවර්ධන ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන මගින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඇති කරනු ලැබූ විවිධ කාර්යභාරයන්, ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තිමය වෙනස්කම්, නොයෙක් ප්‍රමුඛ පෙළේ පර්යේෂණ සඳහා ඉඩ ප්‍රස්ථාවන් උදා කර ගැන්ම ආදී කරුණු සියල්ල ඒකරාශී කොට සම්මන්ත්‍රණයේදී පැහැදිලි විමර්ශණයට භාජනය කරන ලදී. නියෝජිතයින්ගෙන් තෝරා ගන්නා ලද අදහස්වල වැදගත් කරුණු අළලා සමුළු සාකච්ඡා පැවැත්වීය.

සම්මන්ත්‍රණයේ විමර්ශණයට ලක් වූ විශේෂ සම්පත් අංශ 10 කි. ජනගහනය කෘෂිකර්මය හා පොළොව පස ජලය වනාන්තර හා වෘක්ෂලතාදිය ජානමය ප්‍රභවයන් බලශක්තීන් සාගර සම්පත් ඛණිජ හා නාගරික පරිසරය යනුවෙනි. මෙම කරුණු දහය අනුව සම්මන්ත්‍රණ නියෝජිතයින් වෙන වෙනම කණ්ඩායම්වලට බෙදා

තිබුණු අතර මම කණ්ඩායම් නායකයෙකු ලෙස එහි මුලසුන ඉසිලීමෙන් වැඩ සටහන හරිහැටි මෙහෙයවීමි. ඊට අමතරව තවත් කණ්ඩායම් දෙකක සාකච්ඡාවන්හි ප්‍රතිඵල ලෙස තීරණ ගැනීමට හැකි වන පරිදි, ගැමි දිළිඳු ජනතාව සම්බන්ධයෙන් කරුණු ඔප්පු කිරීමට ද මට හැකි විය. ලෝකයේ අනාගතය රඳා පවතින්නේ කුඩා බෙලහීන කණ්ඩායම්වල දාර්ශනික තාක්ෂණික හා ආයතනීය ශක්තිය දියුණු කළ පමණට බව මගේ තර්කය විය. එය ප්‍රතිඵල වාර්තාවේ අවසන ප්‍රකාශනයට අඩංගු විය.

මෙම සමුළුවෙහි කැඳවන්නා ලෙස කටයුතු කළේ ටෝකියෝවල පිහිටි එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයේ අධිපති Dr. Soedjatmoko මහතාය. විවිධ සම්පත් භාවිතයට ගැනීමේදී පරිසරය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමත් අනාගතයේදී වැඩි වන ජනගහණය පාලනය කිරීමේදී අපට මුහුණපෑමට සිදුවන අභියෝගයන් ඉදිරියේ අවශ්‍ය වියහියදම් සොයා ගැනීමත් ලොව පුරා විසිරී තිබෙන ස්වාභාවික සම්පත් හා පරිසාරික ගුණාත්මක භාවයන්හි ඵල ප්‍රයෝජන අපටත්, මතු පරම්පරාවටත් අත්පත් කරදීම සඳහා මිනිස් ඕනෑ එපාකම් ඉටු වන ලෙසට පෘථිවියේ ධාරිතාව සුරක්ෂිත හා සංචිත කර ගැනීමත් යන සියළු කාර්යයන් සඳහා එම සම්පත් හරියාකාරව පිරිමැසුම්දායකව සංවිධානය කර ගැනීම අපේ ව්‍යායාමය බව එතුමාගේ කැඳවීමේ ආරාධනයේ සඳහන් කර තිබුණි.

ලෝකයේ රටරටවල රාජ්‍ය තන්ත්‍රය සමඟ ගැටෙමින් එතැනින් නැවතීම අපේ අරමුණ නොවන බව එහි තවදුරටත් සඳහන් කර තිබුණ අතර, මිනිසාගේ දුක අවම කිරීමේ අරමුණින් මූලික වැඩ රාශියක් ආරම්භ කර, යම් නවතාවයකින් යුක්ත වූ තිරසාර ආර්ථික සංවර්ධනයක් ලොව පුරා ඇති කිරීමට කරනු ලැබූ ප්‍රබල උත්සාහයක් ලෙස මෙම සමුළුව තවදුරටත් හඳුන්වනු ලැබීය.

* * *

මෙම සම්මේලනය පැවැත්වූ කාල සීමාව අපට අතිශයින්ම කාර්ය බහුල අවස්ථාවක්ව තිබුණි. අසූතුන වර්ෂයේ අගභාගයේදී අපේ රටේ ජාතිවාදී කලබල ඇවිස්සී තිබුණෙන්, අපි ජාතික සාම පා ගමන සංවිධානය කරමින් ලහි ලහියේ බොහෝ මහන්සිවී වැඩ කළෙමු. සැතපුම් 1000 ක පා ගමන අපගේ අතිශය වගකිවයුතු කාර්යයන් වී තිබුණ ද සම්පත් ආයතනයේ මෙවැනි ජාත්‍යන්තර වැඩ සටහන් තුළින් අපට අලුතින් ඉගෙනීමට බොහෝ දේ තිබිය හැකි බැවින්, එම ආරාධනය පිළිගැනීමට හේතු විය.

සමුළුව අවසන් වීමෙන් අනතුරුව, මගේ ඒකාබද්ධ වැඩ සටහන් වොෂින්ටනයේදී පැවැත්වීමට සැලසුම් කිරීමට මම ටොන්ට කල් තියා දන්වා තිබුණි. මිෂල් ස්කොට් මහතා හා රොලන්ඩ් ලෙජේ මහතා මා හමුවීමට පැමිණ සිටියහ.

අපි සමුළුව අවසන් වූ දිනම සවස වොෂින්ටන් නගරයට පැමිණියෙමු. ටොන්ගේ නිවසට මා රැගෙන යාමට ටොන් රූත් මෝගන්තව් මැතිනිය හා ජෝර්ජ් මැක්රෝබ් මහතා ද පැමිණ සිටියහ. එදා මුළු සන්ධ්‍යාව ම ගත කළේ රූත් සමඟ මාලි ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කිරීමටය. මා විසින් අවුරුදු දෙකකට පෙර මාලි දේශයට යවනු ලැබූ සුබසේන සිල්වා මල්ලී හා අනුලාවතී නංගී යන දෙදෙනාටම මාලි රාජ්‍යයෙන් නයිට්නාම සම්මානයෙන් පිදුම් ලැබීම මෙම 31 වැනිදා බමාකෝ නගරයේදී පිරිනමන බව දැනගන්නට ලැබීම ද, ඉතාමත් සතුටක් විය. එම උත්සවයට මම ද සහභාගි වෙමි.

සම්පත් ආයතන සම්මන්ත්‍රණයේ වාර්තා පිටපතක් මුලින්ම එවා තිබුණේ මටය. පසුවිපරම් ක්‍රියා පටිපාටිවලදීත් මගේ නායකත්වය ඉඳුරාම අපේක්ෂා කර තිබුණි. ඒ සඳහා යෝජනා කර තිබූ අනෙක් කමිටු සාමාජිකයින් අතර සිල්කා ආයතනයේ මහාචාර්ය රූත් මෝගන්තව් මැතිනියද AIRD හි එම්.වී. රාජසේකරන් මහතා ද වූහ. මෙම සම්මන්ත්‍රණයේ අරමුණු තවත්

සාර්ථක කර ගැන්මට කලාපීය රැස්වීමක් 1985 වර්ෂයේ මැදහරියේදී සර්වෝදය මූලස්ථානයේ පැවැත්වීමට කටයුතු යොදා තිබුණි

සමුළුව අවසන් වී ලංකාවට පැමිණි පසු ලෝක සම්පත් ආයතන සභාපති ගස් ස්පෙත් (Gus Speth) මහතා ස්තුති කරමින් ලිපියක් එවා තිබිණි. කණ්ඩායම් නායකත්වය ගෙන වැඩ කිරීම නිසා, මගේ පැමිණීමෙන් ඉතා වැදගත් මෙහෙයක් ඉටු වූ බවත්, සම්මන්ත්‍රණ සාකච්ඡාවන්හිදී මා විසින් අවස්ථානුකූලව ඉදිරිපත් කරනු ලැබූ යෝජනා ඉතා ප්‍රයෝජනවත් වූ බවත් එහි සඳහන් කර තිබුණි.

234

මා පෙන්වා දීමට මහන්සි ගන්නා පැත්ත ඔව්හු දුටහ.

ඊයේ රාත්‍රිය මා ගත කළේ ටෝකියෝ නගරයේ පිහිටි ''ඒෂියා සෙන්ටර් ඔෆ් ජැපැන්'' (Asia Center of Japan) යන නේවාසිකාගාරයේ ය. අමෙරිකාවේ සිට එන අතරමග මෙහි ළඟා වුණු එම්.වී.රාජසේකරන් මහතා ද මහාචාර්ය ඔසාමෝ මූරෝ ද නිවානෝ සාම පදනමේ කුනිටෝමෝ සාන් ඇතුළු පිරිස ද ජීවා ආයතනයේ කුරෝකි සාන් සහ තව අයෙක් ද මා පිළිගැනීමට මෙහි පැමිණ සිටිහය.

මෙවර මා ජපානයට පැමිණියේ 1984 ඔක්තෝම්බර් පළමු වැනිදාය. මහාචාර්ය ඉවසාකි නරීටා ගුවන් තොටුපළට පැමිණ මා කෙලින්ම කැඳවා ගෙන ගියේ ත්සුකුබා (Tsukuba) විද්‍යා නගරයටයි. මෙය නවීනතම විද්‍යා නගරයකි. මා නැවතුණු ටයි-ඉචි හෝටලය ද ජපානයේ නවීනතම හෝටලයකි. එය ගුවන් විමනක ආභාෂයෙන් නිර්මාණය කර ඇතැයි මම සිතමි.

1985 පැවැත්වෙන ප්‍රදර්ශනය වෙනුවෙන් සංවිධානය කෙරෙන දෙවැනි සමුළුවේ ප්‍රධාන දේශනය කිරීමට තිබුණේ මටයි. ''මනුෂ්‍ය වර්ගයා සඳහා නිවාස'' යනු එහි තේමාවයි. වෘත්තීය විද්‍යාඥයෙක් හෝ තාක්ෂණ විද්‍යාඥයෙක් හෝ නොවන මහාචාර්යවරයෙක් ද නොවන මෙහි පැමිණි එකම තැනැත්තා මායි. මා ඉංගිරිසියෙන් පැවැත් වූ දේශනයේ සිංහල පරිවර්තනය සංෂිප්තව මෙසේය:

''සමස්ත මානව අවශ්‍යතා ඉෂ්ඨ කිරීම සම්බන්ධයෙන් මිනිස් වර්ගයාට වාසස්ථාන'' (Dwellings For Humanity)
1984 ඔක්තෝම්බර් 03

මීට අවුරුදු තුනකට පමණ ඉහතදී පෙරදිග දර්ශනය පිළිබඳ හොඳින් උගත් එක්තරා ගුරුවරයෙක් යම් ගැටළුවක් රැගෙන මා වෙත පැමිණියා. ඔහු කෙරෙහි මගේ යම් ගෞරවයක් ද ඇති වී තිබුණ කෙනෙක්. මුඩුක්කු නිවාස සමූහයක් තිබූ ස්ථානයෙන් ඉවත් කිරීමේ කර්තව්‍යයක් පිළිබඳ ප්‍රශ්නයක් ගැන කතා කරන්නටයි ඔහු මා හමුවීමට පැමිණියේ. ඔහු එක් නිවාස යෝජනා ක්‍රමයක තාවකාලිකව පදිංචි වී සිටියා එම ස්ථානයට ආසන්නව ම කලින් රජය විසින් වෙන් කර දී තිබුණ ඉඩම් කොටසක අඩු වියදම් නිවෙස් ඉදි කර නිම වූ වහාම එම මුඩුක්කු වාසී ජනතාව ඒවායේ පදිංචි කරවීමට නියමිත විය. මෙම ක්‍රියාවලිය සිදු වුවහොත් ඇත්තෙන් ම තමන්ගේ කායික හා මානසික සුරක්ෂිත භාවයට බාධා පමුණුවන්නක් මෙන්ම තම දරුවන්ගේ යහපත් පැවැත්මට ද අහිතකර විය හැකි බැවින් සර්වෝදයට මැදිහත් වී රජයේ මෙම තීරණය වෙනස් කිරීමට යමක් කළ හැකි දැයි ඔහු මගෙන් ඇසීය. එය ඔහුට තිබූ ගැටළුවයි.

එම ඉල්ලීම ගැන මගේ අදහස වූයේ සම්පූර්ණයෙන්ම ඊට වෙනස් එකකි. උගත් සහ යමක් කිරීමට හැකියාවක් තිබෙන ඔවුනට එම ප්‍රජාව වෙනුවෙන් ඔවුන්ගේ ශුභසාධනයට යම් සේවාවක් කිරීමට රජය විසින් කදිම අවස්ථාවක් සලසා දී තිබෙන බව මම කීවෙමි. එම ජනතාවට හිතකර වූ යම් සදාචාරාත්මක පසුබිමකට ගෙන ඒමට තම බුද්ධිය හා ශක්තිය මෙහෙයවා කටයුතු කරන්නේ නම් දෙපාර්ශවයට ම සුහදතාවයෙන් එකමුතුකමින් එක්ව විසිය හැකි නොවේද? ඉන්පසු නැවතත් ඔහු එම ප්‍රශ්නය ගැන කතා කිරීමට පැමිණියේ නැත.

නිවාස නැති අයට ඒවා ලබා දිය යුතුය යන ප්‍රශ්නය ගැන හැම දෙනාම පාහේ කතා කරති. නමුත් තමන් සතු ඉඩමක් හෝ අසල්වැසියන් දන්නා එවැනි තැනකින් උනන්දු වී යමක් ප්‍රදානය කිරීමක් ගැන හෝ කිසිවෙකුගේ කතාබහක් නැත.

සර්වෝදය ව්‍යාපාරයේ සේවය කළ දියුණු වීමට කැමති දක්ෂ හා ළාබාල තරුණ ප්‍රජා සංවර්ධන සංවිධායකයෙක් දිනක් මා වෙත පැමිණ තම මාසික දීමනාව වැඩි කරන ලෙස ඉල්ලා සිටියේය. ඔහුට ඕනෑ වී තිබුණේ ගෙදරදීත් ඉංග්‍රීසි කතා කරන ළමයින්ගේ ආශ්‍රය ලබමින් ඉගෙන ගැනීමට හැකි වන පරිදි තමන්ගේ ළමුන් ද පුද්ගලික පාසලකට යැවීමෙන් ඔවුන් උසස් සමාජ තලයක තැබීමටය. තවමත් ඔහු ප්‍රජා සංවර්ධන සේවකයෙක් හැටියට සර්වෝදයේ වැඩ කරන අතර ඔහු වැඩ සටහන්වලදී ප්‍රසිද්ධියේ ම පක්ෂග්‍රාහීව කතා කරන්නේ අධ්‍යාපනය දියුණු කිරීමට නම් ගැමි පාසල් සංවර්ධනය කළ යුතු බවය. මිනිසුන්ගේ ක්‍රියාව සහ වචනයේ පැහැදිළි පරතරයක් තිබෙන බව මෙවැනි නිදසුන්වලින් කැපී පෙනේ. අනෙක් මනුෂ්‍යයින් විසින් තමාව පාගා දමාවි යන අනවශ්‍ය බිය සමහර අයට උරුමයෙන්ම පිහිටා තිබෙන්නකි.

නෙදර්ලන්තයේ විශ්ව විද්‍යාලයක ගෘහ නිර්මාණ ශිල්පය හදාරමින් සිටි එක්තරා උද්‍යෝගීමත් ශිෂ්‍යයෙක් මීට අවුරුදු කිහිපයකට පෙර අපෙන් අවසර ඉල්ලා තිබුණේ, මෙහි පැමිණ ස්වේච්ඡාවෙන් සේවය කිරීමටය. සර්වෝදයට අයිතිව තිබූ හෙක්ටයාර් 200 ක පමණ වූ සමූහ ගොවිපළක් ඔහු තෝරා ගෙන තිබුණි. එහි අඩු වියදම් නිවසක් ඉදි කර නැවතී සිටීම ඔහුගේ මනාපය වූ අතර ලංකාවේ අනෙක් වියළි කලාපීය නිවෙස්වලට සමාන වූ ගෙයක් සාදා ගැනීමටයි, ඔහු අදහස් කළේ. අපි ඔහුගේ ඉල්ලීමට අවසර ලබා දුනිමු. එවැනි නිවෙස් රාශියක් සැලසුම් කළ ශිෂ්‍යයා ඉන් එක් ආදර්ශ නිවසක් තම රසායනාගාරයේදී ඉදි කළේය.

සති ගණනාවක් තිස්සේ කළා වූ මේ ප්‍රයත්නයේ අසාර්ථක භාවය නිරීක්ෂණය කළ අපි ඔහු තෘප්තිමත් කිරීම සඳහා ගැමි නිවෙස් සැලසුම් හා නිර්මාණ ශිල්පියෙකුත් ඔහුට හඳුන්වා දුන්නෙමු. නමුත් ශිෂ්‍යයා ඒ කිසිත් ගණන් නො ගෙන තම පුද්ගලික මතිමතාන්තරය හා සැලසුමට අනුව වැඩ කරමින් තමන්ට ඕ න ෑ හැටියට ගෙයක් තනා ගත්තේය. එය පිහිටා තිබුණේ ද දේශීය

සැලසුම්වලින් අඩු වියදමින් උචිත අන්දමට තනනු ලැබූ ගොවිපළේ අනෙක් ගෙවල් මැද්දේය. ශිෂ්‍යයාගේ නම හැන්ස්ය. ඔහුගේ ගෙයට ගොවිපළේ අනෙක් අය අදත් කියන්නේ හැන්ස්ගේ මෝඩකම (Hans's Folly) කියා ය. එම නිවසේ දක්නට තිබෙන විශේෂ ලක්ෂණය නම් එහි පැමිණෙන කිසිවෙකු සති දෙකකට වඩා එහි නැවතී සිටීමට අකමැති වීමය. නෙදර්ලන්තයේ සිට ලංකාවට පැමිණ ඇති හැන්ස්ගේ ගමන් වියදම් සමඟ සසඳා බලන විට ඔහුගේ ගෙය තමා සිතූ පරිදි ලාභයට සෑදූ ගෙයක් වූයේ ද නැත.

ආදර්ශ ක්‍රමයට තනනු ලැබූ විවිධ අන්දමේ ඉදි කිරීම් අපේ රටවල අනන්තව තිබේ. නමුත් ආදර්ශ ගෙවල් ආදර්ශ සුළංමෝල් වාරිමාර්ග බලශක්ති සංරක්ෂණ ගම්මාන ජීව වායු උත්පාදක ආදී හැම දෙයක්ම ඉදි කර තිබෙන්නේ අධික වියදමක් දැරීමෙනි. මේ සමහර නිර්මාණයන්ට අරමුදල් ලබා ගෙන ඇත්තේ ද එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට සම්බන්ධ එවැනි වෙනත් ආයතනවලිනි. තවද එම ආධාරක ආයතනයන් විසින් එම ඉදි කිරීම් සඳහා කරනු ලබන දිරි ගැන්වීම් ද බොහෝ ය. විද්‍යුත් මාධ්‍ය පුස්තකාල ආදී විවිධ මාර්ගවලින් ඔව්හු ඒවා වර්ණනා කරති. සංවර්ධනයෙහි ලා ඒවායේ වටිනා ප්‍රතිඵල ඉස්මතු කරති. විශ්ව විද්‍යාල හා සම්බන්ධ පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ව ද මේ හා සම්බන්ධ ඔවුන්ගේ පර්යේෂණයන් කරාම බලෙන් හෝ යොමු කරවති. එම පර්යේෂණ ද අධික වියදම් සහිත ඒවාය. සමාජයට ඒවායින් ලැබෙන මහ ලොකු සෙතක් ද නැත.

තවත් අතකින් බලන විට මා සිතන අන්දමට ලෝකයේ දුප්පත් රටවලට සැමදාම ණය බරින් මිරිකී සිටීමට මෙවැනි ප්‍රයෝගකාරී පර්යේෂණ මගින් ද සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන බව පෙනී යයි.

පර්යේෂණ හෝ පරීක්ෂණ යන්නට මා විරුද්ධ යයි කරුණාකර මෙහි දී නොසිතන්න. මා විසින් මෙහි දි ඔබට ඒත්තු

ගැන්වීමට උත්සාහ කරන්නේ ඉන්නට නිවහනක් නැති මනුෂ්‍යයාට එම අවශ්‍යතාවයන් ඉටු කර දීමට යම් නිර්මාණාත්මක සේවාවක් ප්‍රදානය කරණ්නේ නම් ඊට අදාළ සියළුම ක්‍රියාකාරිත්වයන් සඳහා අවංකව ඇපකැප වී කටයුතු කළ යුතු බවය.

මිනිසාට පූර්ණත්වය කරා එළඹීමට හැකි වන්නේ තම අවශ්‍යතාවන් හෙවත් අරමුණු හරියාකාරව ඉෂ්ට කර ගැනීමට හැකි වුවහොත් පමණකි. ඒ සඳහා සුදුසු හා නිවැරදි වූ මාර්ගෝපදේශකත්වයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය බැව් මගේ විශ්වාසයයි. මිනිසුන්ට වාසස්ථාන ලබා දීම වැනි මූලික අවශ්‍යතා ඉටු කිරීම සඳහා ඒ ඒ සමාජ කොට්ඨාශයන්ට සුදුසු වන පරිදි මනාව සැලසුම් කර ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති ඉහත සඳහන් කළ පූර්ණත්වයට පැමිණීම සම්බන්ධයෙන් සුවිශේෂ වන බව මතක් කර සිටිමි. මානව අවශ්‍යතා පූර්ණ කිරීම යන වචන මා විසින් ඇතුළත් කරනු ලැබුවේ ''මිනිස් වර්ගයාට වාසස්ථාන'' යන මගේ ප්‍රකාශනයේ විෂය මූලික ගුණාත්මක අගය තහවුරු කිරීමටය.

''ඉන්නට නිවහනක් නැති මානව මූලික අවශ්‍යතාවන් පිළිබඳව අපි සාකච්ඡා කරන විට මිනිසාගේ අනෙකුත් මූලික ඕනෑ එපාකම් ද ප්‍රජාවන් හා ජාතීන්ගේ ද්විතියික-තෘතීයික අවශ්‍යතා පිළිබඳව ද නිවාස අවශ්‍යතාවයට ඒකාබද්ධවම සලකා බැලිය යුතුය. තවත් විදියකට කියතොත් ඔවුන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතා ඉටු කිරීමටත් ජීවිතයේ අරුත හා විශ්වයේ සමස්ත උදාව අතර ඇති බන්ධුතාවය අවබෝධ කර ගැනීමටත් සැම දා වැඩිවෙමින් පවතින චක්‍රිය ප්‍රජාවන් අතර හා පවුලේ සාමාජිකයින් ඔවුනොවුන් අතර ද මානව අන්තර් සබඳතාවයන් වර්ධනය වීමට ඉඩ ප්‍රස්ථාවන් සලසා දීමටත් ප්‍රජාවට තම පාරිසාරික වෙනස්වීම්වලට අනුව (සමතුලිත ප්‍රතිචාරයන් සහිතව) පාලනය වී සිටීම තහවුරු කර ගැන්මට ද කරුණාව දයාව මෙන්ම අන්‍යයන් කෙරෙහි ඇති වන සානුකම්පික හැඟීම් ස්ව ප්‍රකාශනයන් ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති කිරීමටත් සමෘද්ධිමත් භාවය ළඟා කර ගැනීමට සුදුසු වන්නා වූ

ප්‍රසන්න හා හිතකර මනෝ-භෞතික විද්‍යාත්මක පරිසරයක් ගොඩනගා ගැනීම මෙන්ම සහෝදර හැඟීමෙන් හැමදෙනාගේ ශුභසාධනය සඳහා සාමූහිකව වැඩ කිරීමට පෙළඹවීම හා සුහදතාවයෙන් ජීවත්වීමටත් එම ප්‍රජාවන්ට හැකි වන පරිදි යම් ඒකාබද්ධ සැලැස්මක් නිර්මාණය විය යුතුය.

ඇත්ත වශයෙන්ම තාක්ෂණයට හා ආර්ථිකයට අදාළ වන්නා වූ තවත් කොතෙකුත් කාරණාවලට වඩා අප විසින් වැඩිපුරම සිතිය යුතුව ඇත්තේ මෙම අවශ්‍යතා පිළිබඳව ය.

නිවාස ප්‍රශ්නය එක ගැටළුවක් පමණකි. වැඩිපුරම මෙම නිවාස ප්‍රශ්නවලට මුහුණ දී තිබෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවලත් නගරබද මුඩුක්කු ගෙවල් හා එවැනි තදබදය සහිත තැන්වල ජීවත් වන ජන කොට්ඨාශයන් ය. තවද නිවාස ප්‍රශ්නය වනාහි ඔවුන්ගේ දහසකුත් එකක් ප්‍රශ්නවලින් එකක් පමණි. ඉන්නට වහලක් ඉඩමක් නොමැතිකමත් කුසගින්න දුගීකම රෝගාබාධ අධ්‍යාපනය හරිහැටි රක්ෂාවක් නොමැතිකම නොයෙක් වැරදි ක්‍රියා හා අපරාධවලට යොමුවීම වැනි හා විවිධ සමාජ ආර්ථික දුෂ්කරතාවයන් ද සමඟ රුදුරු වූත් වක්‍රාකාරව පීඩා විඳින්නා වූත් අතිශය දුක්ඛිත තත්ත්වයන් මැද මෙම අසරණ ජනතාව සිර වී. මේ සෑම ගැටළුවක් පාහේ ඉබේටම එක දිගටම ගුණනය වෙමින් හැමදාම පවතින ඒවාය. ඒ නිසා මෙවැනි වියවුල් සහිත ප්‍රශ්නයන්ට විසඳුම් සොයා ගැනීමට නම් කළ යුත්තේ ඊට ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කරවිය හැකි යම් නිර්මාණාත්මක හා චක්‍රීය සැලසුම් මත කළමනාකරණ කිරීමය. අවස්ථානුකූලව කළ හැකි සුදුසු විසඳුම් මෙවැන්නක් වන අතර මෙම කර්තව්‍යයන්හිදී සමස්ත ජනතාවගේම සහභාගිත්වය ද අනිවාර්යය වන්නකි. බොහෝ දුර දිග ගොස් තිබෙන මෙවැනි සමාජීය ගැටළුවලට විසඳුම් සෙවීමේදී ක්ෂණික ප්‍රතිඵල ලබා ගැනීමේ අරමුණින් හිතුමතයට ක්‍රියා කිරීම ඥානාන්විත නොවේ. එනම් ඉක්මනින් ගෙවල් සපයා දීමේ පරමාර්ථයෙන් නියමාකාරව සැලසුම් කරමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වුව ද මේ අවස්ථාවේ

හැටියට එයට විසඳුමක් වන්නේ නැත. එවැනි ප්‍රයත්නයකින් මිනිස් ප්‍රවර්ධනයට ඉතා තදබල ලෙස අහිතකර ප්‍රතිඵල උත්පාදනය වීම ඉක්මන් හා පහසුවෙන් සිදුවීමට ඇති ඉඩකඩ වැඩිය.

මිනිසාට ජීවත් වීමට සුදුසු වාසස්ථානයක අවශ්‍යතාව ඇතුළු ඔහුගේ අනෙකුත් මූලික අවශ්‍යතාවන් ද ඉහත සඳහන් රුදුරු චක්‍රය කඩාබිඳ දැමීමට අවශ්‍ය වන ඒකාබද්ධ ක්‍රම විධි හා මෙහෙයුම් ද යනාදී වශයෙන් සමස්තයක් ලෙස මුළු මිනිස් සංහතිය විසින් ම මුහුණ දෙන්නා වූ ප්‍රශ්නයන්හි මූලික යථාර්තයන් අවබෝධ කර ගෙන ඒ අනුව විසඳුම් සොයා ගැනීමට අපි ඒ පිළිබඳව අපේ දෘෂ්ටිය හා හැඟීම් වඩ වඩාත් පුළුල් කර ගත යුතුවෙමු. මිනිස් ජීවිතයේ මුඛ්‍ය පරමාර්ථය කුමක් ද යන්න කෙරෙහි පූර්ණ අවධානය යොමු නොකරමින් මොන යම් තරාතිරමකින්වත් විශේෂයෙන්ම ජාතික හා විශ්ව ප්‍රජාව සම්බන්ධයෙන් අද අපට මිනිසාගේ කිසිම ගැටළුවක් ගැන සාකච්ඡා කිරීමට නොහැක.

මිනිස් දිවියේ අරුත එතරම්ම වැදගත් ය, ඒ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් කොතරම් අගහිඟකම් තිබුණ ද දුප්පතාගේ දුප්පතාම වුවද තම පැවැත්මෙහි අර්ථයත් තම තමන් අතර මෙන්ම ස්වභාව ධර්මය සමගිනුත් සාමය එකමුතුකම යන්න නිසි පරිදි පවත්වාගෙන යා හැක්කේ කෙසේ ද යන්නත් එම සමතුලිතතාවයන්ට බාධා හිරිහැර පමුණුවන්නා වූ පිටතින් පැමිණෙන එබිකම් කරන සූරාකෑමේ බලවේගයන් ගැනත් ඒ වගේම තම ජීවිත සතුටින් ප්‍රබෝධයෙන් ගත කිරීමට පහසු මංමාවත් මොනවා ද යන්න ගැනත් තම සරල ජීවන රටාව තුළින්ම අවබෝධ කර ගැනීමට හැකි තරමේ අභ්‍යන්තර ධාරිතාවක් හෙවත් ප්‍රමාණවත් විඥානයක් මේ මනුෂ්‍යයින් සතුව ඇත. දිළිඳු ප්‍රජාවගේ සන්තෝෂයෙහි හෙවත් ඔවුන් විසින් භුක්ති විඳිනු ලබන ප්‍රීතිමත් බවෙහි තරමත් බාහිරින් ඔවුන් වෙත පැටවී තිබෙන දේශපාලන හා ආර්ථික බරපැනෙහි තරමත් අතර පවතින්නා වූ අඩු වැඩි වන ප්‍රමාණයන්ගෙන් යුත් අනුපාතික සබඳතාවය මගේ පුද්ගලික අත්දැකීම් ලෙස මා විසින් අවබෝධ කරගෙන සිටින්නෙමි.

ලෝකයේ වෙසෙන උසස් ජන කොටස් මගින් කරනු ලබන බරපතලම වරද නම් දිළින්දාගේ සිතීමේ ශක්තිය හා බුද්ධිමත් භාවය ගණන් නොගැනීමයි. දිළිඳු ප්‍රජාවගේ වටිනාකම් නොසලකමින් ඔවුන්ව හැම විටම ප්‍රතික්ෂේප කිරීමයි. අද ලෝකයේ මිලියන ගණනින් ජීවත් වන දුප්පතුන් වනාහි ආධ්‍යාත්මික හා සංස්කෘතික උරුමයන්ට තවමත් හිමිකාරයින් බව ඔවුන් විසින් අමතක කර ඇත. එම ජනතාව අපි අද දකින්නාක් මෙන් කෘතිම හෝ සමෘද්ධිමත් සමාජවලින් පැමිණෙන්නන් නොවේ. ගෙවී ගිය අතීතය ඊට සාක්ෂි දරමින් දිළිඳුකම පිටුදකින්නා වූ සමාජයන්ගෙන් පැවත එන්නේ ය. එදා ඒ සමාජවල ජීවත් වූ මනුෂ්‍යයා විසින් තම ජීවිතය හා ජීවත් වීම යන්න සඳහා යම් අරුතක් තේරුම් ගෙන තිබිණ. ඇත්තෙන්ම එවැනි සංසිද්ධියක් අද දවසේ අප විසින් දකිනු ලබන මිනිසුන් බහුල ලෙස යොමු වී සිටින ඇලී ගැලී සිටින ද්‍රව්‍යමය භාණ්ඩ ගොඩගසා ගැනීමත් නිකරුණේ කාලය ගත කිරීමටත් වඩා යම් ගැඹුරු ගැම්මක් දර්ශනයක් සහිත බව කිව යුතුය. ලෝක ප්‍රසිද්ධිය ලැබූ බොහෝ ශ්‍රේෂ්ඨ කලා කෘතීන් හා ගෘහනිර්මාණ ශිල්පීන් ඓශ්චර්යයෙන් වැජඹෙන්නට වූයේ එම වකවානුවලදීම ය.

වානිජ්‍යය යුද සේනාවන් සන්නිවේදන හා වෙනත් විවිධ මාධ්‍ය භාවිතා කරමින් සමෘද්ධිමත් ජන සමාජයන් විසින් අසරණ වූ දිළිඳු ප්‍රජාවන් වෙත තම බලය ශක්තිය යොදවා ක්‍රියා කරන්නේ හිංසාකාරී අන්දමටය. සියලු දෙනාම යොමු වී ඇත්තේ එක්කෝ න්‍යෂ්ටික ව්‍යසනයන් පාරිසාරික දූෂණ වැනි විවිධ අන්දමේ විනාශකාරී ක්‍රියාවන්ටය. එබැවින් මිනිස් සංහතිය සංවර්ධනය කරා ගෙන යාම සඳහා ගත යුතු වෙනත් ක්‍රියාමාර්ග මොනවා ද යන්න තීරණය කිරීමට දිළිඳු ප්‍රජාව විසින් වැඩිමනත් වගකිවයුතු දායකත්වයක් ප්‍රදානය කළ යුතුව ඇත. වාසස්ථාන අවශ්‍යතා ඇතුළුව මිනිස් වර්ගයාගේ අනෙකුත් සියලුම ආකාරයේ ගැටළු විසඳීම සඳහා යොදා ගත යුතු අරමුණු තාක්ෂණයන් සම්පත් උචිත ව්‍යුහයන් ආදිය තීරණය කිරීම සුපරික්ෂාකාරීව කළ යුත්තක් වන අතර මෙම කර්තව්‍යයේ දී අත්‍යවශ්‍ය හා වැදගත් කාර්යයන් බවට

ජාති ආගම් මෙන්ම සමාජීය වශයෙන් ද උස් පහත් භේදයකින් තොරව සියලු දෙනාම එක හා සමාන ලෙස සහභාගි වී වැඩ කිරීමේ අවශ්‍යතාවයයි.

මෙවැනි කර්තව්‍යයක් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද? මගේ විශ්වාසය අනුව ප්‍රථමයෙන් අවබෝධ කර ගත යුතු කරුණ නම් මිනිසාගේ සාමාජීය දේශපාලනික හා ආර්ථික වර්ධනය ප්‍රමාණාත්මකව සැලකිල්ලට ගෙන වැඩ කටයුතු කිරීම පමණක් අර්ථයක් නැති බවය. එමෙන්ම වැදගත් වන්නේ මිනිසාගේ ආධ්‍යාත්මික විෂයෙහි ඇති විය යුතු ප්‍රගතියයි. එවැනි දියුණුවක් අත්පත් කර ගැනීම උදෙසා යොදනු ලබන ප්‍රයත්නයන් එම ජනතාවගේ ආධ්‍යාත්මික සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකම් සහිත ජීවන රටාවන් හා කිට්ටුවෙන් බැඳී පවතින්නේ නම් පමණකි ඉන් ජයග්‍රහණය ලබාගත හැකි වන්නේ.

බුදු හිමිගේ ආදර්ශයඃ

එය පැහැදිලි කිරීමට නිදසුනක් ගෙන දක්විය හැකියඃ බුදුන් වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන අවස්ථා තුන සලකමින් අපි වෙසක් උත්සවය පවත්වමු. සිදුහත් කුමරුන් උපත ලැබුවේ මාලිගයක් තුළ නොව, කපිලවස්තුපුර සල් උයනකය. බුද්ධ ගයාවෙහි බෝ ගසක් මුල බුද්ධත්වය ලබා පිරිනිවන් පෑවේ ද උද්‍යානයක ගසක් යටය. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වී චිත්ත ප්‍රීතියෙන් ප්‍රථමයෙන් උච්චාරණය කළා වූ ධර්ම පාඨය සත්‍යය අවබෝධ කර ගැනීමේ සාරාංශය ගැන පැහැදිලි විග්‍රහයකි,

අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරක ගවේසන්නෝ - දුක්ඛාජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝසි - පුනගේහං න කාහසී
සබ්බාතේ ඵාසුකාභග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගා

ධර්ම කථනයේ අග තැන්පත් අපවත් වී වදාළ බම්බලපිටියේ වජිරාරාමාධිපති පූජ්‍ය නාරද ස්වාමීන් වහන්සේ එම ගාථා පාඨය දේශනා කරමින් මෙසේ අර්ථ දැක්වූහ.

''දුකට හේතුව සොයමින් බුදුන් වහන්සේ සංසාරයේ ඇවිද්දා. අවසාන බවයේදී උන්වහන්සේ සය වසරක් මුළුල්ලේ මහත් සේ දුක් විඳිමින් එය දරා ගනිමින් මහා ගැඹුරු ආධ්‍යාත්මික මාවතක ගමන් කර දුකටත් නැවත ඉපදීමටත් හේතුව සර්වඥතා ඥානය මගින් අවබෝධ කර ගත්තා. දුකට යොමු වන අපගේ ශරීරය නැමැති ගෙය සාදන තෘෂ්ණාව නැමැති වඩුවා සොයා ගත් ඔහු නිර්වාණයට පැමිණියා. උන්වහන්සේ කළාක් මෙන් වඩුවා සොයා ගත් විට විනාශ කළ විට නැවත ගෙය නොසෑදේ. නැවත ඉපදීමක් නැත. තෘෂ්ණාව හෙවත් ආශාව බැඳීම යන්නෙහි ආරම්භය කෙසේ ඇති වූවා ද යන්න විස්තර කිරීමට අපහසු කාරණයකි. මෙම මායාකාර වඩුවා සිටින්නේ බාහිර ලෝකයේ නොව තමන් තුළමය. අප හැමදෙනා තුළම තිබෙන ආශාවන් බැඳීම් ඔහුය. ඔහු විනාශ කළ විට සොයා ගත් විට එනම්ඃ තෘෂ්ණාව මුළුමනින්ම විනාශ කළ විට නිර්වාණයට පැමිණේ. තණ්හාව දුකය එහි අවසානය නිර්වාණය ය.''

මෙම ''වඩුවා සහ ගෙය'' යනු කුමක් දැයි තවදුරටත් එහි විස්තර කෙරේ. ගෙය නිර්මාණය කරන්නේ තමන් විසින්ම ය. තමන් තුළම තිබෙන තෘෂ්ණාව හෙවත් ආශාවේ සිතිවිලි හැඟීම් මගිනි. විවිධාකාර බැඳීම් ආශාවන් පිළිකුල මායාව අහංකාරය වැරදි දෘෂ්ටිය සැකය අලස බව නොසන්සුන්තාවය ලජ්ජා-බිය නොමැති වීම යනාදී මෙම හැඟීම් එම ගෙයි වහලේ පරාලවලට උපමා කර ඇත. සියලුම පරාල දරා සිටින්නේ වහලේ බාල්කය හෙවත් මුදුන් ලීය මගිනි. එය අවිද්‍යාවය. වහලයේ මුළු ශක්තිය බාල්කය මගින් රඳා සිටින්නා සේ අප තුළ තිබෙන සියලු තෘෂ්ණාවන්ට හේතුව තමන් තුළම ඇති අවිද්‍යාවය. සියලු පව් වලට හා දුකට මුල එය යි. එම නිසා සත්‍යය අවබෝධ කර ගැනීමෙන් අවිද්‍යාව නැති වී

තෘෂ්ණාවත් ඒ සමගම විනාශ වී නිවනට පැමිණේ. වඩුවාට නැවතත් ගෙය සෑදීමට නොහැක. පරාල බාල්කය යන ද්‍රව්‍ය විනාශ වී ගොස් ඇති හෙයිනි. අවිද්‍යාව පහ වීමෙන් නැවත ඉපදීමක් ද නැත .

මේ අයුරින් සිතන විට ගෙය විනාශ කිරීමේ සංසිද්ධිය හා ඊට අවශ්‍ය ශක්තිය ඔබ තුළත් මා තුළත් අන්තර්ගතව ඇති දෙයකි. එම නිදසුනින් මා අදහස් කළේ කුමක් දැයි ඔබ තේරුම් ගත්තා යැයි මම විශ්වාස කරමි. මට අවශ්‍ය වූයේ සංවර්ධනය සඳහා ප්‍රයෝජනවත් වන ආධ්‍යාත්මික පදනමක් ඒ තුළින් ඔබට හඳුන්වා දෙන්නට ය. අපේ සියලු දුක් කන්දරාවන්ට මුල් වන්නා වූ මේ ගෙය ඉදි කරන වඩුවා අප විසින්ම සොයා ගත යුතුයි. ඔහු විනාශ කළ යුතුය. මේ සඳහා අපට අවශ්‍ය වන්නේ නවාතැනකි. අපගේ ඒ ප්‍රයත්නයට පහසුකම් සලසා ගැනීමට කටුමැටි හෝ ගඩොල් හුණු ආදී ඕනෑම ද්‍රව්‍යයකින් තනනු ලැබූ නිවසක් ප්‍රමාණවත් ය. අපගේ පැරණි සමාජවලට අයත් වූවන් ජීවත් වූයේ අසම්පූර්ණ ලෙස ඉදි කරන ලද නිවෙස්වලය. ඒ නිවහන් කවදාවත් සම්පූර්ණයෙන් සාදා නිම වූයේ නැත. ඒවායේ අවසානයක් දැකීමට නොහැකි අතර ඔවුනට මුණ ගැසෙන්නේ අවසානය තෙක් ළඟාවීමට අවශ්‍ය මංමාවත් පමණි. එයට හේතු සාධක ලෙස දැක්විය හැක්කේ ආර්ථික අඩුපාඩුකම් මෙන්ම කෙළවරක් වෙත යාමට තරම් ප්‍රඥාව නොමැතිකම විය හැක. අප බුද්ධිමත් වී සත්‍ය තේරුම් ගෙන ඒ සඳහා මාවත සාදාගත යුතුය. අවසානය යනු කුමක්ද? සියලු දුක නැති කිරීමය. සදාකාලික සතුට නිර්වාණය අවබෝධ කර ගැනීමය. ප්‍රඥාවන්ත භාවයෙන් මෙකී අවසානය දැකිය හැක. තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැති කළ විට ඔහු නිවනට පැමිණෙනු ඇත.

මගේ අදහසඃ

සුබෝපබෝගී සමාජයකින් මා පැමිණියේ නැත. මා පැමිණ ඇත්තේ සමෘද්ධිමත් සමාජයකින් නොව දුප්පත් සමාජයකිනි.

ඉන්ද්‍රිය සන්තර්පනය පටු කෙළවරක් නොමැතිව හඹායන්නා වූත් ධනය - බලය - තත්ත්වය භුක්ති විඳින්නා වූත් මුදල් ඉපයීමට වඩා ජීවිතයේ වෙන කිසිම යථාර්ථයක් නොදකින දියුණු යැයි සලකනු ලබන යම් සුළු කොටසක් අප ජීවත් වන සමාජයේ සිටිති. එම සුළු පිරිස ඔබේ මනසින් අයින් කළ විට ඉතිරිව සිටින නිශ්ශබ්දව ජීවත් වන බහුතරය ගැන ඔබට සිතෙන්නේ කුමක් ද? ඔවුන් වනාහි තම පැරණි සංස්කෘතීන් උරුම කර ගත් ජීවිතයේ යම් අරුතක් අවබෝධ කර ගත් එහි අවශ්‍යතාවයක් ද ඇති ජන කොට්ඨාශයක් බව පැහැදිලිව පෙනෙනු ඇත. ඉතිරි වී තිබෙන පුරාවස්තු තුළින් හෙළිදරව් වී ඇති ආකාරයට ඉපැරණි ශ්‍රී ලංකා සමාජයන්හි ඉතා දියුණු ගෘහ නිර්මාණ ශිල්ප තිබීම පුදුමයට කරුණක් නොවේ ද? මගේ අදහසේ හැටියට යම් උචිත වූ දර්ශනයක් හා ආකල්පයන් සහිතව ජීවත් වූ ජන සමාජයක් සඳහා මෙම කරුණු පැහැදිලි නිදසුන් වන අතර යම් ප්‍රජාවකගේ ගුණාත්මක සංවර්ධනය සිදුවන්නේ කෙසේ ද යන්න තිර්ණය වන්නේ ද මෙවැනි සාධක අනුසාරයෙන් බව සඳහන් කළ යුතුය.

අපගේ උසස් සමාජ නියෝජනය කරන සමහර අයගේ සිත්වල මුල් බැස ගෙන තිබූ ඒක-සංස්කෘතික ආකල්පයන් වාණිජකරණය පැමිණීමත් සමඟ ම අපේ පැරණි සමාජයන්හි ස්ථාපිත වී තිබුණ ගුණාත්මක යථාර්තයන් හා එකට ඇදීම පැහැදිලිව දක්නට ලැබුණ දෙයකි.

ආචාර්ය ආනන්ද කුමාරස්වාමි සූරීන් විසින් රචනා කරනු ලැබූ සම්භාවනීය කෘතියක් වන .මධ්‍ය කාලීන සිංහල කලා. නම් ග්‍රන්ථය 1907 දි ප්‍රකාශයට පත් විය. ඉහතින් විස්තර කළ සංසිද්ධිය එහි ඉතා පැහැදිලිව පහත සඳහන් වචනවලින් විස්තර කර ඇත :

බටහිර ලෝකය සමඟ ඇති කර ගෙන තිබූ සබඳතාවයන්හි ප්‍රතිඵලයන් අතර දැක්විය හැකි විශේෂත්වයක් නම් ඉන්දියාවේ මෙන්ම ලංකාවේත් කලා ක්ෂෙත්‍රයට සෘජුවම හෝ ව්‍යාංගයෙන් මරු

පහරක් වැදීමය. තවත් එහිම ප්‍රධාන බලපෑම් දෙකක් හැඳින්විය හැක. එනම් රාජ්‍ය කැටයම් කලාකරුවන්ගේ සංවිධානයන් නෂ්ට වී යාමත් බ්‍රිතාන්‍ය ආභාෂයෙන් යුත් බ්‍රිතාන්‍ය රැකී රක්ෂාවල් මෙහි ජනතාව විසින් අනුගමනය කිරීමත් ඉන් අනතුරුව ක්‍රමවත් ලෙස බ්‍රිතාන්‍ය හා සිංහල යන දෙකොට්ඨාශය විසින්ම එක හා සමානවම දේශීය ගෘහ නිර්මාණ ශිල්පය නොසලකා හැරීමත් ය. මඳ වශයෙන් වුවද, රේඛීයවම එසේ බලපානු ලැබූ බව ස්ථිර ලෙසම ප්‍රකාශ කළ හැකිය. කලා ක්ෂෙත්‍රයේ මෙවැනි පරිහානියකට හේතු සාධකයක් වන්නේ වාණිජකරණයේ වර්ධනයයි. වාණිජ්‍යය මේ අයුරින් අපේ රටවලට ඇතුළත් වී පැතිරී දේශීය ශිල්පය හා තාක්ෂණය පැත්තකට ඇද දැමීය. මිනිසා විසින්ම වෙහෙස මහන්සි වි කරන ලද දේශීය නිෂ්පාදන කර්තව්‍යයන් වාණිජමය ක්‍රම සහ විධිවලට අනුකූලව යන්ත්‍රානුසාරයෙන් ද යන්ත්‍ර සූත්‍ර ලෙසට ම අධිකව වෙහෙස වී ක්‍රියාත්මක වූ මිනිස් ශ්‍රමයෙන් ද ඉෂ්ට වීම සිදු විය. පෙරදිග රටවල ගැමියාට තම අත් යන්ත්‍රයෙන් ඉවත් වීමට සිදු වූයේ මෙම බටහිර බලවේගයන් හෙවත් වාණිජකරණය හේතු කොට ගෙනය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ හස්ත කර්මාන්ත නිෂ්පාදනයන් අලෙවි කර ගැන්මට අනෙක් නිෂ්පාදන හා සටන් කිරීමේ අභියෝගයට මුහුණ දීමට සිදු විය. දේශීය කැටයම්කරුවා තම ආම්පන්නවලින් සමු ගත්තේය. කුඹුරු සී සාමින් ගොවිතැන් බත් කර ගත් ගොවියාට තම ජන කවිය අත් හැරීමට සිදුවිය. මෙවැනි විවිධාකාර පරිවර්තනයන් හේතු කොට ගෙන කලාව යන්න මිනිස් ශ්‍රමයෙන් දික්කසාද වී ඇත. එම සංසිද්ධිය බ්ලේක්ගේ වචනවලින්ම මෙසේ වරනගා තිබුණි :

''මානව ජාතීන් වයෝවෘද්ධ වෙද්දී වියැකී යයි
කලාවන්හි උණුහුම ගස් කොළන් හැම තැනම වාණිජ්‍ය දළලයි''

මෙවැනි බිහිසුණු වේදනාකාරී පරිවර්තනයන් තුළින් වාණිජකරණය යන්න මුළු පෙරදිග් භාගයේම මුල් බැස ගත්තේ ය.

මගේ අදහසේ හැටියට සිංහල ජාතිය සතුටින් ජීවත් වූයේ නම් එය සිදු වූයේ දහඅට වැනි ශතවර්ෂයේ යි. එදා ඔවුන් භුක්තිවින්දා වූ සතුට සොම්නස තෘප්තිමත් බව අද ඔවුනට අහිමි වී ගොස්ය. ප්‍රගතිය හා යථාර්ථය යන්න එකිනෙකට වෙනස් කාරණා දෙකක් මිස එකක් වන්නේ නැත. ප්‍රගතිය හෙවත් දියුණුව ළඟා කර ගත හැක්කේ යථාර්ථය හෙවත් සත්‍යය යනු කුමක් දැයි හඳුනා ගෙන ඒ තුළින් ගමන් කිරීමෙනි. ශිෂ්ඨාචාරයක ප්‍රගතිය ඇති කර ගත යුතුව තිබෙන්නේ ඊට උචිත වූ නිවැරදි අපේක්ෂාවන් නිර්මාණය කර ගැනීම තුළින්ය. ඒවා ඉෂ්ට කර ගැනීමෙන් තෘප්තිමත් වීමට නම් තමන් ඉන්නා තත්ත්වය දියුණු කර ගැනීමට පුද්ගලයා විසින් ද හැම විටම උනන්දු විය යුතුය. යථාර්ථය ගැන විග්‍රහ කරන විට තරම හෙවත් ප්‍රමාණාත්මක බව ඊට කිසිසේත් අදාළ වන්නේ නැත. නමුත් අවශ්‍යතාවයන්ගේ ගුණාත්මකභාවය ජීවත් වීමේ කලාවෙහි ප්‍රගතිය සඳහා නිදසුන් ලෙස පෙන්වීම සුදුසු වේ. නවීකරණය වූ සිංහල රසාස්වාදය එහි ඉපැරණි මුල් තත්ත්වයන්ට වඩා හාත්පසින්ම වෙනස් එකකි. ඉහතින් සඳහන් කළ පැරණි ගුණාත්මක වටිනාකම් එහි අන්තර්ගත නොවේ. එම නිසා නව සිංහල රසය කුමක් ද යන්න හඳුනා ගත් කිසිවෙකු මිනිස් අවශ්‍යතාවයන්ගේ ගුණාත්මක බවෙහි කිසිම ප්‍රගතියක් එම රසය තුළ ඇතැයි නො කියනු ඇත. නව රසාස්වාදය වටිනාකමින් පිරිහී ඇති බවයි, ඉන් අදහස් වන්නේ. මේ සැම දෙයකින්ම අපට අවබෝධ වන්නා වූත් පැහැදිලි ලෙසම කැපී පෙනෙන්නා වූත් සත්‍යයක් නම් ප්‍රමාණයත් (විශාලත්වයත්) විවිධත්වයත් නවතාවයත් ඇත්ත වශයෙන්ම ගුණාත්මක භාවය යන්නට කොහෙත්ම සමාන හෝ අනුරූප නොවන බවය.

මනෝමය හැඟීම් :

සම්භාවනීය හා උගතෙකු මෙන්ම අති දක්ෂ බුද්ධිමතෙකු වූ ආනන්ද කුමාරස්වාමි වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයින් ප්‍රකාශ කළ වටිනා දේ අපගේ බහුතර නූතන ලේඛකයන් විසින් ඉවත දැමීම අභාග්‍යයට කරුණකි.

සමෘද්ධිමත් අතීතයක් ගැන රස විඳීම නිරර්ථක දෙයක් ලෙස සලකමින් ඔවුන් ඒ නුවණැති ආදර්ශමත් අවවාද ඉවත හෙළා ඇත. ලෝකයේ අනෙකුත් ප්‍රජාවන් ද ඒ දෙසට යොමු වී සිටියාක් මෙන් මෙවැනි උසස් පුද්ගලයන් හැම විටම තම අවධානය යොමු කළේ ඒක-සංස්කෘතික ප්‍රවණතාවක් පිළිබඳවය. තවද බටහිර ලෝකයේ දක්නට ලැබුණ සමාජීය විප්ලවයන් කරනකොට ගෙන එවැනි සමාජ හිතෛෂී උසස් පුද්ගලයන් විසින් හැම විටම ප්‍රයත්න දරනු ලැබුවේ අපේ රටවල ජීවත් වන ජනතාව වෙත යම් සාධාරණත්වයක් ඉෂ්ට කිරීමටය.

මා කලින් ප්‍රකාශ කළ පරිදි බුදුන් වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන අවස්ථාවන් තුනම ඉපදීම සත්‍යාවබෝධය ලැබීම හා පරිනිර්වාණය සිදු වූයේ සොබාදහම ආශ්‍රිතවය. එම සංසිද්ධීන් ද මා සඳහන් කළා වු එම විශිෂ්ට පුද්ගලයින් විසින් ජනතාවට පැහැදිලි කර ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රජාව ද ඒ අනුව ගස් යට ජීවත් විමට දක්වන විශේෂ ලැදියාව නිදසුනක් ලෙස ගනිමින් මා කතා කරන්නේ කිසි විශේෂත්වයක් තරාතිරමක් මට්ටමක් ගැන සිතා නොවේ. මා කියන්නට යන්නේ මිනිසුන් ගෙවල් සාදා ඒවායේ ජීවත් වී එම ගෙවල් අයිති කර ගනු ලබන්නේ ද යම් කෙළවරක් දැකීමේ අභිප්‍රායෙනි. එසේම ගෙදර තමන්ට අයිති වීම වෙනුවෙන් යම් ස්ථිර වූ අගයක් වටිනාකමක් කවදාවත් ඔවුන් විසින් එම නිවසට ලබා දෙන්නේ නැත. ඒ නිසා නිවස විසින් ඔබව අයිති කර ගැනීමට උත්සාහ කරයි .

විදේශ සංචාරවලදි මුණගැසෙන අපේ ශ්‍රී ලංකා මිත්‍රයෝ බොහෝ කරුණාවන්තව මට සත්කාර කරති. නමුත් ඔවුන් සමඟ සතුටු වන අවස්ථා මෙන්ම කෝපය හා සිත් වේදනා ඇති වන අවස්ථා නැත්තේ නොවේ. ඒ මන්ද යත් ඔවුන්ගේ බිරියන් නව විලාසිතාවන්ට හුරුවීම ගැන අනවශ්‍ය වර්ණනා අටුවා අසා ගෙන

සිටීමට සිදුවීමෙනි ඔවුන් වැඩිපුරම කතා කරන්නේ අධික මිල ගණන්වලට ලබා ගත් තම ගෙවල් දොරවල් පැරණි ගෘහභාණ්ඩ උද්‍යාන පොකුණු පර්සියන් කලාල යනාදි භාණ්ඩමය. ආශාවන්ගෙන් පිරී උද්දාමයට පත් වෙමින් දොඩවන උවමනා නැති වගතුගය.

එක් දිනක් මට රාත්‍රී ආහාරය හා නවාතැන් සඳහා එවැනි ගෙදරකට යාමට ආරාධනා ලැබුණි. එහි අයිතිකාර මිතුරු කාන්තාව එම නිවසේ තබා තිබූ විදේශවලින් ලැබුණාය, ගත්තාය කියන සියලුම බඩුභාණ්ඩ පෙන්වා අවසන් වනතුරු මා වෙත රාත්‍රී ආහාරය පිළිගැන්වීම නිවසේ කිසිවෙකුට කළ නොහැකි විය. අන්තිමේදි ලඟදී මිලදී ගත්තා යැයි කී ජල සයනයෙහි මට එක් වරක් හෝ ඇලවීමට ද සිදු විය. විවිධාකාර භාණ්ඩවලින් පුරවා තිබූ එම නිවස කෘතිම ලෝකයකි. ඔවුන් අවංකවම විශ්වාස කරන්නේ ශ්‍රී ලංකාවේ රජයත් මුළු මහත් ජනතාවත් ඔවුන්ගේ ආදර්ශය අනුගමනය කරන්නේ නම් ශ්‍රී ලංකාවේ සියලු දෙනාටමත් මෙම අපූර්ව ශිෂ්ටාචාරයක ජීවත්වීමේ ප්‍රමිතිය ලබා දිය හැකි බවක්ය. මෙම ප්‍රමිතිය මගේ වචනයෙන් කියතොත් එය ශක්ති හා සම්පත් ඉතා ඉහළ මට්ටමකින් පාරිභෝජනය කිරීමේ අමුතුම විදියේ ශිෂ්ටාචාරයකි. අවාසනාවට සියලුම ශ්‍රී ලංකාවාසීන්ට අන්තර් ජාතික රැකියාවල් ලබා ගැනීම ඉතා අසීරුය. නො ලැබුණ ද බොහෝ දෙනා වැඩිපුර කැමැත්ත දක්වන්නේ එවැනි රක්ෂාවක් ලබා ගැනීමට ය.

භික්ෂූන් වහන්සේලාට ද ජීවන අවශ්‍යතා ඇත. ගිහිගෙය අත් හැර පැවිදි ජීවිතයට පිවිසිය ද භික්ෂූන් වහන්සේලාටත් මූලික මානව අවශ්‍යතා ප්‍රමුඛතාවයන්ට අනුව තෘප්තිමත් කර ගත යුතු බවක් බුදුන් වහන්සේ අවබෝධ කර ගත්හ. ඒවා ඇඳුම් ආහාර නිවහන් හා අවශ්‍ය කරන ඖෂධ ආදියයි. මිනිසා විසින් ඉෂ්ට සිද්ධ කළ යුතු කුසල කර්ම අතරින් මෙම අවශ්‍ය දේ භික්ෂූන්ටත් වෙනත් දිය යුතු අයටත් ප්‍රදානය කිරීම වැදගත් තැනක් ගන්නා බව බුදුන් වහන්සේ පෙන්වා දුන් සේක.

මෙම ලැයිස්තුවට අප විසිනුත් තවත් යමක් එක් කළයුතු යැයි සිතමි. ජලය නොමැති ප්‍රදේශවල මනුෂ්‍යයාට ළිං පොකුණු තනා දීම වාරිමාර්ග ඇල මාර්ග පාලම් රෝහල්, ප්‍රජා මධ්‍යස්ථාන මල් පලතුරු ඖෂධ උද්‍යාන යනාදී අවශ්‍යතා මනුෂ්‍යයාගේ පොදු ප්‍රයෝජනය සඳහා පූර්ණ කර දිය යුතුය. මේවා සලකනු ලබන්නේ ද්විතීයික ප්‍රජා අවශ්‍යතා ලෙසටය.

මිනිසා රෝගී වීමටත් වෛරය ප්‍රචණ්ඩත්වය හා යුද්ධය යන සිද්ධි ඇති වීමටත් මූලික හේතුකාරකය වන්නේ ඔහුගේ ආත්මාර්ථකාමී කෙටි ජීවිතයයි. ඉතා භයානක වූ මෙම ආත්මාර්ථය මුළුමනින්ම උදුරා දැමීමටත් නිරෝගී හා ශිෂ්ටාචාර ජීවන රටාවක් ජනතාව වෙත ලබා දීමටත් ඔවුනොවුන්ගේ මානව අවශ්‍යතා සපුරා දෙමින් මනා සේ සංවිධානය කරවීම පිණිස පැරණි රජ දවසේ රජවරු හා රටවැසි නායකයෝ සාමාන්‍ය ජනතාව අතරින්ම එම කර්තව්‍යය හා වගකීම්වලට සුදුසු වූ ප්‍රජා නායකයන් තෝරා පත් කර ගත්හ. කෙටියෙන්ම කියතොත් ඒ කාලයන්හි මිනිසාගේ නිවැරදි ජීවන රටාවට හේතු වූ සියලුම බුද්ධිමත් ක්‍රියාදාමයන් යම් ආධ්‍යාත්මික පදනමක් මත සැළසුම් වී තිබුණි.

මෙම ගැටළුමය සංසිද්ධිය දෙස අපි සම්පූර්ණ ලෙස ද්‍රව්‍යමය හෝ නැතිනම් ගණිතමය දෘෂ්ටිකෝණයකින් සසඳා බැලුවහොත් විමර්ශනය කළහොත් අපට දක්නට ලැබෙන්නේ ඇත්තටම එහි වාණිජමය ස්වරූපයකි. ප්‍රධාන වශයෙන්ම මිනිසුන්ගේ නිවාස ප්‍රශ්නය විසඳීමට ව්‍යාපාරික ක්ෂෙත්‍රය තුළින් ඉදිරිපත් කෙරෙන විසඳුම් පැහැදිලි නිදසුනක් ලෙස මෙහිදී ගත හැක.

ප්‍රථමයෙන්ම යම් නිවාස සැලැස්මක් නිර්මාණය වී සියලුම සන්නිවේදන මාධ්‍යය තුළින් එම නිවාස සැලැස්ම ආදර්ශයක් සේ ගෙන මහජනතාව දැනුවත් කරනු ලැබේ.

මෙහි ප්‍රධාන පරමාර්ථය වනුයේ මානව අවශ්‍යතාවයක් ඉටු කිරීමක් ලෙස පිරිමැසුම්දායක අඩු වියදම් හා ශක්තිමත් ගෙවල් සාදා

සාධාරණ මිලකට නිවාස නොමැති ජනතාවට ලබා දීම නොවේ. ඉදි කිරීමේ වියදම අඩු හෝ වැඩි වේවා හැකි උපරිමයෙන් ඉන් ලාභ ලැබීමය. මෙහිදී පෙනෙන නොපෙනෙන සෑම කූට උපක්‍රමයක් ම භාවිතයට ගැනේ. අනෙකුත් ගෙවල් සාදන්නන්ට හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නන්ටත් උපරිම ලාභ ඉපයීමට මං පාදා දෙති. පොළඹවති. කාලයට අවස්ථාවන්ට උචිත වන ලෙස පුද්ගලික ව්‍යාපාර ලෙස හෝ මහජන නිවාස ලෙස ඒවාට නම් තබති. අවශ්‍ය වූ විට කැලෑවල වටිනා ගස් පවා කපාගනු ලබන්නේ ද ඒවාට අවසර කොයි විදියෙන් හෝ ලැබෙන නිසාය. ගෙවල් සෑදීමේදී මෙවැනි ව්‍යාපාර මගින් ජනතාවට ඒත්තු ගන්වන්නේ කුමක් ද? යන්න පැහැදිළිය.

අනෙක් අතට මහත්මා ගාන්ධි හා ෆ්‍රිට්ස් ෂූමාකර් (Fritz Schumacher) වැනි කාර්යශූර බුද්ධිමත් ශ්‍රේෂ්ඨ චරිත දේවත්වයෙහි ලා සැලකිණි. තවත් පැත්තකින් දේශීය නිෂ්පාදනයන්ට මහජනතාව සහභාගි කරවා ගැනීම හා උචිතතම තාක්ෂණය වැනි එම ශ්‍රේෂ්ඨවන්තයින්ගේ විශ්වීය සංකල්ප සූක්ෂම ලෙස අපහාසයට භාජනය කරති. ඒ සඳහා ඔවුන් යොදා ගන්නේ නවීන යථාර්ථයන්ට විරුද්ධව යාම ඔරලෝසුව ආපසු කරකැවීම වැනි තර්කයන්ය.

සාමාන්‍යයෙන් බ්‍රාහ්මණයන් ලෙස හඳුන්වනු ලබන්නේ එම විශේෂ උසස් කුලයක උපත ලබන්නන්ය නමුත් මේ වැඩවලට දියුණු රටවලින් අධ්‍යාපන බ්‍රාහ්මණයන් ඕනෑතරම් කුලියට ගත හැකිය. ඔවුන් විසින් ලෝකයේ ජනගහනය අධික වීම විශේෂිතව පෙන්වා දී පුංචි පවුල අගය කරනු ලැබිණ. අධික ජනගහනය නිසා ඇති වන විශාල පවුලට සංවර්ධනය කරා යාම අපහසු වීම එයට හේතුවයි.

මහාචාර්ය යොහාන් ගල්තුන් මෙම ප්‍රතිකර්මය හැඳින්වූයේ එක-දෙක-තුන-හතරේ සංවර්ධනයේ සූත්‍රය කියා ය. එනම්: එක් බිරිඳක් ළමයින් දෙදෙනෙක් කාමර තුනක ගෙයක් සහ රෝද හතරේ මෝටර් රථයක් යන තරමේ පවුලයි. එවැනි පවුල් අද සංවර්ධනය වී ඇත.

කෙතරම් වියවුල් සහිත තත්ත්වයක් තිබුණ ද විශේෂ වරප්‍රසාද ලත් ජන කොටස් විසින් තමන්ගේ බල පුළුවන්කාරකම් ධන සම්පත් සමාජයේ ඉහළ තත්ත්වයන් උපරිමව භුක්ති විඳිති. ඒ අයට එසේ වැජඹිය හැක්කේ තව ටික කාලයකට ය. දක්ෂතා හා කාර්යශූරත්වය හෙබි තවත් සුළු පිරිසක් දියුණුවේ හිනිපෙත්තට ම නගිති. ඉතිරි කොටස වන බහුතරය සැමදාම සිටි තැනම නතර වී ජීවත් වන අයයි. මුලින් සඳහන් කළ කොට්ඨාශයන් සමඟ දැවටී තිබෙන බලය කාලබෝම්බයක් හා සමානය. ද්‍රව්‍යමය බලය ආශාවන්ට වහල් වී සිටින ඔවුන් පහත වැටෙන්නේ ක්ෂණිකව තමන් නොදැනුවත්වමය.

මිනිස් වර්ගයා හා සම්බන්ධ විවිධ ගැටළු සැලකිල්ලට ගෙන ක්‍රියා කරන්නේ නම් එක් සමාජ කොටසක දුෂ්කරතා පමණක් ගැන අවධානය යොමු කර ක්‍රියා කිරීම කළ නොහැකි දෙයකි. සෑම ප්‍රශ්නයක් ම සමස්ත ජනතාවගේම ප්‍රශ්නයක් ලෙස සැලකිය යුතුය. නිදසුනක් ලෙස ගතහොත් සමහර ප්‍රජාවන්ට ආහාර ඇඳුම් වාසස්ථාන නොමැත. එම අඩුපාඩුකම් ඔවුන්ගේ පමණක් ගැටළුවක් ලෙස නොසිතිය යුතුය. ඇත්තෙන්ම ඒවා එම වරප්‍රසාද භුක්ති විඳින පොදු ජනතාවගේ ම ප්‍රශ්නයකි. හැම දෙයකින් ම අඩුපාඩුවක් නැතිව සැප විඳින අය ඒවා අත්පත් කර ගෙන තිබෙන්නේ අද ඊයෙක නොවේ. මේ මිහි මත මිනිසාට පොදුවේ හිමි වන්නා වූ ද්‍රව්‍යමය ස්වභාවික මූල්‍යමය තාක්ෂණික හා ව්‍යුහමය වන්නා වූ සියලු විවිධ සම්පත් ක්‍රම ක්‍රමයෙන් වැඩි වැඩියෙන් භාවිතා කරමින් කළමනාකරණය කර ගනිමින් සිටින්නේ කාර්මික විප්ලව සමයේ සිටම ගෙනෙනු ලැබූ පරිදිමය.

මෙවැනි මිනිස් සමාජයන් හි එකමුතු භාවයක් ගොඩනගා ගන්නේ කෙසේ ද? මේ අයුරින් මිනිස් වර්ගයාගේ ඒකීය භාවයක් ඇති වන්නේ නැති නම් මේ පොළෝ තලයේ ජීවත් වන අනෙක් ජීවීන්ට අත් විය හැකි දුක්ඛදායක ඉරණම කුමක්ද? මෙම ද්‍රව්‍යමය සමාජයන් විසින් තමන් උරුමයෙන් ම හිමි කර ගෙන තිබෙන

දේපල වස්තු අයිතිවාසිකම් හා වරප්‍රසාදයන් පුද්ගලිකව හෝ සාමූහිකව කිසි විටෙක අත් හරින්නේ නම් නැත. නොදියුණු ප්‍රජාවකගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට යම් කැපවීමක් වන්නේ නම් ඇත්තෙන්ම එවැන්නක් කරනු ලබන්නේ තමන්ගේ සංකල්ප පරමාර්ථ රාමුව තුළ තවත් උස් මහත් වීමේ බලාපොරොත්තුවෙන් විනා තම ආශාවන් අනවශ්‍ය වියහියදම් අඩු කර ගනිමින් ඉන් යම් දායකත්වයක් එම සේවාවන්ට ලබා දීමේ හෝ බලකාමී තේජය අඩු කර ගැනීමෙන් හෝ නොවේ. ඔවුන්ගේ ඉහළ මට්ටමේ භාණ්ඩ පරිභෝජනයේ ද වෙනසක් හෝ අඩුවක් කර ගන්නේ නැත.

විමධ්‍යගත කිරීම උසස් තාක්ෂණය මහා පරිමාණයෙන් සිදු කෙරෙන නිෂ්පාදනය ඒකාකාරිත්වය යනාදිය එම සමාජ කාණ්ඩයන්හි වැදගත් ලෙස කැපී පෙනෙන ලක්ෂණයන් ය. තමන් නොදන්නා නමුත් ඇත්ත වශයෙන්ම මෙම ජනතාව ඉබේටම යොමු වී තිබෙන්නේ තමන්ගේ උච්ච බල සම්පන්නකම නිසාම විනාශයට පත් වීමේ ප්‍රවණතාවයකටය.

21 වන ශත වර්ෂය සඳහා ගැටළුවලට විසඳුම් මෙන්ම දියුණුවේ මංමාවත් සෙවීමට මෙවැනි ජනතාවක් කෙරෙහි කිසිවිටෙක විශ්වාසය තැබීම අවදානම්ය. ඉතිරි බහුතරය බේරා ගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද? පැරණි සමාජය මේ සඳහා ඉදිරිපත් වී පශ්චාත්-නවීන සමාජයක් ගොඩනැංවීම සඳහා යම් සාර්ථක ප්‍රයත්නයක් දැරිය යුතුය. එකී සුපිරි ආත්මාර්ථකාමී සමාජ කොට්ඨාශයන් අභිබවමින් වේගයෙන් ඉදිරියට යා හැකි වන පරිදි සුදුසු වූ මනා සැළසුම් ඔස්සේ යම් විසඳුමක් කරා ප්‍රවේශ වීමට පියවර ගත යුතුය. එසේ නොකළහොත් ඔවුන් විසින් ම මේ ශත වර්ෂය අවසාන වීමටත් පෙර ලෝකය විනාශ මුඛය කරා ගෙන යාමට ඔවුන්ගේම ක්‍රම සහ විධි සකස් කර ගනු ඇත.

සර්වෝදය දැක්ම :

පැරණි සමාජ මීට වඩා වෙනස්ය සර්වෝදය ලෙස අප අදහස් කරන හැම දෙනාගේම උදාව ඔවුන් එදා වටහා ගෙන සිටින ලදී. අවිහිංසාව බෙදාහදා ගැනීම චාම් හා සරල බව උචිත තාක්ෂණයන් නිෂ්පාදනයේදී මහජනතාව සහභාගි කරවා ගැනීම හා ඒකීයත්වය යන සංකල්පයන් ඔවුන් විසින් අවබෝධ කර ගෙන තිබිණ. ඔවුන්ගේ ප්‍රධාන අරමුණු යොමු වී තිබුණේ තිරසාර වූ සරල ජීවිතයක් ගත කිරීමටයි. සමෘද්ධියෙන් ආඪ්‍ය වූ සුපිරි සමාජයක් වෙනුවට එම ජනතාවට අවශ්‍ය වී තිබුණේ දිළිඳුකම පිටුදැකිය හැකි සමාජයක් බවට පත් වන්නටය. එතැන ගැටළුව වී තිබුණේ වාසස්ථාන සහ අනෙකුත් මූලික අවශ්‍යතා මෙම ප්‍රජාවට බොහෝ සේ ඉෂ්ට නොවී තිබීමය. ඔවුන් ඉදිරියේ පෙළ ගැසී තිබෙන බාධක ඉවත් කළ හැකි නම් ස්වෝත්සාහයෙන් මෙම ප්‍රශ්න විසඳා ගැනීමට ඔව්හු සමත් වෙති. මගේ රටෙහි මෙන්ම අනෙකුත් රටවලත් බොහෝ නිවාස ඉදි කිරීමේ ව්‍යාපෘතීන් පසුගිය වසර 30 තුළ ආරම්භ කර ඇති බව මට දැන ගන්නට ලැබිණ. නමුත් අපේක්ෂා කරන ශුභසිද්ධිය එම ව්‍යාපෘතිකරුවන් විසින් ජනතාවට ලබා දී තිබුණේ නැත. එයට හේතුව වශයෙන් පෙන්වා දිය හැක්කේ ව්‍යාපෘතිය ඒ සඳහා සුදුසු භූමි ප්‍රදේශය උචිත සැලසුම් ගොඩනැගිලි ද්‍රව්‍ය තාක්ෂණ සහ ඊට සම්බන්ධ වෙනත් කරුණු තුළ අන්තර්ගතව තිබිය යුතු වූ සංකල්පයන් හා අරමුණු හරියාකාරව නිර්ණය කර ගැනීමට ඔවුන් අසමත් වීමයි.

''පාරක් හදමු පාරෙන් හැදෙමු'' වශයෙන් කියමනක් අපේ ඇත. ඒ වගේම අපි විසින් මතක තබා ගත යුතු වන්නේ ''ගෙයක් හදමු අපි ගෙයින් හැදෙමු'' යන්නය. මෙම යෝජනාව හෙවත් වටිනා සත්‍යතාවය පුද්ගලයින්ට හෝ පවුල්වලට හෝ පමණක් වලංගු වන්නක් නොවේ. ඒ හා සමානව ම ගැමි සහ නාගරික කණ්ඩායම් හා සියලුම ප්‍රජාවන්ට ද අදාළ වන උපදේශයකි.

එක්සත් ජාතීන්ගේ 37 වන සාමාන්‍ය සැසි වාරයේදී නිවාස නොමැති අයට නිවාස ලබා දීමේ අන්තර් ජාතික වර්ෂය ලෙස 1987 වර්ෂය ප්‍රකාශයට පත් කෙරිණ. නිවාස ප්‍රශ්නය විසඳීමට මෙවැනි යොමු කිරීමක් සිදුවීමට ප්‍රධාන හේතුව වූයේ ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය ආර් ප්‍රේමදාස මැතිතුමා 1980 වර්ෂයේදි පැවැත්වූ 35 වන එක්සත් ජාතීන්ගේ සැසි වාරයේදී ඒ සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් කිරීමය. තමන් සතු සම්පත් හා තාක්ෂණ භාවිතා කරමින් මහජනතාව විසින් ම තම ගැටළුවලට විසඳුම් ලබා ගැනීමේ හැකියාව හා ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තැබූ අපේ අගමැතිතුමා ගෙවල් ලක්ෂයක් ඉදි කිරීමේ වැඩ සටහනක් දැන් ලංකාවේ ආරම්භ කර ඇති බව ඔබ දන්නවා ඇත. ඒ සඳහා මධ්‍යම රජයේ දායකත්වය සීමා කර තිබෙන අතර රජය වනාහි පහසුකම් සලසා දෙන පාර්ශවයක් පමණි. යළි අවදි වීමේ ග්‍රාමීය සමිති මගින් ක්‍රියාකාරිත්වය සිදුවේ. එය සුදුසු අන්දමේ පියවරකි. ආධාර උපකාර හා ධෛර්යය ජනතාවට ලබා දුන් විට ඔවුන් ශක්තිකරණය වී තමා සතු ශක්ති සම්පත් හඳුනා ගැනීමෙන් සාමූහිකව අවදි වනු ඇත.

දිළිඳු රටවල්වල බහුතර ජනතාවට සිදුවන්නේ තමන්ගේ නිවෙස් තමන් විසින්ම සාදා ගැනීමට හෝ ප්‍රජාවගේ ශ්‍රමයෙන් එය කර ගැනීමටය. ද්‍රව්‍ය සඳහාත් සංවිධානාත්මක ශක්තිය හෝ ප්‍රාග්ධනය සඳහාත් විදේශ ආධාරක ආයතන හෝ තමන්ගේ රජය පිළිබඳවත් ඔවුනට විශ්වාසයක් තැබිය නොහැක. යම් ස්වල්ප හෝ විධිමත් අධ්‍යාපනයක් ලබා තිබූ සාමාන්‍ය අයට නම් මුදල් හා තාක්ෂණික හැකියාව ලබා ගැනීමට ඉඩකඩ තිබේ. ගෙවල් සෑදීමට යෝජනා ලෙස ඉදිරිපත් කරනු ලබන කුමන ආදර්ශයක් වේවා සමාජ පිළිගැනීමක් සහිත විය යුතුය.

තවද නිවාස සෑදීම කළ යුත්තේ ගැමි ජනතාවගේ සංස්කෘතිය ආකල්ප ඔවුන්ගේ විවිධාකාරයේ අත්දැකීම් සහ තවත් නොයෙක් සියලුම කරුණු සම්පූර්ණයෙන් ම අවධානයට ලක් කිරීමෙන් ය.

මගේ සංකල්පයේ හැටියට වාසස්ථාන සහ ඊට සම්බන්ධ අනෙකුත් මූලික අවශ්‍යතාවයන් පූර්ණ කළ යුත්තේ පුද්ගලයාගේ සමස්ත පෞරුෂය උදාවට අවශ්‍ය වන පූර්ව අවශ්‍යතා ලෙසටය. පුද්ගලයාගේ සමස්ත උදාවට බලපානු ලබන්නේ තම පවුල් පරිසරයෙන්ම මූලික ලෙස ලැබුණා වූ මනෝ-භෞතික වටපිටාවය.

ගෙය හා නිවස යන්න දෙකකි. ගෙය භෞතික ලක්ෂණ වලින් පමණක් සමන්විත වන අතර නිවස මනුෂ්‍ය වාසයකි. පවුලේ සියලු කතාබහ තීරණයන් ගනු ලබන්නේ නිවස තුළය. ඒ නිසා ගෙයක් හැම විටම නිවසක් වන්නේ නැත. ගෙවල් සමූහයක් තිබුණාට එය හැම විටම ප්‍රජාවක් නොවන්නේ ඒ නිසා ය. පුද්ගලයාගේ පෞරුෂ උදාව අපි හැම විටම අපේක්ෂා කරනවා මෙන්ම පවුලේ නාගරික හා ග්‍රාමීය ප්‍රජාව සහ ජාතික හා විශ්වමය ලෙස සමස්ත විශ්වම ය ප්‍රජාවගේ සමස්ත උදාව ගැන ද අරමුණු කර ගත යුතුය. සමස්ත පෞරුෂ උදාව යන්න ප්‍රජාව තුළ ඇති කිරීමට බොහොමයක් කරුණු පූර්ණ විය යුතුය. එනම් එවැනි සමස්ත පෞරුෂ උදාවක් බිහි කළ හැකි වන්නේ අප විසින් ඒ පරමාර්ථය උදෙසා නිර්මාණය කරනු ලබන යම් සැලසුම් තාක්ෂණ හා සංවිධානාත්මක ව්‍යුහයන් දයාව කරුණාව සානුකම්පික ක්‍රියාවන් ප්‍රීතිය සමානාත්මතාවය දුක සැප සම සේ බෙදා ගැනීම (සැමදෙනාගේම යහපතට එක්ව වැඩ කිරීම) ප්‍රසන්න කතාබහ හා නිර්මාණාත්මක ක්‍රියාකාරිත්වයන් හා එක හා සමාන ව හැම දෙනා ඇසුරු කිරීම යන මිනිස් ගුණධර්ම සමඟ එකට පෑහුණොත් පමණි.

විද්‍යාඥයන් තාක්ෂණ ශිල්පීන් ගෘහ නිර්මාණ ශිල්පීන් ඇතුළු ලෝකයේ අනෙකුත් උගත්-දැනුමැති පුද්ගලයින්ට තමන් ඉදිරියේදීම බලපාන්නා වූ යම් අභියෝගයක් ඇත. මගේ නිහතමානී අදහසට අනුව නම් එය වනාහි තාක්ෂණයන් හෝ සම්පත් හෝ ඉන් එකක්වත් නොවේ. ඔවුන්ගේ සත්‍ය අභියෝගය නම් ඔවුනට තම සැබෑ පෞරුෂයෙන්ම ලෝකයට මුහුණ දීමට සිදුවී තිබීම ය.

මගේ කතාවේ මුලදී ඔබට මා විස්තර කළාක් මෙන් තමා තුළ සිටින ''ගෙය සාදන වඩුවා'' සොයා ගැනීමට යම් ප්‍රයත්නයක් දැරීමටවත් තවද තම තමන්ගේ මිනිස් ගති ශක්තිමත් කර ගනිමින් වාසස්ථාන නොමැති ලක්ෂ සංඛ්‍යාත මනුෂ්‍යයින්ට නිවාස සාදා දීමට යම් සත්‍ය වූ නිර්මාණාත්මක හා වෙනත් නීතිරීති පද්ධතියකට අනුව යම් කර්තව්‍යයක් ඉෂ්ට කිරීමටවත් ඔවුන් සූදානම් ද?

තාක්ෂණය දේවත්වයෙහි ලා සලකමින් හැම දෙයක් ගැනම කතා කෙරෙන හැටි ඇසූ මම මගේ කතාවේදී පැ‌ෙගන දුප්පත් ජනතාව ඉස්මතු කර පෙන්වීමි. මට තර්ක කරන්නට සිදුවූයේ පෙන්සෙල්වේනියා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය මාටින් මෙයර්සන්, හූස්ටන් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ලැරී බෙල් ආදී අජටාකාශ යුගයේ විද්‍යාඥයන්ගේ තර්ක මැද්දේය. එහෙත් මා පෙන්වා දීමට මහන්සි ගන්නා පැත්ත ඔව්හූ දුටහ. ඒ නිසාම අපි හොඳ මිත්‍රයන් වීමු.

ත්සුකුබා විශ්ව විද්‍යාලයේ දේශනයක් ද ජපන් නිර්මාණ අමාත්‍යාංශයේ නිර්මාණ පර්යේෂණ ආයතනයේ දේශනයක් ද පැවැත්වීමි. ඊයේ ආපසු ටෝකියෝවලට පැමිණි වහාම මහාචාර්ය පිමෝ කෝබෝ සමඟ පැය දෙකහමාරක සංවාදයක් ඔවුන්ගේ පර්යේෂණ සඟරාව සඳහා පැවැත්වීමි. අද කියෝටෝවලට සහ හෙට ඔසාකා නගරයට වැඩ සටහන් කිහිපයක් සඳහා යෑමට තිබේ. 16 වනදා හවායි බලා පිටත් වෙමි.

235

සර්වෝදය කාර්ය භාරයෙහි කොටස්කාරයෝ

සම්පත්දායක පළමුවන රැස්වීම

සර්වෝදය ව්‍යාපාරය අද පවතින දියුණු තත්ත්වය දක්වා වර්ධනය වීමට ඉවහල් වූ හේතු සාධක බොහොමයකි. දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී වැඩ කළ මගේත් අපගේ සර්වෝදය සේවක සේවිකාවන්ගේත් ශ්‍රමය, උනන්දුව හා අවංක කැපවීම එක් හේතුවකි. අපගේ සමාජ සේවා ක්‍රියාකාරිත්වයන්ට, මූල්‍යමය හා විවිධ අන්දමින් ආධාර උපකාර පරිත්‍යාග ලබා දී අප ශක්තිමත් කළ අපේ හිතමිත්‍ර විදේශීය සම්පත්දායක ආයතනවලටත් ඉන් ප්‍රධාන තැනක් හිමි වේ. අපගේ ප්‍රජා සංවර්ධන සහ පුහුණු පාඨමාලා වැනි වැඩ සටහන් සාර්ථකව දිගටම පවත්වා ගෙන යාමටත් එවැනිම වෙනත් බොහෝ ව්‍යාපෘති සඳහා අවශ්‍ය වූ ගොඩනැගිලි ඉදි කිරීම්

සම්පත්දායක පළමු රැස්වීමට සහභාගි වූ පිරිසෙන් කොටසක්

සඳහාත් මුදල් ද්‍රව්‍ය තාක්ෂණික උපදෙස් හා ආධාර ස්වභාවික ආපදා වන සුළිසුළං පුනරුත්ථාපන සේවා ආධාර ඇතුළු විවිධ වූ අන්දමින් ඔව්හු නොමසුරුව නිසි අවස්ථාවලදී අප වෙත සම්පත් ප්‍රදානය කළහ.

අප ව්‍යාපාරයේ සමස්ත කාර්ය භාරය උදෙසා එම කාරුණික සම්පත්දායකයින් විසින් ඉෂ්ට කර ඇති අතිශය ප්‍රසංශනීය දායකත්වය උදෙසා අප ව්‍යාපාරයේ සියලුදෙනා වෙනුවෙන් මගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්නෙමි.

* * *

මා කොළඹ නාලන්දාවේ උගන්වන කාලයේ, 1958 දී කනතොළුව ගම්මානයේ පවත්වනු ලැබූ ශ්‍රමදානයකින් ආරම්භ කරනු ලැබූ සර්වෝදය ව්‍යාපාරය, ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර සංවර්ධකයෙක් හැටියට අද විශ්ව ප්‍රජාව තුළ ද කීර්තිමත් නාමයක් අත්පත් කර ගෙන ඇත. ශ්‍රී ලංකාව තුළ ද ජන සහභාගිත්වක විශාලතම සංවිධානය බවට පත් වෙමින්, දිවයින පුරා ගම්මාන පහළොස්දහසකටත් අධික සංඛ්‍යාවක සංවර්ධන කර්තව්‍යයෙහි වගකීම සාර්ථකව ඉටු කිරීමට මෙන්ම ළමා නිවාස, වැඩිහිටි නිවාස, ආබාධිතයින් සඳහා වෘත්තීය පුහුණු සේවා ආදී විවිධ ව්‍යාපෘතීන් සඳහාත් අපට නොමසුරුව ආධාර උපකාර කළ විදේශීය සම්පත්දායකයින් අපේ මෙම සියලු ජයග්‍රහණයන් සඳහා කොටස්කරුවන් වන බැව් ඉතා සතුටින් මතක් කරමි.

ඒ කාලයේ අප සතු සම්පත්දායක ආයතන 31 කි. මෙතරම් ආධාරක ආයතන සංඛ්‍යාවක උරුම හිමිකම් ලැබීමේ භාග්‍යය අපට උදා වූයේ නිරායාසයෙන්ම ඔවුන් තුළ අප කෙරෙහි ඇති වූ ප්‍රසාදය නිසාය. එම ආයතන නියෝජිතයන් ප්‍රධානීන් මෙරටට පැමිණ, අප ව්‍යාපාරය විසින් රට පුරා ආරම්භ කර තිබූ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් වැඩ සටහන්හි සැබෑ තතු සියැසින් දැක බලා ගැනීමෙන් සර්වෝදය පිළිබඳව ගොඩනගා ගත් විශ්වාසයේ ප්‍රතිඵලයක් ලෙස අපට උදව් කිරීමට අවංකවම ඉදිරිපත් වූහ.

කාලයක සිට අපේ බලාපොරොත්තුවක්ව තිබූ සර්වෝදය සම්පත්දායකයින්ගේ ප්‍රථම රැස්වීම 1986 අගෝස්තු 26 හා 27 දිනයන්හිදී සර්වෝදය මූලස්ථානයේ 'විශ්ව සමාධි' ශාලාවේදී පැවැත්වීමු. මෙවැනි රැස්වීමක් කැඳවීමට අප සැලසුම් කරමින් සිටියේ 1983 කාලයේ සිටමය. නමුත් මේ හැම කෙනෙක්ම වෙන් කරන ලද එකම දිනයක ගෙන්වා ගැනීමේ අපහසුතාවය මත එය කල් යමින් තිබුණි.

ඒ කාලයේ අපේ ප්‍රධාන හා සමීපතම ආධාරක ආයතනය වූ .නොවිබ්. ඇතුළු ආයතන විස්සක පමණ නියෝජිතයෝ පැමිණ සිටියහ. ඔව්හු කැනඩාවේ සීඩා (CIDA) නෝර්වේහි නොරාඩ් (NORAD) හා ෆෝරුට් (FORUT) ස්විස්ටර්ලන්තයේ හෙල්විටාස් (HELVETAS) මහා බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆෑම් (OXFAM), ITDG, ODA හා SCF, කැනඩාවේ මූලස්ථානය වූ I.D.R.C." USAID කෙයාර් (CARE) හා ආසියා පදනම (ASIA FOUNDATION), වර්ල්ඩ් රනර්ස් (WORLD RUNNERS) හෙල්ප් ඒජ් (HELPAGE) අමෙරිකාව සහ ජර්මනියේ ෆෙඩ්රික් නවුමාන් පදනම, (FNS) හා යුනිසෙෆ් ආයතනය ඇතුළු තවත් සංවිධාන නියෝජනය කළහ.

කැනේඩියානු සහ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලත් ජර්මන් තානාපති කාර්යාලයේ නියෝජිතවරුන් ද සසෙක්ස් (SUSSEX) විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඩේවිඩ් වෝල්ටන් මහතාත් (Prof David Waltan) ප්‍රධාන අමුත්තා වශයෙන් ආරාධනා ලැබ සිටි. විශිෂ්ට ශ්‍රී ලංකා පුත්‍රයෙක් වූ මහාචාර්ය රැල්ෆ් බුල්ජන්ස් මහතාද (Prof. Ralph Buljans) රැස්වීමට සහභාගි වූ ප්‍රභූවරුන් අතර සිටියහ. පිළිගැනීමේ කතාව කරමින් මා විසින් අමුත්තක් පිළිගන්නා ලදී.

මහාචාර්ය රැල්ෆ් බුල්ජන්ස් මහතා විසින් ප්‍රධාන දේශනය පැවැත්වූ අතර, මගේ කතාවට අමතරව යුනිසෙප් ආයතනය නියෝජනය කරමින් ආචාර්ය දිලවර් අලි ඛාන් (Dr.Dilawar Ali Khan) මහතාත් සීඩා ආයතනය වෙනුවෙන් කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ ජෝන් සින්කෙලයාර් (Mr. John Sinclair) මහතාද රැස්වීම ඇමතූහ.

ඒ කාලය වන විට අපට බෙහෙවින් ආධාර ලබා දෙමින් සර්වෝදය ගොඩනැගීමට ඉමහත් ශක්තියක්ව ක්‍රියා කළේ නෙදර්ලන්තයේ නොවිබ් ආයතනයයි. එමගින් අපට එතෙක් ලබා දී තිබුණ සංවර්ධන සහයෝගිතා ආධාර නොතිබෙන්නට, අද අපේ ව්‍යාපාරය මේ තත්ත්වයෙන් ඇද ගෙන යාමට කිසිසේත් නොහැකි බව මම රැස්ව සිටි සභාව අමතා ප්‍රකාශ කළෙමි. සර්වෝදයේ ආයතනික යටිතල පහසුකම් වැඩ සටහන් ආධාර විපත් සහනාධාර සංවර්ධන අධ්‍යාපන ආයතන හා ගොවිපළ තණමල්විල සංකීර්ණය නිර්මාණය මොණරාගල දිස්ත්‍රික්කයේ ශ්‍රමදාන සේවාවන් සියල්ල සඳහා සම්පත් වශයෙන් නොවිබ් ආයතනයෙන් අපට කර ඇති මහඟු උපකාරයන් හැම දෙනාට හඳුන්වා දුනිමි. අපේ ප්‍රධාන සම්පත්දායක ආයතනය වශයෙන් නොවිබ් මිත්‍රයාව සැලකෙන්නේ මන්දැයි එදා අනෙකුත් අපේ ආධාරක මිත්‍රයින් තේරුම් ගත්තාට සැකයක් නැත.

ඒ වන විට වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ නොවිබ් ආසියාතික වැඩ සටහනෙහි සභාපති ලෙස කටයුතු කළ පීටර් ඩි. හාන් මහතා (Mr. Peter De Haan) සර්වෝදය සමඟ ඉතා සමීපව රාජකාරියේ යෙදුන කෙනෙක් විය.



පීටර් ඩි හාන්

මෙවැනි සම්පත්දායක රැස්වීමක් කැඳවීමේ ප්‍රධාන අරමුණ වී තිබුණේ බොහෝ අංශවලින් ඔවුන් දැනුවත් කිරීමේත් අප දෙපාර්ශවයන් අතර හිතවත්කම් වර්ධනය කර ගැනීමේ හා ස්තුති කිරීමේ අවශ්‍යතාවයන් මුදුන්පත් කර ගැනීමත්ය.

අපට උදව් උපකාර කිරීම සම්බන්ධයෙන් අප මූලස්ථානයේදී ඒකරාශී වූ ඔවුනට අපගේ වර්තමාන ක්‍රියා කලාපයන් හා ඉදිරි සැලසුම් පිළිබඳවත් යම් අවබෝධයක් ලබා දුනිමු. එපමණක් නොව, අප ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු විවිධ අවශ්‍යතාවයන් මූල්‍යමය පරිපාලනය හා කළමනාකරණය හා තවත් වැදගත් අංශ පිළිබඳව ප්‍රථම වරට පැහැදිලි දැනුවත් භාවයක් ඔවුනට ලබා ගැන්මට ඉඩ ප්‍රස්ථාව සලසා දුන් අතර අප දෙපාර්ශවයන් අතර හිතවත්කම් හා විශ්වාසය තහවුරු වන පරිදි මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට බොහෝ එකඟතාවයන්ට එළඹීමට අපට එහිදී හැකි විය.

සර්වෝදයේ මූලික ක්‍රියාකාරී සැලැස්මෙන් බැහැරව වෙන් වෙන් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාපෘති වුවද පවත්වා ගෙන යා නොහැකි බැවින්, එම කටයුතු පිළිබඳව දැනුවත් කළෙමු.

මෙම දෙදින සම්මන්ත්‍රණයේදී අප විසින් පුළුල් ලෙස සාකච්ඡා කළ තවත් වැදගත් කරුණු දෙකක් විය. අපේ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති හා සර්වෝදය ආර්ථික ව්‍යවසාව සංවර්ධන සේවා සීඩ්ස් (SEEDS) ආයතනය සම්බන්ධවයි. අපගේ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිවල පස්වන අදියර වන ගමට-ගමක් වැඩ පිළිවෙලට අපට ආධාර අවශ්‍ය වී තිබුණි. එම ව්‍යාපෘතිය සීඩ්ස් ආයතනයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වෙමින් තිබුණ ද, සීඩ්ස් ආයතනයට ආධාර ලබා ගැනීම අපට ප්‍රධාන ගැටළුවක් වීය. ඒ පිළිබඳව අපි සම්පත්දායකයන් සමඟ සාකච්ඡා කළෙමු. සීඩ්ස් හි විශේෂ වූ කාර්යක්ෂම ක්‍රියාන්විතය හේතුකොට ගෙන, කෙතරම් බාධක ගැටළු ඉස්මතු වූවත් සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය ස්ථිර ලෙසට සාර්ථකව ඉදිරියට ගෙන යන බව පීටර් ඩි හාන් මහතාගේ නිගමනය විය. සීඩ්ස් ගැන ඔහුට තිබුණේ දැඩි විශ්වාසයකි. සියලුම සම්පත්දායකයින්ට තම අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්ථාව දීමට අපහසු බැවින්, සියලු දෙනාගේම එකඟතාවය අනුව රැස්වීම ආරම්භයේ හා අවසානයේ ද ඒ හැම නියෝජනය කරමින් පීටර් මහතා පොදුවේ අදහස් ඉදිරිපත් කළේය. තවද සීඩ්ස් ආයතනයේ සාර්ථක නැඟීමක් අනාගතයේදී ස්ථිරවම දැකිය හැකි යැයි කී ඔහු,

මූලාශ්‍රමය ස්වයංපෝෂිත භාවය යනු ගැමි ජනතාවගේ ජයග්‍රහණයක් වූ උසස් ගුණාත්මකභාවය යයි ද ප්‍රකාශ කළේය. සර්වෝදයේ ආරම්භක ඉලක්කය වූයේද, ළමා පුරපුර විසින් දැනටමත් අත්පත් කර ගෙන ඇති සමාජීය දේශපාලනික හා ආධ්‍යාත්මික නිදහස වන බැවින්, දැනටමත් එම අරමුණු සාර්ථක වී ඇති බව ද පැවසීය.

සියලුම සම්පත්දායකයින්ගේ අදහස් පොදුවේ එක් කර ගනිමින් පීටර් ඩි හාන් මහතා ප්‍රකාශ කර සිටියේ, සර්වෝදය විසින් නිරත වෙමින් සිටින නිර්මාණාත්මක සේවාවන් ඉතා ප්‍රශංසනීය බවයි. එය මුහුණ පා සිටින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අපට ශක්තිය ධෛර්යය හා ඥානය ලැබේවා.යි ද පැතුවේය.

ප්‍රධාන දේශනය පැවැත්වූ රැල්ෆ් බුල්ජන්ස් මහතා කතා කරමින් ''මෙහි පැමිණ සිටින සම්පත්දායකයින්, සර්වෝදය තුළ දකින්නා වූ ක්‍රියාකාරිත්වයන් ලංකාවේ හෝ වෙනත් රටක කොතැන හෝ වේවා වෙනත් රාජ්‍ය නොවන සංවිධානයන්හි දැකිය නොහැකිය. ඒවා ඉතා උසස් තත්ත්වයක, ඉතා ප්‍රසංශනීය ලෙස පවත්වා ගෙන යන බැවින් ඔබේ දායකත්වයෙන් ඉතා වටිනා මෙහෙවරක්, සර්වෝදය ව්‍යාපාරය මගින් මේ රටේ ගැමි ජනතාවට ඉටු වන බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.'' සර්වෝදය වැනි ස්වේච්ඡා සංවිධානයක සේවය වර්තමාන සමාජයට ඉතා උචිත බව එතුමා ප්‍රකාශ කළේය.

යුනිසෙෆ් ආයතනය නියෝජනය කරමින් කතා කළ ආචාර්ය දිලාවර් අලි ඛාන් මහතා, ''සමස්ත සංවර්ධන විෂයෙහි අවදානම් කාර්ය භාරයක් රාජ්‍ය නොවන සංවිධානවලට බාර වී තිබෙන මෙවැනි කාලයක ආරියරත්න මහතා යටතේ ඉතා වටිනා වැඩ කොටසක් ඉෂ්ට වන බව පැවැසීය. යුනිසෙෆ් ආයතනයේ සමාජ සංවර්ධන කර්තව්‍යයන්හිදී ඉතා කිට්ටුවෙන් අප සමඟ වැඩ කරන සර්වෝදය ව්‍යාපාරය සබඳකම් පවත්වනු ලබන්නේ, බොහෝ කාලයක පටන්ය. ගැමි ප්‍රදේශවලට පානීය ජලය ලබා දීම අත් පොම්ප සැපයීම ළමුන් බේරා ගැනීමේ සෞඛ්‍යය වැඩ සටහන් ප්‍රජා

සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම ඇතුළු ව්‍යාපෘති බොහොමයක් අපි සර්වෝදය හා ඒකාබද්ධව අප ආයතනයේ ආධාර සහිතව ක්‍රියාත්මක කර ගෙන යනවා සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා සර්වෝදය සමඟ අපි පවත්වා ගෙන යනවා අපේ පුහුණු වැඩ සටහන් බොහොමයකි. ඉතා සුහදව සර්වෝදය අප සමඟ වැඩ කරන නිසා මෙතෙක් අත්දැකීම් ප්‍රයෝජනයට ගෙන, එම වැඩ සටහන් හා ආධාර තවත් පුළුල් පරාසයකට ගෙන යාමට අපි අදහස් කරමු''යැයි ද පැවසීය.

කැනඩාවේ සීඩා ආයතනය වෙනුවෙන් කතා කළේ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ උපදේශක ජෝන් සින්ක්ලෙයාර් මහතාය. ''සර්වෝදයත් සමඟ අපේ හිතමිත්‍රකම්වලට තිබෙන්නේ බොහෝ දිගු ධනාත්මක අතීතයක්. අනෙක් සම්පත්දායකයින් සමඟ මෙන්ම අප අතරත් හිතවත්කම් ඇති වූයේ තනි ව්‍යාපෘතිවලට ආධාර දීමෙනුයි. අද අපි රැස්ව සිටින මේ විශ්ව සමාධි ගොඩනැගිල්ල එයට හොඳම සාක්ෂියක්. අපේ මිතු දම්වලට මුල් වූයේ සීඩා හා නොරාඩ් ඒකාබද්ධ ඇගැයීමක් සඳහා සම්බන්ධ වීමෙනි.'' ඉන්පසු සර්වෝදයේ යාවජීව වැඩ සටහනට කැපවීමක් ලෙස අප ක්‍රියාත්මක වූයේ ඉන් පසුවය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කැනඩාවේ සංවර්ධන ඉලක්කය වූයේ ගැමි ප්‍රජා ස්වයංපෝෂිත කිරීමේ සංවර්ධන කාර්යයන්ට උදව් කිරීමය. ඊට ගැලපෙන සංවර්ධන දර්ශනයක් සර්වෝදය සතුවීම නිසා, ඒ වෙනුවෙන් ආධාර කිරීමට පහසු වීම තවත් රුකුලක් වුණා. සර්වෝදය දර්ශනයේ අන්තර්ගත වන අවදි වීමේ සංකල්පය, ස්වාධීනත්වයත්, ස්වයංපෝෂිත භාවයත් යන දෙකටම අදාළ වන පුද්ගලයා හා ප්‍රජාව අතර සබඳකමක් ඇති කරවන කදිම විමර්ශනාත්මක තේමාවකි. බෞද්ධයාගේ ඇතුලාන්තයේ ගුණධර්ම මත පදනම් වූ සර්වෝදය දර්ශනය, සියලුම ආගම් භක්තිකයින් සමඟ සම සේ හැම දෙයක්ම බෙදා හදාගෙන, යහපත උදා කර ගත හැකි මූලධර්මයක් ලෙස ඉතා ප්‍රසංශනීය වන්නකි.

යුක්ති සාධාරණ හා සානුකම්පිකව අන්‍යයන් දෙස බැලීමත් අභ්‍යන්තරික මෙන්ම, බාහිරව ද එක ලෙස පැවැතිය යුතු එකමුතුකමක් සමඟ අප දකින්නා වූ සර්වෝදය දර්ශනය කැනේඩියානුවන් ලෙස අපි ඉතා අගය කරමු.

ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු විශ්වයටම වැදගත් වන ආධ්‍යාත්මික හා සංවර්ධන පණිවුඩයක් ජාතික ව්‍යාපාරයක් බවට පත්ව ඇති සර්වෝදය විසින් නිෂ්පාදනය කරනු ලබන බවයි. ''සිඩා හි පරමාර්ථය සර්වෝදය කාර්ය භාරයේ කොටස්කාරයෙක් වීම'' යනුවෙන් පැවැසීය.

236

ආවරණය-ධෛර්යය සහ කීර්තිය ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍යය

වව්නියාව සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ සේවක ලෙස සේවය කළ කනගරාජා කදිරමලේ සොහොයුරා ඝාතනය කිරීම පිළිබඳ ශෝකජනක පණිවුඩය අපට ලැබුණේ රැස්වීම පවත්වන අතරතුර දීය. ප්‍රධාන දේශනය පැවැත්වූ මහාචාර්ය රැල්ෆ් බුල්ජන්ස් මහතා ආරම්භයේදීම ඒ ගැන යමක් කීවේය.

මහාචාර්ය රැල්ප් බුල්ජන්ස් කළ දෙසුම

අද අප රැස්ව සිටින්නේ ඓතිහාසික මෙන්ම, දුක්ඛදායක අවස්ථාවකය මෙවැනි රැස්වීමක් අප ලංකාවේදී පැවැත්වූ ප්‍රථම වතාව මෙය බැවින්, ඇත්තෙන්ම එය ඓතිහාසික අවස්ථාවක්ම ය. ලෝකයේ රටවල් විස්සකටත් වඩා නියෝජිතයන්, රාජ්‍ය නොවන සංවිධානයක ක්‍රියාකාරිත්වයන් ගැන උනන්දු වී, මේ අයුරින් එක් රැස් වී සිටීම සාමාන්‍යයෙන් සිදු නොවන විරල ගනයේ සිද්ධියක්. ශ්‍රී ලංකාව තුළ ද එය සුවිශේෂ සිද්ධියක් හැටියටයි මා දකින්නේ. හදවතින් ද, භෞතික සම්පත් මගින් ද, ඔබ විසින් සර්වෝදය ව්‍යාපාරය තුළින් ප්‍රදානය කරනු ලබන දායකත්වය වනාහි ප්‍රමාණාත්මකව මෙන්ම, ගුණාත්මකව ද අපගේ පරිසරයටම එක්කාසු කරනු ලබන දායාදයන්ය. මෙම රටට මෙන්ම එහි වෙසෙන ජනතාවට ද උදා වී ඇත්තේ ඉතා අවදානම් වූ කාලපරිච්ඡේදයක් බැවින්, ඔබ සැමගේ පැමිණීම ඇත්තෙන්ම අපට ධෛර්යයකි. මේ රටටත්, එහි වැසියන්ටත් ඉතා දුක් සහිත අන්තරාදායී වන මෙවැනි අවස්ථාවක, ඒ වෙනුවෙන් යම් සහනදායී වැඩ පිළිවෙළකට ඔබ ද සහභාගි වූ බවක් මෙම රැස්වීම සංකේතවත්

කරයි. එහි යථාර්ථය ඉදිරියේදී ඔබට වැටහෙනු ඇත. මෙම වියවුල් සහිත අවස්ථාව ජාතියේම ශෝචනීය කාල පරිච්ඡේදයකි. බොහෝ කාලයක් තිස්සේ යටපත් වී තිබුණ මිනිසුන්ගේ උද්වේගකර හැඟීම් හා එදිරිවාදිකම් යක්ෂාවේශයෙන් පණ ගැන්වී ඇති අවදියක් ලෙස එය හැඳින්විය හැක.

එක් අතකින් ශ්‍රී ලංකාව පසු කරමින් සිටින මෙවැනි කාලපරිච්ඡේදයන් තවත් බොහෝ රටවල ඉතිහාසයන්හි ද නැත්තේ නොවේ. මෙවැනි තත්ත්වයන් සමහර ජාතීන්ගේ සම්භවය හෝ ඔවුන්ගේ ඉදිරි පරම්පරාවන් කෙරෙහි ද බලපාන කරුණුය. බ්‍රිතාන්‍යය අමෙරිකාව රුසියාව චීනය ඉන්දියාව පකිස්තානය බංගලාදේශය ජර්මනිය උතුරු හා දකුණු කොරියාව නයිජීරියාව කියුබාව හා තවත් රටවල් බොහොමයක් ගැන කිව හැක්කේ ඔවුන් ප්‍රචණ්ඩත්වය හා අපේක්ෂාව අතර සිදුවූ විවාහයකින් බිහි වූ දරු පරපුරක් ලෙසටයි. එකී විවාහයෙන් බිහි වූ පරම්පරාවන් විසින් එක්කෝ අන්‍ය ජාතීන් භේදභින්න කර ඇත. නැතහොත් එක්සත් කර ඇත.

හැඟීමෙහි අවශ්‍යතාවය (Crisis of Spirit)

අප සිතා සිටියේ ශ්‍රී ලංකාවේ එවැනි තත්ත්වයන් ගැන අපට මගහැරී ඇති බවක්ය. එපමණක් නොව, දිගු කාලීන බලවත් ජාතික කම්පනයන් ඇති කරවන බිහිසුණු සිද්ධීන්ගෙන් තොරව අප විසින් ජාතික සංවර්ධනය ආරම්භ කළ බවත්ය. නමුත් දැන් ඉතිහාසය අප හා එක් වී ඇත. ප්‍රමාදයේ මිල ගණන් අතිශයින් විෂකුරුය. ජාතිවාදී අර්බුදයක් හැටියට ලංකාවේ සිදුවෙමින් පවතින්නේ කුමක් ද යන්න විමර්ශනයට ලක් කිරීම ඇත්තෙන්ම චාරිත්‍රානුකූල දෙයක්ම වේ. එහි සත්‍ය ස්වරූපය වසන් වී තිබෙන අතර, බාහිරින් දර්ශනය වන්නේ ඊට හාත්පසින්ම වෙනස් සරල ස්වරූපයකි. අප විසින් අද නිරීක්ෂණය කරනු ලබන්නේ එක් අර්බුදයක් නොවේ. එය ''ජාතිවාදී ලේබලය'' යටතේ එවැනි ගැටළු අර්බුද මාලාවක් එකට වෙළී පැටලී

ඇති සංසිද්ධියකි. නොසලකා හැරීම් ඓතිහාසික ලෙස එකට ගොඩ ගැසීමෙන් සෑදුනු අර්බුදයකි. ක්‍රියා පිළිවෙලෙහි හා ව්‍යුහයේ අර්බුදයකි. මූල්‍යමය හා ජාත්‍යන්තර සබඳතාවයන්හි අර්බුදයකි. ක්‍රම සහ විධි යන්නෙහි අර්බුදයකි. තවද එය ජාතිවාදී අර්බුදයක්ද වේ මේ සියල්ලටමත් වඩා එය හැඟීමෙහි අර්බුදයකි.

මේ සියලුම ගැටළු ඒකරාශී වීමෙන් හා එක පිට එක වැටීමෙන් පිටතින් පෙනෙන තරමට වඩා අතිශය සංකීර්ණ තත්ත්වයකට පත්ව ඇත. එබැවින් විසඳීම ද තවත් දුෂ්කරය. රටෙහි රාජ්‍ය අංශයත් දේශපාලනික බලධාරීන් ජාතික ව්‍යවස්ථා සම්පාදකවරු මෙම අර්බුදයේ භයානක අභියෝගයන්ගෙන් ජය ගැනීමට නිරන්තරයෙන් මහත් අරගලයක යෙදී සිටිත්. එමෙන්ම අපේ ජනතාවගේ ජීවිත මේ තරමින් ආරක්ෂා කර ගැනීම හා මෙම ගැටළු තත්ත්වයන්ට ඔරොත්තු දීමට හැකි වන පරිදි ආරක්ෂා කර ගැනීමත් සම්බන්ධයෙන් ඔවුනට ප්‍රශංසා කළ යුතුය.

ආගමික කණ්ඩායම් විසින් ද මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් නොයෙකුත් සාකච්ඡා විමර්ශන පවත්වා ඇති අතර, බොහෝ අවස්ථාවලදී අප සහභාගි වූ ජාතික වාද විවාදයන්ට ද ඔව්හු දායකත්වය ලබාදී තිබේ. නමුත් රාජ්‍ය දේශපාලනික හා විවිධ ආගමික කණ්ඩායම් හි ක්‍රියා පටිපාටීන්ගේ ස්වභාවය තවමත් මතභේද ඇවිස්සෙන සුළුමය. බහු ආගමික බහු ජාතික හා බහු භාෂාවක් තිබෙන සාමාන්‍ය සමාජයක, එය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. මෙම මතභේදයන් ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡා වාද විවාදයන්ට තුඩු දෙන හේතු සාධකයන්ය. කෙසේ වෙතත් අද අප මුහුණ පා සිටින අරගල තත්ත්වයන්, දැනටමත් භේදභින්න වී ඇති සමාජය තව තවත් එසේ වීමට යොමු කරවන සුළුය. සමහර විට එමගින් බිහිසුණු වාතාවරණයක් පැන නැඟීමට ඉඩ ඇත.

ජාතියක 'සම' හෙවත් ආරක්ෂක ව්‍යුහය ඉරිතැලී ගිය විට, එය යථා තත්ත්වයට ගෙනඒමට සුදුසු ප්‍රතිකාරයක් ඉක්මනින් කළයුතුය.

සෑම රජයක් විසින්ම එවැන්නක් ඉෂ්ට කිරීමට උත්සාහ කරන නමුත්, ඒවා ප්‍රමාණවත් නැත. අර්බුදයේ ගැඹුරු පැත්ත පිළිබඳව සිත යොමු කිරීමෙන්, එනම්, හැඟීමෙහි අර්බුදය ගැන ද අපි උනන්දුවෙන් සලකා බැලිය යුතුව ඇත. සාමාන්‍යයෙන් මෙවැනි දේ ආගමික මූලාරම්භ සිද්ධාන්ත සමඟ බැඳී පවතින ඒවාය. අද ශ්‍රී ලංකාව තුළ භෞතික ගැටළු උද්ගත කරන්නා වූ යම් යම් එදිරිවාදිකම් හේතුකොට ගෙන, වෙනත් විවිධ සැකයන් හා සතුරුකම්වලට ද මඟ පෑදීම සිදුවේ. මෙම අවිශ්වාසයන් දේශපාලන ක්ෂේත්‍රයේ සිට ආගමික පසුබිම සම්ප්‍රේෂණය වන ඒවාය. මේවායේ ප්‍රතිඵලයන් ලෙස උදා වී තිබෙන අභාග්‍ය සම්පන්න තත්ත්වය නම් රටේ ජනතාව තුළ අන්‍යෝන්‍ය එක්සත් භාවය ඇති කරමින්, සෑම දෙනා ගැනම එක හා සමානව මධ්‍යස්ථ ලෙස සිතීටමත් ඔවුන් නැඹුරු කරවීමටත් ආගමික කණ්ඩායම් සතු හැකියාව හීන වී යාමය. එම නිසා රාජ්‍ය හෝ දේශපාලනික ද බෙදුම්වාදී ද නොවන ශ්‍රී ලංකා ස්වේච්ඡා සංවිධාන, තම සංකල්පයෙන් පමණක් නොව, ක්‍රියාකාරිත්වයෙන් ද ඉතා වැදගත් හා විශිෂ්ට වූ කාර්යභාරයක් ඒ වෙනුවෙන් ඉෂ්ට කරති.

ඉහත කී ආකාරයට දේශයේ ආරක්ෂක හා සමස්ත ව්‍යුහය හා පද්ධතීන් ඉරිතැලී විනාශ වී යාමේ අභාග්‍යසම්පන්න තත්ත්වයෙන් මුදා ගැනීමට ඉදිරිපත් වී සිටින ප්‍රසංශනීය ස්වේච්ඡා සේවා සංවිධානයකි සර්වෝදය ව්‍යාපාරය. ජනතාව එක්සත් කරමින් විපතට පත් දේශය යළි ගොඩනැංවීමේ මහඟු සේවය ඉතා දක්ෂ ලෙස ඉෂ්ට කරන්නා වූ සර්වෝදය, මෙම සමාජ ව්‍යසනයෙන් රට බේරා ගැනීමට ක්‍රියා කරන්නන් අතර ප්‍රමුඛත්වය ගෙන ඇත. අද එය ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය සංවිධානයක් වී ඇත්තේ ආවරණයත්, ධෛර්යයත්, කීර්තිමත් බවත් යන කරුණු නිසාය.

සර්වෝදයේ දීප ව්‍යාප්ත ක්‍රියාකාරී ජාලය තුළින් ඉෂ්ට කෙරෙන මෙම සේවය නිසා, සාමයේ හා මධ්‍යස්ථව සිටීමේ පණිවුඩය ඉතා දුෂ්කර, මිනිසුන් නොයන ප්‍රදේශවලට යාම ඉතා

වැදගත්ය. ඉතා බිහිසුණු අවස්ථාවලදී යුක්තිය සාධාරණය යන්න ක්‍රියාත්මක කළ හැකි වූත්, නොබියව නැගිට තම අදහස් ප්‍රකාශ කිරීමට හැකි වූත් ධෛර්යය සහ සූක්ෂම ආම්පන්නය සර්වෝදය සතුය. විසකුරු ලෙස හැල හැප්පෙන එදිරිවාදීන් අතර සර්වෝදය තෙවෙනි අධි ශක්ති බලවේගයක් වී තිබෙන්නේ, මෙම ධෛර්යය නිසාය.

අගනා සේවාව නිසා ආචාර්ය ආරියරත්න මහතාත් ව්‍යාපාරයේ සේවකයිනුත් විසින් දිනා ඇති පිළිගැනීම හා කීර්තිමත් බව, ශ්‍රී ලංකාවේ අධික සංඛ්‍යාවක් ජනතාව වෙසෙන දුෂ්කර ප්‍රදේශවලට ගියහොත් ඔබට දැක බලා ගත හැක.

ජනතාව උසස් ගුණාත්මක භාවයකින් යුතුව සර්වෝදය වෙත පුරුදු පුහුණු කිරීමත්, අවංකවම පක්ෂ භේදයකින් තොරව සිදු කරන්නා වූ නිර්මාණාත්මක සංවර්ධනයත්, මෙම කීර්තිමත් බවට පැහැදිලි සාධකයන්ය. ජාතික ලෙස රටෙහි යටිතල ව්‍යුහය කඩා බිඳවැටුණු අවදියක සර්වෝදයේ මෙම සංවර්ධන කර්තව්‍යය අති විශිෂ්ට වූවකි.

ඔබතුමන්ලා විසින් මේ හැම දෙයක්ම හොඳින් කල්පනා කර සිතා බලන අතරම, සර්වෝදය වැඩ සටහන් වාර්තා අගයන්නටත් උනන්දු වන්න. ඒවායේ ඇත්තෙන්ම මූල්‍යමය අනුපාතයන් ව්‍යාපෘති ක්‍රියාකාරිත්වයන්හි සමීක්ෂණ අයවැය විශ්ලේෂණයන්හි වෙනස්වීම් ආදී සියල්ල අඩංගුය. ඒ හැම දෙයක්ම නියමාකාරයෙන් සකස් කරන ලද වාර්තාය. සර්වෝදය වෙනත් සංවිධාන මෙන් නොවූවත්, අරමුණු හොඳින් සාක්ෂාත් කර ගෙන සිටින බැවින්, ඒවා ඉටු කර ගැනීමට අවශ්‍ය සම්පත් නිරායාසයෙන්ම ලැබිය යුතුය, යන්න මගේ විශ්වාසයයි. සර්වෝදයට ද අනෙකුත් විශාල සංවර්ධන සංවිධානවලට මෙන්ම, මහත් ශක්තියක් ද දුර්වලකම් අඩුපාඩුකම් යම් තරමක් ද ඇති බව ඔබ හැම දෙනාම අවබෝධ කර ගනී යයි මා සිතන අතරම, එහි හැම දෙයක්ම හොඳින් සොයා බලා දැන ගැනීමට විවෘතව ඇති නිසා ඔබට ඒ පිළිබඳව සමීක්ෂණය කර දැන ගැනීමට හැකිය.

එවැනි කරුණු සොයා බැලීම් කෙරෙහි ඔබේ සිත යොමු කිරීම මෙන්ම, හොඳින් සිත්හි තබා ගතයුතු තවත් කරුණු දෙකක් පිළිබඳව අවධාරණය කිරීමට කැමැත්තෙමි:

එකක් නම්: සර්වෝදය මගින් කෙතරම් උසස් සංවර්ධන කාර්යයක් ඉෂ්ට කළ ද, සර්වෝදයේ ඉතා වැදගත් කර්තව්‍යය ලෙස පිළිගත යුත්තේ එයම නොව, ශ්‍රී ලංකාවට අද දවසේ ඉතා අවශ්‍යව ඇති, රටෙහි ජාතික සමගිය හා එකමුතුකම ඇති කිරීමේ පරමාර්ථයෙන් ගැමි සේවා තුළින් මෙම සංකල්පය ඉස්මතු කරමින්, සංවර්ධන වැඩ පවත්වා ගෙන යාමය ශ්‍රී ලංකාවට ඉන් අත්පත් වන යහපත මිනිය නොහැක.

නමුත් මගේ රට ගැන සිතන විට එහි නාගරික හා ග්‍රාමීය පරිසරයන්හි සිදුව තිබෙන සංස්කෘතික පරිහානිය දැකීමෙන් හැඟී යන්නේ 'සර්වෝදය' එහි නොමැති වීමේ අඩුපාඩුවය. අපට අහිමි එහි ක්‍රියාකාරිත්වයන්ය. එවැනි තත්ත්වයන් මගින් සිදුවන්නේ තමා විසින්ම විනාශය කරා ගමන් කිරීමයි. ඒ අතින් බලන විට සර්වෝදය යනු සමාජය ප්‍රතිනිර්මාණය කරන සේවාවකි.

සංවර්ධන ක්‍රමයන්හි තිබිය යුතු නම්‍යශීලී බව (Flexibility of Approach)

මේ ශත වර්ෂය මුල් භාගයේදී මහත්මා ගාන්ධිතුමා විසින් යම් උද්ඝෝෂණයක් ඇති කරමින් වටිනා පණිවුඩයක් සමාජයට රැගෙන ආවේය. එනම් කරුණාව දයාව හා ස්ව ශක්තියත් , ජාතික පුනරුත්ථාපනය තුළින් අත්පත් කර ගත හැකිය යන්නය. සර්වෝදය ව්‍යාපාරය අගය කරන එහි ආධාරකරුවන් කියා සිටින්නේ සර්වෝදය තුළින් ක්‍රියාත්මක වන්නේ, ගාන්ධි ප්‍රයත්නයන්ම බවය ගාන්ධි මූලධර්මයේ කොටස් සර්වෝදය විසින් වැළඳ ගන්නවාට මා විරුද්ධයි සර්වෝදයේ ක්‍රියා පිළිවෙල ඊට වඩා වෙනස් විය යුතුය. අප ජීවත් වන්නේ ගාන්ධි ආචාර ධර්මවලට වඩා වෙනස් ලෝකයකයි.

ඒවා අපට නොගැලපෙන බැවින් සුදුසු පරිදි වෙනස් කර ගත යුතුයි. වැදගත් කාරණයක් ලෙස මතක තබා ගතයුතු දෙයක් නම්, සමහර විට නොසැලකිලිමත්කම නිසා හෝ ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය නිසාමත් විය හැකිය. මහත්මා ගාන්ධිගේ දක්නට තිබුණු සමහර සිරිත්-විරිත් හැසිරීම් රටාවන් සුළු ජාතීන්ගේ විශ්වාස භංගත්වයට හේතු වී තිබුණි. ඔහු හින්දු ශාන්තුවරයෙකු ලෙස ජීවත් වීමත්, රාමා රජුගේ පාර්ශවය වෙනුවෙන් කතා කරමින්, ඔහුගේ ධර්මිෂ්ට පාලනය නැවත පැමිණ ඇතැයි ප්‍රකාශ කිරීම නිසා, මෙවැනි තත්ත්වයක් උදා වී තිබුණි. මේ ආකාරයේ දර්ශනයක් හැම දෙනාටම ලෙහෙසියෙන් අනුගමනය කළ නොහැකි දෙයකි.

තවද මෙවැනි බෙදුම්වාදී අනන්‍යතාවයන් තම ව්‍යාපාරයේ පරමාර්ථයන් සමඟ මිශ්‍ර වීමට ඉඩ තැබීම සර්වෝදයට නුසුදුසුය. සියලුම සුළු ජාතීන් තම සමූහයාට එක්කාසු කර ගැනීමට හැකි වීම සර්වෝදයේ විශාලතම ජයග්‍රහණයන්ගෙන් එකකි. නියම වෙලාවට අපට සමීප වන්නා වූ නමුත්, අපට බොහෝ එපිටින් සිටි මාටින් ලූතර් කිං මේ අවස්ථාවේදී අපට සිහිපත් වෙයි. ගාන්ධිගේ තාක්ෂණ හා සටන් ක්‍රම උපයෝගී කර ගනිමින්, ඔහු අමෙරිකාවේ සමාජ විප්ලවයක් දියත් කළේය. මෙහෙය වූයේය. එහිදී ඔහු විසින් සංවර්ධන ප්‍රයත්නයන්ට වඩා විවිධාකාරයෙන් උනන්දු වූයේ, දේශපාලනික අයිතිවාසිකම් ආර්ථික යෝග්‍යතාවයන් ගැනය. මේ සියල්ලටම අනතුරුව මාටිං ලූතර් කිං, නාගරික සුඛෝපභෝගී සමාජයකට පිවිස, එහි ජීවත් වී තම ජනතාවටත් එම වරප්‍රසාදය ලබා දීමට සුදුසු මාර්ග සෙවීමේ නිරත විය.

ශ්‍රී ලංකාවේ අප ජීවත් වන්නේ දිළිඳු සමාජයකය. අප විසින් සියලු දෙනාගේ යහපත, දියුණුව උදෙසා වැඩ කළ යුතුයි. නැතහොත් නිකම් සිටිය යුතුය. තෝරා ගත් පිරිස් සඳහා එසේ කිරීම සුදුසු නැත. සර්වෝදයේ ශක්තිය නම්, මෙම විශ්ව ධර්මතාවය එය විසින් හොඳින් අවබෝධ කර ගෙන සිටීමයි. නායකත්වය වැනි විශේෂ අවස්ථා යටතේ මාටින් ලූතර් කිංගේ ක්‍රමයන් බොහොමයක්

සර්වෝදය විසින් භාවිතයට ගන්නා අතරම එම ක්‍රම හා මූලධර්ම ශ්‍රී ලංකාවේ පැළපදියම් කිරීමට උත්සාහ ගන්නා වූ පිරිස් මගින් අටවනු ලැබූ බොරු වලවල් ද මඟ හරවා ගනිමින්, තම ව්‍යාපාරයේ කටයුතු නිසි පරිදි මෙහෙයවා ගැනීමයි.

මා යෝජනා කිරීමට යන්නේ, සර්වෝදය ව්‍යාපාරයේ ශක්තිය ඇත්තෙන්ම රඳා පවතින්නේ එහි පරමාර්ථයන්ට අනුකූල වන පරිදි සකස් කර ගන්නා වූ නව ක්‍රමසම්පාදනයන් හා ඒවාට ගැලපෙන පරිදි හැඩ ගැසීමට වැඩ කිරීමට ඇති හැකියාව අනුවය, යන්නයි. මෙම නම්‍යශීලී බව ව්‍යාපාරයේ ජයග්‍රහණය හොඳින් තහවුරු කරන අතර එම තත්ත්වය දිගටම පවත්වා ගෙන යන ලෙස අප විසින් අවධාරණය කළ යුතුය. එම නිසා සර්වෝදය ව්‍යාපාරයේ ආධාරකරුවන් කුමක් කීවත් වෙනත් රටවල ව්‍යාපාරයන් සහ ඒවායේ ක්‍රියාකාරිත්වයන් අනුසාරයෙන් හෝ පිටතට පෙනෙන ව්‍යාපාරයේ යම් කරුණුවලින් පමණක් සර්වෝදය තක්සේරු නොකරන්නැයි මා මෙහිදී ප්‍රකාශ කරමි.

නායකත්ව සංවර්ධනයඃ (Leadership Development)

මා කලින් සඳහන් කළ නායකත්වය පිළිබඳව, රටේ නායකත්වය සම්බන්ධයෙන් එහි පරිණාමයේ යම් වැදගත් වකවානුවකට ශ්‍රී ලංකාව දැන් ප්‍රවේශ වී සිටී. විශිෂ්ට වූ දක්ෂ ජන නායකයන් අපට අතීතයේ සිටිය ද, ඊට වඩා වෙනස් කාලපරිච්ඡේදයක් දැන් ඉක්මණින් උදා වී ගෙන එන්නේය. ඉදිරි අනාගතයට සුදුසු වන්නේ ඔවුන්ට වඩා හාත්පසින්ම වෙනස් ගුණාංගයන්ගෙන් යුත් නායකයන්ය.

අවාසනාවකට මෙන් අපට ඇත්තේ නායකයන් පුහුණු හා සංවර්ධනය කරන්නා වූ ආයතන ඉතා සුළු ප්‍රමාණයකි. විධිමත් අධ්‍යාපනය සඳහා පිහිටුවා ඇති අපේ ආයතන වෘත්තීමය කණ්ඩායම් ව්‍යාපාරික සංවිධාන දේශපාලනික ව්‍යුහය ආදී සියලු දායාදයන් වනාහි නායකත්වයේ බීජ වපුරා සරු අස්වැන්නක් නෙලා

ගැනීමට හැකි වන සාරවත් කෙත්ය. නමුත් ප්‍රජා නායකත්ව විෂයෙහි දක්වා ඇති උනන්දුව ඉතා අල්පය. පැහැදිලිවම පෙනී යන්නේ, සමාජයේ වරප්‍රසාද ලත් අය පමණක් හොඳින් සංවර්ධනය වී ඇති බවයි. ගැමි පරිසරයන්හි ජීවත් වන නමුත්, විවිධ වටිනා කුසලතාවයන්ගෙන් හෙබි තරුණයින්ට තම හැකියාවන් වර්ධනය කර ගැනීමට ඉහත කී ශක්තිමත් අයගෙන් උදව් උපකාර නොලැබීම එයට හේතුවයි.

අපගේ ජාතික ප්‍රශ්නය උද්ගතවීමට ප්‍රධාන සාධකයක් වනුයේ නායකත්ව පුහුණුව නිසි පරිදි ක්‍රියාත්මක නොවීමේ දුර්වලතාවයයි. ජනතාව උනන්දු කරවීම සමඟම ජනතා නායකත්වය ද අපට එක හා සමානව අවශ්‍යයි. ප්‍රජා නායකත්වයකින් තොරව ජනතාව වැඩවල නිරත කරවීමේ සිරිත ශ්‍රී ලංකාවේ මෙතෙක් අනුගමනය කළා විය හැක. එසේ නම් පිටින් සිට මඟපෙන්වන නායකයෙකුට වඩා, ජනතාව අතරට ප්‍රවේශ වී අන්‍යයන්ට ආදර්ශමත් වන ආකාරයට වැඩෙහි යෙදෙන නායකයන් අපි ඉදිරියේදී බිහි කරමු. ප්‍රංශ විප්ලවයේදී ආදර්ශවත් ලෙස ක්‍රියා කළ ඩැන්ටර් ඔබට මතක ඇති. ප්‍රංශ විප්ලවය අවස්ථාවේදී මහ සෙනඟ නගරයේ හැම තැනම විසිරී සිටිනවා ඔහු දුටුවේය.

''මිනිසුන් වීදිවල හැම තැනම ඔවුන් කොහේ යනවා දැයි මම නොදනිමි. නමුත් මා ඒ අතරට යා යුතුය. මා ඔවුන්ගේ නායකයාය'' එසේ පැවැසූ ඩැන්ටන් හනිකවම සෙනඟ අතරට දිව ගියේය.

නොදියුණු හෙවත් ග්‍රාමීය ප්‍රජාව තුළ සිදු කළයුතු නායකත්ව සංවර්ධනය මානව සංවර්ධනයේ අති සුවිශේෂ අංගයක් වේ. වැරදි හෝ නොගැලපෙන නායකත්වය මගින් සිදුවන්නේ සාමාජික හා දේශපාලනික වශයෙන් ද, ජාතියක් විනාශය කරා ඇද දමනවා පමණක් නොව, එහි වැරදි කළමනාකරණය හේතුකොට ගෙන රටෙහි සංවර්ධන ප්‍රාග්ධනය වේගයෙන් නැති නාස්ති වී යාමට ඉන් පැහැදිලි මාර්ගයක් විවෘත වීමය. ප්‍රාග්ධනය හිඟවී යාමේ සංසිද්ධිය දිගු කාලීනව පැවතුණහොත් එහි ප්‍රතිඵලය වන්නේ දුර්වල

නායකත්වය හේතුකොට ගෙන ආර්ථික ව්‍යසනයකට ඉඩ සැලසීමය.

මීට අවුරුදු කිහිපයකට පෙර සර්වෝදය නිරීක්ෂකයෝ සිතා සිටියේ, නායකත්වයේ ඉහළම ස්ථානවල සිටින සමහර ව්‍යාපාර හා ආයතනවල ක්‍රියාපටිපාටීන් සර්වෝදය විසින් අනුගමනය කරන්නට ඇත කියාය. නමුත් ඇත්තෙන්ම එය ඊට වෙනස් දෙයකි. ස්වාධීනව හැම දෙයක්ම නිර්මාණය කර ගත් සර්වෝදය, දැන් නායකත්ව පුහුණු ආයතන කිහිපයක්ම උසස් සංවර්ධිත තත්ත්වයෙන් පවත්වා ගෙන යයි. එමගින් ලැබෙන වටිනා දායකත්වය සර්වෝදය ව්‍යාපාරයේ නවතාවයන් සඳහා පමණක් නොව, අනාගතයට මුහුණ දීමට ශක්තියක් සැපයෙන ජාතික සූදානමක් ලෙස ද ක්‍රියාත්මක වන්නකි.

සර්වෝදය නායකත්ව පුහුණු වැඩ සටහන් මගින් ජාතික ලෙස අත්පත් කර ගැනීමට හැකි වූ එම අංශයේ ප්‍රගතිය, ඉතා විශිෂ්ට සේවයක් ලෙස අගය කළ යුතුව ඇත. කෙසේ වුවද මෙවැනි පුහුණු වැඩ සටහන් සහිත කාර්යභාරයන්හි ක්ෂණික ප්‍රතිඵල ලබා ගැනීමට අපහසු බවත්, අප විසින් මතක තබා ගතයුතු කරුණකි. ජාතිය ගොඩනැංවීමට ඉවහල් වන මෙම ක්‍රියාපටිපාටීන් ගුණාත්මකය. එමෙන් දිගුකාලීන ද වේ. සර්වෝදයේ එවැනි කාර්යයන් තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන පීඩනය හෙවත් .තෙහෙට්ටුව. අඩු වීමට සහාය ලැබෙන අතර, අපේ අනෙකුත් අර්බුදයන් අභිබවා ජය ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත. ජයග්‍රහණය අත්පත් කර ගැනීම සඳහා සර්වෝදය විසින් යොදනු ලබන ප්‍රයත්නය ඉතා විශිෂ්ට එකක් බව කිව යුතුය.

නව සංවර්ධන ක්‍රමඃ (New Development Strategies)

දෙවනුව විශාල වශයෙන් වැදගත් වන සංවර්ධන විෂයය සඳහා අප හැම දෙනා විසින්ම විවිධාකාරයෙන් දායක වෙමින් සිටින්නෙමු. කැප වන්නෙමු. පසුගිය දශක හතරක් තිස්සේම සංවර්ධන කාර්යා වලින් ක්‍රියාත්මක වි තිබෙන්නේ, යම් පූර්ව

තත්ත්වයන් ද සැලකිල්ලට ගත යුතුය යන උපකල්පනයෙනි. තුන්වන ලෝකයේ ජාතීන් අතර තිබිය යුතු එක්සත් හැඟීමත්, සංවර්ධනයේ තිර භාවයත් ඒ අතර විය. ඒ කාලයේ හැටියට එනම්: සාමාන්‍ය තත්ත්ව යටතේදී නම්, එම උපකල්පනයන් වලංගුය. ප්‍රයෝ-ජනවත්ය. නමුත් වර්තමාන ලෝකය එම තත්ත්වයෙන් බොහෝ වෙනස් වී ඇත. අද එය සාමාන්‍ය ස්වභාවයේ පවතින්නක් නොවේ.

එබැවින් අපගේ කාර්ය වී තිබෙන්නේ කාලයට සරිලන නව සංවර්ධන ක්‍රම සැලසුම් කිරීමය. ගැටළු වියවුල් සහිත මෙවැනි තත්ත්වයකදී අමාරුවෙන් කළ යුත්තකි, එය සාමකාමී නිහඬ වාතාවරණයක් නැවත එන තුරු බලා සිටීම හෝ සංවර්ධනය යන්න අතහැර දැමීම අපට කිසිසේත් කළ නොහැක. අද දවසේ සංවර්ධනය යන්න ස්ථිරත්වය ආරක්ෂා කර ගැනීමේ මාර්ගයක් මිස, එහි අතුරු ඵලයක් නම් නොවන බව තේරුම් ගැනීම මෙහිදී වැදගත්ය. අනෙකුත් කාලපරිච්ඡේදයන්හි යුක්ති ධර්මයන්ට ගරු කළා වූ සංවර්ධකයින් සංවර්ධන සැලසුම්කරුවන් ඒ සඳහා සම්පත් ප්‍රදානය කරන්නන් ආදී සියලු දෙනාටම මෙවැනි තත්ත්වයක් යටතේදී සංවර්ධන කාර්යයන්ට පිවිසීම ලෙහෙසි පහසු දෙයක් නොවනු ඇත. මින් ඉදිරියටත් දිගු කාලාන්තරයක් සඳහාම අපට වැඩ කිරීමට සිදුවන වාතාවරණයක් එවැනිම එකකි.

එනම් ගැටළු දුෂ්කරතාවයන් මැද ඉදිරියට යාමය. තවද අපට වැඩ කිරීමට සිදුවන නව ක්‍රමයේ ක්‍රියා පටිපාටීන්වලදී නොසිතූ විරූ කරදර තත්ත්වයන්ට මුහුණ දීමට ද ඉන් කෙසේ හෝ ජය ගැනීමට ද අප සූදානම් විය යුතුය. භෞතික සංවර්ධනයට වඩා ආධ්‍යාත්මික අංශය ඇතුළු සමස්ත මානව සංවර්ධනය උදෙසා වැඩි මුදලක් වැය කිරීම වැඩි පඩි ලබමින් සේවය කරන වෘත්තිකයින්ගේ ප්‍රයත්නයන්ට වඩා, දේශීය ස්වේච්ඡා සේවකයින්ගේ උද්යෝගය හා නිර්මාණ-ශීලිත්වය කෙරෙහි වැඩි විශ්වාසයක් තබා වැඩ කිරීම, සංවර්ධන ක්‍රියාවලීන්හි මැනීමේ කටයුතුවලට නවීනතම උචිත මිනුම් ක්‍රම භාවිතා කිරීම වැනි නව ප්‍රවේශයන් තුළින් අප ගමන් කළ යුතුව ඇත.

සංවර්ධනය සම්බන්ධයෙන් මෙවැනි නව මංමාවත් කරා ගමන් කිරීමට සූදානම් වන රටවල් අතුරින්, හේතු කිහිපයක් මත ශ්‍රී ලංකාව අත්හදා බැලීමේ නිදසුනක් ලෙස ගැනේ. ශ්‍රී ලංකාවට හිමි වී තිබෙන වටිනා වරප්‍රසාද බොහොමයකි. නිවාස ඉදි කිරීම වාරිමාර්ග භූමිය නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම, කෘෂිකාර්මික ව්‍යාප්තිය හා අධ්‍යාපනික ඉඩප්‍රස්ථාවන් ආදී වශයෙනි. ප්‍රචණ්ඩත්වය හා දේශපාලනික අසහනය මගින් එම ප්‍රතිලාභයන් පරිහානියට පත් වී හෝ විනාශ වී ගොස්ය. නමුත් තවත් බොහොමයක් ආරක්ෂා වී තිබිය හැකි වුවද, රටෙහි ක්‍රියාකාරී ව්‍යුහය දෙස පොදු වශයෙන් බැලූ විට පෙනී යන්නේ සාමාන්‍ය තත්ත්වයෙන් බැහැරව අධෛර්යවත් හා වියවුල් තත්ත්වයකට එය පත්ව ඇති බවකි. එවැනි තත්ත්වයක් අද සංවර්ධනයේ ස්වභාවයයි. එක අතකින් අපි, අපේ කැපවීම අත් හරින්නේ නම්, එය සමස්ත සංවර්ධනයටම පිටුපෑමකි. එබැවින් අපේ උනන්දුව හා කැපවීම වර්ධනය කර ගනිමින්, රටේ අනාගතය සඳහා යම් අධ්‍යයන ක්‍රියා පටිපාටියකට අනුව ක්‍රියාත්මක වී, සංවර්ධනය සඳහා දායක වී ඉදිරියට යාම අත්‍යාවශ්‍යය.

අද මගේ කතාව ආරම්භ කළේ මුළු ශ්‍රී ලංකාවටම ඉතාමත් වේදනාවක් ගෙන දී ඇති ඉතිහාසගත වන ශෝචනීය පණිවුඩයකින්. එය මේ රටට පමණක් නොව, ලෝකයටම ඒ වගේම වැදගත් දුක්ඛදායක සිද්ධියක්. සංවර්ධනය සඳහා සර්වෝදය මුහුණ දී ඇති ආධාරවල හිඟකම කවදාවත් නැති තරම් ඉහළ ගොස් තිබේ. ආධාරක ආයතන විසින් උපකාර ලබා දීමේ කැමැත්ත අඩු වී යන බවයි පෙනෙන්නේ. විශේෂයෙන් ගැමි ජනතාවගේ යහපත උදෙසා අවශ්‍ය වන එම මුදල් ලබා ගත යුත්තේ, මුදල් තිබෙන අයගෙන් මිස, දුප්පතුන්ගෙන් නොවේ. නුවණැති ශ්‍රේෂ්ට ලේඛකයෙකු විසින් රචනා කරන ලද මෙම නිසඳැස නොසැලකිල්ලෙහි අති භයානක ස්වරූපය විදහා දක්වයි.

''ඔබේ මිත්‍රයින්ට බිය නොවන්න.
මන්ද ඔවුනට පුළුවන් ඔබ පාවා දීමට පමණි.
ඔබේ සතුරන්ට ද බිය නොවන්න.
ඔවුන්ට ද හැක්කේ ඔබව මරා දැමීමට පමණි.
නමුත් බිය විය යුත්තේ,
නොසැලකිලිමත් කමින් ජීවත් වන කොට්ඨාශයටයි.
ඔව්හු කඩාකප්පල්කාරීන්ට හා මිනීමරුවන්ට
නිදැල්ලේ පොළොව මත
සැරි සැරීමට ඉඩ දෙති.''

'අසරණ ජනතාවකට අප උදව් කළ යුතුය' යන හැඟීමෙන් ඔබෙනුත්, ඔබ නියෝජනය කරන ආයතනවලිනුත් මා ඉල්ලා සිටින්නේ, අපේ මෙවැනි උවමනාවන්ට යම් ප්‍රතිචාරයක් දැක්වීම නොසලකා නොහරින ලෙසයි. ඔබලාගේ උද්යෝගයෙන් හා පිරිනමනු ලබන ආධාරවලින් ඉතා අපහසු වූත්, නමුත් අත්‍යාවශ්‍ය වූත්, පරමාර්ථයක් වන උදාසීනත්වයත් අයුතු අසාධාරණත්වය හා දුගීකමත් පළවා හැරීමට සමත් ස්ව-ශක්ති සංකල්පය ක්‍රියාත්මක කිරීමට ඔබ ද පංගුකාරයෙක් වනු ඇත.

කලෙකින් හමු වූ මිතුරු කැල
ජපානය හරහා හවායි දූපතට

මෙවර යෙදී තිබු විදේශ චාරිකාවට සහභාගි වීම සඳහා මා අප නිවසින් පිටත් වූයේ 1985 ජූලි මස 28 වැනි ඉරිදා සවස් භාගයේදීය. 'එයාර් ලංකා' ගුවන් යානයේ පළමුවැනි පන්තියේ අසුනක් මට ඒ සඳහා ලැබී තිබිණි. මට මුලින්ම යා යුතුව තිබුණේ ජපානයේ ටෝකියෝ නගරයට ය. පුරා පැය අටක ගුවන් ගමනක් අවසානයේ අපට ටෝකියෝහි නරීටා ගුවන් තොටුපළට සැපත් වීමට හැකි වීය. එවිට වේලාව දහවල් දහයට වී තිබිණි. නරීටා ගුවන් තොටුපළට පා තැබූ විගස මට හමුවූයේ ටෝකියෝහි 'එයාර් ලංකා' කළමනාකාර තැන්පත් රත්නායක මහතාය. සුහදශීලීව මා පිළිගත් ඒ මහතා පසුව මා ඉන් පිටතට කැඳවා ගෙන ගියේ ය. එවිට ජපානයේ සම්භාවනීය අමුත්තෝ කිහිප දෙනෙක් මා පිළිගැනීම සඳහා එහි පැමිණ සිටියහ.

මහාචාර්ය ඔසාමා මූරෝ නිවානෝ සාම පදනමේ කුනිටෝමෝ ආගම් සහ සාමය පිළිබඳ සමුළුවේ නියෝජිත සයිටෝ සහ තකායාමා යන විද්වත්හු එහි සිටි සම්භාවනීය පිරිස අතර වූහ. උණුසුම් සෙනෙහසින් මා පිළිගත් ඒ අය අනතුරුව ''සෙන්ට්‍රාසා'' නැමැති හෝටලයට මා කැඳවා ගෙන ගියහ. එහිදී විවේකීව දිවා ආහාරය ගෙන ඉන් පසු සවස 3.00 පමණ වන තෙක් අදාළ කාර්ය කටයුතු පිළිබඳ සාකච්ඡා කළෙමු.

රාත්‍රී අටට පමණ මම නැවතත් නරීටා ගුවන් තොටුපළට පැමිණියෙමි. ඒ ඊළඟට මා යා යුතුව තිබූ හොනොලුලු බලා පිටත් වීම සඳහා ය. ජපන් ගුවන් සේවයට අයත් JL 74 යානය ඒ සඳහා වෙන් වී තිබිණ. දින රේඛාව ද පසු කරමින් පසුවදා උදේ 10.00 ට හොනොලුලු ගුවන් තොටුපළට මා සැපත් වූයේ පැය 6 ක ගමනකින්

පසුය. දින රේඛාව පසු කොට පැමිණීම නිසා මගේ ආගමනය එක් දිනකින් ආපස්සට ගොස් තිබිණ. 29 වැනිදා රාත්‍රී 10.00 ට ටෝකියෝ නගරයෙන් පිටත් වූවත් (දින රේඛාව පසු කළ නිසා) මා හොනලුලුවලට ළඟා වූයේ 29 වනදාම උදේ 10.00 ට ය.

කවදත් මා සහෝදරත්වයෙන් සලකන මට ඉතාම හිතවත් මහාචාර්ය ඩේවිඩ් කළුපහන මා මුණගැසීමට එම ගුවන් තොටුපළට පැමිණ සිටිනු දුටු මම සතුටට පත් වීමි. ඔහු මා පිළිගත්තේ උණුසුම් සෙනෙහසිනි. පළමුව ඔහු මා කැටුව ගියේ හවායි විශ්ව විද්‍යාලයට ය. අනතුරුව අපි ඔහුගේ පෞද්ගලික නිවහනට ගියෙමු. ඒ දිනවල ඔහු පදිංචි වී සිටියේ හවායි-කායිවල නොහිලි වීදියේ අංක 7256 දරණ ස්ථානයේ ය. එතැන ඉතාම නිස්කලංක දැකුම්කළු එමෙන්ම සුන්දර ස්ථානයක් විය. අප එම නිවෙසට එන විට කළුපහන මහතාගේ බිරිඳ වූ ඉන්ද්‍රානිත් නන්දන හා මිලින්ද යන දරුවන් දෙදෙනාත් කෙටි නිවාඩුවක් ගත කිරීම සඳහා එහි පැමිණ සිටියහ. ඉන්ද්‍රානිගේ සොහොයුරකු වූ ගාමිණීත් ඔහුගේ සිඟිති පුතාත් මට එහිදි මුණ ගැසිණි.


මහාචාර්ය ඩේවිඩ් කළුපහන

අප සියලුදෙනා එකට මුණගැසුණේ බොහෝ කලෙකිනි. අපි ප්‍රීතිමත් සන්ධ්‍යාවක් ගත කළෙමු.

සිංහල ක්‍රමයට ඉන්ද්‍රානි අතින් පිළියෙල වූ ප්‍රණීත රාත්‍රී භෝජනය භුක්ති විඳ පසුව කෙටි අල්ලාප සල්ලාපයෙක යෙදී

අනතුරුව මා වෙනුවෙන් වෙන් කොට තිබූ කාමරයට ගොස් යහනෙහි සැතපුණේ ගමන් විඩාව නිසාදෝ තද නිදිමත ගතියක් මට දැනුණු බැවිනි.

පසුව දා අපට මහාචාර්ය රොබට් බොබිලින් සහ මහාචාර්ය එලියට් ඩොයිච් ද හමු විය. අපි ඒ අය සමඟ හවායි දූපතේ අනිත් පැත්තේ (උතුරු වෙරළේ) පිහිටි බ්‍රිගම් යං විශ්ව විද්‍යාලයට පැමිණියෙමු. මා දැන් මේ සටහන ලියන්නේ එහි පිහිටි ලැනි ලොආ ලොප් (Lany Loa lop) නැමැති හෝටලයේ සිට ය. අප නවාතැන් ගත්තේ මෙම හෝටලයේ ය.

මා මෙවර හවායිවලට පැමිණියේ ''මානව සමගි සමුළුව'' (Human Unity Conference) නැමැති සංවිධානයේ 12 වැනි ලෝක සම්මේලනයට සහභාගිවීම සඳහා ය. මේ සඳහා මට ඇරයුම් කළේ මෙම සමුළුවේ සභාපතිවරුන් වන පැටී සහ මානි වීක්ස් යන විද්වතුන් දෙපළ ය. රටවල් 30 කින් දහසක් පමණ නියෝජිත පිරිස් මෙම සමුළුවට පැමිණ සිටිති. පළමු වැනි දිනයේ මට මිනිත්තු දෙකක කතාවක් ද දෙවැනි දිනයේ පැය දෙකහමාරක වැඩ මුළුවක් ද තවත් පැය දෙකක වැඩ මුළුවක් සහ පැය භාගයක කතාවක් ද කිරීමට තිබිණ. ඒ සියල්ලක් ඊයේ රාත්‍රිය වන විට නිම කරන්නට හැකි වීය. මේ නිසා අද උදේ කාලය විවේකයෙන් සහ නිදහසින් ගත කිරීමට මම තීරණය කළෙමි.

මා තුළ මෙතැන සිටින අන් අයට වඩා විශේෂත්වයක් තිබේ දැයි මම නොදනිමි. එහෙත් මෙහි සිටින සෑම දෙනෙක්ම මට දක්වන්නේ අසීමිත ආදරයක් යැයි මට සිතේ. ඇත්තෙන්ම මේ ආදරය ලැබීමට මා සුදුස්සෙක් දැයි මම ම කල්පනා කරමි. මුණගැසෙන හැම කෙනෙක්ම මට කියන්නේ ''ආරි ඔබ දැකීමටත් පෙර ඔබ මා තුළ ඇති කළ වෙනස ඔබට හිතා ගන්නත් බෑ. මගේ ජීවිතය ඔබ වෙනස් කළා. ඔබේ කෙටි දේශනයේ හැම වචනයක් ම අපට මිණිමුතු වගේ ඉතාම අනර්ඝයි. ඒවා අපේ සිත් සතන් ප්‍රබෝධවත් කළා ආලෝක කළා''

සිනාමුසු මුහුණින් යුතුව මා වෙත එන බොහෝ අය පවසන්නේ මෙවැනි වදන්ය. ආශිර්වාදයන්ය. මා අන් අයට අසීමිතව මෛත්‍රිය දක්වන නිසා මෙසේ ඔවුන්ගේ ආශිර්වාදයත් දයාවත් ලැබෙනවා විය යුතු යැයි මට සිතේ.

මෙම සමුළුව අමතා දෙසුම් පවත්වන්නට තවත් විශේෂ අමුත්තන් පහළොස් දෙනෙක් පමණ මෙහි පැමිණ සිටිති. එයින් කිහිප දෙනෙක් පිළිබඳ කෙටි සටහනක් තැබීමට මම කැමැත්තෙමි.

මට මුලින්ම ප්‍රසිද්ධ රූපවාහිනී සාකච්ඡාවකදී මුණගැසුන මේජර් ජනරාල් එස්.එස්.උබාන් මහතා සහ ඔහු සමඟ පැමිණි හරින්දර් දූර්ගා මහත්මිය ඉන්දීය සාම සේවය නියෝජනය කරන වැදගත් විද්වත් දෙපළකි. බංගලිදේශ යුද්ධයේදී අණ දෙන නිලධාරියා වශයෙන් කටයුතු කොට ඇත්තේ මෙම මේජර් ජනරාල් උබාන් මහතා ය. එවකට බංගලිදේශ අගමැති මුජිබර් රහමන් ලවා පකිස්තාන් සොල්දාදුවන් 9300 ක් නිදහස් කර ගැනීම ද පකිස්තාන අගමැති අලි භුටෝ සමඟ සාකච්ඡාවකට ඔහු පොළඹවා ගැනීම ද සම්පාදනය කර ඇත්තේ උබාන් මහතාගේ යෝජනාවලියකට අනුව ය. මේ වන විට විශ්‍රාමික ජීවිතයක් ගත කරන ඔහු දැන් ආගම් සහ සාමය පිළිබඳ සමුළුවේ උප ලේකම් වශයෙන් කටයුතු කරන අතර සාමයට සම්බන්ධ තවත් වැදගත් ජාත්‍යන්තර ආයතන රැසකම නිලතල හොබවමින් කටයුතු කරයි.

වෛද්‍ය ආතර් පැඩ් ඇඩම්ස් මට මුලින්ම මුණ ගැසුණේ මෙහි භෝජන ශාලාවකදී ය. ඔහු දුටු විට කවරකුට වුවද ඉබේම සිනහ පහළ වෙයි. එයට හේතුව ඔහු නිතරම කෘත්‍රිම දිග නාසයක් පැළඳ ගෙන සිටින නිසාය. ඔහු පුදුම විදියේ වෛද්‍යවරයෙකි. ඔහු රෝගීන්ට සේවය සලසන්නේ මුදල් අය කිරීමකින් තොරවය. එමෙන්ම රෝගීන් ඒ අයගේ නෑදෑයන් අතරේ තබා ඒ අය හා එකට ජීවත්වීමට සලස්වා ප්‍රියජනක හා විනෝදාත්මක පරිසරයක් තුළින් රෝග සුව කිරීම ඔහුගේ සම්ප්‍රදාය වී ඇත. ඔහු එය හඳුන්වන්නේ ''වෙදකමත් හෙදකමත් එකමුතු කොට රෝග සුව කිරීමේ කලාව'' යනුවෙනි.

ඊළඟට මගේ සිත් ගත් යුවළක් වූයේ බ්‍රිතාන්‍යයෙන් පැමිණ සිටි ඇන් සහ රිචඩ් බැන්ක්රොෆ්ට් ය. ඒ අය බෞද්ධ ය. බුදුදහම පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති ඇන් මේ වන විට බෞද්ධ දර්ශනය පිළිබඳ වටිනා ග්‍රන්ථයක් ද ප්‍රකාශයට පමුණුවා ඇත. පූජ්‍ය පණ්ඩිත මැදගම වජිරඥාන හිමිපාණන්ගේ සමීපතම හිතවත් දායකයන් දෙදෙනෙකු වන මේ යුවළ වරක් ශ්‍රී ලංකාවට පැමිණ රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන බලන්නට ගිය අවස්ථාවෙක සර්වෝදය මූලස්ථානය බැලීමට ද ගොස් ඇති බව දැන ගත හැකි විය.

මීළඟට ඔබට හඳුන්වා දෙන්නේ තරුණයෙකි. ඔහු දැනට වියනාවේ පදිංචි වී සිට නැගෙනහිර යුරෝපයේ ප්‍රචලිත ''ගව්සියා වෛශ්නව'' නැමති සංවිධානයේ නායකයා ලෙස සේවය කරයි. ඔහු හඳුන්වන්නේ භක්ති දයාල් ස්වාමි යන නමිනි. ඔහු උපත ලබා ඇත්තේ හංගේරියාවේය. නිතරම දුඹුරුපාට වස්ත්‍රයෙන් සැරසී සිටින ඔහු ජාතීන් අතර සුහදතාවය ඇති කිරීම සඳහා විශාල සේවාවක් සලසන ආධ්‍යාත්මික නායකයෙකි.

කලින් කොස්ටාරිකාවේ ජනාධිපති වශයෙන් සිටි දැනට එක්සත් ජාතීන්ගේ සාම විශ්ව විද්‍යාලයේ සභාපති ධූරය හොබවන රොඩ්රිගෝ කරාසෝ මහතා මෙම සමුළුවට සහභාගි වන තවත් විශේෂිත පුද්ගලයෙකි විද්වතෙකි. ඔහු කොස්ටාරිකාව පාලනය කරන අවදියේදී එහි යුද්ධ හමුදාව විසුරුවා හැරියේය. යුද්ධ හමුදාවක් නැති ලෝකයේ එකම රට කොස්ටාරිකාව විය යුතු යැයි මම සිතමි. ඒ රටේ මූලික ජාත්‍යන්තර ප්‍රතිපත්තිය වූ ලෝක සාමය ඇති කිරීමට යොමු කිරීම යන ප්‍රතිපත්තිය බිහි කිරීමේ පුරෝගාමියා මේ ශ්‍රේෂ්ඨ පුරුෂයා බව සඳහන් කළ යුතුව ඇත.

''ස්පිරිට් ඔෆ් සන්රයිස්'' නැමැති මාහැඟි කෘතියේ කතුවරයා වූ ජෝර්ජ් එමරි මෙම සමුළුව නියෝජනය කළ තවත් ප්‍රසන්න පුද්ගලයෙකි. අටවැනි ජාත්‍යන්තර මානව සමගි සමුළුවේ සභාපති හැටියටද ඔහු කටයුතු කොට ඇත.

තවත් විද්වතුන් දෙදෙනෙක් වූ ජෝන් ග්‍රහැම් සහ ඈන් වෙඩ්ලොක් නැමැති සමාජ සේවීන් දෙදෙන අරඹා ඇති අපූරුතම ව්‍යාපෘතිය හඳුන්වන්නේ 'ජිරාප් ව්‍යාපෘතිය' නමිනි. පොදු යහපත සඳහා ''බෙල්ල දිගු කිරීමට'' මිනිසුන් පෙළඹවීම මෙම ව්‍යාපෘතියේ මූලිකතම අරමුණය. ලිබියාවෙන් ඇමරිකානු ගුවන් තොටුපළ ඉවත් කිරීමට සැරසුණු විට එය භාරව කටයුතු කර තිබෙන්නේ ජෝන් ග්‍රෙහැම්ය. කලින් ඇමරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරියකු ලෙස සේවය කොට ඇති ඔහු එයින් ඉවත්ව පූර්ණ කාලීන සමාජ සේවයට අවතීර්ණ වී ඇත්තේ මිනිසාගේ හෘද සාක්ෂියට පිටුපා රාජ්‍ය නායකයින් ක්‍රියා කිරීමේදි සිදුවන විපත අවබෝධවීමෙන් අනතුරුවය.

බ්‍රහ්ම කුමාරි ජයන්ති සොහොයුරිය එංගලන්තයේ ලන්ඩන් නුවර පිහිටි රාජයෝග මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරිය ය. ඇය මට කලින් නිව්යෝක් නගරයේ පැවැති සමුළුවකදී ද හමු වී තිබිණ.

එක්සත් ජාතීන්ගේ සහකාර ලේකම්වරයකු වූ ජේම්ස් ඕසීජොනා මහතා සියරා ලියොන්වල සිට පැමිණි අයෙකි. ජාතිවාදයට එරෙහිව එක්සත් ජාතීන් මෙහෙයවන වැඩ සටහන බාරව කටයුතු කරන්නේ මොහු ය. එක්සත් ජාතීන්ගේ සංගමය සාම කටයුතු අරඹයා මෙහෙය වන වැඩ සටහන්වලදී ඊට අදාළව විශේෂඥමට්ටමේ මාර්ගෝපදේශ සපයන්නේ මෙතුමාය.

බුරුමයේ හිටපු අගමැතිවරයකු වූ ඌ තාන් සමඟ එකතුව ප්ලැනටරි සිටිසන්ස් ආයතනය ආරම්භ කළ ඩොනල්ඩ් කීස් මහතා ද මෙම සමුළුවට සහභාගි වි සිටින තවත් විද්වතෙකි. ඔහු ගත් කතුවරයකුද වෙයි''එර්ත් ඇට් ඔමේගාපැසෙප් ටූ ප්ලැනටයිසේෂන්'' යන කෘතිය ලියා ඇත්තේ ද ඩොනල්ඩ් කිස් මහතාය.

උසස් මට්ටමේ චිත්ත බලයක් ඇති ටෙරී මැක්බ්‍රයිඩ් සහ ඔහුගේ දියණිය ෂෙරී මේ සමුළුවට සහභාගිවීමට පැමිණ නතර වී සිටියේ මා නතර වී සිටි කාමරයට යාබද කාමරයේ ය. පසුගිය කාලය

තුළ ශල්‍යකර්ම තිහකට භාජනය වී සිටින ටෙරී ජීවිතය පිළිබඳ අධෛර්ය නොවී අදත් ගත කරන්නේ සාමාන්‍ය ජීවිතයකි. නිතරම මෛත්‍රිය පෙරදැරිව කටයුතු කරන ඔහු මට දක්වන්නේ පුදුමාකාර ආදරයෙකි.

මා වැනි ආරාධිතයන් කිහිප දෙනෙකු හැරුණු විට මෙහි පැමිණ සිටින සෙසු සියලු දෙනා මෙම සමුළුවට සහභාගි වන්නේ තමන්ගේ වියදමෙනි. පසුගිය දින කිහිපය සඳහා ඒ එක් අයෙකු යටත් පිරිසෙයින් ඩොලර් පන්සීයක් පමණ වියදම් කරන්නට ඇතැයි මම සිතමි. ඒ සියලු දෙනාම මෙම සමුළුවට සහභාගි වීම ජීවිතයේ වැදගත් අවස්ථාවක් නැතහොත් වැදගත් කාර්යයක් ලෙස සලකන්නා සේම මෙය ඓතිහාසික වශයෙන් වැදගත් සිදුවීමක් ලෙස ද කල්පනා කරන බව ඒ අයගේ කතා බහෙන් මට අවබෝධ කොට ගත හැකි විය. මෙහි රැස්ව සිටින අප හැම දෙනාගේ සිතින් හදවතින් පිටවෙන ආදරය මෛත්‍රිය සහ සාම සිතුවිලි විශාල ශක්ති ප්‍රවේගයක් බඹට පත් වී ලෝකයට සාමය උදා කිරීමට එය විශාල පිටුබලයක් වනු ඇතැයි සියල්ලෝම විශ්වාස කරති.

කිසිදු තර්ක විතර්කයක් වාද විවාදයක් මෙහි නැත. සියල්ලන්ම දේවත්වය මානව දයාව සහෝදරත්වය පරිත්‍යාගය ආදී ගුණ තම තමන් පිළිගත් දෘෂ්ටියන්හි පිහිටා ලෝකයට මුදා හැරීමට යත්න දරති. මා සමඟ මෙහි සිටින ටිබැට් ජාතික ස්වාමීන් වහන්සේලා කිහිප නමක් සහ තවත් කිහිප දෙනෙකු ද හැරුණු විට අනික් හැම දෙනාම 'ආත්මය' හෝ 'දෙවියන්' මුල් කොට කතා කරන නිසා මගේ අරමුණ වූයේ 'පටිච්ච සමුප්පන්න' පදනමේ සිට 'මැද පිළිවෙත' තුළින් මා කරන දේ තේරුම් කිරීම ය. මම එය මගේ උපරිම ශක්තියෙන් ඉටු කළෙමි.

මිනිසාගේ පෞරුෂය රූප-වේදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධය වශයෙනුත් පඨවි-ආපෝ-තේජෝ-වායෝ-ආකාශ යන ධාතු වශයෙනුත් ගෙන පටිච්ච සමුප්පන්නව අප ගමන් කරන හැටිත් අපේ විමුක්තිය අප අතම 'අරි

අට මඟ' ගමන් කිරීමෙන් සාක්ෂාත් කර ගත හැකි අන්දමත් සර්වෝදය අත්දැකීම් මගින් උදාහරණ දෙමින් මම කතා කළෙමි. හුස්ම ගැනීමේ තරම්වත් ශබ්දයක් නො නගා මොවුන් මගේ කතාවලට සවන්දීම මගේ ඉමහත් සතුටට හේතු විය.

මෙහිදී මාගේ සිහියට ආවේ අපේ රටේ ඇතැම් බෞද්ධ ජන කොටස් බෞද්ධ මාර්ගයෙන් පිට පැන කරන විනයට එරෙහි කතා බහ සහ විවිධ සාපරාධී ක්‍රියා ගැන ය. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් පිරිසිදු මගෙහි අපේ බහුතරයක් භික්ෂූන් වහන්සේලා හා නායක කාරකාදීන් ගමන් කරත් නම් මුළු ලෝකයම අපට ශීර්ෂ ප්‍රණාමය කරනවා නොවේ දැයි මට කල්පනා විණි.

මෙම සමුළුව පැවැත්වෙන විශ්ව විද්‍යාලය මණ්ඩපය හඳුන්වන්නේ ''බ්‍රිගැම් යං'' යන නමිනි මෙය මෝමන්වරුන් විසින් අරඹන ලද අධ්‍යාපන ආයතනයකි. මෙහි විනය ඉතා දැඩිය කාන්තාවන්ට විශේෂයෙන් අඟ පසඟ මනාව ආවරණය කර ගත් විදිහේ ඇඳුම් පැළඳුම්වලින් සැරසී සිටීමට නීති පනවා ඇත. පිරිමින්ට පවා කොට කලිසම් අත් නැති කමිස ආදියෙන් සැරසී එන්නට තහනම්ය. දුම්බීම සම්පූර්ණයෙන්ම තහනම්ය. අපේ පාසලක විශ්ව විද්‍යාලයක දක්නට නොලැබෙන ආකාර විනයක් මෙන්ම උනුනට ලෙන්ගතුව සිටීමේ ස්වභාවයක් ද මෙහි දක්නට ලැබේ.

මෙම සමුළුව ද ඇමරිකාවේ ඇති වී ගෙන එන විශාල ආධ්‍යාත්මික ප්‍රබෝධයේ ලක්ෂණයකි. හැම දෙනාම ආධ්‍යාත්මික සත්‍යය හා අත්දැකීම් සොයා යෑමට වැර දරති. භාවනාව නමින් විවිධ දේ කරති. ඒ අය එසේම ආධ්‍යාත්මික පාර්ශ්වයට නැඹුරු වන අතරේ එවැනි අපේ රටේ ඇතැම් අය අප ළඟ ඇති ආධ්‍යාත්මික ගුණාංග අතහැර කාමසුඛල්ලිකානුයෝගී පිළිවෙතට නැඹුරු වීමට වෙර දරති. පුදුමයට කාරණය නම් අපේ රජයේ ආර්ථික ප්‍රතිපත්තීන් ඒ කාරණාවලට පොහොර දමන තත්ත්වයට පත් වී තිබීම ය.

තත්ත්වය මෙසේ පැවැතියත් මහාචාර්ය ඩේවිඩ් කළුපහන සූරීන් හවායි විශ්ව විද්‍යාලයේ දර්ශන විද්‍යා මහාචාර්යවරයා වශයෙන් කරන අති උත්කෘෂ්ට සේවාව ප්‍රශංසා කටයුතු ය. ඔහුගේ එම සේවාව නැවත වරක් දැක බලා ගැනීමට ලැබීම මෙවර හවායි ආගමනයෙන් මා ලැබූ තවත් වරප්‍රසාදයක් ලෙස සලකමි. මේ ගමනේදී ද මට ඔහු සමඟ පැය ගණන් නිදහසේ සාකච්ඡා කරන්නට අවස්ථාව සැලසිණි. එය ද භාග්‍යයක් ලෙස මම සලකමි. මා මෙහි සිටින අතර ඔහු පළමුවැනිදා රාත්‍රී බැංකොක් බලා පිටත් වූ අතර 11 වැනිදා ඔහු නැවතත් ලංකාවට යන බව ද මා සමඟ කීවේ ය.

හීනයාන මහායාන බෞද්ධ නිකායයන් අතර මූලික ධර්මය අතින් වෙනසක් නොමැති බව බෞද්ධ විද්වතුන්ට පෙන්වා දෙමින් ඔහු වැදගත් ශාස්ත්‍රීය ආගමික සේවාවක් ජාත්‍යන්තර මට්ටමින් ඉෂ්ට කොට ඇත. එහෙත් අවාසනාවකට මෙන් ඔහු ලියා ඇති වැදගත් බෞද්ධ ශාස්ත්‍රීය ග්‍රන්ථ ගණනාවක් තවමත් හෙළ බසට නඟා නැත. එය විශාල අඩුපාඩුවකි. නිර්මාණවාදය හා ආත්මවාදය ප්‍රතික්ෂේප කරමින් පටිච්ච සමුප්පාද ධර්මය සහ මජ්ජම පටිපදා ධර්මය විස්තර කරමින් ද බෞද්ධ ධර්මයට හින්දු ධර්මයේ ආභාෂයෙන් එකතු වී ඇති මිථ්‍යා මත හේතු සාධක සහිතව විස්තර කරමින් ද ඔහු සම්පාදනය කොට ඇති ග්‍රන්ථ අද විදේශීය උගතුන් අතර ප්‍රචලිතව පවතී. ඇත්ත වශයෙන් ම බුදුරජාණන් වහන්සේගේ ධර්මය ආත්මවාදයෙන් හා ද්‍රව්‍යවාදයෙන් වැසී යන අන්දමට බටහිර බෞද්ධ උගතුන් පතුර වන මිථ්‍යා මතවලට නිසි අන්දමට බුද්ධ වචනයෙන් ම පිළිතුරු දෙන්නේ මහාචාර්ය ඩේවිඩ් කළුපහන බව මගේ විශ්වාසයයි. මේ නිසා නුදුරු අනාගතයේදී ඔහු විසින් ලියන ලද වැදගත් ග්‍රන්ථ අප විසින් හෝ හෙළ බසට නඟා සිංහල පාඨක ජනතාව අතට පත් කරන්නට අපි බලාපොරොත්තු වෙමු.

මා පසුගිය 4 වැනිදා හා 5 වැනිදා දෙදින ගත කළේ වෛද්‍ය ඩැනියෙල් සුසොට් නැමති බෞද්ධ මහතකුගේ නිවෙසකය. මේ නිවෙස පිහිටියේ හවායි විශ්ව විද්‍යාලයේ පිටුපස පිහිටි කඳු මුදුනේ

ලස්සන වන ලැහැබ වලින් යුක්ත අලංකාර පරිසරයක ය. ජපන් ක්‍රමයට සාදා තිබෙන මෙම නිවෙස බෞද්ධ ආශ්‍රමයක ස්වභා-වයෙන් යුතුය. ගේ ඇතුළත බෞද්ධ චිත්‍රවලින් සහ බෞද්ධ ප්‍රතිමාවලින් සරසා තිබේ. මට සූදානම් කොට තිබුණේ එහි

වෛද්‍ය ඩැනියෙල් සුසොට් මහතා සමඟ

බුදුගෙය වැනි කොටසය. ඉටිපන්දම් සහ සුගන්ධවත් හඳුන්කූරු දල්වා දිනපතා ඔහු භාවනාවේ යෙදෙයි. මා එහි ගිය දින මම ඔහුට පන්සිල් දී පසුව මා කරන ක්‍රමයට අප දෙදෙනාම පැය භාගයක් පමණ භාවනාවේ යෙදුණෙමු.

වෛද්‍ය ඩැනියෙල් සුසොට්, මම සහ පිරිස

සුසොට් හා මා අතර මිත්‍රත්වය ඇති වූයේ හතරවැනි දා සමුළුව අවසන් වී අප ආපසු යන්නට සූදානම් වන අතරේය. එහිදී තමාට හිමි චවලට් වර්ගයේ රථයට නැඟී සුසොට් එය පණ ගන්වන අතරේ මා දැක තම රථයෙන්ම යාමට එන ලෙස මට ආරාධනා කළේය. මම එය පිළිගතිමි. අප දෙදෙන අතර මිත්‍රත්වය ඇතිවූයේ එසේය. තමා ලංකාවට ගොස් ඇති බවත් ආචාර්ය ආතර් සී ක්ලාක් තමාගේ හොඳ මිත්‍රයකු බවත් ඔහු මා හා පැවැසුවේය. වෛද්‍ය සුසොට් තම වෘත්තියට මනාව ගැලපුන පුදුම කරුණාවන්ත ගතිගුණ ඇති සන්සුන් පුද්ගලයෙකි. ඔහු දූනට කාම්බෝජ දරුවකු හදාවඩා ගනී. ඔහුට එතරම් වයසක් නැත. අවුරුදු තිස්පහක් පමණ වෙතැයි මම සිතමි. ඔහු තම දෙමාපියන්ගේ නිවෙසට ද මා කැඳවා ගෙන ගොස් ඒ අයට ද මා හඳුන්වා දීමට තරම් කාරුණික වීය.

මේ ගමනේදී දූන හඳුනා ගත් අනෙක් වැදගත් විද්වතා ටිබැට් ජාතික බෞද්ධ නිකායික ප්‍රධාන නාහිමි නමක් වන තායි සිටු රින්පුචි හිමිපාණෝය. මෙම සමුළුවේදී අප දෙදෙන දුටු සැනෙන්ම සුහදව කතාබහ කොට මිත්‍ර විමු. එතුමන්ගේ අනුගාමිකයන් උන් වහන්සේට පුද සත්කාර කරන්නේ මෛත්‍රී බෝසතාණන් වශයෙන් හඳුන්වමිනි. උන්වහන්සේගේ දේශනවලට සවන් දෙන විට මා තුළ උන්වහන්සේ පිළිබඳ ඇති වූ පැහැදීම සහ ප්‍රසාදය කොතෙක් ද යත් එතුමන්ගේ අනුගාමික පිරිස් තුළ පවත්නා විශ්වාසය බඳු විශ්වාසයක් මා තුළ ද ඇති විය.

හවායිවල පිහිටි ධර්ම මධ්‍යස්ථානයේදී උන්වහන්සේ මා කැඳවා පැය දෙකකට ආසන්න කාලයක් සාකච්ඡා කළහ. ටිබැටයේ දලයි ලාමාතුමා එහි ලොකුම ප්‍රාන්තයේ ප්‍රධානියා වන අතර ඊළඟට විශාල ප්‍රදේශයේ ප්‍රධානියා වන්නේ මේ තායි සිටු රින්පුචිතුමාය. සිය ගණනක් ලාමාවරුන් අතරින් පුනරුත්පත්තිය අනුව ඒ නායක තනතුරට තෝරා ගෙන ඇත්තේ මුන් වහන්සේය. මේ වන විට උන්වහන්සේට වයස අවුරුදු 35 ක් පමණ වෙතැයි මට සිතේ.

පස්වැනි දා රාත්‍රි හවායි විශ්ව විද්‍යාලයේ පැවැති සාකච්ඡාවේදී එතුමා විද්වතුන් නැගූ විවිධ ප්‍රශ්නවලට පිළිතුරු දුන් අන්දම දුටු මා තුළ ඇති වූයේ මෙතරම් තරුණ භික්ෂූන් වහන්සේ නමක් තුළ මේ තරම් ගැඹුරු ධර්ම ඥානයක් තිබීම පුදුමසහගත නොවේ ද යන කාරණයයි. ඇත්ත වශයෙන්ම ඒ තරම් මේරූ ධර්ම ඥානයක් උන්වහන්සේ තුළ තිබීම එහි රැස්ව සිටි සෙසු විද්වතුන් තුළ ද විමතියක් ඇති කරන සුළු වීය.

උන් වහන්සේගේ අනුගාමික පිරිස් දැන් චීන පාලනය යටතේ ජීවත් වෙති. ගිය වසරේ චීන රජයේ ඇරයුම පරිදි සිය අනුගාමික පිරිස් බැහැ දැකීම සඳහා චීනයට ගොස් පුරා දෙමසක් උන් වහන්සේ එහි කාලය ගත කොට ඇත. උන්වහන්සේ එසේ චීනයට ගොස් ඇත්තේ අවුරුදු 26 කට පසුවය. සිය ගණනක් ලාමාවරු පැවිදි කළත් ඒ අයගේ අධ්‍යාපනය ධර්ම ඥානය දියුණු කිරීම ජීවන තත්ත්වය උසස් කිරීම ආදිය පිළිබඳ මෙතුමා නිතර කල්පනා කරති. මේවාට උදව් කිරීමට මම ද පොරොන්දු වීමි ශ්‍රී ලංකාවට හැකි විටෙක වැඩම කරන ලෙස ද මම උන්වහන්සේගෙන් ඉල්ලා සිටියෙමි.

මා මුණගැසී කතා බහ කළාට පසු වෛද්‍ය ඩැනියෙල් සුසොට් හමුවූ උන්වහන්සේ ඔහු හා ප්‍රකාශ කොට ඇත්තේ මා තමාගේ සොහොයුරෙක් ලෙස සලකන බව ය. එය මට විශාල ගෞරවයකි. සසර ගමනේදී උන්වහන්සේ මෛත්‍රී බුදු පදවිය ලැබුවහොත් එදාට මටත් විවරණ ලබා ගත හැකි නොවේ දැයි මම කල්පනා කළෙමි.

අනික් භික්ෂූන් වහන්සේ දෙපළත් දසසිල් මෑණියනුත් මට සැලකූ අන්දම ගැන ද මම පැහැදුනෙමි. නාහිමිපාණන් ඇරලීමට ගුවන් තොටුපළට සැපත් වූ ඔව්හු මා පිටත් වන තුරුත් එහි රැඳී සිටියහ.

මෙහි ජීවත් වන බෞද්ධයන්ගේ ශ්‍රද්ධාවත් හැදියාවත් දකින විට අපේ ඇතැම් සංඝයා වහන්සේලා කෙරෙහි ඇති වන්නේ විශාල කලකිරීමකි. අපේ සංඝ ශාසනයත් බෞද්ධ ජනතාවත් ආරක්ෂා කළ හැක්කේ කෙසේ දැයි මම බොහෝ විට කල්පනා කරමි. අපේ සමහර පැවිද්දන් තුළ තිබෙන පණ්ඩිතකම පෙන්වීමේ ගතිය රළු පරළු ස්වභාවය පුහු මානය ආදී දුර්ගුණ මේ එකදු යතිවරයකු වෙතින්වත් ප්‍රතීයමානය නොවෙයි. කවදා හෝ බුද්ධ ශාසනය ආරක්ෂා වන්නේ මේ ශ්‍රද්ධාශීලී ප්‍රඥා සම්පන්න ගුණවන්ත භික්ෂු පරම්පරාවෙකින් නොවේ දැයි මට කල්පනා විණි.

අද (අගෝස්තු 8 වැනිදා) පස්වරුවේ ටෝකියෝවලින් පිටත් වන එයාර් ලංකා යානයෙන් මම ආපසු සියරට බලා යන්නෙමි. ඊයේ හොනොලුලු නගරයෙන් පිටත්ව දින රේඛාව පසු කළ නිසා දිනක් ඉදිරියට ගොස් හත්වැනිදා දවල් ටෝකියෝ නුවරට ළඟා වීමි.

මා ත්සුකුබා සමුළුවේදී මිත්‍ර වූ මහාචාර්ය ඉවසාකිගේ ගෙදර ඊයේ රාත්‍රී ගත කොට ත්සුකුබා ප්‍රදර්ශනය ද බැලීමට ගියෙමි. එහිදී චාරිකා දියණියගේ මිතුරියක වූ චන්ද්‍රිකා ද හමුවීමි.

238

ජපන් සමාජයේ මානසික විවේකය දෙන තැනක්

මට ජපානයේ ''ජීවා'' සංවිධානයේ ඔලිම්පික් මධ්‍යස්ථානයේදී ආචාර්ය වී යුං මුණගැසීමේ අවස්ථාව වරෙක හිමි විය. සම්මුඛ සාකච්ඡාව මෙහෙය වූයේ මැකී මෙනෙවියයි. ඇය ජීවා ආයතනයේ ප්‍රකාශන බාරව කටයුතු කරයි. වී මහතා මට මීට කලින් වොෂින්ටන් ලෝක සම්පත් ආයතනයේ රැස්වීමේදී මුණගැසුණු කෙනෙකි. ඔහු විශේෂ පුද්ගලයෙකි. ජපානයේ වත්මන් සංවර්ධන ක්‍රමය වඩා මානුෂික වඩා සොබාදහමට ඉසිලිය හැකි වඩා සාධාරණ දිශාවකට හැරවීමට ඔහු කටයුතු කරයි. ටෝකියෝ විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයෙකු වූ ඔහුට උසස් වීම් නොලැබී තිබෙන්නේ ඔහුගේ මේ අතිශය ප්‍රගතිශීලී අදහස් නිසා යයි කියනු ඇසේ.

ආසියා පාරිසාරික සංගමයේ සභාපතිවරයා වූ මොහු ඉංජිනේරුවෙකි. කසල ඉවත් කිරීමට සොබා දහමට එකඟ විද්‍යාත්මක ක්‍රම රැසක් ම අඩු වියදමින් ඔහු ගොඩනගා තිබේ. මහා පරිමාණ තාක්ෂණයෙන් මුදල් උපයන සමාගම් හා ඔවුන්ගෙන් අල්ලස් ලබන දේශපාලකයෝ ඔහුට විරුද්ධ වෙති. ඔහු 'මැග්සයිසයි ත්‍යාගය' සඳහා යෝජනා කිරීමට සුදුස්සෙකු බව මම සිතට ගත්තෙමි.

කුනිටාමෝ සාන් සමඟ පැය දෙකක් දුම්රියෙන් ගමන් කොට මම ආසියානු ග්‍රාමීය ආයතනය Asian Rural Institute බැලීමට ගියෙමි. කුනිටාමෝ මහතා නිවානෝ සාම පදනමේ සංවර්ධන ආධාර දීම බාරව සිටි තැනැත්තා ය. 31 වැනි වියැති මොහු ගරු නිකියෝ නිවානෝ ගොඩනඟන ලද තරුණ නායකයන්ගෙන් කෙනෙකි . දැනට යෙන් දෙකෝටියක විදේශාධාර ඔවුන් සපයන බව මා හා පැවැසුවේය.

අප ආසියානු ග්‍රාමීය ආයතනයට ළඟා වන විට අපර භාගයේ තුනට පමණ ඇත. මෙය හෙක්ටයාර් හයක පිහිටි කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානයෙකි. මෙහි ආරම්භකයා ගරු ටෝෂිහිරෝ ටකාමි රෙපරමාදු ආගමට අයිති පූජකවරයෙකි. පුරෝගාමී ජීවයක් ඇති මොහු යම් විශේෂ දෙයක් ගොඩනඟා විශේෂ සේවාවක් කළ කෙනෙක් බව ඔහු දුටු විගසම පැහැදිලි වෙයි. එතුමෝ නිහතමානීය. බුද්ධිමත්ය. කඩිසරය.

මේ ආයතනය පිහිටියේ ටොචිකියෙන් නමැති ප්‍රදේශයේ නිෂිනාසුනෝ නමැති ගමේය. මනස්කාන්ත ගැමි පරිසරයකි. වන සම්පත් හොඳින් රැක ගෙන තිබේ. සියලුම කෘෂිකාර්මික කටයුතු කරන්නේ රසායනික පොහොර නොමැතිව ස්වභාවික වියළි කොම්පෝස්ට් පොහොර භාවිතයෙනි. ගවයන් කුකුළන් ඌරන් ආදී සතුන් ඇති කර විකිණීමෙන් ලාභ ලබා ස්වයංපෝෂිත වී තිබේ. එහෙත් මෙහි අධ්‍යයනය සඳහා රටවල් 16 කට වැඩි ගණනකින් පැමිණෙන 30 ක් පමණ වූ ශිෂ්‍යයින් විදේශාධාර 70% ක් පමණ ද ස්වදේශාධාර 30% ක් පමණ ද ලබන බව ඔව්හු පැවැසූහ.

සර්වෝදයේ පැවැත්වෙන 'පවුල් හමු' මෙන් දිනපතා ක්‍රිස්තියානි ආගමට බර වූ ආගමික වතාවත් සහිත සාකච්ඡා සභාවක් උදේ වරුවේ මිනිත්තු 45 ක් පමණ පැවැත්වේ. හැමදෙනාම කය වෙහෙසා වැඩ කරති. විදේශවලින් පැමිණෙන අයට පිටස්තර තැන්වලට ගොස් බට කර්මාන්තය ධීවර කර්මාන්තය බොන්සායි පැළ හැදීම ආදී දේ ඉගෙන ගැනීමට ද අවස්ථාව තිබේ. මම ද බට හා බොන්සායි හදන තැන් බැලීමට ගියෙමි. අවුරුද්දේ එක දිගටම පිටින් පැමිණෙන කණ්ඩායම් සඳහා ශ්‍රමදාන කඳවුරු පැවැත්වේ කාර්මීකරණය වී තිබෙන ජපන් සමාජයේ ජීවත් වන බොහෝ අයට මේ ස්ථානය යම් මානසික විවේකයක් දෙන තැනකි.

මෙහිදී වෛද්‍ය හෙම්රාජ් ගයාරම් නැමැති මොරීෂස්වල සිට පැමිණි තරුණ වෛද්‍ය වරයෙකු ද මට මුණගැසිණි. සර්වෝදය සාහිත්‍යය බුරුමයට ගෙන ගිය මෙහි වැඩ කරන ඉසාවෝ නොසාකි ද හමු වීමි.

ඊයේ අපර භාගයේ අපි ආපසු ටෝකියෝ නගරයට ආවෙමු. මා නිව්සිටි හෝටලයේ නවත්වා ගෙදර ගිය කුනිටාමෝ සාන් සවස 5.00 ට පමණ පැමිණ නැවත මා ආසියානු මධ්‍යස්ථානයට කැඳවා ගෙන ගියේය. එහි ස්වේච්ඡා ආයතනවල නියෝජිතයෝ රැස්ව මා වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වූහ.

මම ගෙදරින් පිටවූ පසු කිසිම තොරතුරක් නොදත් නිසාත් මදුරාසියේ බෝම්බයක් පිපිරී විශාල පිරිසක් මරුමුවට පත් වූයේ යැයි පුවත්පත්වල පළ වී තිබූ නිසාත් ඊයේ ගෙදරට දුරකතනයෙන් කතා කළෙමි. නීතා හා සතිස්ගෙන් සියලු තොරතුරු දැන ගතිමි. ඔවුන් ඒ අවස්ථාවේ සිටියේ නිල කමිටු රැස්වීමකයි.

රටට අහිමි කළ මානව හිතවාදියා
නීතිඥකාංචන අබේපාල මරා දැමීම



නීතිඥ කාංචන අබේපාල මහතා

අන්‍යයන්ගේ දුක් වේද - නාවන් දෙස සානුකම්පිතව බැලීමටත් ඇප කැප වීමෙන් යම් අවංක සේවාවන් මිනිස් ප්‍රජාව වෙත ප්‍රදානය කිරීමටත් හැකි වන්නේ මානව හිතෛෂී පරාර්ථකාමී හා නිර්මල හදවත් ඇති අයට පමණි. සමාජය තුළින් ඉබේටම බිහි වන මෙවැනි විරල ගනයේ පුද්ගලයින් නියම සමාජ සේවකයන් බව මගේ අදහසයි. ඒවා ආදර්ශවත් වූ ජීවන චරිතයන්ය. ඔවුන්ගේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ ද මහන්සිය වියදම් ලාභ පාඩු නොතකා කුමන විදියෙන් හෝ තමා දන උගත් දෙයින්, රට-දැය-සමය වෙනුවෙන් යමක් කරන්නටය .

සර්වෝදය ව්‍යාපාරය පටන් ගත් දා සිටම අප විසින් දියත් කරනු ලැබූ සමාජ සේවා ක්‍රියාකාරිත්වයන් හිතේ හැටියට සාර්ථක කර ගන්නට එවැනි විශේෂ පුද්ගලයින්ගේ උපරිම දායකත්වයක් ලබා ගැනීමට හැකි වී තිබීම, අප විසින් සලකනු ලබන්නේ අපේම වාසනා ගුණයක් හැටියටය.

තරුණ නීතිඥයෙක් වූ කාංචන අබේපාල මහතා ද සර්වෝදය හා එක් වී වටිනා සේවයක් අප ව්‍යාපාරය වෙනුවෙන් ද,

පෞද්ගලිකව මිනිසා වෙනුවෙන් ද ඉෂ්ට කළ, මිනිසාට ආදරය කළ, මිනිසා නිසාම මහන්සි වී ඇප කැප වී මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර දීම වෙනුවෙන් තම ජීවිතයෙන්ම වන්දි ගෙවූ උදාර මිනිසෙකුම වීය.

කාංචන අබේපාල මුලින්ම මගේ ඇසුරට වැටුණේ, ඔහු කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ ශිෂ්‍යයෙකු හැටියට ඉගෙන ගන්නා කාලයේදීය. මෙම යුගයේදී නාලන්දා විද්‍යාලයේ ගුරුවරයෙක් ලෙස සේවයේ යෙදී සිටි මා හමුවීමට ඔහු පැමිණියේ, තම මිතුරන් සමඟ විශේෂයෙන් පාරිසාරික කටයුතු මෙන්ම බෞද්ධ කටයුතු සඳහා ඔහු අපේ උපදෙස් පතමිනි. නීති විද්‍යාලයේ අධ්‍යාපනය ලද අවදියේම මානව අයිතිවාසිකම් ක්ෂෙත්‍රය කෙරෙහිම තම අවධානය වැඩියෙන් යොමු කළ කාංචන, නීති විද්‍යාලයේ තම අධ්‍යාපන කටයුතු සාර්ථකව අවසන් කළ පසු, කෙලින්ම ප්‍රවේශ වූයේ මානව හිමිකම් පිළිබඳ නීතිමය රාජකාරීවලටය. ඔහු අධිකරණයේදී ඉෂ්ට කළ වැඩ කටයුතුවලට අමතරව ස්වේච්ඡා අංශයේ ද ක්‍රියාකාරිකයෙක් විය.

සර්වෝදය නීති සහන සේවයට එක් වූ පසු, ඔහුගේ කාලයෙන් වැඩි කොටසක් යෙද වූයේ අධිකරණයෙන් බාහිරව, මානව හිමිකම් පිළිබඳව මිනිසුනට උදව් වීමට පමණක් නොව අතුරුදහන් වූ හෝ සිරගෙයට වැටුණු පුද්ගලයන් පිළිබඳව නඩු පැවරීමටත් ඒවා සඳහා සාධාරණත්වයේ නාමයෙන් පෙනී සිටීමටත්ය. අප හැම දෙනාටම මතක තිබෙන හැටියට, ඒ යුගය මහජනතාව අතිශයින්ම රජයේ භීෂණයටත් රජයෙන් බාහිර භීෂණයටත් යටත් වී සිටි කාලයක් වූයේය. නීතියේ යුක්ති සහගත බවෙහි නාමයෙන් සමාජ සේවයට යොමු වන පුද්ගලයින්ට නීතියේ දැනුවත් භාවය පමණක් ප්‍රමාණවත් වූයේ නැත. මිනිසුන්ගේ දුක් වේදනාවන්ට පිටිවහලක් වන පරිදි, මානව දයාවෙන් පිරි හදවතකුත් මරණයට බිය නැති වීරෝදාර හැඟීමකුත් අවශ්‍යව තිබුණි. කාංචන අබේපාල තරුණයා ඒ අවශ්‍යතා දෙකින්ම සම්පූර්ණ වී සිටියේය.

කාංචන අබේපාල අවසන් වරට මට මුණගැසුනේ, ඔහු ඝාතනයට ලක් වීමට දින දෙකකට පමණ පෙරදීය. රජයේ භීෂණය අතිශයින්ම දරුණුව තිබුණු නිසා හැකි තරම් ආරක්ෂා සහිතව තම රාජකාරීවල යෙදෙන ලෙස මම ඔහුට අවවාද කළෙමි ඔහු කළේ සිනාසීම පමණකි. ''හරි දේ කරන්න'' ''සාධාරණත්වය ඉෂ්ට කරන්න''. නීතියේ පරමාධිපත්‍යය පරීක්ෂා කරන්නට යෑමේදී අනතුරුවලට මුහුණ දීම නොවැළැක්විය හැකි දෙයක්'' බව ඔහු මට ප්‍රකාශ කළේය.

1985 වර්ෂයේදී සර්වෝදය නීති සහන අංශය ආරම්භ කළ කාලයේ සිටම, මොරටුවේ සර්වෝදය මූලස්ථානයට පැමිණි ඔහු ස්වේච්ඡා නීතිඥයෙකු ලෙස තම පරාර්ථකාමී නිහඬ සේවය ආරම්භ කළේය. ඔහු පිළිබඳ මතකය අපට හැම විටම ඇති කරන්නේ බලවත් කනගාටුවකි. හිංසා පීඩා සහ නොයෙකුත් අසාධාරණකම්වලට මැදි වී වේදනාවෙන් පෙළෙන ජනතාවකට හිතැති වූ සානුකම්පික වූ ඔවුන්ගේ මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සම්බන්ධයෙන් භයානක කර්තව්‍යයන් සඳහා අභීතව ඉදිරිපත් වූ මෙම තරුණ නීතිඥයා පදිංචිව සිටි නාරාහේන්පිට ඇන්ඩර්සන් තට්ටු නිවාස සංකීර්ණයේ නිවසේදීම නොහඳුනන පුද්ගලයෙකුගේ වෙඩි පහරින් ඝාතනය කරනු ලැබීය. එම ඝාතනයෙන් සර්වෝදයටත්, මුළු ජාතියටත්, රටටත් වටිනා සමාජ සේවකයෙක් අහිමි වී ගියේය. කළගුණ දත් නිර්භය සුළු පිරිසකගේ සහභාගිත්වයෙන් යුතුව ඔහුගේ අවසන් කටයුතු සිදු කරද්දී මම මේ බව පැමිණ සිටි පිරිසට ප්‍රකාශ කළෙමි.

අවුරුදු 27 ක් වැනි ළාබාල වියෙහිදීම මිය ගිය ද, ඒ භීෂණ යුගයේ ජීවත් වූ ඉතිහාස ගත වන වීර පුරුෂයෙක් ලෙසට අප විසින් ඔහුව සිහිපත් කළ යුතුය. ගෞරව කළ යුතුය. අධිකරණ ක්ෂෙත්‍රයේ අභියාචනා උසාවියේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ එතෙක් පෙනී සිටි ළාබාලම නීතිඥයා කාංචන අබේපාල යයි මම සිතමි.

ඉහළ උසාවියේ වැඩිපුරම නීතිඥසේවයේ යෙදී කාංචන අබේපාල මහතා, Chambers of President's Council හි රාජකාරීවල නියැලුණේ පුළුල් පාරාසයක සිවිල් හා පරිපාලනමය නීතිමය ගැටළු සඳහා පෙනී සිටීමෙනි. ඒ අතර පෞද්ගලික මානව හිමිකම් පිළිබඳ නඩු සඳහා ද ඔහු පෙනී සිටියේය මෙවැනි අතිශය වගකීම් සහිත අධික වැඩ කටයුතු නිසාම, ඔහු නීතිමය මූලධර්ම පිළිබඳව ප්‍රවීණයෙක් විය. නීතිඥවෘත්තියෙහි වගකීම හා අතිශය වැඩදායී අයුරින් දිගු ගමනක් යාමට නියම මාවතට පිළිපන් කාංචන අමලනන්ද අබේපාල නම් මෙම තරුණ නීතිඥයා, තම යුතුකම් වගකීම් ඉෂ්ට කිරීමෙහි දැඩි අධිෂ්ඨානශීලී පුද්ගලයෙක්ද වූයේය.

අනිත් නීතිඥයින්ට වඩා ඔහු සුවිශේෂ වූයේ හබෙයාස් කෝපස් රිට්ස් පෙත්සම් සඳහා ඔහු පෙනී සිටීමය. මින් සමහර නඩුවලදී හිංසා තර්ජනයන්ට මුහුණ පෑමෙන් වැරදිකරුවන් ලෙස චෝදනා ලබා සිරගත වී සිටි නිර්දෝශී අය අධිකරණ වෛද්‍ය නිලධාරීතුමා වෙත ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර පිරවීමේ නිර්භය ක්‍රියාදාමයකට අත ගැසුවේය. ඔහුගේ ඛේදවාචක මරණයට ඉතා කනගාටුදායක ලෙස හේතු සාධක වන්නට ඇත්තේත් මෙවැනි සර්ව සාධාරණ වූ, එහෙත් අමානුෂික ලෝකයකට ඔරොත්තු නොදෙන්නා වූත් ක්‍රියාදාමයක්ම වන්නට ඇත. හබෙයාස් කෝපස් යනු බ්‍රිතාන්‍ය නීති ඉතිහාසයේ පතුලටම බැස ඇති සහ අපේම නීති වැඩ කටයුතුවලදීත් අවුරුදු ශතකයකට පමණ සිට ක්‍රියාත්මකව තිබෙන්නා වූ නිති විරෝධී අත්අඩංගුවට හා විවිධ බැඳීම් සාධක මත අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයින් නිදහස් කිරීමට අනුගමනය කරන නීතිමය යාන්ත්‍රණයකි. මෙවැනි සිරගත කිරීම් සහ චෝදනා ලැබූවන් දිගු කල් රඳවා ගැනීම් යන සිද්ධීන් පිළිබඳව ඔවුනට සහනයක් ලබා දීමට ඇති එකම විසඳුම හැටියට මෙම හබෙයාස් කෝපස් සලකනු ලබයි .

80 දශකයේ මුල් කාලයේදී උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු කරන ලද නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් අත් අඩංගුවට

ගන්නා ලද පුද්ගලයන් නිදහස් කිරීමට එකම උපාය මාර්ගය ලෙස යොදා ගනු ලැබුවේ හබයාස් කෝප්ස්ය. නමුත් 1987 වර්ෂයේ ජූලි මාසය පමණ වන විට දකුණු පළාතේ ද එවැනි සිදුවීම්වලින් සිරගත වූවන් සඳහා හබෙයාස් කෝප්ස් අවශ්‍ය විය. මුලින් 10 බැගින් පුරවනු ලැබූ මෙම ඉල්ලුම් පත්‍ර, පසුව සිය ගණනින් එකතු වන්නට වූයෙන්, නීතිඥයින් කුඩා කණ්ඩායමක් ලෙස සංවිධානය වී, එම කාර්යයේම නිරත වූහ. එම කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක් කලින් සිටම මෙලෙස අප අතරින් වියෝ වූ අතර, කාංචන වැනි තරුණ නීතිඥයින් ද රටට අහිමි වීමට හේතු වූයේ මෙම හබෙයාස් කෝප්ස් යාන්ත්‍රණය හා සම්බන්ධවීම නිසාය.

කොළඹ දිස්ත්‍රික් පුරවැසි කමිටුව ප්‍රජාතන්ත්‍රවාදය සුරකින නීතිඥයෝ සර්වෝදය නීති සහන සේවය සහ තවත් ආයතන කිහිපයක නිති උපදේශකයෙකු හැටියට ඔහු වැඩ කළේය. මිනිසුන්ට අහිමි වී ඇති මානව හිමිකම් යළි දිනා ගැනීමට ඔහු විසින් ඉටු කරන ලද විශාල කාර්ය භාරය මානව හිතවාදීත්වයෙන් යුතුව අප විසින් සිහිපත් කළ යුතුය.

සර්වෝදයේ වැඩ කළ අපේ අනිත් ස්වේච්ඡා නීතිඥයන් මෙන් කාංචන ද අසරණ මනුෂ්‍යයින්ගේ සාමාන්‍ය නීති කටයුතු සඳහා උපදේශකවරයෙක් හැටියට කටයුතු කළේය. ඒ අතරම ස්ව විශ්වාසය හා අභිමුඛයට නොපැමිණීමේ සර්වෝදයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ඔහු ද තම සේවාලාභීන්ගේ ගැටළු උසාවියෙන් පිටත විසඳා ගැනිමට හැම උත්සාහයක්ම දැරීය. සර්වෝදය ගැමි පරිසර සේවකයන් නීති සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ද උනන්දුවෙන් මෙහෙය වූයේය. මානව හිමිකම් විෂයයෙහි සුවිශේෂ ඇල්මක් දක්වූ කාංචන අබේපාල මහතා, තමන්ගේ දැනුම අන්‍යයන්ට ලබා දීමට ඉතා වෙහෙස ගත් පරාර්ථකාමී පුද්ගලයෙකි. ඒ සඳහා වැඩි කාලයක් නිර්ලෝභීව මිඩංගු කළේය.

මානව හිමිකම් යනු මනුෂ්‍යයෙකු ලෙස උපත ලැබූ හැම කෙනෙකුටම තම ස්වාධීනත්ව සම්මානනීයත්වය හා ගෞරවය ආරක්ෂා කර ගැනීම සඳහා උරුමයෙන්ම ලැබී තිබෙන්නා වූ බලශක්තියකි. අයිතිවාසිකම් මාලාවකි හබෙයාස් කෝප්ස් ද කිසිවෙකුට හානි කිරීමට නොව, මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා භාවිතා වන පරිත්‍යාගශීලී ආයුධයක් පමණි. කාංචන නීතිඥ මහතා ද අධික වෙහෙසක් ගෙන, හබෙයාස් කෝප්ස් පෙත්සම් ඉල්ලුම් පත්‍ර පිරවූයේ කිසිවෙකුට හෝ ආයතනයකට හෝ රිදවීමට හෝ පළිගැනීමට නොවේ. ඔහුගේ මරණයට එකම හේතුව වී තිබුණේ නිසි ආකාරයෙන් මනුෂ්‍යයින්ගේ මානව හිමිකම් ආරක්ෂා වීමට කටයුතු යෙදෙන විට අපරාධකරුවන් ත්‍රස්තවාදීන් එය නොරිස්සීමය.

බාහිර ලෝකයට ආටෝපයට පෙනෙන්නට කබායක් විදියට තම වෘත්තිය භාවිතා නොකළ මෙම අව්‍යාජ ළාබාල මිනිසා තම අහිංසක හදවතින් උත්පාදනය වූ ධෛර්යයකින් අනුන්ගේම යහපත උදෙසා මේ හැම දෙයක්ම කළේය.

උසාවිවල ඔහුගේ හබෙයාස් කෝපස් ඉල්ලුම්පත්‍ර ක්‍රමයෙන් වැඩි වන විට, මරණීය තර්ජන පැමිණ තිබුණි. තමන්ගෙන් කෙනෙක් ඔහු නීතිමය කටයුතු සඳහා යන විට හා උසාවියේදී ඔහු සමඟ සිටිය යුතු යැයි ඔහුගේ පවුලේ අය සාකච්ඡා කර තිබුණේ ද මෙම මරණීය තර්ජණ සහිත දුරකතන ඇමතුම් නිසාය.

'ලංකාව පුරාම මැරුවෙත් අපි'. 'අපේ ලැයිස්තුවේ තව තුන්දෙනෙක් ඉන්නවා'. 'ඔබ හා ප්‍රින්ස් ගුණසේකරත් ඇතුළුව එම නිසා හබෙයාස් කෝපස් නඩුවලට පෙනී සිටීමෙන් වළකින්න' ආදී වශයෙන් දුරකතන පණිවුඩ දිගටම ලැබෙන්නට විය. ජීවිතය අහිමි වූ ඒ කාලයේ ඔහුගේ වයස අවුරුදු විසිහතක් වුවා පමණි. අතුරුදහන් වූ තරුණයන් 500 කට වැඩි සංඛ්‍යාවක් සඳහා ඔහු ඒ වන විට හබෙයාස් කෝපස් පෙත්සම් පුරවා තිබුණි.

සාමාන්‍ය ඇඳුමෙන් සැරසුනු නාඳුනන පුද්ගලයින් දෙදෙනෙක් 1989 අගෝස්තු 30 වෙනි දින උදෑසන 7.30 ට කාංචනගේ ඇන්ඩර්සන් තට්ටු නිවාසයට පැමිණ ඔහුව ඝාතනය කළහ. විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් පැමිණියා යැයි කියූ සෙනෙවිරත්න නැමැත්තෙක් සමඟ කතා කිරීමට, කාංචන නිවසේ දොර විවෘත කළේය. කාංචනට වෙඩි තැබූ ඔවුහු තට්ටු නිවාසයෙන් පළා ගියහ. ඔවුන්ව අල්ලා ගැනීමටවත් වෙඩි වැදුනු කාංචන මහතා ඉක්මනින් රෝහලට ගෙන යාමටවත් නිසි සහයෝගය අවස්ථානුකූලව නොලැබී තිබීම අභාග්‍යයකි. එවේලේම රෝහලට ගෙන ගියා නම් මේ මානවහිතවාදී මිනිසා මිය නොයන්නට ඉඩ තිබුණි.



නීතිඥ කාංචන අබේපාලගේ මව

මූලික මිනිස් අයිතිවාසිකම් පෙත්සම්වලට ඉදිරිපත් වන සෑම නීතිඥයෙකුටම ආරක්ෂාව සලසා දෙන ලෙස ජාත්‍යන්තර 'ඇම්නෙස්ටි' සංවිධානය විසින් ශ්‍රී ලංකා රජයෙන් ඒ වන විට ඉල්ලීමක් ද කර තිබුණි. නමුත් එවැන්නක් ක්‍රියාත්මක වූයේ නැත. නිරායුධ සාමකාමී පුරවැසියන්ගේ මානව අයිතීන් වෙනුවෙන් දැඩි මානව භක්තියෙන් යුතුව කටයුතු කළ ඔහුගේ ජීවිතය ඒ කාලයේ රජ කළ දූෂිත පාලන තන්ත්‍රය විසින් බිලි ගෙන ඇතැයි මානව අයිතීන් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය විසින් නිකුත් කළ පුවත්පත් නිවේදනයක සඳහන්ව තිබුණි.

කාංචන අබේපාල තරුණ නීතිඥමහතා විසින් මානව දයාවෙන් මිනිස් වර්ගයාගේ නාමයෙන් ඉටු කරන ලද විශිෂ්ට වූ සේවාවන් හා කැපවීමට ගෞරවයක් ලෙස සර්වෝදය නීති සහන සේවා සංසදය විසින් වර්ෂයක් පසා ඔහු වෙනු වෙන් අනුස්මරණ දේශනයක් පවත්වනු ලැබේ.

නීතිඥ කාංචන අබේපාලගේ මව සහ
නීතා ආරියරත්න මැතිනිය



නීතිඥ කාංචන අබේපාල මහතාගේ ජායාරූපයට මව විසින් මල් මාලාවක් පැළඳවීම

අනුස්මරණ උත්සවයට පැමිණි පිරිස

දේශනයේ දී සමාව ගත් සුරේෂ් කුමාර්
(නැවත උතුරු ඇමෙරිකාවට)

1985 දෙසැම්බර් මාසයේදී මම යුරෝපයට ගියෙමි. දෙසැම්බර් අටවෙනිදා උදෑසන මා ශ්‍රී ලංකාවෙන් පිටත් වී සූරිච් ගුවන් තොටුපළට පැමිණි පසු, මා පිළිගැනීමට ගුවන් තොටුපළට පැමිණි 'හෙල්විටාස්' ආයතනයේ මහ ලේකම් වර්නන් කුලිං මහතා එතුමාගේ නව ගෘහයට මා කැඳවා ගෙන ගියේය.

වෛද්‍ය විද්‍යාසාගර මහතා ඩී.එස්. සේනානායක විදුහලේ අධිපති ව සිට පසුව රූපවාහිනියේ සේවය කරමින් සිටි සමරනායක මහතා, නඩේසන් මහතා සහ ඔහුගේ බිරිඳ වූ නිරූපා රාජපක්ෂ මහත්මිය ද මා සමඟ ගුවන් යානයේ යුරෝපයට පැමිණි අය අතර වූහ.

පසු දිනයේ දවස පුරාම ස්විස් ගුවන් විදුලියේ වාර්තාකරුවෙකු වූ රොලන් ප්‍රොබලා මහතා සමඟ ද ස්විස් රජයෙන් අලුතෙන් පත් කර තිබෙන අනාථයින් බාරව සිටින පීටර් ආර්බන්ස් මහතා හා එම මැතිනිය සමඟ ද සාකච්ඡා පැවැත්වීමි. මේ සියලු කතාබස්වලට මාතෘකාව වූයේ දෙමළ අනාථයින් පිළිබඳ ප්‍රශ්නයයි . එදා රාත්‍රියේ 'වර්ල්ඩ් රනර්ස්' ආයතනයේ හාන්ස් බාඩර් මහතා සහ ඇන්ඩ්‍රියා බාඩර් මැතිනිය සමඟ ආහාර ගතිමි. නවා සහ එලානා යන ඔවුන්ගේ දියණියන් අවුරුදු එකොළහ සහ එකහමාර වයසේය. මම ඔවුන් සමඟ ද කතා කළෙමි.

මෙම සවාරිය මා ලෝකය වටා ගිය තවත් චාරිකාවක පළමු නැවතුම පමණකි. මේ සඳහා මාස දෙකකුත් සතියක් ගත වී තිබුණි. මා ඊළඟට ගියේ ජර්මනියටය. දොළොස්වෙනිදා අමෙරිකාවේ නිව්යෝර්ක් නගරයට ගොස් එහි ශාන්ත ජෝන් කැතීඩ්‍රල් දේවස්ථානයේ දේශනයක් පැවැත්වීමි. මා අමෙරිකාවට පැමිණීමේ

අරමුණ වූයේ මෙම දේශනයයි. නිව්යෝර්ක් නගරයේ ජෝන් එෆ්. කෙනඩි ගුවන් තොටුපළෙන් බසින විට මා පිළිගැනීමට පැමිණි ෆ්‍රෑන්ක් මිල්ඩ්ස්පව් ඇමරිකාවේ සර්වෝදය ගොඩනඟා සංවිධානය කිරීමට එම දිනවල බාර ගෙන සිටියේය. ''ශාන්ත ජෝන් ද ඩිවයින්'' නම් වූ මෙම දේවස්ථානයේදී පැවැත්වූ දේශනයේ වැඩ කටයුතු සියල්ල සංවිධානය කළේ ෆ්‍රෑන්ක්ය. මට මතක හැටියට ඔහු මගේම වයසේය. තරුණ වයසේදී ගරු මාටින් ලූතර් කිං සමඟ සිවිල් අයිතිවාසිකම් යටතේ පෙරමුණ ගෙන ඔහු ක්‍රියා කර ඇත. සර්වෝදය පිළිබඳව අත්දැකීම් ලබා දීමට පසුගිය වර්ෂයේදී මා ඔහුව මාසයකට ලංකාවට ගෙන්වා ගතිමි. ඒ සඳහා වියදම් දැරුවේ ෆිලිප් ඇඟලුම් ව්‍යාපාරය අයිති ලැරී ෆිලිප්ස් මහතා ය.

ගුවන් තොටුපළේ සිට මා ෆ්‍රෑන්ක් සමඟ කෙලින්ම ගියේ නිව්යෝර්ක් නුවර ෆ්‍රෑන්ක්ලින් වීදියේ අංක 178 දරණ ස්ථානයේ තුන්වන මහලේ වෙසෙන හවායි හිදි මා සමඟ මිත්‍ර වූ වෛද්‍ය ඩැනියෙල් සුසොට් හමුවීමටය. දෙදිනක් එහි ගත කර 14 වෙනිදා දේවස්ථානයේ මා සඳහා වෙන් කර තිබූ කාමරයට යාම අපේ සැලසුම විය.

ගමන් වෙහෙස හා අධික සීතල නිසාම ඩැනියෙල් සමඟ ගත කළ රාත්‍රී දෙකම මට නින්ද ගියේ නැත. එසේ වූයේ මා තනිකමින් පෙලුන නිසා බව මම පසුව අවබෝධ කර ගතිමි. දන්නා හඳුනන හැමෝටම මා දුරකතනයෙන් කතා කළ ද මීට පෙර හැම වතාවකම මේ රටේ මගේ වැඩ සටහන සංවිධානය කළ ටොන් ඩිවයිල්ඩ් ගෙන් ටෙලිපෝන් පණිවුඩයක් හෝ නොලැබීම තවත් තනිකමට හේතු විය. අන්තිමේදි මාෂල් බෙයාර්ට කතා කර පාලුව නැති කර ගතිමි.

මෙවර මගේ ගමන පිළිබඳව ඔහුට නොදන්වූයේ සර්වෝදයට රැවටීමක් කළ තිදෙනෙකුට ටොන් විසින් අපට නොදන්වා ව්‍යාපෘතියක් භාර දීම නිසා මට ඇති වූ කලකිරීම හේතුකොට ගෙනය. එහෙත් ඔහු නිතරම සිතට ආ නිසා අප අතර

ඇති තද බැඳීම තේරුම් ගතිමි. පසුව 16 වෙනිදා නිව්යෝර්ක්වල සිල්කා සමුළුවේදී ඔහුගේ බිරිඳ ලූසී හමුවී කතා කළ පසු ටොන් පිළිබඳව මා තුළ තිබූ හැඟීම් බොහෝ දුරට වෙනස් වූ අතර ඔහු ද කනස්සල්ලෙන් සිටි බව ලූසී කීවාය. ටොන්ලාගේ ජීවිතය ගසෙන් ගසට පනින කුරුල්ලන් මෙන් ස්ථිර සම්බන්ධතාවයක් නොමැති ජීවිතයන්ය.

15 වැනිදා ශාන්ත ජෝන් දේවස්ථානයේ මා පැවැත්වූ දේශනය ඇසීමට මගේ මිතුරන් රාශියක් ද පැමිණ සිටියහ. 14 සහ 15 දින රාත්‍රියේ සතිස් මල්ලී ද මා සමඟ සිටීම මට ලොකු ධෛර්යයක් විය.

එය මෙම ගමනේ පළමුවන අරමුණ වූ අතර ඉන්පසු ජනවාරි දෙවැනිදා එංගලන්තයට පැමිණි මා පස්වන දා වන තෙක් එහි සිටි අතර දෙවැනි අරමුණ වූ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේදී පැවැත්වූ පලස්තීන ජාතිකයින් පුනරුත්ථාපනය කිරීම පිළිබඳ සමුළුව අමතා දේශනයක් කළෙමි. ඉන්පසු කැනඩාවේ 'සීඩා' ආයතනයට පැමිණි මා ජනවාරි 15 වන දින කලින් බාර ගෙන තිබූ දේශනය එහිදී කළෙමි. එය තෙවැන්නයි. ඊට අමතරව අනෙකුත් ගමන් බිමන් හා වැඩ සටහන් යොදා ගෙන තිබුණි.

හෙල්විටාස් ආයතනයේ සිට ජර්මනියට යාම සඳහා මා නැවතත් සූරිච් ගුවන් තොටුපළට ගෙනත් හැරලූයේ කාර්ල් සහ ඒඩිත් වර්ල් යුවළ විසිනි. කොලෝන්-බොන් ගුවන් තොටුපළේදී මා මුණගැසීමට වෙනමා ෂෙරර් සහ ඩොරික් ගෝටේ දෙපළ පැමිණ සිටියහ. වෙනමාගේ ගෙදර දී රාත්‍රී ආහාරය ගැනීමෙන් පසු නින්දට ගියෙමි.

පසුදින උදේ 9.00 ට පමණ ජර්මන් පාර්ලිමේන්තු (බුන්ඩේහවුස්) මන්ත්‍රීවරුන්ගේ කාර්යාලය පිහිටුවා තිබෙන ස්ථානයට වෙනමාර් සමඟ ගියෙමු. ඩසල්ඩෝර්ෆ්හි ලිබරල් පක්ෂයේ බල කනුවක් වන හයිඩා බ්‍රෝල් මහත්මිය මා මුණගැසීමට

එහි පැමිණ සිටියාය. ඇය කෙලින්ම මා කැඳවා ගෙන ගියේ හිටපු ආර්ථික ඇමති වන කවුන්ට් ග්‍රාෆ්ට් ලම්ස්ඩෝෆ් මහතාගේ කාමරය වෙතටය. මගේ පැරණි මිතුරෙකු වූ ඔහු සෑහෙන වේලාවක් ලංකාවේත් ලෝකයේත් තත්ත්වය ගැන මා සමඟ කතා කළේය. ඉන් පසු මගේ තවත් මිතුරෙක් වන පාර්ලිමේන්තු මන්ත්‍රී වොල්ෆ්ග්‍රාම් මහතා හමුවීමට ද ඇය මා කැඳවා ගෙන ගියාය. උදේ වරුවේ සිදුවූ මෙම සුහද හමුවීම්වලින් පසු වෙනමාර් පැමිණ, සාගිනි නිවීමේ මූලස්ථානය වෙත සවස් භාගයේ මා කැඳවා ගෙන ගියේය. එහි ප්‍රධානියා වූ රොසිං මහත්මිය මා හා කතා කළ අතර මුලතිව් ප්‍රදේශයේ ගම් දහයකට උදව් කරන ලෙස මම ඇයට දන්වා සිටියෙමි. නමුත් එය ඉටු වූයේ නැත.

පැරණි යම් සිද්ධියක් මතක් වීමෙන් මට එතැනදී කනගාටුවක් ඇති විය. එනම්, මීට පහළොස් වසරකට පෙර අපේ බතික් අංශය බාරව සිටි කෙනෙකුගේ අකරුණාවන්තකම නිසා මෙම ආයතනයෙන් අපට ලැබෙන්නට තිබුණ වසරකට රුපියල් කෝටි දෙකක් වූ ආධාර අහිමි වී යාමේ සිද්ධියයි. මගේ මෛත්‍රිය නිසා අප අතර සිටින අඳබාලයන්ට එක හා සමානව සැලකීමේ පුරුද්ද මේ පාඩුවට වගකිවයුතු බව සිතුණ නමුත් එවැන්නන්ට සර්වෝදයේවත් තැනක් තිබිය යුතු බව ඒත්තු ගැනීමෙන් මගේ හිත හදා ගැනීමට පුළුවන් විය.

'එෆ්.එන්.එස්' ආයතනය සමඟ ද පසු දින උදේ වරුවේ සාකච්ඡා පැවැත්වීමි. ඔවුන් විසින් අපට දෙන ආධාර නතර කරන ලද්දේ අවුරුදු දහයකටත් වඩා සර්වෝදයට උදව් කර ඇති හෙයිනි. එය ඔවුන්ගේ සාමාන්‍ය ප්‍රතිපත්තිය නිසා මා ඒ ගැන වැඩිපුර තර්ක කිරීමට නොගිය නමුත් සෙසු ආයතන හා ජර්මන් රජය මේ සම්බන්ධයෙන් උනන්දු නොකිරීම ගැන මම ඔවුනට දොස් පැවැරුවෙමි. ගොඩ්ප්‍රි වූස්ට් වොල්ෆ්ගෑන්ග් රම්රොක් සහ ඩොරිස් ගෝටේ මහත්මිය ද සාකච්ඡාවට සහභාගි වූහ. ශ්‍රී ලංකාවේ එෆ්.එන්.එස්. නියෝජිතව සිටි පෝල් බිෂොප්ගේ අලසකමත් ගෝටේ

මහත්මියගේ තම කාර්ය භාරයේ නුපුරුදු කමත් 85 වසරේ ආධාර අඩුවීමට හේතු වූ කරුණුය. අමාත්‍යාංශය වෙතම දොස් පැවරීම උචිත නොවන බැව් මා විශ්වාස කළ අතර කෙසේ නමුත් වූස්ට් මහතාට සර්වෝදය පිළිබඳව ලොකු වගකීමක් තිබෙන බව හා එය හොඳින් මතක තබා ගත යුතු බැව් මම ඔවුනට ඒත්තු ගැන්වූයෙමි. දිවා ආහාරයෙන් පසු සවස් වන තුරුත් සාකච්ඡා පැවැත්වූයෙන් සවස 6.00 ට පමණ ගොඩ්ප්‍රි අපේ තානාපති ස්ටැන්ලි ජයවීර මහතාගේ නිවසට මා කැඳවා ගෙන ගියෙන් එම මැතිනිය හා දුව සමඟ රාත්‍රී ආහාර ගත්තෙමි.

මෙවර ජර්මනියේ ගත කළ දෙදින තුළ මට රඟපාන්නට සිදු වූ හොඳම ජවනිකාව ඇරඹුණේ රාත්‍රී 8.00 ටය. බොන් නගරයෙන් මිනිත්තු විස්සක් පමණ දුර නගරයක 'ඇම්නස්ටි ඉන්ටනැෂනල් ප්‍රොටෙස්ටන්ට්' තරුණ සමාජය සහ ජර්මන් සර්වෝදය කණ්ඩායමත් එකතුව ''ශ්‍රී ලංකාවේ සාමය ඇති කළ හැක්කේ කෙසේද?'' යන්න පිළිබඳව මට කතාවක් පවත්වා සාකච්ඡාවක් මෙහෙයවීමට සංවිධානය කර තිබුණි. තානාපතිතුමාගේ ගෙදර සිට මිෂල් පෙරේරා මහතා මා එම රැස්වීමට කැඳවා ගෙන ගියේය.

හැට දෙනෙකුගෙන් පමණ සමන්විත පිරිසක් රැස්වීමට පැමිණ සිටියහ. ඉන් බාගයකට වඩා සිටියේ ශ්‍රී ලංකාවේ සිට ජර්මනියට පැමිණ එහි දේශපාලන රැකවරණ සොයමින් සිටින තරුණයින් කණ්ඩායමකි. මොවුන් මට කරදර කිරීමට පැමිණෙන බව වෙනමාර් ෂෙරර්ට කල් තියාම ආරංචි වී තිබුණ නිසා රැස්වීමට පොලීසිය ද ගෙන්වා තිබුණි. මා රැස්වීම් ශාලාවට ඇතුළු වන විටම දුටුවේ ඉදිරියේ නවතා තිබුණ පොලිස් රථයත් ශාලාව ඉදිරියේ වාඩි වී සිටි හැඩි දැඩි ජර්මන් ජාතික පොලිස් මුලැදෑනීන් දෙදෙනාත්ය. මෙය මට මහ විහිළුවකි. මේ දෙමළ තරුණයින් මට හිරිහැර කිරීමට පැමිණියේ මා ඔවුනට කුමන වරදක් කර තිබෙන නිසා ද යන්න මට ලොකු ප්‍රශ්නයක් විය.

මා පැමිණෙන විට වෙනමාර් ෂෙරර් මහතා රුස්වීම අමතා කතා කරමින් සිටියේය. ඒ ජර්මන් බසිනි සර්වෝදය ගැනත් එහි ක්‍රියාකාරිත්වයන් හා ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව ද විස්තරයක් කරන ලෙස ෂෙරර් විසින් මගෙන් ඉල්ලීමක් කරනු ලැබූයෙන් මම කතාව ආරම්භ කර ටික දුරක් ගෙන ගියෙමි. සභාවෙහි වාඩි ගෙන සිටි තරුණයෙක් එක් වරම නැගී සිටියේය. ඔහුගේ මුහුණුවර මට හොඳින් පුරුදු එකක් බව වැටහුණ නමුත් එක් වරම හඳුනා නොගත්තෙමි. එතැන සිටම ජාතිවාදී ප්‍රශ්නවලට පිළිපන් ඔහු මට දොස් නගමින් කතා කරන්නට විය. සිනහ මුහුණින් මම ඔහුට රිසි දෙයක් කියන්නට හැරියෙමි. ඔහුගේ කතාව අවසන් කළ පසු මම නැවතත් මගේ දේශනය කළෙමි.

ඉන් අනතුරුව අපගේ සාම පා ගමන් පිළිබඳව වීඩියෝ චිත්‍රපටියක් ද ප්‍රදර්ශනය කරන ලදී. ඊට පසු එම තරුණයා කතා කරන විට ඔහු සුරේෂ් කුමාර් බව හඳුනා ගැනීමට හැකි විය. තමා සර්වෝදයේ පූර්ණ කාලිකයෙක් හැටියට වැඩ කළ බවත් සෑම්දීන් හා නලනීගේ බසට කන් දෙමින් මා විසින් ඔහුව අස් කරන ලද බවත් ඒ හේතුවෙන් නැවතත් තමා නරක මිනිසෙකු වූ බවත් සුරේෂ් ප්‍රකාශ කළේය. ඒ අවස්ථාවේදී මම ඔහුව ළඟට කැඳවා සිංහලෙන් මෙසේ කීවෙමි.

''සුරේෂ් ඔබ වගේ දහස් ගණන් අය මා විසින් හදා තිබෙනවා සමහර විට එයින් කීපදෙනෙක් අස් කර තිබෙන්නේත් වැරදි කළ නිසයි පසුව ඔවුන් වරද පිළිගත්තාම නැවත බඳවා ගත්තා. ඒ නිසා මුළු රටම අනතුරේ තිබෙන සිය ගණන් මිනිසුන් මැරෙන මේ වෙලාවේ ජාතිවාදියෙක් පෞද්ගලික වෛරක්කාරයෙක් වී රටටත් ජනතාවටත් ද්‍රෝහීකම් කරන්න එපා මා සමඟ එකතුවී අවිහිංසාවාදීව සාමයක් ඇති කරන්නට හිත හදා ගන්න''

මා කී දෙය අසා සිටි සුරේෂ්ගේ දෙනෙත් කඳුලින් පිරෙනු මා දුටුවෙමි ඔහු එවේලේම කළේ අන් හැම දෙනාම ඉදිරියේ දණින් වැටී මට ආචාර කොට මගෙන් සමාව ඉල්ලීමය. දරුවන් වැරදි

කළාම අවවාද කොට, තාත්තා ඒවා ගණන් නොගන්නා බව මම කීවෙමි. ඉන් පසුව එතැන සිටි අනිත් සියලුම තරුණයින් ද සිනාමුසු මුහුණින් මා සමඟ එක්වී සිංහලෙන්ම නොයෙක් දේ කතා කළහ.

කිසිසේත් බලාපොරොත්තු නොවූ මෙම විපර්යස්ත සිද්ධිය දුටු පොලිස් භටයින් දෙදෙනාත් ජර්මන් ජාතිකයනුත් ඔවුන්ගේ ඇස් කන් අදහා ගත නොහැකිව අප දෙස බලා සිටිනු මම දුටුවෙමි. පසුව සැම දෙනාටම නැවතත් කතා කළ මම මෙම තරුණයින් පිළිබඳ වගකීම මා විසින් භාරගන්නා බවත් ෂෙරර් මහතාගේ ප්‍රධානත්වයෙන් කර ගෙන යනු ලබන ජර්මන් සර්වෝදයෙහි ජර්මන් කණ්ඩායමට ඔවුන් ද අලුතින් එකතු වන බවත් පැවසීය. ජර්මන් භූමිය තුළ ජාතික සමගිය ඇති වනු බලා සිටි ජර්මන් ජාතිකයෝ බෙහෙවින් සතුටු වී මට ස්තුති කළහ. පොලීසිය වෙනුවට මා පිරිවරා ගෙන මගේ කාරය ළඟට සීතලේ වෙව්ලමින් ආවේ එම ද්‍රවිඩ තරුණයන්ය. නීතක්කා, නංගිලා මල්ලිලා සහ සියලුම සර්වෝදයේ අය ආදරයෙන් මතක් කරන ලෙස ඉල්ලා සිටි ඔවුන්ගේ නායක සුරේෂ් අවසාන වශයෙනුත් මගේ අත් දෙක අල්ලා කියා සිටියේ ''අනේ සර් තරහාවෙන්න එපා මට සමාවෙන්න'' යනුවෙනි මම ෂෙරර් මහතාගේ ගෙදර බලා ආපසු යාමට පිටත් වීමි.

බොන්වලදි සුරේෂ් කුමාර් මුණගැසීමේ සිද්ධිය විශේෂ දෙයක් හැටියට සැලකිය යුත්තකි. ඔහු එතෙක් මා ගැන ඇති කර ගෙන තිබුණු වැරදි අදහස් හා අමනාපකම් නැතිව යාමත්, නව මිත්‍රයින් සමඟ නැවතත් සර්වෝදයට එකතුවීමත් සතුටට කාරණයක් විය.

ඊයේ සවස හේස්ටින්ස් ඔන් හඩ්සන් නම් ස්ථානයේ සිටි මේසන් පවුලට අයත් ඩොරින් මෙනවියත් සමඟ නිව්යෝර්ක් නුවරට යෑමට පිටත් වන විට හිම වැස්ස පටන් ගෙන තිබුණි. එදා අපට රාත්‍රී ආහාරය දුන්නේ ගෝඩන් මැකොවික් මහතා සහ ගිලෝලා ලේපැට්නර් මහත්මිය විසිනි. පීටර් වින්ටර් නම් වූ සුප්‍රසිද්ධ

සංගීතඥයෙකු විසින් මෙහෙය වන ලද විවිධ ප්‍රසංගයක් බැලීමට අපි රාත්‍රී ආහාරයෙන් පසු ශාන්ත ජෝන් දේවස්ථානයට ගිය අතර ඩැනියෙල්ගේ ගෙදරට ආපසු එන විට රාත්‍රී එකොළහට පමණ විය. අද උදේ මා ඩැනියෙල් සමඟ ලා ගුවාඩියා ගුවන් තොටුපළට පැමිණ බොස්ටන් බලා යන ඊස්ටන් ගුවන් යානයට නැගුණෙමි.

රූත් සහ හෙන්රි මෝගන්තව් යුවළ පසුගියදා මට මුණගැසී තිබුණෙන් මා සිටියේ විශාල තෘප්තිමත් බවකිනි. ඔවුන් ඉතා කරුණාවන්තය. අවංකය දැන් මට සීතල බොහෝ පුරුදුය. ශරීරයේ සීතලත් රූත් හෙන්රි වැනි හදවතින් බැඳුනු අයගෙන් ලැබෙන උණුසුමින් හිතේ ඇති වන උණුසුමත් අතර සම්බන්ධයක් තිබේ යැයි මට හැඟේ. උණුසුම් ඇඳුම් හා ආහාරපාන පමණක් නොව මොවුන්ගෙන් ලැබෙන උණුසුම් වදන් ද ආගන්තුක සත්කාරයේ අග්‍ර ගනයට වැටෙන ඒවාය.

මා හමුවීම - 1
වික්ටර් අයිවන් (පොඩි අතුල)


වික්ටර් අයිවන් මහතා

වික්ටර් අයිවන් මහතා සමඟ පස් වසරක් ඇසුරේ යෙදීම මගේ ජීවිතයේ ලත් වැදගත් අත්දැකීමක් ලෙස මම සලකමි. වික්ටර්ගේ මෙම සම්බන්ධයට මුල් වූයේ 1986 අප්‍රේල් 4 වැනිදා ඔහු විසින් මා වෙත එවන ලද පහත සඳහන් මෙම ලිපියයි.

වික්ටර් අයිවන් (පොඩි අතුල)
මහගෙදරවත්ත
කපුහේන්පොල,
අක්මීමන.
04.04.1986

ප්‍රිය මහත්මයාණෙනි,

"මා ජීවිතයේ සමහර කරුණු සම්බන්ධයෙන් හති වැටුනු කෙනෙක් එක්තරා කාලයක් කිසියම් ප්‍රයෝජනවත් ප්‍රජා සේවාවක යෙදීමේ ආශාවක් මා තුළ ඇති වී තිබෙනවා. එවැනි කටයුත්තක නිරත වීම මානසික තෘප්තිය හා මා නිරත වී සිටින ලේඛන කටයුතු සඳහා ද ප්‍රයෝජනවත් වේය කියා මා සිතනවා. ඒ සඳහා මා කිසියම්

ප්‍රයෝජනවත් කාර්යයක යොදා ගැනීමට ඔබට පුළුවන්ද?

මා දැනට නිරත වී සිටින සියලු කාර්යයන්ගෙන් නිදහස් වී, පූර්ණ කාලීනව ක්‍රියා කිරීමට සූදානම්. මේ ගැන කරුණු සලකා බලා ඒ පිළිබඳව ඔබතුමා දරන අදහස් මා වෙත දන්වා එවන්නේ නම් ඔබතුමාට කෘතඥවෙනවා''.

විශ්වාසී
වික්ටර් අයිවන් පොඩි අතුල



වික්ටර් අයිවන් මහතාගේ අත්අකුරෙන් මට ලියා එවූ ලිපිය

වික්ටර් අයිවන් (පොඩි අතු) එවූ ලිපියට මා යැවූ පිළිතුර මෙසේය.

1986 අප්‍රේල් 07 දින

වික්ටර් අයිවන්
(පොඩි අතුල) මහතා,
මහගෙදරවත්ත,
කපුහේන්පොල,
අක්මීමන.

ප්‍රිය මල්ලී,

ඔබ එවූ 04.04.86 දින දරණ ලිපිය ලැබුණා. ඔබට හැකි අත දීමක් කිරීමට මම සූදානම්. සිංහල අවුරුදු පසුවන තුරු මා වැඩි කාලයක් ගත කරන්නේ ක්ෂේත්‍රයේ බැවින්, ඊට පසු ඔබට පහසු දිනෙක 50-7084 අංකයට දුරකතනයෙන් කතා කොට පැමිණ මා හමුවන්න. දෙදිනක් පමණ මෙහි නැවතීමට සූදානම්ව පැමිණෙන්න. එවිට ඔබ කැමති ක්ෂේත්‍රයක් තෝරා ගැනීමට පහසු වනු ඇත.

සුබ අලුත් අවුරුද්දක් වේවා!

මෙයට - සේවයෙන් බැඳි

ඒ.ටී. ආරියරත්න
සභාපති

[illegible]

1986 අප්‍රේල් 07 දින.

[illegible] ([illegible]) [illegible],
[illegible],
[illegible],
[illegible].

[illegible];

ඔබ ගේ 04.04.86 දින දරණ ලිපිය ලැබුණා. [illegible] 30-7004 [illegible]

[illegible]:

[illegible] - [illegible],

[illegible],
[illegible].

එයට මම යැවූ පිළිතුරු ලිපිය

ඒ අනුව සිංහල අවුරුදු නිවාඩුව නිම වූ විගස වික්ටර් මා හමුවීමට පැමිණියේය. මම ඔහු සාදරයෙන් පිළිගෙන සංග්‍රහ කොට, සෑහෙන වේලාවක් පිළිසඳරේ යෙදුණෙමි. ඔහුගේ අතීත ජීවිතය පිළිබඳව මම කිසිවක් නොවිමසුවෙමි. එදා ඔහු ගත කළ ජීවිතය බිරිඳ හා දරුවන් ගැන අනාගත බලාපොරොත්තු ආදිය පිළිබඳව සැකෙවින් අදහසක් ගෙන, දින කිහිපයක් දම්සක් මන්දිරයේ නැවතී අපේ දර්ශනය ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් ගැනත්, සේවක සේවිකාවන් ගැනත්, යම් අදහසක් ගන්නා හැටියට ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. ඉන් පසු මා හමුවී ඔහු සේවය කරන්නට කැමති අංශයක් පිළිබඳව දන්වන හැටියට ද පැවැසීමි.

සර්වෝදය, රත්නායක ජාත්‍යන්තර නේවාසිකාගාරයට ඔහු හැරලීමෙන් පසු මම ගෙදර ආවෙමි.

1986 අප්‍රේල් 22 දා ඔහුට කළ හැකි සේවය පිළිබඳ ලේඛනයක් ඔහු මට ඉදිරිපත් කළේය. ලේඛකයා පාඨකයා හා ප්‍රකාශකයා පිළිබඳව ඔහු කළ විග්‍රහය අදටත් ගැලපෙන නිසා මම එහි කොටසක් ඊළඟ පරිච්ඡේදයෙන් ඔහුගේ වචනවලින්ම ඉදිරිපත් කරමි.

රාවයේ අත්තිවාරම - 11

ලේඛකයා පාඨකයා හා ප්‍රකාශකයා



වික්ටර් අයිවන්
(පොඩි අතුල)
මහගෙදරවත්ත,
කපුහේන්පොල,
අක්මීමණ.
22.04.86

මහත්මයාණෙනි.

මා අඩුවෙන් විශ්මයට පත් වන කෙනෙක් එහෙත් ඔබගේ හමුවීම මා තුළ විශාල විශ්මයක් ඇති කළ බව නොසඟවා පළ කළ යුතුයි. චේතනා යහපත් වේ නම්, ධෛර්යය හා ආත්ම ශක්තිය වේ. නම්, කෙනෙකුට තම කෙටි ජීවිත කාලය තුළ කළ හැකි දෑ කෙතරම් විශාල ද යන්න ඔබ හොඳින් ඔප්පු කර තිබෙනවා.

මා ඔබ සමඟ කළ කථාබහ නැවත නැවතත් සලකා බැලීමෙන් පසුව අඩුම වියදමකින් වැඩි ප්‍රතිඵල ලබා ගත හැකි ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් වේද යන්න කරුණු සලකා බැලුවා. ඒ පිළිබඳ දළ විස්තරයක් මා දැන් ඔබට ඉදිරිපත් කරනවා. ඒ ගැන තුලනාත්මකව කරුණු සලකා බලන්න.

ලේඛකයන්ගේ හා කියවන්නන්ගේ පොදු යහපත වෙනුවෙන් ඔබට හා සර්වෝදයට කළ හැකි දේ ඉතා විශාලයි. මා හිතන අන්දමට ප්‍රථම කොට කළ යුතුව ඇත්තේ ලේඛකයන්ගේ හා පාඨකයන්ගේ අභිප්‍රායය අරමුණු කොට ගත් නව අංශයක් (ඊට සුදුසු නම තේරීම ඔබට බාරයි) සර්වෝදයට එකතු කිරීමයි. එය සර්වෝදයේ පරමාර්ථ හා හොඳින් ගැලපේ මේ නව අංශය ලේඛකයන් හා ලේඛන කලාව ගැන උනන්දුවක් දක්වන සජීවී පුද්ගලයින් කීපදෙනෙකුට භාර දිය හැකිය.

ප්‍රථම කොට හොඳ <u>තොරතුරු බැංකුවක්</u> ස්ථාපිත කළ යුතුය ක්ෂෙත්‍රයට අදාල සියළු වැදගත් තොරතුරු එම බැංකුව තුළ විය. යුතුයි. එය වැඩ කරන්නන්ගේ අවබෝධය පුළුල් කරන අතර ක්‍රියාවට බැසීමට අවශ්‍ය ප්‍රාරම්භක ශක්තිය ලබා දේ.

පොත් අලෙවියට සම්බන්ධවීම ඔවුන්ගේ ඊළඟ කාර්යය විය යුතුය. රටේ සිංහල කථා කරන ජනගහනය දෙකෝටියකට ආසන්නය. අකුරු උගත්කම 88% කි 77% ක් ප්‍රාථමික හෝ ඊට වැඩි අධ්‍යාපනයක් ලබා සිටී ද්විතීයික හෝ ඊට වැඩි අධ්‍යාපනයක් ලැබූ අය 35% කි. එහෙත් ජනප්‍රිය ලේඛකයෙකුට පවා පොතක පිටපත් දෙදාහක් විකුණා ගැනීම දුෂ්කර දෙයක් ලෙස සැලකේ.

මීට හේතු මොනවාද යන්න ගැඹුරින් සලකා බැලීම වැදගත්ය. මිලදී ගැනීමට තිබෙන හැකියාව සීමා වී තිබීම කියවීමේ උනන්දුව හීන වීම යන කාරණා තිබියදීම, කියවීමේ ලා විශාල උනන්දුවක් තිබෙන බව පෙනෙන්නට තිබේ. එසේ නම් ඔව්හු පෞද්ගලික මිලදී ගැනීම්වලින් තොරව පුස්තකාල සේවා ප්‍රයෝජනයට ගැනීම තුළින් සිය අවශ්‍යතා තෘප්තිමත් කර ගනීද?

ඔවුන්ගේ එම අවශ්‍යතාවයන්ගෙන් 30% ක් තරම්වත් තෘප්තිමත් කිරීමට දිවයිනේ පවතින පුස්තකාල පද්ධතියට නොහැකි වී තිබෙන බව පුස්තකාල තොරතුරු ආශ්‍රයෙන් ඔප්පු වේ.

1972 දී ජාතික පුස්තකාල මණ්ඩලය කරන ලද සමීක්ෂණයක ට අනුව පළාත් බලමණ්ඩල 624 ක් අතරින් පුස්තකාල සේවා සඳහා කිසියම් සූදානමක් තිබී ඇත්තේ 496 ක පමණි. ඒවායින් වැඩි හරියක් ද නමට පමණක් පුස්තකාලයි. බදු ගෙවන්නන් 30000 - 75000 දක්වා වන පළාත් ආණ්ඩු සභා පුස්තකාලයක ඇති සාමාන්‍ය පොත් ගණන 3500 කි. ගම්කාර්ය සභාවක නම් 1000 කි. මේ පොත්වලින් ද වැඩි කොටසක් ඉංග්‍රීසියෙන් ලියැවුනු පැරණි පොතපත වීම ඒවාට ආවේනික විශේෂතම ලක්ෂණයකි. පාසල් 2249 ක පුස්තකාල ඇතත්, ඒවා අතරින් පුස්තකාල තත්ත්වයක පවතින්නේ 10% ටත් අඩු ප්‍රමාණයකි ශිෂ්‍යයින් සඳහා වන ඒක පුද්ගල පුස්තකාල වියදම රුපි 1.30 ක් වන අතර, මොනරාගල දිස්ත්‍රික්කය සඳහා එය ශත 09 කි 5000 ක් පමණ වන ක්‍රිකට් ක්‍රීඩකයින් සඳහා කෙරෙන ඒක පුද්ගල විදයම රුපියල් දශ ලක්ෂයකටත් වැඩි යැයි සිතමි. විශ්ව විද්‍යාල පුස්තකාල පමණක් හරවත් තත්ත්වයක පවතී.

පොත් වෙළඳ පොළේ පටු බව කෙරෙහි පොත් අලෙවි ජාලය තුළ පවත්නා ව්‍යුහාත්මක නොගැලපුම තීරණාත්මක අභියෝගය වී තිබෙන බව පෙනේ.

1971 වන විට ලියා පදිංචි පොත් වෙළඳුන් 1700 දෙනෙකු සිටියෝය. විවෘත ආර්ථික ක්‍රමය යටතේ මොවුන් අතරින් විශාල කොටසක් වෙනත් මාර්ගවලට නැඹුරු වී ඇති බවට සැකයක් නැත. නිදර්ශනයක් වශයෙන් කීර්තිමත් නමක් දිනා ගෙන සිටි හංස ප්‍රකාශන ආයතනය අද බත් පාර්සල් වෙළඳම් කරයි. තිබෙන පොත් සාප්පුවලින් වැඩි කොටසක් ද නමට පමණක් පොත් සාප්පුය ඒවායේ බොහෝ කොට ඇත්තේ ප්ලාස්ටික් බඩුමුට්ටුය. මේ දුර්වල අලෙවි ජාලය පවා විසිරී ඇත්තේ විෂම ලෙසය. දෙනියාය ප්‍රදේශයේ පාඨකයෙකුට තමන්ට අවශ්‍ය පොත් මිලදී ගැනීම සඳහා ගාල්ලට හෝ මාතරට ඒමට සිදුවේ. තිස්සමහාරාමයේ පාඨකයෙකුට නම් මාතරට ඒමට සිදුවේ. රත්ගම බද්දේගම අක්මීමන හබරාදූව යන එකුදු ආසනයකවත් පොත් සාප්පු නැත. තවත් බොහෝ ප්‍රදේශවල පවතින තත්ත්වය ද මීට සමානය. මේ තත්ත්වය පොත් මිලදී ගැනීමට උනන්දුවක් දක්වන අය තුළ පවා එම උවමනාව හීන කරවන බවට සැකයක් නැත.

මේ රටේ ලේඛකයින්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට නම් පොත් වෙළඳපොළ ක්‍රමවත් කොට පුළුල් කළ යුතුය. ලේඛකයෙකුට පොතක පිටපත් 2000 ක් විකුණා ගැනීම සඳහා අවුරුදු 4 ක පමණ කාලයක් ගත වේ. ලැබෙන ලාභය විකුණුම් මිලෙන් 10% ක් ලෙස සලකතොත්, රුපියල් 30 ක විකුණුම් මිලකින් යුතු පොතකින් අවුරුදු 4 ක් තුළ ලැබෙන ආදායම රුපි 6000 කි තමන් විසින්ම පොත් බෙදා හැරීමේ කටයුතුවල නිරත වන ලේඛකයෙකු නම්, එම ආදායමෙන් ද තවත් විශාල කොටසක් බෙදා හැරීමේ කටයුතු හා මුදල් ආපසු එකතු කිරීමේ කටයුතු සඳහා වැය වේ. මෙය ඉතාමත් ඛේදජනක තත්ත්වයක් බව අමුතුවෙන් කිවයුතු නැත. පූර්ණ කාලීනව ලේඛන කටයුතුවල යෙදෙන වෘත්තීය ලේඛක

පිරිසක් රටේ නැති කමට මූලික හේතුව එයයි. වෙළඳ ජාලය තුළ පවත්නා අසමතුලිත බව නැති කොට, පුස්තකාල පද්ධතිය ක්‍රමවත් කිරීමෙන් පමණක් ලේඛකයින් ලේඛන කලාවෙන් ලබන ආදායම 200% කින් පමණ වැඩි කළ හැකි යයි මම සිතමි. පොත් වෙළඳපොළේ ප්‍රසාරණය ජනතාවගේ බුද්ධි වර්ධනය කෙරෙහි ද යහපත් ලෙස බලපායි.

මේ වෙනස ඇති කිරීමේ හැකියාව ඇති ප්‍රථමයා ආණ්ඩුවයි. එහෙත් ආණ්ඩුව එය භයානක අපරාධයක් ලෙස සලකන බව පෙනේ ඒ සඳහා එම හැකියාව ඇති දෙවනියා ඔබ යයි සිතමි.

පළමු කොට අලෙවි ජාලය තුළ පවත්නා ව්‍යුහාත්මක නොගැලපුම විසඳීමට සර්වෝදයට තිබෙන ඉඩකඩ මොනවාද?

(1) සතියේ කිසියම් දිනක පැවැත්වෙන 'ගම්බද පොළ' ගම්මුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කරන ජනප්‍රිය වෙළඳ පොළකි. බොහෝ විට පොළට පවුලේ බොහෝ දෙනෙකු පැමිණේ එය ඔවුනට විනෝද ගමනක් බඳුය. පොළේ සෑම දෙයක්ම ඇතත්, නැත්තේ පොත් පමණි. පොළේ නැති මේ වැදගත් අංගය පොළට එකතු කිරීම සර්වෝදයට කළ හැකිය. පොළට අලුතෙන් එකතු වන සර්වෝදය පොත් වෙළෙන්දා, අන් සියලු වෙළෙන්දන් මෙන් සරල මිනිසෙකි. ඔහුට සරල ලෙස තම පොත් බිම එලූ ඉටිරෙද්දක් මත අතුරා අලෙවි කළ හැකිය. සතියේ අනෙකුත් දිනවල පැවැත්වෙන වෙනත් පොළවල්වලට යෑමෙන් ඔහුට හොඳ ආදායමක් උපයා ගත හැකිය.

(2) ගෙයින් ගෙට ගොස් කරන පොත් වෙළඳාම ද ජනප්‍රිය කළ හැකි තවත් ක්‍රමයකි. විශේෂයෙන්ම ඒ මගින් ළමා පොත් අලෙවි කර ගත හැකිය.

(3) පදික වෙළඳාම ද තවත් සාර්ථක ක්‍රමයකි. ඒ සඳහා ලෑලිවලින් තනන ලද විශේෂ රථ යොදා ගත හැකි අතර ඒ සඳහා යන වියදම ඔවුන්ගෙන්ම කොටස් වශයෙන් ලබා ගත හැකිය.

(4) නාගරික ශාලාවල හා ප්‍රසිද්ධ පාඨශාලාවල පොත් ප්‍රදර්ශන පැවැත්වීම තවත් සාර්ථක ක්‍රමයකි. එය ප්‍රධාන අංශයට අනුයුක්ත විශේෂ ජංගම ඒකකයක් මගින් කළ හැකිය. එවිට ඔවුන්ට එක විට කාර්යයන් තුනක නියලිය හැකිය ඒ සඳහා තිබෙන කිසියම් වාහනයක් යොදා ගැනීම ප්‍රථම අදියර සඳහා ප්‍රයෝජනවත්ය. ඔවුන් ගමින් ගමටද, නගරවලටද යා යුතුය. එම ප්‍රදේශවල පොත් ප්‍රදර්ශන පවත්වමින් අලෙවි කටයුතුවල යෙදෙනවාට අමතරව, ප්‍රදේශයේ ඇති පොත් සාප්පුවල අවශ්‍යතාවයන් සපිරීම ද පාසල් සංවර්ධන අරමුදල්වලින් පොත් මිලදී ගැනීමට උනන්දුවක් දක්වන පාසල්වලට පොත් විකිණීම ද, ප්‍රදේශයේ තුන් ආකාරයකින් වෙළඳාමෙහි යෙදී සිටින සර්වෝදය පොත් වෙළඳුන්ට පොත් සැපයීම ද කළ යුතුය.

මේ සියලු කටයුතු සඳහා විශාල පොත් තොගයක් අවශ්‍ය වන අතර, ඒවා ලබා ගැනීම කෙසේ කළ හැකි ද යන්න දැන් මම විස්තර කරමි. සර්වෝදය ලේඛකයින්ට අත දීමේ සජීවී ක්‍රියා මාර්ගයක් ආරම්භ කොට ඇති බවත් තම පොත් පත් අලෙවි කර ගැනීමට උනන්දුවක් දක්වන ලේඛකයින්ට එම කාර්ය සර්වෝදය මගින් ඉටු කර ගත හැකි බවත්, විස්තර කෙරෙන දැන්වීමක් පුවත්පත් මගින් ප්‍රසිද්ධ කළ යුතුය. ඊට අමතරව ඒ පිළිබඳ සකස් කළ විස්තරාත්මක පත්‍රිකාවක් සියලුම ලේඛකයින්ට තැපැල් මගින් යැවිය යුතුය. එය පොත් ලබා ගත හැකි එක ප්‍රභවයකි.

මුදල් ගෙවීමකින් තොරව විකුණූ පසු මුදල් ගෙවීමේ පදනමක් මත අවශ්‍යම වුවහොත් බැංකු ඇපකරයක් මගින් පහත සඳහන් ග්‍රන්ථ ප්‍රකාශන ආයතනවලින් පොත් ලබාගත හැකිය.

* සීමාසහිත ලේක්හවුස් ග්‍රන්ථ ප්‍රකාශන ආයතනය
* එම්.ඩී. ගුණසේන සහ සමාගම
* මාර්ග ආයතනය
* ප්‍රදීප ප්‍රකාශනායතනය
* මාර්ටින් වික්‍රමසිංහ පදනම
* දයාවංශ ජයකොඩි සහ සමාගම
* දීපානි ප්‍රකාශනායතනය
* ගොඩගේ සහ සමාගම
* ප්‍රගති ප්‍රකාශකයෝ

මුදල් ගෙවීමෙන් පමණක් පොත් ලබා ගත හැකි තවත් වැදගත් ප්‍රභවයන් කීපයක් මෙසේය :-

* රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
* අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව
* සංස්කෘතික දෙපාර්තමේන්තුව
* ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
* මහ බැංකුවේ පර්යේෂණ අංශය
* විශ්ව විද්‍යාල පර්යේෂණ අංශය

මේ වන විට ආණ්ඩුවේ ප්‍රකාශන ආයතනවල කඩා වැටීමක් දක්නට ඇතත්, අතීතයේදී පළ කරන ලද අගනා පොත් රාශියක් (ග්‍රන්ථ නාම 200 ක පමණ) එම ආයතන සතුව පවතී. ඒවාහි මිල ගණන් ද විශ්වාස කළ නොහැකි තරම් පහත් මට්ටමක පවතී. ආයුර්වේදයේ මූල ග්‍රන්ථයක් වන 'චරක සංහිතාව' (ආට්පේපර් සනබැම්ම පිටු 593) රුපි 15.20 ක් පමණි 'ශාර්ධගධ' සංහිතාව. (ආට්පේපර් සනබැම්ම පිටු 256) මිල රුපි. 9.00 කි සමහර පොත් මෙබඳු පොත් ප්‍රදර්ශනවලදි උණු කැවුම් මෙන් අලෙවි වන බවට සැකයෙක් නැත.

යෝජිත අංශයට කාර්යාලයක් සහිත ගබඩා කාමරයක් තිබීම ප්‍රමාණවත්ය. ලේඛකයන්ගෙන් හා ප්‍රකාශකයන්ගෙන් ලබා ගන්නා

සියලු පොත් එහි ගබඩා කළ හැකි අතර, ජංගම ඒකකයට පොත් නිකුත් කිරීම පොත් මිලදී ගැනීම පිණිස එහි එන වෙළඳුන්ට පොත් විකිණීම හා එහි යන එන්නන්ට සිල්ලරට විකිණීම යනාදිය ද ඒ මගින් කළ හැකිය. තුන් මසකට වරක් තොග ගණන් ගත යුතු අතර, භාර ගන්නා ලද පොත්වල අලෙවිය හා ඉතිරිය පිළිබඳ විස්තර සටහනක් ද ඇතිව විකුණුම් සඳහා ගෙවිය යුතු මිල ඒ පුද්ගලයන්ට හා ආයතනවලට චෙක්පත් මගින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

මෙවැනි ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් පොත් වෙළඳ පොළේ සීඝ්‍ර පෙරළියක් ඇති කරනු බවට සැකයක් නැත.එය කියවන්නන්ගේ කියවීමේ උනන්දුව වැඩි කරයි. පොත් මිලදි ගැනීමට තිබෙන ඉඩප්‍රස්ථා පුළුල් කරයි. වෙළඳ පොළ ක්‍රමවත් වී, ප්‍රසාරණය වීම හේතු කොට ගෙන, ලේඛකයන්ට ලේඛන කලාවෙන් ලැබෙන ආදායම ඉහළ යයි. ගම්බද තරුණයින් සඳහා වන අලුත් රැකියා ඉඩප්‍රස්ථා කීපයක් ද ඇති කරයි.

යෝජිත අංශයේ ඊළඟ අවධානය පුස්තකාල පද්ධතිය වෙත යොමු කළ යුතුය. කියවීමේ උනන්දුවක් ඇති හැම කෙනෙකුටම තමන්ට අවශ්‍ය හැම පොතක්ම මිලදී ගැනීමේ හැකියාවක් නැත මේ අඩුව සම්පූර්ණ කළ යුතුව ඇත්තේ පුස්තකාල විසිනි. රට පුරා පුස්තකාල 3000 ක් පමණ ඇතත්, ඒවායින් පුස්තකාල තත්ත්වයේ පවතින්නේ 10% ක් තරම් වන ප්‍රමාණයකි. මේ පුස්තකාල පද්ධතිය ශක්තිමත් කොට, ප්‍රසාරණය කිරීම වැදගත් ජාතික අවශ්‍යතාවයකි. සර්වෝදයට අයත් පුස්තකාල පද්ධතිය ක්‍රමවත් කොට ශක්තිමත් කිරීම මගින් ඊට මුල පිරිය හැකිය වියදම් අධික සම්මත පුස්තකාල ක්‍රමයක් ගමට අවශ්‍ය නැත. වියදම් අධික නොවන නව සරල ක්‍රමයක් අත්හදා බැලිය යුතුව තිබේ.

සර්වෝදයට ගම් 6037 ක් පදනම් කොට ගත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 220 ක් තිබේ. මේ හැම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම

හොඳ පොත් එකතුවකින් යුතු ජංගම පුස්තකාලයක් ඇති කළ හැකි නම් එය ග්‍රාමීය ජනතාවගේ බුද්ධි වර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම සුළුපටු නැත. සර්වෝදයට පොත් වෙළඳ පොලේ ස්ථිර දායකයකුවීමට ලැබෙන පුළුවන්කම එයින් ලැබෙන තවත් අතුරුඵලයකි. එක් ප්‍රාදේශීය පුස්තකාලයක් එක් පොතකින් පිටපත් 5 බැගින් මිලදී ගතහොත් සර්වෝදය පුස්තකාල පද්ධතියට එක් පොතකින් මිලදී ගන්නා පිටපත් සංඛ්‍යාව 1100 කි. එවිට ලේඛකයින්ගේ ස්ථිර වෙළඳ පොළ 100% කින් පුළුල් වේ. මෙබඳු වැඩ ක්‍රියාමාර්ගයක් සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය බවට සැකයක් නැත. එහෙත් එය සපයා ගැනීම අපහසු නොවන බව මාගේ විශ්වාසයයි. දේශීය දානපතීන්ගෙන් පමණක් විශාල මුදල් සම්භාරයක් සොයා ගත හැකිය. විදේශීය මූලයන්ගෙන් ද ආධාර ලබාගත හැකි වනු ඇත.

මිට අමතරව යෝජිත නව අංශය ලේඛකයින්ට මුහුණ දෙන්නට වන ගැටළුවලට අත දෙන සහන ආයතනයක් විය යුතුය. විශේෂයෙන්ම පුස්තකාල මණ්ඩලයෙන් ලැබෙන ආධාරක ලබා ගන්නා ආකාරය ගැන වැටහීමක් නැත. මුද්‍රණ කටයුතු හා ඒ පිළිබඳ වන වියදම් පිළිබඳ වන විස්තර ද ඔවුන්ට ගැටළු සහගතය. නීති ගැටළු ඇති අය ද සිටී.

රාවයේ අරමුණ - 111
අවදානමෙන් තොර ප්‍රගතියක් නැත

වික්ටර් අයිවන් මා හමුවීමට පැමිණි බවත් ඔහු සර්වෝදය සේවයට බඳවා ගැනීමට මා කටයුතු කරන බවටත්, රාවයක් සර්වෝදය පුරා පැතිර ගියේය. බොහෝ පැරණි සේවකයෝ මෙන්ම, සමහර වැඩිහිටියෝ ද මේ ගැන මා සමඟ වරින් වර සාකච්ඡා කළහ. එයින් වැඩි දෙනා කළේ වික්ටර්ගේ අගුණ කියා ඔහු සර්වෝදයට බඳවා ගැනීම වැළැක්වීමටය. මේ චෝදනා අතර බෝම්බ සෑදීමට ගොස් අතක් අහිමි වීම ඔහු සිටි ජනතා විමුක්ති පෙරමුණේ සොහොයුරන් පාවා දීම සහ වෙනත් කරුණු ඔව්හු ඉදිරිපත් කළහ.

මගේ ප්‍රධාන තර්කය වූයේ සර්වෝදයේ ප්‍රධාන අරමුණක් වූ පූර්ණ පෞරුෂෝදයට, හැම දෙනාම යොමු කිරීම යන අදහස වික්ටර් අයිවන් මහතා කෙරෙහි ද එකසේ බලපෑ යුතු බවයි. අපි, ඔහුට අපේ යුතුකම් ඉටු කරමු. ඔහුගේ යුතුකම් සර්වෝදයට ඉටු කිරීම හෝ නො කිරීම ඔහුගේ වැඩක්? ප්‍රධාන වශයෙන් මා මේ ස්ථාවරයේ සිටි නමුත්, වික්ටර්ට අවස්ථාවක් දීමට මගේ සිතේ තවත් කරුණු කිහිපයක් බල පැවැත්වීය. ඔහුගේ සහජ දක්ෂතාවයන්ගෙන් රටට ප්‍රයෝජනයක් විය යුතුය. ඒ සඳහා ඔහුගේ පෞද්ගලික ජීවිතය ස්ථාවර විය යුතු අතර ඔහු බලාපොරොත්තු වන ප්‍රකාශන එළිදැක්වීම සඳහා අවශ්‍ය සම්පත් ද සොයා දිය යුතුය යන්න, මගේ සිතේ බලපැවැත් වූයේය. පළමුවැන්න සඳහා ඔහුට මගේ පෞද්ගලික ආධාරය ද දෙවැන්න සඳහා සංගමයේ ආයෝජන ද ලබාදීමට මම තීරණය කළෙමි. මේ හැර ඔහුගෙන් මට හෝ සර්වෝදයට කිසිදු උපකාරයක් බලාපොරොත්තු නො වූයෙමි. කෘතගුණ මතක තබා ගැනීම මගේ නොව ඔහුගේ වගකීමකි.

වික්ටර් අයිවන් දුටු මුල් අවස්ථාවේදී ම මා සිත තුළ ඇති වූයේ අනුකම්පාසහගත හැඟීමකි. කෙසඟ ශරීරයක් තුළ ඔහුගේ වැටුණු හිත මම දුටුවෙමි. එහෙත් අළු යට තිබුණු ගිනි පුපුරක් මෙන් එම සිතේ අධිෂ්ඨානශීලිත්වය සැඟැවී තිබෙන බවත්, මම අවබෝධ කර ගතිමි. මෙම ගිනි පුපුරු මොළවා සමාජ සාධාරණත්වය සඳහා ඔහුගේ එක් අතකින් පමණක් ඇල්ලිය හැකි පෑන් තුඩින්, පවතින මාධ්‍යයවලින් පතුරු වන මෝහාන්ධකාරය යම් ප්‍රමාණයකට අඩු කිරීමට ඔහුට අත දීම මගේ යුතුකමක් බව මම අවබෝධ කර ගතිමි.

ඔහුගේ සහ පවුලේ අයගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ මා විමසූයේ, පෞද්ගලිකව හැකි අන්දමින් එම බර අඩු කොට, ඔහුගේ මනස සම්පූර්ණයෙන්ම ලේඛන කටයුතු සඳහා නිදහස් කිරීමට ය. මගේ හෘද සාක්ෂියට එකඟව මම එය ඉටු කළෙමි. බොහෝ විට එය පෞද්ගලිකව ඔහුගේ බරක් මගේ කරට ගත් බවක් ඔහුට තේරුම් නොයන්නට ඇත. සමහර විට එම බරපැන් ඉසිලූයේ සර්වෝදය සංගමය යයි ඔහුට හිතෙන්නට ඇත.

වික්ටර් අයිවන් අතිශය දක්ෂ ලේඛකයෙකි. ඔහු සමාජ සාධාරණත්වය සඳහා රෝහණ විජේවීරයන් යටතේ හිංසාවාදී විප්ලවයකට යොමු වූ බව සැබෑය. ඒ ඔහුගේ 21 වැනි වියේදී ය. ඔහුගේ ගම ගාල්ල අක්මීමන කපුහේන්පොල ය. ඔහුගේ පියා ජීවතුන් අතර නැති අතර ඔහු පවුලේ වැඩිමහල් පුතා විය. ගාල්ලේ ශාන්ත ඇලෝසියස් විද්‍යාලයෙන් ඉගෙන ජ්‍යෙෂ්ඨය සමත් වී, දේශපාලන කටයුතු නිසා පාසලෙන් අස් වූ අයෙකි. ඉන් පසු රැකියාවක් නොමැතිව සිටි අතර, 'සිඩ්මා' කර්මාන්ත ආයතනයේ ආධුනිකයෙක් වශයෙන් සිට වැඩපොළේ වර්ජනයකට සහභාගි වී, ඉන් ඉවත් වී, රෝහණ විජේවීරයන්ගේ ව්‍යාපාරයට සම්බන්ධව ලොකු අතුල සමඟ ආයුධ අංශය බාරව වැඩ කළ බව පැවැසේ. නිදහස ලැබීමෙන් පසු වෙනත් ඕනෑම වරදකරුවෙකුට මෙන් ඔහුට ද නව ජීවිතයක් ආරම්භ කිරීමට අත දීම අපේ යුතුකමක් සහ වගකීමක් බව මම කල්පනා කළෙමි.

කැරැල්ලෙන් පසු හිරගෙදරින් නිදහස් වූ බොහෝ ජේ.වී.පී තරුණයෝ, අප හා එක්ව සර්වෝදය අහිංසාවාදී විප්ලවයට එකතු වූහ. ඔවුන්ගෙන් එක් අයෙකි වසන්ත කනගරත්න ඔහුගේ ද පියා නැත. ගාල්ලේ ඉමදූවේ මාවැල්ලේ ඉපදී ඔහුගේ මව කොළඹ මහ නගර සභාවේ වින්නඹු මාතාවක් හැටියට සේවය කළාය. ඔහු පවුලේ තුන්වැන්නා ය. මරදානේ ඕල්කට් විද්‍යාලයේත් කුමාර විද්‍යාලයේත් පෙම්බ්රොක් ඇකඩමියේත් ජ්‍යෙෂ්ඨය සමත් වන තෙක් උගත් ඔහු, දෙහිවල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුලත් විය. ඉන් පසු කොළඹ ඉසිපතන මහා විද්‍යාලයේ ද ඉගෙන ගත්තේ ය. විවිධ තානාපති කාර්යාලවලින් පොතපත ලබා ගෙන, විශේෂයෙන් කොමියුනිස්ට් සාහිත්‍යය ද කියැවූ ඔහු, ජවිපෙයට බැඳී දකුණු කොළඹ දිස්ත්‍රික්කයේ ලේකම් හැටියට ක්‍රියා කළේය. දිනක් මව සමඟ පැමිණ මා හමු වූ ඔහු, පොලිසිය විසින් කඩා දමා තිබූ ඔහුගේ නිවස සර්වෝදය ස්වේච්ඡා සේවකයන් ලවා ප්‍රතිසංස්කරණය කිරීමට උදව් ඉල්ලීය අසනීපයකින් මිය යන තෙක්ම ඔහු ආදර්ශවත් සර්වෝදය සේවකයෙක් හැටියට මගේ උපදෙස් යටතේ කටයුතු කළේය.

ඊට පසු කලෙක ලයනල් බෝපගේද සර්වෝදය ඉංජිනේරු අංශයේ ආදර්ශවත් ලෙස සේවය කොට පසුව විදේශගත විය.

මේ අනුව සලකා බලන විට වික්ටර් අයිවන් මහතා, සර්වෝදයට සම්බන්ධ කර ගැනීම අප වැනි පක්ෂ සහ බලකාමී දේශපාලනයෙන් තොර අහිංසාවාදී ව්‍යාපාරයකට අවදානමක් වුවත් ඔහුට ද, ඔහුගේ දක්ෂතාවලින් රටට සේවයක් කිරීමට අවස්ථාවක් ලබා දීමට මගේ හිත බල කළේය.

මේ කාලය වන විට තදින්ම ශ්‍රී ලංකාව බටහිරකරණය වෙමින් පැවැතියේය. ප්‍රධාන ප්‍රවෘත්ති පත්‍ර තුනක් පාලනය කළේ ලේක්හවුස් ආයතනයයි. තවත් දිනපතා පුවත්පත් දෙකක් පාලනය කළේ ප්‍රධාන පවුලකට අයත් වූ උපාලි ආයතනයයි. දිනපතා

පුවත්පත් තුනක් පාලනය කළ දවස ව්‍යාපාරය ද ප්‍රධාන පවුලක පාලනය යටතේ පැවැතියේය. එවකට තිබූ රූපවාහිනී මධ්‍යස්ථාන දෙකම රජයට අයත්ව තිබූ අතර, රජය විසින් පාලනය කළේය. සියලුම ගුවන් විදුලි මධ්‍යස්ථාන ද පාලනය කළේ රජය විසිනි. මේ සියල්ල ගැන කල්පනා කරන විට, ප්‍රධාන ජන මාධ්‍යවලින් සිදු වූයේ ඉතා සුළු ධනවත්, නාගරික පංතියක් සහ රජය විසින් ඔවුනට ඕනෑ දේ 80% ක් පමණ ගැමි ජනතාවට සන්නිවේදනය කිරීමයි.

ආධ්‍යාත්මික සහ සංස්කෘතික පරිහානියක් ඇති කරමින්, වාණිජ සංස්කෘතියකින් රට වෙලා ගන්නා මෙම යුගයේ, වික්ටර් අයිවන් වැනි නිර්භය දක්ෂ ලේඛකයෙකුට අත දීම කොතරම් අවදානම් කටයුත්තක් වුවත්, එයට අත ගැසීමට මම පසුබට නොවූයෙමි. ඒ නිසා ම අපේ විධායක මණ්ඩලයේ කැමැත්ත ද ලබා ගෙන, ඔහුට සර්වෝදය කාර්ය භාරයක් පැවැරීමට මම පුරෝගාමි වූයෙමි.

1986 වන විට අප රටේ බිහිසුණු යුද්ධයක් ඇවිලෙමින්, රටම අනාථ කඳවුරක් බවට පත් වෙමින් තිබුණේය. මේ තත්ත්වය ඇති වීමට හේතු වූ කරුණු මෙන්ම, එයින් මිදීමට හේතු වන කරුණු ද මහජනයා ඉදිරියේ තැබීමට වික්ටර් අයිවන් මතු කළ නිර්දේශ හැකි තරම් ක්‍රියාවට නැඟීමට මම පෙළඹුණෙමි. අවදානමෙන් තොරව කිසිම ප්‍රගතියක් ලැබිය නොහැකි සේම, නව නිර්මාණයක් ද ගොඩනැඟිය නොහැකිය.

වැරැද්දට විරුද්ධව සටන් කිරීම - IV
''රාවය'' එළි දකී

රාවය සංවාදශීලී මාසිකය 1986 අගෝස්තු මාසයේ පළමුවැනිදා එළි දැක්කේය. මෙහි ප්‍රධාන සංස්කාරක වශයෙන් වික්ටර් අයිවන් මහතා ද සහාය සංස්කාරකවරුන් වශයෙන් උපාලි කොළඹගේ මහතා ද සඳා අහුබුදු මැතිනිය ද, සම්බන්ධීකරණ කළමනාකරු වශයෙන් ලාල් මහවත්ත මහතා ද කටයුතු කළහ. සිතියම් හා රූ රටා බාරව විලියම් පීටර් කේ. අසෝක පද්මසිරි එම්.එච්. උදය ලාල් යන මහත්වරු කටයුතු කළහ. ඡායාරූප අංශය විමලසිරි ජයලත් මහතා මෙහෙයවීය. ප්‍රකාශක හැටියට වික්ටර් අයිවන් මහතා වගකීම ඉසිලූ අතර, මුද්‍රණය පිළිබඳ වගකීම භාර ගත්තේ රත්මලානේ විශ්ව ලේඛා ආයතනයයි.

1986 මැයි ජූනි සහ ජූලි මාසවලදී කිහිප වරක්ම තනියෙන් මෙන්ම වෙනත් සර්වෝදය ප්‍රධානීන් සමඟ ද වික්ටර් අයිවන් මහතා සමඟ සාකච්ඡා කොට, මේ ප්‍රකාශනය පිළිබඳ හැම පැත්තක් ගැනම ගැඹුරට විමසා බැලුවෙමු. අපේ නිගමනය වූයේ ''රාවය සන්නිවේදන පර්ෂදය'' යන නමින් සංගමයක් සංවිධානය කොට, ඒ මගින් රාවය පළ කිරීමට පියවර ගැනීමත් පහත සඳහන් අරමුණු අනුව වැඩ කිරීමත්ය:

(1) වාණිජ හා බලවාදී දේශපාලන අරමුණුවලින් තොරව, ලේඛක හා පාඨක යහපත අරමුණු කර ගත් නිදහස් සන්නිවේදන හා ප්‍රකාශන ආයතනයක් බිහි කිරීම.

(2) තුලනාත්මකව කරුණු සලකා බලන, විචාරවාදී නැඹුරුවක් සමාජය තුළ ඇති කිරීමට ප්‍රයෝජනවත් වන, පුවත්පත් හා වාරික ප්‍රකාශන පොත්පත් හා ඊට අනුශාංගික වෙනත් ප්‍රකාශන ද සිංහල, දෙමළ හෝ ඉංගිරිසි භාෂාවලින් පළ කිරීම.

(3) වෘත්තීය ලේඛක පරපුරක් බිහි කිරීමේ ලා ආධාර විය හැකි ක්‍රියාකාරම්වල යෙදීමයි.

''රාවය'' සඟරාව හැම ප්‍රගතිශීලී මතයක්ම ප්‍රකාශ වන සංවාදශීලී ප්‍රකාශනයක් වනු මිස, සර්වෝදයට ප්‍රචාරය දෙන මාධ්‍යයක් බවට පත් කිරීම කිසිසේත් මම අපේක්ෂා නොකළෙමි. මම රාවය සංස්කාරකගෙන් ඉල්ලා සිටියේ පෞද්ගලික මට්ටමෙන් කිසිවෙකුට අවමානයක් නොකොට, වැරදි කරන්නාට නොව වැරැද්දට විරුද්ධව සටන් කිරීම කළ යුතු බවයි. කිසි සේත් මා හුවා දැක්වීම ඔහුගෙන් අපේක්ෂා නොකරන බව පැහැදිළිවම ඔහුට කීවෙමි. මගේ මතකයේ හැටියට පස් අවුරුදු කාලයක් තුළ මගේ නමින් රාවය සඟරාවේ පළ වූයේ ලිපි දෙකක් පමණකි. ඒ ලිපි දෙක පහත දැක්වේ.

විපතට මුල ආධ්‍යාත්මික පරිහානියයිඃ

ආචාර්ය ඒ.ටී. ආරියරත්න

මූලික වශයෙන් දැන් තිබෙන අර්බුදය මා දකින්නේ ආධ්‍යාත්මික සදාචාර හා සංස්කෘතික අර්බුදයක් හැටියටයි. ආධ්‍යාත්මික අර්බුදය කියා කියන්නේ මිනිහාට මිනිස් ජීවිතයේ පරම අරමුණ ගැන මහා ගැටළුවක් ඇති වෙලා තියෙනවා. ඒ කියන්නේ මනුෂ්‍යයෙක් හැටියට මූලික වටිනාකම් සමුදායකින් තමාගේ පෞරුෂය සම්පූර්ණ කර ගත යුතුය කියන ආධ්‍යාත්මික ගුණය මිනිසුන්ට අමතක වෙලා තියෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආධ්‍යාත්මික වශයෙන් මිනිහා පිරිහීමට පත් වෙලා තියෙනවා. ආධ්‍යාත්මික වශයෙන් පිරිහීමක් ඇතිවුණු හැටියේ මනුෂ්‍යයා, අනෙක් මනුෂ්‍යයනුත් එක්ක තියෙන සම්බන්ධකම් පහළට වැටෙනවා. උදාහරණයක් වශයෙන් ගතහොත් යම් පුද්ගලයෙකු තමන්ගේ කුලය ගැන හෝ ජාතිය ගැන හෝ පක්ෂය ගැන හෝ පමණක් හිතන්නට ගතහොත්, එය ආධ්‍යාත්මික වශයෙන් පිරිහීමක් ඒ නිසාම ඒ පුද්ගලයා වෙනත් අයත් එක්ක ඇති කර ගතයුතු අන්තර්

පුද්ගල සම්බන්ධතාවය පහත් තත්ත්වයකට කඩා වැටෙනවා. ජාති භේදය පිළිගත් මිනිසුන් නිසා තමයි මූලික වශයෙන් අද තියෙන ජාතික ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නේ 'ජාති භේදය' කියන්නේ, 'ජාති මමත්වයට' නොවෙයි. සමහර විට එය 'ජාති ද්‍රෝහිත්වයක්' වෙන්නට පුළුවන්. ජාති මමත්වයක් හැම දෙනාටම තියෙන්න ඕන නමුත් ජාති මමත්වය කියලා කියන්නේ වෙනත් ජාතීන් කෙරෙහි ඇති කර ගන්නා වෛරය නොවෙයි.

මේ ආධ්‍යාත්මික පිරිහීම නිසා සදාචාරාත්මක පිරිහීමක් ද දැන් රටේ ඇතිවෙලා තියෙනවා. අන්තර් පුද්ගල සම්බන්ධතා මතයි දේශපාලන හා සාමාජික දියුණුව රඳා පවතින්නේ තුන්වැනි කාරණය තමයි සංස්කෘතික වශයෙන් ඇති වන පිරිහීම.

සංස්කෘතිය කියලා කියන්නේ අප කොයි විදියේ ආහාර ද ලබා ගත යුතු? කොයි විදියේ ඇඳුම් පැළඳුම් ද ඇඳිය යුතු? කොයි විදියෙන් ද රස වින්දනය ලැබිය යුතු? කොයි විදියේ නිර්මාණද අප කළ යුතු? ඒවා කොතෙක් දුරට අපේ පරිසරයට බලපානවා ද සොයා බලා කටයුතු කිරීමයි. සමස්තයක් හැටියට ගතහොත් මනුෂ්‍යයා මානුෂික සහ භෞතික වශයෙන් තමාගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමේ මහා පොදු සාධකය තමයි, සංස්කෘතිය කියා කියන්නේ.

ඉහත කී කාරණා තුනම අද අවුල් කර ගෙන තියෙනවා ඒ නිසා තමයි නොයෙක් අන්දමේ සාමාජික ප්‍රශ්න, ඒ වගේම මහා විශාල ආර්ථික අර්බුදයක් අද රටේ ඇතිවෙලා තියෙන්නේ හේතුඵලවාදය ගැන සලකන විට මේ අර්බුදකාරී ඵලය ඇති වීමට හේතුව සොයා බලා ඒ ගැන කටයුතු නොකොට නිකම් ඵලය ගැනම හිත හිතා හිටියට වැඩක් වෙන්නේ නැහැ.

අප සමාජයේ ඉන්නවා සමාජය පිළිගත් නායක කොටස් හැම ආගමකටම අයත් ආගමික නායකයන්ගෙන් තමයි සමාජයේ ආධ්‍යාත්මික මට්ටම ඉහළ තත්ත්වයක තබා ගැනීමට

බලාපොරොත්තු වන්නේ වචනයෙන් පමණක් නොවෙයි, තමන්ගේ පිළිවෙත්වලින් හා හිතෙන් මුදා හරින ආධ්‍යාත්මික ශක්තියෙන් මේ අය සමාජයට නායකත්වයක් දිය යුතුයි. මිනිසා යම් යම් දේවලින් බෙදෙනවා නම්, එය පිස්සුවක් - උමතුවක් බවත්, ඉන් අයහපතක් ම මිස හොඳක් නොවන බවත්, මිනිස් වර්ගයා කොටස් වශයෙන් බෙදා වෙන් වෙන් කළ නොහැකි එකම මිනිස් පවුලක් බවත් මේ ආගමික නායකයින් පොදු මහජනතාවට අවබෝධ කර දිය යුතුය.

ඊළඟට ගුරුවරු දේශපාලන නායකයෝ ආදී වශයෙන් සමාජයේ වැදගත් තැන් උසුලන තවත් නායකයන් කොටසක් සිටිති. ඒ අයට තවත් මට්ටමක සේවයක් කළ හැකියි. ඒ අය භේදයෙන් තොර බව ආදර්ශයෙන් පෙන්විය යුතුයි. දේශපාලන පක්ෂ භේදය අත් හැර දා මේ අයට පුළුවනි, යම් පොදු අරමුණක් මත එකම වේදිකාවක නැඟ, රට පුරාම ගිහින් මහ ජනතාවට කරුණු පහදා දෙන්න. දැන් අපට පොදු ප්‍රශ්න ඕනතරම් තියෙනවා. අපේ තරුණ පෙළ මත් උවදුරින් වළක්වා ගැනීමට, ඒ අයට අධ්‍යාපනයක් දීමට මේ අය නායකත්වයක් දෙනවා නම් ඒක එක්තරා මට්ටමක සදාචාරාත්මක පොදු සේවයක් ඒ අයගෙන් ඉටු වෙනවා. එයත් අන්තර් පුද්ගල සම්බන්ධතාව උසස් කිරීමේ එක් පියවරක් වෙනවා.

සමාජයේ ඉන්න දේශපාලන නායකයෝ වගේ අය සරල චාම් ජීවිතයකට පුරුදුවෙලා, ආදර්ශයෙන්ම එය පොදු මහජනතාවටත් කාවද්දන්න උත්සාහ කරන්න ඕන. සංස්කෘතිය දියුණුව කියා කියන්නේ, මූලික අවශ්‍යතා සපුරන්නට යාමේදී මිනිසාගේ හැම පැත්තකින්ම සිදුවන යම්කිසි මට්ටමක දියුණුවක් ඒකෙන් අදහස් කරන්නේ මහා පොදු සාධකයක්. ඒ කියන්නේ ආධ්‍යාත්මික වශයෙන් උසස්, සදාචාරයෙන් උසස් අනවශ්‍ය දේට ඇබ්බැහි නොවී, නිර්මාණ කුසලතා දියුණු කර ගැනීමට යොදන බුද්ධිය වර්ධනය කර ගැනීමට උපකාරී වන සංවාදවල යොදා සමාජයක් බිහි වීමයි.

අතීතයෙන් අපට ඉතිරි වී ඇති සංස්කෘතික අංගෝපාංග ඒ කාලයේ බිහි වුණේ සමාජවල තිබූ සහනශීලී ස්වභාවය නිසයි. වෙනත් වචනවලින් කියනවා නම්, අන්තවාදීව විශාල වශයෙන් ලබන්න බැරි මට්ටමක් ලැබීමට ඉලක්ක කර ගන්නේ නැතිව, දුප්පත්කමත් නැති - පොහොසත්කමත් නැති, දුප්පත් කමින් තොර සමාජයක් තිබුණ නිසයි.

යම් කෙනෙක් අමෙරිකාවේ සිටින පොහොසත්ම මිනිසාගේ නැතහොත් කණ්ඩායම් මට්ටමට යෑම අරමුණු කර ගන්නවා නම්, එය කිසිදාක සාක්ෂාත් කර ගත නොහැකි අරමුණක්. අමෙරිකාවේ ඉහළම තාක්ෂණය මෙහි පිහිටුවන්නට ගිහින් එහි අනිසි ප්‍රතිඵල දකලා කෑ ගැසීම මෝඩකමක්. අපේ අවශ්‍යතාවලට අනුව ආර්ථිකය හැඩගස්වා ගන්නෙ නැතිව ආශාවන්ට මුල් තැන දී, ආර්ථිකය හැඩ ගස්සන්නට යෑමයි, අපේ පිරිහීමට මූලික හේතුව. එහෙම කරන්නට යාමෙන් මිනිසුන්ගේ වැදගත් ගැඹුරු දේ නොවෙයි, පහත් රුචිකත්වය හා පහත් දේවලුයි ඉස්මතු වන්නේ.

විශේෂයෙන් රටේ ඉන්න දේශපාලන නායකයෝ කියනවා නම්, අපේ ආර්ථික තත්ත්වය මෙපමණයි මේ අනුව අප හැඩගැසිය යුතුයි කියා, මේ අනුව මහජනතාව ද හැඩ ගැසෙන්නට ඉඩ තියෙනවා. අනවශ්‍ය දේ රටට ආනයනය කරන්න හොඳ නෑ. අනවශ්‍ය දේ මෙහි නිෂ්පාදනය කළ යුතුත් නෑ. මිනිසුන්ගේ මූලික අවශ්‍යතාවලටයි මුල් තැන දිය යුත්තේ. මූලික අවශ්‍යතා කීවේ කෙනෙකුට ජීවත් වෙන්නට මූලිකව අවශ්‍ය දේ මෙයට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍යය ආදි වශයෙන් ද්විතීය අවශ්‍යතාවයන් තිබෙනවා. ඊටත් එහා තෘතීයික අවශ්‍යතාත් තිබෙනවා. ඒ කියන්නේ පුද්ගල, පවුල් ප්‍රජා මට්ටමේ අවශ්‍යතා ඊටත් එහාට ගියාම ජාතික මට්ටමේ අවශ්‍යතාත් තිබෙනවා ඉතින් ඒ මට්ටම් තේරුම් අරගෙන ඒ අවශ්‍යතාවලට මුහුණ දෙන්නට පුළුවන් විදියේ ආර්ථික ප්‍රතිපත්තියක් කරා යොමු කරනවා නම්, එවැනි නායකත්වයට මුළු ජනතාවම සහභාගි කර ගෙන රට ඉස්සරහට ගෙන යා හැකියි.

සමාජ ක්‍රමයේ මුළුමනින්ම වෙනසක්:

ආචාර්ය ඒ.ටී. ආරියරත්න

1948 දී අපට නිදහස ලැබෙන විට එවකට සිටි ජාතික නායකයන්ට පැරණි සාරධර්ම සම්ප්‍රදායයන් මිනිසුන්ගේ සහජ උරුමයන් හා දක්ෂතාවයන් ප්‍රයෝජනයට ගෙන, මෙරට මිනිසුන්ගේ ජීවන දර්ශනය ගොඩ නඟන්නට පුළුවන්කම තිබුණා. නමුත් එදා සිටි නායකයන් එසේ කළේ නැහැ. යම් ලෙසකින් එය එසේ සිද්ධ වුණා නම්, දෙමළ කතා කරන ජනතාවට ඔවුන්ගේ සංස්කෘතිය නොකඩවා දියුණු කරන්න ඉඩ තිබුණා. සිංහලයන්ටත් එසේ කළ හැකිව තිබුණා. අනික් සුළු ජාතීන්ගෙන් විවිධත්වය රැකගෙන, විවිධ තත්ත්වයන්ගේ ඒකත්වයත් ගොඩ නඟන්නට තිබුණා නමුත් ඒ අවස්ථාව ඔවුන් පැහැර හැරියා.

ඒ වෙනුවට සිදුවූයේ කුමක්ද? උතුර ගෙන බලමු. උතුරේ නායකත්වය දුන්නේ ඉහළ කුලවලින් ආ පවුල්වල අයටයි. මෙහෙ අරගෙන බැලුවත් ඕනෑම පක්ෂයකින් තෝරල දම්මෙ පවුල් බලයක් මුල් කර ගත් අය. උතුරේ වගේම, ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී මුහුණුවරින් බලතල ලබා ගෙන, ඒ බල කේන්ද්‍රයට ඇතුළුවෙච්චි වරප්‍රසාද ලත් පන්තිය තමා, සුද්දන්ගෙ කාලෙ ඉදන් මතුවෙලා ආවේ ප්‍රධාන වශයෙන් දේශපාලන පක්ෂ මාර්ගයෙන් බලය ලබා ගෙන සුද්දන් ලබා ගෙන තිබුණ තැන ඔවුන්ට ගැනීමේ මාර්ගයකට නායකයන් පිවිසෙද්දී, නිලධාරීන්ගේ තිබුණ ස්වාධීනත්වය නැතිවෙලා, නිලධාරී ක්‍රමය පවා දේශපාලන බලධාරීන්ගේ පාලනය යටතට පත් වුණා ඒ සමඟම සිදුවූයේ උතුරේ වේවා, දකුණේ වේවා, මිනිසුන්ට ලැබිය යුතු සාධාරණත්වය නැතිව යෑමයි.

ප්‍රජාතාන්ත්‍රික පාර්ලිමේන්තු සම්ප්‍රදාය මගින් උතුරේත්, දකුණේත් ඉහළ පන්ති දෙක අතරේ යම් සම්බන්ධයක් තියාගෙන ආවා. නමුත් දුප්පත් පන්නපු හැටියේ, නැතිනම් පන්නන්න සිද්ධ

වෙච්ච හැටියෙ ඒ සම්බන්ධය බිඳ වැටුණා. ඒ එක්කම පල්ලෙහා මට්ටමේ හිටපු උතුරේ සන්නාහ සන්නද්ධ තරුණ කණ්ඩායම්වල ආධිපත්‍යය මතු වුණා. දකුණේ මෙතුවක් මෙවැනි තත්ත්වයක් නොතිබුණත්, රජයේ ප්‍රකාශවලින් පෙන්වා සෑහීමකට පත් නොවුනු ජනතාව අතරින්, යම් යම් කොටස් හිංසා මාර්ගවලට මාරුවෙමින් සිටින බව මේ සියල්ලෙහි ප්‍රතිඵලය වෙලා තියෙන්නේ රට අවුල් ජාලයක් බවට පත්වීම.

මේ තත්ත්වයෙන් වාසි ගන්නෙ කවුද? පොදු ජනතාවවත් සටන් බිමට බැහැපු අවි දරන්නන්වත් නොවෙයි. කෙලින්ම වෙළඳ ක්ෂෙත්‍රයේ ඉන්නා අය. මේ අයට රටේ බෝම්බ පිපිරුවත් ගහ ගත්තත් මරා ගත්තත් ප්‍රශ්නයක් නෑ. ඒ ගොල්ලන්ට තියෙන්නේ, තව තවත් මුරකාවල් වැඩි කර ඒ කටයුතු ගෙන යන එකයි පැරණි තිබ්බච දේවල් රැක ගන්න යෑමෙන් අද රටේ බලය ගිහිල්ල තියෙන්නෙ ඉතුරුවෙලා ඉන්න දේශපාලකයන්ගේ අතටවත් ඔය අවි ආයුධ අරගෙන ඉන්න අයගෙ අතට වත් නොවේ. මේ බලය ගිහින් තියෙන්නේ රටේ නොසන්සුන්කම් ඇති කරන සාරධර්ම ප්‍රතික්ෂේප කරන, ඒවා ගණන් නොගන්නා ව්‍යාපාරිකයන් පිරිසක් අතට ඒ අය තමයි අද ඉහළම තැනට ඇවිත් තියෙන්නෙ. මීට තිබෙන විසඳුම් නිදහස් ආකල්ප ඇති කවුරුත් එකට එකතුවෙලා කාටත් එකට ජීවත් විය හැකි ක්‍රමයක් හදාගන්න ඕන කියන එකයි.

මේ දිහා බලා තමයි, සර්වෝදය මුල ඉඳන්ම කටයුතු කළේ අපි පළමුවෙන් විවිධ සිතුවිලි තියෙන ජන කොට්ඨාශයන්ය. මේ රටේ ජීවත් වන්නෙ කියන අදහස පළ කළා. අදත් අපට ලංකාවේ හැම තැනම වගේ වැඩ කර ගෙන යන්න පුළුවන්කම ලැබුණෙ එහි ප්‍රතිඵලයක් හැටියටයි. දෙවනුව අපි කෙලින්ම ප්‍රශ්නත් එක්ක පොර බදින්න ගියෙ නැහැ. හේතුව ඒවා රෝග ලක්ෂණ විතරයි. අපි රෝග නිධානයට බැස්සා. රට පුරාම මේ අදහස ක්‍රියාවට නගන්නට

පුළුවන් පිරිසක් සොයා ගෙන, ඒ අය ලවා විවිධ ක්ෂේත්‍රවල මිනිසුන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන විදිහට අපි වැඩ සටහන් ක්‍රියාත්මක කර ගෙන ගියා. ඒ අතරේ හිංසාවාදී තත්ත්වය නිසා විවිධ ඇබැද්දිවලට මුහුණපෑමට සිදුවුන සරණාගතයන්ගේ පුනරුත්ථාපන සහ සහන සේවා කටයුතුවලටත් කාලය යොදවන්න අපට සිදුවුණා. අපි ඒ අවස්ථා, සිතිවිලි ඔස්සේ, ශිල්පීය ක්‍රම ඔස්සේ හා සංවිධාන ක්‍රම ඔස්සේ මිනිසුන් ඒකරාශී කිරීමට මාධ්‍යයක් කොට ගත්තා.

අපට තියෙන ශක්තියක් නම්, ජාතික පිරමීඩයේ අත්තිවාරමේ සෑහෙන කොටසක් සර්වෝදයට සම්බන්ධ කොට තබා ගෙන සිටීමට හැකි වීම, පිරමීඩය උඩ කඩා වැටෙන එක කාටවත් නවත්වන්න බෑ. හමුදා පිරිස් වැඩි කර හිරගෙවල් වැඩි වැඩියෙන් මිනිසුන්ගෙන් පුරවා ඒක තාවකාලිකව කල් දාගන්න පුලුවන්, නමුත් ඒක තාවකාලිකයි. අපට ඒක රැක ගන්න උවමනාවකුත් නෑ .

ජීවිත එකක් වත් නැති වෙනවට අපි කැමති නැහැ. තිබෙන සමාජ ක්‍රමය හැඩ ගැහිලා තියෙන්නේ මිනිසුන් විනාශ වන විදියට නම්, විනාශ වන ඒවාට සහන සලස්සනවා හැරෙන්නට වෙන කරන්නට දෙයක් අපට නැහැ.

අප බොහොම කැමතියි මේ අසාධාරණ ක්‍රමය කඩා වැටිලා, අලුත් එකක් ගොඩ නැඟෙනවට. හැබැයි මේ අලුත් ක්‍රමය උඩින් ඇතිවෙන්න බැහැ. ඒක යටින් ඇති වන එකක් වෙන්න ඕනෑ. පරස්පර විරෝධතා තියාගෙන ඉන්න ඉහළ තට්ටුවල මිනිස්සු ගැටුණාට, යට තට්ටුවේ සාමාන්‍ය පොදු මහජනතාව සිංහල දෙමළ මුස්ලිම් මිනිස්සු එකට එකතු කිරීමත් රට බෙදන එක වැළැක්වීමත් වළක්වා ගන්න බැහැයි කියලා මං හිතන්නෙ නැහැ. මට හිතෙන්නෙ සාධාරණ විදියට බලය විමධ්‍යගත වන විදියට ඒක කරන්න පුලුවන් ඒ වගේම අනාගතයේදී මේ තියෙන බොරු ආටෝප වෙළඳ

ආර්ථිකය කඩා වැටෙනවා. ඒක කඩා වැටෙන්නෙ සමහර වෙලාවට, ඒ ආර්ථික ක්‍රමයෙන් ම ඇති කරපු පිරිස් මතට වෙන්නට පුළුවන්.

මහජනතාව වෙනුවෙන් කාටවත් මේව විසඳන්න පුලුවන් කියලා මම කියන්නෙ නැහැ. මම කියන්නෙ මේ රටේ ජාතිවාදී හෝ බලකාමීන් හෝ ධනවාදීන් හෝ නොවන බුද්ධිමත් අයගේ යුතුකම, පොදු ජනතාවට ඒ ප්‍රශ්නය කෙලින්ම විසඳා ගැනීමට හදා දෙන එකයි. ඒක හදන්න තමා අපි මහන්සි වෙන්නෙ.

හදවතයි - දක්ෂකමයි
රාවයට ගැටුම් මතුවීම

සමාජයේ අවශ්‍ය සෑම ප්‍රයෝජනවත් අංශයකම වැඩි දියුණුව සඳහා නවතම අංශ සර්වෝදය සංවිධානය තුළ පිහිටුවීම මගේ අභිලාෂය විය 1983 දී සර්වෝදය විසින් රටට ඉදිරිපත් කළ යුතු විකල්ප ආර්ථික දර්ශනයක් සහ ක්‍රියා මාර්ගයක් මම සර්වෝදය විධායක මණ්ඩලයට ඉදිරිපත් කළෙමි. මේ පිළිබඳව බොහෝ දෙනාගේ යහපත් ප්‍රතිචාර ලැබුණු නමුත්, එය ක්‍රියාත්මක කිරීමට තරම් දක්ෂයෙක් ඒ වන විට අපට සම්බන්ධව සිටියේ නැත.

නැවත 1986 ජූලි මස 7 වැනිදා සවිස්තරව 'සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා අංශයක්' ඇති කිරීම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සකස් කොට විධායක මණ්ඩලයෙන් සම්මත කර ගතිමි.

දුලාන් ද සිල්වා මහතා

මේ කාල වකවානුවේදි විධායක මණ්ඩලයට තෝරා ගත් අය අතර, ආනන්ද චිත්තම්පලම් මහතා හොඳ ව්‍යාපාරිකයෙක් හැටියට ප්‍රසිද්ධව සිටියේය. සර්වෝදය ආර්ථික සංවර්ධන ව්‍යවසාය අංශයට සුදුසු තරුණයෙක් තෝරා දෙන ලෙස ඔහුගෙන් මම ඉල්ලීමි. දිනක් ඔහු හීන්දෑරි උපැස් යුවලක් පැළඳ සිටි තරුණයෙක් මා හමුවට කැඳවා ගෙන ආවේය. මොහු මහවැලි අධිකාරියේත් පසුව, මැදපෙරදිග ගණකාධිකාරීවරයෙකු ලෙසත් සේවය කොට, දැන් සුදුසු රැකියාවක් සොයමින් සිටින බව ආනන්ද චිත්තම්පලම් මහතා මා සමඟ පැවැසීය.

අපේ සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවාව විධිමත් ලෙස සංවිධානය කිරීමේ වගකීම මම ඔහුට බාර දුනිමි. ඒ දුලාන් ද සිල්වා මහතා ය. රාජකීය විද්‍යාලයේ ද්විතීයික අධ්‍යාපනය ලබා තිබුණු ඔහු, ගණකාධිකාරීවරයෙකු වශයෙන් සුදුසුකම් ලබා තිබුණේ ය. දුලාන් පිළිබඳව ද මගේ හිතේ කාරණා දෙකක් බලපැවැත්වීය:

පළමුවැන්න ඔහුගේ දස්කම්වලින් රජයට හෝ පෞද්ගලික ආයතනයකට හෝ ගත හැකි සේවය වෙනුවට පොදු මහජනතාවට එම සේවය ලබා දීමය. ඒ අතරම ඔහුගේ පෞරුෂය ගොඩනංවා සාර්ථක පෞද්ගලික ජීවිතයක් ගොඩනැංවීමට ඔහුට අත දීමය. එවකට ඔහු විවාහකයෙක් නොවීය.

ඔහු රාවතාවත්ත හන්දියට බස් රථයකින් පැමිණ, මගේ කාර්යාලයට පයින්ම පැමිණියේ ය. ඔහුට කාර්යාලීය පහසුකම් මම සලසා දුනිමි. 1986 මැයි පළමුවෙනි දා විධායක සභාවේ යෝජනාවකින් ඔහුට සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන අංශයේ ප්‍රධාන විධායක ධුරය පැවරීමි. හඳුන්වා දිය යුතු සර්වෝදය ප්‍රධානීන් ද දුලාන් මල්ලීට හඳුන්වා දුනිමි. මේ දිනවල සර්වෝදය අයවැය ලේඛනය සකස් කරමින් තිබුණ නිසා, ගණකාධිකාරී වරයෙකු වශයෙන් ඔහුට එම වගකීම පැවරුවෙමු. ඉතා හොඳින් ඒ සේවය ඉටු කළ ඔහු 'නොවීබ්' (NOVIB) ආයතනය ප්‍රධාන අපගේ ආධාරක ආයතනවලත් සර්වෝදය වැඩිහිටියන්ගේත් ප්‍රසාදය දිනා ගත්තේ ය.

සාලිය රණසිංහ මහතා ප්‍රධාන මුල් සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවාවේ නිලධාරීන් ද තෝරා ගැනීමේ සම්පූර්ණ බලය ඔහු වෙත පැවරීමි. ඔහු ඉතා හොඳින් තමන්ගේ කනිෂ්ඨ නිලධාරීන් තෝරා ගත් අතර, ඉතා දක්ෂ ලෙස එම අංශයට අඩිතාලම දැමීය. මා කළේ මට හැකි තරම් දුරට ඔහුගේ කටයුතුවලට අත දීමය. මා පාවිච්චි කළ ජීප් රථය සහ පසුව මෝටර් රිය ද ඔහුගේ

ප්‍රයෝජනයට පවරා දී, ඔහුගේ සේවය හැකි තරම් කාර්යක්ෂමව කර ගෙන යාමට මම උදව් කළෙමි.

සර්වෝදය ක්ෂේත්‍ර අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ හර්ෂ කුමාර නවරත්න මහතා, ආදායම් උත්පාදන ව්‍යාපෘති බාරව කටයුතු කළ පී. ඩබ්ලිව්. මහවත්ත මහතා, දූලාන් මෙන්ම, සර්වෝදයට අලුතෙන් එක් වී රාවය සඟරාව ආරම්භ කළ වික්ටර් අයිවන් මහතා ආදි වූ ප්‍රබල චරිත එකම අරමුණක් දෙසට ගමන් කරවීම එතරම් පහසු කාර්යයක් නොවීය. ඒ හැම දෙනාම බලාපොරොත්තු වූයේ ඔවුන්ගේ මතයට පමණක් මා නම්මවා ගැනීම ය. මට සිදුවූයේ සර්වෝදය සංසදයේ අනාගත පැවැත්ම සහ වර්ධනය අරමුණු කරගෙන, මේ හැමදෙනාම එක්සත් කර ඉදිරියට ගමන් කරවීම ය. මේ හැම දෙනෙක්ම මා පෞද්ගලිකව මුණගැසී විවිධ උපදෙස් ගත් අතර, හැමෝම මට කීකරු වූහ. තවත් අංශ රාශියක්ම පිළිබඳව මට සෙවීමට තිබුණු නිසාත් නිතරම සර්වෝදය අදාළ විදේශීය කටයුතුවලට මට රටින් බැහැරව යන්නට සිදුවූ නිසාත්, මේ අය අතරේ මෙන්ම, දිස්ත්‍රික් බාරව වැඩ කළ අය අතරේ ද, ඇති වූ විවිධ මතභේද සමනය කිරීමට කිසිම වැඩිහිටියෙකු නොවීය.

මාතර දිස්ත්‍රික්කය බාරව කටයුතු කළ හේවාවිතාරණ මල්ලිගේ ආර්ථික කටයුතු දූලාන් මල්ලීගේ අධීක්ෂණය යටතේ කිරීමට ඔහු කිසි සේත් එකඟ නොවීය. විශ්ව ලේඛා ආයතනය ව්‍යවසාය සේවා අංශය යටතට ගැනීමට දූලාන් මල්ලී ගත් ප්‍රයත්නයට කිසි සේත් සුසිරි ද සිල්වා මල්ලී කැමති වූයේ නැත. වික්ටර් අයිවන් මල්ලීට උවමනා කළේ රාවය සඟරාව ඉදිරියට ගෙන යාම මිස, විශ්ව ලේඛා ආයතනයේ හෝ සර්වෝදයේ ඉදිරි පැවැත්ම පිළිබඳ කල්පනා කිරීම නොවේ. මෙවැනි අවුල් සහගත තත්ත්වයකදී, මධ්‍යස්ථව සංගමයේ ප්‍රගතිය මූලික වශයෙන් සලකා අන් අයගේ අදහස්වලට ද ගරු කොට ක්‍රියා කිරීම එතරම් පහසු

කාර්යයක් නොවීය. මෙය වඩාත් අපහසු වූයේ මේ හැම කෙනෙක්ම තමන්ගේ අංශයන් පිළිබඳව වැඩි අවධානය යොමු කරමින්, දක්ෂ ලෙස කටයුතු කිරිම ය. රාවය ඉතාමත්ම ජනප්‍රිය සංවාදශීලී මාසිකය බවට පත් විය. එහෙත් එන්ට එන්ටම රාවය මුද්‍රණය කිරීමට විශ්වලේඛා ආයතනයට ණය වූ මුදල වැඩි විය. මෙය මිලියන තුනකට අධික විය. රාවය කෙලින්ම ආණ්ඩුව විවේචනය කරන ප්‍රධාන මාධ්‍යය වූ නිසා, ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ඇතුළු ආණ්ඩුවේ ප්‍රබලයින් මා සමඟ විරසක වෙමින්, විවිධ බාධා කිරීමට පටන් ගත්හ. එහෙත් ඒවාට මුහුණ දීමට මට ශක්තිය තිබුණේය. ජනාධිපතීතුමා හා අගමැතිතුමා හමුව, රාවය ස්ථාවරය පිළිබඳව ඔවුන්ට කරුණු තේරුම් කර දීමට ද වික්ටර්ට අවස්ථාව ලබා දුනිමි. ප්‍රශ්නය වූයේ විශ්ව ලේඛාවේ සියලුම මූල්‍ය සම්පත් රාවයට යෙදවීමෙන් විශ්ව ලේඛාව වසා දැමීමේ තත්ත්වයක් උද්ගතවීම ය. මේ සඳහා විවිධ පිළියම් යෙදීමට මා ඉවසීමෙන් කටයුතු කළ අතර, ඒ ඉවසීම වික්ටර් අයිවන් මහතාට නො තිබුණේ ය.

ආර්ථික අංශය පිළිබඳව කිවයුත්තේ ද මෙයයි. ඉවසීමෙන් දුලාන් ද සිල්වා මහතාගේ ප්‍රශ්න විසඳීමට මා මහන්සි ගත් අතර, ඔහු ද නො ඉවසිලිමත් විය. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට බලා ගෙන සිටි හර්ෂ කුමාර නවරත්න මහතාට, රාවය පිළිබඳ තීරණාත්මක අවස්ථාවේදී, රාවය විශ්ව ලේඛාවේ මුද්‍රණය නො කිරීමේ තීරණයට සාර්ථකව විධායක මණ්ඩලය යොමු කිරීමට සමත් විය. මනස පමණක් දෙස බලා, හදවත දෙස නො බලා, මිනිසුන් සමඟ වැඩ කිරීමට යාම අතිශය භයානක ක්‍රියාවක් බව මට මේ යුගයේදී ප්‍රත්‍යක්ෂ විය.

දිගටම පාඩු ලබමින් රාවය පවත්වා ගෙන යාමෙන්, විශ්ව ලේඛා මුද්‍රණාලය ගෙන යෑමට නොහැකි විය. මේ නිසා දැනට සතිපතා පුවත්පතක් ලෙස පරිවර්තනය වූ රාවය ඉදිරියට ගෙන යෑමේ වගකීම දුලාන් ප්‍රධාන සීඩ්ස් කමිටුවට බාර දුනිමි. එය හැකි

ඉක්මනින් ස්වාධීන ආයතනයක් බවට පත් කොට, සර්වෝදය සමඟ තිබෙන සම්බන්ධය සම්පූර්ණයෙන් නතර කිරීමට ද දූලාන්ට උපදෙස් දුනිමි. මෙම ක්‍රියාව නිසා වික්ටර් අයිවන් මහතා විසින් 1991.05.13 සහ 1991.06.05 දාතමින් මට තර්ජනාත්මක ලියුම් දෙකක් ම එවා තිබුණි. ඒවායේ සඳහන් වූ පරිදි, රාවය පත්‍රයෙන් මට විශාල ප්‍රහාරයක් එල්ල කරමින්, ඔහු - ඔහුගේ කේන්තිය පිරිමසා ගත්තේ ය. ඔහු මට එවූ පළමු ලිපියට මා යැවූ පිළිතුර මෙන් දයාන්විත පිළිතුරක් ඔහුගේ ප්‍රහාරය පිළිබඳව ද ඔහුට ලියා යවා රාවයත් වික්ටර් අයිවනුත් සමඟ මගේ තිබූ නිල සම්බන්ධය එතැනින් නතර කළෙමි.

අවුරුදු පහකට පෙර එනම් 1986 අප්‍රේල් 4 දා ඔහු විසින් එවූ ලිපියට මා ප්‍රතිචාර දැක්වූවා සේම, අවුරුදු පහකට පසු ඔහු එවූ ලිපියට ද මම උපේක්ෂාසහගතව ප්‍රතිචාර දැක්වීමි. එම ලිපිය පහත දැක්වේ.

වික්ටර් අයිවන් මහතා
කර්තෘ, 'රාවය'
නො. 41 පිරිවෙන පාර,
රත්මලාන.
06.05.91

මා අදරැති අතුල මල්ලී,

ඊයේ රාවයේ පළ වූ ''ඔබේ පාඨකයන් හා අනුග්‍රාහකයන් වෙත'' යන ලිපිය දැක මෙය ලිවීමට සිත් විය.

ඔබ 1986.04.04 දින දරණ ඔබේ ලිපියෙන් යම් ඉල්ලීමක් කළේ ද, ඒ අනුව මා මුණගැසුනු පසු ඔබ 86.04.22 දින යම් යෝජනාවක් කළේ ද, 1990.04.30 දින දක්වා මා ඒ සියලු දේ නිස්සරණධ්‍යාශීව ඔබ වෙනුවෙන් ඉටු කළෙමි.

ඔබ අද අංක එකේ ලේඛකයෙකි. පුවත්පත් කතුවරයෙකි. මිතුරන් අනුග්‍රාහකයින් රැසක් ඇති ප්‍රබල පුද්ගලයෙකි. ඒ ගැන මම අවංකව

සතුටු වී සුබ පතමි. ඔබ, ඔබේ 22.04.86 දිනැති ලිපියෙන් පෝෂණය කිරිමට පැමිණි සර්වෝදයෙන් අති විශාල මුදල් ආයෝජනයක් ඔබත් රාවයත් පෝෂණය කිරිමට මා යෙදවූයේ ඔබටත් වඩා තර්ජන-ගර්ජන මැද්දේ, ඔබටත් ආවරණයක් දෙමිනි.

රාවය සතිපතා පුවත්පතක් වශයෙන් අදත් පාඨකයා අතට යෑම ගැන මම සතුටු වෙමි. මේ සඳහා 'සීඩ්ස්' අංශය අවශ්‍ය අරමුදල් සපයා දී දුලාන් මගින් උදව් වීමි.

මෙයට - සේවයෙන් බැඳි
ඒ.ටී. ආරියරත්න
සභාපති

අතිශයින්ම දක්ෂයකු මෙන්ම, මට බොහෝ කීකරු වූ කෙනෙකු වු දුලාන් ද සිල්වා මහතාගේ තිබූ දුර්වලකමක් නම්, හිටි හැටියේ ඉවසීම ඉක්මවා අන් අයගේ සිත් තැලෙන අන්දමට කතා කිරීමයි. මේ දුර්වලකමින් ඔහු මුදවා ගැනීමට මම බොහෝ මහන්සි ගත්තෙමි. පැත්තක් ගැනීමට නොහැකි තත්ත්වයක සිටි මා, නිතරම මධ්‍යස්ථව කටයුතු කළෙමි. ඒ නිසා ඔහු මා සමඟ ද එන්ට එන්ට ම විරසක විය. මේ අන්දමට කටයුතු කළොත් ඔහුට සාමූහිකව කටයුතු කරන සර්වෝදයෙහි වැඩි කලක් රැඳී සිටීමට නොහැකි වන බව, මම අවබෝධ කර ගෙන සිටියෙමි. ඒ නිසාම ලෝක බැංකුවේ උපදේශකයෙකු වශයෙන් උගැන්ඩාවේ මා කළ සේවාව ඔහුට බාර දී ඔහුගේ අනාගතය සුරක්ෂිත කිරීමට මම ඉටා ගතිමි. අවශ්‍ය අයදුම් පත්‍ර ලෝක බැංකුවෙන් ලබා ගෙන, එහි උපදේශකයෙකු වශයෙන් ලියාපදිංචිවීමට අවශ්‍ය සියළු නිර්දේශයන් මම සම්පූර්ණ කළෙමි. මා සමඟම උගැන්ඩාවට කැඳවා ගෙන ගිය ඔහුට, මා නැවැත්වූ තැන සිට වැඩ කිරීමට අවස්ථාව ලබා දී අවශ්‍ය නිවාඩු ද ලබා දුනිමි.

මේ අතර 1991.07.21 දින පැවැත්වූ විධායක සභාවේදී, සර්වෝදය ඉදිරියට යෑමට නම් අකාර්යක්ෂම, දුර්වල, කිසිම පරිපාලනයක් නොදන්නා විධායක අධ්‍යක්ෂවරයා (සරත් හේවාගම මහතා) අස් විය යුතු බව ඔහු ඉතා රළු භාෂාවෙන් ප්‍රකාශ කළේය.

සෑම විධායක සභිකයෙක් වාගේම, ඔහුගේ කතාවට තදින් දෝෂාරෝපණය කොට කතා කළේය. ඔහු ඒවාට ප්‍රතික්‍රියා කළේ විධායක අධ්‍යක්ෂවරයා පමණක් නොව, සභාපතිවරයා ද (එනම් මම ද) ඉවත් විය යුතු බව ප්‍රකාශ කරමිනි. සර්වෝදයේ ආරම්භයේ සිට සේවය කළ සාමාජිකයෝ ඔහුට පෙරටත් වඩා තදින් දොස් කීහ. මේ සියල්ල ඉතා ඉවසීමෙන් මා අසාගෙන සිටියේ, රජය අපට එරෙහි වී තිබෙන නිසා මෙන්ම, බොහෝ ආධාරක ආයතන ද දුලාන්ට පක්ෂපාතී බැවිනි.

මේ අතර ප්‍රථම වරට 1991 ජූලි මාසයේ දිනක උදේ මම සීඩ්ස් සේවකයින් ද කැඳවා දම්සක් මන්දිරයේදී පවුල් හමුවක් පැවැත්වීමි. දුලාන් ද පැමිණියේය. පැය එකහමාරක් පමණ වැය කරමින් සර්වෝදය පිළිබඳ දීර්ඝ දේශනයක් කළෙමි. ඉන් පසු ඩී.ඒ. පෙරේරා මහතා විසින් සීඩ්ස් ආයතනයේ සේවකයින් පමණක් කැඳවා ගෙන ගොස්, නව ප්‍රධාන විධායකවරු හතර දෙනා යටතේ සේවය බෙදී යන ආකාරය තේරුම් කර දුන්නේය. දුලාන්ගේ ව්‍යාජ වූ ද්‍රෝහී ක්‍රියා කලාපයන් මේ වන විට ඔප්පු වී හමාරය. ඔහුගේම අත් අකුරින් මට විරුද්ධව ජනාධිපතිතුමාට හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ එන්.ජී.ඕ කොමිසමට යවා තිබෙන ලියුම දැක මම මවිතයට පත් වීමි. මෙවැනි ද්‍රෝහීකම් කරමින් කිසිම ලැජ්ජාවක් නොමැතිව, මෙසේ මා ඉදිරියට පැමිණි මේ මිනිසා පුදුමමම පුද්ගලයෙකි.

දුලාන් සමඟ තවදුරටත් කටයුතු කිරීමට නොහැකි බව පවසා ආචාර්ය ධර්මප්‍රිය වෙසුම්පෙරුම සීඩ්ස් කමිටුවේ සභාපතිත්වයෙන් ඉල්ලා අස් විය. 1991 ජූලි 21 වැනිදා දුලාන් ද සිල්වා විධායක මණ්ඩලයෙන් ඉවත් කිරීමට ඒකමතිකව තීරණය වූ අතර, 1991 අගෝස්තු 31 වැනිදා සංගමයේ සාමාජිකත්වයෙන් ද ඔහු ඉවත් කරන ලදී.

* * *

දැන් ප්‍රේමදාස ජනාධිපතිතුමා අපට ප්‍රසිද්ධියේ ම පහර දෙයි . රාජ්‍ය නොවන ආයතන පිරික්සන විලාසයෙන් කොමිසමක් ද පත් කොට තිබේ. මේ කාරණා නිසා ඔහුගේ මතයට මා නම්මවා ගැනීමට පහසු වේ යැයි දෝ සිතූ දුලාන් දිනක් හිටිහැටියේ මගේ කාර්යාලයට කඩා වැදුණේය ''විශ්ව ලේඛා මුද්‍රණාලය'' සීඩ්ස් යටතට දෙනවා ද? නැද්ද? ඔහු මගෙන් ප්‍රශ්න කළේය. ''ස්ථිරවම නැහැ'' යනු මගේ පිළිතුර විය. ''හොඳයි එහෙනම් මම කෙලින්ම යනවා ප්‍රේමදාස මහතා ළඟට මම ජනාධිපති කොමිසම ඉදිරියට යනවා ඔබ ගැන සියලු තොරතුරු හෙළි කරනවා'' දුලාන් මට තර්ජනය කළේය. ''පොඩ්ඩක් ඔහොම ඉන්න දුලාන් මල්ලී'' යැයි පැවසූ මම, කාර්යාලයෙන් පිටතට ගොස් මගේ පෞද්ගලික ලේකම් රෝස් පෙරේරා මහත්මියට පහත සඳහන් අන්දමට ඔහුට නිල ලිපියක් ටයිප් කර ගෙන එන මෙන් දැන්වීමි.

''ඔබ මේ මොහොතේ සිට ඔබේ සේවයෙන් නිදහස් කරමි. ඔබේ සියලු ලියකියවිලි ඔබේ දෙවැනියාට බාර දී, වහාම සර්වෝදය කාර්යාලයෙන් පිටවන්න'' ''මේ ලිපිය අතට දී මම මෙසේ පැවැසීමි. ''දුලාන් මල්ලී දැන් ලේසියි නේ මා ගැන සියල්ල හෙළි කරන්න...ආයුබෝවන්'' ''වචනයක් කතා නොකොට ඔහු කාර්යාලයෙන් පිට වීය''.

සර්වෝදයෙන් පිට වූ පසු, අන් සමහර අය මෙන් දුලාන් සර්වෝදයට හෝ මට කිසි දිනක පිටත දී දොස් කියා නැත. ඒ වෙනුවට මට ආරංචි වූ හැටියට ඔහු සර්වෝදය වර්ණනා කර තිබේ. පසුව ඔහු ආධ්‍යාත්මික පැත්තට නැඹුරු වී සම්පූර්ණ ජීවිත පෙරළියකට භාජනය විය. මා මුණගැසී ඔහු කළ සියලු වරද පිළිගැනීමට තරම් දුලාන් මල්ලී නිහතමානී විය. අප අතර එදා සිට පවතින්නේ හද බැඳි සුහද සම්බන්ධයකි.

කඳුරට සාම පා ගමන
හැටන් සිට ශ්‍රීපාදය දක්වා

සාමය යන්න මිනිසා විසින් දකින්නා වූ කාල්පනික සංකල්පයක සිහිනයක් නොවේ. එය ඔහු විසින් නිරන්තරයෙන් අපේක්ෂා කරන්නා වූ යථාර්තයේ ස්වරූපයකි. එක්දහස් නවසිය අසූතුනේදි ඇති වූ කළු ජූලි ව්‍යසනයේ ප්‍රතිඵලයක් ලෙසට මේ රටේ උදා වූ ශෝචනීය වාතාවරණය හේතු කොට ගෙන එම යථාර්තයේ බලාපොරොත්තු සමග මිනිස් චිත්ත සන්තානයේ දල් වී තිබූ පහන නිවී ගොස් තිබුණි. උතුරු නැගෙනහිර ප්‍රදේශවල පමණක් නොව ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ නුවරඑළිය හැටන් තලවකැලේ මස්කෙළිය නෝර්වුඩ් යන ප්‍රදේශවල ද ජාතිවාදී අරගල තදින් බලපැවැත්වීය. එම ප්‍රදේශයන්හි ජීවත් වූ බහුතරය දෙමළ ජාතිකයින් ඇතුළු වතුකරයේ ජනතාව ඉතා දුක් මහන්සි වී දිවි ගැටගසා ගන්නා අයය. අන්ත දිළිඳු ඔවුන් යුද්ධය නිසා තවත් අසරණ බවට පත්වූ අතර ඔවුනට අහිමි වූ අන්‍යොන්‍ය හිත මිත්‍රකම් සුහදතාවය හා සමගිය සාමය නැවත ගොඩනගා ඔවුන් ගිලගත් ත්‍රාසය, කම්පනය හා තම ඥාති මිත්‍රාදීන්ගේ වියෝවීමේ වේදනාවට සැනසීමක් ලබාදීමට කවුරුන් හෝ විසින් ඉදිරිපත් වී අවංකව කැපවීමෙන් යමක් කළ යුතු කාලය ඒ වන විට එළඹී තිබුණි.

''කාලසාධකය'' යන්න කිසිම පුද්ගලයෙකු වෙනුවෙන් නතර වී බලා සිටින්නේ නැති බැවින් තම ගෙවල් දොරවල් විනාශ වී අවතැන් වී අධික දුක් කන්දරාවන්ට මුහුණ දුන් ඒ වතුකරයේ ප්‍රජාවන් වෙනුවෙන් කඩිනමින් ඉදිරිපත් වී අප විසින් යම් ක්‍රියා මාර්ගයක් ගත යුතු යැයි අපි අධිෂ්ඨාන කර ගතිමු. ඒ වෙනුවෙන් ගත හැකි සැනසිලිදායක ක්‍රියා පටිපාටියක් ලෙස සාම පා ගමන් වැඩ සටහන් සම්පාදනය කරන්නට යෙදුනි. වතුකරයේ ජනතාව අතර සිංහල දෙමළ මුස්ලිම් බර්ගර් විවිධ ජාති ආගම්වලට අයත් ප්‍රජාවන්

සිටින බැවින් ඔවුනතර බිඳී ගිය සාමය යළි ගොඩ නගන්නට හමුදා කඳවුරු පොලිස් මුරපොළවල් වතුවල පිහිටුවීමෙන් කිසිවිටෙක සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගත නොහැක. එක් ජාතියක් විසින් තවත් ජාතියක් යටත් කර ගනිමින් පාලනය කිරීමෙන් හෝ ආයුධ හා වෙනත් බලපුළුවන්කාරකම් යොදවා ඔවුන් පළවා හැරීමෙන් කිසිවිටෙක සාමය උදාවීමවත්, සාධාරණය ඉෂ්ටවීමවත්, සිදුවන්නේ නැත. විවිධ ප්‍රජාවන් අතර සහෝදර හැඟීම ස්ථිරසාර සාමය උදා කිරීමට නම් කළයුතු හොඳම දෙය නම් ඒ සියලුම ජන කොටස් සාර්ථකව සහභාගි කරවා ගත හැකි වෙනයම් විකල්ප මාර්ගයක් යෝජනා කර ක්‍රියාත්මක කිරීමය. ඒ නිසා සාම පා ගමන් සැළසුම් තුළින් මෙම සියලුම ප්‍රදේශවාසී ජනතාව වෙත එම සාම පණිවුඩය ව්‍යාප්ත කිරීමට හැකි විය. තවද වතුකරයේ ජනතාවගෙන් වැඩි කොටසක්ම සාමයට ලැදි උනන්දුවක් දක්වන පිරිසක් වීමෙන් අපගේ සාම ප්‍රයත්නයට ඔවුන් හැම දෙනාගේම පූර්ණ දායකත්වය ලබා ගැනීමට හැකි විය.

මෙවැනි උත්කෘෂ්ට පරමාර්ථ අත්පත් කර ගැනීමේදී නීතිය හා අණසක ඉදිරිපත් කිරීමෙන් ලබාගන්නා ප්‍රතිඵල අල්පය. බලපවත්වා ගත හැක්කේ ද ඉතා කෙටි කාලාන්තරයකට පමණි. කොල්ලකාරී කණ්ඩායම් විසින් ඇති කරනු ලැබූ ප්‍රජා ආතතිය අවම කිරීමටත් ඔවුන් තුළ අපේ ක්‍රියාපටිපාටීන් කෙරෙහි විශ්වාසය තහවුරුවීමටත් අපි අපේ පශ්චාත් අරමුණු පා ගමන් පිටත් වීමට කලින් ජනතාවට පැහැදිලි කළෙමු.

සාම පා ගමනින් අනතුරුව එම ප්‍රදේශයන්හි ගමක් පාසා සාම සමාජ හෙවත් සාම කමිටු පිහිටුවා එමගින් සිංහල හා දෙමළ ප්‍රජාවන්ගේ විනාශ වී ගිය ගෙවල් දොරවල් නැවත අලුත්වැඩියා කිරීමට අප විසින් ආධාර සපයා එම ජනතාව ඒ සඳහා යොමු කර නැවත එම පවුල් පදිංචිකරවීමටත් දෙපක්ෂයේම සංස්කෘතික සුහදතා තහවුරු කිරීමට පුළුල් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත් අපි බලාපොරොත්තු වීමු. ප්‍රජාවන් අතර සමගිය එක්සත්භාවය උදා

කිරීම ඇතුළුව අනෙකුත් පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රජා කණ්ඩායම් යෙදවීමට අප විසින් සැළසුම් කර තිබුණි. එම කටයුතු ඒ අන්දමින්ම පා ගමනින් පසු අප විසින් ඉෂ්ට කරන ලදී.

මධ්‍යම කඳුකරයේ විවිධ ජන කොටස් අතර සමගිය සාමය උදා කිරීමට සර්වෝදය ව්‍යාපාරය මූලිකත්වයෙන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබූ අපේ ප්‍රථම පා ගමන පිටත් වූයේ හැටන් නගරයෙනි. ඒ 1986 මාර්තු 25 වන නවම් පුර පසලොස්වක දින උදෑසන හැටන් පොලිස් ස්ථානයෙන් පිටත් වූ මෙම සාම පා ගමන අවසන් වූයේ ශ්‍රීපාදස්ථානයෙනි. හැටන් තලවකැලේ කොටගල පතන, දික්ඔය, නෝර්වුඩ්, මස්කෙලිය, සාමිමලේ, බගවන්තලාව, නෝර්ටන්, වටවල, ගිනිගත්හේන ආදී ප්‍රදේශ හරහා මෙම සාම පෙරහැර ගමන් කළ අතර එම ප්‍රදේශවල වෙසෙන ද්‍රවිඩ වතු කම්කරුවන් ඇතුළු සිංහල හා අනෙකුත් ජාතීන්ට අයත් සෙසු ජනතාව ද එයට අතරමගදී සහභාගි වූහ. එම නිසා මෙම පා ගමන ශ්‍රීපාද වන්දනාවේ ගිය සාම පෙරහැරක සිරිය ඉසිලීය.

මෙවැනි සාම පා ගමනක් පැවැත්වීමට ප්‍රථමයෙන් තීරණය කරනු ලැබුවේ සර්වෝදය ජාතික සමගි සම්මේලනයේ ද සහභාගිත්වයෙන් සර්වෝදය කුඩාඔය මධ්‍යස්ථානයේ පැවැත්වූ සම්මේලනයකදීය. කඳුකරයේ ජනතාව වෙනුවෙන් ඉක්මනින්ම යම් කර්තව්‍යයක් කිරීමේ අරමුණින් එම සම්මේලනය කැඳවනු ලැබුවේ මධ්‍යම කලාපිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ගාමිණී ගුණවර්ධන මහතා විසිනි. මූලාරම්භයේ සිට අවසානය දක්වා උපරිම දායකත්වය හා ධෛර්යයත් ශක්තියත් අපට ලබාදුන් ගාමිණී ගුණවර්ධන මහතා අපට අමතක කළ නොහැකි හිතවත් මිත්‍රයෙක් වීය. මෙම සත් කාර්යය සඳහා පොලීසියේ සහාය අපට නොමදව ලැබුණ අතර දික්ඔය නගරසභා සභාපති ඊ.ඒ පායෝ මහතාත් අපට සහාය වූ ප්‍රමුඛයෙක් හැටියට සැලකිය යුතුය. සියලු දේශපාලන පක්ෂවල නායකයින්, මහා සංඝරත්නය, අනිකුත් ආගමික පූජකවරුන්, කන්‍යා සොයුරියන්, වෙළඳ සංගම් නියෝජිතයින් ආදී සාමය කැමති සියලුදෙනා හැකි උපරිම දායකත්වය ලබා දුන්හ.

ජාතික කොඩිය ඔසවා පා ගමන ආරම්භ කිරීම
නීතා ආරියරත්න මැතිනිය, ගාමිණී ගුණවර්ධන මහතා,
ප්‍රධාන ආරාධිත අමුත්තන් සමඟ

කඳුකරයේ එතෙක් සිදුවී තිබුණ ශෝකජනක සිද්ධීන් නැවත ඇති නොවීමට වගබලා ගැනීමට මෙහිදී විශේෂ අවධානය යොමු වූ අතර එහි වෙසෙන සියලුම ප්‍රජාවන් අතර සුහදතාවය සහජීවනය ඇති කිරීමට හා සුරක්ෂිතභාවය තහවුරු කරදීමේ පරමාර්ථය මත සර්වෝදය ව්‍යාපාරය වෙනුවෙන් එහි ජයක්‍ම සාක්ෂාත් කර ගැනීමට අපි මුල සිටම අධිෂ්ඨාන කර ගතිමු. එම පහන් සිතිවිලි පෙරදැරි කරගෙන පා ගමන පිටත්වීමට පෙර හැටන් පොලිස් ස්ථානය අභියසදී අපි සාම පහන දැල්වීමු.

විශේෂ දේව පූජාවක්

සාම පහන දැල්වීම

පා ගමනට එක්වූ ජපන් ජාතික භික්ෂූන් වහන්සේලා සමඟ

ගමන අවසානය වන විට දහදාහක පමණ සෙනඟක් අපේක්ෂා කළ අතර ආරම්භයේදී ද හාරදාහක් පමණ දෙනා පැමිණ සිටියහ. වෛද්‍යවරු, හදිසි ගිලන්රථ,පොලිස් නිලධාරීහු පා ගමනට සහභාගි වූහ. ආරම්භයේදී මමත් ගාමිණී ගුණවර්ධන මහතාත් සෙනඟ අමතා කතා කළෙමු. මෙම පා ගමනේ පරමාර්ථය වන්නේ මධ්‍යම පළාතේ ජීවත් වන සියලුම ජාති ආගම්වලට අයත් ප්‍රජාවන්ට අනාගතයේදී සුහදව සමගියෙන් ජීවත්වීමට ආධාර කිරීම බවත් අප මේ ගමන් කරන හැම පියවරක්ම එම අධිෂ්ඨානය පෙරදැරි කරගෙන ඒ ඔස්සේම තබා යායුතු ලෙසට මම ප්‍රකාශ කළෙමි. සමහරු සිතන්නේ ප්‍රචණ්ඩත්වය මර්දනය කළ හැක්කේ ප්‍රචණ්ඩත්වයෙන්ම බවයි. තවත් අය සිතන්නේ ආරක්ෂාව ලබා ගැනීමේ හොඳම ක්‍රමය ආක්‍රමණය බවයි. නමුත් ඒ දෙකම වැරදියි මැරවර බලය පාවිච්චි කිරීමේ තත්ත්වය නිසා ප්‍රචණ්ඩත්වය හට ගෙන ඇතැයි ගාමිණී ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය. පා ගමනේ නායකත්වය ගත් අනෙකුත් අය අතරේ උතුරුමැද පළාතේ වන්නි සමගි පෙරමුණේ

සභාපති පූජ්‍ය සියඹලාගස්වැව විමලසාර හිමිපාණෝ මුස්ලිම් පූජක එස්.එස්.ඒ. සමන් මෞලාවි, ජෝසප් මොරැන්ඩා කතෝලික පූජකතුමා, ශ්‍රීපාද ජපන් සාම චෛත්‍යයේ ඉතෝ හිමි සහ අසාමි හිමියන්, බෞද්ධ භික්ෂූන් වහන්සේලාත් යන මේ සියලුදෙනාත් වගකීමෙන් යුතුව ගමන් කරන ලදී. ජපන් හිමිවරුන් උදෑසනම හැටන්වලට පැමිණ සිටි අතර ඉතෝ හිමියන් බෙරය ගසමින් පෙරහැරේ ඉදිරියෙන්ම ගමන් ගත්තේය. හැටන් නගරයේ සිට සැතපුමක් දුර ගිය විට දික්ඔය හමුවේ එහිදි විශාල පිරිසක් අපට එකතු විය.

එදින හවස්වරුවේ අපි මස්කෙළිය නගරයට සේන්දු වුණෙමු. නගරය එකම හිස් ගොඩක් බවට පත්වී තිබූ අතර නෝර්වුඩ්වලදී පෙරහැරේ මුළු සෙනඟ සංඛ්‍යාව හත්දහසක් පමණ විණ. හැම වේලකටම ආහාරත් තේ පානයත් අවට ප්‍රදේශවාසී පරිත්‍යාගශීලීන්ගෙන්, අතරමග වෙළඳසේවක සමිති,විවිධ ස්වේච්ඡා සේවා සංවිධානවලින් නොඅඩුව ලැබිණ. අපි මස්කෙළියෙන් පිටත්ව, නල්ලතන්නිවලට පැමිණි පසු ප්‍රදේශවාසීන් විසින් ඉමහත් කරුණාවෙන් අපිව පිළිගත්තේය. සර්වෝදයේ ප්‍රධානත්වයෙන් හින්දු මුස්ලිම් ක්‍රිස්තියානි සංවිධාන සමිති සමාගම් CWC, CPWU, LJEWU, NUW ආදියෙන් ද ක්‍රියාකාරී කණ්ඩායම් අතරමගදී පා ගමනට එකතු වීම සතුටට කරුණක් වූවා මෙන්ම, අපගේ ප්‍රයත්නයේ ජයග්‍රාහී බව සංකේතවත් කිරීමක් ද විය. ශ්‍රීපාදයට සේන්දු වන තෙක්ම අතරමග අප විසින් පසු කර පැමිණි සියලුම ප්‍රදේශවල පොලිස් ස්ථාන මගින් අපගේ පෙරහැර වෙත විශේෂ සේවාවන් සලස්වා තිබිණි. හැටන්, මස්කෙළිය, කුඩාඔය, බගවන්තලාව, ගිනිගත්හේන, කිරිමැටිය, ලිඳුල, නෝර්ටන්බ්‍රිජ් යන පළාත්වලින් සෙනඟ රැස්විණ. අතරමග හමුවන බොහොමයක් කෝවිල් පන්සල් දේවස්ථානයන්හිදී පූජා පවත්වා ආශීර්වාද ලබා ගැනීමටත් අපි අමතක කළේ නැත. මහනුවර දළඳා මාලිගාවේ දියවඩන නිලමේතුමා විසින් ද අපේ ගමනට ආශීර්වාද එවා තිබුණ බව කිව යුතුයි. කලබල තිබූ ප්‍රදේශවල ඒ වන විටත් සමගි සමාජ පිහිටුවා තිබූ අතර අපගේ සාම පා ගමනේ සංසිද්ධියත් එයට සමාන

බව එතුමා ප්‍රකාශ කර තිබුණා. පසුගිය දිනවල කරන ලද සමීක්ෂණ මගින් පැහැදිලිවම පෙනී ගිය දෙයක් නම් කළකෝලාහලවලට මැදිවූ පුද්ගලයින් ඇත්තටම පශ්චාත්තාපයන්ට ගොදුරු වී ඇති අතර සාමදාන වීමක් හැම දෙනාටම ඕනෑ වී තිබෙන බවය.



වතුකරයේදී

නුවරඑළියට පැමිණි විට නුවරඑළිය සර්වෝදය සංගමයේ සාමාජිකයින් සමඟ ලංකා වතු කම්කරු සංගමය ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය රතු කොඩි සමිතිය රාජ්‍ය වැවිලි සංස්ථා ආදි සමිති සමාගම්වල විශාල සංඛ්‍යාවක් සහභාගි විය. නුවරඑළිය ප්‍රදේශයෙන් සහකාර පොලිස් අධිකාරී බී.එස්.ආර්.ගුණවර්ධන මහතාත් නුවරඑළිය අතිරේක දිසාපති චන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතාත් සාම පා ගමනට හැකි උපරිම සහයෝගයත් ධෛර්යයත් ශක්තියත් ලබාදුන් අයය. වතුකරයේ වෘත්තීය සමිති සංවිධානවල සහායත් ලැබී තිබුණි. උතුරු නැගෙනහිර දෙමළ මුස්ලිම් ජනතාව සම්පූර්ණ පා ගමනට පැමිණ සහභාගිවීම විශේෂිත සිද්ධියක් විය. අපේ පාගමනේ සෑම රාත්‍රියකම නවාතැන් ගත් ස්ථානයන්හි 'පවුල් හමුව' ඉතා සාර්ථකව පැවැත්විය. සහභාගි වූ හැමදෙනා විසින්ම එම අවස්ථාව ඉතා ආදරයෙන් සෙනෙහසින් පිළිගනු ලැබ සියලුම

ආගමික වතාවත්වලටත් සුහදශීලී සහෝදර හැඟුමින් එක්විණ. ඒ හැම රාත්‍රියකම අප නැවතුන ගම්මානවල ජනතාව අපේ පිරිසත් සමඟ එක් වී පවුල්හමු ආගමික වතාවත් භාවනා ගායනා හැම දෙයටම එක්වූවා සතුට සොම්නස සමසේ බෙදා හදා ගන්නා ලදී.

සාම පා ගමට එකතු වූ පාසල් සිසුන්

සාම පා ගමට එකතු වූ අතිවිශාල ජනකාය

එකමුතුකම ගොඩනගා ජනතාවගේ සමස්ත සමතුලිතභාවය තහවුරු කර ගැන්මට ආගමික නායකයින් තම කණ්ඩායම් සමඟ ගමනට එක්වීම සාමයේ පැවැත්මට විශාල ශක්තියක් වූ බව කිවයුතුයි. සියලු විෂමතා වාදභේද අදහස් එතැනදී විනාශ වී ගියේය. බාල මහලු තරුණ දුර්වල ශක්තිමත් සියලුම දෙනා එකම හදවතින් දයාව කරුණාව පෙරටුකොට ශ්‍රීපාද ස්ථානය කරා පියමං කරනු භක්තිය වර්ධනය කරන දර්ශනයක් බවට එය පත්විණ. එම පාරිශුද්ධ පුද බිමෙහි පිහිටි ශ්‍රී පතුල ලාංඡනය හින්දු බැතිමතුන්ට ශිව දෙවියන්ගේ පතුල් සලකුණය. මුස්ලිම්වරුන්ට මහම්මත්තුමාගේ සියලුම භක්ති විශ්වාසයන් එතැනදි ඒකරාශී වී ඇත. ශ්‍රීපාද මළුව කරා ගොස් තම තමන්ගේ ආගමික විශ්වාසයන් අනුව රටට සාමය පතා පුදපූජා පවත්වා ඒම මෙම ශ්‍රීපාද වන්දනා සාම ගමනේ අධිෂ්ඨානය විය. වතුකරයේ ජනතාව දහස් ගණනින් කල්තියාම පාර දෙපස රොක්වී බලා සිටියහ. සාමයේ සැනසීමේ සුසුම් හෙළමින් ඔව්හු එහි සතුට ප්‍රමෝදය බෙදාගත්හ.

ශ්‍රී පාදස්ථානය කරා

නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීමක යෙදෙන පොලීසිය මෙම අවස්ථාවට දායකත්වය ලබාදුන් අයුරු ද ස්තුති පූර්වකව මතක් කිරීම යුතුකමකි. රටේ ජීවනාලිය සමඟ සැහෙන කාලයක පටන් සැලකිය යුතු මෙහෙවරක යෙදි සිටි ආරක්ෂක හමුදාවන් අපේ පා ගමනේදී මහජනතාව සමඟ සුහද හා මිත්‍රශීලීව කටයුතුවල යෙදීම අපට දැක ගන්නට ලැබීම විශාල සතුටකි. මධ්‍යම පළාතේ පොලිස් සේවාවන් අපගේ පා ගමනට දිගටම මැදිහත් වී උදව් උපකාර හා ශක්තියත් ආරක්ෂක විධිවිධාන මෙන්ම සෙනඟට දිගටම බොහෝ ආහාර පාන ලබා දුන්නේය පසුගිය කාලවලදී උද්ගත වූ ගැටුම්වලදී පොලීසිය කෙරේ ජනතාව තුළ තිබූ බිය අවිශ්වාසය සහිත හැඟීම් එම සිද්ධීන් තුළින් තුරන්වී ගිය බවක් අපි දුටුවෙමු. එම දෙපාර්ශවය අතර තිබූ විරසකභාවය අඩු වූ බවක් පැහැදිලිවම පෙනෙන්නට තිබුණි. පොලිස් නිලධාරීන් ඉතා සමීපව මිශ්‍ර ප්‍රජාව සමඟ ගැටීමෙන් එම දුක්ඛිත ජනතාවගේ හදගැස්ම හොඳින් හඳුනා ගන්නට ඇතැයි සිතිය හැකිය.

ද්‍රවිඩ ජනතාව අපව පිළිගෙන ආදර සංග්‍රහ පවත්වන ලදී. රාත්‍රි 7.00 ට පමණ අපි නල්ලතන්නියට පැමිණියෙමු. එතැන සිට ඉතිරි පැය පහක් තුළදී මළුවට නැංගෙමු. කඳුකරයේ මෙතෙක් නොදුටු ශාන්ති අසිරිය එදා ශ්‍රීපාද මළුව තෙක් විහිදී ගියේය. ජාතිවාදී අඳුරු වළාකුල් පහකරමින් අප සැමදෙනාම ශ්‍රීපාද වන්දනා කර ගතිමු. වාරු නැති අයට වාරු දෙමින් වතුර බෙදමින් වයෝවෘද්ධ අයට ඇප උපස්ථාන කරමින් මහඟු සේවාවක යෙදුන අපේ මෙන්ම වෙනත් ප්‍රදේශවලින් පැමිණි ස්වේච්ඡා සේවකයින් විශේෂයෙන් මතක් කළ යුතුය. නල්ලතන්නියේදී බොහෝ සෙනඟක් අප සමඟ එකතු වී මළුවට පැමිණ සිටින ලදී.

අපගේ සාම පා ගමන නිරීක්ෂණය කළ එක්තරා විදේශික මාධ්‍යවේදියෙකු විසින් පා ගමනට සහභාගි වූ ද්‍රවිඩ ජාතික සාමාජිකාවකගෙන් මෙවැනි ප්‍රශ්නයක් අසා තිබුණි. ශ්‍රී ලංකාව තුළ සිංහල ද්‍රවිඩ ජනතාවන්ට එකට ජීවත් විය හැකි ද? යන්නය. ඇය

විසින් පිළිතුරු දී තිබුණේ සර්වෝදයේදී අපි හැම විටම ඉන්නේ එකටයි. අප ජීවත් වෙන්නේ සහෝදර හැඟීමෙන් විවිධ ජාති ආගම්වලට අයත් ජනතාව සමගි සමාදානයෙන් එලෙස ජීවත්වීම බහු ජාතික හා බහු ආගමික අත්දැකීමකි. එනම් සියලු දුක-සැප සම සේ භුක්ති විඳීමේ උත්කෘෂ්ටභාවයයි. එහි වටිනාකම මිනිය නොහැක. දේශපාලනික හෝ පාක්ෂික නොවන සර්වෝදය දර්ශනයේ අන්තර්ගත වන පොදු මානුෂික ධර්මතාවය ද එයයි සර්වෝදය ව්‍යාපාරයට එහි ක්‍රියාකාරිත්වයන් තුළින් රටේ ජනතාවගේ විශ්වාසය දිනාගත හැකි වූයේ සියලු ප්‍රජාවන් සමාන ලෙස සැලකීමේ එම ප්‍රතිපත්තිය නිසාය.

අපගේ ප්‍රථම කඳුරට සාම පා ගමන් වැඩ සටහනට සහභාගි වූ සැමදෙනාගේ සිත් සතන්හි දැකිය හැකි වූ තෘප්තිමත් බවත් සතුටත් එම මිශ්‍ර ප්‍රජා එකමුතුවෙහි ප්‍රතිඵලයකි. සාම පියවරෙහි ජයග්‍රාහීබවේ සංකේතයකි. විශේෂයෙන් කඳුකරයේ ද්‍රවිඩ ජනතාව මුළු හදවතින්ම එයට ආශීර්වාද කළහ. රටේ සාමය උදා කිරීම වෙනුවෙන් අපේ ප්‍රයත්නයේ හෘදයාංගම කැපවීමත් එයම වූ බැවින් සතුට සාමයේ නැවුම් හැඟීමත් සචේතනික භාවයත් එම ව්‍යායාමය තුළින්ම නිර්මාණය වූවාට කිසිම සැකයක් නැත.

තවද ශ්‍රී ලංකාව තුළ අවිහිංසාවාදී මනෝවිද්‍යාත්මක හා මනෝ පරිසරාත්මක නව පසුබිමක් නිර්මාණය වීමට සර්වෝදයේ මෙම වටිනා කාර්යභාරය ස්ථිර ලෙසින්ම දායක වී ඇති බව විචාරකයෝ පවසති. තවද උතුරු නැගෙනහිර මුස්ලිම් ද්‍රවිඩ ජනතාව නියෝජනය කරමින් අපේ පා ගමනට සහභාගි වී තිබීමෙන් නැවතත් හැම දෙනාටම බියෙන් චකිතයෙන් තොරව එක්ව සිට ගත හැකි නව විශ්වාසයක් ගොඩනැගෙන්නට ඇත. ජනතාව දහස් ගණනින් එකට රැස් කර මෙවැනි දැවැන්ත වැඩ සටහනක් සංවිධානය කර සාර්ථකව නිම කිරීමට සර්වෝදය ව්‍යාපාරය සතු අද්විතීය හැකියාව මාධ්‍යයන් මගින් ප්‍රකාශයට පත් කර තිබුණි. එය එම ශක්තිය සනාථවීමකි. ඒ වගේම රටට ඉතා අවශ්‍ය වූ සාමූහික මානව සංහතියටම හිතකර හා අතිශය වැඩදායක වූ නවීනතම සාමූහික විඥානයක් ද ඉන් බිහි වූ බව සත්‍යයකි.

247

සාගිනි නිවීමේ දායකත්වයට ජාත්‍යන්තර සම්මානයක්
(ඇලන්ෂෝන් ෆයින්ස්ටයින් සම්මානය)

'ඇලන්ෂෝන් ෆයින්ස්ටයින්' ලෝක සාගිනි නිවීමේ වැඩ සටහන මගින් සම්මානයක් ප්‍රදානය කරනු ලැබේ. මෙම වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ අමෙරිකා එක්සත් ජනපදයට අයත් වන රෝඩ්ස් දිවයිනෙහි, ප්‍රෝඩන්ස් නුවර පිහිටි බ්‍රවුන් විශ්ව විද්‍යාලයෙහිය. සාගින්නෙන් පීඩා විඳින ලෝකයේ බහුතර ජනතාවකගේ කුසගිනි නිවීමට අදහස් කරමින්, බ්‍රවුන් විශ්ව විද්‍යාලය මගින් මෙම වැඩ සටහන ආරම්භ කරනු ලැබුවේ 1984 දීය. විශාල ජන සංඛ්‍යාවක් ඒ අන්දමින් කුසගින්නෙන් පෙළීමට සත්‍යය හේතු සාධක සොයා බලා, ඒවා තුරන් කිරීම උදෙසා ඒ හා සම්බන්ධ විවිධ ඉගැන්වීම් හා පර්යේෂණ ද බ්‍රවුන් විශ්ව විද්‍යාලය මගින් සැලසුම් කර තිබුණි.

ලෝක සාගිනි නිවීමේ මෙම වැඩදායී ප්‍රයත්නයන් වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියනයක් පරිත්‍යාග කිරීමට ප්‍රතිඥාවක් දී තිබුණු ඇලන්ෂොන් ෆයින්ස්ටයින් මහතාට කරන ගෞරවයක් ලෙසට එම වැඩ සටහන, ඔහුගේ නමින් පවත්වා ගෙන යනු ලැබේ. එතුමන් ව්‍යාපාරිකයෙකු මෙන්ම මානව හිතවාදී පරිත්‍යාගශීලියෙකි එම අරමුදල භාවිතා කරමින් ඉන් පසු අඛණ්ඩව ගෙන යනු ලැබූ මෙම ඇලන්ෂෝන් ෆයින්ස්ටයින් සම්මාන ප්‍රදානය, බ්‍රවුන් විශ්ව විද්‍යාලය මගින් පිහිටවනු ලැබුවේ 1985 වර්ෂයේදීය.

එහි මුල්ම සම්මානය හිමිකර ගැනීමේ වරප්‍රසාදය හිමිවූයේ මා හටය. ඇලන්ෂෝන් ෆයින්ස්ටයින් සම්මාන ප්‍රදානයේ අභිලාෂය වූයේ ලෝක සාගින්න අඩු කිරීම සහ අනාගතයේදී එය නිවාරණය කරනු වස් ගනු ලබන සුවිශේෂ ව්‍යායාමයන් තුළින්, එවැනි වටිනා

සේවයන්හි නිරත වන පුද්ගලයින්, ආයතන, සංවිධානයන් වෙත මහජන ප්‍රසාදයත්, ජාත්‍යන්තර පිළිගැනීමත් ලබා දීමය. මෙම වැඩ සටහන මහාචාර්ය රොබට් කේට්ස් මහතාගේ (Prof. Robert Kates) මඟ පෙන්වීම යටතේ පවත්වා ගෙන එන ලද ලෝක සාගිනි ගැටළුව සඳහා දීර්ඝකාලීන විසඳුම් සෙවීමට මූලික වූ නව අධ්‍යයන කර්තව්‍යයකට අයිති වැඩ පිළිවෙලක් ලෙසට සංවිධානය වූවකි.

එවැනි විශ්ව මෙහෙවරක් නොකඩවා ක්‍රියාත්මක කර ගැනීම සඳහා ලෝකවාසී ජනතාව ධෛර්යවත් කර, සාගිනි වැළැක්වීමටත් සාගින්න යන්න හා එය ඇති වීමට හේතු සහ එය වැළැක්විය හැකි ක්‍රියා මාර්ග හඳුනා ගැනීමටත් ජනතා මට්ටමින් හෝ විද්‍යාත්මකව හෝ පුරෝගාමී වෙමින් සාගින්න අඩු කිරීම හා නිවාරණය කිරීමට උචිතතම මාර්ග පාදමින්, දිගු කාලාන්තරයක් තිස්සේ වෙහෙස වීමේ ප්‍රතිඵලයක් ලෙස ලොව සාගින්නේ පෙළෙන්නන්ගේ සංඛ්‍යාව පහත හෙළීමට සමත්වූ පුද්ගලයින් හා සංවිධාන හඳුනා ගැනීමට හා එවැනි අයට මෙම සම්මානය පුද කිරීමෙන් ගෞරව කිරීම මෙහිදී මූලික අරමුණ විය. එහිදී ප්‍රදානය කෙරෙන මුදල ඇමරිකානු ඩොලර් විසිදහසකි. ලංකාවේ මුදලින් රුපියල් හැත්තෑ දහසක් වේ. බ්‍රවුන් විශ්ව විද්‍යාලයීය සමීක්ෂණ කණ්ඩායම විසින් සුදුස්සන් තේරීමට අතරමැදි වී ක්‍රියා කළ හැකි නාම යෝජනාකරුවන්ගෙන් යුත් මණ්ඩලයක් සංවිධානය කරනු ලැබූ අතර ඒ අය විසින් තම රටවල් හා ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින්ගේ නාම යෝජනා ඉදිරිපත් කිරීමට නියමිත විය.

අදාළ ක්ෂෙත්‍රය හා ඒ සම්බන්ධ ක්‍රියාකාරිත්වය පිළිබඳ මනා දැනුවත්කම හා නිපුනත්වය ඇති අය ලොව නන් දෙසින් මෙම කර්තව්‍යයට සහභාගි කරවනු ලැබුහ. සාගිනි නිවීමේ පදනමෙහි හොවඩ් මහතා විසින් කරන ලද ආරාධනය මම ද පිළිගතිමි. සම්මානය සඳහා ලෝකයේ සෑම ප්‍රදේශයකින්ම නාම යෝජනා ලැබී තිබුණද, මෙම සම්මානය සඳහා මා තෝරා පත් කර ගැන්මට

විශේෂයෙන්ම ඉවහල් වී තිබුණේ, මාලි රටේ අප සර්වෝදයේ මැදිහත්වීමෙන් ඉතා සාර්ථකව ඉෂ්ට කරනු ලැබූ 'සිල්කා ව්‍යාපෘතියයි'. හාමතින් දුගී බවින් පෙළෙන අප්‍රිකානු ජනතාව වෙනුවෙන් අප විසින් මහත් කැප වීමෙන් ක්‍රියාත්මක කළ සිල්කා ව්‍යාපෘතිය වෙනුවෙන් මාලි රාජ්‍යය විසින් පිරිනමනු ලබන උසස්තම සම්මානය එහි ගොස් සේවයේ යෙදුන සර්වෝදය යුවළට පිරිනමනු ලැබීම ද අපට මහත් ශක්තියක් මෙන්ම, සඳහන් කිරීමට තරම් වැදගත් කරුණක් ද වේ.

1986 වර්ෂයේ ඔක්තෝම්බර් මස 16 සහ17 දිනවලදී පවත්වනු ලැබූ විශේෂ උත්සවයකදී 'ඇලන්ෂෝන් ෆයින්ස්ටයින් සම්මානය' බ්‍රවුන් විශ්ව විද්‍යාලයේදී මා වෙත පිරිනමනු ලැබිණි. ඔක්තෝම්බර් මස 16 වන දිනය ලෝක ආහාර දිනය වූයෙන් එය තවත් වැදගත් සිද්ධියක් ලෙස කැපී පෙනුණ අතර, ලෝකයේ සෑම තැනම ආහාර වැඩ සටහන් පවත්වමින් සිටියහ.

උත්සව අවස්ථාවට සහභාගි වූ සම්භාවනීය අමුත්තන්ගෙන් ශාලාව පිරී තිබුණි. ප්‍රොවිඩන්ස් නගරයෙන් ආරාධිත විශේෂ අමුත්තන් 200 ක් පමණ ද රාජ්‍ය ආයතන විශ්ව විද්‍යාලවලින් පැමිණි නියෝජිතයින් හා ෆෙඩරල් නිලධාරීන් ද බ්‍රවුන් විශ්ව විද්‍යාලයේ උසස් නිලධාරීන් විවිධ ජාතික හා පෞද්ගලික සංවිධානවල නියෝජිතයින් මාධ්‍ය නියෝජිතයින් එම අමුත්තන් අතර සිටි බව දැන ගන්නට ලැබුණි.

'ලෝක සාගින්න' යන මාතෘකාව යටතේ මිනිත්තු 15 ක දේශනයක් මා සඳහා වෙන්වී තිබුණි. බ්‍රවුන් විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා මගේ අත්දැකීම් සහිතව වෙනම දේශනයක් පැවැත්වීමට පසුදින 17 වැනිදා සංවිධානය කර තිබුණි. 16 වන දා රාත්‍රියේ උත්කර්ෂවත් ලෙස සම්මාන ප්‍රදානය හා රාත්‍රී භෝජන සංග්‍රහය පැවැත්වුණි. මගේ ගමන් වියදම් සහ අනෙකුත් අනුග්‍රහය ලෝක සාගිනි වැඩ සටහන මගිනි.

''ඇලන්ෂෝන් ෆයින්ස්ටයින් ලෝක සාගිනි නිවීමේ සම්මානය'' මට ලැබෙන්නට යන වග මාධ්‍ය හරහා ප්‍රසිද්ධවීමෙන් පසු, මගේ හිතමිත්‍ර ඥාතීන් බොහෝ දෙනා ඔවුන්ගේ හෘදයාංගම ආශීර්වාදය පිරිනමමින් ලියුම් හා දුරකතන මගින් මට පණිවුඩ එවන්නට යෙදුණහ. ඇතැමෙක් එම ආරංචියට ප්‍රතිචාර දැක්වූයේ ඊට වෙනස් ආකාරයකටය. එය ඉවසා සිටිය නොහැකිව එය සමච්චලයට හා උපහාසයට භාජනය කරමින් පත්තරවල කාටුන් පළ කළහ. (1986 අගෝස්තු 30 දින ඇත්ත පුවත්පත) ඇත්ත පත්‍රයේ පළ කර තිබූ එවැනි කාටුන් චිත්‍රයක ඇඳ තිබුණේ රෝස් කරන ලද කුකුළෙක් මාළු පීරිසියක් සහිත කෑම පිරි මේසයක ලොකු බත් පිඟානක් බුදිමින් කුකුල් මස් ගාතයක් හප හපා සිටින මා පිළිබඳ



1996 අගෝස්තු 30 - ඇත්ත

චිත්‍රයකි. එහි අනික් පැත්තේ ඇඳ තිබුණේ විශාල තෑගි පෙට්ටියක් උස්සාගෙන ගෙය දොරකඩ සිටගෙන, මා එනතුරු බලා සිටින මහත්මයෙකි. ''පොඩ්ඩක් ඔහොම ඉන්න සෑර් මහත්තයා කුසගින්න දුරු කරනවා'' යි දොරකඩට විත් මගේ සේවකයා ඔහුට කියයි.

එක් මිනිසෙකුගේ කුසගින්න නිවීම කෙතරම් ශ්‍රේෂ්ඨ ක්‍රියාවක්ද? ඔවුනට එය තේරුම් ගැනීමට නොහැකිව, ලෝක සාගිනි නිවීම යනු කුමක් දැයි තේරුම් ගත හැකිවේද? සුභවාදී දේ ඒ විදියටම දකින්නටත්, කලාතුරකින් කෙනෙකුට පමණක් ඉෂ්ට කළ හැකි මෙවැනි සත් ක්‍රියාවන්හි සතුට ප්‍රීතිය වින්දනය කිරීමට බෙදාහදා ගැනීමට හෝ එහි ආදර්ශය තේරුම් ගැනීමටත් පුළුවන්කමක් තිබෙන්නේ එක්තරා මනුෂ්‍යයන් කොටසකට පමණකි.

ලෝක සාගිනි වැඩ සටහනෙහි පරමාර්ථය වූයේ ද එවැනි කාර්යයන් ආදර්ශයට ගෙන සෑම පුද්ගලයෙකු විසින් තමන්ට හැකි පමණින් අන්‍යයන්ගේ කුසගිනි නිවීමට උත්සාහ කිරීමට පෙළඹවීමය යහපත් දෙය අවමානයට ලක් කිරීමට පුරුදුව සිටින කාටූන් කැලෑ පත්තර ඒ සඳහා යොදා ගන්නා ජීවිතයේ යථාර්ථය යන්න කවදාවත් තේරුම් ගැනීමට හැකි වේද? ඊට ප්‍රතිවිරුද්ධ පැත්තේ සිටි හිතමිතුරන් අතරින් අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතාත් එවකට ආරක්ෂක අමාත්‍යාංශය බාරව සිටි ලලිත් ඇතුලත්මුදලි මහතාත් ගැන සඳහන් කිරීම වැදගත්ය. ඒවා ඉහත කී කාටූන්වලට හාත්පසින්ම වෙනස් වූ අවංක සුභාශිංසනයන්ය.

මා කර්කශ උපහාසයට භාජනය කළ කාටූන් චිත්‍ර ශිල්පී යුනුස් මහතාගේ කාටූන් ප්‍රදර්ශනයක් පසු කලක කොළඹදී පැවැත්වීය. මගෙන් කළ ඉල්ලීමක් අනුව එහි සම්පූර්ණ බර පැන දැරුවේ සර්වෝදයෙනි.

ඇලන්ෂෝන් ෆයින්ස්ටයින් සම්මානය ලැබීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මා වෙත එවන ලද ලිපිය සහ මා යැවූ පිළිතුරු ලිපිය මෙසේයː

මගේ අංකය: අග්‍රා/01/1/86.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

1986 අගෝස්තු 30 දින.

හිතවත් ආචාර්ය ඒ.ටී.ආරියරත්න මහතාණනි,

ලෝක සාගිනි නිවාරණය කිරීමට කරනලද සුවිශේෂ සේවය සඳහා ඇමරිකාවේ රෝඩ් දිවයිනෙහි ප්‍රොවිඩන්ස් නුවර බ්‍රවුන් විශ්ව විද්‍යාලය මඟින් පිහිටුවන ලද "ඇලන් ෂෝන් ෆයින්ස්ටයින්" සම්මානයේ ප්‍රථම සම්මාන ලාභියා වශයෙන් ඔබ තෝරාගත් පුවත අසා මම සාතිශය ප්‍රීතියට පත්වූයෙමි. ලෝකයා ගේ හිතසුව පිණිස නිරතුරු ව සිතන්නටත්, ඒ යහපත් සිතිවිලි ක්‍රියාත්මක කර ඒ තුළින් නිරාමිෂ ප්‍රීතියක් අත්කර ගැනීමටත් ඔබ ආභාෂය ලබා ඇත්තේ සම්බුදුරජාණන් වහන්සේගෙන් බව මම දනිමි. මෙරමා ශාන්තිය සඳහා නොව, ආත්ම තෘප්තිය සඳහා ම නිරතුරු ව වෙහෙසන මිනිසුනගෙන් පිරි ලෝකයට ඔබ වැන්නෝ දුර්ලභයෝ ය.

ජාත්‍යන්තර මැක්සයිසේ සම්මානය හා බෝඩුවින් රාජ්‍ය සම්මානයත්, මේ රටේ ඉහළ ම සම්මානත් දිනා ඇති ඔබ මේ ලද නව සම්මානය නිසා තවතවත් නිහතමානිත්වයට පත් ව, ජනතා සේවයට වැඩිවැඩියෙන් කැපවනු නොඅනුමානය.

ඔබ අපේ රටට සම්මානයකි. අපි ඔබ ගැන ආඩම්බර වෙමු. මුදු තෙපුල් තෙපලන, සංවර ඉන්ද්‍රියයන්ගෙන් දකින්නන් පිනවන, යහපත් චේතනා හා යහපත් ක්‍රියා ඇති ඔබ ගේ සමව්‍යායාමය දිනෙන් දින ලෝක ව්‍යාප්තියට පත්වනු දකිනු රිසිමි. ඔබගේ අනාගත අභිප්‍රායන් සහ පොදු ජන යහපත සඳහා දියත් කරන වැඩපිළිවෙලවල් සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනය කරමි.

සැපවේවා !

මෙයට,
හිතවත්,

අ ග්‍රා මා ත්‍ය

ආචාර්ය ඒ.ටී.ආරියරත්න මහතා,
77, "දම්සක් මන්දිරය",
ද සොයිසා පාර,
මොරටුව.

ඒ.ටී.ආරියරත්න

☎ 507084
505255
507159
507194

මෙදන්
10අ රවතාවත්ත පාර
මොරටුව

......05..09..... 1986

ගරු ආර්.ප්‍රේමදාස මැතිතුමා,
අග්‍රාමාත්‍ය,
ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය කාර්යාලය,
කොළඹ.

තෙරුවන් සරණයි!

මා ආදරණීය අගමැතිතුමනි;

"ඇලන් ෂෝන් පයින්ස්ටයින්ස්" සම්මානය ලැබීම පිළිබඳව ඔබතුමන් විසින් එවුනු කාරුණික සුභාශිංසන පණිවුඩය කෘතඥතා පූර්වකව බාර ගනිමි. ඒ පණිවුඩයෙන් ප්‍රකාශිත ලයාන්විත හැඟීම් තව දුරටත් නිහතමානීව ලෝ සේවයට කැපවීමට ලැබුණු ධෛර්යයක් කොට සලකන අතර ඒ ලිපියෙන් උද්දීපනය වූ ඔබතුමන්ගේ ශ්‍රේෂ්ඨ පෞරුෂාංග පිළිබඳ වඩාත්ම සතුටට පත්වෙමි.

අප සමාජය පත්ව ඇති අතිශයින්ම ශෝචනීය වූ තත්ත්වයෙන් මුදා ගෙන අප තෝරා ගත් සාරධර්ම සහ ක්‍රියාමාර්ගයන් තුළින් පොදු ජාතික පරමාදර්ශයක් වෙතට ගමන් කිරීමට අදිටන් කර ගනිමු. එහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ අපේ රට ඇය සමය ලෝක සමාජයේ සාමය, සාධාරණත්වය සහ ජනතා පරමාධිපත්‍යය පිළිබිඹුවන ජගත් කේන්ද්‍රස්ථානය බවට නැවත පත් කිරීමයි.

මේ පරමාදර්ශය ඉටු කර ගැනීමට ඔබතුමාගෙන් ඉටු විය යුතු ලෝක සේවය සිදු කිරීම සඳහා තෙරුවන් සරණ සහ සම්‍යක් දෘෂ්ටික දෙවියන්ගේ ආශිර්වාදය ලැබේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

මෙයට - සේවයෙන් බැඳි,

ඒ.ටී.ආරියරත්න.

ජාතික ආරක්ෂක ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා විසින් එවන්නට යෙදුන සුභපැතුම් පණිවුඩය:

ජාතික ආරක්ෂක ඇමැති සහ
ආරක්ෂක උප ඇමැති
ලලිත් ඇතුලත්මුදලි PC.MP.

සැප්තැම්බර් 01 දින 1986

ආදර ආරි,

ඇමරිකාවේ රෝඩ් දිවයිනෙහි බ්‍රවුන් විශ්ව විද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලැබූ ප්‍රථම ලෝක සාගිනි නිවීමේ සම්මානය ඔබට ප්‍රදානය කිරීම පිළිබඳව මගේ සුභපැතුම් කරුණාවෙන් පිළිගනු මැනවි. ඔබ ලත් මෙම ජයග්‍රහණය ලෝකයේ වඩාත්ම වැදගත් අවශ්‍යතාවය වන සාගිනි නිවීමේ හා වැළැක්වීමේ මෙහෙවර වෙනුවෙන් ඔබතුමාගෙන් ලැබුණු අසහාය දායකත්වය සඳහා පුදන ලද කාලෝචිත පිළිගැනීමකි. තවද ශ්‍රී ලංකාවාසීන් වන අප සියලුදෙනාටම එය ආඩම්බරයකි.

ඔබට ලැබුණ මුදල් සාමය හා සංවර්ධන ප්‍රයත්නයන් සඳහා වැය කිරීමට ගත් තීරණය ඇත්තෙන්ම ප්‍රශංසනීයය. අනාගත සියලු කාර්යයන් සඳහා මා ඔබට සුභ ප්‍රාර්ථනා කරමි.

ඔබට විශ්වාසී,

ලලිත් ඇතුලත්මුදලි පා.ම.
ජාතික ආරක්ෂක ඇමැති සහ
ආරක්ෂක උප ඇමැති

ලලිත් ඇතුලත්මුදලි මහතාට ද පිළිතුරු ලිපියක් යැව්වෙමි. එය මෙසේය:

1986 සැප්තැම්බර් 8 දින

ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා,
ජාතික ආරක්ෂක ඇමති,
7 වන මහල රක්ෂණ මන්දිරය,
21 වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

මා අදරැති ගරු ඇමැතිතුමනි,

ඔබතුමා විසින් රට-දැය වෙනුවෙන් ඉටු කෙරෙන මහඟු සේවාවන්ට ස්තුති ප්‍රශංසා කරන අතර යම් අවස්ථාවක් පැන නැගුණහොත් ඔබට අවශ්‍ය ඕනෑම විදියක සහයෝගයක් ලබාදීමට මා ඇතුළු සර්වෝදය පවුලේ සියලුදෙනාම සූදානම්ව සිටින බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

මෙම සම්මානයෙන් මා වෙත පරිත්‍යාග කළ සියලු මුදල් හැම දෙනාගේම ශුභසිද්ධිය සඳහා අප ව්‍යාපාරයට පරිත්‍යාග කළෙමි.

ඒ.ටී. ආරියරත්න
සභාපති

248

සිංගප්පූරුවේදී මුණගැසුන හිතවතුන්

දිනය 1986 නොවැම්බර් 17 වැනිදාය. සිංගප්පූරුවේ පැවැත්වෙන සංවර්ධන සන්නිවේදන කාර්යය සැසියක් සඳහා පිටත් වීමට දැන් මම එයාර් ලංකා අංක 312 දරණ ගුවන් යානයේ වාඩි වී සිටිමි. පෙරවරු එකයි කාලට මේ යානය පිටත් වේ දැන් අප සිටින්නේ ගුවනේය.

ඊයේ සවස නීතා එංගලන්තය බලා ගියාය. ඊට හේතුව චාරිකා සමඟ ඇගේ සිඟිති පුතු ජනන්ත බලා ගැනීමට යෑමට සිටි උදව්කාරියට බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයෙන් වීසා බලපත්‍රයක් නොදීමය. ඊට හේතු දක්වා ඇත්තේ ඇය ජනාධිපතිතුමාගේ සහෝදරයකුගේ ගෙදර මාසයක් සේවය කළ බවට ඔහුගේ බෑනනු කෙනෙකු ඔවුනට දන්වා තිබීමය. මෙය අමූලික බොරුවකි. මේරි හෙවත් දනවති වත්තගේ මෙනවිය අපේ නිවසේ හැර වෙන කොතැනකවත් සේවය කර නැත. ජූලි මාසයේ මුල සිටම මේ ගැන අප ක්‍රියා කළ අතර තවම විසඳුමක් නැත. ගිය සතියේ මහ කොමසාරිස් තැන්පත් ජේම්ස් ස්ටුවර්ට් මහතා හමුව කරුණු පැහැදිලි කර දුන්නෙමු. අද උදේ ද ගුවන් තොටුපළට එන ගමන් එතුමා හමුවීමි. එය කන්නන්ගර නැමැති අයකු විසින් කරන ලද බොරුවක ප්‍රතිඵලයකි. ඔහු විසින් බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය රවටා තිබේ. මේ නිසා අපට මෙතෙක් සිදුවී ඇති කරදරය ඉමහත්ය.

කාර්ය සැසිය 22 දා හමාර විය. අද සවස සිය රට බලා ආපසු යන්නෙමි. සංවර්ධන සන්නිවේදනය සංවර්ධන ආධාරක සන්නිවේදනය යන විෂයයන් පිළිබඳ ලෝකයේ විවිධ විශේෂඥයන්ගේ දේශනවලට කන් දීමට ලැබීම ඔවුන් පෞද්ගලිකව

දැන හැඳින ගැනීමට ලැබීම සහ මගේ දේශනය සහ සාකච්ඡා තුළින් සර්වෝදය පිළිබඳ ඔවුනට අවබෝධයක් දීමට ලැබීම මේ කාර්ය සැසියට සහභාගිවීමෙන් ලත් ප්‍රයෝජනය හැටියට සලකමි.

කලකට පසු නෙවිල් ජයවීර මහතා හමු විය. ඔහු ප්‍රධාන දේශනය පැවැත්වූවේය. දැනට ඒ මහතා එංගලන්තයේ ලෝක ක්‍රිස්තියානි සන්නිවේදන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයෙකි. ඔහු යාපනයේ සහ වවුනියාවේ දිසාපති හැටියට කටයුතු කරන කාලයේදීත් ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හැටියට සේවය කරන කාලයේත් ඔහු හා ළඟින් ආශ්‍රය කළෙමි. යාපනයේ 1964 දී පැවැත්වූ සර්වෝදය ශ්‍රමදාන කඳවුරේ වැඩට ඔහු ක්‍රියාකාරීව සහභාගි විය. 1971 කැරැල්ලට මාස කිහිපයකට පෙර ඔහු මා වවුනියාවට කැඳවා නගර ශාලාවේදී විශාල රැස්වීමක් ඇමතීමට මට අවස්ථාව සලසා දුන්නේය. බොහෝ රජයේ නිලධාරීන් ඒ අවස්ථාවේ හැංගෙද්දී ඔහු ජීවිතය පරදුවට තබා නීතිය හා සාමය රැකීමට පොලීසිය ද සමඟ පෙරමුණ ගත්තේය ඉන් පසු ඔහු මට දින කිහිපයක් එක දිගට ඇසුරු කිරීමට හමු වූයේ මේ සමුළුවේදීය.

සමුළුවට පැමිණ සිටි තවත් අයෙක් නම් ආචාර්ය සරත් අමුණුගම මහතාය. ඔහු දැනට 'වර්ල්ඩ් වීව් ඉන්ටර්නැෂනල්' ආයතනයේ සම මහ ලේකම්වරයාය. 1972 දී ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා අපට කරදර කරන කාලයේ දී ඔහු ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන් ටික කලක් සේවය කළේය. ඒ දිනවල ඔහු අපට කළ උදව්වක් මට මතකය. නෙදර්ලන්ත රජය මගින් 'නොවීබ්' ආයතනය හරහා අපට දුන් ආධාරයක් සඳහා රජයේ අනුමැතිය අපට අවශ්‍ය විය. ඇමතිවරයාගෙන් නම් එය නො ලැබෙන බවට අපට සැකයෙක් තිබුණේ නැත. ඒ නිසා ධර්ම ගුණසිංහ මහතා ලවා සරත් අමුණුගම මහතා මුණ ගැසී එම ලිපිය මම ලබා ගතිමි. මෙවැනි රජයේ සේවකයින් ඉතා විරලය. එදත් අදත් මම සරත්ට බොහෝ ප්‍රිය කරමි. මේ සමුළුවේදී ද ඔහු කළ දේශනය

මගේ සිත් ගත්තේය. මේ කාර්ය සැසිය සඳහා ලංකාවෙන් පැමිණි තවත් දෙදෙනෙක් 'වර්ල්ඩ් වීව් ඉන්ටනැෂනල්' ආයතනයේ අධ්‍යක්ෂ නිකහැටිය මහතා සහ 'රූපවාහිනියේ' අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අනුර ගුණසේකර මහතාය. මේ අයගේ දස්කම් දකින විට කල්පනා වන්නේ හොඳ දේශපාලන ක්‍රමයක් අප රටේ තිබේ නම්, මේ අයගෙන් කෙතරම් විශාල ජාතික සේවයක් ගත හැකි ද යන්නයි.

එංගලන්තයෙන් පැමිණ සිටි ජේම්ස් හැලොවන් මහාචාර්යතුමා, අමෙරිකාවේ ටෙම්පල් විශ්ව විද්‍යාලයෙන් පැමිණ සිටි මහාචාර්ය ජෝන් ලෙන්ට් මහතා, පිලිපීන විශ්ව විද්‍යාලයෙන් පැමිණ සිටි මහාචාරිනී නෝරා කබ්රාල් මැතිනිය සහ ඉන්දියාවෙන් පැමිණ සිටි මහාචාර්යවරුන්ගේ දේශන හා අදහස් ප්‍රකාශනවලින් මම බොහෝ දේ ඉගෙන ගතිමි.

ලෝකයේ මා යන බොහෝ රටවල මාගේ ශ්‍රී ලාංකික නෑදෑ හිතවත්තු සිටිති. එහෙත් කැනඩාවේ සිටින විනීතා හා වජිරා නංගිලාගේ ගෙදර හැරුණු විට, කිසිම ශ්‍රී ලාංකික නිවෙසක රැයක් හෝ ගත කරන්නේ නැත. එහෙත් මහින්ද සහ තිලානි තේනබදු පවුල විශේෂය. සිංගප්පූරුවට පැමිණෙන හැම අවස්ථාවකම ඔවුහු ගුවන් තොටුපළේදී මුණගැසී මා ගෙදරට කැඳවා ගෙන යති. කුඩා දියණියන් ද මා හා මිත්‍ර නිසා, මා මෙහි පැමිණෙන්නේ ඉතා සතුටිනි. මෙවර මට ඇරයුම් කළ ආයතනයෙන්, රෝයල් හෝටලයට ගෙවා මට කාමරයක් වෙන් කර තිබෙද්දීත්, මොවුන්ගේ ආරාධනයෙන් මම මෙහි නතර වී සිට, ඔවුන්ගේ ආගන්තුක සත්කාර වින්දෙමි. තිලානි නංගී කරවිල, නෙළුම් අල, විවිධ පලා වර්ග, කොළ වර්ග, සුදුළූණු ආදිය සොයා ගෙන උයා මට ආදරයෙන් සංග්‍රහ කළාය. මට දියවැඩියා රෝගය තිබෙන බව දන්නා නිසා, මෙසේ මහන්සි වී විශේෂ ආහාර පිළියෙල කර දෙයි. මට වෙද කෑම දෙන නිසා .වෙද හාමිනේ. යැයි ඇයට විහිළු කළෙමි. මොවුන්ගේ ආගන්තුක සත්කාරවලට ප්‍රති සත්කාර කිරීමට කවදා හෝ මටත් අවස්ථාවක් ලැබේ යැයි සිතමි.

සිංගප්පූරුවේ පුරවැසියන් හැටියට ස්ථිරව පදිංචිව සිටින මාගේ ඉතාමත්ම කල්‍යාණ මිත්‍රයෙකි, ජැම්ෂෙඩ් පොස්ඩා මහතා. ඔහුත්, ඔහුගේ මැතිනිය පාර්වතීත් මට සලකන්නේ තමන්ගේම සහෝදරයෙක් විලසටය. මහින්දගේ ගෙදර හැරුණු විට, සිංගප්පූරුවේ මා නවතින විකල්පීය පවුල පොස්ඩා පවුලයි. ඔවුන්ගේ ළමයින් විවාහ වී විවිධ රටවල ජීවත් වන නිසා, මේ දෙපළ පමණක් එහි ජීවත් වෙති. ජැම්ෂෙඩ් පොස්ඩා මහතා බහායි ආගමේ ප්‍රබල නායකයෙකි. විද්‍යුත් ඉංජිනේරුවෙකු වූ ඔහු, පළමු පෙළේ දාර්ශනිකයෙක් ද වේ. ඔහු විසින් බුදුන් වහන්සේ සහ බහායි ආගම පිළිබඳ පොත් විශාල සංඛ්‍යාවක් ලියා පළ කර තිබේ.

පාර්වතී, පොස්ඩා යුවළ සමඟ

පොස්ඩා පාර්වතී යුවල කලක් ලංකාවේ ද වාසය කළේය. මේ යුගයේදී අපේ පවුලත් සමඟ ඉතා කිට්ටු මිත්‍රත්වයක් පැවැත්වූ ඔහු, අප ව්‍යාපාරයේ කටයුතු රැසකටම හවුල් විය. අගමැති ආර්. ප්‍රේමදාස මහතා ලවා සර්වාගමික දිනයක් පවත්වා විශේෂ මුද්දරයක් ද නිකුත් කිරීමට මූලිකව කටයුතු කළේ ජැම්ෂෙඩ් පොස්ඩා මහතාය.

පොස්ඩා පාර්වතී යුවළ නීතා සමඟ

පොස්ඩා පාර්වතී යුවළ සුවසෙත දරුවන් සමඟ

පොස්ඩා පාර්වතී යුවළ විශ්ව නිකේතනයේ

සිංගප්පූරුව හරහා මා කොහි ගියත් අඩු වශයෙන් ගුවන් තොටුපොලේ සිට මොවුන්ට ටෙලිෆෝනයෙන් හෝ කතා කිරීම මගේ සිරිතය.

විශ්ව ධර්ම ශක්තී

1987.05.13 අද වෙසක් පුන් පොහෝ දිනයයි. පසුගිය දින තුන වව්නියාවේ ගත කළ මම ඊයේ රෑ ගත කළේ මාතලේ සර්වෝදය මධ්‍යස්ථානයේය. අද උදේ 7.00 ට නෙරංජන් විජයරත්න දියවඩන නිලමේතුමාගේ ඇරැයුමෙන් මම දළදා මාලිගාවට පැමිණියෙමි. දළදා මාලිගා ප්‍රදේශය බෞද්ධ පූජනීය පෙදෙසක් වශයෙන් නම් කිරීමේ චාම් උත්සවයට මම ද සහභාගි වුනෙමි. මල්වතු පාර්ශවයේ මහා නාහිමියන් වන සිරිමල්වත්තේ ආනන්ද මාහිමිපාණෝ ද, අස්ගිරි පාර්ශවයේ මහා නාහිමියන් වන පලිපානේ චන්ද්‍රානන්ද මාහිමිපාණෝ ද, නෙරංජන් විජයරත්න මහතා හා තිස්ස විජයරත්න මහතා ද මම ද පොල්තෙල් පහන් දැල් වූයෙමු.

දළදා සමිඳුන් වැඳ මිනිත්තු කිහිපයක් භාවනා කොට ආපසු ඒමට පිටත් වීමි. මාලිගාවේ බැතිමතුන් විසිපහකට වඩා නොසිටීම ඉමහත් වේදනාවක් ගෙන දිණි. ගෙදර එන අතරමග කැළණි විහාරයට ද ගොස් වැඳ පුදා ගතිමි. වින්යා ද මා සමඟ මේ දින පහේ චාරිකාවට එක් විය. කැළණි විහාරයේ අතුරු සිදුරු නැතිව බැතිමත්හු පිරී සිටියහ.

මේ දිනවල මගේ සිත වැඩ කරන්නේ ජූනි 3 වැනිදා මහනුවර ශ්‍රී දළදා මාලිගාවෙන් අරඹා මාතලේ අළුවිහාරේ, දඹුල්ල හා මිහින්තලාව හරහා අනුරාධපුර පූජනීය නගරය හරහා පැමිණ ජූනි 11 වනදා උදෙන් නිම වන ආධ්‍යාත්මික ශක්තිය ජනිත කිරීමේ වැඩ පිළිවෙල ගැනයි. මේ ගමන ගියේ ද 9 වනදා මහනුවරදීත්, මාතලේදීත්, 10 වනදා අනුරාධපුරයේදීත් පැවැත්වූ සංවිධාන කමිටු රැස්වීම්වලට සහභාගි වී දෙදිනක් උතුරු පළාත්වල ගත කිරීමටය.

දළදා වැඳ කැළණි එන අතරමගදී 'විශ්ව ශක්තී' ගීතය ලීවෙමි.

ස්වභාව ශක්තී සජීව ශක්තී විශ්ව ධර්ම ශක්තී
මෙත් මුදිතා ගුණ චිත්ත වේග වී
ස්වස්ති සිද්ධි ජයතු //

අහස පොළොව ඉර හඳ තරු තුරු ලිය
දෙව් බඹ මිනිසුන් නගන සවී
හද තුළ එක් වී මහ සවියක් වී
සාම කිරණ ජනනී//

ස්වභාව ශක්තී ...../

සිරි දළදා සිරිමාබෝ රන්වැලි
මහ සෑ මා සමිඳුන් සවියයි
හද තුළ එක් වී මහ සවියක් වී
සාම කිරණ ජනනී//

ස්වභාව ශක්තී...../

තිස්ස මහාරාමය කිරි වෙහෙර ද
මියුගුණ ගිරිහඬු සෑ සවියයි
නාගදීප කැළණිය සිරි සමනළ
ගිරි හිස රැඳි සිරි පා සවියයි
හද තුළ එක් වී මහ සවියක් වී
සාම කිරණ ජනනී//

ස්වභාව ශක්තී...../

1960 දී පමණ අනුරාධපුරය සංරක්ෂණ සමිතිය පිහිටුවා අනුරාධපුර පූජනීය නගරයක් කිරීමේ ව්‍යාපාරයට මුල් පියවර තබන විට එවකට අනුරාධපුර මහ දිසාපතිව සිටි නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ ඇරයුමෙන් මම ද සහභාගි වීමි. එතුමා මා වේදිකාවට කැඳවා ගෙන ගිය සැටිත්, මා දහසක පමණ පිරිසක් සමඟ දෙසැම්බරයේදී පැමිණ ශ්‍රමදානයෙන් පූජනීය නගරය සංරක්ෂණය ඇරඹීමට ඉදිරිපත් වූ සැටිත් එය එසේම සිදුවූ සැටිත් සිතන විට අද

උදේ නෙරංජන් විජයරත්න මහතා සිය පියා මෙන්ම මේ ඇරයුම මට කළ හැටි පුදුම සහගතය.

1956 දී නෙරංජන් දළදා මාලිගාව පිහිටි මහනුවරදී ඉපදෙන විට 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් මම අනුරාධපුරයේ සිල් සමාදන් වී සිටියෙමි. අවුරුදු තිහක් ගිය තැන මහනුවර සිට අනුරාධපුර දක්වා මහා ආධ්‍යාත්මික සතියක් පැවැත්වීමට අපි දෙදෙනා මේ වන විට සංවිධානය කරමින් සිටියෙමු.

පසුදින උදේ අමරදේවයන් සහ සුනිල් සරත් පෙරේරා කැඳවා මම තැනූ ගීතයට තනුවක් දමා ගායනය කොට පටිගත කර දෙන ලෙස පැවැරුවෙමි.

ආධ්‍යාත්මික ශක්තිය සතියක් පුරා

මහනුවර සෙංකඩගල පුරවරයෙහි ශ්‍රී දළදා මාලිගාව අබියස දී අද පස්වරු 1.30 ට ඇරඹෙන ආධ්‍යාත්මික සතිය සඳහා ඊයේ රාත්‍රී මෙහි ආමි. නෙරංජන් විජයරත්න දියවඩන නිලමේතුමාගේ නිවසේ රාත්‍රී නිදා ගතිමි.

ආධ්‍යාත්මික සතිය ශ්‍රී දළදා මාලිගාව අබිසය මහ මළුවෙන් ඇරඹීම සඳහා කොළඹ සිට මහනුවරට එන තුරු අප ආවේ එකම ධාරානිපාත වැස්සක් මැද්දේය. විදුලි කෙටීම් හා අහස ගිගිරීම් නිසා ඉතා සෙමින් රිය පැදවීමට සිදු විය. අරන්තලාවේ හාමුදුරුවරුන් ත්‍රස්තවාදීන් විසින් මරා දැමීම නිසා කලබල ඇතිවේදෝ යි, නැති නම් රජය විසින් ඇඳිරි නීතිය පනවාදෝ යි යන සැකය ද අප තුළ තිබිණි. එහෙත් අප සූදානම් කළ අන්දමටම සක්මන් භාවනා සතිය පැවැත්වීමේ කටයුතු අපි සංවිධානය කරගෙන ගියෙමු.

දවල් 1.00 වන විට විශාල පිරිසක් පෙරහැරවල් කිහිපයකින් දළදා මාලිගාව අබියසට පැමිණ සිටි අතර, සියලු කටයුතු 1.30 ට ඇරඹීමට ලහි ලහියේ සූදානම් වීමු. ගුණපාල සමරනායක මල්ලී,

ප්‍රධාන සංවිධායකයන් ඉතා ශූරව සිය කටයුතු සංවිධානය කර තිබිණ. ඔහු වැනි කීකරු නිහතමානී ගුණගරුක තරුණ පිරිසක් සමඟ සේවය කිරීමට ලැබුණ මා මහත් වාසනාවන්තයෙකැයි විටෙක මට හැඟේ.

එකහමාර වන විට දළදා මාලිගාව අබියස පාරවල් හා මහමළුව වසා සිටි එකම හිස් ගොඩකි. සියල්ලෝම භාවනාවට වාඩි වී සිටියහ. මහනුවර කතෝලික බිෂොප් වියානා ප්‍රනාන්දු අගරදගුරුතුමා ප්‍රධාන පියවරු හා මව්වරු අසූ පහක් පමණ පැමිණ සිටියහ. දියවඩන නිලමේ හා මම ද වේදිකාව පසෙකින් වාඩිවීමු. දළදා මාලිගාවේ තේවාවට අධිපති උඩුවාවල චන්ද්‍රානන්ද නාහිමියෝ පිරිස පන්සිල්හි පිහිටවූහ. එතැන සිට වේදිකාවට නැගි මම පැයක භාවනාව මෙහෙයවීමි. අප විසින් මුද්‍රණය කොට ලක්ෂයක් පමණ පිටපත් බෙදා හැරි ඒ භාවනා ක්‍රමය වාර්තාගත වීම සඳහා මෙසේ ලියා තබමි.

පෙරදා මුළු රෑ තිස්සේම තිබුණු ධාරානිපාත වැස්සත්, එදා මුළු අහසම අන්ධකාර වී තිබූ සැටිත් දුටු බොහෝ දෙනෙක් භාවනාවට සූදානම් වී කුඩ දිගහැර ගෙන සිටියහ. මා මුලින්ම කළේ අපේ සති සක්මන් භාවනාව නිම වන තුරු වැහි පොදක්වත් නොවැටෙන ලෙස අධිෂ්ඨාන කොට, සියලුම කුඩ අකුලා ගන්නා ලෙස ඉල්ලා සිටීමය. සියල්ලෝම කුඩ අකුලා ගත්හ. නැවත අප වර්ෂාව දුටුවේ සියල්ල නිම වී 11 දා සවස ආපසු එන විටය.

එදා ජූනි 3 වනදා මෙන්, පෙර කිසිදු මතකයේ තිබූ දිනයක දස දහස් ගණනක බැතිමතුන් ඒ ආකාරයට දළදා මැඳුර අබියස ශාන්තව වාඩි වී භාවනා කරනු කිසිවකු දැක නැත. මෙය වඩාත් වැදගත් වූයේ සර්වාගමික භාවනාවක් වූ හෙයිනි. එදාම ශාන්ත අන්තෝනි පල්ලියේ පූජාවකට සහ අම්මාන් හින්දු කෝවිලේ පූජාවකට ද නෙරංජන් සහ මම සහභාගි වීමු.

දළදා මාලිගාව ඉදිරිපිට....................

භාවනාවට සහභාගි වූ පිරිසෙන් කොටසක්

දළදා මාලිගාව ඉදිරිපිට...................

දළදා මාලිගාව ඉදිරිපිට පා ගමනට සූදානම් වූ ශාන්තිසේනා කණ්ඩායම

ජූනි 4 වනදා උදෙන්ම අප ගියේ අකුරණ නගරයේ මුස්ලිම් මහ පල්ලියේ තිබූ පිළිගැනීමකටයි. එතැන සිට මග දෙපස රැස්ව සිටි ජනතාවගේ පිළිගැනීම් ලබමින් ගිය අපි මාතලේ නගරයට සැතපුම් 1 1/2 කට පමණ මෙහා පිහිටා තිබෙන පුරන්අප්පු ස්මාරකය ලඟ සිට සාම සක්මන් භාවනාව ඇරඹීමු. සක්මනට දහස් ගණන් සාමකාමීන් එක්වූ අතර, මග දෙපස දහස් ගණන් ජනතාව සම්පූර්ණ නිශ්ශබ්දතාවයකින් යුතුව අපව පිළිගත් අතර, ක්‍රිස්තියානි හා මුස්ලිම් පල්ලිවලදී ඉමහත් හරසරින් පිළිගෙන ඔවුන්ගේ ආගමික චාරිත්‍ර අනුව ආශීර්වාද කළ අතර සාම සක්මන් භාවනාව නිම වූයේ අලුවිහාරේ ආලෝක විහාරයෙනි.



රැස්ව සිටි පිරිස භාවනාවට එක්වී

ආලෝක විහාරයේදී මා දිවා ආහාරය ගන්නා අතර විදේශ ඇමති හමීඩ් මහතා මට දුරකතනයෙන් කතා කළේය. ඒ යාපනයේ ජනතාව දින පහක් ආහාර නැතිව සිටින නිසා ආහාර යැවීමට පිළිවෙලක් සර්වෝදයෙන් සූදානම් කළ හැකි දැයි ඇසීමටය. වව්නියාවේ හාමුදුරුවන් හා කතා කොට මේ පිළිබඳව කතා කර ගන්නා ලෙස මම ඇමතිතුමාට දැන්වූයෙමි.

එදින රාත්‍රිය අප ගත කළේ දඹුල්ල රජමහා විහාරස්ථානයේය. මා බලාපොරොත්තු වූවාටත් වඩා අතිවිශාල පිරිසක් දඹුල්ල විහාරස්ථානයේ පැවැති භාවනාවට එදින රාත්‍රියේ සහභාගිවීම විශේෂයෙන් සඳහන් කළ හැකිය. ශාස්ත්‍රපති පණ්ඩිත ඉනාමළුවේ සුමංගල නායක ස්වාමීන් වහන්සේ සියලු කටයුතු මැනවින් සංවිධානය කොට තිබිණි. මාතලේ සර්වෝදය දිස්ත්‍රික් සංවිධායකවරයා වශයෙන් කටයුතු කළ එච්.පී. සෝමසිරි මල්ලී සිවිල් කටයුතු මැනවින් සංවිධානය කර තිබූ බව සඳහන් කළ යුතුය.

පසුදා සාම සක්මන් භාවනාව අරම්භ කරනු ලැබුවේ දඹුල්ල විහාරස්ථානයෙන්ය. මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වෙන් වන සීමාව පවතින්නේ මිරිස්ගෝනියාව හන්දියෙනි. මිරිස්ගෝනියාව හන්දියට අනුරාධපුරයේ ප්‍රධානීන් විශාල පිරිසක් පැමිණ සිටියහ. අනුරාධපුර මහ දිසාපති ටී.කේ. දසනායක මහතා ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් ඉතා උනන්දුවෙන් මෙම සාම කාර්යයට ස්වකීය දායකත්වය ලබා දුන්හ. මම සාම සක්මන් භාවනාවට දිස්ත්‍රික් දෙකෙන්ම පැමිණි කණ්ඩායම අමතා කතා කළ අතර අනුරාධපුර ජනතාව සියල්ලන්ටම කැවුම් කිරිබත් කෙසෙල්ගෙඩිවලින් සංග්‍රහ කළේය. අවට ප්‍රදේශවාසීහු ස්වේච්ඡාවෙන් විවිධ ආහාර ද්‍රව්‍ය සාම පා ගමනේ යෙදෙන්නන්ට ගෙනවිත් දීම විශේෂත්වයක් විය. උදෑසන ආහාරයෙන් පසුව මම සාම භාවනාවට අවතීර්ණ වූයෙමි. යළිත් මහජනතාවට ආමන්ත්‍රණය කරන අවස්ථාවලදී හැර කතා නොකරමි යන අධිෂ්ඨානයෙන් ආධ්‍යාත්මික ප්‍රාර්ථනයෙහි යෙදුනු අතර එහි වැදගත්කම අප සාමාජිකයන්ට ද දැනුම් දුන්නෙමි.

මග දෙපස අතිවිශාල පිරිස් රැස්වෙමින් සාම ප්‍රයත්නයට සුභ පැතූ බව මම පසුව දැන ගතිමි. කැකිරාව නගර මධ්‍යයේ රැස්ව සිටි පිරිස අමතා කැකිරාව පොලිස් ස්ථානය අසලදී කතාවක් පවත්වන ලෙස මට ආරාධනා ලැබුණි. එහිදී කැකිරාව ප්‍රදේශයේ ග්‍රාමීය මවක් දොඩම් වීදුරුවක් ගෙනැවිත් මට දැතින්ම පිරිනැමූ බව මතකය. සාමය ඇති කිරීම සඳහා ආධ්‍යාත්මික ප්‍රයත්නය හැර වෙනත් විකල්පයක් නැති බව මම අවධාරණය කළෙමි. උනුන් කෙරෙහි කැකෑරෙන වෛරයෙන් යුතුව කටයුතු කිරීම රටෙහි අනාගතයේ ලේ ගංගා ඇති කරවන බව ප්‍රකාශ කළෙමි. සාමකාමී හදවත්වලින් පමණක් ආධ්‍යාත්මික ශක්තිය ඇති වන බව ප්‍රකාශ කළේ පැමිණ සිටියවුන්ගේ සාදුකාර මධ්‍යයේය.

දියවඩන නිලමේ නෙරංජන් විජේරත්න මහතා මෙහිවෙයි.

මහමගදී පිළිගැනීම්

අපට දිවා ආහාරය සූදානම් කර තිබුනේ කැකිරාව සර්වෝදය දිස්ත්‍රික් මධ්‍යස්ථානයේය. දිස්ත්‍රික් නියමු සේවක ආරියසේන මුතුපෝරුව මල්ලී සියලු කටයුතු මැනවින් සංවිධානය කොට තිබිණි. මගේ පිටට කිසිවෙකු තට්ටු කළේය. මම ආපසු හැරී බැලුවෙමි. මගේ පසුපස වාඩි වී සිටියේ අනුරාධපුර දිසා ඇමති මහින්දසෝම මහතාය. ඩොක්ටර්, මම මිරිස්ගෝනියාව හන්දියට එන විට ඩොක්ටර් සාම සක්මන් භාවනාව පටන් අරන්. එතන සිට මම දිගටම ඩොක්ටර්ගෙ පිටිපස්සෙන් පයින් ආව. මතක ඇති කාලෙක මම මෙච්චර පයින් ගිහින් නැහැ. මුලදි මහන්සි දැනුන. පස්සෙ ඒක ඇරිල ගියා. ඩොක්ටර් මම ගෙදර යනව. හවස පා ගමනට එකතු වෙනව. දිසා ඇමතිවරයා පමණක් නොව රජයේත් විරුද්ධ පක්ෂයේත් දේශපාලන නායකයන් රාශියක්ම මෙසේ පැමිණ සිටියෝය. සවස 3.00 ට පමණ ආරම්භ කළ පා ගමන එදින නතර කළේ නාමල්උයන විහාරස්ථානයේය. අනුරාධපුර ප්‍රදේශයේ බොහෝ පිරිසක් එම ස්ථානයට පැමිණ සිටියෝය. ඔවුන් මෙසේ පැමිණ සිටියේ රජරට සේවයෙන් කරන ලද අධ්‍යාපන වැඩ

සටහන්වලට සවන්දීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව කොළඹින් වැඩ සටහන ඉදිරිපත් කළ අතර රජරට නිලධාරීන් සාම පාගමනේ ගමන් මග පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දුන්නේය. රජරට සේවයේ සිරි රදන්පොල, ජෝතිපාල තෙඹුවන, බ්‍රැඩ්මන් ජයවීර යන මහත්වරු විටින් විට අප හමුවෙමින් අපගේ අදහස් ලබා ගත්තේය. සාම සක්මන් භාවනාව පිළිබඳ මගේ සම්මුඛ සාකච්ඡාවක් ගුවන් විදුලියේ ප්‍රචාරය වනු අසා මම පුදුමයට පත්වීමි. මම එවැනි සාකච්ඡාවකට සහභාගි නොවූයෙමි. උදෑසන සක්මන් භාවනාව අවස්ථාවේදී කරන ලද කතාව ඇසුරෙන් මෙම වැඩ සටහන සකස් කොට තිබුණි.

පසුදින සාම සක්මන් භාවනාව පැවැතුනේ විශාල ජනාකීර්ණ පෙදෙස් අතරින් නොවේ. එදින අප රාත්‍රිය ගත කළේ ප්‍රධාන පාරෙන් කිලෝමීටරයක් පමණ ඔබ්බෙන් පිහිටි තලගුලි රජමහා විහාරස්ථානයේය. එය කැලය මැද පිහිටි ඓතිහාසික ස්ථානයකි. එම ස්ථානයේ පිහිටි සුන්දරත්වය පිළිබඳ මම සතුටට පත්වීමි. රාත්‍රී භාවනාවට සූදානම් වන විට හමුදා නිලධාරීන් රාශියක් සිටිනු දැක මගේ ශිෂ්‍යයෙකු වූ එවකට කර්නල් තනතුරක් දැරූ ආනන්ද වීරසේකර මහතාගෙන් තොරතුරු විමසීමි. මෙම සාම ප්‍රයත්නයට ත්‍රස්තවාදීන් විසින් පහරදීමට කටයුතු යොදා ඇති බැව් ආරංචි වූ බැවින් මෙම විහාරස්ථානය අවට වනය දැඩි හමුදා ආරක්ෂාවක් යෙදූ බව ඔහු මට සඳහන් කළේය. හමුදාවේ ආරංචිය කෙසේ වුවත් මෙවැනි සාම ප්‍රයත්නයකට පහර දීමට කිසිවෙකුටත් නොහැකි බව හමුදා නිලධාරියාට පැහැදිලි කළේය. අවි බලයට වඩා ආධ්‍යාත්මික ශක්තිය ප්‍රබල බව ඔහුට පැහැදිලි කළ මම මෙම හමුදා නිලධාරීන් ආපසු යවන ලෙස දැන්වීමි.

පසු දින උදෑසන මිහින්තලය බලා සාම සක්මන් භාවනා පිරිස ගමන් කළහ. පොසොන් පොහොය දිනයට වන්දනාවේ යන දහස් සංඛ්‍යාත පිරිස් අප පසු කර ගියෝය. සමහරුන් තමන්ගේ වාහන නතර කොට එයින් බැස වාහන ඉදිරියට යවා සාම සක්මන්

භාවනාවට එක්වූහ. අප සමඟ අතිවිශාල පිරිසක් ගමන් කරනු දැක ඔවුනට සංග්‍රහ කිරීමේ ප්‍රශ්නයක් තිබේ දැයි මම විමසුවෙමි. 'නැහැ සර්'. මිනිසුන් එකතු වෙනවා වගේම සංග්‍රහ කරන තැන්වලට සංග්‍රහ කිරීමට අවශ්‍ය කරන දේවලුත් මිනිසුන් ගෙනැත් දෙනව. මට උත්තර දුන්නේ හර්ෂ නවරත්නය. මිහින්තලා කන්දේ මැද මහලට අප පැමිණියේ දහස් සංඛ්‍යාත මිනිසුන්ගේ සාදුකාර මධ්‍යයේය. එදින රාත්‍රී මිහින්තලාවේ පැවැත්වූ භාවනාව අතිශය තීරණාත්මක විය. සැදැහැවතුන්ගෙන් මළුව පිරී ඉතිරී තිබූ අතර අතිශය නිශ්චලතාවයක් භාවනාව පුරා පැවැතුණි. චිත්ත ඒකාග්‍රතාවයට පැමිණීමෙන් මාතෘ භූමියේ සාමය ඇති කිරීම සඳහා හදවතින් උපන් උදාර මිනිස් ශක්තිය පාදක වන බව අවධාරණය කරමින් සාම භාවනාව ආරම්භ කළෙමු. සියල්ලෝම ගැඹුරු අරමුණකට එක්ව භවනාවේ නිමග්නව සිටියෝය.

මග දෙපස ජනතාවගේ උපහාර

අතරමගදී එකතු වූ සාම බැතිමතුන්

චිත්තාකාශයේ ඇති කරනු ඒකාග්‍රතාවය තුළින් ගොඩනඟන ආධ්‍යාත්මිකත්වයේ කල්පිත ස්කන්ධය බලවත් කරමින් රුදුරු වෛරය ඇතිවීම වැළැක්වීම සඳහා එක් සිතින් අධිෂ්ඨාන කිරීම අපි සාමූහිකව සිදු කළෙමු. මා අවට වායු ගෝලයේ දැඩි කම්පනීය තත්ත්වයක් සිදු වන බවත්, දහස් සංඛ්‍යාත මීමැස්සන්ගේ හඬක් වැනි හඬක් ඉතා ඈතින් ආරම්භ වී වේගයෙන් මා දෙසට පැමිණෙන බවත් මට දැනුණි. භාවනාව අවසාන කළ මොහොතේ එම ශක්තිය යතුල් පහරක් ලෙස මගේ සවනත වැදෙනු මට දැනුනි. මා අසලම සිටි තිස්ස බාලසූරිය පියතුමාගේ උකුල මතට මම ඇලවීමි. දියවඩන නිලමේ නෙරංජන් විජේරත්න මහතා වේගයෙන් යමක් මට කියනු ඇසුණි. තිස්ස බාලසූරිය පියතුමා මගේ හිස අතගාමින් මට යාඥා කළේය. විනාඩි කිහිපයකින් මම ඇස් ඇර බැලුවෙමි. ආධ්‍යාත්මික ශක්තිය පරාජය කරන්නට අධර්මයට පුළුවන් කමක් නැහැ. ධර්මය ජයග්‍රාහී. ඩොක්ටර් අපේ ප්‍රයත්නය සාර්ථකයි. බාලසූරිය පියතුමා හෙමින් ප්‍රකාශ කළේය. මහා සංඝරත්නය මා වටා සිටිමින් සෙත් පිරිත් කියනු මට ඇසුණි.



මිහින්තලාව මැද මළුවේ සාම භාවනාවේ යෙදුනු බැතිමතුන්

පසුදා දිවා ආහාරයෙන් පසු මිහින්තලා කඳු මුදුනේ භාවනාව පවත්වා සාම යාත්‍රිකයෝ අනුරාධපුරය බලා ගමන් ඇරඹූහ. අප සාම යාත්‍රිකයෝ පෙළකට දෙදෙනෙකු බැගින් අඩි තුනක පරතරයක් තබමින් ගමන ආරම්භ කරන ලදී. මෙත් සිතින් ගමන් කළ සාම යාත්‍රිකයන්ගෙන් මිහින්තලා අනුරාධපුර මාර්ගය අලංකාර වී තිබුණි.

මිහින්තලාව පඩිපෙල බසින සාම බැතිමතුන්

මිහින්තලාවේ සිට අනුරාධපුරය බලා පිටත් වූ සාම බැතිමතුන්

මිහින්තලාවේ සිට අනුරාධපුරය බලා ගමන් ඇරඹූ සාම බැතිමතුන්

සාම පා ගමනට එකතු වූ සර්වෝදය ශාන්තිසේනාව

ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත පැමිණ උන් වහන්සේට පූජා පවත්වා රුවන්වැලි මහා සෑ මළුවට අප පැමිණෙන විට රාත්‍රී 7.00 පමණ වී තිබුණි. සලපතල මළුවේ සාම භාවනාවට පැමිණ සිටි ලක්ෂ සංඛ්‍යාත පිරිස සුදුවතින් සැරසී වාඩි වී සිටියේය. රුවන්වැලි මහා සෑයේ නැගෙනහිර දිශාවේ පරිවාර දාගැබ් වහන්සේ අසල සිට මම සාම භාවනාව ආරම්භ කළෙමි. ජනාධිපතිතුමා සහ අගමැතිතුමා මුණගැසී අප භාවනාව ආරම්භ කළාට පසු රුවන්වැලි සෑ මළුවට පැමිණෙන සේ මම එතුමන්ලාට ආරාධනා කළෙමි. සියල්ලෝ භාවනාවට අවතීර්ණ වූ විට මම සෑ මළුවේ පිවිසුම් පඩිපෙළ අසලට ගියෙමි. ඒ දෙපළත්, ප්‍රේමදාස මැතිනියත් ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන නිලධාරී ජනරාල් සිරිල් රණතුංග මහතා ප්‍රධාන නිලධාරීන් පිළිගෙන නිශ්ශබ්දව කැඳවා ගෙන ආවෙමු. භාවනාව කර ගෙන යන අතරමඟදී මෙම මහා පුණ්‍යකර්මයට සහභාගිවීමෙන් ඔවුන්ට විශාල සෙතක් සැලසෙන

අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, අගමැති ආර්. ප්‍රේමදාස මැතිතුමා , දියවඩන නිලමේතුමා සහ මම

බව මට කල්පනා විය. පියවරෙන් පියවර සාම සක්මන් භාවනාවේ අවසන් භාවනාව පැයකට අධික කාලයක් පැවැත්වූයෙමි. අසීමිත ශක්තියක් අති සැහැල්ලු මානසිකත්වයක් මට දැනුණි. දෑත් ඉහලට ඔසවා චෛත්‍ය රාජයාණන් වහන්සේගේ චූඩාමාණික්‍යය දෙස බලා කතා කළෙමි. ආධ්‍යාත්මික ශක්තිය සත්‍ය බවත්, එය පරාජය කළ නොහැකි බවත් එහි ඒ පිළිබඳ සංකේතයක් දැකීමට අවශ්‍ය බවත් අධිෂ්ඨාන පූර්වකව ප්‍රකාශ කළෙමි. මහ සෑයේ චූඩාමාණික්‍ය ෂඩ් වර්ණ රශ්මි කදම්භයක් නිකුත් කරනු දුටුවෙමි. මම දෑත් එකතු කර සාදුකාර දුන්නෙමි. ලක්ෂ සංඛ්‍යාත පිරිස ද ඒ අනුව යමින් සාදුකර දුන්නේය. රාජ්‍ය නායකයන්ට දසරාජ ධර්මයෙන් යුතුව රට පාලනය කිරීමට ශක්තිය ලැබේවා'යි ප්‍රාර්ථනා කරමින් කරණීය මෙත්ත සූත්‍රය සාමූහිකව සජ්ජායනා කොට භාවනාව අවසන් කළෙමි.

භාවනාව නිම වී ඔවුන් සමඟ නැවතත් පසු ගමන් කොට පඩි පෙලෙන් බසින විට එකවරම මහා විශාල ශබ්දයක් ඇසුණේය. අලුතෙන් ගොඩනගමින් තිබුණු මිරිසවැටිය චෛත්‍යයේ කඩා වැටීමේ හඬයි අපට ඇසුණේ. එහෙත් ඒ බව දැන ගත්තේ පසුවයි.

ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා මගේ දෑත අල්ලා මට සුභ පැතුවේය. ප්‍රේමදාස අගමැතිවරයා මෙම ප්‍රයත්නය අගය කරමින් මිරිසවැටි චෛත්‍යයේ පිරිත් පින්කමට පැමිණෙන ලෙස මට ආරාධනා කළේය. මෙම ආධ්‍යාත්මික ප්‍රයත්නය ඉදිරියට ගෙන යන බැවින් එම ස්ථානයට පැමිණීමට නොලැබෙන බව එතුමන්ට ඉතා නිහතමානීව ප්‍රකාශ කළෙමි. එම පින්කමට මෙතෙක් මා සමඟ ආධ්‍යාත්මික ප්‍රයත්නයේ නියැලුනු දළදා මාලිගාවේ දියවඩන නිලමේ නෙරංජන් විජේරත්න මහතා සහභාගි වීය.

අප සෑ මළුවේ විවේකීව සිටියෙමු. පිරිස අතරින් හිසෙහි අත ගසමින් වේගයෙන් පැමිණි දියවඩන නිලමේතුමා මා අභියස බිම පතිතවෙමින් කතා කළේ දැඩි කලබලයෙනි. ඉවරයි... ඉවරයි ඩොක්ටර් ... මිරිසවැටිය චෛත්‍ය හාමුදුරුවෝ දේවතා කොටුවෙ ඉදල දෙකට පැලුන. හරියටම දේවතා ආරාධනය කරන කොට. කාටවත් තුවාලයක් නැහැ. ගාමිණී දිසානායක ඇමතිතුමාට කතා කර ගන්නත් බැහැ. කල්පනාවත් නැහැ. අනේ, ඇයි ඩොක්ටර් මෙහෙම වෙන්නෙ. මම නෙරංජන්ගේ හිස අත ගෑවෙමි. මල්ලී, මිරිසවැටිය ආයෙ දවසක හැදෙනෙව. මිරිසවැටිය ගොඩනැගුවෙ ශ්‍රේෂ්ඨ අවංක ධර්මිෂ්ඨ මහා රජ කෙනෙක්. අධර්මිෂ්ඨව දූෂණයෙන් වංකව හදන්න බැහැ. හදල වැඩකුක් නැහැ. බොරුවට හුඟක් කල් ආයුෂ නැහැ. සත්‍යය පමණයි තිබෙන්නේ. මතකද දැනට පැයකට ඉස්සෙල්ලා මම කිව්වෙ ආධ්‍යාත්මික ප්‍රයත්නය සත්‍ය බව. ඒ පිළිබඳව සාධකයක් අවශ්‍ය බවත් මම කිව්ව. අනේ ඩොක්ටර්,

රටට මොකද වෙන්නෙ. අධර්මයෙන් රට පාලනය කරන්න බැහැ. එහෙම කරන සේරම වැනසෙනවා. මහා විශාල ලේ ගංගා මේ මාතෘ භූමියේ ගලා යනවා. බුදුහාමුදුරුවෝ තුන් සැරයක් වැඩිය මේ පුණ්‍ය භූමියේ ධර්ම ශක්තිය විනාශ කරන්න බැහැ. හිංසාව සහමුලින්ම අපේ මව් බිමින් ඉවත් වෙනවා. අපේ ආධ්‍යාත්මික ප්‍රයත්නයේ ශක්තිය එයයි. ඒත් එය කවදද කියල මට හරියටම කියන්න බැහැ. නමුත් ඒ විදියට සිදුවන බව මම ස්ථිරවම කියනව. මම දෑත් ඔසවා පසඟ පිහිටුවා වැන්දෙමි. බොහෝ වේලා එසේ සිටියෙමි. මම හිස ඔසවා බලන විට දියවඩනේ නිලමේතුමා ද චෛත්‍යයට වැඳ ගෙන සිටියේය.

සර්වෝදය ශ්‍රව්‍යදෘශ්‍ය ඒකකය පා ගමන රූපගත කරමින්

සාම භාවනාවः

පළමු අවස්ථාව

1. පහසු ආකාරයට වාඩි වෙන්න. පැයක් පමණ වේලා පහසුවෙන් සිටීමට හැකි වේ යැයි සිතන ආකාරයට වාඩි වෙන්න. කොන්ද, බෙල්ල, හිස ඍජුව සිටින සේ වාඩි වී ඇත්දැයි සොයා බලන්න. විටින් විට ඉරියව්ව නිවැරදි දැයි විමසා එය නිවැරදි කර ගන්න.

2. අත්දෙක ඇඟිලි තුඩුවලින් සම්බන්ධ වන සේ හෝ වම් අත උඩ දකුණු අත තිබෙන සේ හෝ පහසු ආකාරයට තබා ගන්න. ඇස් දෙක පියා ගන්න. නැතිනම් අඩක් පියා ගන්න. සිනහ රැල්ලක් මුවග රැඳෙන පරිදි මුව සරසා ගන්න.

3. මාපට ඇඟිලිවලින් ආරම්භ කොට හිස්මුදුන දක්වා මාංශපේශීයෙන් මාංශපේශියට, අවයවයෙන් අවයවයට ක්‍රමයෙන් සිත යොමු කරවමින් ඒ ඒ ස්ථානය සැහැල්ලු කර ගන්න. මෙලෙස මුළු සිරුරම සැහැල්ලු කර ගන්න. කය ඍජුව තබාගත යුතු මුත් දරදඬු නොවිය යුතුය.

4. පපුව පිරෙන සේ හුස්ම ඇතුළට ගන්නා ගමන් තමා තුළට විශ්ව ශක්තීන් ඇතුළු වේවා යයි සිතන්න. හුස්ම පිට කරන ගමන් තමා තුළ යම් විෂම ශක්තීන් ඇතොත් ඒවා පිට විය යුතු යයි සිතන්න. මෙය තෙවරක් කරන්න.

5. ඉනික්බිතිව ස්වභාවයෙන් සිදුවන ආශ්වාස ප්‍රශ්වාස කෙරෙහි පමණක් අවධානය තබා ගන්න. ආශ්වාසය සිදුවන විට එය ආශ්වාසයක් බව දැන ගන්න. ප්‍රශ්වාසය සිදුවන විට එය ප්‍රශ්වාසයක් බව දැන ගන්න. දීර්ඝ නම් දීර්ඝ බව දැන ගන්න. කෙටි නම් කෙටි බව දැන ගන්න. එකම හුස්ම වාරයක්වත් තමන් නොදැනුවත්ව සිදු නොවන ලෙස, ඉහල

පහල යන හුස්ම කෙරෙහි අඛණ්ඩව අවධානය පවත්වන්න. මොනයම් අරමුණක් වෙත සිත යොමු වූවත් එහි රැඳී සිට විභාග කරන්න නොගොස් ආශ්වාස ප්‍රශ්වාසය කෙරෙහිම යොමු කරන ලද සිහියෙන් සිටින්න.

6. ඇතුළු වන හුස්ම හෝ පිටවන හුස්ම නාස්පුඩු කෙලවරේ යම් ස්ථානයක ගැටේ. එම ස්ථානය සොයා ගෙන එහි සිහිය තබා ගෙන, හුස්ම එහි ගැටෙන සලකුනෙන් හුස්ම වැටීම දැන ගන්න. මෙසේ පුහුණු කිරීමෙන් සිත වෙන කිසිම අරමුණකට නොදුවා ඒකාග්‍රතාවය ඇති වේ. සිත වෙනත් අරමුණක් කරා යොමු වූවත් නැවත නැවතත් ඉහතින් දැක්වූ ස්ථානයටම යොමු වන්නේ නම් එහිම සිත රැඳේ නම් ඔබ ධර්ම ශක්තිය ලැබීමටත් ඉන් ජනිත වන ආධ්‍යාත්මික මෛත්‍රී ශක්තිය සියලු සත්ත්වයින් වෙත හිඳුවීමටත් සුදුසු භාවනාවකට පත්වී ඇති බැව් සලකා සාම භාවනාවේ දෙවැනි අවස්ථාව ක්‍රියාත්මක කරන්න.

දෙවැනි අවස්ථාව

1. මෙසේ සිතන්න. මගේ ශරීරය සැහැල්ලුයි. විවේකීයි. ස්වභාව ධර්මයේ ශක්තීන්ට මගේ ශරීරය දැන් වඩා සම්බන්ධයි. මා හුස්ම ගැනීමත් සමඟම ස්වභාව ශක්තීන් මා තුළට ඇතුළු වී මගේ ශරීරය ශක්තිමත් කරයි. මගේ සිත ද සැහැල්ලුයි. මගේ ශරීරය මෙන්ම මගේ සිත ද සුවපත් විය යුතුයි. ඊර්ෂ්‍යා, තරහ, දුරු විය යුතුයි. තුනී විය යුතුයි. ආත්මාර්ථකාමී හැඟීම් දුරු විය යුතුයි. දැන් මගේ ගත මෙන්ම සිතත් සුවපත්. මගේ මෙන්ම මගේ මවගේ....... (මේ අන්දමින් සිත, කය සුවපත් වේවායි සිතන්න) මගේ පියාගේ, භාර්යාවගේ, ස්වාමි පුරුෂයාගේ, දරුවන්ගේ, වෙනත් අයගේ...... සියලුම ලංකාවාසීන්ගේ, සියලුම ලෝකවාසීන්ගේ, සියලුම සත්ත්වයින්ගේ ආදී වශයෙන් තමන්ගෙන් පටන් ගෙන මුළු ජීව ලෝකයම සිතින් කයින්

සුවපත් වෙත්වා යයි සිතන්න. මේ සිතිවිලි අතරතුර එන සෑම මොහොතකම ආශ්වාස ප්‍රශ්වාස දෙස සිත යොමු කරන්න.

2. තමා මෙසේ දියුණු කරගත් මෛත්‍රී ශක්තිය තවත් ශක්තිමක් කර ගැනීම පිණිස බුදුන් වහන්සේගේ, ධර්මයාගේ, සංඝයාගේ මෛත්‍රී ගුණය (බෞද්ධයින් විසින්) සිහි කොට ඒ ශක්තීන් තමා තුළ ද වැඩිය යුතු යැයි අධිෂ්ඨාන කර ගන්න. සෙසු ආගමිකයින් තමා අදහන ශාස්තෘන් වහන්සේලාගේ ගුණය මෙනෙහි කොට ඒ ශක්තිය ලබා ගන්න. හුස්ම ඇතුලට ගන්නා විට මේ මෛත්‍රී ශක්තීන් තමා තුළට ද එක් වේවායි සිතන්න. හුස්ම පිට කරන විට තමා සිතේ තිබෙන සියලු බෙදීම් පිට වී ජීව ලෝකයේම තමා තුළ මෙන්ම මෛත්‍රී ශක්තිය දියුණු වේවායි සිතන්න.

3. අප ඉදිරිපස වැඩ සිටින ශ්‍රී දළදා වහන්සේ, ශ්‍රී මහා බෝධීන් වහන්සේ, රුවන්වැලි මහා සෑය ආදී පූජනීය වස්තූන්ට සම්බන්ධ ශක්තීන් ද තමා තුළට ඇතුළු වී තමාගේ මෛත්‍රී ශක්තිය තව තවත් වැඩි වේවායි සිතන්න. ඒ වස්තූන් හා සම්බන්ධිත විවිධ සම්‍යක් දෘෂ්ටික දේව ශක්තීන් ද තමා තුළට ඇතුළු වී තමාගේ මෛත්‍රී ශක්තිය තවදුරටත් ශක්තිමත් වේවායි සිතන්න.

තුන්වන අවස්ථාව

1. ජාති, කුල, ආගම්, පක්ෂ, භාෂා, ආදී භේද මිනිසා මිනිසාගෙන් වෙන් කරන සූක්ෂම උපක්‍රම බව සිතන්න. මනුෂ්‍යත්වයේ උසස් ලක්ෂණය නම් තමාටත් අන්‍යයන්ටත් හිංසාවක්, පීඩාවක්, හිරිහැරයක් නොවන පරිදි බුද්ධිමත්ව සිහි කල්පනාවෙන් තම චින්තනය, වචනය හා ක්‍රියාව හසුරුවා ගැනීම බවත් තමා මෙන්ම සියලු සත්ත්වයෝම හිංසාවට අකමැති බවත් නිදුක්, නීරෝගී, බියෙන් තොර

සැනසිලිදායක සාමකාමී පරිසරයක ජීවත්වීමට කැමති බවත් අවබෝධ කොට ගෙන එවැනි පරිසරයක ජීවත්වීමට ලැබෙන්නේ නම් එය කොයිතරම් අගනේ දැයි ස්වල්ප වේලාවක් මෙනෙහි කරන්න.

2. අප ජීවත් වන ලංකාද්වීපයෙහි දෙවුන්දරතුඩුවේ සිට පේදුරුතුඩුව දක්වාත්, පුත්තලමේ සිට මඩකලපුව දක්වාත් ජීවත් වන ලක්ෂ සංඛ්‍යාත පිරිසකට මනුෂ්‍යයන්ට හා සත්ත්වයින්ට දෙවැනි පරිසරයක මෙවැනි සිතිවිලි ඇතිව, වචන ඇතිව, ක්‍රියා ඇතිව ජීවත්වීමේ වාසනාව ඇති වේවායි ඉතසිතින් පතන්න. තුන්වරක් මේ අන්දමට මෙනෙහි කර ප්‍රාර්ථනා කරන්න.

3. ඉනික්බිතිව ඒ පරාර්ථකාමී ධර්ම මෛත්‍රී ධාරා සංඛ්‍යාත චිත්ත ශක්තිය මාගේ චිත්ත සන්තානයේ පහළ වේවා, පිහිට වේවායි මිනිත්තු 20 ක් පමණ වේලා එකම අධිෂ්ඨානයෙන් සිටින්න.

4. මේ වන විට ඔබේ සිතට කවරදාකවත් නොදැනුන ශාන්තියක්, ඒ වාගේම දුකට පත්, බියට පත්, සොවට පත්, සත්වයා වෙනුවෙන් මා යමක් කළයුතුය යන මෛත්‍රී සහගතසිතිවිලි පැනනගිනු ඇත.

5. ඉනික්බිතිව ඔබගේ මාර්ගයෙන් ක්‍රියාත්මක වන ආධ්‍යාත්මික ශක්තිය විහිදුවීම සඳහා මෙසේ අධිෂ්ඨාන කරන්න. මගේ සන්තානය කේන්ද්‍ර කොටගෙන උල්පතකින් නැගී එන පිරිසිදු සිසිල් ජල ධාරාවක් සේ මෙම මෛත්‍රී ධර්ම ශක්ති ධාරා මා අවට සිටින සියලුදෙනාගේ සිත් සතන්වලට ඇතුල් වී ක්‍රමයෙන් ඈතට ඈතට හතර වටේම ශ්‍රී ලංකාවේ අස්සක් මුල්ලක් නැර ජීවත් වන සියලුදෙනා වෙතම පැතිරේවායි මිනිත්තු 10 ක පමණ වේලාවක් භාවනාවෙහි යෙදෙන්න.

6. තවදුරටත් මෙසේ අධිෂ්ඨාන කරන්න. මෙම ආධ්‍යාත්මික ශක්තියට එරෙහිව කිසිම හිංසාකාරී අධම බලවේගයකට හිස එසවිය නොහැක. මෙම ආධ්‍යාත්මික ශක්තියේ බලයෙන් බොහෝ දෙනෙකුගේ සිත්වලට අරක් ගෙන ඇති හිංසාකාරී අධම අදහස් නැති වී ධර්මානුකූලව ජීවත් වන පිරිසකගෙන් යුත් සුඛිත මුදිත සාමකාමී වාතාවරණයක් ඇති ප්‍රදේශයක් බවට ශ්‍රී ලංකාව පත් වේවායි සිතා භාවනාවේ යෙදෙන්න.

7. අප ශ්‍රී ලංකාවේ සිට පවත්වන මේ ආධ්‍යාත්මික සතිය තුළදී විවිධ රටවල සිටින අපේ මිතුරෝ ද මේ අන්දමේම භාවනාවල යෙදී අපේ ආධ්‍යාත්මික ශක්තියට එකතු කිරීමට ඔවුන්ගේ ද ආධ්‍යාත්මික තරංග එවනු ඇත. ඒවා ද අප හා එක්වේවා යයි සිතන්න.

8. නැවත ශරීරය දෙස සිතින් බලා ශරීරය සැහැල්ලු කර ගන්න. නාස්පුඩු කෙලවර හුස්ම ඇතුළු වන පිට වන දෙස බලන්න. හුස්ම ඇතුළට ගන්නා ගමන් ස්වභාව ශක්තීන් මෙන්ම සැම දෙනාගේම මෛත්‍රී ශක්තීන් තමන් තුළට ඇතුළු වන බව සිතන්න. දැන් තමා තුළ තිබෙන සියලු ශක්තීන් පිරිසිදුය. ශක්තිමත්ය. දැන් තමා හුස්ම පිට කරන විට තමාගේ මෛත්‍රී ශක්තියෙන් ස්වභාව පරිසරයෙන් ජීව ලෝකයත් සියලුම මිනිසුනුත් සාමකාමී වෙත්වා, සුවපත් වෙත්වායි සිතන්න. මේ අන්දමින් මෛත්‍රී ශක්තිය ඇතුළු කරමින් පිට කරමින් හුස්ම ඉහළ පහළ ගන්නා අතර තමාගේ සිත ලංකාවේ සියලුම ප්‍රදේශවලට මෛත්‍රිය පතුරවමින් යවන්න. මෙසේ භාවනා කරන දස දහස් සංඛ්‍යාත භාග්‍යවන්ත පිරිසගේ පිරිසිදු චේතනාවෙන් ජනිත වන්නා වූ ආධ්‍යාත්මික ශක්තිය අපේ ශ්‍රී ලංකාව පුරා විහිද ගොස් සැම දෙනාගේම සිත් මෛත්‍රියට අහිංසාවට සාධාරණත්වයට සාමයට යොමු වේවා යනුවෙන් අධිෂ්ඨාන කරන්න.

(මේ සෑම භාවනා පැයක්ම නිම වන්නේ ප්‍රාර්ථනා ගීතය සෑම දෙනාම එක්ව ගැයීමෙනි.)

කල්වැසි	වසීවා
කෙත්වත් සාර	වේවා
සත් සිත්	නිවේවා
රජය දැහැමිව ලොවැඩ	වේවා!

දිවෙහි නොවේ හදවතෙහි ඇති දහම
බුරුම වන්දනාව

1987.07.21 වැනි දින ආසියානු හා දකුණු පැසිෆික් කලාපීය වැඩිහිටි අධ්‍යාපන සංවිධානයේ සභාපතිවරයකු වශයෙන් බැංකොක්වල ගුවන් තොටුපොළ හෝටලයේ පැවැත්වෙන විධායක රැස්වීමකට ඊයේ සිට සහභාගි වෙමින් සිටිමි. මහාචාර්ය ඩබ්ලිව්.එම්.කේ. විජේතුංග එහි මහ ලේකම් වශයෙන් ද ආනන්ද ජයවර්ධන මහතා ලේකම්වරයකු වශයෙන් ද සහභාගි වේ. අද සවස මේ රැස්වීම නිමා වේ. හෙට තායිලන්තයේ වැඩිහිටි අධ්‍යාපන සංගමයේ වාර්ෂික රැස්වීමේ දේශනයක් කිරීමට තිබේ. අනිද්දා එනම් 23 දා මම පළමු වරට බුරුමයට යන්නෙමි.

බුරුමයට යෑමේ අරමුණ ශ්‍රී ලංකාවේ සාමය සඳහා භාවනා කරන 'සායා තෙයිඩ් ධම්ම අශින් ඥානික සියාදෝ' හිමියන් මුණගැසීමය. එතුමාගේ ආරාමයේ රෝපණය කිරීමට ශ්‍රී මහා බෝධි අංකුරයක් සහ රුවන්වැලි සෑයේ ආකෘතියක් සාදා එහි තැන්පත් කිරීමට ධාතූන් වහන්සේලා දෙනමක් ද මම වැඩමවා ගෙන ආවෙමි ගුවන් තොටුපොළේදී මුණගැසුන එයාර් ලංකා කළමනාකරු අබේතුංග මහතා හා මැතිනිය ද තානාපති කාර්යාලයේ සේරසිංහ මහතා ද වෛද්‍ය තින් තින් මහත්මියගේ සැමියා වන ආචාර්ය සෙන්ලින් මහතා ද වූහ. මා බැංකොක් පැමිණෙන විට මා ගෙදර නවතා ගෙන සියලු ආගන්තුක සත්කාර කරන ලලිතා හා රැල්ෆ් හවුට්මාන් නැගණිය හා මල්ලී ද පැමිණ සිටියහ.

1987.07.23 දින වූ අද තව මොහොතකින් වෛද්‍ය සම්ලීන් මහතා සහ අබේතුංග මහතා පැමිණ ගුවන් යානයට මා රැගෙන යනු ඇත. මා යන්නේ බුරුමයටයි. අරමුණ 'සායා තෙයිඩ් අශින් ඥානික සියාදෝ' තෙරුන් වහන්සේ හමුවීමට සහ උන්වහන්සේට ම විසින් වඩමවා ගෙන ආ බෝධි අංකුරය සහ ධාතූන් වහන්සේලා

දෙනම බාර දීමටයි. වෛද්‍ය තින් තින් මැතිනිය එහි දී මා මුණගැසී සියලු කටයුතු සංවිධානය කරනු ඇත.

බැංකොක් නුවර ගත කළ දින තුනේදී තායිලන්තයේ වැඩිහිටි අධ්‍යාපනඥයන් බොහෝ දෙනෙක් හමු වීමි. මා කළ දේශනවලට ඔවුහු බොහෝ ප්‍රිය කළහ. හැම තැනින්ම ලැබෙන ආදර ගෞරව සංග්‍රහ මෙහිදී ද ලැබීමි එයින් මා ලද සතුට අපමණය. විජේ සහ ආනන්ද අද සවස ආපසු සිය රට බලා යති.

විසිතුන්වැනිදා බුරුම ගුවන් සේවයේ යානයකින් බැංකොක් සිට මම රැන්ගුන් දක්වා මිනිත්තු 50 ක ගුවන් ගමනකින් පසු ළඟා වීමි. ආගමන නිලධාරීහු ගුවන් යානයට පැමිණ බෝධීන් වහන්සේට පුද සත්කාර දක්වා විශේෂ බස් රියකින් මා ගොඩනැගිලි තුළට කැඳවා ගෙන ගියහ. එහිදී මගේ ලියකියවිලි කටයුතු ඉක්මණින් නිම කළ ඔවුහු මා පිළිගැනීමට පැමිණ සිටි විශාල පිරිසට ද ඇතුළතට පැමිණ මා ගෙනා පූජනීය වස්තූන් වැඳ පුදා ගැනීමටත් මට ආචාර කිරීමටත් ඉඩ දුන්හ.

වෛද්‍ය තින් තින් මැතිනිය ධාතුන් වහන්සේලා තැන්පත් කළ කරඬුව අතැතිව වාහනයට නැගීමට සූදානම්ව

ගුවන් තොටුපොළේ සිට මහ රිය පෙරහැරකි. වෛද්‍ය තින් තින් මැතිනිය අත විශේෂ කරඬුවක තැන්පත් කළ ධාතූන් වහන්සේලා දෙනමද මගේ අතේ බෝධීන් වහන්සේද ගෙන අපි සැම වාහනයක ඉදිරි අසුන්වල වාඩි ගතිමු. මග දෙපස බෞද්ධ කොඩි. දුටු හැමෝම නැවතී අප දෙසට වැදීමට අමතක නොකළහ.

මුලින්ම අපේ රිය පෙරහැර ළඟා වූයේ රැන්ගුන් නගර මධ්‍යයේ පිහිටි සුප්‍රසිද්ධ ශ්වේදගොන් චෛත්‍යරාජයා පිහිටි ආරාමයටය. වාහන නවත්වා සෑයේ භාරකාර මණ්ඩලය ප්‍රධාන උපාසක - උපාසිකා භික්ෂු - භික්ෂුණීන් පෙළගැසී වැඳ නමස්කාර කොට අප පිළිගත්හ මග දෙපස දන ගසා මේ පූජනීය වස්තූන්ට වන්දනා කරන බුරුම ජාතිකයින් දකින ඕනෑම කෙනෙකුට මොවුන්ගේ ආගමික භක්තිය ගැන මහත් පැහැදීමක් ඇති වනු නිසැකය.

ඉන්දීය ජාතික අනුරාද් කී අන්දමට .බුරුම ජාතිකයන්ගේ ආගම තිබෙන්නේ දිවේ නොව හදවතේය.

රැන්ගුන් නගරයේදී පිළිගැනීම

ධාතූන් වහන්සේලා සහ බෝධි අංකුරය ශ්වේදගොන් චෛත්‍යයේ මහ මළුවට වැඩම වනවාත් සමගම මහා ධාරණීපාත වර්ෂාවක් කඩා වැටිණ වැස්ස නොතකා කුඩ සේසත් ගෙන අපි චෛත්‍යය පැදකුණු කොට අවසානයේදී මේ වස්තූන් සඳහා පිළියෙල කර තිබුණු විශේෂ මණ්ඩපයක ඒවා තැන්පත් කළෙමු. ඒ අවස්ථාවේ සිට නැවත රාත්‍රී 8.00 කණිසමට මණ්ඩලේ බලා පිටත් වන දුම්රිය වෙත වඩම වන තුරු දහස් ගණන් බැතිමත්හු ඒවා වැඳ පුදා ගත්හ.

රාත්‍රී 8.00 වන තුරු තින් තින් නිවසේ විවේකයක් ගත් මම නැවත ඔවුන් සමග ශ්වේදගොන් ගොස් එහි භාරකරුවන් ද සමග පූජනීය වස්තූන් වැඩමවා ගෙන රැන්ගුන් දුම්රිය ස්ථානයට රිය පෙරහැරකින් ආවෙමි විශේෂ දුම්රිය මැදිරියක පනහක පමණ මා සමග ගිය පිරිස වෙනුවෙන් ආසන වෙන් කරවා ගෙන තිබිණ. කනප්පුවක් මත පූජනීය වස්තූන් ගෞරවාන්විතව තැන්පත් කොට ඒ ළඟම අසුනේ මම වාඩි ගතිමි පසුවදා උදේ 900 ට දුම්රිය තාසි නම් වූ දුම්රිය පොළට ළඟා වීය.

රැන්ගුන් තාසි අතර දුම්රිය නැවැත්වූයේ එක් ස්ථානයක පමණකි. එළිය වැටුනු පසු දෙපස දක්නට ලැබුණේ විශාල තැනිතලා භූමියකි. කලින් මේ ප්‍රදේශය සරුසාර වී වගා කළ ගොවි බිම් ලෙස තිබෙන්නට ඇත. අදත් බොහෝ තැන්වල පාර දෙපස විශාල කුඹුරු, එළවළු වගා සහ උක් වගා කොට තිබුණත්, ගොවි ආර්ථිකය දුර්වල වී ඇති බව පෙනේ. ජලය ලබා ගැනීමට ප්‍රයෝජනයට ගන්නා ආඩියා සවි කරන ලද ළිං තිබුණත්, නවීන හෝ පැරණි වාරිමාර්ග ක්‍රමයක් නොදුටිමි.

කොයි මොහොතේ රේල් පාර දෙපස බැලුවත්, නොවරදවාම පෙනෙන පියකරු දර්ශනයක් නම් චෛත්‍ය සමූහයයි. ගමින් ගමට සමහර විට එක ගමක චෛත්‍ය සමූහ කිහිපයක් ම තිබේ. ඒවා සියල්ල රන් ආලේප කරන ලද ඒවාය. ශ්වේදගොන් චෛත්‍යයේම හැඩ හුරුකමට ඒවා ගොඩනගා තිබේ. පිණ්ඩපාතේ වඩින හාමුදුරුවන් අපට නිතර දැක ගන්නට ලැබුණු දර්ශනයක් විය.



චෛත්‍ය සමූහයන්

එක් ට්‍රැක්ටර් නැවතුම් පොළක් දුටු මුත්, වැඩ කරන එකම ට්‍රැක්ටරයක්වත් දුටුවේ නැත. කුඹුරු හැමට පාවිච්චි කරන්නේ මී සහ එළ හරකුන්ය. බඩු ප්‍රවාහනය කරත්ත මගිනි. මිනිසුන් ප්‍රවාහනය වන්නේ අශ්වයන් විසින් අදින බක්කි කරත්ත මගිනි. මහ පාරවල ඉඳහිට ඉතා පැරණි ලොරි කිහිපයක් හෝ බසයක් ඇදෙනු දිටිමි. බොහෝ විට ඉන්දියාවේ මෙන් ඒවායේ ඇතුළත පමණක් නොව, වහළ උඩ ද මිනිස්සු නැඟ යති.

තාසි දුම්රිය පොළට සියාදෝ හාමුදුරුවන්ගේ දායකයෝ රැසක් වාහන කිහිපයකින් අප පිළිගැනීමට පැමිණ සිටියහ. පූජනීය වස්තූන්ට මහත් හරසර දක් වූ පසු, ඔවුහු අප සමඟ වාහනවලින් මහ පාර දිගේ පැය එකහමාරක් පමණ දුම්රිය පොළේ සිට මිථීලා නගරය දෙසට ගමන් ගත්හ. බුරුමයේ වාහන ගමන් කරන්නේ පාරේ දකුණු පැත්තේය. එහෙත් දකුණේ මෙන් වම් පස ද සුක්කානම තිබෙන වාහන කිසිදු වෙනසක් නැතිව පාරවල දුවයි. පාර අඩි හයකට වඩා පළලට තාර දමා නැත. එහෙත් අපේ මෙන් ඒ අඩි හය තුළ කැඩී බිඳී පාරේ වළවල් නැත.

අප පිළිගැනීමට මිථිලා නගරයට පැමිණ සිටි පිරිස

මිථිලා නගරය විශාල ස්වාභාවික වැවක් මායිම් කොට තිබේ. වරක් මේ නගරය ඉතා දියුණු නගරයක්ව තිබුණු බව අසන්නට ලැබිණ. අප කෙලින්ම ගියේ එහි පිහිටි විශාල ආරාමයකටයි. එහි භාරකාර මණ්ඩලය හා දායක දායිකාවන් විශාල පිරිසක් ඉමහත් ගරු සැලකිලි ඇතිව පූජනීය වස්තූනුත්, අපත් පිළිගත්හ. බුරුම බෞද්ධයන්ගේ භක්තිය කොපමණ දැයි කිවහොත්, මහ පාර දෙපස දණ ගසා ගෙන අපේ වාහන පසු වන තුරු ඔවුහු වැඳ ගෙන සිටිති. ඒ පූජනීය වස්තූන් රැගෙන පැමිණි මගේ දෙපා වැඳ ආචාර කළ අතර, ඒ වැඳුම මට නොව, තෙරුවනට යි සිතා අහංකාරයක් ඇති වීමට සිතට ඉඩ නුදුනිමි.

අප උදේ ආහාරය මෙන් ම දිවා ආහාරය ද ගත්තේ මිථිලා පන්සලේදීය. හොඳ සීතල වතුර ටිකක් නා ගන්න ද අවස්ථාව පැදින. අප එහි විවේක ගත් කාලය තුළ දී සෑහෙන බැතිමතුන් පිරිසකට

පැමිණ මේ ධාතූන් වහන්සේලා හා බෝධීන් වහන්සේ වැඳ පුදා ගැනීමට හැකි විය. මෙහි සිරිතක් නම් වඳින විට, මුදල් ද එම පූජනීය වස්තූන් තිබෙන භාජනය තුළට පූජා කිරීමය. ඒ අතර පෙරහැර යන විට මල් පෙති, පොරි සමඟ කාසි ද උඩට විසි කෙරේ. ඉන්පසු පොර කමින් සියල්ලෝම එම කාසි අහුලති.

මිරීලා සිට අපේ රිය පෙරහැර පිටත් වන විට දහවල් එකට පමණ ඇත. දැන් මහ පාරේ නොව, අප ගමන් කරන්නේ බොරළු පාරවලය.

මෙය ඉතා වියළි පෙදෙසකි. අපේ වියළි කලාපය සිහි ගන්වයි. අපේ ගම්සභා පාරක් වැනි වූ මේ මුඩු බිම් හරහා යන පාර, ජීප් රථයකට හැර වෙනත් වාහනයකට යෑමට සුදුසු නොවේ. ඒ නිසා හයිනෝ බසය සහ පික්අප් රථය ඇතුළු මේ වාහන ජලය නැති අගල්, ජල මාර්ග, ගංගා අතරින් පදවන රියැදුරන් ගැන මම පුදුම වීමි.

අපි ගම් රැසක්ම පසු කළෙමු. ඒවායේ තිබෙන ප්‍රධානම ගොඩනැගිලි දාගැබ් සමූහයන්ය. එක පාසලක් පමණක් මිරීලාවේ දී දුටිමි. මග දෙපස මිනිසුන් දණ ගසා වැඳ ගෙන අපේ වාහන යන තුරු බලා සිටිති. ගම් තුනක පමණ වාහන පෙරහැර නතර කළ විට, බැතිමත්හු පැමිණ වැඳ පුදා ගෙන මුදල් නෝට්ටු පූජා කළහ.

සැතැප්ම 18 ක් පමණ වූ මේ දුර ඒමට අපට පැය තුනක් ගත වීය. අප ආරාමය පිහිටා තිබෙන සීමාවට පැමිණෙන විට සවස 4.00 ට පමණ ඇත. සුදු කුඩය හැඩය ගත් සේසත් 108 ක්ද, ගස්වල අතු ද, මල් ද, බෞද්ධ කොඩි ද රැගත් පිරිසක් සැතැප්ම භාගයක් පමණ මොබ්බෙහි දී අප පිළිගෙන මහ පෙරහැරින් සියාදෝ හිමිගේ අරමට කැඳවා ගෙන ගියහ. සියාදෝ හාමුදුරුවන් ද අප පිළිගැනීමට පෙර මගට පැමිණි බව මම දැන ගතිමි. දැන් නම් මට බොහෝ

සියාදෝ හාමුදුරුවන් ප්‍රධාන පිරිස අප පිළිගැනීම

වෙහෙසය. එහෙත් ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය ඝාතනය නිමා වී, සාමයේ සිසිලසක් දැකීමේ පරම පවිත්‍ර චේතනාවෙන් මේ බෝධීන් වහන්සේ හා ධාතූන් වහන්සේලා මෙහි වැඩමවා ගෙන වුත් සියාදෝ හිමියනට බාරදීමේ කාර්යය තව මොහොතකින් සපිරේ. දහස් ගණන් ගිහි පැවිදි බැතිමතුන් සමඟ දැන් මම මේ පූජනීය භූමියට පිවිසුණෙමි. ස්වාමීන් වහන්සේ ආරාමයට පිවිසෙන භූමියේ තවත් කීප දෙනෙක් පිරිවරා ගෙන වාඩිවී සිටියහ. මම උන්වහන්සේට වැන්දෙමි. අප ගෙනා පූජනීය වස්තූන් උන්වහන්සේට අත ගැස්වූ පසු, ධර්ම ශාලාවට ගොස් ආරාමයේ භාරකරුවන් විසින් ඒවා තැන්පත් කරන ලදී.

අප වෙනුවෙන් තනන ලද නේවාසික ගොඩනැගිල්ලට ගිය මම නව වැසිකිලිය හා නාන කාමරය ද හාපුරා කියා පාවිච්චි කොට, තේ ටිකක් බී, විවේකයක් ගැනීමට ඇඳේ හාන්සි වූයෙමි.

දැන් සන්ධ්‍යාවේ 6.00 ට පමණ ඇත. හතර වටින්ම කළුවර විය. වලාකුළක් නොතිබුණු අහසේ දැන් කළු වලාකුළු රැසකි. ධාරානිපාත වැස්සක් ආරම්භ විය. විදුලි කොටමින්, අහස ගුගුරවමින් මේ වර්ෂාව පසු දා එළිවන තුරු වැස්සේය. මාස නවයක ඉඩෝරයක් නිම කරමින් මුළු පළාතටම ජලය දෙමින් සිසිලස පතුරුවමින් වැටුණු ඒ වැස්ස, ප්‍රදේශයට වසරකට වරක් ලැබෙන වර්ෂාවෙන් අඩක් බව එහි සිටි අය පැවැසූහ. මා රැගෙන එන පූජනීය වස්තූන් සත්‍යය ඒවා නම්, එදා ම වසින බව සියාදෝ හිමියන් එදා උදේ පවසා ඇති බව මම පසුව දැන ගතිමි.

මේ ආරාම භූමිය අක්කර 72 ක් පමණ යැයි දැන ගන්නට ලැබිණි. මෙහි කලකට පෙර තාපසවරයකු වාසය කර තිබේ. අනාගතයේදී මේ භූමියේ ශ්‍රේෂ්ඨ හිමි නමක් ආරාමයක් පිහිටුවා වැඩ වසන බවත්, එතුමා නිසා මේ පළාතම දියුණු වන බවත් ඔහු පවසා ඇතැයි කියති.

ස්වාමීන් වහන්සේ මුලින්ම පැමිණ එක් දිනකින් ගොඩනැගූ චෛත්‍යයේ සිට, චෛත්‍ය සමූහ රාශියක් අද මේ භූමියේ තිබේ. ඒවා වරින් වර කලින් කල නිර්මාණය කරන ලද ඒවාය.

චෛත්‍යවල බුදු පිළිම රාශියක් තිබේ. ඊට අමතරව දූන් විෂ්ණු පත්තිනි ආදී විවිධ දෙවිවරුනට භාර වූ පූජ්‍යස්ථාන ද තිබේ. ශිව හා කාලි දෙවිවරුන් සඳහා තවත් දේවාල ගොඩනැගෙන බව දැන ගතිමි. මා පසු දා උදේ වරුවම ගත කළේ මේ විශාල ආරාම භූමිය නැරඹීමටය. ඒ අතර ධර්ම ශාලාවේ වාඩි වී සියාදෝ හිමියන් මා ගෙනා ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම සඳහා රුවන්වැලිසෑයේ ආකෘතියක් ගොඩනැගීම සහ බෝධීන් වහන්සේ රෝපණය කිරීම පිළිබඳව කමිටුවක් සමඟ සාකච්ඡා කරනු දිටිමි.



ආරාමයේ තිබෙන බුදුපිළිම

ආරාමයේ තිබෙන දේවාල

සියාදෝ හිමියන්ගේ ඇරැයුමෙන් විසිපහක පමණ දෙමළ කතා කරන බැතිමතුන් පිරිසක් මගේ ආහාර පිළියෙල කිරීම සඳහා මණ්ඩලේ සිට පැමිණ සිටියහ. ඔවුන්ගේ ප්‍රධානියා වූ රාමසාමි කියන අන්දමට, අවුරුදු 20 ක් ඔවුහු සියාදෝ හිමියන් අනුගමනය කර ඇති බෞද්ධයෝ වෙති. මට පුදුම භක්තියකින් හා ගෞරවයකින් සැලකුව මේ අයගෙන් සියාදෝ හිමි පිළිබඳ ආශ්චර්යවත් දේ ඇසීමි.

සියාදෝ හිමියන්ගේ අරමේ සිටි කාලය තුළදී රසවත් කථාන්දරයක් ඇසීමට ලැබිණි. මෙහි ඓතිහාසික සත්‍ය අසත්‍යතාවය සොයා ගැනීමට මට මෙතෙක් නොහැකි විය.

මහනුවර රාජධානය පැවති සමයේ, බුරුමයේ රජතුමා දළඳා වැඳීමට පැමිණ තිබේ. එවකට ශ්‍රී ලංකාවේ රජ කළ රජතුමාගේ දියණිය, බුරුම රජුට අග මෙහෙසිය වශයෙන් විවාහ කර දෙන ලදී. මෙම තරුණ කුමාරිකාව සමඟ බුරුමයට ගිය රජතුමා ටික කලක් තමාගේ අග මෙහෙසිය සමඟ සතුටින් ජීවත් විය. එකල බුරුම

රජවරුන්ගේ සිරිත වූයේ සති ගණන් හෝ මාස ගණන් රටේ ඈත ප්‍රදේශවල සංචාරයේ යෙදීමයි. දවසක් රජතුමාත්, බිසවත්, පිරිවරත් ගඟක් දිගේ යන අතර ඉතාමත්ම නොදියුණු ජනතාවක් වාසය කළ ගමක් හමු විය. මෙම ගමේ කිසිවෙක් ඇඳුම් ඇන්දේ නැත. මෙය දුටු සිංහල කුමරිය එකවරටම කොක් හඬලා සිනාසුණාය. මහ රජු ඉදිරියේ කිසිවෙකුට ඒ අන්දමින් සිනාසීමට බුරුමයේ රාජ්‍ය සම්ප්‍රදායන් අනුව ඉඩක් තිබුණේ නැත. එසේ යම් කෙනෙක් සිනාසුණහොත් එවේලේම හිස ගසා දැමීම එදා සිරිත විය. රජතුමා වහාම සිය කඩුපත අතට ගෙන තමාගේ දයාබර අග මෙහෙසියගේ හිස ගසා දැම්මේය. ඒ මොහොතේම විදුලි කොටමින් මහා කුණාටුවක් හට ගත්තේය. මේ කුණාටුව තුළින් මතු වූ ආලෝකයක් හැම පැත්තට විහිදී ඒ තුළ ඉතා කැපී පෙනෙන දිව්‍යාංගනාවකගේ රූපය නිර්මාණය වී, එය පෙනෙන තෙක් මානයේ තිබුණු විශාල කන්දක් මුදුනට පාත් වූයේලු. එම සිංහල කුමරිය එහි දිව්‍යාංගනාවක් වශයෙන් ජීවත් වන බව සලකා, රජතුමා එතැන එතුමියගේ නමින් දේවාලයක් ගොඩ නැංවූයේලු.

එම දිව්‍යාංගනාවිය වරින් වර සියාදෝ හිමියන් ළඟට පැමිණ විවිධ කරුණු හෙළි කරන අතර ශ්‍රී ලංකාව පිළිබඳ සියලු විස්තර සපයන්නේ ඇයලු. මීට මාස කිහිපයකට පෙර මා බැංකොක් නුවර සිටින විට වෛද්‍යාචාරිණී තින් තින් මැතිනිය අත පාත්‍රයක් ද, සිවුරක් ද, හැන්දක් ද, පුටුවට දමන ඇතිරිල්ලක් ද, නව ගුණ වැලක් ද මට තෑගි කර එව්වේ, එම දිව්‍යාංගනාවියගේ ඉල්ලීම පරිදිලු. මෙම පාත්‍රය මගේ බුදුගෙයි තැන්පත් කර තිබුණු අතර, මගේ මවට පින් පිණිස එය අනුරාධපුරයේ ආරියවංශ හිමියනට පරිත්‍යාග කළෙමි. අනිත් මෙවලම් තවම මා ළඟ තිබේ. ශ්‍රී මහා බෝධි අංකුරයක්, අනුරාධපුරයේ ආකෘතියක් සහ ශ්‍රී දළඳා මාලිගාවේ සැලැස්මක් ද සමඟ ධාතුන් වහන්සේලා දෙනමක් ද මා ලවා සියාදෝ හාමුදුරුවෝ ගෙන්වා ගත්තේ මෙම දිව්‍යාංගනාවගේ උපදෙස් පරිදිලු.

මේවා පිළිබඳ සත්‍ය අසත්‍යතාවය මම නොදනිමි. එහෙත් අප නොදන්නා දේ බොහෝ තිබෙන නිසාත්, උන් වහන්සේගේ උපදෙස්වල කිසිදු වරදක් නොතිබුණු නිසාත් උන් වහන්සේගේ උපදෙස් පරිදි මම ක්‍රියා කළෙමි.

දිනක් සියාදෝ හිමි වනයේ භාවනා කරමින් සිටියහ. ධාරානිපාත වැස්සක් කඩා වැටුණෙන්, කුඩ රැගත් මිනිසුන් උන් වහන්සේට ආවරණය දීමට ඒ පැත්තට දුවගෙන ගියහ. එවිට ඔවුන් දුටුවේ භාවනාවේ යෙදී සිටින සියාදෝ හිමියන්ය. උන් වහන්සේ වැඩ සිටි ස්ථානය අවට වැස්ස නැත. මොවුන් විශ්වාස කරන්නේ දෙවියන් උන් වහන්සේට ඉහළින් කුඩ උසුලා හාමුදුරුවන් තෙමීමට ඉඩ නොදුන් බවය.

වරක් ගමේ දෙපළක දානය බාරගත් හිමියෝ, දෙපළටම එක වර වැඩ දානය පිළිගත් බව මිනිසුන් අතර පැතිර ඇති තවත් කතාවකි. පෙර භවයක හිමියන් මෙහි රජ කළ බවත්, තවත් භවයක ජල මීයෙක්ව ඉපිද සිටි බවත් මිනිස්සු කියති. හම්වලින් සාදන ලද පාවහන් හිමියන් පළඳින්නේ නැත. මෙහි පැමිණෙන ඕනෑම කෙනෙකුගේ අභිමතාර්ථය ඉටුවෙන බව හැමෝගේම විශ්වාසයයි.

සිරිතක් වශයෙන් උන් වහන්සේ ගමෙන් පිටතට වැඩම නොකරති. එහෙත් උන් වහන්සේ සොයා ගෙන බැතිමත්හු එහි එති. කවදාවත් තරහ ගොස් නැත. කාගේත් සාමය සහ සතුට පතා භාවනා කරති. කියුබා මිසයිල් ප්‍රශ්නයේදී, ඇමෙරිකාව සහ රුසියාව යුද්ධයකට පැටලෙන්නට හදන විට, ඒ බව සැළ වූ සියාදෝ හිමියෝ වහාම ලෝක සිතියමක් ගෙන්වා ප්‍රශ්නය තිබූ තැන අසා, එතැනට අත තබා ධ්‍යාන ශක්තීන් මුදා හැරියේලු.

දැනට දෙවසරකට පමණ පෙර දිනක් හිමියෝ සිය අනුගාමිකයිනට මෙසේ පවසා තිබේ, අද සිට දින තුනක් ගිය තැන ශ්‍රී ලංකාවේ ශ්‍රී මහා බෝධිය සහ රුවන්වැලි මහා චෛත්‍යය පිහිටි පෙදෙසෙහි විශාල මනුෂ්‍ය ඝාතනයකින් තුන් සියයක් පමණ මිය

යනවා ඇත. රටත් ජාතියත් ශාසනයත් අනතුරේ. ඒ නිසා මා ලංකාවේ සාමය වෙනුවෙන් අද සිට භාවනා කරමි.

මෙසේ පැවැසූ උන් වහන්සේ ආරාම භූමියේ තුන් පළක් ලකුණු කර තිබේ. දළඳා මාලිගාවේ සංකේතයක් වශයෙන් එක් තැනක අලියෙක් හා කරඬුවක් සාදා, එහි ධාතූන් වහන්සේ නමක් තැන්පත් කළ යුතු බවත්, තවත් තැනක ශ්‍රී මහා බෝධි අංකුරයක් රෝපණය කළ යුතු බවත්, අනිත් තැන රුවන්වැලි මහාසෑයේ ආකෘතියක් හැදිය යුතු බවත් පවසා තිබේ. මේ තුන සම්පූර්ණ වන විට ශ්‍රී ලංකාවේ සාමය උදාවන බව උන් වහන්සේ ප්‍රකාශ කොට තිබේ. මේ අනුවයි මා බෝධි අංකුරය හා ධාතූන් වහන්සේලා වැඩම කළේ.

සියාදෝ හිමියන් දෙවිවරුන්ගෙන් වැඩ ගන්නා බව බොහෝ දෙනාගේ විශ්වාසයි.

සියාදෝ හිමියන්ගේ ආරාමයේ සෑම අංශයක්ම බැලීමට මම ගියෙමි. උන් වහන්සේ භාවනා කරන ස්ථාන රාශියක් තිබේ. විශාල සක්මන් මළුවක් ද, තනිව ගත කරන වන මැද පිහිටි තැන්නක් ද තිබේ. මේ ගොඩනැගිලි සියල්ල සාදා තිබෙන්නේ ප්‍රෝම් නැමැති කුඩා නගරයේ වසන බැතිමතුන් විසිනි. ඔවුහු පැමිණ දිනක් සවස මා මුණගැසුණහ.

ආරාමය මධ්‍යගතව එක් පසක පිහිටා ඇති අතර පාරේ අනික් පැත්තේ දිගටම තිබෙන්නේ විවිධ පවුල් ජීවත් වන ගෙවල්ය. පවුල් 300 ක් පමණ මෙහි ජීවත් වෙති. මොවුන්ගේ ජීවන රටාවම ආරාමය වටා ගොඩනැගී තිබේ. සියාදෝ මෙහි පැමිණෙන විට, මේ පළාතේ මිනිසුන් අපරාධවලට ඇබ්බැහි වී සිටි බව ඇසීමි. ක්‍රමයෙන් උන් වහන්සේ ඔවුන් නියම මගට ගෙන තිබේ. දැන් මත්ද්‍රව්‍යවලට පුරුදු වූ අය පුනරුත්ථාපනයට මෙහි ගෙන එති.

දවසට තෙවරක් දාගැබ් ඉදිරිපිට හා පෙති පිළිම ඉදිරිපස මලක් පූජා කිරීම මෙහි සිරිතකි. ජේළි සෑදී විශාල මල් කිනිති රැගෙන පියකරු ලෙස සැරසුණ තරුණියෝ අරමට අවුත්, ඒ සේවාවන් කරන හැටි දැකීම ඇසට ඉතා ප්‍රියජනකය. තැනින් තැන බැතිමත්හු භාවනා කරති. සියාදෝ හිමියන්ගේ පෞද්ගලික භාවනා කුටියෙහි පැයක් භාවනා කිරීමේ භාග්‍යය මට ද ලැබිණි.

වෛද්‍ය තින් තින් මැතිනිය සහ පිරිස සමඟ මල් පූජා කිරීම

සියාදෝ හිමියන්ට දානය පිළියෙල කරන අන්දම අපේ ගෙවල දන් දෙන අවස්ථා වැනිය. ඉතා පිරිසිදුව ඉමහත් භක්තියෙන් දායකයෝ දානමානාදිය ඉටු කරති. ජනතාව කෙරෙහි මෛත්‍රියෙන් සිල්වත් පැවිදි ජීවිතයක් ගත කරන උතුමනට, ජනතාවගෙන් ලැබෙන ගරු සැලකිලි පුදුමය.

සියාදෝ හිමියන් ජනතාව මුණ ගැසෙන සැන්දෑ යාමයක මම ධර්ම ශාලාවට ගියෙමි. බැතිමත්හු නොයෙක් දේ පූජා කරති.

එතුමා ඒවා අල්ලා පසෙක සිටින කෙනෙකුට දෙයි. මම ද ජූනි මාසයේ පැවැති අපේ සාම භාවනා ගමන පිළිබඳ පින්තූර ඇල්බම් එකක් දුනිමි. උන් වහන්සේගේ අවශ්‍යතා පිරිමසින දේ හැර, අන් සියල්ලම තැන්පත් කර තබා, ඒවා සෙසු ගිහි පැවිදි අයට අවශ්‍ය පරිදි බෙදාදීම උන් වහන්සේගේ සිරිතලු.

දිනක් මා ආහාර ගෙන එන විට, කිහිප දෙනෙක් මා සමඟ පෙළ ගැසුණහ. එතැනට දුවගෙන ආ හිස බූ ගාගත්, රෙද්දක් හා හැට්ටයක් ඇඳගත් තරුණ ගැහැණු ළමයෙක් මා ඉදිරිපිටට දිව විත්, දණ ගසා වැඳ, මගේ දෙපා අල්ලා ගෙන සිටියේය. ඇය ඉවත් කිරීමට මම මිනිසුනට ඉඩ නොදුන් නෙමි. හිසට අත තබා ඇයගේ උමතුව සනීප වීමට ආශීර්වාද කළෙමි.

සියාදෝ හිමියන් ජනතාව මුණගැසෙන ධර්මශාලාව තුළ

ශ්‍රී ලංකාවේ සිට පැමිණි දෙවියෙක් ඇය ලෙඩ කළ බවත්, මා අරමට පැමිණ ආපසු ගිය විට මේ ළමයා සුව වන බවත්, සියාදෝ හිමියන් පවසා ඇති බව මම පසුව දැන ගතිමි.

මට කොතනකටවත් තනිව හැංගි හොරා යා නොහැකිය. මෙහි පැමිණි පළමු විදේශිකයා මා නිසාදෝ හැමෝම හඳුනති. හැමෝම පැමිණ දණ ගසා වදිති. කිසිවෙක් මට වඳිනවාට

මා කැමැති නැත. එහෙත් ඔවුන්ගේ කැමැත්තට මා ගරු කළ යුතුය. ඒ සියලු වැඳුම් මට නොව, මා අදහන තෙරුවනටය. මා පතන උතුම් බෝධියටයි සිතා මම නිහතමානී වෙමි. ගිහි ගෙයින් පිට වීමට මට නිතර සිතෙයි. මට මුණගැසෙන ආගමිකයින් දකින විට, ඔවුනට වඩා මා බොහෝ දුර ගොස් ඇති බව මට සිතේ. එහෙත් ඒ ආත්ම වර්ණනීය අදහස ද කෙලෙස් සහගතය. එයත් නැති කර ගත යුතුය. ඒ සඳහා කොපමණ කලක් ගත වේද යන්න මම නොදනිමි.

අවුරුදු දහසකට පසු පූජනීය වස්තු රැගෙන මෙහි ආ එකම ශ්‍රී ලාංකිකයා වූ මට මේ අරමට පැමිණි පළමු විදේශිකයා වූ මට පෞද්ගලිකව ආශීර්වාද කිරීමට සියාදෝ හිමියන් කැඳවීම බලාපොරොත්තුව සිටියෙමි. 26 වැනිදා උදේ 5.00 - 7.00 ත් අතර ඒ අවස්ථාව ලැබිණි. වෛද්‍ය තින් තින් මැතිනිය මගේ පරිවර්තකයා ලෙස ක්‍රියා කළාය.

මම සියාදෝ හිමියනට වැඳ පසෙක වාඩි වුණෙමි. මගේ පළමු අරමුණ ශ්‍රී ලංකාවේ සාමය ඇති කිරීම බව පැවසුවෙමි.

"ඔබ මෙතෙක් ගිය මග නිවැරදියි. එහි ප්‍රතිඵල ඔබ ආපසු ලංකාවට යන දිනයෙහි ම දැක ගත හැකියි. ඔබ ගොඩ බැසීමට පැය එකහමාරකට කලින් ඉන්දීය අගමැති රජීව් ගාන්ධි ශ්‍රී ලංකාවට ගොඩ බසීවි. එදාම ඔබේ ජනාධිපතිතුමා සමඟ සාම ගිවිසුමක් අත්සන් කරාවි. දකුණේ හැම තැනම හිංසා කරදර පළමුව ඇති වී, එය මග හැරී යාවි. උතුරේ හා නැගෙනහිර සාමය තාවකාලිකව හෝ උදාවේවි. ඔබේ ආධ්‍යාත්මික ශක්තිය මුදා හැරීමේ වැඩ සටහන් ඒ විදියටම ගෙන යන්න. කල් ගියත් සාමය උදා වන්නේ ආධ්‍යාත්මික ශක්තිය ප්‍රමාණවත් මට්ටමට උදා වූ විට පමණයි."

කවදාවත් තම ගමෙන් පිටතට වැඩම කර නොමැති ලොවින් සම්පූර්ණයෙන්ම ඈත් වූ වන පෙදෙසක වැඩ වසන මුන්වහන්සේ මේ කරන කතාව ඇදහීමට නොහැකි තරම් පුදුම අනාගත සිදුවීමකි. මම තවදුරටත් ඇහුම්කන් දුනිමි. සිත්රා, ස්වාදී, විසාකා හා

අනුරාධා යන දෙවිවරුන්ගේ ආශීර්වාදය ලබා ගන්නා හැටියට දැන්වීය. ඔක්තෝම්බර් වැඩ සටහන එසේම පවත්වන හැටියටත්, ඒ වන විට සියලු අනතුරුදායක තත්ත්වයන් මග හැරී යන බවත් ප්‍රකාශ කළහ. කාලි අම්මා වෙනුවෙන් පහන් 108 ක් බුදුන්ට දල්වා, ඒ පින් ඇයට දෙන ලෙස දැන්වූහ. එය කාලි අම්මාගේ ඉල්ලීමකි. ඇයගේ ප්‍රතිමාවකට හානි කිරීම නිසා මෙසේ සිංහලයින්ගේ සිත් අවුල් කර ඇති බවත් ඇයට පින් අනුමෝදන් කළහොත් ඇය මේ ජාතික අවුල ලිහීමට උදව් වන බවත් සියාදෝ හිමි පැවැසූහ.

මේ ස්ථානයට එන කිසිවකුට මුන්වහන්සේ සතු විශාල ධ්‍යාන බලයක් ඇති බවට සැකයක් ඇති වන්නේ නැත. පිරිසිදු බුදු දහම මිනිසුනට තේරුම් කර දීමට ප්‍රථම, ඔවුන් ජීවත් වන මානසික පරිසරය පිරිසිදු කිරීමේ භාවනාව, අවශ්‍යතාව, උන්වහන්සේ අවබෝධ කර ගෙන තිබේ. මගේ පිළිගැනීමත් මෙයයි.

සියාදෝ හිමියන්, වෛද්‍ය තින් තින් මැතිනිය සහ මම

වරක් සියාදෝ හිමියන් වැඩ වසන ඇතුළත ආරාමයට උන්වහන්සේ මා තනිව කැඳවා ගෙන ගියහ. මොකක්දෝ සූත්‍රයක් කියමින් උන්වහන්සේ වේගයෙන් මගේ අත්ල උන්වහන්සේගේ අත්ලෙන් ඇතුල්ලූහ. එළියට ආපසු වෛද්‍ය තින් තින් මැතිනියගෙන් උන්වහන්සේ කී දේ මොකක් දැයි ඇසීමි. ඕනෑම ප්‍රශ්නයකට මුහුණ දීමට හැකි වන පරිදි උන්වහන්සේගේ බලය මට පැවැරූ බවත් මගේ දකුණු අත උස්සා අවශ්‍ය විට දී එය ප්‍රයෝජනයට ගත හැකි බවත් උන්වහන්සේ පැවසූහ. කලින් කල අවශ්‍ය උපදෙස් එවන බව ද ප්‍රකාශ කළහ. මා කරන විශාල කටයුතුවල කාල සටහන කලින් එව්වහොත් උන්වහන්සේ ඒ වේලාවලදී අප හා එක්වන බව ද පැවැසූහ.

සියාදෝ හිමියන් බැහැ දැකීමෙන් පසු මම ආපසු ඒමේ ගමනට සූදානම් වීමි. මට ආගන්තුක සත්කාර කළ හැමටම ස්තුති කළෙමි. බිම දණ ගසාගෙන වැඳ වැටී මට ආචාර කළ සමහර මුහුණු කවදාවත් මට අමතක නොවේ. මේ මිනිසුන්ගේ මුළු ජීවිතයම ආගම ඇදහීමය. අර උමතුවකින් පෙළෙමින් සිටි තරුණ ළමයා පවා පැමිණ මට ආචාර කළේය. දැන් අප ආපසු එන්නේ

ආරාමය තුළ ආගන්තුක සත්කාර කළ පිරිස සමඟ

පරණ හයිනෝ බසයෙනි. උදේ 8.30 ට පමණ අපි සියාදෝ හිමිගේ අරමින් පිටත් වීමු. පැය දෙකක් පමණ ගම් මැදින් ගුරු පාරවල් දිගේ කිසි දා පාලමක් බෝක්කුවක් නොමැති ඇළ දොළ ගංගාවලට බසය බස්සවා, නැවත නංගවමින් බසයේ රියැදුරා එම බසය පැදවූ හැටි ප්‍රසංශනීයය. පැරණි කාලයේ අප ස්වර්ණපාලී බස්වලින් තිස්ස-කතරගම වන්දනා ගිය හැටි මට සිහි විය. අප තාර පාරට ළඟා වන විට උදේ 10.30 ට පමණ ඇත. එතැන සිට මණ්ඩලේ බලා තාර පාර දිගේ අපි තවත් පැය දෙකක් පමණ ගමන් කළෙමු.

දිවා ආහාරය සඳහාත් රෑ වන තුරු නවාතැන් ගැනීම සඳහාත් සූදානම් කර තිබුණේ ස්වේවිමියේ නම් වූ පන්සලයි. මේ පන්සලේ පුස්කොළ පොත් 2500 ක් පමණ යට මහලේ ආරක්ෂිතව තැන්පත් කර තිබේ. උඩු මහලේ ඉතා වටිනා පිළිම සිය ගණනක් ආරක්ෂිතව තැන්පත් කර ඇත.

දිවා ආහාරයෙන් පසු මණ්ඩලේ පන්සල් හයක් පමණ නැරඹීමට අප රැගෙන යන ලදී. ඉන්පසු රාත්‍රී 9.00 ට මණ්ඩලේ සිට රන්ගුන් බලා පිටත් වන දුම්රියෙන් අපි ආපසු ගමන් ඇරඹීමු.

විසිහත්වැනි දාට එළි වූයේ අප දුම්රිය තුළ සිටියදීය. දවල් 12.00 වන තුරු පැය 15 ක ගමනක් නිම කරමිනුයි අප රන්ගුන් දුම්රිය පොළට ළඟා වූයේ. දින පහක ත්‍රාසජනක අත්දැකීම් රැසකින් පසු රන්ගුන් නුවර Resident's Hotel එකට ගිය මම දිවා ආහාරය ගෙන නිදා ගතිමි.

අපේ තානාපති කාලිදාස ද සිල්වා මහතාට දුරකතනයෙන් කතා කළෙමි. එතුමා ආචාර්ය රාසපුත්‍රම් එවා තිබුණු ටෙලෙක්ස් පණිවුඩයක් ද රැගෙන හෝටලයට පැමිණියේය. වින්යා පැපොල් රෝගය සෑදී රෝහල්ගතව මැනිලා සිටින බවත් හැකි නම් මැනිලා එන ලෙසත් පණිවුඩයෙන් දන්වා තිබිණි.

හෝටලයට ඩොලර් දහසයාමාරක් ගෙවා වෛද්‍ය තින් තින් මැතිනියගේ ගෙදරට පැමිණියෙමි. මට ආයුබෝවන් කීමට තෑගි බෝග ගෙන වරින් වර නොයෙක් අය පැමිණියහ. දෙකට පමණ ගුවන් තොටුපොළ බලා පිටත්වීමු. එතැනට සියාදෝ හිමිගේ අනුගාමිකයෝ රැසක් මට සුබ පැතීමට පැමිණ සිටියහ.

මා ගුවන් යානයෙන් පිටත් වන විට ද ඔවුන් අත වන වනා සිටිනු දුටුවෙමි. මා මුණ ගැසීමට රැල්ෆ් හවුට්මාන් මල්ලී බැංකොක් ගුවන් තොටුපොළට පැමිණ සිටියේය. ගෙදරට ගොස් වින්යාට කතා කිරීමෙන් පසු රාත්‍රී ආහාරය සඳහා ලලිතා හා රැල්ෆ් සමඟ හෝටලයකට ගියෙමු.

සියාදෝ හාමුදුරුවන් මට පැවැසූ පරිදිම, මම කටුනායකින් ගෙඩබසින විට රජීව් ගාන්ධි අගමැතිතුමාගේ පැමිණීම නිසාත්, සාම සම්මුතිය නිසාත් මුළු රටම කලබලකාරී තත්ත්වයක පැවතුණේය. කටුනායක සිට මොරටුවට එන තෙක්ම පාර දෙපැත්තේත් පාර මැද්දේත් දක්නට ලැබුණේ ගිනි ගන්නා වාහනය. ගොඩනැගිලිය. මේ සෑම තැනදීම උන්වහන්සේ මට උපදෙස් දී තිබුණු පරිදි මගේ දකුණු අත ඔසවා ආරක්ෂාව පැතීමි. කිසිම කරදරයක් නැතිව මගේ වාහනය කොළඹ නගරයටත් කොළඹ සිට මොරටුවටත් මෙම ගිනි කඳු මැදින් පදවා ගෙන ඒමට පුළුවන් විය. වැල්ලවත්ත පාලම ළඟදී හමුදාව විසින් මගේ වාහනය නැවැත්වූ අවස්ථාවේදී එතැනට පැමිණි කර්නල් ජනක පෙරේරා මහතා නිරුපද්‍රිතව මට ඉදිරියට යාමට කටයුතු සැලැස්වීය. මොරටුව, රාවතාවත්ත හන්දියෙන් වාහනය ද සොයිසා පාරට හරවන විට පාරෙන් එහා පැත්තේ වෙඩි හඬක් ද අපට ඇසුණේය.

පසුවදන

අපි යොවුන් වියේදී දෙල්ගහයටගෙදර විප්ලවය පොත කියවා ආභාසය ලැබුවෙමු. රටක් ලොවක් දිවියක් දිනූ ගිහි පැවිදි උතුමන්ගේ වතගොත ඇසුරින් මනා මඟ පෙන්වීම් ලැබුවෙමු. ආචාර්ය ඒ.ටී. ආරියරත්න සූරීමතුන්ගේ ජීවිතයත්, සර්වෝදයෙන් ඉටු කරන සමාජ, සංස්කෘතික, ආර්ථික සංවර්ධනයේ ක්‍රියා මාර්ගත් ගසට පොත්ත මෙන් එකක්ම වැනිය. භවතණ්හාහි තෙවැනි වෙළුම සර්වෝදය ව්‍යාපාරයේ සංවර්ධන අවදීන්, එහි අභියෝග, ගැටළු-බාධා, වහ-දොස්, අණ-විණවලට මුහුණ දෙමින් දිරියෙන් විරියෙන් සවියෙන් මේ ගමන පැමිණි සැටි අප වෙත කියාපායි. සර්වෝදය නායකයාණන්ගේ ස්වීයත්වය සුවිශේෂය. පරහිතකාමී ශ්‍රේෂ්ඨයකු වන එතුමන් ධාර්මිකව නැගී සිටියෙකි. ආධ්‍යාත්මික පෝෂණයත්, භෞතික සංවර්ධනයත් රටක සමාජ අභ්‍යුදයේදී අවශ්‍ය ලෙස කළමනාකරණය කර ගන්නා ආකාරය බුදු සමයෙන් උගනිමින් එතුමා ලෝකාර්ථචරියාවේ යෙදෙන කළ සියලු ආගමිකයන්ට, වාර්ගිකයන්ට, අන්‍ය සංස්කෘතීන්ට, ශිෂ්ටාචාරයන්ට ගරු බුහුමන් දක්වයි. ඉන් උකහා ගත හැකි උල්පතින් ලක් පොළොව සරු කරයි. විශ්වාසතර දර්ශනයකින් නැගුණු සර්වෝදය අප ජීවිත පුබුදු කරයි. එම සමාජාභිවර්ධන කාර්යයේ අසහාය සංස්කෘතික වීරයාණන්ගේ චරිතාපදානයෙන් අපි ආලෝචනා ලබමු.

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල - ශ්‍රී ලංකාව.

ඒ. ටී. ආරියරත්න

''නිදහස් ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරයෙන් සිදු වූයේ ඓතිහාසික විප්ලවවාදී වෙනසකි. රටේ සාරධර්ම කෙරෙහිත් සංවර්ධනය කෙරෙහිත් දේශපාලනය සහ පරිපාලනය කෙරෙහිත් නායකත්වය කෙරෙහිත් සර්වෝදය ඇති කළ බල පෑම භික්ෂූන් වහන්සේලා හැටියට අප කෙරෙහි ද නොඅඩුව බල පෑවේය. එය අපේ ජීවිතවලට ද විශාල ආලෝකයක් ගෙනදුන්නේය. පසුගිය කාලයේ අපේ රට විශාල වශයෙන් දේශපාලනකරණය වූ නිසා සර්වෝදය මෙරටට කළ සේවය යම්කිසි ප්‍රමාණයකට මහජන මනසින් ඈත් වී ගියත්, සර්වෝදයට ඉතිහාසයේ ඇති තැන කාටවත් වසා දැමිය නොහැකිය.''

දක්ෂිණ ලංකාවේ
ප්‍රධාන සංඝනායක
අතිපූජ්‍ය ගෞරවාර්හ
අත්තුඩාවේ රාහුල
මාහිමිපාණන් වහන්සේ

සර්වෝදය
විශ්ව ලේඛා මුද්‍රණයෙකි.

ISBN 978-955-599-515-3
මිල රු. 600/=

භව තණ්හා

ස්ව චරිතාපදානය

තෙවන වෙළුම